326 වන කාණ්ඩය - 04 වන කලාපය
தொகுதி 326 - இல. 04
Volume 326 - No. 04

2026 අප්‍රේල් 10 වන සිකුරාදා
2026 ஏப்பிரல் 10, வெள்ளிக்கிழமை
Friday, 10th April, 2026

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**නිවේදන:**
කථානායකතුමාගේ සහතිකය [තීරුව 571]
**අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා** [තීරුව 572]
**ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා** [තීරුව 573]
**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 574-597]
**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**
යාවත්කාලීන කරන ලද සංඛ්‍යාලේඛන මත පදනම්ව "අස්වැසුම" සුදුසුකම් නිර්ණායක සමාලෝචනය [තීරුව 598]
කොට්ටන්තිව් මොහිදීන් ජුම්මා මුස්ලිම් පල්ලියට අයත් ඉඩමක ඉදිකරන ලද සංස්කෘතික මධ්‍යස්ථානය [තීරුව 610]
**වරප්‍රසාද:**
පාර්ලිමේන්තුවේ සහ කමිටුවල මතු කරන ලද ප්‍රශ්නවලට පිළිතුරු නොදී තොරතුරු රඳවා ගැනීම [තීරුව 614]
**බලශක්ති අමාත්‍යවරයාට එරෙහි විශ්වාස භංග යෝජනාව:**
නිෂ්ප්‍රභ විය [තීරු 619-770]

---

# பிரதான உள்ளடக்கம்

**அறிவிப்புகள்:**
சபாநாயகரது சான்றுரை [ப: 571]
**அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள்** [ப: 572]
**துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்** [ப: 573]
**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 574-597]
**தனி அறிவித்தல் மூல வினா:**
புதுப்பிக்கப்பட்ட புள்ளிவிபரங்களின் அடிப்படையில் "அஸ்வெசும" தகுதி அளவுகோலின் மீளாய்வு [ப: 598]
கொத்தாந்தீவு முகைதீன் ஜும்ஆ பள்ளிவாசல் காணியில் நிர்மாணிக்கப்பட்டுள்ள கலாசார மத்திய நிலையம் [ப: 610]
**சிறப்புரிமை:**
பாராளுமன்றம் மற்றும் குழுக்களில் எழுப்பப்படும் கேள்விகளுக்குப் பதிலளிக்காமல் தகவல்களைத் தடுத்து வைத்தல் [ப: 614]
**வலுசக்தி அமைச்சருக்கு எதிரான நம்பிக்கையில்லாப் பிரேரணை:**
நிராகரிக்கப்பட்டது [ப: 619-770]

---

# PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Speaker's Certificate [Col. 571]
MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS [Col. 572]
SECTORAL OVERSIGHT COMMITTEE REPORTS [Col. 573]
ORAL ANSWERS TO QUESTIONS [Cols. 574-597]
QUESTION BY PRIVATE NOTICE:
Review of “Aswesuma” Eligibility Criteria Based on Updated Statistics [Col. 598]
Cultural Centre Built on Land Belonging to Kottantivu Mohideen Jumma Mosque [Col. 610]
PRIVILEGE:
Withholding Information by Not Answering Questions Raised in Parliament and Committees [Col. 614]
VOTE OF NO-CONFIDENCE AGAINST MINISTER OF ENERGY:
Negatived [Col. 619-770]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2026 අප්‍රේල් 10වන සිකුරාදා***
*2026 ஏப்பிரல் 10, வெள்ளிக்கிழமை*
*Friday, 10th April, 2026*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.
The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## නිවේදන
## அறிவிப்புகள்
## ANNOUNCEMENTS

### කථානායකතුමාගේ සහතිකය
### சபாநாயகரது சான்றுரை
### SPEAKER'S CERTIFICATE

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව ප්‍රකාරව, මවිසින් 2026 අප්‍රේල් 09 දින "සමාජ ආරක්ෂණ දායකත්ව බදු (සංශෝධන)" නමැති පනත් කෙටුම්පතෙහි සහතිකය සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, 2023 වර්ෂය සඳහා සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම, 2023 වර්ෂය සඳහා සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගමේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)

ගරු කථානායකතුමනි, බේරා ගැනීම්, පුනරුත්ථාපන සහ වස්තුභංගත්ව (ආයතනික සහ පුද්ගලික) නමැති පනත් කෙටුම්පත 2026.03.17 දින පාර්ලිමේන්තුවට පිළිගන්වා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 50(2) විධිවිධාන ප්‍රකාරව, රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලදුව එකී කාරක සභාව විසින් එම පනත් කෙටුම්පත යථා පරිදි සලකා බැලීමෙන් අනතුරුව එම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට යොමු කරනු ලැබීම යෝග්‍ය බවට නිර්දේශ කර ඇති බැවින් බේරා ගැනීම්, පුනරුත්ථාපන සහ වස්තුභංගත්ව (ආයතනික සහ පුද්ගලික) නමැති පනත් කෙටුම්පත සභාවේ අවසරය ඇතිව රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත ද යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා
## அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள்
## MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කරන ලද 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 18, 24, 28 සහ 30 වගන්ති සමඟ කියවිය යුතු 44 වගන්තියේ (ඌ) සහ (ඒ) ඡේද යටතේ ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2026 ජනවාරි 17 දිනැති අංක 2471/68 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
## துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
## SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

**ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சமன்மலீ குணசிங்ஹ)
(The Hon. (Mrs.) Samanmali Gunasingha)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය, ජනමාධ්‍ය සහ කාන්තා සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන්, එම කාරක සභාව වෙත යොමු කරන ලද -

වාර්තාව 1

(i) 2024 වර්ෂය සඳහා ආයුර්වේද දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව; සහ

(ii) 2024 වර්ෂය සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ වාර්ෂික වාර්තාව

වාර්තාව 2

2024 වර්ෂය සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තා මම ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු මහින්ද ජයසිංහ මහතා (කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ - தொழில் பிரதி அமைச்சர்)
(The Hon. Mahinda Jayasinghe - Deputy Minister of Labour)

ගරු කථානායකතුමනි, රත්නපුර, මුවගම, බේමානන්ද මාවත, අංක 28/9 යන ලිපිනයෙහි පදිංචි එන්.එල්. චන්ද්‍රසේකර මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, ගාල්ල, කටුගොඩ, දෙවන පටුමග, අංක 25 යන ලිපිනයෙහි පදිංචි එම්.එම්. රම්සානා මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු අජිත් අගලකඩ මහතා**
(மாண்புமிகு அஜித் அகலகட)
(The Hon. Ajith Agalakada)

ගරු කථානායකතුමනි, මොනරාගල, හිදිකිවුල, අංක 18 යන ලිපිනයෙහි පදිංචි කේ.සී.යූ.කේ. පතිරණ මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු රුවන්තිලක ජයකොඩි මහතා**
(மாண்புமிகு ருவன்திலக்க ஜயக்கொடி)
(The Hon. Ruwanthilaka Jayakody)

ගරු කථානායකතුමනි, ගම්පහ, උඩුගම්පල, වීදියවත්ත, අංක 102/1/1 යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්.පී. ජේමසිරි ජයලත් මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### රාජ්‍ය විශ්වවිද්‍යාලවල අනධ්‍යයන කාර්ය මණ්ඩලය: පුරප්පාඩු
### அரச பல்கலைக்கழக கல்விசாரா பணியாட்டொகுதியினர்: வெற்றிடங்கள்
### NON-ACADEMIC STAFF OF STATE UNIVERSITIES: VACANCIES

25/2024

**1. ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා**
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) මේ වන විට රජයේ විශ්වවිද්‍යාලවල ඇති අනධ්‍යයන තනතුරු සංඛ්‍යාව කොපමණද;

(ii) 2019 වර්ෂයේ සිට මේ දක්වා එම විශ්වවිද්‍යාලවල අනධ්‍යයන තනතුරු සඳහා බඳවාගෙන ඇති පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම්, තනතුරු හා ලිපිනයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත විශ්වවිද්‍යාලවල අනධ්‍යයන තනතුරුවල ඇති පුරප්පාඩු පිරවීම ඉහළ විනිවිදභාවයකින් යුතුව සිදු කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) இன்றளவில் அரச பல்கலைக்கழகங்களில் காணப்படும் கல்விசாரா பதவிகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) 2019ஆம் ஆண்டிலிருந்து இதுவரை, அத்தகைய பல்கலைக்கழகங்களின் கல்விசாரா பதவிகளுக்காக ஆட்சேர்ப்புச் செய்யப்பட்டுள்ளவர்களின் எண்ணிக்கை, அவர்களின் பெயர்கள், பதவிகள் மற்றும் முகவரிகள் வெவ்வேறாக யாது என்பதையும்;

(iii) மேற்படி பல்கலைக்கழகங்களில் கல்விசாரா பதவிகளிலுள்ள வெற்றிடங்கள் நிரப்பப்படுவதை மிகவும் வெளிப்படைத் தன்மையுடன் மேற்கொள்ள எடுக்கப்படும் நடவடிக்கை யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House the -

(i) number of non-academic positions currently available in the State universities;

(ii) number of persons recruited for non-academic positions in those universities from the year 2019 to date, along with their names, positions and addresses separately; and

(iii) steps that will be taken to fill the vacancies in non-academic positions in the State universities in a more transparent manner?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා (අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன - கல்வி, உயர் கல்விப் பிரதி அமைச்சர்)

(The Hon. (Dr.) Madhura Senevirathna - Deputy Minister of Education and Higher Education)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i)

| විශ්වවිද්‍යාලය | අනධ්‍යයන තනතුරු සංඛ්‍යාව |
|---|---|
| විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ වන, I. විශ්වවිද්‍යාලය II. උසස් අධ්‍යාපන ආයතන | 13,290 654 |
| ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය | 109 |
| ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය | 111 |
| වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය | 148 |
| ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය | 219 |
| ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය | 594 |

(ii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ තිබෙන විශ්වවිද්‍යාලවලට බඳවා ගැනීම් සම්බන්ධ තොරතුරු ඇමුණුම 01 මඟින් වෙන් වෙන්ව දක්වා තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. ඒක ලොකු සංඛ්‍යාත්මක දත්ත ප්‍රමාණයක්. අනෙකුත් විශ්වවිද්‍යාලවලට බඳවා ගැනීම් සම්බන්ධයෙන් ඇමුණුම් 02,03,04,05,06 මඟින් දක්වා තිබෙනවා.

01 සිට 06 දක්වා ඇමුණුම් **සභාගත*** කරනවා.

(iii) කොමිෂන් සභාව යටතේ ඇති විශ්වවිද්‍යාල සඳහා උසස් අධ්‍යාපන ආයතන/විද්‍යායතන සඳහා වූ ආයතන සංග්‍රහය 2023 සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛවල ප්‍රතිපාදන අනුව අනධ්‍යයන තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කරනු ලබයි.

අනෙකුත් ආයතනවලටත් බඳවා ගැනීම් සිද්ධ වෙනවා. ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ බඳවා ගැනීම් පටිපාටිය අනුව, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ සමාලෝචන කමිටුවේ තීරණ මත, වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ පුවත් පත් දැන්වීම් සහ අදාළ පටිපාටිය අනුව සහ ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේත් ඒ විධියට. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ පුරප්පාඩු පිරවීමේදී අනුගමනය කරන්නේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් අනුමත කරන ලද ක්‍රියාදාමයම තමයි.

(ආ) පැන නොනඟී.

**ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා**

(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)

(The Hon. Hesha Withanage Ankumbura Arachchi)

ගරු කථානායකතුමනි, ගරු නියෝජ්‍ය ඇමතිතුමාට යොමු කරන මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මම මේ අතුරු ප්‍රශ්නය යොමු කරන්න හේතුව මෙයයි. බොහෝ විශ්වවිද්‍යාලවල අනධ්‍යයන කාර්ය මණ්ඩල බඳවා ගැනීමේ ක්‍රියාවලිය ඉතිහාසයේ සිට මේ දක්වාම සිද්ධ වෙන්නේ දේශපාලනඥයන්ගේ අවශ්‍යතාව මත ඔවුන්ගේ ලැයිස්තුවලට. එහෙම නැතුව ඔය කියපු චක්‍රලේඛවලට අනුව කටයුතු කරලා නැහැ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට පුළුවන් නම් මේ පිළිබඳව සොයා බලන්න. මේ රටේ රාජ්‍ය විශ්වවිද්‍යාල සියල්ලේම බඳවා ගැනීම් සිද්ධ වෙන්නේ එහෙමයි. උප කුලපතිවරයාට අදාළ ලැයිස්තුව යනවා, උප කුලපතිවරයා බඳවා ගැනීම් කරනවා.

අපි විශ්වාස කරනවා, මේ ක්‍රමය වෙනස් විය යුතුයි කියලා. මොකද, මේ රටේ අනෙකුත් රාජ්‍ය ආයතනවල පවතින ක්‍රමය වෙනස් වෙන්නේ නැත්නම්, විශ්වවිද්‍යාල තුළවත් මේ ක්‍රමය වෙනස් විය යුතුයි. මම ඔබතුමාට කියන්න කැමැතියි, මේ මොහොත වනවිටත් එය ඒ ආකාරයෙන්ම සිදු වන බව. අවශ්‍ය නම් ඒ සඳහා උදාහරණ වුණත් ඉදිරිපත් කරන්න කැමැතියි. ඔබතුමන්ලාගේ ආණ්ඩුවට අද වනවිට අවුරුදු එකහමාරක පමණ කාලයක් ගත වී තිබියදීත් මේ තත්ත්වය නිවැරදි කිරීමට අඩුම තරමේ ප්‍රවේශයක්වත් ගත්තේ නැත්තේ ඇයි කියා මා අහනවා.

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**

(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)

(The Hon. (Dr.) Madhura Senevirathna)

ගරු මන්ත්‍රීතුමනි, මේ සම්බන්ධයෙන් අපට දීර්ඝ කාලීන අත්දැකීම් තිබෙනවා. මේ සියලු තනතුරුවලට බඳවා ගැනීමේදී දේශපාලනඥයන්ගේ "ලිස්ට්" එකක් මත තමයි සිද්ධ වුණේ. ඒක තමයි වෙලා තිබෙන්නේ. අපි දැක්කා, අතීතයේදී එහෙම තමයි සිද්ධ වුණේ. ඊට අදාළව සෘජුවම ලිස්ට් එකක් තමයි ආවේ. නමුත් 2024න් පසුව මේ තත්ත්වය යම් කිසි මට්ටමකින් අඩු වෙලා තිබෙනවා. අපි ඒක දැක්කා. ගරු කථානායකතුමනි, මේ මොහොත වනවිට බඳවා ගැනීම් 16,000කට ආසන්න ප්‍රමාණයකට අනුමැතිය ලැබී තිබෙනවා. ඒ ප්‍රමාණය බඳවා ගැනීම විශ්වවිද්‍යාල මට්ටමින් සිදු කරනවා. ඒ සියලු බඳවා ගැනීම් සිද්ධ වෙන්නේ කිසිම දේශපාලන බලපෑමකින් තොරවයි. මම ඔබතුමාට එහෙම කියන්නේ වගකීමක් සහිතව. ඒකට හේතුව මෙයයි. යම්කිසි පැමිණිල්ලක් ආවොත්, අපි එක්කෝ විශ්වවිද්‍යාල

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා]

ප්‍රතිපාදන කොමිෂන් සභාවට, එහෙම නැත්නම් අපේ අමාත්‍යාංශයේ උසස් අධ්‍යාපන අංශයට කථා කරලා අහනවා. මොනවා හරි දෙයක් වෙලා තිබෙනවා නම් ඒ සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයෙන් කරුණු විමසීමක් කරන්න පුළුවන්, ඒ අසාධාරණයට ලක් වූ තැනැත්තාට. ඒ වාගේම, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට පැමිණිලි කරන්න පුළුවන්. එහෙම නැත්නම් අමාත්‍යාංශයට පැමිණිලි කරන්න පුළුවන්. ඒ විධියට තුන් ආකාරයක් තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නිශ්චිතව කරුණු සඳහන් කරන්න පුළුවන් නම් අපි ඒ ගැන කියන්නම්. මොකද, මේ සම්බන්ධයෙන් අපි විවෘතයි. මේ වෙද්දි කිසිම බලපෑමක් දේශපාලන වශයෙන් නම් කරලා නැහැ. ඒ ගැන අපට කියන්න පුළුවන්.

**ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා**
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)

ගරු කථානායකතුමනි, මම අපේ නියෝජ්‍ය ඇමතිතුමාගෙන් මේ කාරණය දැනගන්න කැමැතියි. මම මීට පෙරත් මේ ප්‍රශ්නය ඇහුවා, හරිනි අමරසූරිය අග්‍රාමාත්‍යතුමියගෙන්. එතුමිය පිළිතුරක් ලබා දුන්නා, සාධනීය විධියට මේක ඉතා කඩිනමින් කරනවා කියලා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, දැන් අවුරුදු එකහමාරක් ගිහිල්ලාත් එය සිදු වෙලා නැහැ. මම ඔබතුමාගෙන් මේ ප්‍රශ්නය අහනවා. ඒ කියපු දේ සිද්ධ වෙලා තිබෙනවා නම් මගේ ප්‍රශ්නයට උත්තරය තිබෙනවා. අපේ රටේ විශ්වවිද්‍යාල පද්ධතිය නියාමනය කිරීමේ වගකීම තිබෙන්නේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට. නමුත් අපේ රටේ, විදෙස් විශ්වවිද්‍යාල එක්ක එකතු වෙච්ච affiliated universitiesවලින් degrees දෙන ආයතන තිබෙනවා විශාල ප්‍රමාණයක්. මේක ව්‍යාපාරයක්. මේ ව්‍යාපාරය තුළ ඒ විශ්වවිද්‍යාලවල තිබෙන quality එක, නැත්නම් අපේ රටේ UGC එකට අවශ්‍ය මූලික සුදුසුකම් ටික නැති ආයතන විශාල ප්‍රමාණයක් තිබෙනවා. මේ ව්‍යාපාර කරගෙන යන්න ඉඩ දුන්නාට අඩුම තරමින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට කිසිම ආකාරයකින් ඒකට මැදිහත් වෙන්න පුළුවන්කමක් නැහැ. ඒකට උත්තරයක් හොයද්දී ගරු උසස් අධ්‍යාපන ඇමතිතුමිය පොරොන්දු වුණා, ඒක වෙන්න ඉඩ දෙන්නේ නැහැ කියලා. නමුත් මේ මොහොතේත් ඒ ව්‍යාපාරය ඒ විධියටම යනවා. අපේ රටේ උපාධි කඩ විශාල ප්‍රමාණයක් නිර්මාණය වෙලා තිබෙනවා. තවමත් එය එලෙසම සිදු වනවාද, එහෙම නැත්නම් එය නතර වෙලාද තිබෙන්නේ කියලා මම දැනගන්න කැමැතියි.

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)

ගරු මන්ත්‍රීතුමනි, එම ප්‍රශ්නය ඇසීම සම්බන්ධව ස්තුතියි. ඇත්තටම අපි එම ප්‍රශ්නය හඳුනාගෙන ගොඩක් කල්. මේ වෙද්දි අපි කළ නිශ්චිත මැදිහත්වීම් ටික ඔබතුමාගේ දැන ගැනීම සඳහා මා සඳහන් කරන්නම්.

ඉන් පළමුවැන්න මේකයි. උසස් අධ්‍යාපන ආයතන සඳහා වන ප්‍රතිපත්ති සැදීමේ කමිටුව මේ සම්බන්ධයෙන් තීරණ කිහිපයක් අරගෙන තිබෙනවා. එක තීරණයක් තමයි, මූලිකව උසස් අධ්‍යාපන ආයතන සියල්ල ලියාපදිංචි කිරීම. අපට මතු වූ ප්‍රධාන ගැටලුව තමයි, උසස් අධ්‍යාපන ආයතනයක් හොයා ගන්නේ කොහොමද කියන එක. මෙහිදී BoI එකේ ලියාපදිංචි වෙලා තිබෙනවා. සමහර විට business එකක් විධියට register වෙලා තිබෙනවා. නමුත්, ක්‍රියාදාමය වෙන්නේ කොතැනද කියලා අපි දන්නේ නැහැ. ඒක තමයි මූලිකව පැන නැඟුණ ගැටලුව.

අපි මේ වනකොට BOI එක සමඟ සාකච්ඡා වට දෙකක් පැවැත්වූවා. අපි මුලින්ම ලියාපදිංචියේ ඉඳලා පටන් ගන්නවා. මූලිකව කළ යුතු දේ මුලින්ම කරන්න ඕනෑ නේ. අපි මුලින්ම සියලු උසස් අධ්‍යාපන ආයතන ලියාපදිංචිය පටන් ගන්නවා. දෙවනුව, මේ තිබෙන විෂය සන්දර්භ, course content එක සම්බන්ධයෙන් සමාලෝචනය කරනවා. මේ වෙද්දි ඒ කාරණා දෙකම සිදු වන ගමන් තිබෙන්නේ, ගරු මන්ත්‍රීතුමනි. අපේ අවසාන අරමුණ තමයි උසස් අධ්‍යාපන ආයතන සියල්ල ලියාපදිංචිය සහ නියාමනය කිරීම එකම තැනකින් කිරීම. එය විෂය යටිතල වෙන්න පුළුවන්, ඩිප්ලෝමා වෙන්න පුළුවන්, ඕනෑම අධ්‍යාපන ආයතනයක් වෙන්න පුළුවන් ලියාපදිංචිය සහ නියාමනය එකම තැනකින් කිරීම තමයි අපේ අරමුණ. එම ක්‍රියාව සිදු වෙමින් පවතිනවා. ඒ සම්බන්ධයෙන් අපි වගකියනවා. විශේෂයෙන්ම ශිෂ්‍යයන්ට ගැළපෙන, ප්‍රතීතනය වන, quality එකක් තිබෙන සහ විශ්වාස කළ හැකි course එකක් ලබා දෙන්න අපට අවශ්‍යයි. අපි ඒ සම්බන්ධයෙන් කටයුතු කරමින් සිටිනවා. එම ක්‍රියාදාමය ඉතා ඉක්මනින් සිදු වනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 2 -122/2024- (1), ගරු චමින්ද විජේසිරි මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 3 -567/2025- (1), ගරු රෝහණ බණ්ඩාර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 4 -641/2025- (1), ගරු කිංස් නෙල්සන් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 5 -1881/2026- (1), ගරු ජගත් විතාන මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## ජාතික අධ්‍යාපන ආයතනය: වෘත්තිකයින් සඳහා පවත්වන පාඨමාලා
### தேசிய கல்வி நிறுவகம்: தொழில்வாண்மையாளர்களுக்காக நடாத்தப்படும் பாடநெறிகள்
### NATIONAL INSTITUTE OF EDUCATION: COURSES CONDUCTED FOR PROFESSIONALS

1882/2026

**6. ගරු සුනිල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சுனில் ராஜபக்ஷ)
(The Hon. Sunil Rajapaksha)

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) අධ්‍යාපන ක්ෂේත්‍රයේ වෘත්තිකයින් සඳහා ජාතික අධ්‍යාපන ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන පාඨමාලා කවරේද;

(ii) එම එක් එක් පාඨමාලාවට බඳවා ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව සහ පාඨමාලා කාලය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම පාඨමාලා සඳහා අදාළ ඇගයීම් ක්‍රමය පාඨමාලාවෙන් පාඨමාලාවට වෙනස් වන්නේද;

(iv) එසේ නම්, එම පාඨමාලා කවරේද;

(v) සිසුන් බඳවා ගැනීමෙන් පසුව නිශ්චිත කාල සීමාව තුළ අවසන් නොකළ පාඨමාලා තිබේද;

(vi) එසේ නම්, එම පාඨමාලා කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) கல்வித் துறைசார் தொழில்வாண்மையாளர்கள் என்ற வகையில் தேசிய கல்வி நிறுவகத்தால் நடாத்தப்படும் பாடநெறிகள் யாவை;

(ii) மேற்படி ஒவ்வொரு பாடநெறிக்கும் இணைத்துக்கொள்ளப்படும் மாணவர்களின் எண்ணிக்கை மற்றும் பாடநெறிக் காலம் என்பன வெவ்வேறாக யாவை;

(iii) மேற்படி பாடநெறிகளுக்கான மதிப்பீட்டு முறைகள் ஒவ்வொரு பாடநெறிக்கும் அமைவாக வேறுபடுகின்றனவா;

(iv) ஆமெனில், அத்தகைய பாடநெறிகள் யாவை;

(v) மாணவர்களை இணைத்துக்கொண்டதன் பின்னர், குறித்த காலப்பகுதிக்குள் பூர்த்தி செய்யப்படாத பாடநெறிகள் உள்ளனவா;

(vi) ஆமெனில், அத்தகைய பாடநெறிகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House -

(i) the courses currently conducted by the National Institute of Education for professionals in the field of education;

(ii) the number of students admitted to each course and the duration of each course, separately;

(iii) whether the assessment method for these courses vary from course to course;

(iv) if so, the names of such courses;

(v) whether there are courses that have not been completed within the specified duration after student enrolment; and

(vi) if so, the names of such courses?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) 1. අධ්‍යාපන දර්ශනපති පාඨමාලාව

2. අධ්‍යාපනපති පාඨමාලාව

3. අධ්‍යාපන කළමනාකරණ පිළිබඳ විද්‍යාපති උපාධි පාඨමාලාව

4. අධ්‍යාපන කළමනාකරණ පිළිබඳ අධ්‍යාපනපති උපාධි පාඨමාලාව

5. පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව

6. පශ්චාත් උපාධි අධ්‍යාපන කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව

7. අධ්‍යාපනවේදී (ගෞරව) උපාධි පාඨමාලාව

8 .අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව

9. ශාරීරික අධ්‍යාපනය සහ ක්‍රීඩා පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව

10. අධ්‍යාපන තක්සේරුව හා ඇගයීම පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව

11. මුල් ළමා විය සංවර්ධන ඩිප්ලෝමා පාඨමාලාව

12. පාසල් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව

13. විශේෂ අධ්‍යාපන පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව

14. සංඥා භාෂා ඩිප්ලෝමා පාඨමාලාව

15. උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව

16. පාසල් වෘත්තීය මාර්ගෝපදේශය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව

17. අධ්‍යාපන පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ තේමා පාඨමාලාව

18. බ්‍රේල් සහතික පත්‍ර පාඨමාලාව

(ii) එම එක් එක් පාඨමාලාව සඳහා බඳවා ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව සහ පාඨමාලා කාලය වෙන් වෙන් වශයෙන් පහත ඇමුණුම 01 මඟින් ඉදිරිපත් කර ඇත.

ඇමුණුම 01

| අනු අංකය | පාඨමාලාවේ නම | බඳවාගත හැකි ශිෂ්‍ය සංඛ්‍යාව | | | පාඨමාලා කාලය |
|---|---|---|---|---|---|
| | | සිංහල | දෙමළ | ඉංග්‍රීසි | අවුරුදු |
| 01 | අධ්‍යාපන දර්ශනපති පාඨමාලාව (2024/2027) | 23 | | | 03 |
| 02 | අධ්‍යාපනපති පාඨමාලාව Level 10 (2024/2025) | 68 | 18 | 12 | 01 |
| | Level 09 (2025/2026) | 299 | 310 | 79 | 01 |
| 03 | අධ්‍යාපන කළමනාකරණ පිළිබඳ විද්‍යාපති උපාධි පාඨමාලාව (2021/2022) | 103 | | | 02 |
| 04 | අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ අධ්‍යාපනපති උපාධි පාඨමාලාව (2021/2022) | 328 | 167 | - | 02 |
| | අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ අධ්‍යාපනපති උපාධි පාඨමාලාව (2022/2023) | - | - | 56 | 02 |
| | අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ අධ්‍යාපනපති උපාධි පාඨමාලාව (2023/2024) | 222 | 55 | - | 02 |
| 05 | පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව (2025/2026) | 2012 | 980 | - | 01 ½ |
| 06 | පශ්චාත් උපාධි අධ්‍යාපන කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව පූර්ණකාලීන | 80 | 40 | 30 | 01 (සතියේ දිනවල) |
| | අර්ධකාලීන | 150 | 100 | - | 01 ½ (සති අන්ත)_ |
| 07 | අධ්‍යාපනවේදී (ගෞරව) උපාධි පාඨමාලාව (2022/2026) | 1267 | 3400 | 762 | 04 |
| 08 | අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව (2021/2022) කණ්ඩායම | 288 | 45 | - | 03 |
| | (2022/2023) කණ්ඩායම | 42 | 8 | - | 03 |
| 09 | ශාරීරික අධ්‍යාපනය සහ ක්‍රීඩා පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව | 300 | | | 02 |
| 10 | අධ්‍යාපනික තක්සේරුව හා ඇගයීම පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව පළමු කණ්ඩායම (2021/2022) | 52 | - | - | 01 |

[ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා]

| අනු අංකය | පාඨමාලාවේ නම | බඳවාගත හැකි ශිෂ්‍ය සංඛ්‍යාව | | | පාඨමාලා කාලය |
|---|---|---|---|---|---|
| | | සිංහල | දෙමළ | ඉංග්‍රීසි | අවුරුදු |
| | දෙවන කණ්ඩායම (2022/2023) | 117 | 69 | - | 01 |
| | තුන්වන කණ්ඩායම (2025/2026) | 47 | 21 | - | 01 |
| 11 | මූල් ළමාවිය සංවර්ධන ඩිප්ලෝමා පාඨමාලාව | 30 | 20 | _ | 01 |
| 12 | පාසල් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | 150 | 100 | - | 01 (සති අන්ත) |
| 13 | විශේෂ අධ්‍යාපන පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | 100 | | - | 01 |
| 14 | සංඥා භාෂා ඩිප්ලෝමා පාඨමාලාව | 30 | | | 01 |
| 15 | උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | 35 | 35 | - | 01 |
| 16 | පාසල් වෘත්තීය මාර්ගෝපදේශය පිළිබඳ ඩිප්මෝලාව පාඨමාලාව | 35 | 35 | - | 01 |
| 17 | අධ්‍යාපන පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ තේමා පාඨමාලාව | 50 | | | දින 03 |
| 18 | බ්‍රේල් සහතික පත්‍ර පාඨමාලාව | 30 | | | මාස 06 |

(iii) ඔව්.

අපි ප්‍රශ්න අංක (iv)ට ලබා දී තිබෙන පිළිතුරේ මේ පාඨමාලා සම්බන්ධව සඳහන් කර තිබෙනවා. මෙතැනදී පර්යේෂණ සම්බන්ධයෙන් තිබෙන පාඨමාලා විශ්වවිද්‍යාල හා සමානව, ඒ කියන්නේ නිබන්ධන සහ වාචික පරීක්ෂණ - viva - විධියට යන්නේ. අනෙකුත් පාඨමාලා SLQF වාගේ, විශ්වවිද්‍යාලයට සමාන විධියට තමයි කටයුතු කරන්නේ. ඩිප්ලෝමා සම්බන්ධයෙන් විභාග සහ ප්‍රායෝගික පරීක්ෂණ තමයි පැවැත්වෙන්නේ. සාමාන්‍ය විශ්වවිද්‍යාලවලට සමාන SLQF තත්ත්වයේ ඇගයීම් ක්‍රම යටතේ තමයි දැනට ජාතික අධ්‍යාපන ආයතනය මේ පාඨමාලා පවත්වන්නේ.

(iv)
1. අධ්‍යාපන දර්ශනපති පාඨමාලාව
2. අධ්‍යාපනික පාඨමාලාව
3. අධ්‍යාපන කළමනාකරණ පිළිබඳ විද්‍යාපති උපාධි පාඨමාලාව

   පර්යේෂණ යෝජනාව ඉදිරිපත් කිරීමෙන් අනතුරුව පර්යේෂණ වාර්තා ඇගයීම සිදු කෙරේ.
4. අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ අධ්‍යාපනපති උපාධි පාඨමාලාව
5. පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව
6. පශ්චාත් උපාධි අධ්‍යාපන කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව
7. අධ්‍යාපනවේදී (ගෞරව) උපාධි පාඨමාලාව
8. අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව
9. ශාරීරික අධ්‍යාපනය සහ ක්‍රීඩා පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව
10. අධ්‍යාපනික තක්සේරුව හා ඇගයීම පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව
11. මුල් ළමාවිය සංවර්ධන ඩිප්ලෝමා පාඨමාලාව
12. පාසල් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව
13. විශේෂ අධ්‍යාපන පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව

    මෙම පාඨමාලාවේ ඇගයීම් ක්‍රමය ලිඛිත සහ ප්‍රායෝගික පරීක්ෂණයකි.
14. සංඥා භාෂා ඩිප්ලෝමා පාඨමාලාව

    මෙම පාඨමාලාවේ ඇගයීම් ක්‍රමය ලිඛිත සහ ප්‍රායෝගික පරීක්ෂණයකි.
15. උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව
16. පාසල් වෘත්තීය මාර්ගෝපදේශය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව
17. අධ්‍යාපන පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ තේමා පාඨමාලාව

    ප්‍රායෝගික ක්‍රියාකාරකම් සහිතව සිදු කරනු ලබන දින තුනක කෙටි පාඨමාලාවකි.
18. බ්‍රේල් සහතික පත්‍ර පාඨමාලාව

    මෙම පාඨමාලාවේ ඇගයීම් ක්‍රමය ලිඛිත සහ ප්‍රායෝගික පරීක්ෂණයකි.

(v) ඔව්. සමහර පාඨමාලා ප්‍රමාදවීමක් සිදු වෙලා අවසන් නොකළ පාඨමාලා තිබෙනවා.

(vi) අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ අධ්‍යාපනපති උපාධි පාඨමාලාව, දෑ අවුරුදු අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව සහ සිව් අවුරුදු අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව.

(ආ) අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ අධ්‍යාපනපති උපාධිය මාස අටකින් පරක්කු වෙලා තිබෙනවා. අවසන් වෙලාත් තිබෙනවා. ඒක 2022දී වෙලා තිබෙන්නේ. 2023දී ඉංග්‍රීසි මාධ්‍ය පාඨමාලාව මාස හතරක ප්‍රමාදයක් වෙලා අවසන් වෙලා තිබෙනවා. 2024දී දෙමළ මාධ්‍ය පාඨමාලා මාස තුනකින් ප්‍රමාද වෙලා අවසන් වෙලා තිබෙනවා. දෑ අවුරුදු අධ්‍යාපනවේදී පාඨමාලාව හා සිව් අවුරුදු අධ්‍යාපනවේදී උපාධි පාඨමාලා සම්බන්ධයෙන් ගැටලුවක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. බඳවා ගැනීම සිදු වෙලා තිබෙන්නේ 2021 වර්ෂයේදී. 14,000ක් විතර බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවලා තිබෙනවා නමුත් 2022දී ආරම්භ කරන්න තිබුණාට, කොරෝනා සහ ආර්ථික අර්බුදය නිසා එය නැවත පරක්කු වෙලා තිබෙනවා. ඊට පස්සේ නැවත වතාවක් ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයට සහ ආයතන සභාවට ඉදිරිපත් කරලා නැවත අනුමැතිය ගන්න සිදු වෙලා තිබෙනවා. මේ කාරණා නිසා ප්‍රමාදයක් සිදු වෙලා තිබෙනවා. දැනට semesters දෙකක විතර විභාග කටයුතු පැවැත්වෙලා නැහැ. ඔක තමයි පිළිතුර.

**ගරු සුනිල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சுனில் ராஜபக்ஷ)
(The Hon. Sunil Rajapaksha)

ගරු කථානායකතුමනි, අපේ නියෝජ්‍ය ඇමතිතුමා අවසාන වශයෙන් දැනුම් දීපු කාරණය අනුව අධ්‍යාපනවේදී ගෞරව උපාධි පාඨමාලාව ආරම්භ කරන්නේ දැනට ක්ෂේත්‍රයේ ඉන්න ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරින් සඳහායි. ඔවුන්ට අවුරුදු දෙකකින් ආරම්භ කරන පාඨමාලාව පටන් ගන්නේ 2023 වර්ෂයේ. දැනට විභාග දෙකක් විතරයි තියලා තිබෙන්නේ. 14,000කින් 5,000ක් තෝරා ගන්නවා. දැන් ඒ 5,000න් 3,000ක් විතර තමයි රැඳිලා ඉන්නේ.

මේ ප්‍රමාදය හේතුකොටගෙන ඉතිරි අය පෞද්ගලික විශ්වවිද්‍යාල කරා ඇදී යමින් ඉන්නවා. අපි දන්නවා, ජාතික අධ්‍යාපන ආයතනය කියන එක ගුරුවරුන්ගේ අධ්‍යාපනයේ මහ ගෙදර වාගේය කියලා. මොන විධියකින් හරි මේ පාඨමාලා ප්‍රමාද වීම නිසා සිසුන් පෞද්ගලික අංශයෙන් උපාධි ලබාගැනීම සඳහා ඇදී යන ප්‍රවණතාව වැඩි වෙලා තිබෙනවා. මෙන්න මේක වළක්වා ගැනීම සඳහා ඉදිරියේදී ගන්නා ක්‍රියාමාර්ග මොනවාද කියලා මම අහන්න කැමතියි.

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)

ගරු කථානායකතුමනි, ඒ ප්‍රශ්නයට අදාළව සමාසික - semesters - දෙකක ඇගැයීම් විභාග ක්‍රම නැවතීමක් සිද්ධ වෙලා තිබෙනවා. ඔය විභාගය පැවැත්වෙන්නේ GPA කියන විභාග ක්‍රමයට. එතැනදී විභාගය කොටස් දෙකකට බෙදලා formative කියන විභාගය පවත්වා තිබෙනවා. Summative කියන විභාගය පවත්වා නැහැ. ඕක තමයි වෙලා තිබෙන්නේ. ජාතික අධ්‍යාපන ආයතනය පවසන්නේ ඉතාම ඉක්මනින් මේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් කැඳවා විභාගය පවත්වනවා කියලායි. ඇත්තටම ප්‍රමාදයක් වෙලා තිබෙනවා. මේ ප්‍රමාදය මත යම් කිසි කාලයක් මේ ශිෂ්‍යයන්ට විවිධ දුෂ්කරතාවලට මුහුණ දෙන්න සිදු වෙලා තිබෙනවා. නමුත් ඒක නිවැරදි කරගන්න මේ වෙද්දි ක්‍රියාමාර්ග ගන්නවා කියන එක තමයි ජාතික අධ්‍යාපන ආයතනය මඟින් ඉදිරිපත් කරන්නේ.

**ගරු සුනිල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சுனில் ராஜபக்ஷ)
(The Hon. Sunil Rajapaksha)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මෙම පාඨමාලාව ආරම්භ කරනකොට එහි ඇගැයීම් ක්‍රමය විධියට දැක්වූයේ continuous assessment ක්‍රමය. ඒ කියන්නේ, මේ පාඨමාලා සම්පූර්ණයෙන් ක්‍රියාත්මක වන්නේ අඛණ්ඩ ඇගැයීම් ක්‍රමයට යටතේ කියන එකයි. නමුත්, මේ වනකොට ඒ සඳහා විභාගත් පැවැත්වෙනවා. මෙන්න මේ පරස්පරතාව ඇති වුණේ කොහොමද කියන එක තමයි මට දැනගන්න ඕනෑ.

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)

ගරු කථානායකතුමනි, අපි Academic Affairs Board එකත් එක්ක ඒ සම්බන්ධයෙන් කථා කළා. එතැනදී ඉදිරි විභාග කටයුතු සම්බන්ධයෙන් තීරණයක් අරගෙන තිබෙනවා. ඒ තීරණය තමයි, SLQF ක්‍රමය ක්‍රියාත්මක කිරීම. ඒ කියන්නේ, ශ්‍රී ලංකාවේ සියලුම උසස් අධ්‍යාපන ආයතන SLQF ක්‍රමය යටතේ පවත්වාගෙන යන එක. එතකොට මුලදී විභාගය පවත්වන ආකාරය පිළිබඳව ලබා දෙන handbook එකේ තිබෙන කාරණා සියලුම විෂය ධාරාවන්ට අදාළ වනවා. එම නිසා ඉදිරියේදී ඔය තත්ත්වය ඇති වන්නේ නැති වෙයි. නිශ්චිතව ගත්තොත්, මේක ක්‍රියාත්මක වන්නේ GPA system එකට කියන එක තමයි කියැවෙන්නේ. මෙතැනදී summative සහ formative කියන කොටස් දෙකම සිද්ධ වනවා. හැබැයි, ඉදිරියේදී මේකත් අනෙකුත් විශ්වවිද්‍යාල හා සමාන්තරව SLQF ක්‍රමය යටතේම කරන්න කියලා නිශ්චිතව දැනුම් දීමක් කරලා තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 7 -1884/2026- (1), ගරු අබූබකර් අතම්බාවා මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## හම්බන්තොට, පඩවුගම ග්‍රා.නි. වසමේ ආරම්භ කරන ලද ඉන්දියානු ආධාර සහිත නිවාස ව්‍යාපෘති: වර්තමාන තත්ත්වය

அம்பாந்தோட்டை, படவுகம கிராம அலுவலர் பிரிவில் இந்திய உதவியின்கீழ் ஆரம்பிக்கப்பட்ட வீடமைப்புக் கருத்திட்டங்கள்: தற்போதைய நிலை

INDIA-ASSISTED HOUSING PROJECTS INITIATED IN PADAWUGAMA GN DIVISION, HAMBANTOTA: CURRENT STATUS

1904/2026

**8.** **ගරු (වෛද්‍ය) සඳරුවන් මදරසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சந்தருவன் மதரசிங்ஹ)
(The Hon. (Dr.) Sandaruwan Madarasinghe)

නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පඩවුගම ග්‍රාම නිලධාරි වසමේ ඉන්දියානු ආධාර යටතේ ආරම්භ කරන ලද නිවාස ව්‍යාපෘති තිබේද;

(ii) එසේ නම්, එම සංඛ්‍යාව කොපමණද;

(iii) එම ව්‍යාපෘතිවල නම් කවරේද;

(iv) එම එක් එක් ව්‍යාපෘතියේ නිවාස සංඛ්‍යාව, ආරම්භ කළ වර්ෂය, වියදම් කරන ලද මුදල සහ වර්තමාන තත්ත්වය ව්‍යාපෘතිය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) එම නිවාස ව්‍යාපෘති වෙනත් ස්ථානයකට ගෙන යෑමේ සැලසුමක් තිබේද;

(vi) එසේ නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அம்பாந்தோட்டை மாவட்டத்தில், லுனுகம்வெஹெர பிரதேச செயலாளர் பிரிவில் படவுகம கிராம அலுவலர் பிரிவில் இந்திய உதவித் திட்டத்தின்கீழ் ஆரம்பிக்கப்பட்ட வீடமைப்புக் கருத்திட்டங்கள் உள்ளனவா;

(ii) ஆமெனில், அவற்றின் எண்ணிக்கை யாது;

(iii) மேற்படி கருத்திட்டங்களின் பெயர்கள் யாவை;

(iv) மேற்படி ஒவ்வொரு கருத்திட்டத்திலும் உள்ள வீடுகளின் எண்ணிக்கை, ஆரம்பிக்கப்பட்ட ஆண்டு, செலவிடப்பட்ட தொகை மற்றும் தற்போதைய நிலைமை கருத்திட்ட வாரியாக வெவ்வேறாக யாவை;

(v) மேற்படி வீடமைப்புக் கருத்திட்டங்களை வேறோர் இடத்துக்குக் கொண்டுசெல்லும் திட்டம் உள்ளதா;

(vi) ஆமெனில், அதற்கான காரணங்கள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா;

(ஆ) இன்றேல், ஏன்?

[ගරු (වෛද්‍ය) සඳරුවන් මදරසිංහ මහතා]

asked the Minister of Housing, Construction and Water Supply:

(a) Will he inform this House -

(i) whether there are housing projects initiated under Indian assistance in the Padawugama Grama Niladhari Division of the Lunugamwehera Divisional Secretary's Division in the Hambantota District;

(ii) if so, the number of such housing projects;

(iii) the names of those projects:

(iv) the number of houses, the year of commencement, the total expenditure and the current status of each project, separately;

(v) whether there is a plan to relocate these housing projects; and

(vi) if so, the reasons for such relocation?

(b) If not, why?

**ගරු ටී.බී. සරත් මහතා (නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரீ.பி. சரத் - வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் பிரதி அமைச்சர்)
(The Hon. T.B. Sarath - Deputy Minister of Housing, Construction and Water Supply)

ගරු කථානායකතුමනි, නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ඔව්.

(ii) නිවාස ව්‍යාපෘති 02කි.

(iii) 1. ගුණපාල තිස්සකුට්ටිආරච්චි ගම

2. ටෙනිසන් එදිරිසූරිය ගම

(iv) • ගුණපාල තිස්සකුට්ටිආරච්චි ගම

නිවාස සංඛ්‍යාව : 24

ආරම්භ කළ වර්ෂය : 2018

වියදම් කරන ලද මුදල : රුපියල් මිලියන 2.16යි

වර්තමාන තත්ත්වය :

එක් ප්‍රතිලාභියෙක් සඳහා රුපියල් 90,000ක් බැගින් ලබා දී අත්තිවාරම් දමා ඇති නමුත් මේ වන විට අඩි 10ක්, 15ක් පමණ වැඩුණු කැලෑවකින් වැසී ගොස් ඇත.

• ටෙනිසන් එදිරිසූරිය ගම

නිවාස සංඛ්‍යාව : 24

ආරම්භ කළ වර්ෂය : 2018

වියදම් කරන ලද මුදල : රුපියල් මිලියන 2.16යි

වර්තමාන තත්ත්වය :

එක් ප්‍රතිලාභියෙක් සඳහා රුපියල් 90,000ක් බැගින් ලබා දී අත්තිවාරම් දමා ඇති නමුත් මේ වන විට අඩි 10ක්, 15ක් පමණ වැඩුණු කැලෑවකින් වැසී ගොස් ඇත.

(v) ඔව්.

(vi) මෙම නිවාස ව්‍යාපෘති ඉදිකර ඇති ඉඩම් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ඒවා වන අතර, එවකට ගම්මාන දෙක ආරම්භ කිරීමේදී මෙම ඉඩම්වල අලි ඇතුන් හා වන සතුන් ගැවසී ඇති අතර, එවැනි රක්ෂිත භූමි ප්‍රදේශයක් මෙම නිවාස ව්‍යාපෘතිය සඳහා යොදාගෙන ඇත.

අදාළ භූමි ප්‍රදේශය රක්ෂිත භූමියක් වන හෙයින් ඊට ඇතුළත් නොවන ලෙස වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් දන්වා එවා ඇති බැවින්, මෙම ව්‍යාපෘතිය ඉදිරියට පවත්වාගෙන යෑමට නොහැකි තත්ත්වයක් උදා වී ඇත.

මේ වන විට මෙම ගම්මාන දෙකෙහි ප්‍රතිලාභීන් වෙත වෙනත් ඉඩමක් ලබා දිය හැකිද යන්න සොයා බලන ලෙස ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් වෙතින් විමසීම් ද කර ඇත.

(ආ) අදාළ නොවේ.

**ගරු (වෛද්‍ය) සඳරුවන් මදරසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சந்தருவன் மதரசிங்ஹ)
(The Hon. (Dr.) Sandaruwan Madarasinghe)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

2015 අවුරුද්දෙන් පසුව ඉන්දියානු ආධාර යටතේ ඉදිකරන ලද නිවාස ව්‍යාපෘති ගත්තොත්, 2017-2018 කාලය තුළ එම ව්‍යාපෘති ඉදිකරන ලද ගම්මාන 25න්, ගම්මාන 7ක් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ඉඩම්වල පිහිටා තිබෙනවා. ඒ වාගේම, 2019-2021 කාලය තුළ නිවාස ව්‍යාපෘති ඉදිකරන ලද ගම්මාන 26න්, ගම්මාන 7ක් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ඉඩම්වල පිහිටා තිබෙනවා. විශේෂයෙන්ම හම්බන්තොට දිස්ත්‍රික්කය කියන්නේ අලි-මිනිස් ගැටුම බහුල දිස්ත්‍රික්කයක්. මේ අනෙක් ගම්මාන සම්බන්ධයෙන් ගන්නා ක්‍රියාමාර්ග මොනවාද කියලා මම ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි.

**ගරු ටී.බී. සරත් මහතා**
(மாண்புமிகு ரீ.பி. சரத்)
(The Hon. T.B. Sarath)

ගරු මන්ත්‍රීතුමනි, අනෙකුත් ගම්මාන පිළිබඳව අපි දිස්ත්‍රික් ලේකම්තුමා සහ අමාත්‍යාංශයේ නිලධාරින් එක්ක සාකච්ඡා කරලා තිබෙනවා. දැනට සාකච්ඡා කර ගත් පරිදි, ඒ ගම්මාන නිදහස් කරගෙන ඉදිරි කටයුතු කරන්න පුළුවන්. ඒ ගම්මානවල නිවාස 1,200 ගණනක් තිබුණත් දැනට පදිංචි නිවාස හැටියට 842ක් වාගේ ප්‍රමාණයක් තමයි හඳුනා ගන්න පුළුවන් වෙලා තිබෙන්නේ. ඉදිරියේදී ඒ නිවාස 842 ඉදිකිරීම් ආරම්භ කරන්න මුදල් වෙන් කරලා තිබෙනවා. ඉන්දියානු ආධාර යටතේ තමයි මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක වෙන්නේ. ඒ නිවාස ඉදිකිරීම් කටයුතු සඳහා එම මුදල් වෙන් කර තිබෙනවා.

**ගරු (වෛද්‍ය) සඳරුවන් මදරසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சந்தருவன் மதரசிங்ஹ)
(The Hon. (Dr.) Sandaruwan Madarasinghe)
මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, විශේෂයෙන්ම මේ නිවාස ව්‍යාපෘති අතරින් 2017-2018 කාලයේදී ගම්මාන 25ක නිවාස 576ක් සඳහා මුල්ගල් තබා තිබුණත් මේකෙන් සම්පූර්ණ නිමි නිවාස තිබෙන්නේ 111ක් විතරයි. ඊළඟට, 2019 කාලයේදී ගම්මාන 26ක, නිවාස 600ක් සඳහා මුල්ගල් තබා තිබෙනවා. මේකේ නිමි නිවාස තිබෙන්නේ නිවාස 32ක් විතරයි. විශාල මුදලක් වියදම් කරලා හිටපු ඇමතිවරු තමන්ගේ "ස" අකුරින් නම් දමාගෙන මේ නිවාස ව්‍යාපෘති ආරම්භ කළාට මේවායෙන් හතරෙන් එකකවත් වැඩ අවසන් කරලා නැහැ. මේ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග මොනවාද කියලා මම ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් දැනගන්න කැමැතියි.

**ගරු ටී.බී. සරත් මහතා**
(மாண்புமிகு ரீ.பி. சரத்)
(The Hon. T.B. Sarath)
මේ පිළිබඳව තොරතුරු හොයාගෙන තිබෙනවා. ඒ නිවාසවල පදිංචියට නම් කරන ලද සමහර අය කොළඹ දිස්ත්‍රික්කයේ අය. කොළඹ දිස්ත්‍රික්කයේ අයත් ඒ නිවාසවලට නම් කරලා තිබෙනවා, ගරු කථානායකතුමනි. අක්‍රමිකතා විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒ පිළිබඳව සොයා බලන්න අපි කමිටුවකුත් පත් කරලා තිබෙන්නේ. දැනට නිවාස 842ක් පමණ සඳහා නාම ලේඛන තිබෙනවා. නමුත්, ඒ නාම ලේඛනවල සඳහන් අයත් ඒ ස්ථානවල පදිංචියට ගිහිල්ලා නැහැ, වනඅලි ප්‍රශ්නය සහ සතුන් සම්බන්ධයෙන් පවතින ප්‍රශ්න නිසා. කොහොම නමුත් මේවා 2017, 2018, 2019 කාලයේ ආරම්භ කරපු ව්‍යාපෘති. එවකට මේ ව්‍යාපෘති ආරම්භ කරනකොට නිවාස ඇමතිවරයා විධියට හිටියේ වත්මන් විපක්ෂ නායකතුමා. එතුමාට දැන් පුදුමාකාර අදහස් තිබෙන්නේ. හැබැයි, තමන් කටයුතු කරපු නිවාස අමාත්‍යාංශය යටතේ නිවාස ටික හදා ගන්නවත් සැලසුම් තිබිලා නැහැ. ඒක තමයි මේක ඇතුළේ තිබෙන ඇත්ත ප්‍රශ්නය. දැන් අපට - වර්තමාන ආණ්ඩුවට - උපදෙස් දෙන හොඳම උපදේශකයා තමයි මේ ව්‍යාපෘතිවල නිර්මාතෘවරයා. ඒවායේ තිබෙන අක්‍රමිකතා පිළිබඳව සොයා බලන්න අපි කටයුතු කරනවා. ඉදිරියේදී ඒ සඳහා ක්‍රියාමාර්ග ගන්නවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය.

ප්‍රශ්න අංක 2 -122/2024- (1), ගරු චමින්ද විජේසිරි මහතා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## මෑත කාලීන සහල් ආනයන: විස්තර
## அண்மைய அரிசி இறக்குமதிகள்: விபரம்
RECENT RICE IMPORTS: DETAILS

567/2025

**3. ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වෙළෙඳ පොළ සහල් හිඟයට පිළියමක් ලෙස මෑතකදී සහල් ආනයනය කිරීමට තීරණය කරන ලද දිනය කවරේද;

(ii) ඒ අනුව සහල් ආනයනය කරන ලද රජයේ සහ පෞද්ගලික ආයතනවල නම්, එම එක් එක් ආයතනය විසින් ආනයනය කරන ලද සහල් ප්‍රමාණය සහ එමඟින් රජයට ලැබුණු බදු ආදායම වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) වී මිලදී ගැනීම, වී ගබඩා කිරීම සහ සහල් අලෙවි කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය අංශයේ දායකත්වය වැඩි කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) சந்தையில் அரிசித் தட்டுப்பாட்டுக்குத் தீர்வாக அண்மைக் காலத்தில் அரிசி இறக்குமதி செய்வதற்குத் தீர்மானிக்கப்பட்ட திகதி யாது என்பதையும்;

(ii) அதன் பிரகாரம், அரிசி இறக்குமதி செய்த அரச மற்றும் தனியார் நிறுவனங்களின் பெயர்கள், அத்தகைய ஒவ்வொரு நிறுவனத்தினாலும் இறக்குமதி செய்யப்பட்ட அரிசியின் அளவு மற்றும் அதன்மூலம் அரசாங்கத்துக்குக் கிடைத்த வரி வருமானம் வெவ்வேறாக யாவை என்பதையும்;

(iii) நெல் கொள்வனவு, களஞ்சியப்படுத்தல் மற்றும் அரிசி விற்பனை செய்தல் தொடர்பில் அரசாங்கத் தரப்பின் பங்களிப்பை அதிகரிப்பதற்காக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Trade, Commerce, Food Security and Co-operative Development:

(a) Will he inform this House -

(i) the date on which the decision on rice importation was made to address the shortage of rice in the market;

(ii) accordingly, the names of the government and private institutions which imported rice, the respective quantities imported by each institution, and the tax revenue received by the Government, separately; and

[ගරු රෝහණ බණ්ඩාර මහතා]

(iii) the measures that will be taken by the Government to enhance the contribution of the public sector in the purchase and storage of paddy and selling of rice?

(b) If not, why?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
* சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :
* Answer tabled:

(අ) (i) 2025 ඔක්තෝබර් මස 15.

(ආනයන පාලන බලපත්‍ර යටතේ සහල් ආනයනය කිරීම තාවකාලිකව අත්හිටුවා ඇති අතර, 2025 ඔක්තෝබර් මස 15වන දිනැති අංක 2458/43 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයට අනුව 2025.10.15 දින සිට 2025.11.10 දින දක්වා කිරි සම්බා සහල්වලට සමාන GR 11 (HS code 1006.30.29) සහල් ආනයනය කිරීමට අවසර ලබා දෙන ලදී.

(ii) එක් ආනයනකරුවකු වෙත මෙට්‍රික් ටොන් 520ක උපරිමයකට යටත්ව සහල් ආනයනය කරනු ලැබූ රජයේ සහ පෞද්ගලික ආයතනයන්, එම එක් එක් ආයතනය විසින් ආනයනය කරන ලද සහල් ප්‍රමාණයන් සහ එමඟින් රජයට ලැබුණු බදු ආදායම වෙන් වෙන් වශයෙන් ඇමුණුමෙහි** දක්වා ඇත.

(iii)
- 2026 වසර සඳහා වී මිලදී ගැනීමට රජය විසින් රුපියල් මිලියන 10,000ක මුදලක් වෙන් කර දී ඇත. ඒ අනුව, වී අලෙවි මණ්ඩලය විසින් වී මෙට්‍රික් ටොන් 80,000ක් මිලදී ගැනීමට අපේක්ෂා කෙරේ.
- මිලදී ගන්නා ලද වී තොග ගබඩා කිරීම සඳහා මෙට්‍රික් ටොන් 326,710ක ධාරිතාවකින් යුත් ගබඩා 353ක් වී අලෙවි මණ්ඩලය සතුව පවතී. මීට මෙට්‍රික් ටොන් 250,000ක ධාරිතාවකින් යුත් ගබඩා ප්‍රමාණයක් දැනට වී ගබඩා කළ හැකි මට්ටමේ පවතී. මෙම වී ගබඩා දිස්ත්‍රික් මට්ටමින් අදියර කිහිපයක් යටතේ අලුත්වැඩියා කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කරමින් ගබඩා පහසුකම් ඉහළ නැංවීමට කටයුතු සිදු කර ඇත.
- වී අලෙවි මණ්ඩලය සතු වී තොග සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව හරහා සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන් වෙතින් සහල් බවට පත් කර වෙළෙඳ පොළට නිකුත් කිරීමේ ක්‍රමවේදයක් සකස් කර ඇත. ඒ අනුව, වී අලෙවි මණ්ඩලය සතු වී තොග මේ වනවිටත් සහල් මෙට්‍රික් ටොන් 5,300ක් බවට පත් කර ඇති අතර මෙම සහල් ලංකා සතොස ආයතනය, සමුපකාර සමිති හා පෞද්ගලික අංශය හරහා වෙළෙඳ පොළ වෙත නිකුත් කිරීම සිදු කරනු ලබයි.
- එසේම සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව විසින් 'ත්‍රිපෝෂ' නිපදවීම සඳහා අවශ්‍ය සුදු කැකුළු සහල් මෙට්‍රික් ටොන් 400ක් සීමාසහිත ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම වෙත මාසිකව ලබා දීමට කටයුතු කරයි.

(ආ) අදාළ නොවේ.

## හිඟුරක්ගොඩ සහ පන්නෙගමුව සහල් සැපයුම් සංකීර්ණ: වත්මන් තත්ත්වය
### ஹிங்குரக்கொட மற்றும் பன்னெகமுவிலுள்ள அரிசி வழங்கல் கட்டடத் தொகுதிகள்: தற்போதைய நிலை
### RICE SUPPLYING COMPLEXES IN HINGURAKGODA AND PANNEGAMUWA: CURRENT STATUS

641/2025

**4. ගරු අජිත් පී. පෙරේරා මහතා (ගරු කිංස් නෙල්සන් මහතා වෙනුවට)**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா - மாண்புமிகு கிங்ஸ் நெல்சன் சார்பாக)
(The Hon. Ajith P. Perera on behalf of the Hon. Kins Nelson)

වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) සමුපකාර තොග වෙළඳ සංස්ථාවට අයත්, පැයකට සහල් කිලෝග්‍රෑම් 2,000 බැගින් සැපයීමේ ධාරිතාවෙන් යුතු සහල් සැපයීමේ සංකීර්ණ 2ක් හිඟුරක්ගොඩ සහ පන්නෙගමුව ප්‍රදේශවල පිහිටා ඇති බව දන්නේද;

(ii) එම සංකීර්ණ අවසන් වරට භාවිතයට ගනු ලැබූ වර්ෂය කවරේද;

(iii) මෙම සංකීර්ණ ඌන උපයෝජිතව පැවතීමට හේතු කවරේද;

(iv) මේ සම්බන්ධව නිකුත් කර ඇති විගණන වාර්තාවේ දැක්වෙන කරුණු කවරේද;

(v) මෙම සංකීර්ණ නැවත ක්‍රියාත්මක තත්ත්වයට පත් කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கூட்டுறவு மொத்த விற்பனைக் கூட்டுத்தாபனத்துக்குச் சொந்தமான, மணித்தியாலத்துக்கு 2,000 கிலோ கிராம் அரிசி வழங்கல் கொள்ளளவைக் கொண்ட 2 அரிசி வழங்கல் கட்டடத் தொகுதிகள் ஹிங்குரக்கொட மற்றும் பன்னெகமுவ பிரதேசங்களில் அமைந்துள்ளமையை அறிவாரா என்பதையும்;

(ii) அக்கட்டடத் தொகுதிகள் இறுதியாகப் பயன்படுத்தப்பட்ட வருடம் யாது என்பதையும்;

(iii) இக்கட்டடத் தொகுதிகள் குறைப் பயன்பாட்டில் காணப்படுவதற்கான காரணங்கள் யாவை என்பதையும்;

(iv) இந்த விடயம் தொடர்பாக வெளியிடப்பட்டுள்ள கணக்காய்வு அறிக்கையில் குறிப்பிடப்படும் விடயங்கள் யாவை என்பதையும்;

(v) மேற்படி கட்டடத் தொகுதிகளை மீள இயக்குவதற்கு மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

---

***** පුස්තකාලයේ තබා ඇත.***
*** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*** Placed in the Library.*

asked the Minister of Trade, Commerce, Food Security and Co-operative Development:

(a) Will he inform this House -

(i) whether he is aware that there are two rice supplying complexes belonging to the Co-operative Wholesale Establishment located in the Hingurakgoda and Pannegamuwa areas, each having a capacity to supply 2,000 kilograms of rice per hour;

(ii) the year in which the aforesaid complexes were last put into use;

(iii) the reasons for the underutilization of the aforesaid complexes;

(iv) the facts stated in the audit report issued in this regard; and

(v) the measures that will be taken to restore these complexes to operational status?

(b) If not, why?

**ගරු ආර්.එම්. ජයවර්ධන මහතා (වෙළෙඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆர்.எம். ஜயவர்தன - வர்த்தக, வாணிப மற்றும் உணவுப் பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. R.M. Jayawardhana - Deputy Minister of Trade, Commerce and Food Security)

ගරු කථානායකතුමනි, වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්

(ii) හිඟුරක්ගොඩ - 2019

පන්නෙගමුව - 2018

(iii) කාලයක සිට සහල් නිෂ්පාදන ක්‍රියාවලියෙන් බැහැරව පැවතීම හේතුවෙන් යන්ත්‍ර සූත්‍ර දිරාපත්ව සහ ගොඩනැඟිල්ල අබලන් තත්ත්වයට පත් වීම.

(iv) වසර 18කට ආසන්න කාලයක් ඌන උපයෝජිතව පැවති පැයකට කිලෝග්‍රෑම් 2,000ක් බැගින් සැකසීමේ ධාරිතාවක් සහිත සංස්ථාව සතු හිඟුරක්ගොඩ සහ පන්නෙගමුව සහල් සැකසීමේ සංකීර්ණ දෙක 2024 අගෝස්තු 20 දින වනවිටත් නිෂ්කාර්යව පැවතීම.

(v) ඔව්.

මෙම සංකීර්ණ නැවත ක්‍රියාත්මක තත්ත්වයට පත් කිරීම සම්බන්ධයෙන් සලකා බලමින් සිටී. විශේෂයෙන්ම අක්කර 9ක වපසරයකින් යුක්ත වන මෙම වත්කම් ප්‍රශස්ත ආකාරයෙන් භාවිතය සඳහා යොදා ගත හැකි ආකාරය පිළිබඳව ශක්‍යතා අධ්‍යයනයක නිරත වීමෙන් අනතුරුව රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව හරහා මෙම වත්කම් උපයෝජනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට නියමිතයි.

(ආ) අදාළ නොවේ.

## කළුතර බන්ධනාගාරය: රැඳවි තදබදය සහ කාර්ය මණ්ඩල හිඟය

### களுத்துறை சிறைச்சாலை: கைதிகளின் இட நெரிசல் மற்றும் ஆளணிப்பற்றாக்குறை

### KALUTARA PRISON: PRISONER OVERCROWDING AND STAFF SHORTAGE

1881/2026

**5.** **ගරු ජගත් විතාන මහතා**
(மாண்புமிகு ஜகத் விதான)
(The Hon. Jagath Vithana)

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කළුතර බන්ධනාගාරයේ අනුමත රැඳවියන් සංඛ්‍යාව 811ක් වුවද, දැනට එහි 2,000කට ආසන්න පිරිසක් රඳවා තැබීමෙන් ඇති වී ඇති තදබදය පාලනය කිරීමට ගෙන ඇති පියවර කවරේද;

(ii) එම බන්ධනාගාරයේ බන්ධනාගාර නියාමක සහ සැරයන් තනතුරු සඳහා පවතින විශාල පුරප්පාඩු සංඛ්‍යාව කඩිනමින් පිරවීමට පියවර ගන්නා දිනය කවරේද;

(iii) නිලධාරි හිඟය හේතුවෙන් දැනට සේවයේ නියුතු නිලධාරින්ට දින කිහිපයක් අඛණ්ඩව සේවය කිරීමට සිදු වන තත්ත්වය සමනය කිරීමට ඇති කෙටි කාලීන පියවර කවරේද;

(iv) පසුගිය වසරේ සිදු කළ ස්ථාන මාරුවීම්වලදී හිස් වූ තනතුරු සඳහා නව නිලධාරින් අනුයුක්ත නොකිරීමට හේතු කවරේද;

(v) ගාල්ල සහ මාතර බන්ධනාගාරවල සේවක අතිරික්තයක් සිටියදී කළුතර බන්ධනාගාරයේ සේවක හිඟයක් පැවතීමට හේතු වී ඇති අවිධිමත් සේවක මාරුවීම් නිවැරදි කරන්නේ කෙසේද;

(vi) නිලධාරින්ගේ හිඟය හේතුවෙන් රැඳවියන් අධිකරණයට ඉදිරිපත් කිරීම ප්‍රමාද වීමෙන් අධිකරණ කටයුතුවලට ඇති වන බාධා වැළැක්වීමට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) களுத்துறை சிறைச்சாலையில் தடுத்துவைக்க அனுமதிக்கப்பட்டுள்ள கைதிகளின் எண்ணிக்கை 811ஆகவிருப்பினும், தற்போது அங்கு சுமார் 2,000 கைதிகள் தடுத்து வைக்கப்பட்டுள்ளதால் ஏற்பட்டுள்ள நெருக்கடியைக் கட்டுப்படுத்த எடுத்துள்ள நடவடிக்கை யாது என்பதையும்;

(ii) அந்தச் சிறைச்சாலையில் சிறைச்சாலைக் காவலாளர் மற்றும் சார்ஜன்ட் பதவிகளில் காணப்படுகின்ற பெரும் எண்ணிக்கையிலான வெற்றிடங்களைத் துரிதமாக நிரப்புவதற்கு நடவடிக்கை எடுக்கப்படும் திகதி யாது என்பதையும்;

(iii) அலுவலர் பற்றாக்குறை காரணமாகத் தற்போது சேவையிலுள்ள அலுவலர்கள், சில நாட்களுக்குத் தொடர்ச்சியாகக் கடமையாற்ற வேண்டியிருக்கின்ற நிலைமையைச் சீர்செய்வதற்கு ஏற்பாடு செய்யப்பட்டுள்ள குறுங்கால நடவடிக்கை யாது என்பதையும்;

[ගරු ජගත් විතාන මහතා]

(iv) கடந்த ஆண்டில் மேற்கொள்ளப்பட்ட இடமாற்றங்களின்போது வெற்றிடமான பதவிகளுக்குப் புதிய அலுவலர்கள் இணைக்கப்படாமைக்கான காரணங்கள் யாவை என்பதையும்;

(v) காலி மற்றும் மாத்தறை சிறைச்சாலைகளில் ஊழியர் மிகை காணப்படுகின்ற நிலையில், களுத்துறை சிறைச்சாலையில் அலுவலர் வெற்றிடம் ஏற்படுவதற்குக் காரணமாக அமைந்துள்ள முறையற்ற அலுவலர் இடமாற்றங்கள் எவ்வாறு சீர்செய்யப்படும் என்பதையும்;

(vi) அலுவலர் பற்றாக்குறை காரணமாகத் தடுத்துவைக்கப்பட்டுள்ளவர்களை நீதிமன்றில் முன்னிலைப்படுத்தும் பணிகளில் தாமதம் ஏற்படுவதால், நீதிமன்ற நடவடிக்கைகளுக்கு ஏற்படுகின்ற இடையூறுகளைத் தடுக்க எடுக்கப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Justice and National Integration:

(a) Will he inform this House the -

(i) measures that have been taken to manage the overcrowding at the Kalutara Prison, where approximately 2,000 inmates are currently held despite an approved capacity of 811;

(ii) date on which steps will be taken forthwith to fill the existing huge number of vacancies for the positions of Superintendent and Sergeant at the said prison;

(iii) short-term measures intended to provide relief to officers who are currently compelled to work for several days due to the staff shortage;

(iv) reasons for the failure to attach new officers to the vacancies created by the transfers made last year;

(v) measures taken to rectify the irregular staff transfers that have resulted in a personnel shortage at Kalutara Prison, while a surplus of staff reportedly exists at the Galle and Matara Prisons; and

(vi) measures taken to prevent disruptions to court proceedings caused by delays in producing inmates before the court due to the shortage of officers?

(b) If not, why?

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) කළුතර බන්ධනාගාරයේ පමණක් නොව අනෙකුත් බොහෝ බන්ධනාගාර ආයතන තුළද රැඳවිය හැකි ජනගහනය ඉක්මවා රඳවා ඇති බැවින් තදබදයක් නිර්මාණය වී ඇත. මෙය දීර්ඝ කාලයක් තිස්සේ පවතින තත්ත්වයකි. ඒ අනුව මේ වනවිට ඉඩකඩ පවතින බන්ධනාගාර ආයතන කිහිපයක ගොඩනැඟිලි ඉදි කරමින් පවතින අතර කළුතර බන්ධනාගාරය තුළද දෙමහල් ගොඩනැඟිලි දෙකක් ඉදිකිරීම සඳහා අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු සිදු වෙමින් පවතී.

(ii) බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ බන්ධනාගාර නියාමක තනතුර සඳහා බඳවා ගැනීම්වලට අදාළව 2025 වර්ෂයේදී නියාමක නිලධාරින් 317ක්ද, ස්වේච්ඡා බලසේනාවෙහි සේවයෙහි නියුතු හමුදා නිලධාරින් 13ක්ද බඳවාගෙන ඇත. තවද, නියාමක තනතුරු 544ක් බාහිර බඳවා ගැනීම සඳහා ලිඛිත විභාගය පවත්වා ප්‍රතිඵල නිකුත් කර ඇති අතර ශාරීරික යෝග්‍යතාව ඇගැයීමේ සම්මුඛ පරීක්ෂණය 2026.02.13, 14, 15 සහ 20, 21, 22 දිනවල පවත්වා ඇත. නියාමක තනතුරු 26ක් සඳහා අභ්‍යන්තර උසස් කිරීම මඟින් බඳවා ගැනීමට අයදුම්පත් කැඳවා ඇති අතර යෝග්‍යතා ඇගැයීම් සම්මුඛ පරීක්ෂණය 2026 මාර්තු මස පැවැත්වීමට නියමිතය. මෙම නව නිලධාරින් මාස 03ක පුහුණුවෙන් පසු ජූනි මස අවසන් වනවිට බන්ධනාගාරවලට අනුයුක්ත කිරීමට කටයුතු කරනු ලැබේ.

2024.12.31 දිනට බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සැරයන් තනතුරේ පිරිමි 338ක් හා කාන්තා 18ක් පුරප්පාඩුව පවතින අතර එම පුරප්පාඩු පිරවීම සඳහා අනුමැතිය ලැබී ඇත. ඒ අනුව, සැරයන් පිරිමි තනතුරු 225ක් හා කාන්තා තනතුරු 12ක් ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව මත උසස් කිරීම සඳහා නියාමක නිලධාරින් අතුරින් අයදුම්පත් කැඳවා ඇති අතර එම අයදුම්පත් තේරීමේ කටයුතු සඳහා දෙපාර්තමේන්තු කමිටුවක් වෙත යොමු කර ඇත. එම කටයුතු අවසන් වීමෙන් පසු සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමේ කටයුතු සිදු කිරීමට නියමිතව ඇති අතර 2026 ජූනි මස නිලධාරින් උසස් කිරීමේ කටයුතු සිදු කිරීමට නියමිතව ඇත.

ලිඛිත විභාගය මත සැරයන් පිරිමි තනතුරු 113ක් හා කාන්තා තනතුරු 6ක් සම්පූර්ණ කිරීම සඳහා කැඳවීමේ නිවේදනය විභාග දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියෙහි පළ කර ඇති අතර මාර්ගගත ක්‍රමය ඔස්සේ 2026.02.25 දින සිට 2026.03.25 දින දක්වා අයදුම්පත් භාර ගැනීම සිදු කරනු ලැබේ. එම විභාගය 2026 ජූනි මස විභාග දෙපාර්තමේන්තුව මඟින් පැවැත්වීමට නියමිතව ඇත.

(iii) මෙම තත්ත්වය කළුතර බන්ධනාගාරයේ පමණක් නොව වෙනත් බන්ධනාගාර ආයතන තුළද පවතින තත්ත්වයක් වන අතර ඉහත සඳහන් කළ නව බඳවා ගැනීම් තුළින් හා උසස් කිරීම් මඟින් නිලධාරින්ට දින කීපයක් අඛණ්ඩව සේවය කිරීමට සිදු වන තත්ත්වය සමනය කිරීමට හැකි වනු ඇත.

(iv) බන්ධනාගාර දෙපාර්තමේන්තුව සඳහා 2013 වර්ෂයේ අනුමත කරන ලද කාර්ය මණ්ඩලය දැනට සිටින රැඳවියන් සංඛ්‍යාව හා කාර්යභාරය ඉටු කිරීමට ප්‍රමාණවත් නොවීම හේතුවෙන් සමස්ත බන්ධනාගාර දෙපාර්තමේන්තුව තුළ නිලධාරි හිඟතාවක් පවතී. මෙම හිඟතාව හේතුවෙන් ස්ථාන මාරුවීම්වලදී කළුතර ආයතනයට අනුමත නිලධාරින් සංඛ්‍යාවට ගැළපෙන පරිදි නිලධාරින් අනුයුක්ත කිරීමට අපහසුතාවක් මතුව ඇත. එකී හේතු මත අනෙක් බොහෝ බන්ධනාගාර ආයතනවලටද ප්‍රමාණවත් නිලධාරින් සංඛ්‍යාවක් අනුයුක්ත කිරීමට අපහසු වී ඇත. එහෙත් පවතින නිලධාරි හිඟතාව ඉදිරි බඳවා ගැනීම්වලදී හා ස්ථාන මාරුවීම්වලදී සම්පූර්ණ කිරීමට කටයුතු කරනු ලැබේ. තවද,

නිලධාරි හිඟතාවක් ආයතන තුළ පැවතියද නිලධාරීන් එකම සේවා ස්ථානයක දිගු කාලයක් රැඳී සිටීම සම්බන්ධයෙන් විගණන විමසුම්වලින් පවා කරුණු පෙන්වා දී ඇති අතර ඒ අනුව වාර්ෂික ස්ථාන මාරුවීම් සිදු කරන බවත් වැඩිදුරටත් වාර්තා කරමි. තවද, 2026.01.09 දිනෙන් පසුවද තවත් නිලධාරීන් 11දෙනෙකු කළුතර බන්ධනාගාරයේ රාජකාරි කිරීමට හැකි වන පරිදි කටයුතු සිදු කර ඇත.

(v) ගාල්ල බන්ධනාගාරය සඳහා අනුමත නිලධාරි සංඛ්‍යාව 249කි. දැනට සිටින සංඛ්‍යාව 153ක් පමණ වේ. තවද, මාතර බන්ධනාගාරය සඳහා අනුමත නිලධාරි සංඛ්‍යාව 206කි. එහෙත් සිටින සංඛ්‍යාව 151ක් පමණ වේ. ඒ අනුව මෙම බන්ධනාගාර ආයතන තුළ නිලධාරීන්ගේ අතිරික්තයක් නොමැත.

(vi) බන්ධනාගාරය තුළ පවතින රැඳවි තදබදය හා පවතින අනෙකුත් සම්පත් සීමාවන් නිසා ඇතැම් අවස්ථාවලදී අධිකරණ වෙත රැඳවියන් ඉදිරිපත් කිරීම යම් ප්‍රමාදයක් සිදු විය හැකි නමුත් එය දිනපතා සිදු වන තත්ත්වයක් නොවන අතර එය හුදෙක් නිලධාරි හිඟතාව නිසා පමණක්ම ඇති වන තත්ත්වයක්ද නොවේ. කෙසේ නමුත් මේ වනවිට එවැනි ප්‍රමාදයන් අවම කිරීමට කටයුතු කර ඇති බවද දන්වා සිටිමි. තවද මෙය කළුතර බන්ධනාගාරයේ පමණක් නොව අනෙක් බන්ධනාගාර ආයතනවලද විවිධ හේතු නිසා ඇති වන තත්ත්වයකි. කෙසේ නමුත් මේ වනවිට බන්ධනාගාර දෙපාර්තමේන්තුවට නව බස් රථ, වෑන් රථ ආදිය මිලදී ගැනීමටද කටයුතු කර ඇත. තවද ඉදිරියේදී නව බඳවා ගැනීම් හා උසස්වීම්ද සිදු කරන බැවින් මෙවැනි ප්‍රමාදයන් තවදුරටත් අවම කර ගැනීමට හැකි වනු ඇත.

එමෙන්ම බන්ධනාගාර දෙපාර්තමේන්තුව සඳහා වර්තමානයේ අවශ්‍යව පවතින සේවක සංඛ්‍යාව පිළිබඳ කාර්ය මණ්ඩල සමාලෝචනයක්ද සිදු කරමින් පවතින අතර, ඒ අනුව ඉදිරියේදී අනුමත කාර්ය මණ්ඩලය වැඩි කර ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා ගැනීමටද අපේක්ෂා කෙරේ.

(ආ) අදාළ නොවේ.

## අම්පාර වෙරළ තීරය: ඝන අපද්‍රව්‍ය කළමනාකරණය
## அம்பாறை கரையோரப் பிரதேசம்: திண்மக் கழிவு முகாமைத்துவம்
## AMPARA COASTLINE: SOLID WASTE MANAGEMENT

1884/2026

**7. ගරු අබූබකර් අතම්බාවා මහතා**
(மாண்புமிகு அபூபக்கர் ஆதம்பாவா)
(The Hon. Aboobucker Athambawa)

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) අම්පාර වෙරළ තීරයට විශාල වශයෙන් එකතු වන ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම සඳහා දීර්ඝ කාලීන සහ තිරසර ක්‍රමවේදයක් නොමැති වීම හේතුවෙන් අර්බුදකාරී තත්ත්වයක් මතුව ඇති බවත්;

(ii) එම වෙරළ තීරයේ අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා භාවිත කරනු ලබන ස්ථානවල ධාරිතාව සම්පූර්ණ වී ඇති හෝ ඉක්මවා ඇති බැවින්, පළාත් පාලන ආයතනවලට අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා සුදුසු ඉඩම් සොයා ගැනීමට නොහැකි වීමෙන් පරිසර දූෂණය හා සෞඛ්‍ය ගැටලු වර්ධනය වෙමින් පවතින බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) අම්පාර වෙරළ තීරයේ දැනට පවතින ඝන අපද්‍රව්‍ය හා සම්බන්ධ ගැටලුව කළමනාකරණය කිරීම සඳහා ගනු ලබන කඩිනම් පියවර කවරේද;

(ii) විදුලිබල නිෂ්පාදනය, ජෛව වායු නිෂ්පාදනය, ප්‍රතිචක්‍රීකරණය, ඉදිකිරීම් ද්‍රව්‍ය නිෂ්පාදනය සහ කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය ඇතුළුව සංයුක්ත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රමවේදයක් මෙම කලාපය තුළ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් යම් සැලැස්මක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பொது நிருவாகம், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அம்பாறை கரையோரப் பிரதேசத்தில் அதிகளவில் ஒன்றுசேரும் திண்மக் கழிவுகளை முகாமைத்துவம் செய்வதற்கு நீண்டகால மற்றும் நிலைபேறான முறைமைகள் இல்லாததன் காரணமாக நெருக்கடி நிலை ஏற்பட்டுள்ளது என்பதையும்;

(ii) மேற்படி கரையோரப் பிரதேசத்தில் கழிவுகளைக் கொட்டுமிடங்கள் அதன் கொள்ளளவை அடைந்துள்ள நிலையில் அல்லது விஞ்சியுள்ள நிலையில் உள்ளூராட்சி மன்றங்களால் கழிவுகளைக் கொட்டுவதற்கு பொருத்தமான இடங்களைக் கண்டறிய முடியாததன் காரணமாக சுற்றுச்சூழல் சீர்கேடுகள் மற்றும் சுகாதாரப் பிரச்சினைகள் அதிகரித்து வருகின்றன என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) அம்பாறை கரையோரப் பிரதேசத்தில் தற்போது நிலவும் திண்மக் கழிவுப் பிரச்சினையை முகாமைத்துவம் செய்வதற்கு மேற்கொள்ளப்படும் துரித நடவடிக்கை யாது என்பதையும்;

(ii) மின்னுற்பத்தி, உயிர்வாயு உற்பத்தி, மீள்சுழற்சி, நிர்மாணப் பொருட்கள் தயாரிப்பு, கூட்டெரு தயாரிப்பு போன்றவை அடங்கலான ஒருங்கிணைந்த திண்மக் கழிவு முகாமைத்துவத்தை இப்பிராந்தியத்தில் நடைமுறைப்படுத்துவது தொடர்பாக ஏதேனும் திட்டமுள்ளதா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration, Provincial Councils and Local Government:

(a) Is he aware that -

(i) a crisis situation has arisen due to the lack of a long-term and sustainable system for managing the massive amount of solid waste accumulated on the Ampara coastline; and

(ii) since the sites used for dumping waste along the said coastline have reached or exceeded their capacity, environmental pollution and health-related issues are increasing owing to the inability of local authorities to identify suitable lands for waste disposal?

[ගරු අබුබකර් අතම්බාවා මහතා]

(b) Will he inform this House -

(i) the rapid steps taken forthwith to manage the existing problem of solid waste on the Ampara coastline; and

(ii) whether there is a plan to implement a comprehensive solid waste management system in this region, including electricity generation, biogas production, recycling, the manufacture of construction materials and the production of compost fertilizer?

(c) If not, why?

**ගරු පී. රුවන් සෙනරත් මහතා (පළාත් සභා සහ පළාත් පාලන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு பீ. ருவன் செனரத் - மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சிப் பிரதி அமைச்சர்)
(The Hon. P. Ruwan Senarath - Deputy Minister of Provincial Councils and Local Government)

ගරු කථානායකතුමනි, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්.

(ii) ඔව්.

(ආ) (i)
- දෛනික කසළ රැස් කිරීමේ සහ බැහැර කිරීමේ සේවා ශක්තිමත් කිරීම.
- තාවකාලික නොදිරන කසළ රැස් කිරීමේ මධ්‍යස්ථාන පවත්වා ගැනීම.
- මහජනතාව දැනුවත් කිරීමට අවශ්‍ය පියවර ගැනීම.
- නිරන්තර අධීක්ෂණ යන්ත්‍රණයක් ක්‍රියාත්මක කරවීම.
- අනෙකුත් පළාත් පාලන ආයතනවල සහයෝගයෙන් ඒකාබද්ධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- අෂ්රෆ් නගර් සනීපාරක්ෂක බිම් පිරවුම කාර්යක්ෂමව භාවිතයට ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

(ii) ඔව්.

ඒකාබද්ධ අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රවේශයක් මඟින් විදුලිය උත්පාදනය, ජීව වායු නිෂ්පාදනය, කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය සහ ප්‍රතිචක්‍රීකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා අෂ්රෆ් නගර්හි පිහිටි කසළ රඳවනය සහ එයට අදාළ යටිතල පහසුකම් රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයක් යටතේ ලනෝ බයෝ ගෑස් ඔලුවිල් (පුද්ගලික) සමාගම වෙත කොන්දේසි සහිත අවබෝධතා ගිවිසුමක් මඟින් පවරා දී විධිමත් පරිදි කසළ ප්‍රතිචක්‍රීකරණය කිරීමට 2026.03.17 දිනැති මහා සභා තීරණය මඟින් අවශ්‍ය කඩිනම් පියවර ගෙන ඇත.

(ඇ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා.

# පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### යාවත්කාලීන කරන ලද සංඛ්‍යාලේඛන මත පදනම්ව "අස්වැසුම" සුදුසුකම් නිර්ණායක සමාලෝචනය
### புதுப்பிக்கப்பட்ட புள்ளிவிபரங்களின் அடிப்படையில் "அஸ்வெசும" தகுதி அளவுகோலின் மீளாய்வு
### REVIEW OF "ASWESUMA" ELEGIBILITY CRITERIA BASED ON UPDATED STATISTICS

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

ස්ථාවර නියෝග 27(2) යටතේ මම මේ ප්‍රශ්නය අහනවා, ගරු කථානායකතුමනි.

"අස්වැසුම" සුබසාධන ප්‍රතිලාභ වැඩසටහන මඟින් ප්‍රතිලාභී පවුල් මිලියන 24කගේ පමණ සුදුසුකම් තීරණ කරනු ලබන්නේ සමාජ-ආර්ථික දර්ශක 22ක් පදනම් කර ගනිමිනි. දරිද්‍රතාව මැනීමේ නිල පදනම වන ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් අවසන් වරට පවත්වන ලද ගෘහ ඒකකයක ආදායම් හා වියදම් සමීක්ෂණය - Household Income and Expenditure Survey - 2019 වසර තුළ සිදු කරන ලදී. 2022 වසරේ සමීක්ෂණය පවත්වනු නොලැබූ අතර, 2025 වසරේ සමීක්ෂණය මේ වනවිට ක්‍රියාත්මක වෙමින් පවතින නමුත් එහි ප්‍රතිඵල මෙතෙක් ප්‍රකාශයට පත් කර නොමැත.

ගරු කථානායකතුමනි, මේක ඉතා වැදගත්. මොකද, අස්වැසුම ප්‍රතිලාභීන්ට තමයි රජයෙන් මේ සහන ලබා දෙන්න හදන්නේ. මේ HIES එක 2019දී කර තිබෙන්නේ. සැබෑ ලෙසම අස්වැසුම ප්‍රතිලාභය ලැබිය යුතු ප්‍රතිලාභීන් ඒ තුළ ඉන්නවාද කියන එක පිළිබඳව සැකයක් තිබෙනවා.

ශ්‍රී ලංකාව නිදහසින් පසු ඉතිහාසයේ දරුණුතම ආර්ථික අර්බුදය වූ කොවිඩ්-19 වසංගතයට සහ "දිට්වා" ව්‍යසනයට මුහුණ දුන්නේය. ලෝක බැංකුවට අනුව මෙරට දරිද්‍රතා අනුපාතය දළ වශයෙන් සියයට 11 සිට සියයට 25 ඉක්මවන මට්ටමකට ඉහළ ගොස් ඇත. මේ අනුව ශ්‍රී ලංකාව වර්තමානයේ සුබසාධන තීරණ ගනු ලබන්නේ යාවත්කාලීන වූ ජාතික දරිද්‍රතා තක්සේරුවක් නොමැතිවය. අර්බුදයෙන් පසුව පවතින එකම ඇස්තමේන්තුව ලෝක බැංකුව විසින් ඉදිරිපත් කරන ලද්දක් වන අතර, එය දේශීය සමීක්ෂණයකට විකල්පයක් නොවනවා සේම රජයේ ප්‍රක්ෂේපණයන්ගෙන් ඓතිහාසිකව වෙනස් වන්නක්ද වේ.

මේ අනුව ගරු මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයාගෙන් මම ප්‍රශ්න කිපයක් ඇසීමට බලාපොරොත්තු වෙනවා.

ගරු කථානායකතුමනි, පිළිතුරු ලබා දෙන්න අද අමාත්‍යවරයා ඉන්නවාද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔබතුමා ප්‍රශ්නය අහන්න.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
මම එහෙම ඇහුවේ උත්තර දෙනවාද බලලා ප්‍රශ්නය අහන්න. *[බාධා කිරීමක්]* උත්තර දෙනවාද? හොඳයි.

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයාගෙන් මම පහත සඳහන් ප්‍රශ්නවලට පැහැදිලි කිරීම් ඉල්ලා සිටිමි.

1. 2019 වසරෙන් පසුව රජය සතුව ජාතික දරිද්‍රතා අනුපාතය පිළිබඳ යාවත්කාලීන කරන ලද ඇස්තමේන්තුවක් තිබේද? එසේ තිබේ නම් එය ප්‍රකාශයට පත්කර තිබේද?

2. 2025 ගෘහ ඒකකයක ආදායම් සහ වියදම් සමීක්ෂණයේ - Household Income and Expenditure Survey එකේ - ප්‍රතිඵල සම්පූර්ණ කර ප්‍රසිද්ධියට පත් කිරීමට රජය අපේක්ෂා කරන්නේ කවදාද?

3. 2025 සමීක්ෂණ ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීමෙන් පසු අස්වැසුම වැඩසටහනේ මීළඟ අදියර ආරම්භ වීමට පෙර එහි සුදුසුකම් නිර්ණායක නැවත සකස් කිරීමට රජය කැපවන්නේද? එසේ නම් එහි අපේක්ෂිත කාල රාමුව කුමක්ද?

4. වඩාත්ම මෑතකාලීන ගෙවීම් චක්‍රයට අනුව (අතිශය දිළිඳු, දිළිඳු, අවදානමට ලක්විය හැකි, වැඩිහිටි, ආබාධිත සහ වකුගඩු රෝගී) එක් එක් කාණ්ඩය යටතේ සිටින මුළු සක්‍රිය ප්‍රතිලාභීන් සංඛ්‍යාව දිස්ත්‍රික්ක මට්ටමින් කොපමණද?

5. අස්වැසුම සුදුසුකම් පිළිබඳ තීරණවලට එරෙහිව මේ දක්වා ඉදිරිපත් කර ඇති මුළු අභියාචනා සංඛ්‍යාව කොපමණද? ඉන් කීයක් විසඳා තිබේද? අභියාචකයාට වාසිදායක ලෙස විසඳන ලද ප්‍රතිශතය දිස්ත්‍රික්ක සහ අස්වැසුම කාණ්ඩ අනුව කොපමණද?

   ගරු අමාත්‍යතුමනි, මම මේ කාරණාව ඉතා ඕනෑකමින් අහන්නේ. ඔබතුමා දන්නවා, අස්වැසුම ලැබුණේ නැහැ කියලා ගොඩක් අය පැමිණිලි කළ බව. ඔබතුමන්ලාගේ මේ සහන පැකේජය අස්වැසුම ප්‍රතිලාභීන්ට නම් ලබා දෙන්නේ, - මම හිතන විධියට බිලියන 100ක් - අස්වැසුම ප්‍රතිලාභීන් හැටියට ඒකට ඇතුළු නොවුණු කට්ටිය වෙනුවෙන් මොනවා හරි වැඩ පිළිවෙළක් තිබෙනවාද කියන එක තමයි අහන්නේ.

6. දැනටමත් ප්‍රකාශයට පත් කර ඇති ඉන්ධන මිල සහනාධාරවලට අමතරව, මැදපෙරදිග අර්බුදය හරහා ඉස්මතු වූ ජීවන වියදම් බලපෑමෙන් අවදානමට ලක්විය හැකි පවුල් ආරක්ෂා කිරීම සඳහා ගැනීමට රජය අදහස් කරන අතිරේක ක්‍රියාමාර්ග මොනවාද? අස්වැසුම පරිපාලනයේ පවතින ප්‍රමාද, දෝෂ සහ අකාර්යක්ෂමතා සැලකිල්ලට ගත් කළ එම ආරක්ෂාව සපයනු ලබන යාන්ත්‍රණය කුමක්ද?

கௌரவ அமைச்சர் அவர்களே, இது முக்கியமானதொரு கேள்வி! ஏனெனில், எங்களுடைய வடக்கு, கிழக்கு மாகாணங்களிலும் பாதிக்கப்பட்டவர்கள், நிவாரணம் கிடைக்க வேண்டியவர்கள் என ஆயிரக்கணக்கானவர்கள் 'அஸ்வெசும' திட்டத்தில் உள்வாங்கப்படாமல் இருக்கிறார்கள். அவர்கள் தங்களுக்கு 'அஸ்வெசும' கொடுப்பனவு கிடைக்கவில்லையென்று முறைப்பாடு செய்திருக்கிறார்கள். உங்களுடைய அரசாங்கம் பாதிக்கப்பட்ட சமூகத்துக்கு 100 பில்லியன் ரூபாயை வழங்குவதற்கு இணங்கியிருக்கின்றது; அது வரவேற்கத்தக்க விடயம். ஆனால், 'அஸ்வெசும' திட்டத்துக்குள் உள்வாங்கப்படாதவர்களுக்கு இதன் பலன் கிடைக்காது. ஏன் நாங்கள் இந்தக் கேள்விகளைக் கேட்கின்றோம் என்றால், உங்களுடைய அரசாங்கம் சார்பாக வட மாகாணத்தில் நியமிக்கப்பட்டு இருக்கின்ற ஊழல்வாதிகள் மீன்பிடியில் ஈடுபடுகின்ற இழுவைப் படகுகளுக்காக கப்பம் வாங்குகின்றவர்களாகத்தான் இருக்கின்றார்கள். மக்களுடைய விடயங்கள் பற்றி பேசுவதில் அவர்களுக்கு அக்கறையில்லை. கப்பம் வாங்குவதில்தான் அக்கறையாக இருக்கிறார்கள். அதனால்தான் நாங்கள் எங்களுடைய மக்களின் பிரச்சினையை உங்களிடம் முன்வைக்கின்றோம். நன்றி.

**ගරු නිශාන්ත ජයවීර මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிசாந்த ஜயவீர - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Nishantha Jayaweera - Deputy Minister of Economic Development)
ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා කාලීන ප්‍රශ්නයක් යොමු කරන්නේ. ඇත්තටම මෙය වැදගත් ප්‍රශ්නයක්. මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

1. නැත.

2. වෙබ් නිකුතුවේ යෝජිත දිනය : 2026 ඔක්තෝබර් 30

   මුද්‍රිත ප්‍රකාශන නිකුතුවේ යෝජිත දිනය : 2026 දෙසැම්බර් 30

3. 2025 දෙසැම්බර් මස 22 දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ පැවැති ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාවේදී අස්වැසුම ප්‍රතිලාභය සඳහා තෝරාගැනීමට සලකා බලනු ලබන දර්ශක සහ නිර්ණායක සමාලෝචනය කිරීම පිණිස විද්වත් කමිටුවක් පත් කරන ලෙස උපදෙස් ලබා දෙන ලදී. ඒ අනුව සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් 2025 දෙසැම්බර් මාසයේදී මේ සඳහා වන විද්වත් කමිටුව පත් කරන ලද අතර, අදාළ විද්වත් කමිටුව විසින් දැනට පවතින නිර්ණායක සමාලෝචනය කර කෙටුම්පතක් සකසා ඇත. මෙම කෙටුම්පතෙහි සඳහන් නිර්ණායක සම්බන්ධයෙන් ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදු කර සකසා ගනු ලබන අවසාන කෙටුම්පත කැබිනට් අනුමැතියට ඉදිරිපත් කර පාර්ලිමේන්තුවේ අනුමැතියට ඉදිරිපත් කිරීමට නියමිතය.

4. වැඩිහිටි, ආබාධිත සහ වකුගඩු රෝගී වශයෙන් වර්ගීකරණයක් සිදු වී නොමැත. මුළු සක්‍රිය ප්‍රතිලාභීන් සංඛ්‍යාව පහත පරිදි වේ.

| | |
|---|---|
| ආබාධිත දීමනාලාභීන් සංඛ්‍යාව | - 171,957 |
| වකුගඩු රෝගී දීමනාලාභීන් සංඛ්‍යාව | - 53,037 |

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔය මුළු ලංකාවේම සංඛ්‍යාව ද?

**ගරු නිශාන්ත ජයවීර මහතා**
(மாண்புமிகு நிசாந்த ஜயவீர)
(The Hon. Nishantha Jayaweera)
ඔව්, ලංකාවේම.

දිස්ත්‍රික්ක අනුව විස්තර සඳහන් දීර්ඝ ලේඛනයක් තිබෙන්නේ. ඇමුණුම 01 වශයෙන් මම එය **සභාගත*** කරනවා.

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු නිශාන්ත ජයවීර මහතා]

ඊට අමතරව, වැඩිහිටි දීමනා ලබා දීමේදී තැපැල් කාර්යාල මඟින් ප්‍රතිලාභීන් 240,201දෙනෙකුට මේ හිමිකම ලැබී තිබෙනවා.

ඒ පිළිබඳ තොරතුරු ඇමුණුම 02 යටතේ දක්වා ඇත.

ඇමුණුම 02

2026 වර්ෂයේ මාර්තු මාසය සඳහා වැඩිහිටි දීමනා සහ සියවස් පූර්ණ දීමනා ගෙවීම

| අනු අංකය | දිස්ත්‍රික්කය | මාර්තු මස දීමනාව ලබන මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ගෙවීමට නියමිත මුදල (රු. 5,000 බැගින්) |
|---|---|---|---|
| 1 | කොළඹ | 20,850 | 104,250,000 |
| 2 | ගම්පහ | 27,256 | 136,280,000 |
| 3 | කළුතර | 15,263 | 76,315,000 |
| 4 | මහනුවර | 13,329 | 66,645,000 |
| 5 | මාතලේ | 5,688 | 28,440,000 |
| 6 | නුවරඑළිය | 11,659 | 58,295,000 |
| 7 | ගාල්ල | 12,563 | 62,815,000 |
| 8 | මාතර | 12,812 | 64,060,000 |
| 9 | හම්බන්තොට | 6,543 | 32,715,000 |
| 10 | යාපනය | 4,879 | 24,395,000 |
| 11 | මන්නාරම | 940 | 4,700,000 |
| 12 | වවුනියාව | 1,928 | 9,640,000 |
| 13 | මුලතිව් | 1,594 | 7,970,000 |
| 14 | කිලිනොච්චිය | 1,420 | 7,100,000 |
| 15 | මඩකලපුව | 3,147 | 15,735,000 |
| 16 | අම්පාර | 7,340 | 36,700,000 |
| 17 | ත්‍රිකුණාමලය | 3,041 | 15,205,000 |
| 18 | කුරුණෑගල | 20,727 | 103,635,000 |
| 19 | පුත්තලම | 9,941 | 49,705,000 |
| 20 | අනුරාධපුරය | 13,450 | 67,250,000 |
| 21 | පොළොන්නරුව | 5,524 | 27,620,000 |
| 22 | බදුල්ල | 10,260 | 51,300,000 |
| 23 | මොනරාගල | 5,810 | 29,050,000 |
| 24 | රත්නපුර | 15,008 | 75,040,000 |
| 25 | කෑගල්ල | 9,229 | 46,145,000 |
| | | **240,201** | **1,201,005,000** |

මීට අමතරව, අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ වැඩසටහන යටතේද ගෙවනු ලැබේ. එසේම ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් ආබාධිත දීමනා සහ වකුගඩු රෝගී දීමනා ලබන ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාව ආබාධිත තැනැත්තන් සඳහා වූ මහලේකම් කාර්යාලයෙන් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් වැඩිහිටි දීමනා ලබන ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාව ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයෙන් ද විමසිය යුතුය. එම ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යා ඒ ඒ කාර්යාලවලින් ලබා ගන්න පුළුවන්. *[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අහන්නේ- *[බාධා කිරීමක්]*

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, දිස්ත්‍රික්ක මට්ටමින් සම්පූර්ණ ගණන කියන්න.

**ගරු නිශාන්ත ජයවීර මහතා**
(மாண்புமிகு நிசாந்த ஜயவீர)
(The Hon. Nishantha Jayaweera)
අම්පාර දිස්ත්‍රික්කයේ මේ ප්‍රතිලාභය හම්බ වෙනවා 19,687දෙනෙකුට. අනුරාධපුර දිස්ත්‍රික්කයේ,- *[බාධා කිරීමක්]* මඩකලපුව දිස්ත්‍රික්කයේ හම්බ වෙනවා,- *[බාධා කිරීමක්]* ඔව්, ඒක තමයි. ගරු මන්ත්‍රීතුමනි, මම ඒ සම්පූර්ණ ලේඛනය සභාගත කළා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා, මගේ මඩකලපුව දිස්ත්‍රික්කයේ විස්තර ටික විතරක් කියන්න.

**ගරු නිශාන්ත ජයවීර මහතා**
(மாண்புமிகு நிசாந்த ஜயவீர)
(The Hon. Nishantha Jayaweera)
මම ඒ විස්තර ටික කියවන්නම්. *[බාධා කිරීමක්]*

| | | |
|---|---|---|
| අම්පාර දිස්ත්‍රික්කය | - | 59,432 |
| අනුරාධපුර දිස්ත්‍රික්කය | - | 52,377 |
| බදුල්ල දිස්ත්‍රික්කය | - | 101,240 |
| මඩකලපුව දිස්ත්‍රික්කය | - | 50,302 |

මේ සියලු විස්තර ඇමුණුම 01 වශයෙන් මම සභාගත කළා, ගරු මන්ත්‍රීතුමනි.

| | | | |
|---|---|---|---|
| 5. | අභියාචනා | - | 63,964 |
| | විරෝධතා | - | 6,295 |

සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ අනුමැතිය සඳහා 57,770ක ප්‍රමාණයක් ලැබී ඇත. අභියාචකයාට වාසිදායක ලෙස විසඳන ලද ප්‍රතිශතය දිස්ත්‍රික්ක සහ අස්වැසුම කාණ්ඩ අනුව පහත ඇමුණුම 03 හි සඳහන් වේ.

ඇමුණුම 03

Phase 2 Release 1 - Summary of Appeal Committee Decision

Total no. of appeal objections resolved - 56054

Resource: IWMS as of 16/03/2026

| District | DATA ACCEPTED Amount | Percentage |
|---|---|---|
| Ampara | 3158 | 5.6 |
| Anuradhapura | 1792 | 3.2 |
| Badulla | 2888 | 5.2 |
| Batticaloa | 2891 | 5.2 |
| Colombo | 2860 | 5.1 |
| Galle | 2308 | 4.1 |
| Gampaha | 2229 | 4.0 |
| Hambantota | 1081 | 1.9 |
| Jaffna | 2304 | 4.1 |
| Kalutara | 1698 | 3.0 |
| Kandy | 3069 | 5.5 |
| Kegalle | 2835 | 5.1 |
| Kilinochchi | 730 | 1.3 |
| Kurunegala | 2920 | 5.2 |
| Mannar | 660 | 1.2 |
| Matale | 1977 | 3.5 |
| Matara | 2137 | 3.8 |
| Monaragala | 1014 | 1.8 |
| Mullativu | 516 | 0.9 |
| Nuwara Eliya | 1940 | 3.5 |
| Polonnaruwa | 1968 | 3.5 |
| Puttalam | 1838 | 3.3 |
| Ratnapura | 2775 | 5.0 |
| Trincomalee | 1798 | 3.2 |
| Vavuniya | 374 | 0.7 |
| **Grand Total** | **49760** | **88.8** |

The above details are based on a pre-prepared document using data as of 16th March, 2026.

6. අංක MF/NB/09/CM/2026/121 සහ 2026.04.06 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයෙහි 3.1 පරිච්ඡේදයේ සඳහන් පරිදි අස්වැසුම වැඩසටහන යටතේ අප්‍රේල් මාසය සඳහා අන්ත දිළිඳු කාණ්ඩයේ පවුලක් සඳහා දැනට මාසිකව ලබන ප්‍රතිලාභී මුදල වන රුපියල් 17,500ට අමතරව රුපියල් 7,500ක මුදලක්ද, දුප්පත් කාණ්ඩයේ පවුලක් සඳහා දැනට මාසිකව ලබන ප්‍රතිලාභී මුදල වන රුපියල් 10,000ට අමතරව රුපියල් 5,000ක මුදලක්ද, අවදානමට ලක් වූ කාණ්ඩය සඳහා දැනට මාසිකව ලබන ප්‍රතිලාභී මුදල වන රුපියල් 5,000ට අමතරව රුපියල් 2,500ක දීමනාවක්ද ගෙවනු ලැබේ.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අහන්නේ මෑත කාලීන ගෝලීය අර්බුදයෙන් ගොඩ ඒම සඳහා දීපු සහන මොනවාද කියලා. මෙන්න මේ කියන සහන රාශිය මේ වනකොට ලබා දීලා තිබෙනවා. පළමුවෙන්ම, ධීවර ප්‍රජාවට ඉන්ධන සඳහා සහනාධාරයක් ලබා දෙන්න කටයුතු කර තිබෙනවා. ඊට අමතරව, ඩීසල් සහ පෙට්‍රල් සඳහා අදාළ සහන දෙන්න කටයුතු කර තිබෙනවා. ඊට අමතරව, යූරියා පොහොර මිල ස්ථාවරව පවත්වාගෙන යන්න වැඩිපුර වැය වන මුදල රජය විසින් දරන්න එකඟ වෙලා තිබෙනවා. ඊටත් අමතරව, පොහොර සඳහා අදාළ සහනාධාරය වැඩි කරන්න - වී වගාව වෙනුවෙන් සහ අමතර භෝග වෙනුවෙන් - කටයුතු කර තිබෙනවා. ඊටත් අමතරව, Units 90ට අඩුවෙන් විදුලිය පරිභෝජනය කරන පාරිභෝගිකයන්ගේ වැය බර රජය විසින් දරමින්, ඒ අමතර මුදල සහනාධාරයක් විධියට ලබා දෙන්න කටයුතු කරනවා. විශේෂයෙන් මේ ගෝලීය අර්බුදය හේතුවෙන් ඔන්න ඔය කියපු ප්‍රධාන කටයුතු වෙනුවෙන් රුපියල් බිලියන 100ක අමතර මුදලක් වැය කරන්න රජය විසින් කටයුතු කර තිබෙනවා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, මට විශේෂයෙන්ම දැනගන්න ඕනෑ කාරණය මේකයි. රුපියල් බිලියන 100ක සහනාධාරයක් දෙනවා නේ. ඒ බිලියන 100 මුදල වෙන් වෙන්නේ කොහෙන්ද, ගරු අමාත්‍යතුමනි? අපි දන්නා පරිදි භාණ්ඩාගාරයේ මුදල් යම් ප්‍රමාණයක් නේ තිබෙන්නේ. ඒකෙන් කොටසක් "දිට්වා" ආපදා සහන සඳහාත් වෙන් කළා. "දිට්වා" ආපදා සහන සඳහා වෙන් කළ මුදල්වලින් අඩු කිරීමක් කරලාද මේකට වෙන් කරන්නේ කියන එක දැන ගන්න කැමැතියි. ඒක, එක කාරණයක්.

අනෙක් කාරණය මේකයි. "සමෘද්ධිය" සහ "අස්වැසුම" කියන්නේ දෙකක් නේ. මම ඔබතුමාගෙන් මඩකලපුව දිස්ත්‍රික්කයේ දත්ත ඉල්ලුවේ, 50,300 දෙනෙකුට තමයි අස්වැසුම ප්‍රතිලාභ හම්බ වෙන්නේ. හැබැයි මඩකලපුවේ ලක්ෂ 6කට වැඩි ජන ප්‍රජාවක් ඉන්නවා. මඩකලපුවෙන් සියයට 40කට වඩා දරිද්‍රතාවෙන් පෙළෙන බව කියලා තිබෙනවා. එහෙම බැලුවාම ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, අඩුම තරමින් ලක්ෂ 2කට විතර ප්‍රතිලාභ දෙන්න වෙනවා. හැබැයි 53,000 ගණකට පමණයි ප්‍රතිලාභ ලබා දෙන්නේ. අභියාචනා විශාල ප්‍රමාණයක් ද තිබෙනවා. එතකොට සමෘද්ධි තිබෙන කට්ටියටත් මේ බිලියන 100 හරහා මුදල් ලැබෙනවාද, එහෙම නැත්නම් අස්වැසුම ප්‍රතිලාභ ලැබෙන අයට විතරද ලැබෙන්නේ? සමෘද්ධි ප්‍රතිලාභයයි, අස්වැසුම ප්‍රතිලාභයයි කියන දෙකම නැති අයට සහන ලබා දෙන්න වැඩ පිළිවෙළක් නැද්ද? මේ survey එක පිළිබඳවත් මම කියන්න ඕනෑ. මොකද, අලුත් survey එකක් කරන්නේ නැතුව, 2019දී ගත්තු survey එකක් හරහා මේක හරියට capture වෙනවාද කියන එක තමයි විශේෂයෙන්ම දැන ගන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ධීවර ප්‍රජාවට දෙන සහනාධාර ගැන දැන් කථා කළා. ගරු බිමල් රත්නායක ඇමතිතුමා මේ වෙලාවේ ගරු සභාවේ ඉන්න නිසා එතුමාගේ අවධානයට කාරණයක් කියන්න ඕනෑ. ඇමතිතුමන්ලා විධියට ඔබතුමන්ලා උතුරු පළාතට විශාල මෙහෙවරක් කරනවා කියා අපි දන්නවා. හැබැයි, ඔබතුමන්ලා උතුරු පළාතට නියෝජනයක් හැටියට නම් කරලා තිබෙනවා, ධීවර ප්‍රජාව පිළිබඳව කථා කරන්න

[ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

ඇමතිවරයෙක්. ඒ ඇමතිතුමා එහා පැත්තේ ඉන්නවා. ගරු බිමල් රත්නායක ඇමතිතුමනි, මතක තබා ගන්න, Ceylon Electricity Board එක පිළිබඳවත් මම මේ පාර්ලිමේන්තුවේදී හෙළි කළා, අවුරුදු දෙකහමාරකට විතර කලින්. ඔබතුමන්ලා මේ අමාත්‍යවරයා පිළිබඳව පොඩ්ඩක් ඕනෑකමින් බලන්න. උතුරු පළාතේ නීති විරෝධී ධීවර කර්මාන්තයේ නියැළෙන විශාල කණ්ඩායමකට මෙතුමා අනුබල දෙනවා, මෙතුමා කප්පම් ගන්නවා කියලා චෝදනා තිබෙනවා. ඊළඟ විශ්වාස භංගය මෙතුමාට විරුද්ධව එන්න පුළුවන්.

ගරු බිමල් රත්නායක අමාත්‍යතුමනි, ඔබතුමා එක්ක දේශපාලන මතවාද පිළිබඳව අපේ වෙනත් අදහස් තිබුණාට, ඔබතුමා කෙළින් වැඩ කරන අමාත්‍යවරයෙක්. ඔබතුමා තවම නිල් පාට කැබ් එකේ යන්නේ. ඔබතුමා පිළිබඳව එක චෝදනාවක්වත් නැහැ. හැබැයි, මේ ඇතැම් ඇමතිවරු පාර්ලිමේන්තුවට ඇවිල්ලා අප ගැන ඉතා නරක කථා පවත්වනවා. අපි හොරකම් කරපු අය නොවෙයි. ඒ නිසා ගරු අමාත්‍යතුමනි, මේ ධීවර ප්‍රජාව පිළිබඳවත් වැඩි ඕනෑකමක් දක්වන්න කියලා මම මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා.

**ගරු නිශාන්ත ජයවීර මහතා**
(மாண்புமிகு நிசாந்த ஜயவீர)
(The Hon. Nishantha Jayaweera)

ගරු මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නයට පිළිතුර මේකයි. අපි "දිට්වා" ආපදා සහන වෙනුවෙන් වියදම් කරන්න වෙන් කරපු රුපියල් බිලියන 500 කිසිසේත්ම මේකට යොදා ගන්නේ නැහැ. මේ වෙනුවෙන් ණය ගන්නේ නැතුව වෙනම රුපියල් බිලියන 100ක් අය වැයෙන්ම - අය වැයෙන් යොමු කරලා තිබෙන මුදල්වලින්ම - තමයි ගන්නේ.

ඊට අමතරව, ඔබතුමා අහපු අනෙක් ප්‍රශ්නයට පිළිතුර මේකයි. මේ සඳහා අයිති නැති, අස්වැසුමට දැනටමත් එක් වෙලා නැතිව එළියේ ඉන්න ප්‍රජාවක් පැහැදිලිවම ඉන්නවා. ඒක රජය විධියටත් අපි හඳුනා ගෙන තිබෙනවා. ඒ වෙනුවෙන් තමයි, මෑත කාලීනව - ගිය අවුරුද්දේ දෙසැම්බර් ඉඳන් මාර්තු 31වන දා වනතුරුම - recertification එකක් කරලා, ඒගොල්ලන්ට අයදුම් කරන්න අවස්ථාව දීලා තිබෙන්නේ. ඒ අයදුම්පත් සමාලෝචනය කරලා, ජූනි 30වන විට අවසානාත්මක කරනවා. ඇත්තටම සුදුසුකම්ලාභී පිරිසක් එතැනින් එකතු වෙනවා. ඊටත් අමතරව, මා ප්‍රකාශ කළ ආකාරයට ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාව මඟින් ලබා දුන් නිර්දේශ අනුව විශේෂ විද්වත් මණ්ඩලයක් පත් කරලා, නව ක්‍රමවේදයක්, ඉතා පැහැදිලි සරල ක්‍රමවේදයක්, නිවැරදි ප්‍රතිලාභියා හඳුනා ගන්න අවශ්‍ය නිවැරදි ක්‍රමවේදයක් මේ වන කොට සකස් කරමින් පවතිනවා. ඉස්සෙල්ලා අහපු ප්‍රශ්නයට මා උත්තරයක් දුන්නා වාගේම ඒක පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා, ඒ ක්‍රමවේදය ඉදිරියේදී විධිමත්ව ක්‍රියාවට නංවනවා. එමඟින් නිසි ප්‍රතිලාභීන්, සුදුසුකම් ලබන නිවැරදි ප්‍රතිලාභීන්, ඉතා නිවැරදි විධියට මේ සඳහා එකතු කර ගන්න අපි බලාපොරොත්තු වෙනවා.

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා)**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர் - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர்)
(The Hon. Ramalingam Chandrasekar - Minister of Fisheries, Aquatic and Ocean Resources)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් අමාත්‍යතුමා.

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)

ගරු කථානායකතුමනි, මගේ නම සඳහන් කළ නිසා ෂාණක්කියන් මන්ත්‍රීතුමාට කිව යුතු දෙයක් තිබෙනවා. අද වනවිට උතුරේදී ෂාණක්කියන් මන්ත්‍රීතුමාටත්, එතුමාගේ ගුරුවරයා වන සුමන්තිරන්ටත් විරුද්ධව වැඩියෙන්ම කථා කරන්නේ මම. අන්න ඒ තරහ මතකයේ තියාගෙන බොරු චෝදනා එල්ල කරන්න එපා. හරිද? මන්ත්‍රීතුමනි, එහෙම චෝදනා තිබෙනවා නම්, කරුණාකරලා එක්කෝ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න. එහෙම නැත්නම් CID එකට භාර දෙන්න. එහෙම භාර දීලා ඒ වැඩේ කරන්න. මම කප්පම් ගත්තාද, නැද්ද කියන එක ඔබතුමාත් දන්නවා. ඔබතුමාට විරුද්ධව මේ පාර්ලිමේන්තුවේ දෙමළ භාෂාවෙන් කථා කරන්නේ මම විතරයි නේ. ඒ නිසා ඒ තරහ මතක තියාගෙන බොරු චෝදනා නම් එල්ල කරන්න එපා කියා කරුණාකර ඉල්ලා සිටිනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා. ඔබතුමාගේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

Hon. Speaker,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔබතුමාට ලබා දුන් කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

නැහැ, නැහැ. එතුමා මගේ නම සඳහන් කළා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

එතුමා ඔබතුමාට පිළිතුරක් ලබා දුන්නේ.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

එතුමා මගේ නම සඳහන් කළා. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු තාහිර් මන්ත්‍රීතුමා. *[බාධා කිරීම්]*

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

ගරු කථානායකතුමනි, එතුමා මගේ නම සඳහන් කළා. *[බාධා කිරීම්]* ලේකම් මණ්ඩලයෙන් කියන්නේ -*[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සභා ගැබේ ඉන්නේ එක ධීවර අමාත්‍යවරයායි. දෙන්නෙක් නැහැ. *[බාධා කිරීම්]* ඔබතුමා ඒ අමාත්‍යවරයා නම් කළ නිසා තමයි එතුමා නැඟිට්ටේ. *[බාධා කිරීම්]* ගරු තාහිර් මන්ත්‍රීතුමා, ඔබතුමාගේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න. *[බාධා කිරීම්]*

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු කථානායකතුමනි, මගේ නම සඳහන් කළාම, - *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු තාහිර් මන්ත්‍රීතුමා, ඔබතුමාට ප්‍රශ්නය ඉදිරිපත් කරන්න පුළුවන්. *[බාධා කිරීම්]*

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
හරි, හරි. පිටුපස ඉන්නා අය කෑ නොගහා ඉන්නකෝ. *[බාධා කිරීම්]* පෙරටුගාමී පක්ෂයෙන් රිංගාගෙන මන්ත්‍රීකම් ගත්ත අය කෑ ගහන්න එපා. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ෂාණක්කියන් මන්ත්‍රීතුමා, ඔබතුමා ඉඳගන්න. *[බාධා කිරීම්]*

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
මගේ නම සඳහන් කළා. *[බාධා කිරීම්]* මගේ නම සඳහන් කළ නිසා - *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
*ඔබතුමා මෙතැන අනවශ්‍ය විවාදයකට පැටලෙන්න අවශ්‍යතාවක් නැහැ.* *[බාධා කිරීම්]*

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
*නැහැ, නැහැ.* *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් මේ සභාව පවත්වා ගෙන යෑමට අවශ්‍යයි. *[බාධා කිරීම්]* ඔබතුමා මට ඇහුම්කන් දෙන්න. *[බාධා කිරීම්]* ඔබතුමා ධීවර අමාත්‍යවරයා කියලා එක්කෙනෙක් නම් කළා. මෙතැන ඉන්නේ එක ධීවර අමාත්‍යවරයායි. දෙන්නෙක් නැහැ. ඔබතුමා කෙළින්ම චන්ද්‍රසේකර් අමාත්‍යතුමා ගැන තමයි කියන්නේ. එතකොට එතුමාට අයිතියක් තිබෙනවා, නැඟී සිටින්න. කරුණාකර ඔය නාඩගම නටන්නේ නැතුව ඉන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු තාහිර් මන්ත්‍රීතුමා, ඔබතුමා ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු කථානායකතුමනි, - *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා මෙතැන සම්පූර්ණයෙන්ම වැරදි වැඩක් කරන්නේ.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු කථානායකතුමනි, අප්‍රේල් මාසයේ මේ සභාව පවත්වන අන්තිම දවස අද. *[බාධා කිරීම්]* ගරු සභානායකතුමනි, මට තත්පර 30ක් දෙන්න කියන්න. ඔබතුමා okay එක දුන්නා නම් හරි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා මේ සභාව පවත්වාගෙන යන්න ඉඩ දෙන්නේ නැත්නම්, මට ඔබතුමාව එළියට දමන්න සිද්ධ වෙනවා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු සභානායකතුමනි, ඔබතුමා okay එක දෙන්න මට තත්පර 30ක් ලබා දීමට. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මන්ත්‍රීතුමා, ඔබතුමා එළියට දමන්න සිද්ධ වෙනවා. *[බාධා කිරීම්]* වාඩිවෙන්න. වාඩිවෙන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
එතුමා මගේ නම සඳහන් කළා. මම ස්ථාවර නියෝග යටතේ - *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, මම දැන් ඔබතුමාට හොඳ සිංහලෙන් කිව්වා. You can understand Sinhala well. Please sit down.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
පාර්ලිමේන්තු ලේකම් මණ්ඩලයෙන් කියනවා නම් -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු එම්.ඒ.එම්. තාහිර් මන්ත්‍රීතුමනි, ඔබතුමා ඉදිරිපත් කරන්න, ඔබතුමාගේ ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්නය.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ලේකම් මණ්ඩලයෙන් කියනවා නම් ස්ථාවර නියෝග යටතේ මට අයිතියක් නැහැ කියලා - *[බාධා කිරීම්]*

හොඳ වෙලාවට ඊළඟට එම්.ඒ.එම්. තාහිර් මන්ත්‍රීතුමාට අවස්ථාව ලැබුණේ -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු එම්.ඒ.එම්. තාහිර් මන්ත්‍රීතුමනි, ඔබතුමා ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්නේ නැත්නම් න්‍යායපත්‍රානුකූලව ඊළඟ කාරණයට යනවා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ලේකම් මණ්ඩලයෙන් මම අහන්නේ. ස්ථාවර නියෝග යටතේ මට එහෙම අයිතියක් නැත්නම් වාඩි වෙන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වාඩි වෙන්න කිව්වාම වාඩිවෙන්න. එච්චරයි ඔබතුමාට කියන්නේ. ඔබතුමාට සිංහල තේරෙන්නේ නැද්ද? Do you not understand?

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග යටතේ-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
No, no, that is wrong.

මේ සභාවේ ඉන්නේ එක ධීවර ඇමතිතුමායි. ඒ අනුව ධීවර ඇමතිතුමා නැඟිට්ටා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට සිංහල තේරෙන්නේ නැද්ද කියන එක ගැන ප්‍රශ්නයක් තිබෙනවා. You have to sit down. *[බාධා කිරීම්]* මම දැන් ඔබතුමා මේ සභාවෙන් එළියට යවනවා, කියන දේ අහන්නේ නැත්නම්.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
හා හා. යවන්න, යවන්න. යවන්න, යවන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු එම්.ඒ.එම්. තාහිර් මන්ත්‍රීතුමනි, ඔබතුමා ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න. එහෙම නැත්නම්, I am going to move on to the next item.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු තාහිර් මන්ත්‍රීතුමා ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්නය ඉදිරිපත් කරන එකට බාධා කරන්න කැමති නැති නිසා මම නවත්වන්නම්. හැබැයි මෙතුමාගේ හොරකම් ගැන ඉදිරියේදී පාර්ලිමේන්තුවට විශ්වාස භංගයක් එයි. *[බාධා කිරීම්]*

## II

## කොට්ටන්තිව් මොහිදීන් ජුම්මා මුස්ලිම් පල්ලියට අයත් ඉඩමක ඉදිකරන ලද සංස්කෘතික මධ්‍යස්ථානය

கொத்தாந்தீவு முகைதீன் ஜும்ஆ பள்ளிவாசல் காணியில் நிர்மாணிக்கப்பட்டுள்ள கலாசார மத்திய நிலையம்

CULTURAL CENTRE BUILT ON LAND BELONGING TO KOTTANTIVU MOHIDEEN JUMMA MOSQUE

**ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා**
(மாண்புமிகு எம்.ஏ.எம். தாஹிர்)
(The Hon. M.A.M. Thahir)
கௌரவ சபாநாயகர் அவர்களே, நிலையியற் கட்டளை 27 (2)இன்கீழ் பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரிடம் பின்வரும் வினாக்களைக் கேட்கின்றேன்.

1. புத்தளம் மாவட்டம், முந்தல் பிரதேச செயலாளர் பிரிவின் கொத்தாந்தீவு கிராம அலுவலர் பிரிவில் கொத்தாந்தீவு முகைதீன் ஜும்ஆ பள்ளிவாசலுக்கு வக்பு செய்யப்பட்ட காணியில் மேற்படி பள்ளிவாசலின் வேண்டுகோளுக்கு அமைய, அப்போதைய அரசாங்க நிதி ஒதுக்கீட்டின்மூலம் 2017ஆம் ஆண்டிலும், 2023ஆம் ஆண்டில் விசேட நிதி ஒதுக்கீட்டின் அடிப்படையிலும் கலாசார மத்திய நிலையம் ஒன்று நிர்மாணிக்கப்பட்டு, 2024 மார்ச் மாதமளவில் வேலைகள் முழுமையாகப் பூர்த்தி செய்யப்பட்டாலும்கூட, புத்தளம் மாவட்டச் செயலகம் மற்றும் முந்தல் பிரதேச செயலகத்தால் மக்கள் பாவனைக்கு இதுவரை கையளிக்கப்படாமல் மூடப்பட்ட நிலையில் கடந்த இரண்டு வருடங்களாக இருப்பதை அவர் அறிவாரா?

2. மேலும், பள்ளிவாசல் ஒன்றுக்குக் குறித்தொதுக்கப்பட்ட தேவைக்காக வக்பு செய்யப்பட்ட சொத்துக்களை வேறு எந்தத் தேவைகளுக்காகவோ அல்லது வக்பு சட்டத்துக்கு அமைவாக அக்காணி வேறு தேவைகளுக்காகவோ சுவீகரிக்கப்பட முடியாது என்பதை அவர் அறிவாரா?

3. மேற்படி காணியைச் சுவீகரிப்பதற்கான முயற்சிகளை மாவட்ட செயலகம் முன்னெடுத்து வருவதாக உத்தியோகபூர்வமாக 2026.01.29ஆம் திகதியிடப்பட்ட கடிதம்மூலம் பள்ளிவாசல் நிருவாக சபையின் கவனத்துக்குக் கொண்டுவரப்பட்டதால், இதற்கான பள்ளிவாசலின் ஆட்சேபனைகளை மாவட்ட செயலாளருக்கு 2026.02.10ஆம் திகதி முகவரி இடப்பட்டு, அமைச்சர் உட்பட ஏனையோருக்கும் பிரதி இடப்பட்டு பதிவுத் தபால்மூலம் அனுப்பப்பட்ட ஆட்சேபனைக் கடிதங்கள் சம்பந்தமாக அவர் அறிவாரா?

4. மேற்படி காணியில் பள்ளிவாசல் ஒன்றும் கொத்தாந்தீவு கிராமத்துக்கான குழாய் நீர் வழங்கல் திட்டத்தின் உட்கட்டமைப்பு வசதிகளும் அரசாங்க நிதி ஒதுக்கீட்டின்மூலம் நிர்மாணிக்கப்பட்டு, சமுதாயம்சார் அமைப்பின்கீழ் நிருவகிக்கப்பட்டு வருவதை அவர் அறிவாரா?

5. அவ்வாறாயின்,

(i) மக்களின் வேண்டுகோளுக்கு இணங்க, மக்களுக்காக நிர்மாணிக்கப்பட்ட மேற்படி கலாசார மத்திய நிலையமானது, பள்ளிவாசல் அமைந்துள்ள காணியில் நிர்மாணிக்கப்பட்டுள்ளதோடு, அது சம்பந்தமான மின்சாரம், நீர் வழங்கல் பயன்பாடுகளுக்கான செலவினம் பள்ளிவாசலால் செலுத்தப்படுகின்ற அதேவேளை, அந்த நிலையத்துக்கான உள்ளகப் பாதைகளும் பள்ளிவாசலால் அபிவிருத்தி செய்யப்பட்டிருக்கின்ற நிலையில், மேற்படி கலாசார மத்திய நிலையம் பள்ளிவாசலின்கீழ் நிருவகிக்கப்பட்டு பராமரிக்கப்படுவதற்குத் தடையாக உள்ள காரணங்கள்;

(ii) மேற்படி கலாசார மத்திய நிலையத்தை பள்ளிவாசலின்கீழ் நிருவகித்து பராமரிப்பதற்கு வழங்க முடியுமாயின் எப்போது, யாரால் வழங்கப்படும்;

(iii) இதற்குத் தடையாக, தாமதப்படுத்த நிருவாகத் தீர்மானங்களை மேற்கொண்ட அரச அலுவலர்களுக்கு எதிராக எடுக்கப்படவுள்ள நடவடிக்கைகள் என்ன என்பது பற்றிய விபரங்களை அவர் சமர்ப்பிப்பாரா?

**ගරු පී. රුවන් සෙනරත් මහතා (පළාත් සභා සහ පළාත් පාලන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு பீ. ருவன் செனரத் - மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சிப் பிரதி அமைச்சர்)
(The Hon. P. Ruwan Senarath - Deputy Minister of Provincial Councils and Local Government)

ගරු කථානායකතුමනි, ගරු එම්.ඒ.එම්. තාහිර් මන්ත්‍රීතුමා ඉදිරිපත් කරන ලද ප්‍රශ්නවලට පිළිතුරු මෙසේයි.

1. 2017 වර්ෂයේ හා 2024 වර්ෂයේ ප්‍රතිපාදන ලැබ 2024 වර්ෂයේ දෙසැම්බර් මස වැඩ නිම කර ඇති අතර, ඉදිරි කළමනාකරණ කටයුතු සඳහා කල්පිටිය ප්‍රාදේශීය සභාවට පවරා දීමට කටයුතු කිරීමේදී ඒ සඳහා මොහිදීන් ජුම්මා මස්ජිදය නියෝජනය කරන යම් පුද්ගලයන් කණ්ඩායමකගේ විරෝධතාව හේතුවෙන් ජනතා අයිතියට පැවරීමට නොහැකි වී ඇත.

   තවද, මෙම ව්‍යාපෘතිය ආරම්භයේදී මෙම ඉඩම මේ සඳහා ලබා දීමට ජුම්මා මස්ජිදයේ පාලක සභාව විසින් එකඟතාව පළ කර ඇත. ඊට අදාළ ලිපි ඇමුණුම 01 සහ ඇමුණුම 02 ලෙස ඉදිරිපත් කර ඇත.

   ඇමුණුම 01 සහ 02 **සභාගත*** කරමි.

2. මෙම ගොඩනැගිල්ල ඉදි කර ඇති ඉඩම් කොටස නිශ්චිතවම පල්ලියට අයත්ද යන්න පිඹුරු මඟින් තහවුරු කර නැත.

3. ඔව්.

4. නැත.

5. (i) 2017 වර්ෂයේ රුපියල් මිලියන 35.7ක ප්‍රතිපාදන ලැබී අඩක් නිම කරන ලද මෙම බහුකාර්ය ගොඩනැගිල්ල වසර 07කට පසු 2024 වර්ෂයේ ජනාධිපති ලේකම් කාර්යාලයේ ප්‍රතිපාදන මත වැඩ අවසන් කළ අතර, යම් පුද්ගලයින් කණ්ඩායමකගේ බාධා කිරීම් හේතුවෙන් කල්පිටිය ප්‍රාදේශීය සභාවට පැවරීමට නොහැකි වී ඇත. 2017 වර්ෂයේ මෙම ගොඩනැගිල්ල සඳහා එවකට බන්ධනාගාර, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම් හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයේ ප්‍රතිපාදන ලබා දී ඇත්තේ බහුකාර්ය සම්මන්ත්‍රණ මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා වන බැවින් සියලුදෙනාටම සාධාරණ වන ආකාරයට භාවිතයට ගැනීමට හා ප්‍රවේශ වීමට හැකි විය යුතු බැවින් මස්ජිදය යටතේ මෙම ගොඩනැගිල්ල කළමනාකරණයට ලබා දිය නොහැක.

   ඊට අදාළ ලිපි ඇමුණුම් 03 සහ 04 ලෙස **සභාගත*** කරනවා.

   (ii) මෙම ගොඩනැගිල්ල සඳහා 2017 වර්ෂයේ ද එවකට බන්ධනාගාර, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම් හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයේ ප්‍රතිපාදන ලබා දී ඇත්තේ බහුකාර්ය ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා වන බැවින්, ප්‍රදේශයේ සියලු ජනතාවට මෙය භාවිත කිරීමේ අයිතිය සුරක්ෂිත කිරීම කළ යුතුව ඇත. එබැවින් මෙය මස්ජිදය යටතේ කළමනාකරණය කිරීම සඳහා පැවරිය නොහැකි අතර, එය පොදු මහ ජනතාවගේ භාවිතය සඳහා ඉඩම පවරා ගැනීම සිදු කරන තෙක් ප්‍රාදේශීය සභාවට පැවරීමට හැකියාව ඇත. නමුත්, ඒ සඳහා මස්ජිදය හා අනෙකුත් පාර්ශ්වයන්ගේ සහයෝගය දිස්ත්‍රික් ලේකම්ට හා කල්පිටිය ප්‍රාදේශීය සභාවට ලබා දිය යුතුය.

**ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා**
(மாண்புமிகு எம்.ஏ.எம். தாஹிர்)
(The Hon. M.A.M. Thahir)

கௌரவ பிரதி அமைச்சர் அவர்களே, கடந்த அரசாங்கங்களால் நாட்டின் பல பிரதேசங்களிலும் மதஸ்தலங்களுக்கு நிறைய கட்டிடங்கள் வழங்கப்பட்டு இருக்கின்றன. இவ்வாறான கட்டுமானங்கள் மதம் சார்ந்த நிறுவனங்களுக்கு வழங்கப்பட்டு, அந்தந்தப் பிரதேசத்தில் இருக்கின்ற மக்களின் பாவனைக்கு விடப்பட்டு இருக்கின்றன. நானும் ஒரு பிரதேச சபையின் தவிசாளராக 14 வருடங்கள் இருந்திருக்கிறேன். ஒரு மதஸ்தலத்துக்குக் கொடுக்கப்பட்ட கட்டிடத்தைப் பறித்து, வேறு பிரதேச சபைகளுக்குக் கொடுக்கின்ற நடவடிக்கை இனவாதத்தை ஒழித்துக்கட்டுவதாகக் கூறி ஆட்சிக்கு வந்திருக்கின்ற NPP அரசாங்கத்தால்தான் மேற்கொள்ளப்படுகின்றது.

2017ஆம், 2023ஆம் ஆண்டு காலப்பகுதிகளில் இருந்த அரசாங்கங்களால் வழங்கப்பட்ட நிதிமூலம் நிர்மாணிக்கப்பட்ட இந்த கலாசார மத்திய நிலையமானது, மேற்குறித்த பள்ளிவாசலின் காணியில்தான் அமைக்கப்பட்டு இருக்கின்றது. இவ்வளவு காலமும் அக்கட்டிடத்தை அந்தப் பள்ளிவாசலின் சொந்த நிதிமூலம்தான் நிருவகித்து வருகிறார்கள். அதனைப் பயன்படுத்துகின்ற மக்களின் பாவனைக்கான நீர்க் கட்டணம், மின் கட்டணம் போன்றவற்றைச் செலுத்துவதுடன், தளபாடங்கள், ஏனைய வசதிகள் அனைத்தையும் அந்தப் பள்ளிவாசல் நிருவாகம்தான் தொடர்ச்சியாகப் பேணி வருகின்றது. அந்தப் பள்ளிவாசலைப் பிரதிநிதித்துவம் செய்யும்

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා]

ஒரு குழுவினரின் எதிர்ப்பினால்தான் அந்தக் கட்டிடம் மக்கள் பாவனைக்குக் கையளிக்கப்படவில்லையென நீங்கள் கூறுவதை எங்களால் ஏற்றுக்கொள்ள முடியாது. ஏனெனில், அந்தப் பிரதேசத்தில் இருக்கின்ற அனைத்து இன மக்களும் அதனைப் பாவிப்பதற்கான ஏற்பாடுகளை அந்தப் பள்ளிவாசல் செய்திருக்கின்றது.

இவ்வாறான பல கட்டிடங்களை இந்த நாட்டில் பெரும்பான்மையினச் சமூகம் வாழுகின்ற பிரதேசங்களிலுள்ள 'பன்சலை'களில் நீங்கள் கட்டிக்கொடுத்து இருக்கின்றீர்கள். அந்தக் கட்டிடங்களை அந்தப் பிரதேசத்தில் இருக்கின்ற municipality அல்லது பிரதேச சபைகளுக்கு தாரைவார்த்துக் கொடுப்பதற்கான ஏதேனும் முயற்சிகளைச் செய்திருக்கின்றீர்களா? என்பதை நீங்கள் இச்சந்தர்ப்பத்தில் கூற வேண்டும். நீங்கள் இந்த விடயத்தின்பால் கவனம் செலுத்தி அந்தக் கட்டிடத்தை முழுமையாகப் பராமரிப்பதற்கான சந்தர்ப்பத்தை அந்தப் பள்ளிவாசலுக்கு வழங்க வேண்டுமென நான் இந்த உயர்ந்த சபையில் கேட்டுக் கொள்கின்றேன். ஏனெனில், அந்தப் பள்ளிவாசலுக்கு வக்பு செய்யப்பட்ட காணியில்தான் அந்தக் கட்டிடம் அமையப் பெற்றிருக்கிறது. வக்பு சட்டம் பற்றி இங்கிருக்கின்ற அமைச்சர்கள் எல்லோருக்கும் தெரியுமென நினைக்கின்றேன். வக்பு செய்யப்பட்ட காணியை வேறொருவருக்குக் கொடுப்பதற்கான எந்தவொரு சந்தர்ப்பமும் இல்லை. நீங்கள் அங்கு ஒற்றுமையைக் கட்டியெழுப்புவதாக இருந்தால், அந்தப் பிரதேச மக்கள் எல்லோரும் பாவிக்கின்ற அந்தக் கட்டிடத்தை நிருவகிக்கும் பொறுப்பை அந்தப் பள்ளிவாசலுக்குக் கொடுக்க வேண்டுமென தயவாகக் கேட்டுக் கொள்கின்றேன்.

**ගරු පී. රුවන් සෙනරත් මහතා**
(மாண்புமிகு பீ. ருவன் செனரத்)
(The Hon. P. Ruwan Senarath)

ගරු කථානායකතුමනි, ගරු එම්.ඒ.එම්. තාහිර් මන්ත්‍රීතුමා ඉදිරිපත් කරන කාරණාව සම්බන්ධව අපි විශ්වාස කරන්නේ, එම ගත්ත තීරණය හේතුවෙන් ඔබතුමා මතු කරන අදහස කිසිසේත්ම සිදු වෙන්නේ නැහැ කියන එකයි. ඒ කියන්නේ, ජාතිවාදය හෝ වෙනත් කිසිදු කාරණාවක් එතැන සිදු වෙන්නේ නැහැ කියන එකයි. ඇත්තටම මේ ඉදි කරපු ගොඩනැඟිල්ල සම්බන්ධව 2023 වර්ෂයේදී විගණන වාර්තාවක් තිබෙනවා කියලා ඔබතුමාත් දන්නවා. ඒ වාගේම තමයි ඒ පිළිබඳ ගැටලු ගණනාවක් සාකච්ඡා වෙලා තිබුණා. විශේෂයෙන්ම අපි බලාපොරොත්තු වෙන්නේ මේකයි. මේ ගොඩනැඟිල්ල ඇතුළත ඉදි කරලා තිබෙන්නේ බහුකාර්ය සම්මන්ත්‍රණ ශාලාවක් විධියටයි.

ගරු කථානායකතුමනි, ඊළඟ කාරණාව මේකයි. මේ සඳහා රජයේ මුදල් වැය කරලා තිබෙනවා. ඒ ඉඩම රජය සතු එකක් ද කියලා තවම නිරවුල් නැහැ. ඒක නිසා මම දිසාපතිතුමා එක්කත් සාකච්ඡා කළා, මේ ඉඩම නිරවුල් කර ගැනීම සම්බන්ධව පළමු අදියරේදීම මැනුම් කටයුතු කරලා පිඹුරුපත් පරීක්ෂා කරලා ඒ කටයුතු කර ගන්න ඕනෑ කියලා. එය නිරවුල් කර ගන්නා තෙක් ප්‍රාදේශීය සභාවට පවරන්නත්, ඒ අනුව ප්‍රාදේශීය සභාව විසින් නඩත්තු කටයුතු කරන අතර, ඉඩම නිරවුල් කර ගත්තාට පස්සේ අවශ්‍ය කරන මැදිහත්වීම කරනු ලබනවා. විශේෂයෙන්ම දිස්ත්‍රික්කයේ ඔබ සියලු දෙනාම සම්බන්ධ කරගෙන, සාකච්ඡාවක් අරගෙන එය නිරවුල් කර ගැනීමට අවශ්‍ය කරන මැදිහත්වීම කර ගන්න පුළුවන්කම තිබෙනවා. ඒ නිසා මම හිතන විධියට, මේ මොහොතේ මෙය පාවිච්චි කරන්න කියන ඉල්ලීම,- *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමා පිළිතුර ලබා දීලා අවසන් කරන්න.

**ගරු පී. රුවන් සෙනරත් මහතා**
(மாண்புமிகு பீ. ருவன் செனரத்)
(The Hon. P. Ruwan Senarath)

හොඳයි, ගරු කථානායකතුමනි.

විශේෂයෙන්ම මගේ පැත්තෙන් යෝජනාව තිබෙන්නේ මේ ඉඩම ප්‍රාදේශීය සභාවට පවරලා ප්‍රාදේශීය සභාවේ නඩත්තුව යටතේ සංස්කෘතික මධ්‍යස්ථානය පවත්වාගෙන යන්නත් කිසිදු ගැටලුවක් නැහැ කියන එකයි. මුස්ලිම්, සිංහල, දෙමළ යන සියලු ජාතීන් මේ ප්‍රදේශයේ ඉන්නවා. ඒ හැමෝටම වැඩ කටයුතු කර ගන්න පුළුවන්. මේ ඉඩමේ නිරවුල්භාවය තහවුරු කර ගන්නා තෙක් ඔබතුමන්ලාට ඉඩකඩ ලද අවස්ථාවේ සහයෝගය ලබා දෙන්න කියලා තමයි මම ඉල්ලා සිටින්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

වරප්‍රසාද ප්‍රශ්නය, ගරු රවි කරුණානායක මහතා.

## වරප්‍රසාද: පාර්ලිමේන්තුවේ සහ කමිටුවල මතු කරන ලද ප්‍රශ්නවලට පිළිතුරු නොදී තොරතුරු රඳවා ගැනීම
## சிறப்புரிமை: பாராளுமன்றம் மற்றும் குழுக்களில் எழுப்பப்படும் கேள்விகளுக்குப் பதிலளிக்காமல் தகவல்களைத் தடுத்து வைத்தல்
## PRIVILEGE: WITHHOLDING INFORMATION BY NOT ANSWERING QUESTIONS RAISED IN PARLIAMENT AND COMMITTEES

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Hon. Speaker, I rise today in Parliament to raise a matter of Privilege under the Parliament (Powers and Privileges) Act, No. 21 of 1953 read with Standing Order No. 118(2)(a) concerning a serious and continuing obstruction to discharge my duties as a Member of Parliament.

Over the past several months, I had submitted multiple questions to be answered both in this House and at Committee lev/ KSel, in person at the Committee on Public Finance, directed at the Central Bank of Sri Lanka and the relevant authorities. Those questions relate to matters of critical national importance, including but not limited to:

- the regulatory position and the oversight of cryptocurrency transactions;
- the composition and utilization of Sri Lanka's US Dollar reserves;

- the policy direction on digital currency;
- the independence and governance conduct of the Central Bank;
- the legality and the procedural basis of the 2022 debt standstill announced without prior Parliamentary approval;
- the operational scope and effectiveness of the Central Bank's Supervision Division; this was also referred to by IMF delegation in the Diagnostic Report for corrective action.
- the strategy and the transparency of US Dollar reserve build-up for the Government; and
- recent allegations of financial irregularities involving institutions such as the NDB, which now have extended to involve five to seven banks and four to nine non-banking financial institutions. The IMF Head of Mission, at yesterday's press conference, had stated that they are watchful of this fraud and its potential ramifications on the banking sector, other financial institutions and the Central Bank's Supervision Division.

Despite the gravity and the urgency of those matters, those questions remain unanswered, neither addressed in Parliament nor adequately responded to at Committee proceedings. This pattern reflects not an isolated lapse, but a systematic failure of accountability and responsiveness.

Sir, the Supreme Court, in numerous determinations, has consistently affirmed that public office bearers are bound to exercise due diligence, transparency and accountability in the discharge of their statutory and constitutional responsibilities. The deliberate or negligent withholding of information from Parliament strikes at the very heart of Parliamentary sovereignty and oversight.

As Members of Parliament serving for the last 30 years, we are constitutionally entrusted, under Article 148 and the broader framework of representative democracy, with the responsibility of exercising control over public finance and holding institutions accountable. However, that duty becomes impossible to be fulfilled when essential information is withheld.

This is not merely a procedural inconvenience, but a grave obstruction of Privilege. It prevents me and, by extension, this House from discharging our obligations to the citizens of Sri Lanka. It also undermines public confidence in both the Government and the Opposition, as citizens rightfully expect their elected Representatives to act with knowledge, scrutiny and authority.

The continued unilateral conduct, opacity, arrogance or ignorance and apparent disregard for Parliamentary accountability by key institutions raise serious concerns regarding the governance standards, institutional integrity and the democratic responsibility.

In this context, Sir, I seek your ruling and request the following to be clarified.

1. Why have the questions formally submitted by a Member of Parliament on matters of national, financial, legal and governance importance not been answered within a reasonable time frame either in this House or at Committee level, and does this failure constitute a breach of Parliamentary Privilege?

Sir, this was taken up at the Committee on Public Finance last Tuesday at 2.30 p.m., and this stemmed from what transpired at that particular Committee. I appreciate your giving me this opportunity. This is not only for me, but also for the Government and the Opposition and we need to ensure that this is looked into.

2. What directions will be issued to ensure that the Central Bank of Sri Lanka and all relevant public institutions comply with their obligations to provide timely, accurate and complete information to Parliament, as required under the law and the Standing Orders?
3. Will this matter be referred to the appropriate Committee on Ethics and Privileges or other competent authority to inquire into whether such non-disclosure amounts to an obstruction of a Member's constitutional duties and contempt of Parliament?
4. Does this lead to relook at the one-sided independence thrusted by the previous administration at the behest of international lending institutions without the expected discharge of accountability and responsibility?

Sir, I appreciate the importance given to this.

ගරු කථානායකතුමනි, ලාල් කාන්ත ඇමතිතුමා ඉතාම සෙනෙහසින් ඊයේත්, අදත් මට කථා කළා. ඊයේ 1.00ට සහ අද උදේ 6.57ට කථා කරලා කිව්වා, "රවී, ඔබතුමාගේ නම පාවිච්චි කරලා මගේ චරිත ඝාතනයක් කරනවා" කියලා. And, when I looked into yesterday's and today's incidents, මට පෙනුණා, ඇත්තවශයෙන්ම ලොකු අපරාධයක් සිදු වී ගෙන යනවා කියලා. මගේ social media tagline එක පාවිච්චි කරලා ලාල් කාන්ත ඇමතිතුමාට කාන්තාවක් සහ තවත් දෙන්නෙක් අමු කුණුහරුපයෙන් බැණලා තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔබතුමා ඒ සම්බන්ධයෙන් පොලීසියට පැමිණිල්ලක් කරන්න. ඔබතුමාගේ නමින් තිබෙනවා නම්, ඒ සම්බන්ධව නීත්‍යනුකූලව ක්‍රියාත්මක වන්න. ඔබතුමා පොලීසියට ගිහිල්ලා පැමිණිල්ලක් කරන්න.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඒක තමයි. මම ලාල් කාන්ත ඇමතිතුමාට කිව්වා, ඒ සම්බන්ධව පාර්ලිමේන්තුවේදී අද උදේ කථා කරනවා කියලා.

අද මම නැඟී සිටින්නේ නවීන ජීවිතය සමඟ වෙන් කළ නොහැකි -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඒක කියවන්න අවශ්‍යතාවක් නැහැ. ඔබතුමාගේ නමින් තිබෙනවා නම් ඔබතුමා පොලීසියට ගිහිල්ලා පැමිණිල්ලක් දාන්න.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මේක පාර්ලිමේන්තුවේදී කිව්වේ නැත්නම්, මේ පැමිණිල්ල භාර ගන්න බැහැ කියලා CID එකෙන් කිව්වා. ඔබතුමා දැනුවත් කළාට පසුව, ලාල් කාන්ත ඇමතිතුමාගේ ඉල්ලීම පරිදි මම ඒක කරනවා. මොකද, මගේ social media byline එකෙන් කරලා තිබෙන එකක් නිසා. ඕනෑ කෙනෙකුට ඕනෑ නමක් පාවිච්චි කරලා අමු කුණුහරුපෙන් බණින්න පුළුවන්. මට ලාල් කාන්ත ඇමතිතුමාට බණින්න ඕනෑ නම්, මම ඒක කරනවා. නමුත්, ඒ වාගේ දේශපාලන සංස්කෘතියක් නොවෙයි අපි අනුගමනය කරන්නේ. මට මේ සම්බන්ධයෙන් ඔබතුමාව දැනුවත් කරන්න අවශ්‍යයි. එම නිසා මම මේක කියවනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඒකේ අමු කුණුහරුප තිබෙනවා නම් ඔබතුමා එය සභාගර්භය තුළ කියවීම එච්චර හොඳ දෙයක් නොවෙයි.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඒ අනුව, වගකීම් සහගත භාවිතය ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රතිපත්ති අප සලකා බැලිය යුතුය. ඩිජිටල් දැනුම - digital literacy - අධ්‍යාපනය සහ අන්තර්ජාල අපයෝජන වාර්තා කිරීම හා විසඳීම සඳහා ශක්තිමත් යන්ත්‍රණයක් ඉතා අවශ්‍ය වේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා පොලීසියට ගිහිල්ලා ඒ සම්බන්ධව පැමිණිල්ලක් කරන්න.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

එහෙම නම් මම මේ ලේඛනය සභාගත කරන්නද? ඔබතුමාගේ අවසරය පරිදි මෙය මුද්‍රණය කරන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට පුළුවන්, ඒ සම්බන්ධව පොලීසියට පැමිණිල්ලක් කරන්න. මුද්‍රණය කිරීම සඳහා අවසර ලබා දිය නොහැකියි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු අර්ච්චුනා මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 118(3) යටතේ මම මේ කාරණය අහන්නේ. මම පස්වෙනි අවස්ථාවට අහන්නේ, "යූටියුබ් සුදාව" inquiry එකක් කරන්න ගෙනාවේ නැත්තේ ඇයි කියලා. ගරු කථානායකතුමනි, මට ඒ සම්බන්ධයෙන් කිසිදු උත්තරයක් ලැබිලා නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඊළඟ කමිටු වාරයේදී සභාපතිතුමාව දැනුවත් කරනවා කියලා ලේකම් මණ්ඩලය මා දැනුවත් කරනවා. *[බාධා කිරීම්]*

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, මේ කොටසත් හැන්සාඩ් වාර්තාවේ මුද්‍රණය කරන්න අවසර දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

නැහැ, ඒක මුද්‍රණය කිරීම සඳහා අවසර ලබා දීමට නොහැකියි.

ප්‍රධාන කටයුතු ආරම්භයේදී යෝජනා.

## පාර්ලිමේන්තුවේ කටයුතු
### பாராளுமன்ற அலுவல்
### BUSINESS OF THE PARLIAMENT

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 24හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 83 මුඛ්‍යස්ථානය ගත යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. අ.භා. 5.30ට කථානායකවරයා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## II

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"අද දින විසිර යෑමේ දී මෙම පාර්ලිමේන්තුව 2026 මැයි 05 අඟහරුවාදා පූ.භා. 9.30 වන තෙක් කල් තැබිය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
න්‍යාය පත්‍රයේ විෂය අංක 83, බලශක්ති අමාත්‍ය ගරු කුමාර ජයකොඩි මහතාට එරෙහි විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කිරීම, ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා.

ඔබතුමාට විනාඩි 20ක කාලයක් තිබෙනවා.

## බලශක්ති අමාත්‍යවරයාට එරෙහි විශ්වාස භංග යෝජනාව
## வலுசக்தி அமைச்சருக்கு எதிரான நம்பிக்கையில்லாப் பிரேரணை
## VOTE OF NO-CONFIDENCE AGAINST MINISTER OF ENERGY

[පූ.භා. 10.43]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ගරු සජිත් ප්‍රේමදාස මහතා
ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
ගරු ගයන්ත කරුණාතිලක මහතා
ගරු දිලිප් වෙදආරච්චි මහතා
ගරු රවි කරුණානායක මහතා
ගරු අජිත් පී. පෙරේරා මහතා
ගරු කිංස් නෙල්සන් මහතා
ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
ගරු ජෝෂා විතානගේ අංකුබුර ආරච්චි මහතා
ගරු මුජිබුර් රහුමාන් මහතා
ගරු ජේ.සී. අලවතුවල මහතා
ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා
ගරු ඩී.වී. චානක මහතා
ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා
ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
ගරු බී. ආරියවංශ මහතා
ගරු හර්ෂණ රාජකරුණා මහතා
ගරු ඉම්රාන් මහරූෆ් මහතා
ගරු සුරංග රත්නායක මහතා
ගරු චතුර ගලප්පත්ති මහතා
ගරු දිලිත් ජයවීර මහතා
ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා
ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
ගරු චමින්ද විජේසිරි මහතා
ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා
ගරු නයන වාසලතිලක මහතා
ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
ගරු එස්.එම්. මරික්කාර් මහතා
ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා
ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා
ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
ගරු නීතිඥ අනුරාධ ජයරත්න මහතා
ගරු චාමර සම්පත් දසනායක මහතා
ගරු ජගත් විතාන මහතා

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා,- බලශක්ති අමාත්‍ය ගරු කුමාර ජයකොඩි මහතාට එරෙහි විශ්වාස භංගත්වය,- පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහය III වැනි කොටසේ, 6 වගන්තියෙහි:

'මන්ත්‍රීවරයන් සෑම අවස්ථාවක දී ම ඔවුන් වෙත තබා ඇති මහජන විශ්වාසයට අනුව ක්‍රියා කළ යුතු අතර, සෑම විට ම යම් පොදු සම්පත් භාවිතය ද ඇතුළු ඔවුන්ගේ හැසිරීම අවංකභාවයකින් සහ ඒකානුතාවයකින් විය යුතු ය.'

යනුවෙන් සඳහන් කර ඇතත්, එය කඩ කර ඇති හෙයින්ද;

පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහයේ V වැනි කොටසේ 9 වගන්තියෙහි චර්යා රීතිවල සඳහන්:

'(අ) හෘදය සාක්ෂියට එකඟව කටයුතු කිරීම.
(ආ) ජනතාවගේ විශ්වාසය සහ ගෞරවයට යෝග්‍ය වන පරිදි කටයුතු කිරීම.
(ඉ) තමන් වගකිව යුතු චර්යාව සහ කාර්යභාරය සම්බන්ධයෙන් වගකිව යුතු වීම.'

යන චර්යා රීති උල්ලංඝනය කර ඇති බව බැලූ බැල්මටම තහවුරු වන හෙයින්ද;

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 28 ව්‍යවස්ථාවට අනුකූලව මූලික යුතුකම් ඉටු කිරීමට අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයෙකු ලෙස අපොහොසත් වන බව නිරීක්ෂණය වන හෙයින්ද;

නොරොච්චෝලේ, ලක්විජය ගල් අඟුරු බලාගාරය සඳහා ප්‍රමාණවත් හා ගුණාත්මක ගල් අඟුරු ප්‍රසම්පාදනය සහතික කිරීම සඳහා බලශක්ති අමාත්‍යවරයා තම මූලික රාජකාරිය ඉටු කිරීමට අපොහොසත් වී ඇති බව සනාථ වන හෙයින්ද;

තීරණාත්මක ජාතික බලශක්ති වත්කමක් අධීක්ෂණය කිරීමේදී එවැනි දැඩි නොසැලකිලිමත්කමක් අමාත්‍ය වගකීම මූලික වශයෙන් උල්ලංඝනය කිරීමක් වන හෙයින්ද;

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, 2024 නොවැම්බර් 25 දිනැති අංක 2412/08 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් බලශක්ති අමාත්‍යවරයාට පවරා ඇති ආයතනික කළමනාකරණ මට්ටමින් සිදුවන පාඩු සහ විදුලි ජනන හා බෙදාහැරීමේ පද්ධතියට සිදුවන තාක්ෂණික හානි අවම කිරීමට අවශ්‍ය පියවර ගැනීම සහ විදුලි ජනනය සඳහා දරනු ලබන පිරිවැය අඩු කිරීම සහ ජනනයේදී ඇතිවන අවිනිශ්චිතතා ඉවත් කිරීම යන විෂයයන් හා කාර්යයන් ඉටුකිරීම පැහැර හැරීම සිදුකර ඇති හෙයින්ද;

වර්තමාන බලශක්ති අමාත්‍යවරයා, ලංකා පොහොර සමාගමේ ප්‍රසම්පාදන කළමනාකරු ලෙස සේවය කරමින් සිටියදී දූෂණ ක්‍රියාවක් සිදු කිරීම සම්බන්ධයෙන් ඔහුට එරෙහිව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් (26 වැනි අධිකාරය වූ) අල්ලස් පනතේ 70 වගන්තිය ප්‍රකාරව "දූෂණය වරද" පිළිබඳ චෝදනා කර කොළඹ මහාධිකරණය හමුවේ විධිමත් අධිචෝදනා ගොනු කර ඇති හෙයින්ද; සහ

ඉහත සඳහන් කළ කරුණු අනුව රාජ්‍ය මූල්‍ය පාඩුව, ජාතික බලශක්ති ආරක්ෂාව අනතුරේ හෙළීම, දූෂිත ලෙස ප්‍රසම්පාදන ක්‍රියාවලිය හැසිරවීම, "දූෂණය වරද" සඳහා ක්‍රියාකාරී අධිකරණ ක්‍රියාමාර්ගයන්ට ලක් වීම සහ රජයේ "දූෂණ විරෝධී ජනවරම" පාවා දීම තුළින් බලශක්ති අමාත්‍යවරයා පාර්ලිමේන්තුවේ සහ ශ්‍රී ලංකාවේ ජනතාවගේ විශ්වාසය ආපසු හැරවිය නොහැකි ලෙස අහිමි කර ගෙන ඇති බව සහ ඔහු දිගින් දිගටම බලශක්ති අමාත්‍ය ධුරයේ රැඳී සිටීම මහජන යහපතට, නීතියේ ආධිපත්‍යයට සහ යහ පාලන මූලධර්මවලට පටහැනි හෙයින්;

බලශක්ති අමාත්‍ය ගරු කුමාර ජයකොඩි මහතාට තවදුරටත් අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයෙකු ලෙස කටයුතු කිරීමේ හැකියාව පිළිබඳව විශ්වාසයක් නොපවතින බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි."

ගරු කථානායකතුමනි, නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරයට 2025-2026 වර්ෂය සඳහා වූ ගල් අඟුරු සපයා ගැනීම පිළිබඳ ක්‍රියාදාමයේ ප්‍රශ්නයක් තිබෙන බව අපි මුලින් කිව්වා. පළමුවැනි නැව ලංකාවට එන්න කලින්ම අපි මේ ප්‍රශ්නය බරපතළ ප්‍රශ්නයක් බවත්, මෙයින් ඇති විය හැකි පාඩුව කෙසේද කියාත් කිව්වා. මේ විෂයය පිළිබඳ වගකීම දරපු ඇමතිවරයෙක් හැටියටත්, මේ රටේ බලශක්ති පද්ධතිය පිළිබඳ නිරතුරුව විමසිලිමත් වන හිටපු ඇමතිවරයෙක් හැටියටත්, මහජන නියෝජිතයෙක් හැටියටත් මම යුතුකම් ඉටු කළා. ඉන් පසුව පළමුවැනි නැව ලංකාවට පැමිණි විට ඒ පළමුවැනි නැවම නියමිත ප්‍රමිතියට නැති බවත්, පළමුවැනි නැවම නියමිත කාලයට වඩා ප්‍රමාද වී ඇති බවත්, සිදු වන්නට යන්නේ විපතක් බවත් අපි කිව්වා. එසේ කිවූ විට මේ ඇමතිවරයා කිව්වා, "කිසිම ප්‍රශ්නයක් නැහැ, ඒත් ගල් අඟුරු බාලයි, නමුත් පාඩුවක් නැහැ, අපට මේ ප්‍රශ්නය විසඳා ගන්න පුළුවන්" කියලා. ඉන් පසුව 2026.02.27වැනි දා පාර්ලිමේන්තුවේ යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේදී මහජන උපයෝගිතා කොමිෂන් සභාව එම කමිටුවේ ඉල්ලීම පරිදි සවිස්තරාත්මක, විද්‍යාත්මක වාර්තාවක් ඉදිරිපත් කළා, මේ ක්ෂේත්‍රය පිළිබඳ වගකීම් දරන ආයතනය හැටියට. ඔවුන් කිව්වා, ගල් අඟුරු නැව් 9ක් ඇවිල්ලා තිබෙනවා, ඒ නැව් නවයේම ගල් අඟුරු බාලයි කියලා. ඒ වාගේම ඔවුන් කිව්වා, මෙයින් පාඩුවක් සිදු වෙනවාය කියලා. ගහන්න පුළුවන් දඩයත්, සිදු වන පාඩුවත් අතර බරපතළ වෙනසක් තිබෙනවාය කියාත් ඔවුන් කිව්වා. ඒ වාගේම ඔවුන් කිව්වා, මේ නැව් 9ට පමණක් රුපියල් බිලියන 8.49ක් - රුපියල් කෝටි 849ක් - පාඩු වෙලා තිබෙනවාය කියලා. ඒ, එදා ඩීසල් මිල අනුව. ඩීසල් විදුලි ඒකකයක් සඳහා රුපියල් 62.50ක් වැය වෙනවා කියා එදා ඩීසල් මිල අනුව ගණන් හදලායි කිව්වේ. ගරු කථානායකතුමනි, එසේ කිව්වත්, "ඔව්, පාඩුවක් වෙනවා, ප්‍රශ්නයක් තිබෙන බව දන්නවා, හැබැයි අපි වංචාවක් කළේ නැහැ, අපි තමයි හරි ක්‍රමයට ටෙන්ඩර් දැම්මේ" කියලා කිව්වා. ඉන්පසු විගණකාධිපතිවරිය මේ පාර්ලිමේන්තුවට වාර්තාවක් ඉදිරිපත් කළා. 2026.04.02වැනි දා විගණකාධිපතිවරිය ඉදිරිපත් කරපු එම වාර්තාව අනුව මේ ඇමතිවරයා මෙතෙක් කියපු සියලු කරුණු වැරදි බව සනාථ වුණා, ගරු කථානායකතුමනි.

විගණකාධිපතිවරියගේ වාර්තාව අනුව ගල් අඟුරු බාලයි, ටෙන්ඩර් කාර්ය පටිපාටිය වැරදියි, තෝරා ගැනීමේ ක්‍රමවේදය වැරදියි, තෝරා ගත් සමාගමට සුදුසුකම් නැහැ, තෝරා ගත් සමාගමට ඒ ශක්තිය නැහැ. ඒ වාගේම ප්‍රශ්නය ඇති වෙලා ඒ පිළිබඳව මේ පාර්ලිමේන්තුවේදී දැනුම් දුන් විට සහ සමාජය තුළ ඒ ගැන සාකච්ඡා වනවිට පවා මේ ඇමතිවරයා ඒ ගැන සංවේදී නොවී දිගින් දිගටම කටයුතු කිරීම පිළිබඳව විගණන වාර්තාවේ සවිස්තරාත්මකව දක්වා තිබෙනවා. විගණකාධිපතිවරිය ඉදිරිපත් කළ මේ වාර්තාව පිළිබඳව අද වනතුරු ඔහු කිසිම අභියෝගයක් ඉදිරිපත් කළේ නැහැ. එක් පැත්තකින්, මහජන උපයෝගිතා කොමිෂන් සභාව මෙහි තිබෙන තාක්ෂණික පැත්ත ගැන, සිදු විය හැකි පාඩුව ගැන, පරිසරයට වන හානිය ගැන, රටේ බලශක්ති ආරක්ෂාව පිළිබඳව මේ අමාත්‍යවරයා වගකීම පැහැර හැර තිබීම ගැන සවිස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ වාර්තාව පිළිබඳ වචනයකින්වත් තර්කානුකූලව අභියෝග කිරීමට මේ ඇමතිවරයා අසමත් වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, මේ පිළිබඳව විගණකාධිපතිවරිය සවිස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කර කරුණු ඉදිරිපත් කළ විට ඒ ගැන කරුණු ඉදිරිපත් කරන්න ඔහු අසමත් වෙලා තිබෙනවා. ඒ නිසා හුදු ප්‍රතික්ෂේප කිරීමෙන් පමණක් මේ ප්‍රශ්නය විසඳා ගැනීමට හැකියාවක් නැහැ, ගරු කථානායකතුමනි. මේ ඇමතිවරයාට මූලික ප්‍රශ්නයක් තිබෙනවා, ඔහු මීට කලින් කරපු රස්සාව සම්බන්ධයෙන්. ඒ කියන්නේ, නිලධාරි කුමාර ජයකොඩි පොහොර සංස්ථාවේ මිලදී ගැනීමේ කළමනාකරු හැටියට කටයුතු කරපු කාලයේ. ඔහු ඒ තනතුරට පත් වන්නේ වර්තමාන ජනාධිපති අනුර කුමාර දිසානායක මහත්මයා කෘෂිකර්ම ඇමතිවරයා හැටියට සිටියදීයි. ඔහුගේ පත්වීම දේශපාලන පත්වීමක්. තමන් ඇමති වෙනකොට යාළුවාව Procurement Manager කර ගත්තා. ඔහු එහේදී කරපු දූෂණය පිළිබඳ වරදක් සම්බන්ධයෙන් දිගු කලකට පස්සේ කොළඹ මහාධිකරණයේ නඩු අංක HCB 481/2026 නමින් අල්ලස් පනතේ 70වැනි වගන්තිය යටතේ අධිචෝදනා ගොනු කළා. දූෂණය කියන වරද ඉදිරිපත් වුණු තැනැත්තෙක් රුපියල් බිලියන ගණනක රාජ්‍ය මුදල් පාලනය පිළිබඳව කටයුතු කරන කැබිනට් මණ්ඩලය තුළ සිටීමම නොගැළපෙනවා. අපි විශ්වාස කරන වෙස්ට්මින්ස්ටර් සම්ප්‍රදාය අනුව පාර්ලිමේන්තු ක්‍රමවේදය තුළ මෙවැනි බැරෑරුම් චෝදනාවක් එල්ල වීම, වාහනයක් පදවා අනතුරක් සිදුවීමක්, නැත්නම් ඉඩම් නඩුවක් වැනි ප්‍රශ්නයක් නොවෙයි. මේක දූෂණය.

රජයේ සේවකයෙක් වශයෙන් සිටියදී දූෂණය නමැති වරදට බැලූ බැල්මට සාක්කි තිබෙනවා කියලා සෑහීමට පත් වෙලා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව රටේ ඉහළම අපරාධ අධිකරණයේ ඔහුට නඩු පවරා තිබෙනවා. මීට මාස 6කට කලින් මේ තත්ත්වය හෙළිදරව් වෙනකොට උත්සාහ කළා, නීතිඥවරු මඟින් කරුණු කියලා, කොමිසම ඉදිරියේ කරුණු දක්වලා, වරදක් කරලා නැහැ, නඩු දමන්න එපා කියන්න. ඒ පිළිබඳව කොමිසමේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ප්‍රකාශ කළා. නමුත්, වර්තමානයේ කැබිනට් මණ්ඩලයේ මේ ධුරය දරන ඇමතිවරයා වරදක් කරලා තිබෙනවා, බැලූ බැල්මට සාක්කි තිබෙනවා, නීතියට අනුව ඔහු දූෂණය නමැති වරදට වරදකරු කිරීමට තරම් ප්‍රමාණවත් සාක්කි තිබෙනවා කියලා සෑහීමට පත් වෙලා කොමිසම විසින් නඩු පැවරුවා, ගරු කථානායකතුමනි. නීතිඥවරුන්ට, ඇමතිතුමා වෙනුවෙන් කරුණු කියන්න ඉඩ දීම වරදක් නැහැ. හැබැයි, ඔහුට විරුද්ධව තිබෙන ඒ චෝදනාව නිසි ලෙස සලකා බලන්න තිබුණා. එවැනි තත්ත්වයක් තුළ, ඇත්තවශයෙන්ම වෙස්ට්මින්ස්ටර් සම්ප්‍රදාය තුළ දූෂණය පිළිබඳ චෝදනාවක් එල්ල වෙනවා නම්, ඇමතිවරයාට චෝදනාව එල්ල වූ පළමුවැනි දවසේම ඉල්ලා අස් වෙලා තමන්ගේ ආණ්ඩුවේ ගෞරවය ආරක්ෂා කරන එක, තමන්ට ලැබුණු දූෂණ විරෝධී ජන වරම ආරක්ෂා කරන එක, තමන්ගේ නායකයා වන අනුර කුමාර දිසානායකගේ ආත්ම ගරුත්වය ආරක්ෂා කරන එක කරන්න තිබුණා. හැබැයි, එහෙම කරන්න පුළුවන්කමක් තිබුණේ නැහැ.

ඒ විතරක් නොවෙයි, අනුර කුමාර දිසානායකත් ඔහුව ආරක්ෂා කළා. ගරු කථානායකතුමනි, ඒකයි කනගාටුවට කාරණය. මේ සභාවේ විපක්ෂයේ ඉස්සරහ පේළියේ ඉඳගෙන අවුරුදු 20කට වැඩි කාලයක් දූෂණයට එරෙහිව කථා කරපු වත්මන් ජනාධිපතිතුමා මෙවැනි අවස්ථාවක වෙන පක්ෂයක කෙනෙක් මේ වැඩේ කළා නම්, මෙවැනි ආකාරයේ චෝදනාවකට ලක් වුණා නම්, වෙනත් පක්ෂයක ඇමතිවරයෙක් මේ තත්ත්වයට පත් වෙලා හිටියා නම්, "ඇමතිවරයා අනිවාර්යයෙන්ම ඉල්ලා අස් වෙන්න ඕනෑ. දූෂණ චෝදනා තිබෙන ඇමතිවරයෙක් කැබිනට් මණ්ඩලයේ ඉන්නේ කොහොමද?" කියලා අහනවා. එහෙම අහන අනුර කුමාර දිසානායක අද තමන්ගේ හොඳම මිත්‍රයා; තමන්ගේ කල්‍යාණ මිත්‍රයා, එකට පොහොර සංස්ථාවේ කටයුතු කරපු මිත්‍රයා දූෂණ චෝදනාවට ලක් වෙනකොට අහක බලාගෙන යනවා. ඒ ගැන කනගාටුයි, ගරු කථානායකතුමනි. එවැනි ඇමතිවරයෙකුට මේ ධුරය දරන්න සුදුසුකමක් ඇත්තේ නැහැ.

ඒ විතරක් නොවෙයි, ගරු කථානායකතුමනි. මේ ටෙන්ඩරය ජයග්‍රහණය කළා කියන Trident Chemphar Limited එක මීට කලින් ලංකාවේ ආණ්ඩුවට සහල් මෙට්‍රික් ටොන් 30,000ක් සැපයීමේ ක්‍රියාදාමයේදී දූෂණයක් සිදු කිරීම සම්බන්ධව blacklist කරපු සමාගමක්; අසාදු ලේඛනගත සමාගමක්. ඒ වාගේම මේ Trident Chemphar Limited එකේ ප්‍රධාන විධායක නිලධාරියා ඉන්දියාවේ ප්‍රධානම, සුප්‍රකට, දූෂණය පිළිබඳ නඩුවක් වන Delhi liquor licence නඩුවේදී අත්අඩංගුවට ගත් තැනැත්තෙක්. ඒ වාගේම ඒ සමාගමේ ලංකාවේ නියෝජිතයා, ප්‍රධානියා, ජයසුන්දර වරදකරු වෙලා තිබෙනවා, ක්‍රිකට් සම්බන්ධ දූෂණයකට. ඔහුට වසර හතක ක්‍රිකට් තහනමක් පනවා තිබෙනවා. ඒ වාගේම එම සමාගමේ තවත් අධ්‍යක්ෂවරු දෙදෙනෙක් දූෂණය හා සම්බන්ධ කාරණාවලට ජනවාරි මාසයේදී අත්අඩංගුවට අරගෙන තිබෙනවා. එතකොට, මේ පිළිබඳව අධ්‍යයනය කරන විට පෙනෙන්නේ මොකක්ද? නිකම්ම ඉදිරිපත් වුණාට දෙන්නේ නැහැ නේ. මේ Trident Chemphar කියන්නේ අපරාධ ඉතිහාසයක් තිබෙන සමාගමක්; ඉන්දියාවේ අපකීර්තිමත් සමාගමක්; මුදල් විශුද්ධිකරණය හා සම්බන්ධ සමාගමක්; ඉන්දියාවේ දේශපාලනය තුළ ඉතාම අප්‍රකට සමාගමක්. එවැනි සමාගමකට මේ ටෙන්ඩරය යනතුරු බලාගෙන ඉන්න කටයුතු කළා.

ගරු කථානායකතුමනි, තව ඉතා වැදගත් කාරණයක් මට කියන්න තිබෙනවා. ගරු නලින්ද ජයතිස්ස ඇමතිතුමනි, ඔබතුමා දූෂණයට විරුද්ධයි. මම අදත් විශ්වාස කරනවා, නලින්ද ජයතිස්ස ඇමතිතුමා දූෂණයට සම්බන්ධ නැහැ කියලා. මේ පිළිබඳ මේ ප්‍රශ්නය යද්දී ඔබතුමන්ලාගේ ආණ්ඩුවෙන් පත් කරපු ගල් අඟුරු සමාගමේ සභාපති ඉල්ලා අස්වීමේ ලිපියක් දුන්නා. ඔබතුමා දකින්නේ නැතුව ඇති ඒ ලිපිය. ඒ ලිපියේ තිබෙන්නේ මෙම වරද සම්බන්ධව, මේ ගල් අඟුරු ටෙන්ඩරය සම්බන්ධව අනාගතයේ ඇති වන නීතිමය වගකීම්වලට මට යටත් වෙන්න බැහැ, අමාත්‍යාංශයේ ලේකම්වරයා විශාල වැරදි ප්‍රමාණයක් කරනවා, ඒ නිසා මම අස් වෙනවා කියලා. ඔහු ඉල්ලා අස්වීමේ ලිපි දෙකක් දුන්නා. පළමුවැනි ලිපිය තවම තිබෙනවා, ගල් අඟුරු සමාගමේ. මොකක් හරි වරදක් වෙනවා නම්, අඩුපාඩුවක් වෙනවා නම්, ඇමති දන්නේ නැත්නම්, අමාත්‍යාංශයේ ලේකම් නම් ඒක කරන්නේ, "මෙහෙම වරදක් වෙනවා. මට වගකීම් දරන්න බැහැ. මම තනතුරෙන් අස් වෙනවා" කියලා තමන් පත් කරපු සභාපති කියනකොට මොකක්ද කරන්න ඕනෑ, ගරු කථානායකතුමනි? ඒ ගැන හොයා බලන්න ඕනෑ. නමුත්, එහෙම කළේ නැහැ. සභාපතිට කිව්වා, ඔයා මේ පළමුවැනි ලිපිය ඉවත් කරගෙන සෞඛ්‍ය හේතු මත කියලා දෙවැනි ලිපියත් දෙන්න කියලා. ලිපි දෙකම තිබෙනවා, ගල් අඟුරු සමාගමේ. නලින්ද ජයතිස්ස ඇමතිතුමනි, ඔබතුමන්ලා දන්නේ නැහැ මේ වැඩේ. නමුත්, මේ ඇමතිතුමා ඒ ගැන දන්නවා. එතුමාගේ අමාත්‍යාංශයේ ලේකම් ඒ ගැන දන්නවා. එතුමාගේ අමාත්‍යාංශය යටතේයි තිබෙන්නේ Lanka Coal Company එක. "පෞද්ගලික" කියලා කිව්වාට ඒක රජයේ සමාගමක්. එහි සභාපති පත් කළේත් ඔබතුමන්ලාගේ ආණ්ඩුවෙන්. ඒකේ වරදක් නැහැ. ඒක දේශපාලන පත්වීමක්. හැබැයි, තමන් පත් කරපු තමන්ගේ කෙනා ඉල්ලා අස් වෙලා යනකොට වැඩේ අවුල් කියලා කට වහගෙන හිටියා. මොකද, ඒ? වරදට සම්බන්ධයි; දූෂණයට සම්බන්ධයි. එවැනි ඇමතිවරයෙකුට මේ ධුරය දරන්න හැකියාවක් නැහැ, ගරු කථානායකතුමනි.

ඒ වාගේම මේ ඇමතිවරයා තවත් විශේෂ වැඩක් කළා. ඒ තමයි සූර්ය බලශක්තිය අධෛර්යවත් කිරීම සඳහා කටයුතු කිරීම. අපි කවුරුත් දන්නවා, මේ රටේ අද දවසේත් දිනක බලශක්ති අවශ්‍යතාවෙන් සියයට 20ත්, 25ත් අතර ප්‍රමාණයක් සපයන්නේ සූර්ය බලයෙන් බව. අපි ඒ ගැන ආඩම්බර වෙනවා. බැටරි පද්ධති නැතිව රටේ සම්පූර්ණ බලශක්ති අවශ්‍යතාවෙන් සියයට 25කට ආසන්න ප්‍රමාණයක් පසුගිය කාලයේ දිගටම සැපයුවේ සූර්ය බලයෙන්. ඇත්තවශයෙන් නොරොච්චෝලේ බලාගාරයේ දැන් සපයන බලශක්ති ප්‍රමාණයට ආසන්න ප්‍රමාණයක් සූර්ය බලයෙන් සපයනවා.

2016 සැප්තැම්බර් මස 6වැනි දා සූර්ය බල සංග්‍රාමය ව්‍යාපෘතිය මඟින් Net Plus, Net Metering සහ Net Accounting වැනි ක්‍රම හඳුන්වා දීලා, ඒ තිබුණු දූෂණ අයින් කරලා, ටෙන්ඩර් ක්‍රම හඳුන්වා දීලා, ඇමතිවරයා හෝ ලේකම් හෝ කාගෙවත් බලයක් නැතිව පිරිසිදුව රට තුළ සූර්ය බලය සම්බන්ධ ව්‍යාපාර කිරීමට පුරවැසියා ශක්තිමත් කරන්න, ඒ සඳහා පුරවැසියාට හයිය ලබා දෙන්න කටයුතු කරපු නිසා අද වෙනකොට මේ රටේ solar power මෙගාවොට් 3,000ක ප්‍රමාණයක් තිබෙනවා. ගරු කථානායකතුමනි, ඒ මෙගාවොට් 3,000 ලබාගැනීම සඳහා මූලික වෙච්ච පුද්ගලයන් හැටියට අපට අයිතියක් තිබෙනවා. නමුත්, මේ ඇමතිවරයා මේ රටේ අනාගතය, ලෝකයේ අනාගතය, පුනර්ජනනීය බලශක්තිය අධෛර්යවත් කළා, මේ පාර්ලිමේන්තුව අධෛර්යවත් කළා, විහිළු කළා, සූර්ය බලශක්ති ව්‍යාපාරයේ ඉන්න ව්‍යාපාරිකයන්ට අපහාස කළා, පාරිභෝගිකයන් අධෛර්යවත් කළා, මේ දේවල් වැට්ටුවා. එහෙම කරපු පුද්ගලයා තමයි ගල් අඟුරු සම්බන්ධව මෙහෙම කටයුතු කරන්නේ. එතකොට අපට පෙනෙනවා, මේකේ සම්බන්ධයක් තිබෙනවා කියලා.

ගරු කථානායකතුමනි, මම කාරණයක් අහන්න කැමැතියි. ගල් අඟුරු සමාගමේ සභාපතිවරයා ඉල්ලා අස්වීමේ ලියුම දුන්නා. පුවත්පත්වල ඒ පිළිබඳව පළ වුණා. ඒ දිනවලම අපි මේ පාර්ලිමේන්තුවේ කථා කළා, මෙහෙම සිද්ධියක් වෙලා තිබෙනවා, මේ ටෙන්ඩරය දූෂිත නිසා ඔහුට එහි වගකීම දරන්න බැරි නිසා තමයි අස් වෙන්නේ කියලා. ජනාධිපතිතුමා ඇහුවෙත් නැහැ, "පුණ්‍ය කුමාර මොකක්ද මේ ප්‍රශ්නය?" කියලා. ඔබතුමන්ලා ඇහුවෙත් නැහැ. ඒක තමයි කනගාටුදායක තත්ත්වය. එහෙම කළා නම් අවසානයේ මේ රටට වෙන විපත වළක්වා ගන්න තිබුණා. මීට මාස ගාණකට කලින් - ඔක්තෝබර් මාසයේ - මේ පිළිබඳව සංවේදී වුණා නම් අද ඇති වෙලා තිබෙන දැවැන්ත පාඩුව වළක්වා ගන්න තිබුණා. අද ජාත්‍යන්තර මූල්‍ය අරමුදල කියන්නේ මොකක්ද? අද මේ රටේ ප්‍රධාන පුවත්වල ප්‍රධාන news එක මොකක්ද? IMF එක කියනවා, මේ රටේ විදුලි බිල වැඩි වෙන්න ප්‍රධානම හේතුවක් තමයි ගල් අඟුරු දූෂණය කියලා. ඒක මදිද ඉල්ලා අස් වෙන්න? ඒක මදිද ඇමතිතුමනි, ඉල්ලා අස් වෙන්න? හොරකමක් නැහැමයි කියමු, දූෂණයක් නැහැමයි කියමු. ඔබතුමාගේ වගකීම තමයි කළමනාකරණය, ප්‍රතිපත්තිය සම්පාදනය. ඒ කළමනාකරණය පිළිබඳ වගකීම අත හැරියාට පස්සේ ඔබතුමාට තවම ඔය තනතුරේ ඉන්න පුළුවන්ද? පාඩුව පොඩි ගාණක්ද? PUCSL එකේ වාර්තාව අනුව පළමුවැනි නැව් 9ට

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

කෝටි 849ක් පාඩුයි. ඒ, සෘජු පාඩුව. දැන් නැව් 18ක් විතර එයි කියලා බලාපොරොත්තු වෙනවා. එතකොට ඒ පාඩුව අඩු ගාණේ දෙගුණ වෙනවා. නමුත්, අද වනකොට ඩීසල් මිල වැඩි වෙලා තිබෙන හින්දා පාඩුව ඒ වාගේ තුන් ගුණයක් විතර වෙන්න පුළුවන්.

එහෙම තත්ත්වයක් තිබියදී අද ඔළුව ගහගෙන ඉඳලා හරියන්නේ නැහැ, ඇමතිතුමනි. සමාජයට මුහුණ දෙන්න ඕනෑ. ඔබතුමා ඇමතිකම දරන්නේ, ඔය පහසුකම් සියල්ල භුක්ති විඳින්නේ ජනතාව නිසා. දූෂණ විරෝධී ජන වරමක් තමයි ඔබතුමන්ලාගේ ආණ්ඩුවට ලැබුණේ. අද මෙතැන ආණ්ඩුවේ 159දෙනෙකු ඉන්නවා. ඒ ගරු මන්ත්‍රීතුමන්ලාට; ඔබතුමන්ලාට ලැබුණු ජන වරමට අපි ගරු කරනවා. හැබැයි, ජාතික ලැයිස්තුවෙන් ගෙනැල්ලා බලශක්ති ඇමතිකම දීපු පුණ්‍ය කුමාර ජයකොඩි තමුන්නාන්සේලාගේ ජන වරමට එරෙහිව කටයුතු කර තිබෙනවා, දූෂණය නමැති වරද කර තිබෙනවා කියන එක මතක තබා ගන්න. එතුමා එක සැරයක් ඒක පොහොර සංස්ථාවේදී කළා. දෙවැනි සැරේ මෙතැනදී කළා. ලංකා ඉතිහාසයේ ලොකුම දූෂණය. දැන් බිමල් රත්නායක ඇමතිතුමා, මෙතැනින් නැඟිටලා යන්න කලින් මම මේ කියන්නේ. ගරු ඇමතිතුමනි, ඔබතුමාවත් පැටලුවා නේ, මේකට. මම හිතුවේ නැහැ, ඔබතුමා ඔහොම කරයි කියලා. ඔබතුමා Trident Chemphar Limited එක වෙනුවෙන් කථා කළා. Trident Chemphar Limited එක බංකොලොත් වෙයි, දඩ ගහන එක ගොඩක් කරන්න බැහැ, වැඩියෙන් දඩ ගැහුවොත් Trident Chemphar Limited එකට "ඌයියා" වෙනවා කියලා ඔබතුමා කිව්වා නේ. අපි පුදුමු වුණා. ඔබතුමා සාමාන්‍යයෙන් දූෂණ විරෝධියි. *[බාධා කිරීමක්]* Trident Chemphar Limited එක වෙනුවෙන්, Trident Chemphar Limited ඒකේ ආරක්ෂාව වෙනුවෙන් නේ ඔබතුමා කථා කළේ. *[බාධා කිරීමක්]* එතුමා කථා කරන්නේ නැහැ, පුරවැසියෝ වෙනුවෙන්. බිමල් රත්නායක ඇමතිතුමා කථා කළේ Trident Chemphar Limited එක වෙනුවෙන්. *[බාධා කිරීමක්]* ඔබතුමාගේ කථාවේදී කියන්න. විනාඩි 30ක් තිබෙනවා උත්තර දෙන්න. දැන් උත්තර දුන්නත් කමක් නැහැ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, අපි පුදුම වෙනවා මේ කියන කාරණා ගැන. මේ විවාදය සම්බන්ධව අපි පැහැදිලි කිරීම් කරන්නම්. ඊට පෙර කියන්න ඕනෑ පළමුවැනි දෙය මේකයි. අපේ ආණ්ඩුව ඇතුළේ ඉන්න යම්කිසි මන්ත්‍රීවරයෙකුගෙන් දූෂණයක්, වංචාවක් සිදුවෙනවා නම් අපි පක්ෂයක් ලෙස කවුරුවත් කියනකම් ඉන්නේ නැහැ, ඊට කලින් අපිම අයින් කරනවා. *[බාධා කිරීම්]* නැහැ. මගේ නම කිව්ව නිසා -*[බාධා කිරීම්]* ගරු කථානායකතුමනි, අපි මේ ප්‍රශ්නයේදී කරුණු කාරණා සහිතව- *[බාධා කිරීම්]* ඇහුම්කන් දෙන්න ඉතින්. අපි මේ විවාදයේදී තර්කානුකූලවත් කරුණු සහිතවත් උත්තර දෙනවා. අපිට කියන්න තිබෙන්නේ මේකයි. *[බාධා කිරීම්]* මම ඒක මගේ කථාවේදී පැහැදිලි කරන්නම් අවශ්‍ය වුණොත්. අපි පක්ෂයක් ලෙස, මහ බැංකු කඩපු හොරුන්ගෙන් උපදෙස් අරගෙන කටයුතු කරන්න යන්නේ නැහැ. මෙයා Footnote එක්කෙනෙක් නේ. ඔබතුමා, ෆුට්නෝට් කල්ලියේ කොතැනද හිටියේ?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි 2ක කාලයක් තිබෙන්නේ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, එතුමාගේ කථාවේදී එතුමා උත්තර දෙයි. මම අහපු දෙයට උත්තර දුන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, එක දෙයක් පැහැදිලියි. ඒ තමයි, මේ ඇමතිවරයා වංචාව සංවිධානය කළේ කොහොමද කියන එක. මේ ඇමතිවරයාට 2025.04.08වැනිදා Lanka Coal Company (Pvt.) Ltd. එක සම්ප්‍රදායානුකූලව දැනුම් දුන්නා, දැන්, ඊළඟ අවුරුද්දට ටෙන්ඩරය පටන් ගන්න ඕනෑ කියලා.

දැන් නිලධාරින්ව හිරේ දමන්න ලැහැස්ති වෙනවා. ඇමති බේරිලා, නිලධාරින් වගකියන්න ඕනෑ, ලේකම් වගකියන්න ඕනෑ, Lanka Coal Company (Pvt.) Limited එකේ නිලධාරින් වගකියන්න ඕනෑ කියලා කියන්න දැන් ලැහැස්ති වෙනවා. අපට ඕවා ආරංචියි. ඒ අය වැරදි ඇති; දඬුවම් කරන්න. ඒ ගමන් ඇමතිත් හිරේ යන්න ඕනෑ. ඒකයි කියන්න තිබෙන්නේ.

Lanka Coal Company (Pvt.) Limited එක 2025.04.08වැනි දා දැනුම් දුන්නා, ඊළඟ ටෙන්ඩරය පටන් ගන්න කියලා. එහෙම කියලා තිබෙද්දීත්, ඒ ටෙන්ඩරය පටන් ගත්තේ, ලංසු කැඳවීම කළේ 2025.08.18වැනි දා. ඒ කියන්නේ, අදාළ සමාගමට - Trident Chemphar Limited එකට - අවශ්‍ය කරන ඒ මූලික සුදුසුකම් ටික ලබා ගන්න පහසුකම දීලා, බලලා තමයි ඒක කළේ. ඒත් අපි දන්නවා, විගණකාධිපති කියනවා, සුදුසුකම් නැහැ කියලා. එදාටවත් ලියාපදිංචි වෙලා නැහැ. මොකද, හදිසියේ නේ කරන්නේ. ලෝකයේ කොහේවත් නැති, ජාත්‍යන්තර ගල් අඟුරු වෙළෙඳාම පිළිබඳ අත්දැකීම් නැති, ලෝකයෙන් එපා කරපු, අපරාධ ඉතිහාසයක් තිබෙන සමාගමක් නේ හොයා ගත්තේ. ලියාපදිංචියවත් හරියට කරලා නැහැ. එහෙම තිබෙද්දී තමයි මේ ටෙන්ඩරය දමන්න ඉඩ දුන්නේ. මෙහි ලස්සනම කොටස මේකයි, ගරු කථානායකතුමනි. සාමාන්‍යයෙන් ටෙන්ඩරයක් සඳහා දවස් 42ක් දෙනවා. අප්‍රේල් මාසයේ ඉඳලා මේක චේතනාන්විතව ප්‍රමාද කරපු මේ ඇමතිවරයා - මේක Lanka Coal Company (Pvt.) Limited එක නොවෙයි ප්‍රමාද කළේ, මේ පුණ්‍ය කුමාර ජයකොඩියි ප්‍රමාද කළේ - ඊට පස්සේ හදිසියේම කියනවා, දවස් 21ක් දෙමු කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, your time is over now.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, මට විනාඩි 5ක් දෙන්න, අපේ පක්ෂයෙන්.

පළමුවෙනි කාරණය තමයි මේක වුවමනාවෙන් පරක්කු කිරීම. ඊළඟ කාරණය තමයි ඊට පස්සේ හදිසි කරලා ටෙන්ඩරය දාලා, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, your time is over.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
අපේ පක්ෂයෙන් වෙලාව ගන්නවා. I am the Deputy Whip of the Opposition, Sir.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මට තිබෙන වෙලාවෙන් ගන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Okay, Hon. Ajith P. Perera, you will be given five more minutes.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, මොකක්ද කර තිබෙන්නේ? මුලින් පරක්කු කළා. ඊට පස්සේ හදිසි කළා. හදිසි කරලා Trident Chemphar Limited එකේ මිල තමයි අඩුම මිල කියලා තීරණය කළාට පස්සේ දැන් Trident Chemphar Limited එකට ගල් අඟුරු නැහැ. මොකද, ඒගොල්ලන් ගල් අඟුරු බිස්නස් එකේ ඉන්න මිනිස්සු නොවෙයි. ඊට පස්සේ දවස් 40ක් පරක්කු කළා. පුළුවන් නම් උත්තර දෙන්න, දවස් 40ක් පරක්කු කළේ ඇයි කියලා. මේවා තමයි දූෂණය - corruption - කියන්නේ; අපරාධ කියන්නේ. මේවා තමයි හෙණ ගහන වැඩ කියන්නේ. අන්තිමට 2025.10.29වැනි දා තමයි කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන්නේ. අවශ්‍ය වෙලාවට ප්‍රමාද කරනවා; අවශ්‍ය වෙලාවට ඉක්මන් කරනවා. එහෙම කරන්නේ දූෂණය නිසා. දූෂණය පිළිබඳ අලුත් නීති අර්ථ නිරූපණය අනුව මෙම ක්‍රියාව එනයින්ම දූෂණයක්.

ගරු කථානායකතුමනි, ඒ වාගේ තව වැඩක් කළා. නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරයට ගල් අඟුරු මිලදී ගන්නා ක්‍රම දෙකක් තිබෙනවා, spot tenders සහ term tenders ලෙස. පසුගිය අවුරුදු 16ක ඉතිහාසය තුළ නැව් 135ක් අරගෙන තිබෙනවා, spot tendersවලින්. නැව් 240ක් අරගෙන තිබෙනවා, term tendersවලින්. ඒ කියන්නේ, දිගු කාලීන ටෙන්ඩර්වලින් 240යි; spot tendersවලින් 135යි. විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණයක් තමයි, මෙහෙම සමාගම් දෙකකින්, ආකාර දෙකකට, මූලාශ්‍ර දෙකකින් ගල් අඟුරු ලබා ගත්තාම අවදානම අඩුයි, ඒක ලාභදායකයි, ඒක ආරක්ෂිතයි, ඒක රටේ බලශක්ති සුරක්ෂිතතාවට හේතු වනවා කියන එක. මේ ඇමතිවරයාට Lanka Coal Company එක යෝජනා කළා, අපි මේ term tender සහ spot tender කියන option එකට යමු කියලා. හැබැයි, ඇමතිවරයා බැහැ කිව්වා. ගරු ඇමතිතුමනි, ඒ වෙන මොකුත් නිසා නොවෙයි, ගෙඩිය පිටින්ම කන්න ඕනෑ හින්දායි. සමාගම් දෙකකට ගියා නම් මේක ප්‍රශ්නසහගතයි නේ; මිල සංසන්දනය වෙනවා නේ; මිල අඩු වැඩි වීම තේරෙනවා නේ. ඒ නිසා එතෙක් තිබුණු සම්ප්‍රදාය නැති කරලා, spot tender සහ term tender කියන ක්‍රම දෙක සමාන්තරව යන ක්‍රමය නැති කරලා තනි සමාගමට දෙමින් දූෂණයට පාර කැපුවා; රට විනාශයට අරගෙන ගියා.

ගරු කථානායකතුමනි, ඒ විතරක් නොවෙයි, තව විශේෂ තත්ත්වයක් ඇති වුණා. ඒ තමයි, මේ අර්බුදය මතු වුණාම බලාගාරය කියනවා, අපි බලශක්තිය උත්පාදනය කරන්නේ නැහැ කියලා; මේ ගල් අඟුරු බාලයි කියලා. ඒ වාගේම කියනවා, මේ බලාගාරයේ අඩුපාඩුකම් තිබෙනවා කියලා. අපේ ගරු නියෝජ්‍ය ඇමතිතුමාත් සභාවේ හිටියා. නියෝජ්‍ය ඇමතිතුමා දන්නේ නැහැ මේවා ගැන. මොකද, එතුමා පත් වුණේ මේ මෑතකදී නේ. එතුමා සම්බන්ධ නැහැ, මේ දූෂණයට. හැබැයි, එතුමා කියනවා "හරි වැඩේ නේ. දැන් බලන්න ඕනෑ බලාගාරය කැඩිලාද කියලා" යනුවෙන්. ගරු කථානායකතුමනි, බලශක්ති නියෝජ්‍ය ඇමති අපේ ගරු අර්කම් ඉල්යාස් මැතිතුමා කියනවා, බලාගාරය කැඩිලා ද කියලා බලන්න ඕනෑ කියලා. නොරොච්චෝලේ බලාගාරය හොඳට ක්‍රියාත්මක වෙනවා. ඒක ස්වයංක්‍රිය බලාගාරයක්. ඒකේ දත්තවලට බොරු කරන්න පුළුවන්කමක් නැහැ. ප්‍රශ්නය තිබෙන්නේ ගල් අඟුරුවලයි. ඒ බව දැන් නැවත නැවත ඔප්පු වෙලා තිබෙනවා. එහෙම නම්, බලාගාරයේ අවුලක් නොවෙයි මේ තිබෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, you have two minutes left of your additional time.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
හොඳමයි, ගරු කථානායකතුමනි.

අන්තිමට මේ ප්‍රශ්නය විසඳා ගන්න තිබුණා. ඒ තමයි, umpire sample එක බලන එක. විගණකාධිපතිතුමා කියනවා, අර්බුදය මුලින් විසඳා ගන්න පුළුවන්කම තිබියදී, ඒ සියල්ලම කරන්න පුළුවන්කම තිබියදී umpire sample එක බැලුවේ නැහැ කියලා. ඒ, දූෂණය නිසා, හොරකම නිසා, හොරකම අහු වෙන නිසා.

ගරු ඇමතිතුමනි, මම ඔබතුමාට අවසාන වශයෙන් එක දෙයක් කියන්නම්. ඔබතුමන්ලා මේ අපහසුතාවට පත් කරන්නේ ඔබතුමන්ලාට ඡන්දය දුන්, දූෂණ විරෝධී ජන වරමක් දුන් මේ රටේ අහිංසක මිනිස්සු. මේ රටේ මිනිස්සු මේ රටේ අනාගතය වෙනුවෙන් මහත් බලාපොරොත්තු තියාගෙන නැවුම් ජන වරමක් ලබා දීලා මේ ආණ්ඩුව පත් කළා. ඇමතිතුමා, ඔබතුමාත්, ඔබතුමාගේ කණ්ඩායමත් ඒ ජන වරම පාවා දුන්නා. ලජ්ජා වෙන්න! ලජ්ජා වෙන්න, ඇමතිතුමා! දැන් හරි ඉල්ලා අස් වෙන්න. හැබැයි, ඉල්ලා අස් වෙන්නේ නැත්නම්, අස් කරන්නේ නැත්නම්, මේ ආණ්ඩුවේ ඉන්න ඔබතුමන්ලා ඔක්කෝම මේ අපරාධයට සම්බන්ධයි. *[බාධා කිරීම්]*

අනුර කුමාර දිසානායක මැතිතුමා ඇතුළු- *[බාධා කිරීමක්]* ගරු නලින්ද ජයතිස්ස ඇමතිතුමනි, මගේ මිත්‍රයා වුණත් ඔබතුමාත් මේ වාගේ වෙලාවක කෙළින් හිට ගන්නේ නැත්නම්, ඔබතුමාගේ කැබිනට් මණ්ඩලයේ ඉන්න දූෂිතයෙකුට, මේ විගණකාධිපති වාර්තාවෙන් ඔප්පු වෙලා තිබෙන, විගණකාධිපති සහතික කර තිබෙන හොරෙකුට පක්ෂව අත ඔසවනවා නම් මට හිතන්න වෙන්නේ ඔබතුමාත් ඒකට සහයෝගය දක්වනවා කියලායි. ඒ නිසා මා ඉල්ලන්නේ, පක්ෂය අමතක කරන්න, JVP, NPP කියන එක අමතක කරන්න, රට වෙනුවෙන් හිතන්න කියලායි. මේ ඇමතිවරයාට විරුද්ධව, අවංකව, තමන්ගේ හෘදය සාක්ෂියට අනුව ඡන්දය දෙන්න කියා මම ඉල්ලා සිටිනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

The Hon. S.M. Marikkar to second the Motion. You have 15 minutes.

[පූ.භා. 11.09]

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු කථානායකතුමනි, අද දිනයේ ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා විසින් පුණ්‍ය කුමාර ජයකොඩි ඇමතිවරයාට එරෙහිව ගෙනාපු විශ්වාස භංග යෝජනාව මම ස්ථිර කරනවා. මම පැහැදිලිව කියනවා, මේ කාරණය. මේ සම්බන්ධව අද විවාදයක් තියන්න අවශ්‍යත් නැහැ. මුළු රටම දන්නවා හොරා කාලා කියලා. මුළු රටම පිළිගන්නවා, මේකෙන් හොරා කාපු නිසා බිලියන 30කට වඩා මුදලක් අවභාවිත වෙලා, නාස්තියක් වෙලා කියලා. ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ හිටපු සභාපති, සරත් කෝන්ගහගේ සහ හිටපු අතිරේක අධ්‍යක්ෂ ජෙනරාල්, දේවප්‍රිය අබේසිංහට විරුද්ධව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවෙන් නඩු දාලා තිබෙන්නේ, මේ වන විට ඒ අය රක්ෂිත බන්ධනාගාරගත කරලා තිබෙන්නේ මිලියන 14ක් නාස්ති කළා කියලා. අර්ජුන රණතුංග හිටපු ඇමතිවරයාට නඩු දැම්මේ හොරා කෑවා කියලා නොවෙයි, නාස්ති කළා කියලා. එක වතාවක්, දෙවතාවක් නොවෙයි, තුන්වතාවකට වඩා මේක තහවුරු වෙලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, මේක ලංකා ඉතිහාසයේ සිදු වෙච්ච සංවිධානාත්මක මංකොල්ලයක්. සංවිධානාත්මක මංකොල්ලයක්! ඇයි, සංවිධානාත්මක මංකොල්ලයක් කියන්නේ? 2025 අගෝස්තු මාසයේ 19වැනි දා තමයි මේ සැපයුම්කරු ලියාපදිංචි වෙලා තිබෙන්නේ. ලියාපදිංචි වෙන්න කලින්ම ලංසු පත්‍රිකාව සැපයුම්කරුට දීලා තිබෙනවා. එහෙම කොහොමද කරන්නේ? හැබැයි, එයා ලියාපදිංචි වෙන්න අවශ්‍ය ඩොලර් 5,000 ගෙවලා තිබෙන්නේ අගෝස්තු මාසයේ 22වැනි දා. එහෙම නම්, මේක සැලසුම් කරපු දෙයක් කියලා අපි දන්නවා. මොකද, මෙතුමා රුසියාවට ගිහිල්ලා ඊට පෙර රුසියාවෙන් ගල් අඟුරු supply කළ සමාගම මුණ ගැහුණා. මෙතුමා ඉල්ලුවේ මොකක්ද? ඒකේ ඉන්න ලංකාවේ local agentව අයින් කරන්න කියලායි. ඒ, එයාට කැමැති කෙනෙකුව දමා ගන්නයි. ඒ සමාගම අකමැති වුණු හින්දා නැව් 11න් පස්සේ ඒක නතර වුණා. ඒකත් පැත්තකින් තියමු. ගල් අඟුරු ප්‍රසම්පාදන ක්‍රියාවලියට අදාළව මෙහෙම වැරදි විධියට ලංසු තියන්න අවස්ථාව දීලා තිබෙනවා. විගණකාධිපති විසින් මීට පෙර ලබා දී තිබූ උපදෙස් අනුව දින 42ක් ලබා දෙන්න ඕනෑ, මේ ටෙන්ඩරයට. හැබැයි මෙතුමා ඒක අඩු කළා, දින 21කට. දින 21ට අඩු කළේ ඇයි? පිළිගත් සමාගම්වලට ක්‍රමානුකූලව සූදානම් වෙන්න තිබුණු අවස්ථාව නැති කරන්නයි. ඊට පස්සේ කිලෝ කැලරි 5,900ට වැඩි අගයක ගල් අඟුරු අන්තිම අවුරුදු තුනේ මෙට්‍රික් ටොන් ලක්ෂ 5ක් supply කරලා තිබෙන්න ඕනෑ කියන එක මෙට්‍රික් ටොන් ලක්ෂයට අඩු කෙරුවා. ඇයි ඒ? දූෂිත සමාගම්වලට මේක ඇතුළට එන්නයි. ඊළඟට, මාස 36ක් ඇතුළත මෙට්‍රික් ටොන් ලක්ෂ 10ක් ගල් අඟුරු සපයා තිබෙන්න ඕනෑ කියන එක මෙට්‍රික් ටොන් ලක්ෂ 5ට අඩු කළා. හිතාමතාම සංවිධානාත්මකව ඒක කළා. ඒ නිසා තමයි බලපෑම්වලට යට වෙන්න බැහැ කියලා ලංකා ගල් අඟුරු සමාගමේ හිටපු සභාපතිවරයා ඉල්ලා අස් වුණා කියන්නේ. මොකද, ඔහු පිළිගත්තා විගණකාධිපති දෙපාර්තමේන්තුව මේ විධියට සුදුසුකම් ලේඛනය හරි ගස්සන්න කියලා උපදෙස් දීලා තිබුණා කියලා. එතැනින් තමයි මේක පටන් ගත්තේ.

ගරු කථානායකතුමනි, ඊළඟ කාරණය මේකයි. මේගොල්ලෝ නීතිපතිවරයා අත්සන් කරන දවසට කලින් දවසේ ටෙන්ඩර් එක ලබා දෙනවා, නීතිපතිවරයාගේ එකඟතාවකින් තොරව. කොහොමද එහෙම කරන්නේ? මේවා මම කියන ඒවා නොවෙයි, මේ විගණකාධිපති වාර්තාවේ තිබෙන ඒවා. මේවා Auditor-General's Report එකේයි තිබෙන්නේ. අද දවල් වෙද්දී කියාවි, මේ Auditor-General's Report එකත් වැරදියි කියලා. ඒ වාගේ බඩු ටිකක් ආණ්ඩුව පැත්තේ ඉන්නේ. එහෙම නම් ඉතින්, රනිල් වික්‍රමසිංහලාගේ, රාජපක්ෂලාගේ පාලන කාලවල වෙච්ච ඒවා ගැන තිබෙන Auditor-General's Reports පවා පිළිගන්න බැහැ කියලා කියන්න පුළුවන් වේවි.

ගරු කථානායකතුමනි, මට ජනාධිපතිතුමා ගැන යම් කනගාටුවක් තිබෙනවා. එතුමා අපේ පන්තියේ මිනිහෙක්. අපේ පන්තියේ මිනිහෙක් මේ රටේ ජනාධිපති වෙච්ච එක ගැන අපට සතුටුයි. සජිත් ප්‍රේමදාස මැතිතුමාට ජනාධිපති වෙන්න බැරි නම්, අපේ පන්තියේ පුද්ගලයෙක් ජනාධිපති වෙන එක ගැන අපි සතුටුයි. හැබැයි, එතුමාට අද අත් වෙලා තිබෙන ඉරණම බලන්න, තමන්ගේ යාළුවා බේරා ගන්න යෑම නිසා. ගරු කථානායකතුමනි, සාමාන්‍යයෙන් ඇමතිවරයෙක් පත් වුණාම තමන්ගේ හිතවත්, දන්නා කියන අයව පත් කරන්නේ සභාපති තනතුරට සහ අධ්‍යක්ෂ මණ්ඩලවලට. අනුර කුමාර දිසානායක මැතිතුමා කෘෂිකර්ම ඇමති වුණාම මෙතුමාගේ හැටි දැනගෙනද කොහේද, මෙතුමා දැම්මේ පොහොර සංස්ථාවේ ප්‍රසම්පාදන කමිටුවට. තැටිය දීලා දුන්නේ. ඒ දුන්නාම තමයි ගැහුවේ. 2014දී දූෂණ චෝදනා එල්ල වෙලා තියෙද්දී තමයි- *[බාධා කිරීමක්]* මෙතුමා මාලිමාවේ ජන වරමට අයිති එක්කෙනෙක් නොවෙයි. මෙතුමා JVP website එකට fund කරලා, යාළුකමට වාහනයක් දීලා, ජාතික ලැයිස්තුවෙන් තමයි පාර්ලිමේන්තු ඇවිල්ලා තිබෙන්නේ. මෙතුමාට ලංකාවේ ආර්ථිකයේ මර්මස්ථානය වෙච්ච බලශක්ති විෂය භාර දුන්නා, අර වඳුරාට දැළි පිහිය දුන්නා වාගේ. දැන් වටේම දැලි නොවෙයි අඟුරු ගාලා, මුහුණුවල අඟුරු අලවලායි තිබෙන්නේ, මාලිමාවේ කට්ටියගේ. ඒ අයගේ හෘදය සාක්ෂිය ඇත්ත දන්නවා.

වෙනදාට උදේ වරුවේ ආණ්ඩු පක්ෂයේ අය මේ සභාවේ කොච්චර නම් ඉන්නවාද? නමුත් අද බලන්න. අද එහෙම නැහැ. බලපෑම් නිසා, පක්ෂයෙන් එන බලපෑම් නිසා ආණ්ඩුවේ අය මන්ත්‍රී ධුරය රැක ගැනීම සඳහා හවසට එයි ඡන්දය දෙන්න. ආණ්ඩුවේ බොහෝ දෙනෙක් දැන් මෙතැන නැහැ. මොකද, මේවා අහගෙන ඉන්න බැහැ; මුහුණ දෙන්න බැහැ. ගල් අඟුරු ගෑවිලා ඇලිලා තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, එහෙම ගැටලුසහගත ප්‍රසම්පාදන ක්‍රියාවලියකටයි මේක භාර දීලා තිබෙන්නේ. ඊට පස්සේ ගල් අඟුරු සමාගමට නොවැම්බර් මාසයේ 13වන දා ඉඳලා දෙසැම්බර් මාසයේ 31වන දා වනකල් දින 40කට වැඩි ප්‍රමාණයක් ගල් අඟුරු බාන්න පුළුවන් දවස්වල එක නැවක්වත් ලංකාවට ආවේ නැහැ. දෙසැම්බර් මාසයේ 14වන දායි නැව එන්න නියමිතව තිබුණේ. ඒ පළමුවෙනි නැවම ප්‍රමාද වුණා. ඒක ආවේ දෙසැම්බර් 30වන දා. පළමුවෙනි නැව ෆේල්. අපි ඒ ගැන කියන කොට ආණ්ඩුවේ අය ඒක පිළිගත්තේ නැහැ. එතකොට කිව්වා, ඒගොල්ලන්ට මේක check කරන්න, මේ බලාගාරයට accreditation නැහැ කියලා. මොන බොරුද?

ගරු කථානායකතුමනි, අපි අහන කොට කිව්වා, "ඉන්දියාවේ COTECNA සමාගමට යවලා තිබෙනවා, ඒගොල්ලන් කියන ඒවා තමයි අපි පිළිගන්නේ" කියලා. පළමුවෙනි නැව ඒකෙන් ෆේල්. දෙවන, තුන්වන නැව ඒකෙන් පාස්. හැබැයි අපි කිව්වා, ගල් අඟුරු පාවිච්චි කරන්නේ ලක්විජය බලාගාරයේ නිසා ඒකේ real-time report එක තමයි පිළිගන්න ඕනෑ කියලා. නමුත් පිළිගත්තේ

නැහැ. හරිද? මේ රට හුණ්ඩුවක් කිව්වා මතකද? ඒ වාගේ තමයි. ලක්විජය බලාගාරයේ මැෂින් පිළිගන්න බැහැ කියලා කිව්වා. විගණනයටත් එකඟ වෙන්න බැරි කථාවක්, ඒක. හැබැයි, විගණකාධිපති වාර්තාවේ 6.2.1 අනුව පැහැදිලිව තිබෙනවා, ගල් අඟුරු දාන බොයිලේරුවේ එන real-time report එක තමයි ඇත්ත කියලා. පුළුවන් නම් හොඳන්නකෝ. ආපු පළමුවෙනි නැව, දෙවන නැව, තුන්වන නැව කියන තුනම ෆේල් වෙද්දී, අවශ්‍ය කිලෝ කැලරි ප්‍රමාණයේ ගල් අඟුරු එන්නේ නැති වෙද්දී අපි ඒ ගැන කියන කොට අපට මඩ ගැහුවා. සමහර අය වාගේ අපි කැමැති නැහැ විදුලිය කපලා, පෝලිම් හදලා අර්බුද මැදින් බලය ගන්න. අපි පෙන්වා දුන්නා දෙවෙනි, තුන්වෙනි, හතරවෙනි, පස්වෙනි නැව් එනකොට. නමුත් කවුරුත් එක්ක කථා කරන්නේ නැහැ, මේ ගාණට ගන්න පුළුවන්ද කියලා බලන්නේ නැහැ. එදා තකතීරුකමින්, උද්ධච්චකමින්, "නැහැ, එක ළඟ නැව් දෙකක් reject වුණොත් තමයි cancel කරන්න පුළුවන්" කියලා කියන්නේ නැතිව, ඇහුම්කන් දීලා ඒ වැඩේ කළා නම් මේ සා විශාල පාඩුවකුත් නැහැ, බාල ගල් අඟුරු මෙච්චර එන්නෙත් නැහැ, විදුලිය කපන්න වෙන්නෙත් නැහැ, දෙපාරක් විදුලි බිල වැඩි කරන්න වෙන්නෙත් නැහැ, මේ අපවාදයට මුහුණ දෙන්න වෙන්නෙත් නැහැ. එක පුද්ගලයකුගේ උද්ධච්චකමයි, තක්කඩිකමයි, උන්මත්තකකමයි හින්දා ආණ්ඩුවයි, මුළු රටමයි අර්බුදයකට පත් වෙලා විදුලිය කපන තැනට ඇවිල්ලා තිබෙනවා. ඔය පැත්තේ ඉඳන් ඕනෑ එකක් record කරන්න. අපට කිසි ප්‍රශ්නයක් නැහැ.

ගරු කථානායකතුමනි, ඒ නැව් තුන ගැන කියනකොට ඇහුම්කන් දෙන්නේ නැතිව, ඒ වෙලාවේ කිව්වා cancel කරන්න බැහැ කියලා. දැන් කියනවා නීතිපතිවරයා කියලා තිබෙනවාලු, cancel කරන්න පුළුවන් කියලා. Cancel කරන්නේ නැතිව ඒ කළේ මොකක්ද? දන්නවා. හොඳටම දන්නවා බාල ගල් අඟුරු එන්නේ, වැඩේ අල වෙලා තිබෙන්නේ, අවශ්‍ය මෙගාවොට් 300 විදුලිය ජනනය වෙන්නේ නැහැ කියලා. නමුත් මේ ඇමතිවරයා හොරගල් ඇහිලුවා. මොකටද? හදිසි මිලදී ගැනීමකට යන්න. ඒ plan B එක කලින්ම තියාගෙන හිටියා. වෙන දාට term tender එකත් එක්ක spot tender එහෙකුත් එනවා. මෙදා පාර term tender එක විතරක් දාලා spot tender එක නැවැත්තුවා. නවත්වලා බාල ගල් අඟුරු ගෙනැල්ලා තව ඩීල් එකක් දාන්න බැලුවා. මම දන්නේ නැහැ මෙච්චර කොහේට ගෙනියන්නද කියලා. මේවා කොහේට ගෙනියන්නද කියලා මට තේරෙන්නේ නැහැ. ඒ spot tender එකේදී වැඩියෙන් මිලදී ගන්න වෙනවා නේද කියලා අපි ඇහුවාම, ඒ වෙලාවේ කිව්වා එහෙම එකක් නැහැ කියලා. ඒවා මේ පාර්ලිමේන්තුවේ හැන්සාඩ්ගත වෙලා තිබෙනවා.

ඊළඟ දූෂණය මොකක්ද? Spot tender එකට කීයක්ද දෙන්නේ කියලා දන්නවා, ගරු කථානායකතුමනි? මෙට්‍රික් ටොන් එකක් ඩොලර් 98.50ට ගත්ත එක වෙනුවට, ඩොලර් 145 ගාණේ නැව් 5න් මෙට්‍රික් ටොන් ලක්ෂ 3ක් ගන්නවා. ඒ කියන්නේ ඩොලර් මිලියන 13කට වඩා අතිරේක පාඩුවක් මේකට එකතු කළා. රුපියල් මිලියන 4,200ක්, මේ රටේ ජනතාවගේ රුපියල් ලක්ෂ 42,000ක් පාඩු කළා දෙවෙනි පාර. හරිද? හිතාමතාම සැලසුම්සහගතව ඒක කළේ. ඒ විතරක් නොවෙයි. මේ සමාගම කොච්චර හුරතල් කරනවාද කියනවා නම් ගරු කථානායකතුමනි, spot tender එක දීලා තිබෙන ඉන්දියානු සමාගමටත් මේ අවශ්‍ය කිලෝ කැලරි ප්‍රමාණය supply කරන්න බැහැ කියලා මේ විගණන වාර්තාවේ ඉතා පැහැදිලිව තිබෙනවා. ඒගොල්ලන් කිලෝ කැලරි 5,000ට අඩු ඒවා තමයි supply කරලා තිබෙන්නේ. මේවා අපි කියන ඒවා නොවෙයි, මේ විගණන වාර්තාවේ තිබෙන්නේ. මම දන්නේ නැහැ, එතුමා දැන් කියනවාලු, "ඔක්කෝම එකතු වෙලා මා බේරා ගන්න, මොකද කැබිනට් මණ්ඩලයම තමයි අනුමත කරලා තිබෙන්නේ" කියලා. කැබිනට් මණ්ඩලයම තමයි අනුමත කළේ කියනවාලු. කොහොමද game එක? අර අර්ජුන මහේන්ද්‍රනුයි, අර්ජුන් ඇලෝසියසුයි වාගේ. හැබැයි ඒ දෙන්නා මීට වඩා අඩුවෙන් ගැහුවේ. ඊට වැඩිය මාර නරි මොළයක් තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, ඊළඟට තව වැඩක් කළා. එතුමා අව්‍යාජ නම්, අවංක නම්, යම්කිසි වැරදීමක් වුණා නම්, මේ නැව් ෆේල් වෙද්දී, අවශ්‍ය විදුලිය ජනනය නොවෙද්දී umpire samples check කරන්න තිබුණා. පළමුවෙනි නැව ආවේ දෙසැම්බර් 30වෙනි දා. එතකොට මාස 3ක් යනකම් umpire samples check කරන්න පුළුවන්. පළමුවෙනි, දෙවෙනි, තුන්වෙනි නැව් අත හරින්නකෝ. වුවමනාවක් තිබෙනවා නම් අද මේ මොහොතේත් ඊට පස්සේ ආපු නැව්වල umpire samples check කරන්න පුළුවන්. නමුත් එහෙම කළේ නැහැ. ඊට පස්සේ තෙවෙනි පාර්ශ්වයක් දාලා ඒක check කිරීමේ හැකියාව තිබුණා. ඒක කළෙත් නැහැ. එතකොට දූෂණය නැද්ද? ඒක අපරාධයක් නොවෙයිද? එතකොට එතුමා බබාද?

ගරු කථානායකතුමනි, ඊළඟට තව වැඩක් කළා. දකුණු අප්‍රිකාවෙන් පටවන ගල් අඟුරු සාම්පල් පරීක්ෂා කරන්න ඉන්දුනීසියාවට බාර දුන්නා. වැඩේ කියන්නේ ඒ ඉන්දුනීසියානු සමාගම බලපත්‍රය update කරගෙන නැහැ, පසුගිය මාර්තු මාසයේ 31වෙනි දා වෙනතෙක්. මරු ගේම් ටිකක් දීලා තිබෙන්නේ. වැඩක් නැහැ කථා කරලා. ගරු කථානායකතුමනි, බලන්නකෝ මෙච්චර ගේමක් දීලා හිනා වෙවී ආතල් එකේ ඉන්න විදිය. මෙන්න මෙගොල්ලන් තමයි පොරවල්.

ගරු කථානායකතුමනි, එතුමා දැන් ඒක නිලධාරින් පිට පටවන්න හදනවා. මේ ආණ්ඩුවේ සාමාන්‍ය උත්තරය තමයි තෙල් මිල වැඩි කළේ අපි නොවෙයි, විදුලි බිල වැඩි කළේ අපි නොවෙයි කියන එක. ඒගොල්ලන් නේ, කලින් ඇහුවේ මිල වැඩි වෙන විදියට වැඩි කරන්න නම් ජනාධිපති කෙනෙක් ඕනෑද කියලා. අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා තමයි ඒ කාලයේ ඇහුවේ, "ගෑස් කොම්පැනියේ සභාපති ඉන්නේ ඇමතිට වැඩිය උඩින්ද?" කියලා. දැන් අපි අහනවා, එහෙම නම් මෙතුමාට වැඩිය උඩින්ද ගල් අඟුරු කොම්පැනිය තිබෙන්නේ? අනුර කුමාර ජනාධිපතිතුමාට වැඩිය උඩින්ද ගල් අඟුරු කොම්පැනිය තිබෙන්නේ? දිට්ඨධම්ම වේදනීය කර්මය පළ දෙනවා කියන්නේ ඕකට තමයි, ගරු කථානායකතුමනි. අද අපි මාලිමාවේ අයට කියනවා, ඔබට හෘදය සාක්ෂියක් තිබෙනවා නම්, ඔබ ඒ හෘදය සාක්ෂියට අනුව කල්පනා කරලා බලන්න කියලා. ජීවිත කාලය පුරා ගොඩක් දේවල් පක්ෂය වෙනුවෙන් කැප කරලා, මේ පක්ෂය බලයට ගෙන එන්න වැඩ කරපු ජනතා විමුක්ති පෙරමුණේ බොහෝදෙනෙක් මෙතැන ඉන්නවා. නමුත් අද එක පුද්ගලයෙක් ඔබේ ඒ දශක ගණනාවක මුළු කැප කිරීම පාවා දීලා, කොළේ ඉරලා දමනවා. මේ ආණ්ඩුව පත් වුණු මුල් දවස්වල හරි ප්‍රසිද්ධ කියමනක් මේ හැමෝගේම කටින් ආවා. ඒ මොකක්ද? ජන වරමේ තරම තේරුම් ගන්න කියන එක. නමුත් දැන් ජන වරම ගැන කථා කරන්නේ නැහැ. ජන වරම අවභාවිත කරන නිසා කථා කරන්න බැහැ. ජන වරම දුන්නේ දූෂණයට විරෝධීව. රාජපක්ෂලා අරෙහෙම කළා, මෙහෙම කළා, හෙට අල්ලනවා කියලා තමයි පෙන්වූයේ. අර්ජුන මහේන්ද්‍රන් ඊළඟ සතියේ ගේනවා කියලා නේ කිව්වේ. උගන්ඩාවේ තිබෙන සල්ලි මෙහේට ගේනවා කියලා නේ කිව්වේ. දැන් ඒවා මතක නැතුව කියනවා, "අපි එහෙම කිව්වේ නැහැ" කියලා. මම විශ්වාස කරනවා, මේ ආණ්ඩුවේ අධිකරණ ඇමතිතුමාව. ජේ.ආර්. ජයවර්ධනගේ ආණ්ඩුවේ ඉඳලා හැම ආණ්ඩුවකම, ඒ ආණ්ඩුව කරන ක්‍රියා විවේචනය කරලා එළියට එන්න කොන්දක් තිබුණු ඇමතිවරු හිටියා. 1983දී ජේ.ආර්. ජයවර්ධනගේ ආණ්ඩුව කාලයේ ගාමණී ජයසූරිය ඇමතිකමෙන් ඉල්ලා අස් වුණා. හිටපු කථානායක, මහින්ද යාපා අබේවර්ධන මැතිතුමා 1987දී ඉන්දු-ලංකා ගිවිසුමට විරුද්ධව ආණ්ඩුවෙන් එළියට ආවා. රණසිංහ ප්‍රේමදාස මැතිතුමාට විරුද්ධව ලලිත්

[ගරු එස්.එම්. මරික්කාර් මහතා]

ඇතුලත්මුදලි මැතිතුමා සහ ගාමිණී දිසානායක මැතිතුමා එළියට ආවා. යහ පාලන ආණ්ඩුව කාලයේ විජයදාස රාජපක්ෂ මැතිතුමා - හරිද, වැරැදිද කියන එක වෙනම කථාවක් - ඉල්ලා අස් වුණා. අධිකරණ ඇමතිතුමනි, ඔබතුමාට "විජේවීර මගේ නායකයා නොවෙයි" කියන්න කොන්දක් තිබුණා. ඒ නිසා හෘදය සාක්ෂියක් තිබෙනවා නම්, අද ඔබතුමා මේකට නායකත්වය ලබා දෙනවාද කියන එක අපි බලාගෙන ඉන්නවා. මට වෙනත් අය නම් පේන්නේ නැහැ. *[බාධා කිරීමක්]* මම නම කිව්වේ නැහැ, අධිකරණ ඇමති කියලා කිව්වේ හොඳේ. *[බාධා කිරීමක්]* නැහැ, නැහැ, ඔබතුමාගේ කථාවේදී උත්තර දෙන්න. ගරු කථානායකතුමනි,- *[බාධා කිරීමක්]* නැහැ, ඒවා බැහැ. මම නම කිව්වේ නැහැ. මගේ කාලය දෙන්න බැහැ නේ.

ගරු කථානායකතුමනි, අපි පැලවත්තෙයි, මාලිමාවෙයි අර්බුද ගැන කියලා මෙතැන වුන් එකක් ගන්න උත්සාහ කරන්නේ නැහැ. ඒවා වෙන කථා. ඒවා දේශපාලන වැඩ. ඒ "වලිවලට" අපට මැදිහත් වෙන්න ඕනෑ නැහැ. ඒවා එහෙම වෙනවා නම් වෙච්ච දෙන්, නොවෙනවා නම් නොවෙච්ච දෙන්. අපට අදාළ නැහැ. නමුත්, මේ අපරාධයට, මේ මංකොල්ලයට, මේ දූෂණයට විරුද්ධව කොන්ද කෙළින් තියාගෙන මේ ලැබුණු ජන වරම ක්‍රියාත්මක කරන්න ඕනෑ කියන එකයි අපි කියන්නේ. ඒ නිසා මෙතුමා ඉවත් කරනවාද, කථානායකතුමාට මොනවාද කරන්නේ කියන ඒ වාගේ දේවල්වලට අපි පැටලෙන්නේ නැහැ.

දැන් කෙහෙළිය රඹුක්වැල්ල කියනවා ඇති නේ, "මම injection විදලාද ගෙනාවේ?" කියලා. "මම දන්නේ නැහැ" කියලා කියන්න පුළුවන් කෙහෙළිය රඹුක්වැල්ලට. "මම බෙහෙත් කාලා බලලාද ගෙනාවේ?" කියලා කියන්න පුළුවන්. ඔබතුමන්ලා විපක්ෂයේ සිටියදී මේ වාගේ දෙයක් වෙන ආණ්ඩුවකින් වුණා නම්, ගල් අඟුරු කාලා, ගල් අඟුරුවලට ඇටයක් තිබුණා නම් ඒකේ දිග, පළලත් කියලා, පාටත් කියයි. එහෙම නේ, අසූචි නැව ගැන කිව්වේ. කෙහෙළිය රඹුක්වැල්ලට විරුද්ධව ජේවීපී එක විශ්වාස භංගයක් ගෙනාවේ නැහැ. මට දැන් නම් හිතෙනවා, අපේ ආණ්ඩුවක් ආවොත් අපටත් එහෙම වෙයිද කියලා, භයට එදා ගෙනාවේ නැද්ද කියලා. සමගි ජන බලවේගය විශ්වාස භංගයක් ගෙනාපු වෙලාවේ ගරු අග්‍රාමාත්‍යතුමිය විපක්ෂයේ මන්ත්‍රීවරියක හැටියට සිටියදී කරපු කථාවකින් මගේ කථාව අවසන් කරනවා. ගරු කථානායකතුමනි, 2023 සැප්තැම්බර් 08 දිනැති හැන්සාඩ් වාර්තාවේ 2199වන තීරුවේ මෙසේ සඳහන් වෙනවා:

> "මට කියන්න තිබෙන්නේ, අමාත්‍යතුමා ඇතුළු මේ ආණ්ඩුව තුළ තව වුට්ටක් හරි හෘදය සාක්ෂියක් කියන දෙයක් තිබෙනවා නම්, මීට වඩා ජනතාවගේ පැත්තෙන් හිටගෙන තීන්දු තීරණ ගත යුතු බවයි. මේක දේශපාලන වශයෙන් ගන්න හෝ ආණ්ඩුවක් රැක ගැනීම පිළිබඳ ප්‍රශ්නයක් නොවෙයි. මේක මේ රටේ මිනිස්සුන්ගේ ජීවිත පිළිබඳ ප්‍රශ්නයක්. වුට්ටක් හරි හෘදය සාක්ෂියක් ඉතුරු වෙලා තිබෙනවා නම්, ජනතාවගේ පැත්තෙන් හිටගෙන තීන්දු තීරණ ගන්න කියන ඉල්ලීම කරමින් මම නතර වෙනවා."

එහෙමයි තමයි, ගරු හරිනි අමරසූරිය මැතිනිය කියලා තිබෙන්නේ. ඉතින්, එතුමිය අද කණ්ණාඩියක් ඉස්සරහට ගිහිල්ලා මේක කියවලා බලලා, මේ 159දෙනාටම බෙදා දෙන්න. එහෙම නැත්නම් 225ම හොරුයි කියපු අයට 159දෙනාම හොරුයි කියලා අද ඔප්පු කරන්න වෙනවාය කියන එක කියන්න සිද්ධ වීම ගැන කනගාටුයි.

ගරු කථානායකතුමනි, බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Next, the Hon. (Dr.) Nalinda Jayatissa. You have 25 minutes.

[පූ.භා. 11.26]

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, මෙම විවාදය පාර්ලිමේන්තු ඉතිහාසයේ වැදගත් විවාදයක් බවට පත් කරගත යුතුව තිබෙනවා. අපි ලැහැස්තියි, මේ විශ්වාස භංග යෝජනාවේදී ප්‍රමාණාත්මකව පමණක් නොවෙයි, මොකක්ද මේ සිදු වුණේ කියන එක කරුණු සහිතව අනාවරණය කරන්නට. මෙම විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කළ සහ ස්ථිර කළ විපක්ෂයේ ප්‍රධාන කථිකයන් දෙදෙනා සඳහන් කළ කාරණා මම අහගෙන හිටියා. මම හිතන විධියට ඒ දෙදෙනා තමයි ගල් අඟුරු සම්බන්ධයෙන් ප්‍රධානම කථිකයන් දෙදෙනා හැටියට පසුගිය කාලවලදී මාධ්‍යයටත් අදහස් දැක්වූයේ. නමුත් ඒ දෙදෙනාගේම කථාවලින් මට පෙනෙන්නේ නැහැ, මේ විවාදය හෝමාගම මහජන බැංකුවේ තිබෙන නැන්දම්මාගේ account එකෙන් එහාට යයි කියලා. එතැන තමයි තැන. එතැනින් එහාට යන එකක් නැති බව තමයි පෙනෙන්නේ.

ගරු කථානායකතුමනි, ඉස්සෙල්ලාම ගල් අඟුරු ගෙන්වන්න ගත්තේ අපේ ආණ්ඩුවෙන් නොවෙයි. ලක් විජය බලාගාරයට ගල් අඟුරු සැපයීමේ ක්‍රියාවලිය වසර 15ක් තිස්සේ සිදු වෙනවා. විගණකාධිපති වාර්තාවේ සඳහන් වන හැටියට 2010 ජූලි මාසයේ ඉඳලා 2026 මාර්තු වෙනකොට ගල් අඟුරු නැව් 462ක් ඇවිල්ලා තිබෙනවා. සාමාන්‍යයෙන් ඒ එක නැවක ගල් අඟුරු මෙට්‍රික් ටොන් 60,000ක පමණ ප්‍රමාණයක් තිබෙනවා. දළ වශයෙන් හිතුවොත් එක ගල් අඟුරු නැවක් ඩොලර් මිලියන 4ක, 5ක, 6ක පමණ වටිනාකමකින් යුක්තයි. එහෙම ගත්තාම ඉතිහාසය තුළ අඩු තරමින් ඩොලර් බිලියන දෙකහමාරක් විතර අපි ගල් අඟුරුවලට ගෙවා තිබෙනවා. හැබැයි, දැන් තමයි නිසි ප්‍රසම්පාදන ක්‍රියාවලියක් සහ තත්ත්ව පරීක්ෂණ ක්‍රියාවලියක් මේ ගල් අඟුරු සැපයීම වෙනුවෙන් ස්ථාපිත කරන්නට කටයුතු කරමින් සිටින්නේ. පසුගිය අවුරුදු 15 තුළම මොකක්ද සිද්ධ වුණේ? අද මෙම විශ්වාස භංග යෝජනාව ගෙනෙන මේ කණ්ඩායම ආණ්ඩු කරපු, ඒ ගත වුණු අවුරුදු 15 තුළදීත් ගල් අඟුරු සැපයුම සිදු වුණා. නමුත් මේ තත්ත්ව පරීක්ෂණ, මේ ටෙන්ඩර් ක්‍රියාවලිය ලෝකයේ පැවතිලා තිබෙනවා. අවුරුදු 15ක් ගියාට පසුව අපට කරන්නට සිද්ධ වෙලා තිබෙන්නේ අන්න ඒ ක්‍රියාවලිය ස්ථාපිත කරන එකයි. ඇයි?

ගරු කථානායකතුමනි, 2010 වසරේ ඉඳලා 2015 වසර වෙනකම් කිසිදු ටෙන්ඩර් ක්‍රියාවලියක් සිදු වෙලා නැහැ. සමහර ප්‍රසම්පාදන කටයුතු ආරම්භ වෙලා තිබුණත් ඒවා අතරමඟ නතර වෙලා, කැබිනට් මණ්ඩලය තීන්දුව ගෙන ඒ සැපයුම ලබා දී තිබුණා. ඒ කියන්නේ, ටෙන්ඩර් ක්‍රියාවලිය පටන් ගත්තත්, පසුව ටෙන්ඩර් එක close කළාට පසුව කැබිනට් එක තීන්දු කරලා ලබා දීපු ක්‍රියාවලියක් තමයි පළමු අවුරුදු පහ තුළ සිද්ධ වෙලා තිබෙන්නේ. අද අපි කථා කරන මේ Load Port Reports, Discharge Port Reports කියන ඒවා මොකක්වත් අදාළ වෙලාම නැහැ. ගරු කථානායකතුමනි, ඒ කියන්නේ, ප්‍රසම්පාදනයත් කැබිනට් එකෙන් නතර කරලා තමන්ට ඕනෑ කෙනෙකුට දෙන්න

පුළුවන් තත්ත්වයක් තිබුණා නම්, මම හිතන විධියට Load Port Reports ගැන කථා කරන එක, Discharge Port Reports ගැන කථා කරන එක තේරුමක් නැහැ නේ. එහෙම තමයි පළමු අවුරුදු පහ ගතවුණේ, 2015 වසර වෙනකම්.

මේ ක්‍රියාවලිය කොතරම් බරපතළද, කොතරම් ලජ්ජා සහගතද කියනවා නම්, 2010-2011 සැපයුමේ ඉඳලා 2014-2015 සැපයුම දක්වා වුණු ඒ ක්‍රියාවලියෙන් පසුව, ඒ කියන්නේ ප්‍රසම්පාදනයෙන් තොරව කැබිනට් තීන්දුව අනුව එම සැපයුම ලබා දීලා පළමු වතාවට මේ ප්‍රශ්නය ශ්‍රේෂ්ඨාධිකරණයට ගියාම කියා තිබෙන්නේ මොකක්ද? මේ තිබෙන්නේ SCFR/394/2015 කියන තීන්දුව. එම තීන්දුව අනුව ඒ වෙලාවේ ගරු අධිකරණය ප්‍රකාශයට පත් කර තිබෙනවා, අධිකරණයේ හෘදය සාක්ෂිය කම්පනයට පත් කරන මට්ටමේ ගනුදෙනුවක් තමයි සිද්ධ වෙලා තිබෙන්නේ කියලා. අධිකරණයේ හෘදය සාක්ෂිය කම්පනයට පත් කරන සිදුවීමක්! ඒ නිසා ඒ ටෙන්ඩර් එක 2015දී ශූන්‍ය සහ බලරහිත කර තිබෙනවා. මෙහෙම තමයි පළමු වසර පහ ගත වුණේ.

ඊළඟට, ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ වුණා. ඒකේ term tenders ගියා, spot tenders ගියා. ඒක ඇතුළේත් සිදු වෙච්ච අක්‍රමිකතා, දූෂණ පිළිබඳව ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් කරුණු සහිතව කියාවි. ඩොලර් මිලියන 1.5ක වංචාවක් පිළිබඳව තවම අධිකරණයේ නඩු කටයුතු විභාග වෙමින් පවතිනවා. අපි මේ ක්‍රියාවලියට සාපේක්ෂව මේ ප්‍රසම්පාදනය හරි තැනක තිබ්බා. ඒ නිසා ගල් අඟුරු සැපයුම්කරුවන් 26දෙනෙක් ලියාපදිංචි කර තිබුණා.

ඒ 26දෙනාගෙන් 11දෙනෙක් ටෙන්ඩරයට ඇතුළත් වුණා. ඒ ටෙන්ඩරයට දින 28ක් ලබා දුන්නා. ඒ දින 28 ලබා දුන්නෙත් දින 21ක් ලබා දීම සඳහා ජාතික ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය සහිතව තිබියදී බව මතක තියාගන්න. සැපයුම්කරුගේ ඉල්ලීම මත ඒ දින 21 දින 28ක් දක්වා දීර්ඝ කළා. ගරු කථානායකතුමනි, මේ ගල් අඟුරු මෙට්‍රික් ටොන් මිලියන 1.5ක සැපයුමක්. ගරු ඇමතිතුමනි, අවුරුදු 3කට ගල් අඟුරු මෙට්‍රික් ටොන් මිලියන 4.5ක සැපයුමක් සඳහා දින 35ක ටෙන්ඩරයක් call කළේ. අවුරුදු 3ක ගල් අඟුරු මෙට්‍රික් ටොන් මිලියන 4.5ක ගනුදෙනුවක ටෙන්ඩරයකට දින 35යි දුන්නේ. ඒක දීර්ඝ කළෙත් නැහැ. අපි දින 21ක් දීපු එක දින 28ක් දක්වා දීර්ඝ කළා. කාට හරි ප්‍රශ්නයක් තිබුණා නම් ඊට පස්සේ අභියාචනා කමිටුවට එන්න තිබුණා.

ගරු කථානායකතුමනි, අපි තමයි මේ ටෙන්ඩර් ක්‍රියාවලියේ පිරිවිතරයන් වෙනස් කළේ කියලා දැන් එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා පටලවලා පට්ට බොරුවක් ඇද බෑවා. මේ තිබෙන්නේ ටෙන්ඩර් ක්‍රියාවලියේ තිබුණු නිර්ණායක. "2023 ජූනි 23 සංශෝධිත ඉහත කොන්දේසියට පෙර සැපයුම්කරුවෙකු ලියාපදිංචි කිරීමේ නිර්ණායක සලකන විට ලියාපදිංචිය සඳහා අයදුම් කරනු ලබන සැපයුම්කරුවෙකු අවසාන මාස 6 තුළ අවම වශයෙන් ගල් අඟුරු මෙට්‍රික් ටොන් ..." ඒ කියන්නේ සැපයිය යුතු ප්‍රමාණය ලෙස තිබුණු මෙට්‍රික් ටොන් ලක්ෂ 10 ලක්ෂ 5ට වෙනස් කළේ අපේ ආණ්ඩුවෙන් නොවෙයි. 2023 වර්ෂයේදීයි එය වෙනස් කළේ. ඒ ලක්ෂ 5න් ලක්ෂයක GCV එක කිලෝග්‍රෑමයකට කිලෝ කැලරි 5,900ට වඩා වැඩි වෙන්න ඕනෑ කියන එක වෙනස් කළෙත් 2023දී. ඒ 2023දී වෙනස් කරපු එක තමයි ඊට පස්සේ අඛණ්ඩව ක්‍රියාත්මක වුණේ. එහෙම නැතුව අපි ඒක වෙනස් කරන්න ගියේ නැහැ. මේ සැපයුම්කරුවන් 26දෙනෙක් ලියාපදිංචි කරගත්තාට පස්සේ එයින් 11දෙනෙක් ටෙන්ඩරයට ආවා. ඒ අයටත් මේ ටෙන්ඩරය සඳහා දින 28ක් ලබා දුන්නා. ඒකෙන් තමයි මේ තෝරා ගැනීම කළේ.

ඊළඟ ප්‍රශ්නය මෙයයි. මෙතැන ගැටලුවක් මතු වෙලා තිබෙන්නේ Load Port Report එක ගැනයි. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ගැන කාටවත් ඔය චෝදනා එල්ල කරන්න බැහැ. විෂය භාර ඇමතිවරයා මැදිහත් වෙලා මෙවැනි සමාගමකට ටෙන්ඩරය දුන්නා කියලා කවුරුහරි කියනවා නම් පුළුවන් නම් ඒක ඔප්පු කරන්න කියලා මම කියනවා. එහෙම ප්‍රශ්නයක් තිබුණා නම් ටෙන්ඩරය close කරලා දීපු දින 10දී සැපයුම්කරුවෝ අභියාචනා කමිටුවට යනවා. මොකද, මේක ඩොලර් මිලියන 4 ½ක, 5ක ලොකු ගනුදෙනුවක්. එහෙම නම් ඒ සැපයුම්කරුත් අභියාචනා කමිටුවට යනවා. නමුත් කවුරුවත් ගියේත් නැහැ. කලින් තමයි තමන්ට ඕනෑ කෙනාට ටෙන්ඩරය ආවේ නැත්නම් කැබිනට් මණ්ඩල ඇමතිවරු මැදිහත් වෙලා ඒවා වෙනස් කළේ. හැබැයි, ඒක එහෙම නොවෙයි වුණේ. අපි ප්‍රසම්පාදනය හරියට කළා. ප්‍රසම්පාදනයේදී අඩුම මිල ගණන් සහිත කෙනා තෝරාගත්තා. ඒක තමයි ප්‍රසම්පාදන ක්‍රියාවලිය. අපි ප්‍රසම්පාදන ක්‍රියාවලිය හරියට තහවුරු කරලා තිබෙනවා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ටෙන්ඩරය call කරන්න පරක්කු වුණේ ඇයි?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ටෙන්ඩරය call කරන්න පරක්කු වුණේ මේ නිසායි. කලින් ටෙන්ඩරයට අදාළ අන්තිම නැවේ ගල් අඟුරු බෑවේ පසුගිය දෙසැම්බර් 08වැනි දා කියන එක මතක තියාගන්න. පසුගිය ඔක්තෝබර් මාසයේ ඒ නැවෙන් බාන්න තිබුණු ගල් අඟුරු අවසානයේ බෑවේ පසුගිය දෙසැම්බර් 08වැනි දා. හරිද? ඒ ගල් අඟුරු ටික එන්න පරක්කු වුණා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඒක ප්‍රශ්නයක් නැහැ නේ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ඒකෙන් කිසිම ප්‍රශ්නයක් ආවේ නැහැ, ඒ ටෙන්ඩරයට.

දෙවැනි කාරණය තමයි තත්ත්ව පරීක්ෂණය. තත්ත්ව පරීක්ෂණය කරන ක්‍රමවේදය තමයි Load Port Report එක ගන්න එක, සහ Discharge Port Report එක ගන්න එක. ගරු විපක්ෂ නායකතුමනි, දැන් මේ විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කරන සමගි ජන බලවේගයේ මන්ත්‍රීවරු හිටපු 2015-2020 ආණ්ඩුව නම් තිබුණේ, මේ ප්‍රශ්නය එන්නේ නැහැ. මොකද, ඔබතුමන්ලා Discharge Port Report එක අනුව නොවෙයි නේ සල්ලි ගෙව්වේ. ඒ, ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති රාජ්‍ය ඇමති වෙලා හිටපු 2015-2018 කාලයේ. ඒ කාලයේදී ගල් අඟුරුවලට මුදල් ගෙවීමේදී Discharge Port Report එක බලලා ගෙව්වේ කවදාද කියලා මට කියන්න. එතකොට ගෙව්වේ Load Port Report එකට අනුව විතරයි. Load Port Report එක කියලා කියන්නේ සැපයුම්කරු ගැණුම්කරුගේ එකඟතාව සහිතව තෝරාගන්න accredited lab එකෙන් ගන්න වාර්තාවක්. ඒ වෙලාවේ සැපයුම්කරු ඒක තෝරා ගත්තේ ගැණුම්කරු වන ලංකා කෝල් සමාගමේ එකඟතාව සහිතවද කියලා අපි දන්නේ නැහැ. ඒක තමුන්නාන්සේලායි කියන්නේ. හැබැයි ඒ කාලයේදී, 2019 වෙනකම් Load Port Report එක මොකක්ද, ඒකට අනුව සල්ලි ගෙව්වා. හා, නැද්ද? එතකොට මේ

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

Discharge Port Reports ගත්තේ නැහැ. ගරු මන්ත්‍රීතුමනි, අපිත් වැඩ කරන්නේ ඒ විධියට නම් ඒ ආපු නැව් 13ටම සල්ලි ගෙවන්න පුළුවන්, කිසි ප්‍රශ්නයක් නැතිව. ඒ, ඇයි? ඒ ඔක්කෝම ඒවායේ Load Port Report එක pass. තමුන්නාන්සේලාගේ කාලයේ එහෙම තමයි කළේ. Load Port Report එක විතරක් බලනවා; Discharge Port Report එක ගන්නේම නැහැ; සල්ලි ගෙව්වා.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
එතකොට ප්‍රශ්නයක් වෙලා තිබුණේත් නැහැ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ප්‍රශ්නයක් තිබෙනවාද කියලා හෙව්වෙත් නැහැ. ඊට පස්සේ තමයි ඒවා අහුවෙන්නේ. අන්න එහෙමයි එදා කටයුතු කළේ.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
මේක වහන්න යනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ඔය කථා කරන අය ඇමතිකම් කළ කාලයේ අඩු ගණනේ මෙහෙට ගෙනාවට පස්සේ අපේ ගල් අඟුරු බලාගාරයේ reports බැලුවාද? ඒවා මොකක්වත් සැලකිල්ලට අරගෙන නැහැ. මෙහේ accredited lab එකකින් report එකක් ගත්තාද? ඒ මොකක්වත් නැහැ. අරහෙන් දෙන report එක මොකක්ද, ඒකට අනුව සියයට සියයම ගෙව්වා. එහෙම තමයි සිදු වුණේ. එහෙම සිදු වෙලා, 2019න් පසුව යන්තම් ඒ ක්‍රමය වෙනස් කළා. මේ විශේෂ විගණන වාර්තාවේම තිබෙනවා, Discharge Port Report එක සැලකිල්ලට ගන්න ඕනෑකම තිබුණත්, ඒකත් හරියට සිදු වෙලා නැහැ, ඒකේත් විවිධ අක්‍රමිකතා සිදු වෙලා තිබෙනවා කියලා. අපි මොකක්ද කළේ? අපි accredited lab එකෙන් Load Port Report එකත්, Discharge Port Report එකත් අරගෙන තමයි මේ ගෙවීම් සිදු කරන්නේ. ඒ දෙක අතර වෙනසක් තිබෙනවා. දැන් ඒක තමයි අපි හොයන්නේ. ඇත්තටම අවුරුදු 15ක් තිස්සේ එම ක්‍රියාවලිය හරියට සිදු වුණා නම් මෙවැනි පරස්පරතා ඇති වෙන්නේ නැහැ. ඒ කියන්නේ, accredited lab එකේ Load Port Report එකයි, Discharge Port Report එකයි දෙකම බලලා, accreditation එක හරියට හොයලා මේ වැඩේ කළා නම් මෙවැනි පරස්පරතා නිරාකරණය කරන්න අවුරුදු 15ක් යන්නේ නැහැ. හැබැයි, ඒක කරලා තිබුණේ නැහැ. දැන් accreditation ගැන කථා කරනවා, Discharge Port Report එකක් නොබලාම සල්ලි ගෙවපු අය.

ගරු කථානායකතුමනි, ඇත්ත, දැන් ප්‍රශ්නයක් මතුවෙලා තිබෙනවා. Load Port Report එක අනුව කිලෝ කැලරි 6,150ට වඩා වාර්තා වෙද්දී, Discharge Port Report එකේ කිලෝ කැලරි 5,700 සහ 5,800 ලෙස වාර්තා වන්නේ කොහොමද? ඒක හොයන්නට ඕනෑ. අපටත් ඒකට උත්තරයක් ඕනෑ. ඒ, accredited lab. ඒ රටේ ආයතන ඒ accreditation එක පිළිඅරගෙන තිබෙනවා. එහෙම නම් අපි ඒකට උත්තරයක් හොයන්න ඕනෑ. ඒකට අවස්ථාවක් තිබෙනවා. ඒකට තමයි අපි උත්තරයක් හොයමින් ඉන්නේ.

තුන්වන කාරණය මෙයයි. දැන් මේක පටලවන්න යනවා. අපට තිබෙන එක චුවමනාවක් තමයි, ප්‍රසම්පාදන ක්‍රියාවලිය හරියට තහවුරු කිරීම. දෙවැනි එක තමයි, තත්ත්ව පරීක්ෂණය. තුන්වන එක තමයි, සැපයුම සහතික කර ගැනීම. ප්‍රමාදවීම් ඕනෑ තරම් සිදු වෙලා තිබෙනවා. සාමාන්‍යයෙන් නැව් ඇවිල්ලා තිබෙන්නේ මැයි මාසයේ විතරක් නොවෙයි, ජුනි, ජූලි වනකල් නැව් ඇවිල්ලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, ගල් අඟුරු සැපයුම් ක්‍රියාවලියේ GCV එක, අළු ප්‍රමාණය, සල්ෆර් ප්‍රමාණය, moisture එක ආදී පිරිවිතරයන්ගේ deviation එකක් විය හැකිව තිබෙන නිසා එයට යම් අය කර ගැනීමක් කරන්න තමයි මේ කොන්දේසිවලින්ම දඩ පැනවීමක් කරන්නේ. දැන් අපි මොකද කරන්නේ? ඒ පිරිවිතරයන්ගේ යම් යම් deviations තිබෙන නිසා මේ වනකොට ඩොලර් මිලියන 17ක penalty එකක් ගන්න අපි කටයුතු කරලා තිබෙනවා. ඒකෙන් අනිවාර්යයෙන්ම මේ සිදු වන පාඩුවත් මඟ හැර ගන්නවා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඊළඟට විදුලි බිල වැඩි කරනවා?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
මම මේ රටේ ජනතාවට කියන්න කැමැතියි, මේ ප්‍රශ්නය නිසා කිසිදු ආකාරයකින් විදුලි බිලේ වැඩිවීමක් කර අපි ජනතාව මත බර පටවන්නේ නැහැ කියලා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
නැත්තේ මොකද?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
එය කරන්නේ නැහැ. ඔය දැන් පටලවන්න යන්න එපා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඇමතිතුමා, PUCSL එක දීලා තිබෙන report එකේ බොහොම පැහැදිලිව තිබෙනවා, Rs. 20 billion පාඩුවක් මත තමයි ඒක කරන්නේ කියලා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
දවස් කිහිපයකට කලින් විදුලි බිල වැඩි කරන්නට වූ යෝජනාව ලංකා විදුලිබල මණ්ඩලය සකස් කරන්න පටන් ගත්තේ පසුගිය දෙසැම්බර් මාසයේ මැද ඉඳලා. PUCSL එක වාර්තාව ඉදිරිපත් කළේ පෙබරවාරි 13වැනි දා. සාමාන්‍යයෙන් ලංකා විදුලිබල මණ්ඩලය සමඟ සති තුනක, හතරක සාකච්ඡාවකින් අනතුරුව තමයි විදුලි බිල වැඩි කිරීමේ යෝජනාව ඉදිරිපත් කරන්නේ. මම අදාළ නිලධාරීන් ගෙන්වා මේ පිළිබඳව කථා කළා.

අනෙක් එක තමයි, ගිය සැරේ දෙවන කාර්තුවේ ලංකා විදුලිබල මණ්ඩලය ජනන වියදම ගණනය කරනකොට ගල් අඟුරුවලට යොදවා තිබෙන මුදලට වඩා අඩු මුදලක් තමයි මෙවර ගල් අඟුරු ජනනයට දාලා තිබෙන්නේ. මට මතක හැටියට ගිය අවුරුද්දේ දෙවන කාර්තුවේ රුපියල් බිලියන 25ක් තිබුණා නම්,

මේ අවුරුද්දේ දෙවන කාර්තුවට ඒගොල්ලන් ඇස්තමේන්තු කරලා තිබෙන්නේ රුපියල් බිලියන 23.5ක් විතර. ඒ කියන්නේ, ගිය අවුරුද්දට වඩා අඩුවෙන් තමයි දෙවන කාර්තුවට ගල් අඟුරු ජනන වියදම ඇතුළත් කරලා තිබෙන්නේ. ඒ මත තමයි PUCSL එකට කිව්වේ, මේ ගණනින් විදුලි බිල වැඩි කරන්න වුවමනාය කියලා. මේ ප්‍රශ්නයට එය අදාළ වන්නේ නැහැ.

අනෙක් කාරණය තමයි, දඩ අය කිරීමේ ක්‍රමවේදය. අපි ඩොලර් මිලියන 15ක් රඳවාගෙන ඉන්නවා. ඒ ගල් අඟුරුවලින් තාපය ජනනය කර විදුලිය උත්පාදනය කිරීමේදී සිදු වන පාඩුව ජනතාව මත පටවන්නේ නැතුව එම සමාගම හරහා අය කර ගන්න අපි කටයුතු කරනවා. ඒකත් ප්‍රමාණවත් නැත්නම් අධිකරණ ක්‍රියාමාර්ගවලට ගිහිල්ලා හරි අය කර ගන්න අපි කටයුතු කරනවා. ජනතාව මත අපි ඒ බර පටවන්නේත් නැහැ. ඒකට මහ භාණ්ඩාගාරයෙන් මුදල් යොදවන්නේත් නැහැ. ගරු කථානායකතුමනි, මෙතැන තිබෙන්නේ අවුරුදු 15ක් වැරදි කරලා, දූෂණ අක්‍රමිකතාවලට ඉඩ දීලා, පවත්වාගෙන ගිය system එකක් නිවැරදි තැනක පිහිටුවන්න යනකොට, ප්‍රසම්පාදන ක්‍රියාවලිය හරියට කරනකොට, තත්ව පරීක්ෂණය හරියට කරනකොට බලාගෙන ඉන්න බැරිකම. අන්න එතකොට අපට තේරුම් ගන්න පුළුවන්, ඒ කාලයේ ටෙන්ඩර් cancel කරලා කැබිනට් එකේ තීන්දු අරගෙන තමන් දන්නා සමාගම්වලට දෙනකොට ඒකෙන් මොකක්ද වුණේ කියලා. අදත් ඩොලර් 98.5ට ගල් අඟුරු ගන්න පුළුවන්. හැබැයි, ඩොලර් 134ටත් ගත් කාලයත් තිබුණා. ඊටත් වඩා වැඩි ගණනට ගත් කාලයනුත් තිබුණා. ඩොලර් දෙසියඅසූ ගණනට ගත්ත කාලයනුත් තිබුණා. එහෙම තිබුණු රටක් මේක. අපි මේක ප්‍රසම්පාදනයෙන්, තරගකාරී ලංසු කැඳවීමෙන් හරි තැනකට ගෙනෙනවා. එතකොට තමුන්නාන්සේලා කලින් උදව් කරපු සමාගම්වලට අවස්ථාව නැති වෙන්න පුළුවන්. දැන් ඒගොල්ලන්ට කරන්න තිබෙන්නේ ලංසු අඩුවට ඉදිරිපත් කරන එකයි, නිවැරදි වාර්තා ඉදිරිපත් කරන එකයි. ඒ නිසා අපි සහතික වනවා, අපි මේ ක්‍රියාවලිය හරියට තහවුරු කිරීම සඳහා තත්ව පරීක්ෂණයේ තිබෙන මේ අඩුපාඩු නිවැරදි කරන බවට.

ඒ විතරක් නොවෙයි. ගරු කථානායකතුමනි, අපි ජනතාව මත කිසිසේත්ම මේ බර පටවන්නේ නැහැ කියන එක මේ වෙලාවේ මම කියන්න කැමැතියි. ඒ වාගේම අපි සහතික කරලා කියනවා, කිසිසේත්ම තමුන්නාන්සේලා බලාපොරොත්තු වන ආකාරයට විදුලි සැපයුමේ ප්‍රශ්නයක් සිදු වන්නේ නැති බවත්. මේ ප්‍රශ්න එකක්වත් නිසා විදුලිය කපන්නේ නැහැ. දැනට ජලාශවල ජලය සියයට 20ක්, 25ක් අඩු වෙලා තිබෙන්නේ. ඒ ප්‍රශ්නයට අපි මුහුණ දෙනවා. ලෝක වෙළෙඳ පොළේත් තෙල් මිල ඉහළ ගිහිල්ලා තිබෙන්නේ. ඒ සියලු ප්‍රශ්නවලට මුහුණ දෙන අතරේ විදුලිය කපන්න අපි කටයුතු කරන්නේ නැහැ. විදුලිය අඛණ්ඩව සපයනවා, ගෘහස්ථවලට සහ කර්මාන්තවලට. ඒ නිසා තමුන්නාන්සේලාගේ බලාපොරොත්තු ඉෂ්ට වන්නේ නැහැ කියන එක මම කියන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, මෙතුමන්ලා උත්සාහ කරනවා, මේ ආණ්ඩුව පත් වෙච්ච වෙලාවේ ඉඳලා මේ ඇමතිවරුන්ට දූෂණ චෝදනා එල්ල කරන්න. පසුගිය සතියක, දෙකක කාලය විතර වෙනකන් අර කන්ටේනර් 323 සිද්ධිය අල්ලාගෙන පොළොවේ ගහා හිටියා. ඒක ගැන නම් දැන් සද්ද නැහැ වාගේයි.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
තවම යනවා; තවම යනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
මතක තියාගන්න, ඒ කන්ටේනර් 323ක් නිදහස් කිරීම සම්බන්ධයෙන් ප්‍රශ්නයක් වුණාද කියලා හොයන්න කමිටුවක් පත් කළේත් ජනාධිපතිවරයා; ජනාධිපතිවරයා කමිටුව පත් කළේ. අපි එතැනත් තිබුණු ප්‍රශ්නය නිවැරදි කරනවා. COPE එකේදි මේ සම්බන්ධව විගණනය කරන්න කියලා කිව්වේ කවුද? COPE එකේදි විගණනයක් ඉල්ලා සිටියේ අපේ මන්ත්‍රීවරුන්ම තමයි; අපේ සභාපතිවරයා; අපේ කණ්ඩායම තමයි.

ගරු කථානායකතුමනි, මම මේ විවාදයට හරි කැමැතියි. මොකද දන්නවාද? මේ විවාදය අවසන් වනකොට ලස්සන වැඩක් වෙනවා. ගරු කථානායකතුමනි, දැන් මේ නැව් 13 ගැන විතරක් නොවෙයි, මේ නැව් 462 ගැනම හොයන්නට ඕනෑ. ඒ නිසා මේ විවාදය අවසන් වනකොට අපි ආණ්ඩුවක් හැටියට තීන්දුවකට එනවා, නැව් 462 ගැනම හොයන්න පුළුවන් විධියේ බලයලත් පරීක්ෂණ කමිටුවක් පත් කරන්න. 2010 වර්ෂයේ ඉඳන් වුණු දේවල් හොයන්න ඕනෑ. අන්න එතකොට අපේ මන්ත්‍රීවරුන් කියාවි, එකෙන් බෙදන්න ඕනෑ එක දශම ගණනෙන් බෙදලා සමාගමට වාසි කළේ කොහොමද කියලා. ඒවාත් හොයන්න ඕනෑ. ඒ කාලයේ Load Port Report එක විතරක් අරගෙන, Discharge Port Report එක පැත්තකට දාලා සල්ලි ගෙව්වේ කොහොමද කියන ඒවාත් හොයන්න ඕනෑ. ගරු කථානායකතුමනි, ඒක තමයි මේකෙන් වෙන වාසිය. අපි මේ ක්‍රමය මෙතැන් සිට ඉදිරියට නිවැරදි කරනවා විතරක් නොවෙයි, පරණ වැරදිත් මේකෙන් හොයනවා. ඒ පරණ වැරදි හොයලා නඩු පැවරීමේ කටයුතු කරනවා. ගරු කථානායකතුමනි, අපට ඕනෑ නැහැ, වැරදිකාරයෝ ආරක්ෂා කරන්න.

අනෙක් එක, ඔහොම නොවෙයි, ඔබතුමන්ලා මේ ආණ්ඩුවේ මේ ඇමතිවරුන්ට වංචා, දූෂණ චෝදනා එල්ල කරන්න නම් "Artemis III" හදාගෙන හඳට ගිහිල්ලා ගොඩ බැහැලා එන්න වෙයි. ඒක සාර්ථක වෙන්නේ නැහැ. එම නිසා වෙන වෙන දේවල් අල්ලාගන්න බලන්න. *[බාධා කිරීම්]* හැබැයි, මේ ඇමතිවරුන්ට වංචා, දූෂණ චෝදනා එල්ල කරන්න තමුන්නාන්සේලාට බැහැ, තිබෙනවා නම් ඉදිරිපත් කරන්නකෝ. ඇත්ත සිද්ධිය මට පෙනෙනවා. ටෙන්ඩර් එකේ දින ගණන පොඩ්ඩක් අඩු වෙනකොට ඔබතුමන්ලාට හිතෙනවා, ඔබතුමන්ලා කරපු විධියට මොකක් හෝ වංචාවක් එතැනත් කරන්න ඇතිද කියලා. සාමාන්‍යයෙන් ඒ හිතෙන විධිය නේ. ටෙන්ඩර් එක පොඩ්ඩක් කල් යනකොට කල්පනා කරනවා, අපි ඒ කාලයේ අහවලාට වාසි වෙන විධියට මේක කළා, මේගොල්ලොත් එහෙමද දන්නේ නැහැ කියලා. නැහැ, අපි එහෙම නොවෙයි. මේකේ වෙච්ච ක්‍රියාවලියක් තිබෙනවා. අවුරුදු 15ක් තිස්සේ system එකක් නොතිබුණු තැනක් අපි දැන් මේ හදමින් ඉන්නේ. එතකොට ඒකේ තිබෙන තාක්ෂණික දුර්වලතා, අඩුපාඩුකම් පවා අපි හදනවා.

ගරු කථානායකතුමනි, මට අවසාන වශයෙන් කියන්න තිබෙන්නේ මෙයයි. මේ විශේෂ විගණන වාර්තාව වැදගත්. මේ විගණන වාර්තාවේ මතු පිටින් නොවෙයි අල්ලා ගන්න ඕනෑකම තිබෙන්නේ. ඒකේ තිබෙනවා, ඉතිහාසයට අදාළ ගොඩාක් කරුණු කාරණා. ඒ වාර්තාවේ තිබෙනවා, 2010-2015 කාලයේ, 2020-2022 කාලයේ සිදු වෙච්ච ක්‍රියාවලින් පිළිබඳව වාගේම ඒ කාලයේ කොහොමද මේ ආයතන හැසුරුණේ කියලා. අපි ඒවා ගැනත් පරීක්ෂණ කරන්න ඕනෑකම තිබෙනවා. අපි අනිවාර්යයෙන් ඒවා ගැනත් පරීක්ෂණ කරනවා. එහෙම කරලා මේ system එක අපි හරියට හදනවා. ඒක නිසා මේක තේරුමක් නැහැ කියලා මම කියන්නේ නැහැ. මේක හොඳයි. තමුන්නාන්සේලාගේ පැත්තෙන් පුළුවන් තරම් කරුණු ඉදිරිපත් කරන්න. මම කලින් කිව්වා වාගේ

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

පුළුවන් නම් මහජන බැංකුවේ account එකෙන් එහාට යන්න බලන්න. පුළුවන් නම් අද දවස ඇතුළත ඒ තිබෙන details පිළිබඳවත් කරුණු ඉදිරිපත් කරන්න.

ගරු කථානායකතුමනි, අපි වංචාවට, දූෂණයට එරෙහිව කථා කරලා ජනතා විශ්වාසය දිනාගෙන බලයට පත් වෙච්ච ආණ්ඩුවක්. මේගොල්ලන් ප්‍රතික්ෂේප වුණේ ඒ වංචා, දූෂණ සිදු කිරීම නිසා. ඒක නිසා අපේ ජන වරම ගැන අපි දන්නවා. ඒ අනුවයි අපි කටයුතු කරන්නේ. ඒක නිසා අපි කිසිසේත්ම එවැනි චෝදනාවට ලක් වෙන්න සූදානම් ඇමතිවරු නොවෙයි. අපි මේක නිවැරැදි කරමින් යනවා. Systems හදනකොට, system නැති තැනක ඒවායින් ලාභ ගත්ත කට්ටිය කලබල වෙන එක ගැන අපි පුදුම වෙන්නේත් නැහැ. ගල් අඟුරු ක්ෂේත්‍රය සම්බන්ධයෙන් විතරක් නොවෙයි, තෙල් සම්බන්ධවත් ප්‍රශ්නයක් තිබෙනවා. අපි ඖෂධ මාෆියාව කඩන්න යනකොට ඒ ප්‍රශ්නය එනවා. අපි system එක හදන්න යනකොට ඒ කට්ටිය එකතු වෙලා ඒකට එරෙහිව කටයුතු කරනවා. ඒවාට මුහුණ දෙන්න බලාගෙන තමයි අපි ආණ්ඩු බලය ගත්තේ. අපි ඒ කටයුත්ත කරනවා, ගරු කථානායකතුමනි. ඒ නිසා මේ වෙලාවේදී අපි බලාපොරොත්තු වෙනවා, ඒ පැත්තෙන් කියන කරුණුවලට එකින් එක ප්‍රතිචාර දක්වන්නට. මට වේලාව ලබා දීම සම්බන්ධව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Next, the Hon. (Dr.) Pathmanathan Sathiyalingam. You have 16 minutes.

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.*

[மு.ப. 11.48]

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)

கௌரவ சபாநாயகர் அவர்களே, இன்றைய தினம் வலுசக்தி அமைச்சருக்கு எதிராகக் கொண்டுவரப்பட்டுள்ள நம்பிக்கையில்லாப் பிரேரணை மீதான விவாதத்தில் பேசுவதற்குச் சந்தர்ப்பம் வழங்கியமைக்கு முதலில் நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இந்த நம்பிக்கையில்லாப் பிரேரணையில் எங்களுடைய கட்சி சார்பில் நாங்கள் கையெழுத்து வைப்பதைத் தவிர்த்திருந்தோம். நாங்கள் அவ்வாறு கையெழுத்து வைப்பதைத் தவிர்த்ததற்கான முக்கிய காரணங்கள் இரண்டு இருந்தன. ஒன்று, இந்த விடயம் ஏற்கெனவே நாடாளுமன்றத்தின் 'கோப்' குழுவில் விசாரிக்கப்பட்டு வருகின்றது. இரண்டாவது, சம்பந்தப்பட்ட அமைச்சர் அவர்களுக்கு எதிராக கொழும்பு மேல் நீதிமன்றத்தில் வழக்கொன்று தாக்கல் செய்யப்பட்டு, தற்பொழுது அவர் பிணையில் இருக்கிறார். இந்த விடயம் விசாரணைக்கு உட்பட்டு இருக்கும் நிலையில், நாங்கள் அவசரப்பட்டு இந்த நம்பிக்கையில்லாப் பிரேரணையில் பங்குதாரர்களாக இருக்க வேண்டுமா? என்ற எண்ணத்தின் அடிப்படையில்தான் எங்களுடைய கட்சியைச் சேர்ந்தவர்கள் இந்த நம்பிக்கையில்லாப் பிரேரணையில் கையெழுத்து இடாமல் இருந்தோம். ஆனால், தற்போது வெளியாகியுள்ள தேசிய கணக்காய்வு அலுவலகத்தின் அறிக்கையில் சுட்டிக்காட்டப்பட்டுள்ள சில விடயங்களைப் பார்க்கும்போது, இந்த விடயமானது இலகுவாகக் கடந்து செல்லக்கூடிய ஒரு விடயமல்ல என்பதை நாங்கள் உணர்ந்திருக்கிறோம். அந்த வகையில், இன்று நாங்கள் இந்த விடயம் தொடர்பில் ஒரு முடிவை எடுக்க வேண்டியவர்களாக இருக்கின்றோம்.

வலுசக்தித் துறை என்பது, வெறுமனே பணத்துடனும் மின்சாரத்துடனும் சம்பந்தப்பட்ட ஒரு விடயம் அல்ல. இது இந்த நாட்டின் தேசிய பாதுகாப்போடு சம்பந்தப்பட்ட விடயம்; இந்த நாட்டின் பொருளாதார உறுதிப்பாட்டோடு சம்பந்தப்பட்ட விடயம். அதேநேரம், இந்த நாட்டில் வாழுகின்ற மக்கள் அரசாங்கத்தின்மீது வைத்திருக்கின்ற நம்பிக்கையுடன் சம்பந்தப்பட்ட விடயமாகவும் இது இருக்கின்றது. ஆகையால், அரசியலமைப்பு, பாராளுமன்றத்தில் இருக்கின்ற உறுப்பினர்கள் மற்றும் அமைச்சர்களுடைய நன்நடத்தை, நிருவாக நடைமுறைகள் என்பவற்றை அடிப்படையாகக் கொண்டுதான் நாங்கள் இந்த நம்பிக்கையில்லாப் பிரேரணையை எங்களுடைய கட்சி சார்பில் ஆராய்கின்றோம்.

முதலாவது, ஒழுக்கம் மற்றும் நன்நடத்தை மீறல்கள். இது எங்களால் அவதானிக்கப்பட வேண்டிய ஒரு விடயமாக இருக்கின்றது. பொதுமக்களின் நம்பிக்கையைக் காப்பாற்றும் வகையில் நேர்மையுடன் செயற்பட வேண்டிய பொறுப்பு அமைச்சர்களுக்கும் பாராளுமன்ற உறுப்பினர்களுக்கும் இருக்கின்றது. மனச்சாட்சிப்படி நடத்தல், தமது கடமைகளுக்குப் பொறுப்புக்கூறுதல் போன்ற விடயங்களை அமைச்சர் மீறியதாக இங்கு குற்றஞ்சாட்டப்படுகின்றது. இரண்டாவது, நிருவாக மற்றும் தொழில்நுட்பக் கவனமின்மை. இது மிகவும் முக்கியமான ஒரு விடயம். நுரைச்சோலையிலுள்ள நிலக்கரி மின் உற்பத்தி நிலையத்துக்குப் போதுமான மற்றும் தரமான நிலக்கரியைப் பெற்றுக்கொள்வதை உறுதிப்படுத்த அமைச்சர் அவர்கள் தவறியிருக்கிறார் என்பதை நாங்கள் அறியக்கூடியதாக இருக்கின்றது. அதன் விளைவாக நிறுவனத்துக்கு ஏற்படும் நட்டத்தைக் குறைத்தல், மின் வழங்கல் பாதிப்புகளைத் தவிர்த்தல் போன்ற விடயங்களில் அமைச்சர் அவர்கள் தோல்வி அடைந்துள்ளதாகவே நாங்கள் கருதுகின்றோம். மூன்றாவது, ஊழல் குற்றப்பத்திரிகை. இது சம்பந்தமாகவும் நாங்கள் பார்க்க வேண்டிய தேவை இருக்கின்றது. வலுசக்தி அமைச்சர் முன்னர் உரக் கூட்டுத்தாபனத்தில் கொள்வனவு மேலாளராகப் பணியாற்றியபொழுது, 8.86 மில்லியன் ரூபாய் நட்டத்தை ஏற்படுத்தியதாக அவருக்கு எதிராக கொழும்பு மேல் நீதிமன்றத்தில் குற்றப்பத்திரிகை தாக்கல் செய்யப்பட்டிருக்கிறது. தற்போது அவர் பிணையில் இருக்கிறார்.

அவர்மீது சுமத்தப்பட்டுள்ள ஊழல் குற்றச்சாட்டு இன்னும் நிரூபிக்கப்படவில்லை என்பது உண்மை! எனினும், ஊழல் குற்றச்சாட்டு தொடர்பில் மேல் நீதிமன்றத்தில் குற்றப்பத்திரிகை தாக்கல் செய்யப்பட்டு பிணையில் இருக்கும் ஒருவர், அமைச்சுப் பதவியில் நீடிப்பது பொது நலனுக்கும் நல்லாட்சிக்கும் எதிரானது என்றே நாம் கருதுகின்றோம்.

இந்தப் பாராளுமன்றத்தில் அங்கம்வகிக்கும் நாங்கள், ஊழல், இலஞ்சம், கொள்ளை, களவு என்பவற்றுக்கு எதிரானவர்கள். நாங்கள் இரண்டு அணியினரையும் சாராதவர்கள்; ஆளுங்கட்சி, எதிர்க்கட்சி என்று சொல்ல விரும்பாதவர்கள். සිංහලෙන් කියනවා නම්, අපි විරුද්ධ පක්ෂයේ නොවෙයි; විරුද්ධ පක්ෂය පැත්තේ සිටියාට, අපි ප්‍රතිපක්ෂය. நாங்கள் எதிர்க்கட்சி என்ற வகையில் மாத்திரம் இதைப் பார்க்கவில்லை. இந்த நாட்டில் நல்லாட்சி நடைபெற வேண்டும், இலஞ்சம், ஊழல் ஒழிக்கப்பட வேண்டும், இந்த நாட்டின் அரசின்மீது மக்கள் நம்பிக்கை வைக்க வேண்டும் என்ற நோக்கத்தோடு பாராளுமன்றத்துக்கு வந்தவர்கள் நாங்கள். கௌரவ அமைச்சர்மீது சுமத்தப்பட்டு இருக்கின்ற குற்றச்சாட்டு மிகவும் முக்கியமானது. நான் சொன்ன அந்த விடயங்களில் மக்களைத் திருப்திப்படுத்தக்கூடிய அளவுக்கு அவர் நடந்துகொள்ளவில்லை என்றே நாங்கள் கருதுகின்றோம். அவர் குற்றவாளியா, இல்லையா என்பதற்கு அப்பால், இவ்வாறான பாரியதொரு குற்றச்சாட்டு அவர்மீது சுமத்தப்பட்டு இருக்கும்போது, அமைச்சுப் பதவியில் நீடிப்பது பொருத்தமற்றதென்றே நாங்கள் கருதுகின்றோம். எங்களது கட்சி இந்த விடயத்தை உன்னிப்பாகப் பார்க்கின்றது.

தேசிய மக்கள் சக்தி அரசாங்கம் ஊழல் எதிர்ப்புக்காக மக்கள் ஆணையைப் பெற்றிருக்கின்றது. அந்த மக்கள் ஆணையைச் சோதிக்கும் ஒரு நடவடிக்கையாகவே இந்த நம்பிக்கையில்லாப் பிரேரணை இங்கு முன்வைக்கப்பட்டு இருக்கின்றது. இதற்குப் பொறுப்புக்கூற வேண்டியது இந்த அரசாங்கத்தின் முக்கிய கடமை! "நீங்கள் கடந்த 15 வருடங்களாக ஊழல் செய்தீர்கள்; உங்களுக்கு இது பற்றி பேச அதிகாரம் இல்லை; நீங்கள் செய்தால் நாங்கள் செய்யக்கூடாதா?" என்ற தொனியில் எதிர்க்கட்சியினரைப் பார்த்து கேள்வி எழுப்பக்கூடாது. இதற்கு முன்னர் ஊழல் நடந்திருக்கலாம்! அவற்றையும் விசாரியுங்கள். முன்னர் ஊழல் நடந்திருப்பதால் இந்த ஊழல் குறித்து பேசக் கூடாது என்ற கட்டுப்பாட்டைக் கொண்டுவர முடியாது என்பதைத்தான் நான் இங்கு சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

ஊழல் குற்றச்சாட்டுகள் மற்றும் நிருவாகத் தவறுகளுக்கு கௌரவ வலுசக்தி அமைச்சர் அவர்கள் அற அடிப்படையில் அந்தப் பதவியிலிருந்து தற்காலிகமாகவேனும் விலக வேண்டுமென நாங்கள் கருதுகின்றோம். குறிப்பாக, 2025 டிசம்பர் முதல் 2026 பெப்ருவரி மாதம் வரை இறக்குமதி செய்யப்பட்ட நிலக்கரியின் வெப்பப் பெறுமானம் - calorific value - மிகவும் குறைவாக இருப்பதாக குறித்த அறிக்கையில் சொல்லப்பட்டு இருக்கின்றது. இதை இலங்கைப் பொதுப் பயன்பாடுகள் ஆணைக்குழுவும் சொல்கின்றது. இதன் காரணமாக நுரைச்சோலை மின் உற்பத்தி நிலையத்தில் உற்பத்தி செய்யப்பட வேண்டிய சக்தியின் அளவு குறைந்திருப்பதாக இந்த அறிக்கையில் சொல்லப்பட்டு இருக்கின்றது. எனவே, இது தொடர்பாக ஆராய வேண்டிய தேவை இந்தப் பாராளுமன்றத்துக்கு இருக்கின்றது. இவ்வாறான விடயங்களை இதற்குப் பொறுப்பான அமைச்சர் தடுக்கத் தவறியிருக்கிறார் என்ற சந்தேகம் எங்களுக்கு இருக்கின்றது. இலங்கை பொதுப் பயன்பாடுகள் ஆணைக்குழுவின் அறிக்கையில், கொள்வனவு நடைமுறைகளில் பாரிய தவறுகள் இடம்பெற்றிருப்பதாகச் சுட்டிக்காட்டப்பட்டு இருக்கின்றது. இந்த விடயங்கள் இந்த Audit Reportஇல்கூட விலாவாரியாக குறிப்பிடப்பட்டு இருக்கின்றது.

இந்த நிலக்கரியின் தரம் தொடர்பாக ஆராயும்போது, இது மிகக் குறைந்த வெப்பப் பெறுமானத்தைக் கொண்டதாகச் சுட்டிக்காட்டப்பட்டு இருக்கின்றது. இது load பண்ணுகிற portஇல் எப்படி இருந்தது, unload பண்ணுகிற portஇல் எப்படி இருந்தது என்பதை முன்னர் பார்க்கவில்லையென கௌரவ சுகாதார அமைச்சர் அவர்கள் சொன்னார். முன்னர் அந்தத் தவறு நடந்திருக்கலாம். அதைப் பற்றி விசாரியுங்கள்! அதற்காகத்தான் மக்கள் உங்களைத் தெரிவுசெய்து இங்கு அனுப்பி இருக்கிறார்கள். அந்தத் தவறு இந்த அரசாங்கத்திலும் தொடரக்கூடாது என்றே நாங்கள் விரும்புகிறோம்.

லக்விஜய மின் உற்பத்தி நிலையத்துக்காக லங்கா நிலக்கரி நிறுவனம் மேற்கொண்ட 2025/2026 காலப்பகுதிக்கான நிலக்கரி பெறுகைகள் தொடர்பான விசேட கணக்காய்வு அறிக்கையில் பின்வரும் விடயங்கள் சுட்டிக்காட்டப்பட்டு இருக்கின்றது. அவற்றை நான் இந்தச் சபையின் கவனத்துக்குக் கொண்டுவர விரும்புகின்றேன். வழங்குநர் தெரிவில் முரண்பாடு காணப்படுவதாகச் சொல்லப்படுகிறது. நிலக்கரியைக் கொண்டுவந்த சம்பந்தப்பட்ட நிறுவனம், வழங்குநராகப் பதிவு செய்யப்படாத ஒரு நிறுவனம் என்று சொல்லப்படுகின்றது. அதுமாத்திரமல்ல, இந்த tender procedureக்குள் உள்வாங்கப்பட்ட மேலும் மூன்று நிறுவனங்கள் வழங்குநராகப் பதிவு செய்யப்படாத நிறுவனங்களெனவும் சுட்டிக்காட்டப்பட்டு இருக்கின்றது. அதேநேரம், இந்த நிறுவனங்கள் கடந்த அரசாங்க காலத்தில் தரமற்ற அரிசியைக் கொண்டுவந்ததனால் கறுப்புப் பட்டியலில் இருப்பதாகவும் சொல்லப்படுகின்றது. இதன்மூலம் பெறுகை மூலதத்துவம் அல்லது கொள்முதல் கொள்கை நியாயம் இல்லாமல் அப்பட்டமாக மீறப்பட்டுள்ளதாக இந்தக் கணக்காய்வு அறிக்கையில் சொல்லப்பட்டு இருக்கின்றது.

மேலும், நிலக்கரியின் தரப் பரிசோதனையில் பல மோசடிகள் செய்யப்பட்டு இருப்பதாக கணக்காய்வு அறிக்கை சொல்லுகிறது; நாங்கள் சொல்லவில்லை. லங்கா நிலக்கரி கம்பனி கொள்வனவு செய்த நிலக்கரியின் தரத்தை ஆராய்வது தொடர்பாக விற்பனையாளருக்கும் கொள்வனவாளருக்கும் இடையே ஏற்பாடு உள்ளபோதும் உரிய நடைமுறை பின்பற்றப்படவில்லை என்பதை இந்தக் கணக்காய்வு அறிக்கை சுட்டிக்காட்டுகின்றது. அதுமட்டுமல்ல, குறித்த ஒரு நிறுவனத்துக்கு தரப் பரிசோதனைக்கு கொடுக்கப்பட்டதாகச் சொல்லப்பட்டு இருக்கிறது. ஆனால், அந்த நிறுவனத்தால் வழங்கப்பட்ட அறிக்கைக்கும் இந்த மின் உற்பத்தி நிலையத்தின் அறிக்கைக்கும் இடையில் பாரிய முரண்பாடு இருப்பதாகச் சொல்லப்படுகிறது. அதுமாத்திரமல்ல, இந்த அறிக்கையைக் கொடுத்த நிறுவனம், ஏற்கெனவே காலாவதியான ஒரு நிறுவனம் என்றும் இந்த அறிக்கையில் சொல்லப்பட்டு இருக்கின்றது. நிலக்கரி ஏற்றப்படும் துறைமுகத்திலும், இறக்கப்படும் துறைமுகத்திலும் செய்ய வேண்டிய procedures, quality check செய்யப்படவில்லை என்பதையும் இந்தக் கணக்காய்வு அறிக்கை சுட்டிக்காட்டுகின்றது.

நிலக்கரி விநியோகம் தொடர்பில் அனுபவம் இல்லாதவர்கள் இந்த tenderஇல் பங்குகொள்வதற்காக, எந்தவொரு தொழில்நுட்ப அல்லது சட்டரீதியான ஆலோசனைகளும் இன்றி, 'தகுதி நிபந்தனை' வேண்டுமென்றே தளர்வு செய்யப்பட்டதாகச் சொல்லப்படுகிறது. சட்டமா அதிபர் அவர்கள் அனுமதி வழங்கிய திகதிக்கு முன்னரே இவர்களுக்கு tenderஐக் கொடுப்பதற்கான ஏற்பாடுகள் நடைபெற்றதாக இந்தக் கணக்காய்வு அறிக்கையில் சொல்லப்பட்டு இருக்கிறது. இதனை நாங்கள் மிகவும் முரணான ஒரு விஷயமாகவே பார்க்கின்றோம். பெறுகை நடைமுறைகளுக்கான காலம்

[ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා]

குறைக்கப்பட்டுள்ளது. "இதனை முன்னரும் குறைத்தார்கள். இப்போது நாங்கள் குறைத்ததைப் பற்றி பேச வேண்டாம்" என்று தயவுசெய்து சொல்ல வேண்டாம். அதாவது, 42 நாட்களாக இருந்த பெறுகை நடைமுறைகளுக்கான காலத்தை 21 நாட்களாக வேண்டுமென்றே குறைத்ததாக இந்த அறிக்கை சொல்கிறது.

நிலக்கரியை நாட்டுக்குள் கொண்டுவருவதற்கான முறையான திட்டமிடல் இன்மையால், மின்சார வழங்கலில் பாதகமான தாக்கம் ஏற்பட்டுள்ளமை கணக்காய்வில் கண்டறியப்பட்டுள்ளது. நிலக்கரியின் தரம், உரிய வேளையில் இங்கு கொண்டுவரப்படாமை, தட்டுப்பாடு ஏற்படுத்தப்பட்டமை போன்ற விடயங்களில் கௌரவ அமைச்சர் அவர்கள் நேரடியாகப் பங்குபற்றினாரா, ஊழல் செய்தாரா என்பதல்ல பிரச்சினை! இந்த விடயத்தைச் சரிசெய்ய வேண்டிய பாரிய பொறுப்பு இந்த அரசாங்கத்துக்கு இருக்கின்றது. எனவே, இந்த விடயங்களை அரசாங்கம் கவனத்திற்கொள்ள வேண்டுமெனக் கேட்டுக் கொள்கிறேன். தரமற்ற நிலக்கரியை இங்கு கொண்டுவந்ததால் ஏற்படுகின்ற உற்பத்தி இழப்பை - சக்தி இழப்பை - ஈடுசெய்வதற்கு மேலதிகமான நிலக்கரியைப் பயன்படுத்துவதால், 2,237.7 மில்லியன் ரூபாய் நஷ்டம் ஏற்படுமென சொல்லப்பட்டு இருக்கிறது. இந்த நட்டத்தை ஈடுசெய்வதற்கு தரமற்ற நிலக்கரியை வழங்கிய நிறுவனங்களிடம் இருந்து surchargeஐ அல்லது நட்டஈட்டைப் பெற்றுக்கொள்ள முடியுமென அமைச்சர் அவர்கள் இங்கு குறிப்பிட்டு இருந்தார்.

ஆனால், இந்த நிலை ஏற்படுவதற்கு அனுமதித்த அமைச்சர் அவர்கள் தொடர்ந்தும் பதவியில் இருக்கலாமா? என்பதுதான் எங்களுடைய கேள்வி. நிலக்கரியின் தரம் குறைவாக இருப்பதனால், அதிலிருந்து வெளியேறும் சாம்பலின் அளவு 25 சதவீதத்தை எட்டுமெனச் சொல்லப்படுகின்றது. வெளியேறும் சாம்பலின் அளவு 25 சதவீதத்தை எட்டுமாக இருந்தால், குறித்த அனல் மின் உற்பத்தி நிலையத்தில் இருக்கும் இயந்திரங்களைப் பாதிப்படையச் செய்யும். இதனால் இன்னும் நட்டம் ஏற்படும். அதுமாத்திரமல்ல, இந்தச் சாம்பலை dispose பண்ணும்போது - அழிக்கும்போது - சுற்றுச்சூழலுக்கும் பாரிய பாதிப்பு ஏற்படும்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up.

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
எனக்கு இன்னும் ஒரு நிமிடம் தாருங்கள்!

நிதி இழப்புக்குப் பொறுப்புக் கூறவேண்டிய கடமையும் இந்த அரசாங்கத்துக்கு இருக்கின்றது. எனவே, நீதிமன்ற நடவடிக்கையின்கீழ் இருக்கின்ற ஒருவர், இந்த அமைச்சுப் பதவியில் தொடர்ந்து இருக்காமல், நல்லெண்ணத்தோடு தானாக முன்வந்து அமைச்சுப் பதவியை இராஜினாமா செய்து, இந்தப் பிரச்சினை சுமுகமாகத் தீர்ந்த்த பின்னர் அல்லது தான் குற்றமற்றவர் என்று நிரூபித்த பின்னர்தான் மீண்டும் பதவிக்கு வர வேண்டும். அப்படிச் செய்வாராக இருந்தால், மக்கள் என்ன நோக்கத்துக்காக இந்த அரசாங்கத்தைக் கொண்டுவந்தார்களோ, அந்த நோக்கத்தை உங்களால் நிறைவேற்ற முடியுமெனக் கூறி, சந்தர்ப்பத்துக்கு நன்றி கூறி, விடைபெறுகின்றேன்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. R.M. Ranjith Madduma Bandara. You have seven minutes.

[අ.භා. 12.05]

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ හිතවත් ගරු නලින්ද ජයතිස්ස ඇමතිතුමා බොහොම උත්සාහයක් ගත්තා මේ හොරකම වහන්න. හැබැයි, ඒක කරන්න එතුමාට පුළුවන්කම ලැබුණේ නැහැ. එතුමා කියන්න ගියේ, "මීට කලින් ගල් අඟුරු නැව් 462ක් ආවා, ඒ අවස්ථාවලත් මෙහෙම කරපු නිසා අපිත් මෙහෙම කළා" වාගේ එකක්. මම මේක දකින්නේ, සීමාවක් නැති හොරකමක් විදියටයි. දැනට ගණනය කරලා තිබෙන විදියට එය රුපියල් බිලියන 30ක් පමණ වෙනවා. මෙච්චර කල් කිව්වේ, මේ රටේ ලොකුම හොරකම මහ බැංකු හොරකම කියලායි. ඔබතුමන්ලාට අවුරුදු එකහමාරක කාලයක් තිබුණා, ඒක අල්ලන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ හොරකම ගැන කථා කරන කොට මට මතක් වෙනවා, ගාමිණී දිසානායක මැතිතුමා මහවැලි ගඟ හරස් කරලා වික්ටෝරියා වේල්ල හදලා මේ පාර්ලිමේන්තුවට ඇවිත් කියපු කථාව. ලංකාවේ හදපු අනෙක් වැව් ඔක්කොගේම වතුර ගෙනාවත් ඒක පුරවන්න බැහැ කියලා එතුමා කිව්වා. මමත් දකින්නේ, ලංකාවේ ඔක්කෝම හොරකම් එකතු කරලා බැලුවත් ගල් අඟුරු හොරකමට කිට්ටු කරන්නවත් බැහැ කියලායි. මේක තමයි රටේ වෙච්ච ලොකුම හොරකම.

අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා එදා පාර්ලිමේන්තුවට ඇවිල්ලා කිව්වේ මොකක්ද? "ටෙන්ඩරය හරි" කිව්වා. හැබැයි ටෙන්ඩරයක තිබෙනවා, quality එකක්, යම්කිසි තත්ත්වයක්. මේකේ තත්ත්වය බාලයි. ජනාධිපතිතුමනි, තමුන්නාන්සේගේ කථා ශෛලියෙන් රටේ මිනිසුන් රවටන්න බැහැ. Quality එක වැරැදියි; ටෙන්ඩරයත් හරි නැහැ. හැබැයි, ටෙන්ඩරය හරි කියමුකෝ. විගණකාධිපති වාර්තාවේ කියනවා, මේ ටෙන්ඩර්කරු ලියාපදිංචිය හරියාකාරව කරන්නේ නැතුව තමයි මේක පටන් අරන් තිබෙන්නේ කියලා. දින ගණන අඩු වෙනවා, quantity එක අඩු වෙනවා. තමුන්නාන්සේලාම පත් කරපු, ලංකා ගල් අඟුරු සමාගමේ සභාපති ඉල්ලා අස් වුණා. අපි අහනවා, එතුමා ඉල්ලා අස් වුණේ ඇයි කියලා. එතුමා හොරකම දැක්කා. හොඳ මිනිස්සුත් එක්කෙනෙක් දෙන්නෙක් ඉන්නවා. මෙතැන ඉන්න මන්ත්‍රීවරුන්ට, ඇමතිවරුන්ට මම කියනවා, මේ හොරකම, මේ හොරාව ආරක්ෂා කරන්න එපා කියලා. මෙතුමාගේ ඉතිහාසය එච්චර හොඳ නැහැ.

අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා මහින්ද රාජපක්ෂ මහත්මයාත් එක්ක ආණ්ඩු කරද්දී කෘෂිකර්ම ඇමතිවරයා වශයෙන් කටයුතු කළා. එතකොට එතුමාගේ ආයතනයේ සිදු වුණු ලොකුම ගනුදෙනුව සඳහා පත් කළේ, මොන කුමාරද කියන මේ ඇමතිවරයායි. එතැනත් හොරකම් කරලා, අධිකරණයේ නඩුවක් තිබෙනවා. මම අහනවා, මේ කාරණය. මේ පාර්ලිමේන්තු ඉතිහාසයේ ඇමතිවරයෙකුට විරුද්ධව නඩුවක් තිබුණා නම්, රටේ නායකයා වශයෙන් ජනාධිපතිවරයා හෝ අගමැතිවරයා විසින් ඒ ඇමතිවරයා අයින් කරනවා. මේ ඇමතිවරයාට විරුද්ධව අධිකරණයේ නඩුවක් තිබියදීත් මේ ඇමති හොඳයි ජනාධිපතිට. මොකද,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

දන්නේ නැහැ. පාර්ලිමේන්තුවේදීත් පැහැදිලිව කියා තිබෙනවා, විගණකාධිපති වාර්තාවේත් තිබෙනවා, මේක වංචාවක්, දූෂණයක්

කියලා. මේකේ බර පැටවෙන්නේ ජනතාව මත. ජනාධිපති නිශ්ශබ්දයි. අපට ආරංචියි, ජනාධිපති විපක්ෂයේ සිටියදී කාර් දුන්නේත් මේ ඇමතිවරයායි කියලා. ජනාධිපති විපක්ෂයේ සිටියදී සැලකුවේත් මේ ඇමතිවරයාලු; පක්ෂයට වියදම් කළේත් මේ ඇමතිවරයාලු. එහෙම නම්, දූෂණය කියන එකේ හිණිපෙත්තට ගිය කෙනෙකු තමයි ඇමති කරලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ ආණ්ඩුවේ වැඩිම මුදල් ගනුදෙනු සිදු වෙන්නේ බලශක්ති අංශයේයි. ඉන්ධන ටික ගෙනෙනවා, ගල් අඟුරු ටික ගෙනෙනවා, ගෑස් ටික ගෙනෙනවා. ඒකෙන් හොඳට රිංගන්න පුළුවන් මිනිහෙකුට තමයි මේ කටයුත්ත භාර දීලා තිබෙන්නේ. අපි අහනවා, මේ ඇමතිවරයා රුසියාවට ගියේ ඇයි කියලා. ගනුදෙනුව ගැන කථා කරන්නද ගියේ? රහස් සාකච්ඡාවකටයි ගියේ. මම කියනවා, මේවාට උත්තර දෙන්න කියලා. ගල් අඟුරු පටවන්නේ දකුණු අප්‍රිකාවෙන්. ඒ රටේ ඕනෑ තරම් පරීක්ෂණාගාර තිබෙනවා. ඉන්දුනීසියාවේ lab එකකිනුයි ඒකේ පරීක්ෂණ වාර්තාව ගන්නේ. ඒකෙන්ම හොරකම පෙනෙනවා නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ lab එකත් පිළිගත්තේ නැති lab එකක්. එන්න එන්නම මේ හොරකම හැම පැත්තෙන්ම ඔප්පු වෙනවා. නමුත්,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

කරනවා. එදා ජනාධිපතිතුමා ආපු වෙලාවේ, මේ ගැන කථා කරන මන්ත්‍රීවරයෙකු එනකල් ජනාධිපතිතුමා හිටියාලු. ඉඳලා කිව්වාලු, "නැහැ, මන්ත්‍රීතුමා. මේකේ හොරකමක් නැහැ" කියලා. ජනාධිපති තවත් ඒක වහන්න යනවා. මම නලින්ද ජයතිස්ස ඇමතිතුමාට එක කාරණයක් කියනවා. මා, අපේ විපක්ෂ නායකතුමා ඇතුළු අපි හිටපු 2015-2019 ආණ්ඩුව කාලයේ අපි ඒ ටෙන්ඩර්වලට අදාළ කටයුතු ටික හරියට කළා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
හරියටම කළා.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ඔව්, හරියටම කළා. ගරු නලින්ද ජයතිස්ස ඇමතිතුමනි, තමුන්නාන්සේගේ කථාවේදී කියැවුණේ නැහැ, ඒවායේ වැරැදි තිබෙනවා කියලා. අපි කියමුකෝ, 2010-2015 කාලයේ වැරැදි වෙලා තිබෙනවා කියලා. ඒ නිසා තමයි, ඒවා අල්ලන්න කියලා තමුන්නාන්සේලාට ආණ්ඩු බලය දුන්නේ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
2015-2019 කාලයේ ඒ කටයුතු හරියටම කළා.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ඔව්, 2015-2019 කාලයේ ඒ කටයුතු හරියටම කළා. මා ළඟ මේ වාඩි වෙලා ඉන්නේ, ඒ කාලයේ එම විෂය භාරව හිටපු නියෝජ්‍ය ඇමතිතුමා. තමන්ගේ එකා හොරකම් කළාම තමුන්නාන්සේලාට දැනුයි මතක් වෙන්නේ, "අන්න අරුනුත් හොරකම් කළා. අපිත් හොරකම් කරනවා" කියලා. Spot tender එකෙන් පාඩුව තවත් වැඩි වෙලා. ඒක කාටද දෙන්නේ? ධම්මික පෙරේරාට. ධම්මික පෙරේරා කියන්නේ, තමුන්නාන්සේලාගේ පක්ෂය ගෙන යන්න ගොඩක් උදව් කරපු කෙනෙක්. ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමනි, කීයක් පාඩු වෙනවාද, ඒකෙන්?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
බිලියන 4ක් පාඩු වෙනවා.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
හැබැයි, මිත්‍රයන්ට සලකන්නේ නැහැ කිව්වා; යාළු මිත්‍රයන්ට සලකන්නේ නැහැ කිව්වා. දැන් ධම්මික පෙරේරාට සලකලා තිබෙනවා. කන්ටේනර් 323 අතරේ බස්නාහිර පළාතේ ආණ්ඩුකාරයාගේ කන්ටේනර් කිහිපයකුත් තිබුණු බව කියනවා. ඔන්න, මිත්‍රයන්ට සලකන හැටි. තමුන්නාන්සේලා ජන වරම ගත්තේ, පැවැති ආණ්ඩු අවුරුදු 76ක් හොරකම් කළා කියලායි. ඒ අවුරුදු 76 තුළ කාට හරි දූෂණ චෝදනා තිබෙනවා නම් ඒ අය අල්ලන්න ඕනෑ. අපි ඉන්නවා එතැන. අපි තමයි දූෂණ විරෝධී පනත පාර්ලිමේන්තුවට ගෙනාවේ, පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් විධියට. අපි කියනවා, දූෂිතයන් අල්ලන්න අප ඕනෑම වෙලාවක අත ඔසවලා සහයෝගය දෙනවා කියලා. හැබැයි, තමුන්නාන්සේලා අල්ලපු එවැනි එක්කෙනෙක් ගැන හෝ කියන්න බලන්න.

හැම දාම කථා කරනවා, මහ බැංකු හොරකම ගැන. කෝ, පරීක්ෂණ? වග කිව යුත්තන් අල්ලලා එය ඔප්පු කරන්න. ජනතාවට හොරු අල්ලන බව කියලා නේ, ඔබතුමන්ලා බලයට ආවේ. හොරු අල්ලන බව ජනතාවට කියලායි ඔබතුමන්ලා බලයට ආවේ. හොරකම් කරන්න නොවෙයි ජනතාව බලය දුන්නේ. ජනතාව තමුන්නාන්සේලාට උත්තරය දෙයි. ඒක තමයි තමුන්නාන්සේලා බය, පළාත් සභා මැතිවරණය තියන්න. අපි දැක්කා, පළාත් සභා මැතිවරණය පැවැත්වීම ගැන සොයන්න පාර්ලිමේන්තුවේ විශේෂ කාරක සභාවක් පත් කරලා තිබෙනවා. එහි සභාපති බලන්නේ පළාත් සභා මැතිවරණය කල් දමන්නයි. ඇයි ඒ? තමුන්නාන්සේලාගේ හොරකම් අහුවෙනවා නේ. අපි කියනවා, ආණ්ඩුවේ මේ හොරකමට මේ ඇමතිවරයා විතරක් නොව

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

මේක හංගන්න යනවා. ජනාධිපතිගේ මිත්‍රයා ආරක්ෂා කරනවා.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

දන්නේ නැහැ. කථා කරන්න දක්ෂ වුණාට වැඩ කරන්න දක්ෂ නැහැ. කරුණාකර මේ හොරකම අල්ලන්න කියලා අපි ඉල්ලා සිටිනවා.

නලින්ද ජයතිස්ස ඇමතිතුමාට අපි මේ කාරණයත් කියනවා. එතුමා මේ ඇමතිවරයාව බේරෙන්න බැලුවා. නමුත්, බේරන්න බැරි වුණා. ඒ කරපු කථාවේ ඇති දෙයකුත් නැහැ. එතුමා විගණකාධිපති වාර්තාව ගැන වචනයක්වත් කිව්වාද? ඒකේ තිබෙන දේවල් බොරු කියලා කිව්වාද? ඒ වාර්තාවෙන් පෙන්වනවා, මේ ඇමතිවරයා ලෝක හොරකමක් කරලා

[ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා]

තිබෙනවා කියලා; තමුන්නාන්සේලාගේ ආණ්ඩුව ලෝක හොරකමක් කරලා තිබෙනවා කියලා.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ලෝක හොරකමක් කරලා තිබෙන්නේ. පසුගිය අවුරුදු 78 රටේ වෙච්ච ලොකුම හොරකම මේ ගල් අඟුරු හොරකමයි කියලා ප්‍රකාශ කරමින් මම නවතිනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Ravindra Bandara. You have ten minutes.

[අ.භා. 12.13]

**ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දවසේ මේ කථා කරන දේවල් දිහා බැලුවාම කිව යුතු කාරණා කීපයක් තිබෙනවා. විපක්ෂය මේ කාරණය හඳුන්වනවා "ගල් අඟුරු වංචාව" කියලා. මම කරුණු එකින් එක පැහැදිලි කරන්නම්. දැන් කිහිප වතාවක් කියැවුණා - පසුගිය දවස්වල මාධ්‍යවලත් ගියා, මේ දැනුත් පුන පුනා කියනවා - ලියාපදිංචි නැති සමාගමකට එම ටෙන්ඩරය දුන්නා කියලා. මම හිතන විධියට, ඒගොල්ලන් මේ කාරණා හරියට කියවලා නැහැ. මේ විගණකාධිපති වාර්තාවේම තිබෙන එක කතන්දරයක් අරගෙන තමයි අගෝස්තු 18වන කොට ගෙවලා නැහැ කියන්නේ. ඇත්තම කාරණය අගෝස්තු 18වන දා ගෙවලා තිබෙනවා. කවුරුවත් හිතන්න එපා අපි මේ කවුරු හරි වෙනුවෙන් පෙනී ඉන්නවා කියලා. රජය ලෙස අපි මොනම කොම්පැනියක් වෙනුවෙන්වත් පෙනී ඉන්නේ නැහැ. අපි නිවැරැදි ක්‍රියාවලිය තුළ තමයි යන්නේ. ඒ අය ගෙවන්න ඕනෑ ඩොලර් 5,000 මුදල 18වන දා ගෙවලා තිබෙනවා. යම්කිසි බැංකු ක්‍රියාවලියකදී ඩොලර් 20ක් අය කර ගන්න තිබිලා තියෙනවා. ඒක ඊට පහුවදා දීලා තිබෙනවා. ඒක 22 දැනුම් දීලා තිබෙනවා. හරි, එතැන ගැටලුවක් තිබෙනවා කියමුකෝ. නමුත් කාරණාව හරියට කියවලා බලන්න. මේ විගණකාධිපති වාර්තාවේ 486වැනි පිටුවේ කාරණාව ඉතා පැහැදිලිව කියනවා. එහි අන්තිම කොටස විතරක් මම කියවන්නම්, I quote:

> "…them that any coal supplier will not be eligible for bidding without being registered by paying USD 5000 before the submission of the bid."

Bid එක submit කරන්න කලින් තමයි ගෙවන්න ඕනෑ. එහෙම බැලුවාම, මේක එන්න ඕනෑ අගෝස්තු 18වන දා නොවෙයි. දින 21 සහ 28 බැලුවාම සැප්තැම්බර් 18වන දාට කලින් තමයි ගෙවන්න ඕනෑ. ඒ නිසා අපි ඔය මහත්වරු ඔක්කෝටම කියනවා; ලියාපදිංචි - register - වෙලා නැහැ කියලා මාධ්‍යවලට සහ මෙතැනදී කියන අයට අපි කියනවා, විගණකාධිපති වාර්තාවේ 486වන පිටුව පෙරළා බලන්න කියලා. ඒක highlight වුණේ නැත්තේ ඇයි, ඒක ඉස්සරහට ආවේ නැත්තේ ඇයි කියන එක ගැටලුවක්. ඒක අපටත් ගැටලුවක්. මේ වාගේ ලොකු ප්‍රකාශනයක තිබෙන වගන්ති එකින් එක එකින් එක කියෙව්වොත් තමයි ඒ දේවල් පෙනෙන්නේ. ඒ නිසා විපක්ෂයේ ඒ තර්කය පුස්සක්.

අනෙක් අතට, ලියාපදිංචිය ගැන නොවෙයි නේ එතැන කියන්නේ. ඒ ඩොලර් 5,000 ගෙවීම පිළිබඳවයි කියන්නේ. ඒ ඩොලර් 5,000 මුදල 18වන දා ගෙවන්න ඕනෑ කිව්වා. ඩොලර් 20ක අඩුවක් තිබෙනවා. බැංකුව ඩොලර් 20ක් එතැනදී කපාගෙන තිබෙනවා. හරි, ඒක පැත්තක තියන්නකෝ. විපක්ෂයේ අය හරි ලස්සනට කථා කරනවා. ඒ කථා කරන දේවල් අතර ඔය කථාවත් කියනවා. අපි දැන් දැක්කා, විරෝධතාත් පවත්වනවා. පළමුවෙන්ම කියන්න තිබෙන දේ තමයි මෙතැන අවුලක් නැති බව. ඒක අපි කවුරුත් දන්නවා. එහෙම අවුලක් නැහැ. අවුල තිබුණේ අතීතයේ. ඒ අවුල ගැන කියන්න පුළුවන් නිසා තමයි අපි මේ විවාදයට ගොඩක් කැමැති. එතකොට තමයි මේ ගොඩක් දෙනාට මේක අපහසුවෙන් හරි අහගෙන ඉන්න වෙන්නේ. මොකද, එහෙම අපේ දේශපාලන ව්‍යාපාරය තුළ එහෙම අවුල් තිබුණු අයට වෙච්ච දේවල් අපි දන්නවා. හිටපු මන්ත්‍රීවරු මන්ත්‍රීකමෙන් පවා අයින් කරලා තිබෙනවා. ඒ වාගේම තමයි ජනප්‍රිය නායකයෝ හිටියා. ඒ කාලයේ ජනප්‍රිය - දැන් කුල්ල කුජීත වෙලා ඉන්නේ - ලී ක්වාන් යූලා, මහතීර් මොහොමඩ්ලා ගෙනැල්ලා රට හදන්න ගිය අය. ඒගොල්ලන් පවා අයින් කළා. ඒ සියලු දේවල් එක්ක, අතීත අත්දැකීම් එක්ක ඉතාම හොඳට, නිවැරදිව ඒ process එකේ තමයි අපි යන්නේ. ඒ නිසා තමයි දැවැන්ත කැප කිරීමක් කරලා මේ හැම දේම කරන්නේ. අපේ පෞද්ගලික දේවල් කැප කරලායි අපි මෙතැන ඉන්නේ. එක දශමයක හරි කොස්සක් තිබෙනවා නම් අපි එතැන ඉන්නේ නැහැ. ඒ වාගේම එක දශමයක හරි කොස්සක් තිබෙනවා නම් ඒ අදාළ අයට දඬුවම් දෙනවා. ඒ වෙනුවෙන් පක්ෂයවත්, අපිවත් - අපි කවුරුත් - පෙනී ඉන්නේ නැහැ කියන එකත් කියනවා.

දැන් කථා කළා නේ මහත්මයෙක් මේ යෝජනාව වෙනුවෙන්, නේද? අර "Mr. Footnote" හැම දාම කියනවා. එයා හැම දාම කියන දේ ගැන මම කියන්නම්. එයා හරි ශුද්ධවන්ත විධියට කියන්නේ. එයා මේ ක්ෂේත්‍රයේ රාජ්‍ය ඇමති විධියට කාලයක් සිටියා. මා ළඟ ලේඛනයක් තිබෙනවා, 2015ට අදාළ. අපේ නලින්ද ජයතිස්ස ඇමතිතුමාත් මේ ගැන කිව්වා. මේ තිබෙන්නේ, නැව් 18කින් අය කරගන්න ඕනෑ මුදල්. දැන් ඒ නඩු ක්‍රියාත්මක වෙනවා. ඒක තමයි මේගොල්ලන්ට හරි වේදනාවක් දැනෙන්නේ. ඒ නඩු ක්‍රියාත්මක වෙනවා. ඩොලර් මිලියන 1.5ක් මෙහි ගණන හැටියට සඳහන් වෙනවා. තවම ඒ නඩුව යනවා, ඩොලර් මිලියන 1.5ක. මෙහි තොරතුරු තිබෙනවා, කොහොමද fly ashවලින් එන්න ඕනෑ ගණන, සල්ෆර්වලින් එන්න ඕනෑ ගණන කියන ඒ සියල්ල. ඉතින්, අපි ඉස්සරවෙලා අහනවා, ඒවා රජයට අහිමි වීම, රටට අහිමි වීම පිළිබඳව. ඒ වාගේම ඒගොල්ලන් මුලින්ම meetingsවලට ආවාම කිව්වේ මොනවාද? මේවා බාල ගල් අඟුරු කිව්වා. ඒ බාල ගල් අඟුරුවලට, ප්‍රමිතිය යම් ප්‍රමාණයක් අඩු ඒවාට ගන්න ඕනෑ ක්‍රියාමාර්ග තිබෙනවා. අතීතයේත් මෙහෙම වෙලා තිබෙනවා. අතීතයේ එහෙම ගහපු දඩ ප්‍රමාණ මම කියන්නම්. හැබැයි, එතැන නොවෙයි ප්‍රශ්නය තිබෙන්නේ. එච්චර අත්දැකීම් තිබෙන, ඇමති ධුර දරපු අය කියන්නේ මොනවාද? මේ ගල් අඟුරු කුඩු ටර්බයින්වලට ගිහින් ටර්බයින් සවුත්තු වෙන විධියට තමයි ඒගොල්ලන් කථා කළේ. අන්න එහෙම තමයි ඒගොල්ලන්ගේ දැනුම තිබුණේ. මේවා රත් කරලා, ජලය වාෂ්ප කරලා යන්න තිබෙන ඒ procedure එකවත් දන්නේ නැහැ. ඒ වාගේම තමයි, එතුමා තව ලොකු කථාවක් කියනවා. එතුමා විතරක් නොවෙයි, තව ගොඩක් අය කියනවා, සූර්ය බලය හින්දා තමයි මේ ගේම ගොඩ යන්නේ කියලා. සූර්ය බල සංග්‍රාමය අපි තමයි කළේ කියනවා. ඒ වාගේම කියනවා, වහල මත තිබෙන සූර්ය පැනල, ඒ වාගේම ground-mounted solar panels අපේ රජය ඇවිල්ලා අධෛර්යවත් කළා කියලා. මා ළඟ තිබෙනවා, ඊට අදාළ chart එක. මම මේක **සභාගත*** කරනවා.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ඉතිහාසයේ වැඩිම ප්‍රමාණයක් පුනර්ජනනීය විදුලිය එකතු කළේ පසුගිය අවුරුද්දේ. රටට වැඩිම විදේශ ප්‍රේෂණ ගෙනාවා වාගේම, වැඩිම අපනයන ආදායම ගෙනාවා වාගේම, වැඩිම සංචාරක ආදායම ගෙනාවා වාගේම, පුනර්ජනනීය බලශක්තියත් වැඩියෙන්ම ගෙනාවේ පසුගිය අවුරුද්දේ. ඒ අයට අර වාගේ කතන්දර කියන්න පුළුවන්. නමුත්, ක්‍රියාත්මක වීමේදී පසුගිය වසර තුළ පුනර්ජනනීය විදුලි නිෂ්පාදනය මෙගාවොට් 1,000කින් වැඩිවෙලා තිබෙනවා. ඒ කියන්නේ, 2024 වෙනකොට මෙගාවොට් 2,347ක් තිබුණු එක 2025 වෙනකොට මෙගාවොට් 3,387ක් වෙලා තිබෙනවා. පසුගිය අවුරුදු 18ටම මෙගාවොට් දෙදහස් ගණනක් වෙනකොට, අපි එක අවුරුද්දකින් ඒක මෙගාවොට් 1,000කින් ඔසවනවා. ඉතින්, මේ ඉදිරිපත් කරන චෝදනා හරිද? ඒ චෝදනා කොහොමද ඉදිරිපත් කරන්නේ, පුනර්ජනනීය බලශක්තිය අධෛර්යවත් කරන ගමන්? වඩාත්ම වේගයෙන් මේක ඉස්සරහට ආවේ මොන අවුරුද්දේද කියලා මේ ප්‍රස්ථාරය ගත්තාම ඉතාම පැහැදිලිව පෙනෙනවා. ඒ සංඛ්‍යාලේඛන සියල්ල ඉදිරිපත් කරන්න පුළුවන්. හැබැයි, ඒගොල්ලන් ඔය සූර්ය බලශක්තිය ගෙනාපු විධිය තමයි අවුල. මේ රට තුළ දැන් කිසිම විදුලිය කැපීමකින් තොරව මේ බලශක්ති සුරක්ෂිතතාව ඇති කරන්නේ මේ රජය ගත් ක්‍රියාමාර්ග හින්දා. මෙගාවොට් 1,000ක් වැඩි කරගෙන - මෙගාවොට් දෙදහස් ගණනක් තිබුණු එක 1,000කින් වැඩි කර ගෙන - තිබෙන නිසා තමයි අපි අද බය නැතුව කියන්නේ, විදුලි කප්පාදුවක් සිදු වෙන්නේ නැහැ කියලා.

දැන් සූර්ය බලයෙන් නිපදවන විදුලිය පද්ධතියට එකතු කරනවා. ඒක හොඳයි. ඒ එකතු කරන ඔක්කොම - සූර්යබල සංග්‍රාම - වාගේ ඒවා, මේවා කරනකොට, නොයෙකුත් කථා කියනවා. අපි කවුරුත් දන්නා දේ තමයි, ලෝකයම දන්නා දේ තමයි දිවා කාලයේ තමයි ඒ ටික එකතු වන්නේ කියන එක. ඒක රාත්‍රියටත් යොදා ගන්නා ක්‍රම තිබෙනවා. අනෙක් රටවල ඒවා වර්ධනය කළාට ලංකාවේ battery systems හඳුන්වා දුන්නේ නැහැ. ඒ වාගේම තමයි, pumped storage ක්‍රම නැහැ. අනික් එක තමයි අපි දන්නා හැටියට, Control Room එකේ ඉන්න ඉංජිනේරුවෝ දැඩි අපහසුතාවකට පත් වෙනවා මේ system එක stableව තබාගැනීමේදී. මේක ඉල්ලුම සැපයුම මත වන දෙයක්. එය 50 Hzවල රඳවාගන්න ඕනෑ. එතකොට සූර්ය බලය වාගේ දේවල් එනකොට, ඒකට battery systems වාගේම, synchronous condensers වාගේ තාක්ෂණ ක්‍රම යොදාගෙන අර system එක balance කරන ක්‍රම හදන්න ඕනෑ. නමුත් ඒවා හැදුවේ නැහැ. ඒ නිසා තමයි තවමත් බයක් තිබෙන්නේ, මේක unstable වෙලා මුළු ලංකාවටම විදුලිය නැති වෙයිද කියලා. හැබැයි, ඒකට විසඳුම් තිබුණා. ඒවා ක්‍රියාත්මක කළේ නැහැ. ඒගොල්ලන් මොකද කළේ? ඒ කාලයේ ඩොලරයේ අගය වැඩිවෙලා තිබියදී, උපකරණ මිල වැඩිවෙලා තිබියදී ඒ ඒකකයකට රුපියල් 37 ගණනේ ගෙව්වා. එහෙම ගෙවන එක, ඒක සවිකරන අයට වාසිසහගතයි. හැබැයි, සමස්ත ජනතාවට අවාසිසහගතයි. ඒකත් කමක් නැහැ. ඒ ගිවිසුම අත්සන් කළේ, ඒගොල්ලන්ට මේ සම්බන්ධව කිසිම ව්‍යාපාරික අත්දැකීමක් නැහැ කියන එක කියන්නයි. මොකද දන්නවාද? අවුරුදු 30කට අත්සන් කරන්නේ. එතකොට බලන්න, බරපතළ අවුලක. දැන් අපි ආණ්ඩුව විධියට ඒ battery systems හඳුන්වා දෙමින් යනවා; pumped storage ක්‍රම සිදු කරගෙන යනවා. අපට විශ්වාසනීය විධියට බලශක්තිය දෙන්න පුළුවන් වෙන්නේ අන්න ඒ විධියට ක්‍රියාත්මක වීම තුළයි.

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම කියන්න ඕනෑ තවත් කාරණා කිහිපයක් තිබෙනවා. දැන් මේ අය කියන්නේ මොකක්ද? දැන් ඔය ටෙන්ඩරය දීලා, ඒක හරියට procurement process එකට යන එක නේ මෙයාලාට තිබෙන ප්‍රශ්නය. අතීතයේ මොකක්ද වුණේ? මීට කලින් වතාවේදී මොකද වුණේ? ටෙන්ඩර් පටිපාටියෙන් තොරව Potencia එකට දුන්නා. ටෙන්ඩරය දිනපු අය පැත්තක තියලා දුන්නා. එතකොට කථා කළේ නැහැ නේ. දැන් register වුණේ නැහැ කියනවා, දවසක් පහු වුණා කියලා ගෙවන්න. ඒකත් ගෙවලා තිබෙන්නේ. නමුත් ඒකේම කියනවා, ඒක ප්‍රශ්නයක් නැහැ කියලා. ඒක ගැන ප්‍රශ්න කරන අය tender procedure එකකින් තොරව Cabinet Papers දාලා තිබෙනවා. ඒක 2017දීත් වෙලා තිබෙනවා. පසුගිය කාලයේ වාගේම තමයි. මේ වෙනකොට පොහොට්ටුව පක්ෂයේ මන්ත්‍රීවරු තුන්දෙනෙක් පාර්ලිමේන්තුවේ ඉන්නවා නේ. එයින් දෙන්නෙක් මේ හැම ක්‍රියාවලියකටම සම්බන්ධයි; මේ මාෆියාව පිටුපස ඉන්නවා. ඒවා ආරක්ෂා කරන්න සමඟි ජන බලවේගයත් ක්‍රියා කරන එක තමයි පුදුමය. ඔය හිටපු රාජ්‍ය ඇමතිතුමා 2017දී, - මේ වෙලාවේ එතුමා මේ සභාවේ නැහැ - මෙන්න මෙවැනි කථාවක් කියලා තිබෙනවා. මේක 2017දී වෙන්නේ. පවිත්‍රා වන්නිආරච්චි ඇමතිවරිය හිටපු කාලයේ ඒ ටෙන්ඩරය දිනපු අය පැත්තක තියලා එවකට හිටපු මුදල් ඇමති බැසිල් රාජපක්ෂගේ මැදිහත්වීම මත වෙනත් සමාගමකට දුන්නා.

ඒ සම්බන්ධයෙන් අජිත් පී. පෙරේරා මැතිතුමා පාර්ලිමේන්තුවේදී මෙසේ කියා තිබෙනවා:

> "නමුත්, නොබෙල් සමාගමේ මැදිහත්වීම පිළිබඳ ප්‍රශ්නය ගරු මන්ත්‍රීතුමනි, හිටපු සභාපතිතුමාගේ ප්‍රශ්නයක්ම නොවෙයි. හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහත්මයාගේ කාලයේ නොබෙල් සමාගම මේ රටේ ගල් අඟුරු සැපයීමේ ඒකාධිකාරිත්වය හිමිකර ගත්තා. එතුමාගේ පුත්‍ර නාමල් රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමාගේ පාසල් මිත්‍රයෙක් - අවුරුදු 21ක තරුණ ළමයෙක් - ගල් අඟුරු සමාගමේ සභාපතිකමට පත් කරලා,.."

ඔන්න ඔහොම තමයි වැඩේ වුණේ. හොඳම විහිළුව තමයි අන්න එහෙම කථා කරපු අය, පසුකාලයේදී ඇමතිකමකුත් දරපු අය, මේ රට අවුලට පත් කරපු අය එක්ක දැන් එකතු වෙලා, මේ වැඩේ හරියට යනකොට මේ වාගේ විශ්වාස භංග යෝජනා ගෙනෙන එක.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Ravindra Bandara, your time is up now.

**ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)
මට තව පොඩි වෙලාවක් දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මේ රටේ ජනතාවට අපි ඉතා පැහැදිලිව මෙන්න මේ කාරණය කියනවා. එතුමන්ලා දැන් මේ සූත්‍ර වෙනස් කරලා පෙන්වනවා නේ. ඒ විධියට අය කර ගන්නවා නම්, අය කර ගන්න ගොඩක් මුදල් තිබෙනවා. Tender procedures නැතිව, ඒවා පැත්තකට දාලා කටයුතු කරපු කාලයක් තිබුණා. අපි විපක්ෂ මන්ත්‍රීවරුන්ටත් කියනවා, ඒ අතීතය ගැනත් හොයන්න කියලා. ඒ අතීතය හොයන්න. ඒක තමයි අද ගරු නලින්ද ජයතිස්ස ඇමතිතුමාත් කිව්වේ. ඔබතුමන්ලා මේ සියලු කාරණාත් එක්ක එන්න. මේ සියල්ල නිවැරදිව ගිය ක්‍රමයක් තුළ ඔබතුමන්ලා ප්‍රශ්න කරනවා නම් මේ ගල් අඟුරු බාලයි කියලා, මීට පෙර ගෙන්වපු සියලු ගල් අඟුරු ගැනත් සොයා බලා කථා කරන්න ඕනෑ.

දැන් ඔය එළියේ ඉඳන් අඬන, 2017ට කලින් ඇමතිකමක් දරපු කෙනෙක් ඉන්නවා නේ. එයාගේ කාලයේ ගල් අඟුරු නැව් 7ක් පිට පිට reject වෙලා තිබෙනවා. ඒවාට දඩ විධියට අය කරලා තිබෙන්නේ ඩොලර් ලක්ෂ තුනහමාරයි. දැන් නැව් 3කින් විතරක්

[ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා]

ඩොලර් මිලියන 12ක විතර දඩ මුදලක් අය කරලා තිබෙන වෙලාවක ඒ අය දැන් අඬනවා, කෑ ගහනවා. ඒ නිසා පැහැදිලිව මෙන්න මේ කාරණය අපට කියන්න පුළුවන්. හොරකම, වංචාව ආයුධයක් කර ගනිමින් කටයුතු කරපු අය දැන් කලබල වෙලා කෑ ගහනවා, අපි ඒ ක්‍රියාවලියෙන් මිදිලා ලස්සනට procurement process එකක් තුළ වැඩේ කරගෙන යනකොට. ඒ නිසා ඔබතුමන්ලා මේ ගැන නිවැරදිව දැනුවත් වෙන්න. ඔබතුමන්ලාගේ හැමදේම වාගේ මේකත් පෙරළා ඔබතුමන්ලාටම එන්න පුළුවන් කියන එක මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Chithral Fernando. You have six minutes.

[අ.භා. 12.33]

**ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මුළු රටම කථා කරන මාතෘකාවක් සම්බන්ධ මේ විවාදයට එක්වීමට ලැබීම ගැන මම සන්තෝෂ වෙනවා.

අද මේ විශ්වාස භංග යෝජනාව ගෙනෙද්දී, මෙතැන පාර්ලිමේන්තුව ඇතුළේ කිව්වේ නැතත්, මේ ආණ්ඩුවේ සල්ලිවලින් යැපෙන රුපියල් 35ට, 40ට comments ගහන ඩිජිටල් ත්‍රස්තවාදීන් ටික ගෙනෙන තර්කයක් මම දැක්කා. මම ඒක මුලින්ම කියන්න අවශ්‍යයි. "විපක්ෂයේ මන්ත්‍රීවරු 40ක්, 50ක් තියාගෙන මේ විශ්වාස භංග ගේන්නේ මොකටද, ආණ්ඩුව පැත්තේ මන්ත්‍රීවරු 159ක් ඉන්නවා. පුළුවන් නම් ඡන්ද 70ක්, 100ක් අරගෙන පෙන්වන්න" කියලා ඔවුන් කියනවා. අපි මෙන්න මේ කාරණයත් කියන්න කැමැතියි. ඇත්තටම අපි මේ විශ්වාස භංග යෝජනාව ගේන්නේ විපක්ෂයේ ඉන්න ගණන පෙන්වන්න නොවෙයි. කෙහෙළිය රඹුක්වැල්ල මැතිතුමාටත් අපි තමයි විශ්වාස භංග යෝජනාව ගෙනාවේ. එතකොටත් විපක්ෂයේ අපට තිබුණේ ඡන්ද 70ක් විතර. එතකොටත් ආණ්ඩුවට ඡන්ද 143ක් තිබුණා. අනුර කුමාර දිසානායක විතරයි ඒකට අත්සන් කරලා තිබුණේ නැත්තේ. මම හිතන විදියට එදා අපේ අග්‍රාමාත්‍යතුමියත්, විජිත හේරත් ඇමතිතුමාත් ඒකට අත්සන් කර තිබුණා. ඒ නිසා මම මේ කාරණයත් කියන්න කැමැතියි. කෙහෙළිය රඹුක්වැල්ලට විශ්වාස භංග යෝජනාව ගෙනා වෙලාවේත් ඔබ සියලුදෙනා අපිත් එක්ක එකතු වෙලා ඒ දූෂණයට විරුද්ධව සටන් කළා. අද නේ මේ ආණ්ඩුවේ ප්‍රශ්නය තිබෙන්නේ. එම නිසා ඒ ඩිජිටල් ත්‍රස්තවාදීන්ට මම මේකත් කියන්න ඕනෑ. අපි මේ විශ්වාස භංග යෝජනාව ගේන්නේ මේ හොරකම්වලට විරුද්ධ වෙන්න ඔයගොල්ලන්ටත් හෘදය සාක්ෂියක් තිබෙනවා ද කියලා බලන්නයි. මුලින්ම මම ඒක කියන්න කැමැතියි.

මේ ගල් අඟුරු බාලයි කියන එක පිළිගන්න මෙච්චර දුර ආවා. ජනාධිපතිවරයාටත් මෙතැනට ඇවිල්ලා කියන්න සිද්ධ වෙලා තිබෙනවා, "ගල් අඟුරු බාලයි" කියලා. ඒක කියන්න මෙච්චර කල් ගත්තේ ඇයි කියලා අපි අහනවා. කටේ කෙළ හිඳෙනකම් අපි ඒක කිව්වාම මුලින් පිළිගත්තේ නැහැ. හැබැයි, PUCSL වාර්තාවලින් පස්සේ, ගල් අඟුරු බාලයි කියන තැනට දැන් ඇවිල්ලා තිබෙනවා. "වංචාවක් වෙලා නැහැ" කියන තැන දැන් රැඳිලා ඉන්නවා. මෙහෙම යද්දී හෙට අනිද්දාට කියයි ද දන්නේ නැහැ, "චූටි වංචාවක් වුණා තමයි, මහ ලොකු එකක් නොවෙයි" කියලා. ඇත්තම කියනවා නම්, ඇමතිවරයාගේ කටින් ඒක දවසක් කියවුණාත් එක්ක. "මෙතැන මහ ලොකු වංචාවක් වෙලා නැහැ නේ, පොඩි එකක් නේ වෙලා තිබෙන්නේ" කියලා. නමුත් මේ තැනටවත් අද ඇවිල්ලා තිබෙන එක ගැන අපි සන්තෝෂ වෙනවා. මොකද, නැත්නම් ඒ තරමටවත් පිළිගන්නේ නැහැ. හෙට අනිද්දා වෙද්දී මේක සම්පූර්ණයෙන් පිළිගත්තාට පස්සේ පාරේ බැහැලා යන්න බැරි වෙන තත්ත්වයට පත් වෙනවාය කියලාත් මම මතක් කරන්න කැමැතියි.

මට මේ විනාඩි හය නම් මදි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒත් කමක් නැහැ. මට තව කරුණු කීපයක් කියන්න තිබෙනවා.

දැන් මේකේ ස්ථාවරය තමයි ගල් අඟුරු බාලයි කියන එක. හරි, ඒ ප්‍රශ්නය දැන් ඉවරයි. වංචාවක් සිද්ධ වෙලා නැහැ. එතකොට, අපි අහන්න කැමැතියි, මේ ලංසු කැඳවන දිනය වන විට ගාස්තු නොගෙවා ලියාපදිංචි නොවුණු සමාගමක් මේකට යොදා ගත්තේ ඇයි කියලා. මම කෙටියෙන් අහන්නම්කෝ. තමුන්නාන්සේලාගේ කථාවේදී මේවාට උත්තර දෙන්න. ඒක තමයි මට කියන්න තිබෙන්නේ. මොකද, කෙහෙළිය රඹුක්වැල්ල හිටපු ඇමතිතුමාට විරුද්ධව ඒ විවාදය පැවති වෙලාවේ, 2023දී හරිනි අමරසූරිය ගරු අග්‍රාමාත්‍යතුමිය ඉතා පැහැදිලිව මෙන්න මෙහෙම කියා තිබෙනවා. එතකොට එතුමිය විපක්ෂයේ මන්ත්‍රීවරියක්. එතුමිය මොකක්ද කියන්නේ? "මේ ඖෂධ ගෙන්වා තිබෙන්නේ ලියාපදිංචි නොවූ companies හරහායි. මේ සමාගම්වලට ගෙනෙන්න අවසර දීලා තිබෙන්නේ ලියාපදිංචි වෙච්ච සමාගම් තිබියදී." එතුමිය එහෙම කියා තිබෙනවා. ඊළඟට කියනවා, "Register නොවූ ව්‍යාපාරවලින් ඖෂධ 350ක් විතර ගෙනැල්ලා තිබෙනවා" කියලා. ඊළඟට එතුමිය විශේෂයෙන් කියනවා, "මාධ්‍ය කෙසේ කීවත් මේ වන විට Auditor-General's Report එකේත් පැහැදිලිව වාර්තා වෙලා තිබෙනවා, මේ වෙලාවේ ඖෂධ ගෙන්වා ගත්තේ ක්‍රියාපටිපාටිය උල්ලංඝනය කරමින්" යනුවෙන්. ඒ වෙලාවේ Auditor-General's Report එක හොඳයි; ඒ කියන්නේ, එතුමිය මෙන්න මේ හරියේ වාඩි වෙලා සිටිද්දී. දැනුත් මෙන්න Auditor-General's Report එක ඇවිල්ලා තිබෙනවා. දැන් මොකද කියන්නේ? දැන් මේ වාර්තාවට එකඟද, නැද්ද? අග්‍රාමාත්‍යතුමිය මේ අවස්ථාවේ සභාවේ නැහැ. නමුත් අපට උත්තර දෙන මේ අපේ පුස්තකාලවලින් අහනවා. මේකට දැන් එකඟද, නැද්ද, නලින්ද ඇමතිතුමා? නලින්ද ඇමතිතුමා මොකක්දෝ කථාවක්. මේ Auditor-General's Report එකේ මේවා තිබෙන්නේ. මේවාට උත්තර දෙන්න. මේක වංචාවක්ද, නොවෙයිද? ඊළඟට, සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ නිර්ණායක පිළිගත නොහැකි මට්ටම දක්වා ලිහිල් කර තිබෙනවා. මමද මේවා කියන්නේ? Auditor-General's Report එක කියන්නේ. අග්‍රාමාත්‍යතුමිය උත්තර දෙයි. ඊළඟට, "මිලියනය" කියන එක "ලක්ෂය" දක්වා අඩු කරලා තිබෙනවා. අපි හැමෝම දන්නවා, මේ අවශ්‍යතාව. මිලියනයක් තිබෙන්න ඕනෑ එක ලක්ෂය දක්වා අඩු කළා, අවශ්‍යතාවට. හැබැයි ඒකේ කියලා තිබෙනවා, "එවැනි ලිහිල් කිරීමක් සිදු කිරීමේ නීතිමය හෝ තාක්ෂණික පසුබිමක් නැත" කියලා. මමද කියන්නේ? Auditor-General's Report එක මේ කියන්නේ. ඒ නිසා, වංචාවක් සිදු වෙලා නැත්නම් ඒවාට උත්තර දෙන්න.

ඊළඟට, Load Port Report එක අරගෙන තිබෙන්නේ, බලපත්‍රය අවලංගු වෙච්ච සමාගමකින්. මේවාට පසුව උත්තර දෙන්න. මම ඉක්මනට කියාගෙන යන්නම්. ඒ වාගේම පළමුවැනියෙන්ම බාල ගල් අඟුරු නැව් තුනක් එද්දී, ඒ ගැන ආංශික අධීක්ෂණ කාරක සභාවෙන් කියද්දී අපිව පට්ට ගැහුවා. හැබැයි ඒ වෙලාවේ ඒක cancel කරන්න කටයුතු කළා නම්, මේ

ප්‍රශ්නය ඇති වෙන්නේ නැහැ කියලා මම හිතනවා. ඉතින්, වංචාවක් සිදු වුණේ නැත්නම් ඒක කළේ නැත්තේ ඇයි කියලාත් අපි අහනවා.

ඊළඟ කාරණය තමයි, අමාත්‍යාංශ ලේකම්තුමා අනුමත කරපු ප්‍රසම්පාදන ක්‍රමවේදය. ඒ වෙලාවේ spot tender එකකට යන්න තිබුණා. අපේ තිබ්බ ආණ්ඩු හැම එකක්ම spot tendersවලට ගිය ගමන් හොරකම, හොරකම කිය කියා හිටියා. Spot tenders, term tenders කියන දෙකම තිබෙන්නේ අවදානම අඩු කර ගන්න. එතකොට, ඒවා දන්නේ නැතුවද මේ අමාත්‍ය ධුරවලට ආවේ? ඒක කළේ නැහැ. අද වෙනකොට මේ බලශක්ති අර්බුදයට ඒක බලපා තිබෙනවා. එතකොට මොකක්ද කියන්නේ? ඒක වංචාවක් නොවෙයිද? මේ වෙනකොට ඩොලර් 98කට විතර ගන්න තිබ්බ එක දැන් හදිසියේ 142කට ගන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ පාඩුව පියවන්නේ කවුද? ඒක වංචාවක් නොවෙයිද කියලා මම අහන්න කැමැතියි. මේවායේ සඳහන්ව නැති වුණත්, ඇමතිතුමා රුසියාවට ගිහිල්ලා පොටෙන්ෂියා සමාගම හම්බ වුණාය කියලා මේ හැමෝම දන්නවා. ඔව්, හම්බ වුණාය කියලා නියෝජ්‍ය ඇමතිතුමා ඒක පිළිගත්තා, ටීවී එකේ දැක්කා. ටෙන්ඩර් එකක් අස්සේ එහෙම කළේ මොකටද? ඒ වෙනකොට ටෙන්ඩර් එක ලබා දුන්න Trident Chemphar Limited එකට 98ක් දෙද්දී පොටෙන්ෂියා සමාගමට තිබෙනවා, 99ක් හෝ 100ක්. ඩොලර් එකක් හෝ දෙකක් වැඩියි. එහෙම හරියටම වුණේ කොහොමද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේක කියන්නේ ඇයි දන්නවාද? මේ හදිසි ටෙන්ඩර් කැඳවීමේදී මෙට්‍රික් ටොන් ලක්ෂ 3 ගැනීමේදීත් මේ Trident Chemphar Limited එකටම ඉඩ දුන්නා පමණක් නොවෙයි. ඒකත්, ඊළඟට142කට තිබ්බ Taranjot Resources කියන සමාගමත් අතර ඩොලර් 30ක gap එකක් තිබුණත්, ඊළඟ ටෙන්ඩර් එක open කළාට පස්සේ මේ විධියටම ඩොලර් එකක් අඩුවෙන් නැවත email එකක් එවලා දාන්න හැදුවා. එතැනත් දූෂණයක් කරන්නයි හැදුවේ. මොකද, හැම වෙලාවේම ඩොලර් එකක වෙනස තියාගෙන මේ සමාගමට මේක ලබා දීලා තිබෙනවාය කියන එක අපට ඉතාම පැහැදිලිව පේන්න තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Chithral Fernando, your time is up now.

**ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
මට තව විනාඩියක් විතර ගන්න පුළුවන්ද, ගරු නියෝජ්‍ය කථානායකතුමනි?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
We have to suspend for lunch, Hon. Member.

**ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
මට තත්පර 30ක් දෙන්න.

ඉතින් මේ සැපයුම්කරුවන්ට මේකට සුදුසුකමක් නැති බව තමයි විශේෂයෙන්ම කියන්න තිබෙන්නේ. අද කෝප් කමිටුවෙන් මේක හෝදන්න හදනවා. මම හිතන්නේ නැහැ, හෝදන්න හම්බ වෙයි කියලා. ඊයේ දවසේ කෝප් කමිටුවට Lanka Coal Company එකේ සභාපතිතුමාවත් ආවේ නැහැ; හැංගිලා ඉන්නේ. Lanka Coal Company එකේ සභාපති හැංගිලා ඉන්නේ. අද අමාත්‍යවරයා උත්සාහ කරනවා, Lanka Coal Company එකේ GMවත්, එහෙම නැත්නම් Director Board එකවත් අල්ලලා දීලා බේරෙන්න. නමුත් මේකෙන් බේරෙන්න හම්බ වෙන්නේ නැහැ කියන එක අපි කියන්න අවශ්‍යයි.

අවසාන වශයෙන් මට මේ කාරණය කියන්න දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. පාර්ලිමේන්තුවේ හිටපු මහ ලේකම්තුමියක් වන වන ප්‍රියානි විජේසේකර මැතිතුමියගේ "ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු ක්‍රියාදාමය" පොතේ කියනවා, "අමාත්‍යවරයාට එල්ල වී ඇති විවේචන වෙනුවෙන් රජයට වී ඇති බලපෑම අවම කිරීම සඳහා ප්‍රඥා ගෝචර වශයෙන් අමාත්‍යවරයා ඉල්ලා අස් විය යුතුයි" කියලා. අවසාන වශයෙන් මම මේ කාරණයත් මතක් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එතුමාගේ නමේ හැටියටම පුණ්‍ය කියලා කැල්ලක් තිබෙනවා නේ. අද මේ තරුණ මන්ත්‍රීවරුන් අමාරුවේ දමන්නේ නැතුව පින් අයිති වෙයි, ඉල්ලා අස් වෙන්න කියලා අවසාන වශයෙන් මා එතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! The ongoing Proceedings of the House shall stay suspended till 1.00 p.m. for lunch.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නැවත පවත්වන ලදී.***
*அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப. 1.00 மணிக்கு மீண்டும் ஆரம்பமாயிற்று.*
*Sitting accordingly suspended till 1.00 p.m.and then resumed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Anura Karunathilaka. You have 15 minutes.

[අ.භා. 1.00]

**ගරු අනුර කරුණාතිලක මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுர கருணாதிலக்க - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சர்)
(The Hon. Anura Karunathilaka - Minister of Ports and Civil Aviation)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දවසේ පවත්වන මේ විවාදය ගොඩ නැඟෙන ප්‍රධාන කරුණු තුනක් තිබෙනවා කියලායි මට හිතෙන්නේ. එකක් තමයි, ගල් අඟුරු ප්‍රසම්පාදනය සඳහා ලියාපදිංචි නොවූ සමාගමකට ටෙන්ඩරය ප්‍රදානය කරලා තිබෙනවාද කියන එක. අනෙක් එක තමයි, ප්‍රමිතියෙන් අඩු ගල් අඟුරු පරීක්ෂා කිරීමේදී ඒ පරීක්ෂණාගාරය සඳහා ප්‍රතීතන - accreditation - බලපත්‍ර තිබෙනවාද කියන එක. ඊළඟට, ප්‍රමිතියෙන් අඩු ගල් අඟුරු භාවිත වීම නිසා මූල්‍යමය වශයෙන් සිදු වන අලාභය අය කර ගැනීම සඳහා තිබෙන ක්‍රමවේද මොනවාද කියන එකත්, ඒ සිදු වන පාඩුව ජනතාව මත පැටවෙන්න කටයුතු කරනවාද කියන එකත් මෙතැනදී විවාද වනවා.

අපේ ආණ්ඩු පක්ෂයේ වාගේම විපක්ෂයේ මන්ත්‍රීවරුන් බොහෝ අවස්ථාවලදී උපුටා දැක්වූයේ මේ අදාළ විගණන වාර්තාවයි. එම නිසා මම හිතුවා, මේ විගණන වාර්තාව මඟින්ම මේ කරුණු සනාථ කරගන්න එක වඩා සාධාරණයි කියලා. පළමුවැනි එක තමයි, නීත්‍යානුකූල නොවූ සමාගමකට ගල් අඟුරු

[ගරු අනුර කරුණාතිලක මහතා]

සම්පාදනය කිරීමේ ටෙන්ඩරය ප්‍රදානය කරලා තිබෙනවා කියලා විපක්ෂයේ මන්ත්‍රීවරුන් විශේෂයෙන් සඳහන් කිරීම. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සඳහා අවස්ථාව සැපයෙන්නේ විගණන වාර්තාවේ පිටු අංක 102, 6.1.3හි සඳහන් වන දේ අනුවයි. එහි එක් තැනක මෙසේ සඳහන් වනවා:

> "... 2025 අගෝස්තු 18 එනම් ලංසු කැඳවන දින වන විට නියමිත පරිදි ලියාපදිංචි ගාස්තු ගෙවා සමාගමෙහි ලියාපදිංචි නොවූ සැපයුම්කරුවකු බව විගණනයේදී නිරීක්ෂණය වූ අතර මෙම සැපයුම්කරුද ඇතුළත්ව.."

හැබැයි, මේ විගණන වාර්තාවේ මේ කොටස ලියනකොට ඒ අයට අමතක වුණු කරුණක් තිබෙනවා, එක් තැනක. මෙයට අදාළව එම විගණන වාර්තාවේ සඳහන් වෙන්නේ මොනවාද කියන එක පිටු අංක 486හි තිබෙනවා, I quote:

> "5.7 LCC mentioned that recently approved coal suppliers are still in the process of registering by making payment of USD 5000. SHLPC informed the LCC to inform them that any coal supplier will not be eligible for bidding without being registered by paying USD 5000 before the submission of the bid."

I emphasize, "before the submission of the bid."

2025 අගෝස්තු 18වැනි දා වනකොට මේ සමාගම ඩොලර් 5,000 ගෙවා නැති නිසා ඒ අය ලියාපදිංචිය සම්පූර්ණ නොකරපු සමාගමක් හැටියට කවුරු හරි කියනවා නම් ඒක සම්පූර්ණයෙන්ම වැරදියි, සාවද්‍යයි. ඉහළ ප්‍රසම්පාදන කමිටුව විසින් ඔවුන්ගේ වාර්තාවේ ඉදිරිපත් කරනවා, bid එක submit කරනකොට මේ මුදල් ගෙවා ලියාපදිංචිය සම්පූර්ණ කර තිබෙනවා නම් ඒක ප්‍රමාණවත් කියලා. කවුද, මේ කමිටුවේ ඉන්නේ? මෙතැන විශ්වාස භංගය ඉදිරිපත් කරලා තිබෙන්නේ ඇමතිවරයාට විරුද්ධව. හැබැයි, මේ තීරණය අරගෙන තිබෙන්නේ කවුද? මේ තීරණය අරගෙන තිබෙන්නේ Chairman. එම නිලධාරියා, පරිසර අමාත්‍යාංශයේ ලේකම්, ඒ වාගේම අනෙක් membersලා වන උදයංග හේමපාල, දිල්රුක්ෂි, කලංසූරිය, එදිරිසූරිය කියන මේ කිසිම කෙනෙක් දේශපාලනඥයන් හෝ දේශපාලනඥයන්ගේ නියෝජිතයන් නොවෙයි, රජයේ නිලධාරින්. මේක තමයි සාමාන්‍ය ක්‍රමවේදය. මේ සාමාන්‍ය ක්‍රමවේදය මත කටයුතු කරලා තමයි ඒ කමිටුව තීරණය කරන්නේ, bids submit කරනකොට අදාළ මුදල් ගෙවා ලියාපදිංචිය සම්පූර්ණ කර තිබෙනවා නම් ඒ අය ඒ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා සම්පූර්ණ වෙච්ච අය හැටියට. එම නිසා විපක්ෂය පුන පුනා නඟන තර්කය වන ලියාපදිංචි නොවූ සමාගමකට මේ ටෙන්ඩරය දීලා තිබෙනවා කියන එක අසත්‍යයක්, සාවද්‍ය ප්‍රකාශයක්. ඒ මත ගොඩනැඟෙන මේ විශ්වාස භංගයත් ඒ හා සමානව සාවද්‍යයි කියන එක තමයි මගේ අදහස.

මේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේ කිසිම තැනකට දේශපාලනඥයින් සම්බන්ධ වෙලා නැහැ, ඇමතිවරයා සම්බන්ධ වෙලා නැහැ. ඒ නිසා මේ තිබෙන තත්ත්වය සම්බන්ධයෙන්, පැන නැඟී තිබෙන ගැටලු සම්බන්ධයෙන් ඇමතිවරයාට දූෂණ චෝදනා එල්ල කිරීම සාධාරණ නැහැ කියන එකයි මගේ මතය. ඒ වාගේම සපයන ලද ගල් අඟුරුවල ප්‍රමිතිය පිළිබඳව ගැටලුවක් පැන නැඟිලා තිබෙනවා. මෙතැනදී විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් විසින් මතු කරන තර්කයක් තමයි, මේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී තත්ත්ව පරීක්ෂාව කරන ඉන්දුනීසියාවේ සමාගම accreditation ලබා ගත් සමාගමක් නොවෙයි කියන එක. මේ අවස්ථාවේ මෙතැන ඉන්න විපක්ෂයේ මන්ත්‍රීවරුන් පුළුවන් නම් කියන්න, ඒ සමාගම ප්‍රතීතන තත්ව සහතික බලපත්‍රය ලබාගෙන නැත්තේ කුමකටද කියලා. මගේ වෙලාවෙන් මම විනාඩියක් දෙන්නම්. විපක්ෂයේ ඉන්න මන්ත්‍රීවරුන් පුළුවන් නම් කියන්න, ඒ ඉන්දුනීසියානු සමාගමට මෙතැනදී තිබෙන කාර්යභාරය මොකක්ද, ඒ කාර්යභාරයට අනුව ඔවුන්ට accreditation certificate එක තිබෙනවාද, නැද්ද කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙකේ මෙහෙමයි තිබෙන්නේ. ප්‍රසම්පාදන ගිවිසුමෙහි 3.5.1 වගන්තිය අනුව පැටවීමේ වරායේදී සාම්පල කොටස් දෙකකට බෙදා ස්වාධීන පරීක්ෂකයෙකු යටතේ පරීක්ෂා කිරීම සඳහා යොමු කරවනවා. එතැනදී Trident Chemphar කියන සමාගම තමයි සැපයුම්කරු වන්නේ. ඒ අය සමාගම් තුනක් ඉදිරිපත් කරනවා, විකුණුම්කරු හැටියට අපේ Lanka Coal Company එකට. එතකොට ඒ සමාගම් තුනෙන් තත්ත්ව පරීක්ෂාව සඳහා; ප්‍රමිතිය පරීක්ෂා කිරීම සඳහා අපට සමාගමක් තෝරාගන්න පුළුවන්. ඒ අනුව Trident Chemphar සමාගම විසින් ඉදිරිපත් කරපු සමාගම් තුනෙන් Mitra SK - South Africa කියන සමාගම තෝරාගෙන තිබෙනවා. එය South African National Accreditation System පරීක්ෂණාගාර පහසුකම සහිත එකක් බව දකුණු අප්‍රිකාවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය 2025.12.08වැනි දා තහවුරු කරලා තිබෙනවා. ඒ නිසා ප්‍රමිතිය පරීක්ෂා කරන්නේ accreditation නැති සමාගමක් කියන එක සාවද්‍යයි. හැබැයි, මෙතැන තවත් කරුණක් තිබෙනවා. මම කලින් කියපු Mitra SK - South Africa සමාගමට තිබෙන accreditation එකෙන් අළුවල සංයුතිය පරීක්ෂා කිරීම ආවරණය වන්නේ නැහැ. ඒ නිසා ඔවුන් අළුවල අන්තර්ගතය, වාෂ්පශීලී ද්‍රව්‍ය - volatile matter - මැනීම සහ ඒවායේ තත්ත්ව පරීක්ෂා කිරීම සඳහා ඉන්දුනීසියාවේ සමාගමක් වන PT Mitra SK Analisa Testama Samarinda සමාගම යෝජනා කර තිබෙනවා. ගොඩක් අය මෙතැනදී කිව්වේ, ඒ ඉන්දුනීසියානු සමාගමට accreditation certificate එක නැහැ කියලායි. හැබැයි, 2025.12.12වැනි දා ඉන්දුනීසියාවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය සහතික කරලා තිබෙනවා, ඒ සමාගමට අදාළ තත්ත්ව පරීක්ෂාව සඳහා, ප්‍රමිතිය පරීක්ෂා කිරීම සඳහා accreditation certificate එක තිබෙනවා කියලා. එක පැත්තකින් ටෙන්ඩරය ලබා ගත් සමාගම ලියාපදිංචි නැහැයි කියන තර්කයත්, අනෙක් පැත්තෙන් ප්‍රමිතීන් පරීක්ෂා කරන සමාගම්වල accreditation certificate එක නැහැයි කියන තර්කයත් අමූලික බොරුවක්. ඒ නිසා ඒ මත ගොඩනැඟෙන අනෙක් සියලුම තර්කත් අසත්‍යයි කියලා තමයි අපට මේ අවස්ථාවේදී කියන්න වෙන්නේ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු ඇමතිතුමනි, මට කාරණයක් කියන්න අවසර දෙනවාද?

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
කියන්නකෝ බලන්න. Accreditation ගැන කියන්න. අනෙක් ඒවා ගැන කියන්න එපා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
හොඳයි. Accreditation ගැන තිබෙන්නේ, 2026.04.02 විගණන වාර්තාවේ 102 පිටුවේ 6.1.1 ඡේදයේ ඉඳලා පහළට තිබෙන ඡේදවල සහ 103 පිටුවේ 6.2.3 ඡේදයේ ඉඳලා පහළට තිබෙන ඡේදවල. රටේ විගණකාධිපති සියලුම ලේඛන පරීක්ෂා කරලා නිගමනය කරලා තිබෙනවා, accreditation නැහැ, තිබුණු ඒවා දෙසැම්බර් 31වැනි දා ඉවර වෙලා තිබෙනවා කියලා. එතකොට දැන් ඔබතුමා විගණකාධිපතිව අභියෝගයට ලක් කරනවාද? ඔබතුමාට තිබෙන සුදුසුකම මොකක්ද, විගණකාධිපතිව අභියෝගයට ලක් කරන්න? ඇයි එහෙම කථා කරන්නේ?

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
මේ විගණකාධිපති වාර්තාව මත පදනම් වෙමින් විතරයි මගේ කථාව මම ගොඩනඟන්නේ. ඒ නිසා අසත්‍ය කියන්න එපා. මම මේ සඳහන් කළ ඉන්දුනීසියානු සමාගම සම්බන්ධයෙන් 2025.12.12වැනි දින ඉන්දුනීසියාවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය නිකුත් කළ වාර්තාව පිළිබඳව මේ විගණකාධිපති වාර්තාවේ සඳහන් වෙනවා. ඒ නිසා මේ පාර්ලිමේන්තුවත්, පොදුවේ සමාජයත් නොමඟ යවන්න එපා, අසත්‍ය කරුණු ඉදිරිපත් කරලා. ඒ කරුණු ඉතා පැහැදිලිව මේ විගණකාධිපති වාර්තාවේ සඳහන් වෙනවා. ඒ නිසා කොහොමද කියන්නේ accreditation නැහැ කියලා?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බොරු කියන්න පුළුවන්; සාවද්‍ය කරුණු ඉදිරිපත් කරන්න පුළුවන්. හැබැයි, ඒ සාවද්‍ය කරුණුවලට ලොකු ආයුෂක් නැහැ. පැය ගණනක්, විනාඩි ගණනක් විතරයි ඒ බොරුවලට ආයුෂ තිබෙන්නේ. සත්‍යය කවදා හරි මතු වෙනවා; සත්‍යය කවදා හරි ජය ගන්නවා. හැබැයි, මේ සත්‍යය අද දවසේ මේ පාර්ලිමේන්තුව තුළදීම ජය ගන්න බව මේ කරුණුවලින් අපි පැහැදිලිව සනාථ කර තිබෙනවා.

ගල් අඟුරුවල ප්‍රමිතිය බාල වීම ඉතිහාසයේ පළමුවැනි වතාවට නොවෙයි මේ සිද්ධ වෙලා තිබෙන්නේ. ඒ නිසාම මේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ගිවිසුම්වලම සඳහන් වෙනවා, අන්න ඒ වාගේ වෙලාවක ප්‍රමිතියෙන් තොරව ගල් අඟුරු සැපයීම් කළොත් කොයි විධියටද අදාළ කටයුතු කරන්නේ කියලා. මම කලින් කිව්වා වාගේ හැම තිස්සේම මා උපුටා දක්වන්නේ මේ විගණකාධිපති වාර්තාවේ කරුණු විතරයි. මම මේ ගරු සභාවෙන් ඉල්ලනවා, විගණකාධිපති වාර්තාවේ පිටු අංක 37හි, වගුව අංක 14ට අවධානය යොමු කරන්න කියලා. එහි සඳහන් වෙනවා, ඒ වාගේ ප්‍රමිතියෙන් තොර ගල් අඟුරු සම්පාදනය වුණු අවස්ථාවකදී ගත හැකි පියවර මොනවාද කියලා. ඒ ගිවිසුමට මේ දේවල් ඇතුළත් කරන්නේ සැපයුමෙන් පසුව නොවෙයි. ඒ කියන්නේ, ඉතිහාසයේ අවස්ථා ගණනාවකදී ගල් අඟුරු සැපයුම්වල ප්‍රමිති පිළිබඳව ගැටලු පැන නැඟී තිබෙනවා. ඒ ගැටලු පැන නැඟුණු සමහර අවස්ථාවලදී අදාළ දඩ මුදල් අය කරගෙන තිබෙනවා. හැබැයි, සමහර අවස්ථාවලදී දඩ මුදල් අය කර ගැනීම සඳහා කටයුතු කර නැහැ.

මම කලින් සඳහන් කළා වාගේ, විගණන වාර්තාවේ පිටු අංක 37හි දළ තාපජනන අගයෙහි තිබෙන්න ඕනෑ මිනුම් ඒකකය, සම්මත අගය මොකක්ද, සල්ෆර් අන්තර්ගතයෙහි සම්මත අගය, තත්‍ය අගය තිබෙන්න ඕනෑ කොහොමද, අළු අන්තර්ගතය, තෙතමනය අන්තර්ගතය ආදී වශයෙන් අදාළ පිරිවිතර මොනවාද කියන එක ගැන ඉතා පැහැදිලිව එහි සඳහන් වෙනවා. ඒ වාගේම මේ පිරිවිතරවලින් අපගමනය වන අවස්ථාවේදී, ඒ පිරිවිතරවලට අනුකූල නොවන විධියට සැපයුම් ලැබුණු අවස්ථාවේදී අදාළ දඩ මුදල් අය කර ගන්නේ කෙසේද කියන එක සම්බන්ධයෙන් මේ විගණන වාර්තාවේ ඉතාම පැහැදිලිව සඳහන් වෙලා තිබෙනවා. එක පැත්තකින් අපි මේ ප්‍රමිති පිළිබඳව සහතික දැන් ලබා ගන්න කටයුතු කර තිබෙනවා. ඒ විතරක් නොවෙයි, මේ පිළිබඳව වැඩිදුරටත් සොයා බැලීම සඳහා ගොඩබෑමේ සහ පැටවීමේ අවස්ථාවේදී ලබා ගන්න සාම්පල පරීක්ෂා කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ වාගේම Bureau Veritas කියන සමාගම, ඕස්ට්‍රේලියානු සමාගමක්; මේ සම්බන්ධයෙන් ලෝකයේ ඉහළ පිළිගැනීමක් තිබෙන සමාගමක්. අන්න, ඒ සමාගමට අපි තවත් සාම්පලයක් යවලා තවදුරටත් මෙහි ප්‍රමිතිය පිළිබඳව පරීක්ෂා කරන්න කටයුතු කර තිබෙනවා. කිසියම් කෙනෙක් දූෂිත ගනුදෙනුවක යෙදෙනවා නම්, වංචා සහගත ගනුදෙනුවක යෙදෙනවා නම් මෙන්න මේ වාගේ තුන්වන ස්වාධීන ආයතනයකට මේ සාම්පල යවලා එහි ප්‍රමිතිය පිළිබඳ දත්ත ලබා ගන්න කටයුතු කරන්නේ නැහැ.

හොරෙක් කවදාවත් තමන්ගේ හොරකම හෙළිදරව් වෙනවා කියලා හිතලා ඒ අනුව වැඩ කටයුතු කරන්නේ නැහැ. රජය පැත්තෙන්, අමාත්‍යාංශය පැත්තෙන් සහ ගල් අඟුරු සමාගම පැත්තෙන් ඉතා පැහැදිලිව වංචාවක් සහ දූෂණයක් වෙනුවෙන් මැදිහත් නොවුණු නිසා තමයි කිසිම පැකිළීමක් නැතුව තුන්වන පාර්ශ්වයකට ඒ සාම්පල වැඩිදුර පරීක්ෂාව සඳහා යවන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට ලැබුණේ ඉතා සීමිත කාලයක් බව මම දන්නවා. නමුත්, මම අර කලින් සඳහන් කළා වාගේ එක පැත්තකින් ලියාපදිංචි, නීත්‍යනුකූල සමාගමකට විනිවිදභාවයෙන් යුතු tender procedure එකක් හරහා ගිහිල්ලා සැපයුම් ලබා දීම සඳහා අවස්ථාව දීලා තිබෙනවා. ඒ පිරිවිතරයන් පරීක්ෂා කිරීම සඳහා, ප්‍රමිතීන් පරීක්ෂා කිරීම සඳහා අවශ්‍ය accreditation සහතික තිබෙන සමාගම්වලට අනුව කටයුතු කර තිබෙනවා. හැබැයි, ඒ සමාගම්වලත්, ඒ වාගේම නොරොච්චෝලේ බලාගාරයේ තාක්ෂණික වාර්තාව අනුවත් මේ ප්‍රමිතීන් පිළිබඳව ගැටලුවක් පැන නැඟිලා තිබෙනවා. ඒ පැන නැඟුණු ගැටලු නිසා සිදු වූ පාඩුව මේ ගිවිසුම් ප්‍රකාරව අය කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග අපි අරගෙන තිබෙනවා. දැනටමත් අපි රුපියල් කෝටි 960ක් රඳවා ගෙන තිබෙනවා, මේ සමාගම්වලට ගෙවීම් නොකර ඉන්න. දැනට ඒ මුදල අපි රඳවා ගෙන ඉන්නවා. ඉදිරියේදී අපි හිතනවා, තවත් ප්‍රමාණයක් රඳවා ගන්න අපට පුළුවන්කම ලැබෙයි කියලා. ඒ නිසා ප්‍රමිතියෙන් තොර - ප්‍රමිතියෙන් අඩු - ගල් අඟුරු සැපයීම නිසා ඇති වූ පාඩුව අයකර ගැනීම සඳහා අපි රජයක් හැටියටත්, අමාත්‍යාංශයක් හැටියටත් නිවැරදි පියවර අනුගමනය කරමින් විශේෂයෙන් ප්‍රසම්පාදන ගිවිසුමේ තිබෙන පියවර අනුගමනය කරමින් කටයුතු කරනවා. ඒ හරහා ගල් අඟුරුවලින් ඇති වුණු පාඩුව ජනතාවට දරන්න අපි කිසිසේත්ම ඉඩ දෙන්නේ නැහැ. ඒ වාගේම රජයක් හැටියට විශේෂයෙන්ම දූෂණයට එරෙහිව කටයුතු කරන, ඒ වෙනුවෙන් පෙනී සිටින දේශපාලන ව්‍යාපාරයක් හැටියට කිසිම හොරකමක්, වංචාවක් යට ගහන්න, හොරෙක් ආරක්ෂා කරන්න අපි කටයුතු කරන්නේ නැහැ. අපිට විශ්වාස නිසා තමයි අපි මේ වෙනුවෙන් ඍජුව පෙනී සිටින්නේ කියලා අවධාරණය කරමින්, මම නිහඬ වෙනවා. මට මේ අවස්ථාව ලබා දුන්නාට බෙහෙවින්ම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Leader of the Opposition. You have 11 minutes.

[අ.භා. 1.17]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බලශක්ති ඇමතිවරයාට විරුද්ධව ඉදිරිපත් වූ විශ්වාස භංග යෝජනාව පිළිබඳව සාකච්ඡා කරන මේ අවස්ථාවේදී ඉතාම පැහැදිලියි, ගල් අඟුරු ක්ෂේත්‍රයේ නිකම් වංචාවක් නොවෙයි, බරපතළ වංචාවක් සිදු වෙලා තිබෙනවාය කියන කාරණය. ඒ බරපතළ වංචාව තමයි, ප්‍රමිතියෙන් තොර බාල ගල් අඟුරු ගෙන්වීම. මේ වංචා සහගත බාල ගල් අඟුරු ක්‍රියාවලියට අමතරව පුනර්ජනනීය බලශක්තියට විරුද්ධව රාජ්‍ය ප්‍රතිපත්තියකුත් ක්‍රියාත්මක වනවා. පුනර්ජනනීය බලශක්ති, සුනිත්‍ය බලශක්ති, - solar, hydro, wind - වැඩ පිළිවෙළට විරුද්ධව වැඩ පිළිවෙළක් මේ රජය ක්‍රියාත්මක කරනවා. එක පැත්තකින් තාප බලාගාර කේන්ද්‍රීය පුනර්ජනනීය නොවන බලශක්තිය ප්‍රවර්ධනය කරන ඉන්ධන මාෆියාවට තැන

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

ලබා දීලා, අනෙක් පැත්තෙන් පරිසර හිතකාමී අඩු පිරිවැය සහිත විදුලි බිල අඩු කරන පුනර්ජනනීය බලශක්ති නිෂ්පාදනය විනාශ කරන මේ කුමන්ත්‍රණය ඉතාම බරපතළයි. මේ සියලු කරුණු කාරණා මත අපි විශ්වාස කරනවා, බලශක්ති ඇමතිවරයා තවදුරටත් මේ තනතුරේ රැඳී සිටීම සදාචාරාත්මක නොවන බවට.

අපි දිගින් දිගටම බාල ගල් අඟුරු ගැන කථා කළා. සමගි ජන බලවේගය - සමගි ජන සන්ධානය - විපක්ෂයේ අනෙකුත් කොට්ඨාසවලටත් නායකත්වය ලබා දෙමින් අපි මේ තර්කය ඉදිරිපත් කරනකොට රජයේ වගකිව යුත්තන් -ජනාධිපතිවරයා ප්‍රමුඛ ඇමතිවරුන්- පෝලිමට ඇවිල්ලා කිව්වේ මොකක්ද? නැහැ, එහෙම ප්‍රශ්නයක් නැහැ, එහෙම බාල ගල් අඟුරු ප්‍රශ්නයක් නැහැ කියායි. හැබැයි, ප්‍රමිතියෙන් තොර බාල ගල් අඟුරු ප්‍රයෝජනයට ගන්නවා කියන එක දත්තවලින් ඔප්පු වනකොට කථාව වෙනත් අතකට හැරෙව්වා, ඔව්, ගල් අඟුරු නම් බාල තමයි, හැබැයි, වංචාවක් සිදු වෙලා නැහැ කියලා.

විශේෂයෙන්ම මේ අය දෙපැත්තකට බෙදිලා කරුණු කාරණා ඉදිරිපත් කරනවා. අභවලා කියන්නේ බොරුලු, අපි කියන්නේ සත්‍යලු. විශේෂයෙන්ම වාර්තාවලින් උපුටා ගන්න දත්ත කිහිපයක් ඉදිරිපත් කරලා රජය ඉදිරිපත් කරන තර්කය පදනම් විරහිතයි කියන කාරණාව පෙන්වා දෙන්න මම කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් මා ළඟ තිබෙනවා, මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ - PUCSL එකේ - වාර්තාව. මහජන උපයෝගිතා කොමිසමක් තිබෙන්නේ හැත්තෑපන් ලක්ෂයක් පමණ වන විදුලි පාරිභෝගිකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන්න. දැන් මේ වාර්තාවේ මොකක්ද කියන්නේ? මේ ගෙන්වපු බාල ගල් අඟුරු භාවිතය තුළ සම්පූර්ණ ජනනය ලබා ගන්නට බැහැයි කියලා කියනවා. මම කැමැතියි, මෙම වාර්තාව සභාගත කරන්න. මේ වාර්තාවේ තුන්වන පිටුවේ මේ ගැන කියනවා. දැන් මේක බොරුයි කියලා කවුද කියන්නේ? එහෙම නම්, මම රජයෙන් ඉල්ලීමක් කරනවා, කරුණාකරලා එතුමන්ලා කථා කරනකොට මේක බොරුයි කියලා කියන්න කියලා. මෙන්න, වාර්තාව. දැන් හැමෝම කියා ගන්නවා නේ තමන් කියන්නේ ඇත්ත, අභවල් අය කියන්නේ බොරු කියලා; විපක්ෂය කියන්නේ බොරු, රජය කියන්නේ ඇත්ත කියලා. සාමාන්‍ය ගල් අඟුරු දහන අනුපාතය පිළිබඳව මේ වාර්තාවේ තුන්වන පිටුවේ තිබෙනවා. මේ වාර්තාවෙන් කියන සාමාන්‍ය ගල් අඟුරු දහන අනුපාතය - Average Coal Consumption Rate එක - දිහා බැලුවාමත්, මීට පෙර ආයතන සපයපු ගල් අඟුරුවලින් ජනනය කළ විදුලිය තුළ, ඒ ගල් අඟුරු දහන අනුපාතය දිහා බැලුවාමත් ඉතා පැහැදිලියි මේවා බාලයි කියන එක. කවුද කියන්නේ, මේ වාර්තාව බොරුවක් කියලා? කරුණාකරලා කියන්නකෝ, බොරුයි කියලා. මේ, මහජන උපයෝගිතා කොමිසමේ වාර්තාව; පාරිභෝගිකයන් වෙනුවෙන් ඉදිරිපත් කරපු වාර්තාව. *[බාධා කිරීමක්]* ඔබතුමාගේ කථාවේදී කියන්න. මම කිව්වේ ඒකයි.*[බාධා කිරීම්]* කරුණාකරලා බාධා කරන්න එපා.

ඊළඟ කාරණාව, නිශ්චිත ගල් අඟුරු දහනය- *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Asitha Niroshana, you can speak later. You have a time slot.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නිශ්චිත ගල් අඟුරු දහනය - specific coal consumption - කියන කාරණාව මත මහජන උපයෝගිතා කොමිසම කියන කාරණාව බලන්න. ඒක බැලුවාමත්, ගෙනැල්ලා තිබෙන්නේ බාල ගල් අඟුරු. *[බාධා කිරීම්]* ඔච්චර කෑ කෝ ගහන්න එපා. කලබල වෙන්න එපා. ඔබතුමන්ලාගේ අවස්ථාවේදී උත්තර දෙන්න. *[බාධා කිරීම්]*

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
බොරු කියන්න එපා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
බොරු කියන්නේ නැහැ. මම මේ කියන හැම දෙයක්ම ඇතුළත් එම වාර්තාව මා **සභාගත*** කරනවා. *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Asitha Niroshana, you are listed to speak. You are the third speaker from now.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
පුළුවන් නම් බොරුයි කියලා පෙන්වන්න. *[බාධා කිරීම්]* එහෙම නම් ඉතින් ඔබතුමන්ලා කියන්න ඕනෑ, මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ - PUCSL එකේ - වාර්තාව බොරු කියලා. *[බාධා කිරීම්]* මොකද, ඔච්චර කලබල වෙලා. කෑ කෝ ගහන්න එපා. පොඩ්ඩක් සවන් දෙන්න. ඔච්චර තරහ ගන්නත් එපා. පොඩ්ඩක් සවන් දෙන්න. මේක බොරුද? බොරු කියලා කියන්නේ මොකක්ද? විශේෂයෙන්ම මේ නිශ්චිත ගල් අඟුරු දහනය, PUCSL වාර්තාවේ සඳහන් ඒ කාරණාව දිහා බලනකොටත් ඔප්පු වෙනවා, ගෙනාපු ගල් අඟුරු බාලයි, ප්‍රමිතියෙන් තොරයි කියන එක.

ඊළඟ කාරණාව මේකයි. විශේෂයෙන්ම GCV එක දිහා බලන්න. මම මේ කථා කරන්නේ PUCSL වාර්තාවෙන්. GCV එක බලන්න. මොකක්ද ඒකේ කියන්නේ? ගෙනාපු ගල් අඟුරුවල GCV එකත් බාලයි; ඒකත් අඩුයි; ඒකත් ප්‍රමිතියෙන් තොරයි. දැන් මේකත් බොරුයි කියලා කියනවාද? මහජන උපයෝගිතා කොමිෂන් සභා වාර්තාව බොරුද? විශේෂයෙන්ම මම ඒ කාරණාවත් ඉදිරිපත් කරනවා, ඔබතුමන්ලාට දැන ගන්න. මම මේ හැම දෙයක්ම සාක්ෂි සහිතව **සභාගත*** කරනවා.

ඊළඟට මේ වාර්තාවේ පස්වන පිටුවේ තිබෙනවා, පාවෙන අළු මුදා හැරීම පිළිබඳ දත්ත. ඒ වාර්තාව දිහා අපි පොඩ්ඩක් බලමු. මොකක්ද වෙලා තිබෙන්නේ? ඒ වාර්තාවෙනුත් පෙන්වන විධියට මේ ගෙන්වපු බාල ගල් අඟුරුවල පාවෙන අළු මුදා හැරීම තියෙන්නේ ඉතාම නරක අගයක් තුළ, මීට පෙර ගෙනාපු ගල් අඟුරු එක්ක සංසන්දනය කරනකොට. පාවෙන අළු - ඒවායින් - බැලුවාමත් ගල් අඟුරු බාලයි. මම නොවෙයි, මේ කියන්නේ. මහජන උපයෝගිතා කොමිෂන් සභා වාර්තාව.

ඒ වාගේම මහජන උපයෝගිතා කොමිෂන් සභා වාර්තාවේ අටවන පිටුවේ පැහැදිලිවම කියනවා, මේ නැව් 9කින් සිදු වුණු

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

අලාභය මිලියන 8,497යි - බිලියන 8.4යි - කියලා. ඒකත් බොරුවක්ද? මෙන්න වාර්තාව. ඒක බොරුද? මහජන උපයෝගිතා කොමිෂන් සභා වාර්තාව බොරුද? විශේෂයෙන්ම පාඩුව ගැන කියනවා.

ඒ වාගේම මහජන උපයෝගිතා කොමිසම කියනවා, ලක්විජය බලාගාරයේ පළමුවෙනි ඒකකය, දෙවෙනි ඒකකය, කෙරවලපිටිය බලාගාරය සහ කැලණිතිස්ස II බලාගාර නඩත්තුවට යම් කාලයකට ක්‍රියා විරහිත කරනකොට, විශේෂයෙන්ම රාත්‍රී කාලයේ, උපරිම ඉල්ලුම වෙලාවේ යම් අවස්ථාවකදී විදුලිය විසන්ධි කිරීමකට, එහෙමත් නැත්නම් විදුලිය කැපීමකට යොමු වීමට සිදුවන අවදානම තිබෙනවා කියලා. මේවා මම නොවෙයි කියන්නේ, මහජන උපයෝගිතා කොමිෂන් සභා වාර්තාව. මේ සියලු දේවල් දිහා බැලුවාම මොකක්ද පැහැදිලි වෙන්නේ? ඉතාම පැහැදිලියි මේ ගෙනාපු ගල් අඟුරු බාලයි, ගෙනාපු ගල් අඟුරු ප්‍රමිතියෙන් තොරයි කියන එක. දත්ත කේන්ද්‍රීයව, සාක්ෂි කේන්ද්‍රීයව හොඳට හිතලා බැලුවොත්, හොඳට හොයලා බැලුවොත් කවුද සත්‍ය ප්‍රකාශ කරන්නේ, කවුද බොරුව වපුරන්නේ කියන එක ඉතාම පැහැදිලිව තේරුම් ගන්න පුළුවන්.

ඊළඟට මම කියන්න කැමැතියි, ලියාපදිංචි නොවූ සැපයුම්කරුවන්ගේ ප්‍රශ්නය ගැන. මේක කියන්නේ අපි නොවෙයි, Audit Report එක. Trident Chemphar සමාගමට - ලියාපදිංචියක් නොතිබුණු සමාගමකට - ගිවිසුම පිරිනමලා තිබෙනවා. මේක විගණකාධිපති කියන්නේ. නීති විරෝධී ලංසු තැබීමක් කරලා තිබෙනවා. ලියාපදිංචිය තහවුරු කරන්න අපොහොසත් වුණු සැපයුම්කරුවන් තිදෙනෙකුට ලංසු ඉදිරිපත් කරන්න ඉඩ දීලා තිබෙනවා. ඉතින්, Audit Report එක වැරදිද? ක්‍රියාපටිපාටියේ දෝෂ තිබෙනවා. විශේෂයෙන්ම අදාළ සමාගම ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කිරීමටත් පෙර අගෝස්තු 18වෙනි දින ඔවුන් වෙත ටෙන්ඩර් ලේඛන යවා තිබෙනවා. කවුද මේවා කියන්නේ? විගණන වාර්තාව.

ඊළඟට, අනුමත නොකළ ගිවිසුම්. නීතිපතිවරයාගේ නිසි අනුමැතිය ලැබීමට පෙර 2025 නොවැම්බර් 19වන දින ගිවිසුම් අත්සන් කර තිබෙනවා. කවුද කියන්නේ? Auditor-General's Report එක කියන්නේ, අපි නොවෙයි. ඔබතුමන්ලාට කියන්න පුළුවන්, මහජන උපයෝගිතා කොමිෂන් සභා වාර්තාව වැරදියි, Audit Report එකත් වැරදියි කියලා.

ඊළඟට, අවලංගු බලපත්‍ර. ගල් අඟුරු නැව් 12ක් සඳහා ගුණාත්මක වාර්තා නිකුත් කරලා තිබෙන්නේ 2025 දෙසැම්බර් 29වන දින බලපත්‍රය අවලංගු කරන ලද ඉන්දුනීසියානු සමාගමක්; Mitra SK Analisa Testama Samarinda කියන ආයතනය. කවුද කියන්නේ? අපි නොවෙයි කියන්නේ Audit Report එක. පිළිගත් සහතිකයක් නොමැතිකම, නිසි ප්‍රතීතනයක් - accreditation එකක් - නොතිබුණු බව කවුද කියන්නේ? Audit Report එක කියන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Leader of the Opposition, you have exhausted your time.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Just give me one more minute, Sir.

දත්ත අතර පරස්පරතා තිබෙනවා කියලා කවුද කියන්නේ? Audit Report එක. ඒ විතරක් නොවෙයි. හදිසියේ සැපයුම් ලබා ගන්නට Taranjot Resources කියලා සමාගමක් හරහා හදිසි මිලදී ගැනීමක් කරලා තිබෙනවා. හැබැයි මීට පෙර ප්‍රමිතියෙන් තොර ගල් අඟුරු සපයපු සමාගමට තමයි හදිසි මිලදී ගැනීමත් ලබා දීලා තිබෙන්නේ.

අවසාන වශයෙන් මම මේ කාරණය කියන්න කැමැතියි. මේ ගල් අඟුරු දූෂණය, වංචාව තුළ අපේ රටේ බලශක්ති සුරක්ෂිතභාවය අහිමි වෙලා තිබෙනවා. අනිවාර්යයෙන්ම බලශක්තිය පවතින බව, ඒ කියන්නේ availability, ඒ වාගේම බලශක්තියට ප්‍රවේශය - accessibility, ඒ වාගේම දරා ගත හැකි මිලකට ලබා ගත හැකි බව - affordability - සහ පිළිගත හැකි බව - acceptability - තිබෙන්න ඕනෑ. Four "A"s - Availability, Accessibility, Affordability and Acceptability. මෙන්න මේ කරුණු කාරණා පිළිබඳව විශ්වාසයක් නැතිකම තුළ, විදුලි බිල වැඩිවීම තුළ - මේ ගල් අඟුරු වංචාව තුළ - අසහනයට, පීඩනයට, කම්පනයට පත් වෙන්නේ අපේ රටේ 75 ලක්ෂයක් වන විදුලි පාරිභෝගිකයින් බව මම ප්‍රකාශ කරන්න කැමැතියි. අපි ඉදිරිපත් කළ හැම කාරණාවක්ම කට කථාවක් නොවෙයි, දත්ත කේන්ද්‍රීයව ඉදිරිපත් කළේ, සාක්ෂි සහිතව ඉදිරිපත් කළේ. මේවා කට කථා නොවෙයි. පුළුවන් නම් කියන්න Audit Report එක වැරදියි, PUCSL වාර්තාව වැරදියි කියලා.

අපි ඒ දෙකම විශ්වාස කරනවා. ඒ දෙකම අනුව ගත්තත් අනිවාර්යයෙන්ම, නිශ්චිතවම ගල් අඟුරු වංචාවක් සිදු වෙලා තිබෙනවා කියන එක අපේ තර්කයයි. අපි එය පිළිගන්නවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Anuradha Jayaratne. You have eight minutes.

[අ.භා. 1.30]

**ගරු නීතිඥ අනුරාධ ජයරත්න මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அநுராத ஜயரத்ன)
(The Hon. Anuradha Jayaratne, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ බාල ගල් අඟුරු සම්බන්ධයෙන් අද දිනයේ අනුර කරුණාතිලක ඇමතිතුමා කථා කරද්දී කිව්වා, samples check කරන ආයතනයට accreditation තිබෙනවා කියලා. හැබැයි, මේ සහතිකය දීපු දිනයේදී ඒ කියන ආයතනයට accreditation තිබුණේ නැහැ කියලා, ප්‍රතීතනය පිළිබඳ සහතිකය තිබුණේ නැහැ කියලා Lanka Coal Company එකේ සභාපතිතුමා ඊයේ COPE එකේදී පිළිගත්තා; සභාපතිවරයා එය කෙළින්ම පිළිගත්තා. මේ කියන samples test කරපු ආයතනයට කිසිම විධියකින් accreditation නැහැ කියන එක ඒ සභාපතිවරයා COPE එකේදී පිළිගත්තා. සභාපතිවරයා COPE එකට ඇවිල්ලා එහෙම කිව්වත්, ගරු ඇමතිතුමා මෙතැනදී වෙනත් දෙයක් කියනවා. ඉතින් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තේරෙන්නේ නැහැ මේක මොන විධියට සුද්ද කරන්න හදනවාද, කවුරු සුද්ද කරන්න හදනවාද කියලා. ඒකේ වැරැද්දක් තිබුණා නම්, ඒ වැරැද්ද සොයා ගෙන අදාළ කණ්ඩායම්වලට හරි විධියට නීතිය හෝ අවශ්‍ය දේ ක්‍රියාත්මක කරනවා වෙනුවට එක එක්කෙනා මෙතැනට ඇවිල්ලා ඒක සුද්ද කරන්න උත්සාහ කරනවා කියන්නේ, මේක ඇතුළේ බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා කියන එකයි. මෙහි පාඩුව විතරක් ගත්තොත්, රුපියල් කෝටි 224යි. මේ විශේෂ විගණන වාර්තාවේ සඳහන් වෙනවා, අතිරේක බලශක්තිය අවශ්‍ය වුවහොත් ඒ අවශ්‍ය වන ප්‍රමාණය විතරක් කිලෝවොට් පැය හැත්තෑහයකෝටි තුන්ලක්ෂ පනස්හතරදහස් අසූහතක් කියලා. මේකෙන් රුපියල් කෝටි 224ක පාඩුවක් වෙලා

[ගරු නීතිඥ අනුරාධ ජයරත්න මහතා]

තිබෙනවා. ඒ නිසා මේ කියන කාරණාව තවදුරටත් කාටවත් සුද්ද කරන්න පුළුවන්කමක් නැහැ කියන එක මෙතැනදී විශේෂයෙන්ම සිහිපත් කරන්න ඕනෑ.

අනෙක ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එදා ජනාධිපතිවරයා මෙතැනට ඇවිල්ලා මොකක්ද ඇහුවේ? ගල් අඟුරු කාලා බලලාද ගන්නේ කියලා ඇහුවා. කෙසේ වෙතත්, accreditation නැති ආයතනයක් තමයි සහතික කරන්නේ. Lanka Coal Company එකේ සභාපතිවරයා ඉල්ලා අස් වෙනවා. එතුමා ඉල්ලා අස්වීමේදී කියනවා, මේක අමාත්‍යාංශයෙන් කළේ, මේ ගනුදෙනුව පිළිබඳව කිසිම වගකීමක් එතුමාට ගන්න බැහැ කියලා. ඒ සියලු කාරණා තිබියදී ජනාධිපතිතුමා මේ සභාවට ඇවිල්ලා අහනවා, ගල් අඟුරු කාලා බලලාද ගන්නේ කියලා. එහෙම නම් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ගම්පොළ අබ්දුල් කාදර් හිටපු ඇමතිතුමා හිරේ යන්නේත් නැහැ,. එතුමාත් නිදොස් කොට නිදහස් වෙන්න ඕනෑ. හිටපු අමාත්‍ය මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා ඇතුළු ඒ සියලුදෙනා නිදොස් කොට නිදහස් වෙන්න ඕනෑ. බාල බෙහෙත් පිළිබඳ චෝදනාව එල්ල වෙලා තිබෙන කෙහෙළිය රඹුක්වැල්ල හිටපු ඇමතිතුමාත් නිදොස් කොට නිදහස් වෙන්න ඕනෑ. ඇයි, බෙහෙත් විදලා බලලා නොවෙයි නේ, ගෙනාවේ. එහෙම නම් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කාරණාව කවුරු කවුරු හෝ එකතු වෙලා සුද්ද කරන්න උත්සාහ කරනවා කියන්නේ මේක ඇතුළේ බරපතළ ප්‍රශ්නයක් - ගැටලුවක් - තිබෙනවා කියන එකයි. මේ විගණකාධිපති වාර්තාවේ තිබෙන කාරණා තවදුරටත් තහවුරු වෙනවා කියන එක මම මෙතැනදී විශේෂයෙන්ම සිහිපත් කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට ආරංචි වන තොරතුරු අනුව දැනට දැන ගන්න ලැබිලා තිබෙන්නේ, දැන් Lanka Coal Company එකේ GM arrest කරන්න යනවා කියලායි. මේක බරපතළ ප්‍රශ්නයක්. අමාත්‍යවරයා නිදහස්, සභාපතිවරයා නිදහස්, අමාත්‍යාංශයේ ලේකම්වරයා නිදහස්, හැබැයි GM තමයි අන්තිමට වැරැදිකාරයා වෙන්නේ. ඔහුව arrest කරනවා නම්, මේ විධියට වෙනවා නම් රජයේ නිලධාරින් ආයෙත් කිසිම දෙයකට සම්බන්ධ වෙයිද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට රජයේ නිලධාරින්ට පණිවුඩයක් දෙන්න වෙනවා. අද ආණ්ඩුව කියන කියන විධියට, ආණ්ඩුව කියන කියන කාරණාවලට නිලධාරින් වැඩ කරන්න ගියොත් වෙන්නේ මොකක්ද? අද ආණ්ඩුවෙන් එක එක කමිටු දමනවා. කමිටුවලින් තීන්දු ගන්නවා, ඒවා නීතිය බවට පත් කරන්න උත්සාහ කරනවා. අවසානයේදී හිරේ යන්නේ අර අහිංසක නිලධාරින්. ඇමතිවරයා නිදහස්, අමාත්‍යාංශ ලේකම්වරයා නිදහස්, ආණ්ඩුවෙන් පත් කර ගත්තු සභාපතිවරයා නිදහස්. අහිංසක නිලධාරින් තමයි අවසානයේ හිරේ ගිහිල්ලා නතර වෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කාරණාව හිතනවාට වඩා එහා ගිය බරපතළ ගැටලුවක්. මේ සඳහා බලය පවරපු අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව හෝ ඒ අදාළ කණ්ඩායම් මේ වෙනුවෙන් හරියට කටයුතු කළ යුතුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2023 අවුරුද්දේ දූෂණ විරෝධී පනත මේ පාර්ලිමේන්තුවට ගෙන එන්න අපි විශාල වෙහෙසක්, මහන්සියක් දැරුවා. අපේ රටේ අධිකරණ සේවා කොමිෂන් සභාව තිබෙනවා, පොලිස් කොමිෂන් සභාව තිබෙනවා, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව තිබෙනවා. අපි කිසිම දවසක මේ කොමිෂන් සභා ආදිය එක එක සභාවලදී, මාධ්‍යවලදී, වෙනත් තැන්වලදී විවේචනය කරන්නේ නැහැ. ඒ වෙන මොකවත් නිසා නොවෙයි. අපට යම් යම් තැන්වලදී පෞද්ගලික මතවාද, ගැටලු, අර්බුද තිබෙනවා තමයි. හැබැයි, ඒත් අපි ඒ ආයතන විවේචනය නොකරන්නේ එක හේතුවක් නිසා. රටේ අධිකරණය පිළිබඳව මේ රටේ මිනිසුන්ට විශ්වාසය ගිලිහුණොත්, මේ රටේ නීතිය පිළිබඳව බරපතළ ප්‍රශ්නයක් ඇති වෙනවා. අපි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, මහ බැංකුව ආදිය ස්වාධීන කරලා නීති, අණ පනත් ගෙන ආවේ දැඩි විශ්වාසයකින්. හැබැයි, අප ඒවා අනවශ්‍ය විධියට විවේචනය කරලා ඒවා විනාශ වුණොත්, මේ රටේ නීතියේ ආධිපත්‍යයටයි බරපතළ හානියක්, ගැටලුවක් වෙන්නේ. අපට විවිධ මතවාද තිබුණත් අප ඒවා විවේචනය කරන්නේ නැත්තේ ඒ නිසායි. අපි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සභාපතිවරයා, සාමාජිකයන්, අධ්‍යක්ෂ ජනරාල්වරයා ඇතුළු සියලු දෙනාට මතක් කරනවා, ඔබතුමන්ලා ගන්නා තීන්දු, තීරණ කරුණාකර හෘදය සාක්ෂියට එකඟව ගන්න කියලා. මොකද, ඔබතුමන්ලා ගන්නා තීන්දු දෙස ආපසු හැරී බලන කොට, ඒවා නිවැරදි තීන්දු හැටියට හෘදය සාක්ෂියට එකඟ නොවෙයි නම්, මේ පාර්ලිමේන්තුවේ එදා ඔය දූෂණ විරෝධී පනත ගෙන එන්න අප කරපු අරගළ ආදී සියල්ල නිශ්ඵල වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අප ගෙන ආ ඒ පනත් කෙටුම්පත සම්මත කරන්න නියමිතව තිබුණු දවසේ - පළමුවෙනි දවසේ - එය සම්මත කරන්න බැරි වුණා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දෙවැනි දවසේ මට වෙන් කරලා තිබුණු පැය භාගයක කථාව කරන්නේ නැතුව, මගේ ඒ කථාවත් අයින් කරලා, වෙනමම Vote එකකට තල්ලු කරලා තමයි දූෂණ විරෝධී පනත් කෙටුම්පත මේ පාර්ලිමේන්තුවේ සම්මත කළේ. එහෙම නොකර මා ඒ පැය භාගය අරගෙන කථාව කර කර හිටියා නම් එදාත් ඒ පනත් කෙටුම්පත සම්මත කිරීම නැවත වතාවක් වෙනත් දවසකට කල් යනවා. එහෙම වුණා නම් අද ඔය පනත නොඑන්න ඉඩ තිබුණා. විජයදාස රාජපක්ෂ මැතිතුමා මේ සභාවේ නැති වුණත් එවකට අධිකරණ අමාත්‍යවරයාව සිටි එතුමාව මේ වෙලාවේ මම ගෞරවයෙන් සිහිපත් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්වාධීන යැයි කියන මහ බැංකුව වේවා, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වේවා ඒවා පිහිටුවා තිබෙන්නේ මේ රටේ නීතියේ ආධිපත්‍යය ආරක්ෂා කරන්නයි. නමුත් නීතියේ ආධිපත්‍යය ආරක්ෂා කරන කණ්ඩායම්, ඒ තිබෙන ආයතන ටික අමාත්‍යවරයාව නිදොස් කොට නිදහස් කරන්න උත්සාහ කරනවා නම්, ආණ්ඩුවෙන් පත් කරපු සභාපතිවරුන්ව නිදොස් කොට නිදහස් කරන්න උත්සාහ කරනවා නම්, ඒකට හිතවාදී ලේකම්වරුන්ව නිදොස් කොට නිදහස් කරන්න උත්සාහ කරනවා නම් අප හඳපු ඔය ස්වාධීන යැයි කියන කොමිෂන් සභා කිසිම එකකට පැවැත්මක් නැහැ කියන කාරණයත් අපි මේ වෙලාවේ විශේෂයෙන් සඳහන් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලංකා ගල් අඟුරු සමාගමේ සභාපතිවරයා අස් වෙනකොට එතුමා දීපු ලිපිය නැවත වතාවක් අධ්‍යයනය කරන්න කියන ගෞරවනීය ඉල්ලීම මා කරනවා. සභාපතිවරයා අහනවා, මේ ටෙන්ඩර් එක කොහොමද කැඳෙව්වේ කියලා. ඒ වාගේම කියනවා, මේ පිළිබඳව විශ්වාසය තියන්න බැහැ කියලා. ඒ කියන කාරණා ටික සටහන් කරලා තමයි එතුමා ඉවත් වෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි බොහොම ඕනෑකමින් කියන්නේ මෙයයි. මේ කාරණාව හරහා වෙන කාටවත් මඩ ගැසීමක්, ප්‍රශ්නයක්, ගැටලුවක් ඇති කිරීමක් නොවෙයි මේ කරන්නේ. හැබැයි, ඇමතිවරයාට සදාචාරාත්මක අයිතියක් නැහැ, තවදුරටත් එම අමාත්‍යාංශයේ අමාත්‍යවරයා හැටියට වැඩ කරන්න. අපි ඒ කාරණයත් මෙතැනදී සිහිපත් කරනවා. මොකද, ඔබතුමන්ලා ජාතික ජන බලවේගය හැදුවේ විශාල මාතෘකාවක් එළියට දමාගෙනයි; ගෞරවාන්විතවයි. ඔබතුමන්ලා හැදුවා කිව්වේ දූෂණයට, වංචාවට තිත තබන සුවිශේෂී වූ ආණ්ඩුවක්. ඒ සුවිශේෂී වුණු ආණ්ඩුවේ ඉඳගෙන මේ වාගේ චෝදනා පිට අමාත්‍යවරුන්ට වැඩ කරන්න බැහැ කියන එක මේ සභාවට සිහිපත් කරමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. Asitha Niroshana Egoda Vithana. You have 11 minutes.

[අ.භා. 1.37]

**ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා**
(மாண்புமிகு அசித நிரோஷண எகொட விதான)
(The Hon. Asitha Niroshana Egoda Vithana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මීට පෙර කථා කළ විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මැතිතුමා චෛතිය ගණයේ බොරු කිහිපයක්ම ඇද බෑවා. එතුමා විසින් PUCSL වාර්තාවේ, ඒ කියන්නේ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා වාර්තාවේ අඩංගු කරුණු මතු කරලා ඒවායෙන් තර්ක කිහිපයක් ගොඩනැඟුවා. පළමුවෙනි කාරණය මොකක්ද? PUCSL වාර්තාව SOC එකට ඉදිරිපත් කළේ ලක් විජය බලාගාරයේ පර්යේෂණාගාරයේ ප්‍රතිඵල අනුවයි. ලක් විජය බලාගාරයේ පර්යේෂණාගාරය accredited lab එකක් නොවෙයි. ඒ නිසා එතුමා හොඳින්ම දන්නවා, ජාත්‍යන්තර සමාගම් එක්ක ලංකා ගල් අඟුරු සමාගම මේ ගල් අඟුරු ක්‍රියාවලිය සිද්ධ කරන්නේ accredited lab reports පදනම් කරගෙනයි කියන එක. එහෙම නම්, ලක් විජය බලාගාරයේ පර්යේෂණාගාර වාර්තාව මත පදනම් වෙලා මේකේ ලාභ, පාඩු ගණනය කිරීම සම්පූර්ණයෙන්ම වැරැදියි. ඒක SOC එකේදීත් අපි ප්‍රකාශ කළා. ඒක තහවුරු වුණා. ඒ තහවුරු වුණු කරුණම; ඒ බොරුවම නැවත මේ පාර්ලිමේන්තුවේදී ඉදිරිපත් කළා. මේක ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ ගැටලුවක් නොවෙයි. ඔවුන්ට වාර්තාවක් දෙන්න කිව්වාට පසුව ඔවුන් ඒක හදපු විධියයි, මේ. නමුත් ඒකේ තිබෙන තාක්ෂණික දෝෂ හෙළිදරව් වුණා. ඒ ව්‍යාජ කරුණුම නැවත මෙතැන තහවුරු කරන්න හැදුවා.

ඊළඟ කාරණය තමයි අහසේ පාවෙනවාය කියන දූවිලි, ash. ඒ දූවිලි විශාල ප්‍රමාණයක් අහසේ පා වෙනවා වාගේ තමයි මවා පෙන්වන්න හැදුවේ. Ash content එක සම්පූර්ණයෙන්ම උරා ගන්න එම plant එකට පුළුවන්. ඔවුන් ඒ ash අළෙවි කිරීම සඳහාත් පාවිච්චි කරනවා. පරිසරය සම්බන්ධයෙන් බලාගාරයේ ඉන්න ඉංජිනේරු මහත්මයා SOC එකේදීත් පැහැදිලි කළා, ash content එක හදපු විධිය වැරැදියි කියලා. ඒක මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ නිලධාරින්ට පිළිගන්න සිද්ධ වුණා. එදා ඒ බිඳපු කරුණම, ඉංජිනේරුවන් තාක්ෂණිකව බිඳපු ඒ කරුණම වැරැදි කාරණයක් ලෙස සමාජගත කරන්න විපක්ෂ නායකවරයා උත්සාහ කළා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා ඒ SOC එකේදී කිව්වා, බාල ගල් අඟුරු ලක් විජය බලාගාරයේ turbine එකට දැම්මාට පසුව turbine එකට හානි වෙනවා කියලා. අපි එතුමාට කරුණු ඉදිරිපත් කළා, අපට තිබෙන සාමාන්‍ය දැනුමට අනුව. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා ඒක සමාන කළා, මේක හරියට බාල පෙට්‍රල් හෝ ඩීසල් එන්ජින් එකක් ඇතුළට දැම්මාට පස්සේ වෙන විධියේ damage එක තමයි මේ වෙන්නේ කියලා. අපි එතුමාට මේ කරුණු කිව්වා. ලක්විජය බලාගාරයේ තිබෙන්නේ බාහිර දහන එන්ජින් එකක්. ඔබතුමා කියන පෙට්‍රල්, ඩීසල් එන්ජින් එකක් කියන්නේ අභ්‍යන්තර දහන එන්ජින් එකක්. පෙට්‍රල්, ඩීසල් එන්ජින් එක ඇතුළට ගිහිල්ලා තමයි දහනය වෙන්නේ. හැබැයි මේ ගල් අඟුරු බාහිර දහන ක්‍රියාවලියකින් ඒ තිබෙන බොයිලේරු රත් කරලා ඒ ජලවාෂ්ප තමයි සම්පීඩනය කරලා turbine එකට යන්නේ. එහෙම නැතුව ගල් අඟුරු නොවෙයි. අපි ඒක එතුමාට පහදා දුන්නා. ඉතින් අනේ, මම දන්නේ නැහැ. එතුමා ඉස්කෝලේ යන කාලේ අදාළ දැනුම ගත්තේ නැත්නම් අපට ඒකට කරන්න දෙයක් නැහැ. නමුත් අපේ රටේ විපක්ෂ නායක ධුරය බරපතළ හැල්ලුවකට ලක් වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ ගැන අපේ කනගාටුව ප්‍රකාශ කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ විවාදය කොහෙන්ද ආවේ? මේ ගරු පාර්ලිමේන්තුවෙන්, විපක්ෂයේ ඉන්න මන්ත්‍රීවරුන්ගෙන් අපි අහනවා, මේ විවාදය කවුද ගෙනාවේ, කොහෙන්ද ආවේ, මේ විවාදයට තුඩු දෙන විගණකාධිපති වාර්තාව කොහෙන්ද ආවේ කියලා. එය ආවේ මෙහෙමයි. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක් තමයි පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා. එතුමාට තිබෙන බලතල අනුව විගණකාධිපති දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීමක් කළා, කරුණාකරලා වහාම මේ ප්‍රශ්නගත ගනුදෙනුව පිළිබඳව වාර්තාවක් COPE එක හමුවේ තියන්න, ඒක පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ට ලබා දෙන්න කියලා. අන්න ඒක තමයි දැන් ඔය පට්ට ගහන්නේ. ඒකේ තැනින් තැන තිබෙන සමහර කාරණා අරගෙන, තැනින් තැන තිබෙන සංඛ්‍යාලේඛන අරගෙන ඒක ඇතුළේ කියැවෙන කථාව, ඒකේ තිබෙන procedure එක ගැන අවධානය යොමු නොකර තමන්ට වාසි කෑල්ල විතරක් වියුක්තව අරගෙන ඒක පට්ට ගහන්න හදනවා. ඒ නිසා විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුනි, මේ විවාදයට තුඩු දෙන ප්‍රශ්නගත ගනුදෙනුවට අදාළ විගණකාධිපති වාර්තාව ආවේත් ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක් සභාපති ධුරය දරන COPE එකේ ඉල්ලීම අනුව. එහෙම නැහැයි කියන්න පුළුවන්ද? අපි අභියෝග කරනවා තමුන්නාන්සේලාට. මේවා තමුන්නාන්සේලා හොයා ගත්ත ඒවාද? නැහැ. අපිට අපි නිර්දෝෂී කරගන්න ඕනෑ. ආණ්ඩුවට අවශ්‍යයි, ආණ්ඩුවම නිර්දෝෂී - නිවැරදි - කරගන්න, යම් අඩුවක් තිබෙනවා නම් ඒක නිවැරදි කරගන්න. මොකද, අපි අපිට අවංකයි. ආණ්ඩුව ආණ්ඩුවට අවංක වෙන්න ඕනෑ. ඒ නිසා යම් චෝදනාවක් එනකොට තිබෙන අඩුව මොකක්ද, අඩුවක් තිබෙනවා නම් ඒක කොහේද තිබෙන්නේ කියලා ඒක නිවැරදි කරගන්න ඕනෑ. ඒක නිවැරදි කරගෙන ඉස්සරහට යන්න ඕනෑ. ඒ නිසා තමයි අපි මේක කළේ. තමුන්නාන්සේලා පට්ට ගහන ඔය වාර්තාව ආවේ ආණ්ඩුවේ මන්ත්‍රීවරු ඉන්න, සභාපතිවරයා හැටියට ආණ්ඩුවේ මන්ත්‍රීවරයෙක් ඉන්න කමිටුවේ ඉල්ලීමක් අනුව. ඒක තමුන්නාන්සේලා අමතක කරන්න එපා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ විවාදයේදී විවිධ මාතෘකා මතු වුණා, කථා මතු වුණා. හෙට අනිද්දාට ලැබෙන අධිකරණයේ සහ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ වාර්තා අනුව, අධිකරණයේ විමර්ශනය වන නඩු විභාග අනුව, මහජන මුදල් අවභාවිත කරලා හිරේ යන්න ඉන්න හාදයන්ගේ, ඒ වාගේම පාස්කු ප්‍රහාරය නාමයෙන් 269ක් ඝාතනය කරපු, දරුවෝ මරා දාපු නායකයන්ගේ, ඒවාට දේශපාලන නායකත්වය දුන්න නායකයන්ගේ කකුල් වෙව්ලනවා අද. ඒ අපරාධ එකින් එක හෙළිදරව් වෙලා තිබෙන්නේ. ජනාධිපතිවරයා ප්‍රකාශ කළා, මේ වසර යුක්තිය හා සාධාරණත්වය පිළිබඳව අංශු මාත්‍රයක හරි බලාපොරොත්තුවක් තිබෙන මිනිස්සුන්ට සතුටුදායක ප්‍රවෘත්ති එන වසරක් බවට පත් වෙනවා කියලා. නමුත් ඒක මේ අයට දරාගන්න බැහැ; හිරේ යන්න ඉන්න කට්ටියට දරාගන්න බැහැ. රනිල් වික්‍රමසිංහ මහත්මයා රුපියල් එක්කෝටි හැටහය ලක්ෂයක මහජන මුදල් අවභාවිත කරපු හැටි ඔප්පු වෙනවා, අධිකරණයේදී. ඒක දරාගන්න බැහැ. එතුමාට හිරේ යන්න වෙනවා. ඒ නිසා කොහොම හරි මේ ආණ්ඩුව පෙරළන්න ඕනෑ කියලා හිතනවා. ඒ නිසා උදේටත් කන්නේ ගල් අඟුරු, දවල්ටත් කන්නේ ගල් අඟුරු, රෑට නිදාගන්නකොටත් ගල් අඟුරු ටිකක් කොට්ටෙ යට තියාගෙන නිදාගන්නේ. දැන් ගල් අඟුරු දෙයියන්ගේ පිහිටයි තමුන්නාන්සේලාට. දැන් මේ අහුවෙච්ච ඒකෙන් ආණ්ඩුව වට්ටන්නේ කොහොමද කියලා කල්පනා කරනවා.

[ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක මුළුමනින්ම තාක්ෂණික ක්‍රියාවලියක්. මුළුමනින්ම විද්‍යාත්මක ක්‍රියාවලියක්, මේ ප්‍රසම්පාදන කටයුත්ත සහ මේ පරීක්ෂණාගාර කටයුතු. ඒ නිසා මේ ක්‍රියාවලිය තුළ යම් යම් ගැටලු මතුවෙන්න පුළුවන් කියන එක සාධාරණයි. මේක machine production එකක් නොවෙයි. මහ පොළොවෙන් ගන්න බලශක්තියක් තමයි අපි මේ භාවිත කරන්නේ. එතකොට රටින් රටටත් ඒ බලශක්තියේ වෙනස්කම් එනවා. එකම රටක එක එක තැන්වලත් බලශක්තිය වෙනස් වෙනවා. ඒක පිළිගන්න පුළුවන් සත්‍යයක්. මේක සාමාන්‍ය මිනිස්සුන්ටත් තේරෙනවා. සාමාන්‍ය මිනිස්සුන්ට දැනෙන කාරණයක්, මේක. මේ බලශක්ති ප්‍රභවය වන ගල්අඟුරුවල දහන අගය නිරන්තරයෙන් වෙනස් වෙන්න පුළුවන් කියන එක ලෝක සත්‍යයක්. ඒ සත්‍යය තමයි වංචාවක් කියලා මිනිසුන්ගේ මනස ඇතුළට දාන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එය තාක්ෂණිකව බේරන්න පුළුවන්, විද්‍යාත්මකව ලිහන්න පුළුවන් කාරණයක්. ඊයේ COPE එකට ඒ අදාළ ආයතනවල ඉන්න විශේෂඥයන්, ඉංජිනේරුවන් ගෙන්වූවා. ආණ්ඩු පක්ෂයේ, විපක්ෂයේ මන්ත්‍රීවරු නියෝජනය කරන COPE එකට ඊයේ විපක්ෂයේ සාමාජික මන්ත්‍රීවරු ඔක්කෝම ආවා. නිරීක්ෂණ මට්ටමිනුත් සමහර මන්ත්‍රීවරු ආවා. මේ පාර්ලිමේන්තුවේදී අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමන්ලා පට්ට ගහන බොරුව, විපක්ෂ නායකතුමන්ලා එළියේ පට්ට ගහන බොරුව, COPE එකේදී අපි කාරණයෙන් කාරණය තාක්ෂණිකව ලිහනකොට ඔන්න එක්කෙනා දෙන්නා නැඟිටලා යනවා. "අපට දැන් කම්මැළියි, තව වැඩක් තිබෙනවා, තව වැඩක් දාගෙන ආවේ, නඩුවකට යන්න තිබෙනවා" කියමින් විපක්ෂයේ එක එක්කෙනා මාරු වුණා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Asitha Niroshana, you have two more minutes.

**ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා**
(மாண்புமிகு அசித நிரோஷண எகொட விதான)
(The Hon. Asitha Niroshana Egoda Vithana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තව පොඩි වෙලාවක් දෙන්න කියලා ඉල්ලනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, COPE එකේදී ඒ කාරණා එකින් එක ලිහද්දී අවසානයේ විපක්ෂයෙන් ඉතුරු වුණේ කවුද? සුජීව සේනසිංහ මන්ත්‍රීතුමායි, අර Potencia සමාගමත් එක්ක නිරන්තරයෙන් අත්වැල් බැඳගෙන ඉන්න අපේ ඩී.වී. චානක මන්ත්‍රීතුමායි විතරයි ඉතුරු වුණේ. කෝ, අනෙක් අය? ඇයි පිට වෙලා ගියේ? මේ කාරණය පාර්ලිමේන්තුවේ පට්ට ගහන්න පුළුවන්. එළියේ මාධ්‍ය සාකච්ඡා තියමින් මේක වංචාවක්ය කියලා පට්ට ගහන්න පුළුවන්. මේ ගැන මාධ්‍ය නිවේදන නිකුත් කරන්න පුළුවන්. හැබැයි, තාක්ෂණිකව ඒ කාරණා එකින් එක, එකින් එක ලිහනකොට, ඒ procedure එක පැහැදිලි කරගෙන එනකොට ඒකට මුහුණ දෙන්න බැහැ. ඇයි? එළියේ ගහන්නේ ගේමක්. වළං කඩේට පැන්න ගොන්නු ටික වාගේ ගහගෙන ගහගෙන යනවා. හැබැයි, නිලධාරින් ඉස්සරහා පිට, ඉංජිනේරුවන් ඉස්සරහා පිට ඒ agreement එකේ තිබෙන කරුණු කාරණා එකින් එක අපි දිග හරිනකොට, පැහැදිලි කරනකොට මෙතුමන්ලාට උත්තර නැතුව ගියා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අන්තිමට COPE එකේ විපක්ෂයෙන් ඉතුරු වුණේ මන්ත්‍රීවරු දෙන්නයි. නමුත් අපි සියලුදෙනාම ඒකට මුහුණ දුන්නා. ඉදිරිපත් කරලා තිබුණ ව්‍යාජ කාරණා විශාල ප්‍රමාණයක් එකින් එක, එකින් එක අපි විසඳුවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දීර්ඝව විස්තර කරන්න මට තිබෙන කාලය ප්‍රමාණවත් නැති නිසා මම ඉදිරිපත් කරන්නම් 2014දී කොහොමද ටෙන්ඩර් ක්‍රියාවලිය සිදු වුණේ කියලා. 2014දී සිදු වුණු ටෙන්ඩර් ක්‍රියාවලිය ඇතුළේ ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Asitha Niroshana, you have extra three minutes.

**ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා**
(மாண்புமிகு அசித நிரோஷண எகொட விதான)
(The Hon. Asitha Niroshana Egoda Vithana)
බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

එහෙම නම් මම මුලට එන්නම්. 2009 ඉඳලා මේ ටෙන්ඩර් ක්‍රියාවලිය ආරම්භ කරලා තිබෙනවා. පළමු ටෙන්ඩර් ක්‍රියාවලිය ආරම්භ කර තිබෙනවා, 2008 වර්ෂයේදී. ඒ, වසර තුනකට ගල් අඟුරු මෙට්‍රික් ටොන් 1,950,000ක් ආනයනය කරන්න. ඒ සඳහා කැබිනට් මණ්ඩල අනුමැතිය ලබා දීලා තිබෙන්නේ 2008දී. ටෙන්ඩර් ක්‍රියාවලිය අවස්ථා කිහිපයකදී දීර්ඝ කර තිබෙනවා. මාස 15ක් ටෙන්ඩර් ක්‍රියාවලිය ඇදෙනවා. අවසානයේදී තාක්ෂණික දෝෂ මත ප්‍රසම්පාදනය අහෝසි කරනවා. මෙතුමන්ලා පළමු ටෙන්ඩරය පටන් ගත්තෙත් අහෝසි කරලායි. ඩී.වී. චානක මන්ත්‍රීතුමන්ලාගේ නායකයෝ මාස 15ක් ටෙන්ඩර් එක ඇද්දා. තමන්ට හිතවත් කෙනෙක් හොයා ගන්න බැරි වනකොට අවසානයේ ටෙන්ඩර් එක හකුළනවා. දෙවන ටෙන්ඩර් එක පටන් ගත්තේ, 2009 ජූලි 13වැනි දා. ඒ ප්‍රසම්පාදනය ආරම්භ කරනවා. 2009 ඔක්තෝබර් මාසයේ අවසන් කරනවා. ඒකේදී අඩුම ලංසුව ඉදිරිපත් කළ Holcim Trading Company කියන සමාගම තෝර ගන්නවා. නමුත්, මහින්ද රාජපක්ෂ මහත්මයා කැඳවනවා කැබිනට් මණ්ඩලය. මුදල් අමාත්‍යවරයා හැටියට හිටියේ බැසිල් රාජපක්ෂ මහත්මයා. එතුමා අඩුම ලංසුව ඉදිරිපත් කළ Holcim Trading Company එක ඉවත් කරලා ටෙන්ඩර් එක පිරිනමනවා Noble Resources (Pvt.) Limited කියන ආයතනයට.

Noble Resources (Pvt.) Limited කියන්නේ, එතුමන්ලාට ඓතිහාසිකව ඥාතිත්වයක් තිබෙන සමාගමක්. ඒක තමයි 2009 ඉඳලා 2016 දක්වාම ලංකාවට ගල් අඟුරු සපයපු එකම සමාගම. ටෙන්ඩර් පහක් කැඳවලා තිබෙනවා. ඒ ටෙන්ඩර් පහෙන්ම අඩුම ලංසුව ඉදිරිපත් කළ සමාගම් පහක් තෝර ගන්නවා. හැබැයි, වාසනාවන්තයා වෙන්නේ Noble Resources (Pvt.) Limited එක. එහෙම නම් මොකටද ටෙන්ඩර් කැඳවන්නේ? මොකටද සමාගමක් හදලා තිබෙන්නේ? 2006දී තමුන්නාන්සේලා වෙනම ගල් අඟුරු සමාගමක් හැදුවේ මොකටද? ඒකට වෙනම නිලධාරින් පත් කළේ ඇයි? ඒ පත් කළේ මේ ගල් අඟුරු සැපයුම් ක්‍රියාවලිය සිදු කරගන්න. ඒ කැඳවපු පළමු ටෙන්ඩර් පහේදීම මොකක්ද වෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි? ටෙන්ඩර් එකෙන් තෝර ගත්ත අඩුම ලංසුව ඉදිරිපත් කළ සමාගම පැත්තකින් තියලා කැබිනට් මණ්ඩලය රැස් වෙලා බැසිල් රාජපක්ෂ මහත්තයා ඒ ටෙන්ඩර් එක Noble Resources (Pvt.) Limited එකට ප්‍රදානය කරනවා. එහෙම නම් මොකටද ටෙන්ඩර් කැඳවන්නේ? දැන් මේ දිනයක්, දෙකක් ප්‍රමාද වුණාම ප්‍රශ්න කරනවා. ඩොලර් 5,000න් ඩොලර් 20ක් බැංකුවල service එකට කපා ගත්තාට පස්සේ ඒ දිනය අරගෙන මෙතුමන්ලා ප්‍රශ්න කරනවා. හැබැයි, අවුරුදු 7ක් මේ ටෙන්ඩර් ක්‍රියාවලිය කොහොමද වෙලා තිබෙන්නේ? ටෙන්ඩරයෙන් තෝරා ගත් සමාගමට අවස්ථාව නොදී මුළුමනින්ම ගනුදෙනුව සිදු වෙලා තිබෙන්නේ Cabinet approval මත. එහෙනම් මොකටද සමාගමක් හැදුවේ? අන්න ඒ Noble Resources (Pvt.) Limited එකට තමයි පස්වන ටෙන්ඩර් එකත් ලබා දුන්නේ. පස්වන ටෙන්ඩරයෙන් ආපු නැව් 7ක් ෆේල් වනවා.

අපි Load Port Report එකට අනුව තමයි මුදල් ගෙව්වේ. හැබැයි, ගිවිසුමේ නැති වුණත් අපි ලංකාවේ discharge port එකේදී පරීක්ෂාව කළා. ඒ පරීක්ෂා කළාට පස්සේ නැව් හතක් ෆේල් වෙනවා. නැව් හතක් ෆේල් වුණාට පස්සේ load port එකේ umpire sample එක check කරනවා. ඒ load port එකේ umpire sample එක check කළාට පස්සේ නැව් හතෙන් නැව් හතරක් ෆේල් කියලා තහවුරු කරනවා. ඒකට දඩ ගහනවා. ඉතිහාසයේ පළමුවැනි වතාවට බාල ගල් අඟුරු ආවා කියලා මේ කියන්නේ. හැබැයි, 2014දී Lanka Coal Company එක බාල ගල් අඟුරු නැව් හතරක් අරගෙන ආවා කියලා තහවුරු කරනවා. ඒකෙදී දඩ ගහලා තිබෙනවා, පළමුවැනි නැවට ඩොලර් 35,937ක්; දෙවැනි නැවට ඩොලර් 34,505ක්; තුන්වැනි නැවට ඩොලර් 137,000ක්; හතරවැනි නැවට ඩොලර් 158,000ක්. අන්න මහත්වරුනි, දඩ ගහලා තිබෙනවා. අපි මේ ගල් අඟුරු සමාගමේ අයගෙන් ඇහුවා, "දැන් Calorific Value 5,900ට අඩුවෙන් දඩ ගහලා ඔයගොල්ලන් reject කරලා තිබෙනවා. මේ ගල් අඟුරු ටිකට මොකද කළේ? ඔයගොල්ලන් හරවලා යැව්වාද? ගල් අඟුරු ළමයින්ට සෙල්ලම් කරන්න දුන්නාද? නැත්නම් ඉඩම් ගොඩකරන්න ගත්තාද?" කියලා. ඔවුන් කිව්වා, "අනේ නැහැ. බාල ගල් අඟුරු ආවාට පස්සේ ඒක plant එකට දානවා ඇරෙන්න වෙන දෙයක් නැහැ" කියලා. හැබැයි, plant එකේ ලොක්කෝ කිහිප දෙනෙකුයි, මෙතුමන්ලාගේ කට්ටියයි මොකක්ද කිව්වේ? බාල ගල්අඟුරු plant එකට දැම්මොත් plant එකත් විනාශ වෙනවා කියලා කිව්වා. 2014 plant එකට නැව් හතරක ගල් අඟුරු පාවිච්චි කරලා තිබෙනවා; මෙට්‍රික් ටොන් 60,000 ඒවා හතරක්. එතකොට plant එකට මොකුත් වුණේ නැද්ද, ගරු මන්ත්‍රීතුමනි?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මොකක්ද වෙලා තිබෙන්නේ? ඉතිහාසයේ හැම දාම ගල් අඟුරුවල Gross Calorific Value එක අඩුවෙන් ඇවිල්ලා තිබෙනවා. මේක natural resource එකක්. ඒකේ අඩු එක තිබෙනවා, වැඩි එක තිබෙනවා. ඒක යථාර්ථයක්. ඒවා පාවිච්චි කරලා තිබෙනවා. පාවිච්චි කරලා තිබෙන්නේ කොහොමද? කලින් tender එකෙන් ගෙනාපු ගල් අඟුරුයි, අලුත් tender එකේ ඒවා බාලයි නම්, දෙක mix කරලා පාවිච්චි කරලා තිබෙනවා. හැබැයි, හරියට ටෙන්ඩර් එක දාලා, අඩුම ලංසුවට දීලා, විනිවිදභාවයෙන් යුතුව ටෙන්ඩර් ක්‍රියාවලිය ගිහිල්ලා ගත්තු සමාගම අන්නන්න ඕනෑ, අර පැරණි cartel එකට. විපක්ෂයේ මන්ත්‍රීවරුනුත් ඉන්නවා. ගල් අඟුරු plant එකේ ඉන්න කිහිප දෙනෙකුත් ඉන්නවා. ඒ වාගේම සමාගමේත් කිහිප දෙනෙක් ඉන්නවා. මේකේ තිබෙනවා cartel එකක්, ඒකාධිකාරයක්; ගණන හුවමාරු වෙන එකක්. අන්න ඒ cartel එකට රිදෙනවා. ඒක නිසා මේ ටෙන්ඩරය වට්ටන්න ඕනෑ. ඒ වට්ටන්න ඕනෑ නිසා තමයි Trident Chemphar Limited එකට ගෙනාපු පළමුවැනි නැවම direct feed කරනවා, coal yard එකට දාන්නේ නැතුව. Coal yard එකේ තිබෙනවා Russian coal. ඒ ටික එහෙම තියාගෙන plant එකට direct feed කරනවා. කොහොමද ටිකිරි මොළේ?

එතරම් හදිස්සියි. මේ ගල් අඟුරු ෆේල් කියලා කියන්න එතරම් හදිස්සියි. මේක ජාවාරමක්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේක තමයි මෙච්චර කල් මේගොල්ලන් ගහපු මැච් එක. දශක ගණනාවක් තිස්සේ හමුදාවට සපත්තු දෙන්නේ, පොලීසියට සපත්තු දෙන්නේ එකම සැපයුම්කරුවෙක්. දශක ගණනාවක් තිස්සේ හමුදාවට මාළු දෙන්නේ, එළවලු දෙන්නේ එකම සැපයුම්කරුවෙක්. දශක ගණනාවක් තිස්සේ ලංකාවට ගෑස් ගෙන්වන්නේ එකම සමාගමක්. මේක ඒකාධිකාරයක්. මේ ගනුදෙනු විපක්ෂයේ ඉන්න මන්ත්‍රීවරුන්ට ආණ්ඩු පක්ෂයේ ඉන්නකොට බෙදුණා. ඇමතිවරුන්ට ගියා, ජනාධිපතිවරුන්ට ගියා, ඒ අයගේ පුත්තුන්ට ගියා. ඒක දැන් බිඳිලා තිබෙන්නේ. ඒ ජාවාරම බිඳිලා තිබෙන්නේ. එම ඒකාධිකාරය කැඩිලා තිබෙන්නේ. ඒ chain එක කැඩිලා තිබෙන්නේ. අපි ඒක බින්දා, මහත්වරුනි. අපට ජන වරම තිබෙන්නේ ඒකට. මහජන ධනය හොරාකන එක නතර කරන්න ඕනෑ. ඒක තමයි ජන වරම. ඒකට මේ ඒකාධිකාරය බින්දා. ඒ බින්ද එකේ පළිය තමයි ඔය කට්ටිය ඔක්කෝම එකතු වෙලා ගත්තේ.

අපි පිළිගන්නවා, මේ ගල් අඟුරුවල Gross Calorific Value එක අඩුයි කියලා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Asitha Niroshana Egoda Vithana, your time has been exhausted now.

**ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා**
(மாண்புமிகு அசித நிரோஷண எகொட விதான)
(The Hon. Asitha Niroshana Egoda Vithana)
On-time data එකෙන් ඒකේ තිබෙන ගුණාත්මකභාවය අඩුයි කියලා ප්‍රකාශ කරනවා. අපි ඒක පිළිගන්නවා. හැබැයි, ඒකට දඩ අය කර ගැනීමේ ක්‍රියාවලියක් තිබෙනවා. ඉතිහාසයේ වැඩිම දඩ අය කරගෙන තිබෙනවා. ඉතිහාසයේ අය කරගත්තු වැඩිම දඩය අපි අය කරගෙන තිබෙනවා. මම තමුන්නාන්සේලාගෙන් අහනවා, "2009 ඉඳලා ගල් අඟුරු සැපයුම් ක්‍රියාවලිය කරලා තිබෙනවා. තමුන්නාන්සේලා ප්‍රමාද ගාස්තු අය කළේ කවදාද?" කියලා. මාස හයක් ඇතුළත නැවකට දින පහයි දෙන්නේ ගල් අඟුරු බාන්න. ඉතාම තීරණාත්මක schedule එකක් තිබෙන්නේ. එහි ප්‍රමාදයක් වුණොත් දඩ අය කරන්න පුළුවන්. 2009 ඉඳලා 2025 දක්වාම ඩොලර් එකක් දඩ අය කරලා නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඉතිහාසයේ පළමු වතාවට මේ ටෙන්ඩරයේ තමයි, ප්‍රමාද ගාස්තුවලට ඩොලර් ලක්ෂ ගණනක් දඩ අය කළේ. අපි ඩොලර් ලක්ෂ ගණනක් දඩ අය කරලා තිබෙනවා. අනෙක් රජයන් දඩ අය කරගෙන තිබෙනවාද? කවදාවත් අය කරගෙන නැහැ. යාළුවෝ නම් දඩ අය කරනවාද? යාළුවෝ නම් ඩොලර් ලක්ෂ ගණනක් Gross Calorific Value එකට දඩ ගහනවාද? යාළුවෝ නම් හොය හොයා ප්‍රමාද ගාස්තුවලට දඩ ගහනවාද? අපට මෙතැන කිසිම ගනුදෙනුවක් නැහැ. අපේ දේශපාලන ව්‍යාපාරය මිනිසුන්ගේ දුක, වේදනාව, කඳුළුත් එක්ක ගොඩනැඟිලා තිබෙන්නේ. ඒ ප්‍රාර්ථනා විනාශ කරන්න අපි ඉඩ දෙන්නේ නැහැ. ඒක තමයි ජන වරම. මෙතැන නියෝජනය කරන සියලු මන්ත්‍රීවරුන් ඒකට සාක්ෂි දරනවා. කිසි කෙනෙකුට ඒක උල්ලංඝනය කරන්න දෙන්නේ නැහැ. මේ ආණ්ඩුව ඇතුළේ ඒකට කිසිම ඉඩක් නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ ගැන අපි ජීවිතයෙන් සපථ වෙනවා. හැබැයි, ජීවිතයෙන්ම සපථ වන ඒ විශ්වාසය තහවුරු කර ගත් දේශපාලන මතයට තමයි මේගොල්ලෝ මේ ගනුදෙනුවේදී තාක්ෂණික විධියට යම් දූෂණයක් වුණු තත්ත්වයට හරවන්නේ. මේක තාක්ෂණික ප්‍රශ්නයක්, විද්‍යාත්මකව බේරන්න පුළුවන් ප්‍රශ්නයක්. හැබැයි, Gross Calorific Value එක අඩුයි කියන එකත් දූෂණයක් කියලා සඳහන් කරනවා. ගරු මන්ත්‍රීවරුනි, මේ කරන්නේ සාහසික අපරාධයක්. ජන වරමට තමයි තමුන්නාන්සේලා මේ damage එක කරන්නේ. එම නිසා මේ විවාදය බලාගෙන සිටින මේ රටේ සුවහසක් ජනතාවට අපි කියනවා, "තමුන්නාන්සේලා විශ්වාසය තැබූ ඒ ජන වරම අපි අංශු මාත්‍රයකින් හෝ බිඳ වට්ටන්නේ නැහැ, තමුන්නාන්සේලා වෙනස් වෙන්න එපා" කියලා.

මේ ප්‍රශ්නය අපි A to Z බේරනවා. අපි COPE වාර්තාව සති කිහිපයක් ඇතුළත මේ පාර්ලිමේන්තුවේ සභාගත කරනවා. COPE එකේ සභාපතිතුමා, Hon. (Dr.) Nishantha Samaraweera සහෝදරයා ඉතාම හොඳින් මේ කරුණු පැහැදිලි කරයි. COPE එකේදී අපි නිවැරදි කරපු කාරණා ටික අද මේ පාර්ලිමේන්තුවේදී

[ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා]

එළියට ආවේ නැහැ. එම නිසා අපි ඉතා ඉක්මනින් COPE වාර්තාව මේ පාර්ලිමේන්තුවේ සභාගත කරනවා. ගරු මහත්වරුනි, ඒකත් එක්ක අපි නැවත විවාද කරමු, ඒකත් එක්ක අපි TV programmesවලට ලෑහැස්ති වෙමු, ඒකත් එක්ක අපි එළියේ සංවාදවලට ලෑහැස්ති වෙමු, අපි මහජන පුස්තකාලයේ විවෘත සංවාදවලට ලෑහැස්ති වෙමු, තමුන්නාන්සේලා එන්න. අපි ලෑහැස්තියි, මේක නිවැරදි කරන්න. අපට ඕනෑ, මේ ජන වරම නිවැරදි කරන්න. අපට ඕනෑ, මේ ජන වරමට අනුව වැඩ කරන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ කථාව අවසන් කරන්න කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම, මේ රටේ ජනතාවට අපි නැවත වතාවක් කියනවා, මේ ජන වරමත් එක්ක හිටගන්න, ඒකත් එක්ක ඉන්න, අපි තමුන්නාන්සේලාට වග කියන බව.

බොහොම ස්තුතියි.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Ajith P. Perera, what is your point of Order?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, මෙතුමා මගේ නම සඳහන් කරලා වැරදි කරුණක් කිව්වා. ඒ තමයි, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ 2026.02.27 වැනි දින වාර්තාව පට්ට ගහනවා කියලා. පට්ට ගහන්න වටිනවා. මොකද හේතුව, ඒ වාර්තාවේ තිබෙන හැම කරුණක්ම ඒ විදියටම තිබෙනවා. එතුමා ඒ කමිටුවේ සාමාජිකයෙක්. එහි තිබෙන කිසිම නිර්දේශයක් කිසිම වෙලාවක ප්‍රතික්ෂේප කළේ නැහැ. මේ ගරු මන්ත්‍රීතුමා, ඒ විදියට ප්‍රතික්ෂේප කළා කියලා කියන එක අන්තිම වැරදි කථාවක්. ඔබතුමා ඒ වෙලාවේ කථා කළේ නැහැ. විවිධ මත තිබුණා, ඒවා විසඳා ගත්තා. ඊට පස්සේ නැවත නැවත තහවුරු වුණා. එතකොට, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා වාර්තාව දැන් ප්‍රතික්ෂේප කරන්නේ ඇයි? ඒ වාගේම එතුමා කථා කරනවා, Public Library එකේ විවාද කරන්න. Public Library එකේ නොවෙයි, අද මේ සභාව තුළ විවාද කරන්න. කියන්න තිබෙන කරුණු අද කියන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Ajith P. Perera, we are not going into a debate on this.

**ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා**
(மாண்புமிகு அசித நிரோஷண எகொட விதான)
(The Hon. Asitha Niroshana Egoda Vithana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay, Hon. Asitha Niroshana Egoda Vithana, I will give you 15 seconds.

**ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා**
(மாண்புமிகு அசித நிரோஷண எகொட விதான)
(The Hon. Asitha Niroshana Egoda Vithana)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන්න, Lakvijaya Power Plant එකේ පරීක්ෂණාගාරය accredited ද?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Ajith P. Perera, we are not going into a debate on this.

**ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා**
(மாண்புமிகு அசித நிரோஷண எகொட விதான)
(The Hon. Asitha Niroshana Egoda Vithana)
ඔව්ද, නැද්ද කියලා කියන්නකෝ, ගරු මන්ත්‍රීතුමා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
We are not going in for a debate.

**ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා**
(மாண்புமிகு அசித நிரோஷண எகொட விதான)
(The Hon. Asitha Niroshana Egoda Vithana)
ඔව්ද, නැද්ද කියලා කියන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. D.V. Chanaka. You have 10 minutes.

Order plase! Before he starts, the Hon. Deputy Chairperson of Committees will take the Chair.

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය [ගරු හේමාලි වීරසේකර මහත්මිය] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] took the Chair.*

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, - *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
සභාව නිහඬ වෙන්න. කරුණාකරලා සභාව නිහඬ වෙන්න. ගරු ඩී.වී. චානක මන්ත්‍රීතුමා කථා කරන්න.

[අ.භා. 1.57]

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විශේෂයෙන්ම නොරොච්චෝලේ විදුලි බලාගාරයේ ඉංජිනේරු මහත්වරු සියලුදෙනාට, ලංකා විදුලිබල මණ්ඩලයට, PUCSL එකට, ඒ වාගේම National System Operator (Pvt.) Limited එකට මම පළමුවෙන්ම ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම, අද IMF එකටත් ස්තුති කරන්න වෙනවා. මොකද, අද සියලුදෙනාම කියනවා මේවා බාල ගල් අඟුරු කියලා.

අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා තමයි මීට සති තුනකට කලින් කල් තැබීමේ විවාදයකදී මේ කාරණය ඉදිරිපත් කළේ. මම රටේ ජනතාවට කියනවා, සති තුනකට කලින් ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරුන්ගේ කථා ටික බලන්න කියලා. ඒ හැම කථාවකම කියනවා, ලංකාවට බාල ගල් අඟුරු ඇවිල්ලා නැහැ කියලා. එකක දෙකක නොවෙයි, හැම කථාවකම එහෙම කිව්වා. සති තුනකට කලින් හැම කථාවකම එහෙම කිව්වා. ඒ වාගේම මීට කලින් කථා කරපු මන්ත්‍රීතුමා කිව්වා, සමාගම් එක්ක තිබෙන සම්බන්ධතා පිළිබඳව. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලා මේ පාර්ලිමේන්තුව බොරු කියන්න පාවිච්චි කළාට කමක් නැහැ. හැබැයි, මට යම් කිසි චෝදනාවක් තිබෙනවා නම්, පුස් වණ්ඩි පාට් දමන්න එපා, එළියේදී කියන්න. මොකද, මම දැනටත් තුන්දෙනෙකුට විරුද්ධව නඩු දාලා තිබෙනවා. මට මොන චෝදනාවක් ඉදිරිපත් කළත් මම නඩු දමනවා. ඔබතුමන්ලා වගේ නොවෙයි; මේ කාරණයේදී වගේ නොවෙයි, එළියේදී මට මොනවා කිව්වත් මම නඩු දමනවා. ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම කුමාර ජයකොඩි ඇමතිතුමා ගිය අවුරුද්දේ අගෝස්තු මාසයේ ඔය පොටෙන්ෂියා කියන සමාගමට ගල් අඟුරු නැව් 5ක් ගෙන්වන්න අවස්ථාව දුන්නා. ඒ වෙලාවේ විරුද්ධව කථා කළේ ඔබතුමන්ලා නොවෙයි, මම. කෝටි 6ක් පගාව අරන් නැව් 5කට අවස්ථාව දුන්නා කියලා ඒකට විරුද්ධව කථා කළේ ඔබතුමන්ලා නොවෙයි, මම. පොටෙන්ෂියා සමාගමෙන්; අරයාගෙන්, මෙයාගෙන් අහන්න ඉස්සෙල්ලා ගිහිල්ලා ඒක ගැන කුමාර ජයකොඩි ඇමතිවරයාගෙන් අහගන්න.

රුසියාවට ගිහිල්ලා හොරෙන් හම්බවෙනවා. ගිහිල්ලා ඒ පුද්ගලයාගෙන් අහන්න. ඒවා අපෙන් අහලා වැඩක් නැහැ. ඔබතුමන්ලා හොරකම් කරලා රුපියල් කෝටි 10,000ක් ලංකාවේ ජනතාවට පාඩු කරලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු මන්ත්‍රීතුමනි, පෞද්ගලික අපහාස කිරීම් කරන්න බැහැ.

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)

පෞද්ගලික අපහාසයක් නොවෙයි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ගිහිල්ලා හමුවෙච්ච එකක් ගැනයි මම කිව්වේ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ස්ථාවර නියෝග 91(උ) යටතේ පෞද්ගලික අපහාස කිරීම් කරන්න බැහැ. මාතෘකාවට අදාළව කථා කරන්න.

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)

හොඳයි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

දැන් කියනවා, COPE එකට ආපු විගණන වාර්තාව නිසා තමයි මේ සියල්ල කියලා. විගණන වාර්තාව එන්න කලින් තමයි විදුලිබල මණ්ඩලයේ වාර්තාව ආවේ; PUCSL එකේ වාර්තාව ආවේ. ඒ වාගේම නොරොච්චෝලේ ඉංජිනේරුවෝ press conference එකක් තියලා කිව්වේ, මේ ඔක්කෝටම කලින්. දැන් නොවෙයි ඒවා වුණේ. ඊට කලින් ඒවා වුණේ. දැන් ඔන්න අමාත්‍යතුමා සභාවට ආවා. අමාත්‍යතුමනි, මේ විගණන වාර්තාවේ පැහැදිලිව තිබෙනවා, ලංකාවට ගල් අඟුරු ගේන්න පුළුවන් කාලය දවස් 40කින් හිතා මතා කල් දාලා තිබෙනවා කියලා. ඇයි එහෙම කළේ? හේතුව මේකයි. බාල ගල් අඟුරු ගෙනාවත් මේ ටෙන්ඩර් එක cancel කරන්න බැහැ. අර බිමල් රත්නායක මහත්තයා කියනවා වාගේ බංකොලොත් වෙනවා. අන්තිම edge එකට වෙනකම් ගිහිල්ලා ගල් අඟුරු ගේන්න පුළුවන් කාලය නැති කරලා ඊයේ COPE එකට ඇවිල්ලා කියනවා, අපි ඒක අප්‍රේල් මාසය වනකොට දීලා තිබෙනවා කියලා. ඒක අමාත්‍යාංශයේ මාස දෙකක් තියාගෙන ඉඳලා, ඊට පසුව කමිටු දමන්න පරක්කු කළ නිසා තමයි දින 40ක කාලයක් නැව් නොපැමිණියේ. කොච්චර බාල ගල් අඟුරු ගෙනාවත් මේක cancel කරන්න බැරිවන ප්‍රධානම හේතුව ඒක තමයි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ වෙලාවේ අනුර කරුණාතිලක ඇමතිතුමා මේ සභාවේ හිටියා නම් හොඳයි. එතුමා කිව්වා, lab දෙකටම accreditation තිබෙනවා කියලා. අපේ බිමල් රත්නායක මහත්තයාට ඕනෑ නම් එතුමා වෙනුවට උත්තර දෙන්න. ඉන්දුනීසියාවේ තිබෙන lab එකට accreditation තිබෙනවා කිව්වා. ඊට පස්සේ කිව්වා, South African lab එකටත් accreditation තිබෙනවා කියලා. හේතුව මම දන්නේ නැහැ, Lanka Coal Company එකටත්, අමාත්‍යාංශයේ ලේකම්ටත් නැති වුවමනාවක් එතුමාට තිබෙනවා නේ, lab දෙක ආරක්ෂා කරන්න. ඊයේ අපි COPE එකේදි ප්‍රශ්න කළා, Indonesian lab එකට accreditation තිබෙනවාද කියලා. ඒගොල්ලන් කියනවා නැහැ කියලා. සභාපතිවරයාත් කියනවා නැහැ කියලා. ලේකම්වරයාත් කියනවා නැහැ කියලා. හැබැයි, අනුර කරුණාතිලක මහත්තයා කියනවා, තිබෙනවා කියලා.

මීට කලින් කථා කළ මන්ත්‍රීවරයා කියනවා, ලංකාවේ lab එකට accreditation නැහැ කියලා. හැබැයි, ඔබතුමන්ලා ගත්ත මේ ඉන්දුනීසියානු සමාගමේ lab එකට කිසිම accreditation එකක් නැහැ. South African සමාගමට තිබෙන්න ඕනෑ ASTM standards; American standards තිබෙන්න ඕනෑ, ලංකාවට ගෙන්වන ගල් අඟුරු පරීක්ෂා කරන lab වලට. මේකේ සභාපතිවරයා ඉන්නවා. දැන් මේ වීඩියෝ එක එළියට ගිහින් තිබෙන්නේ. සුදුසු නැති, හොර labsවලින් හොර reports ගෙනැල්ලා තමයි ලංකාට ගල් අඟුරු ගෙනාවේ කියලා ඊයේ COPE එකේදි මේ දෙන්නා පැහැදිලිව පිළිගත්තා. දැන් lab එකත් හොරයි. South African lab එකත් හොරයි, Indonesian lab එකත් හොරයි. Reports ටිකත් හොරයි.

අපි මේක ජනවාරි මාසයේ හෙළි කළා. ජනවාරි මාසයේ දෙවැනි දා වනකොට ඒ පළමුවැනි ගල් අඟුරු නැව ගොඩබානකොටම මේවා බාල ගල් අඟුරු කියලා කිව්වා. මේ ගල් අඟුරු බාල ගල් අඟුරු වනකොට මේ Agreement එකේ තිබෙනවා, ඊළඟට කරන්න ඕනෑ දේවල්. මේ නැව්වල එන්නේ බාල ගල් අඟුරු නම් මේ Agreement එකේ තිබෙනවා, Independent Surveyor කෙනෙක් පත් කරන්න පුළුවන් කියලා.

[ගරු ඩී.වී. චානක මහතා]

මොකද, ඒ කෙනාට ගිහින් lab එකක් නම් කරන්න පුළුවන්. පහකට සැරයක් South Africaවලට ගිහිල්ලා check කරන්න හැකියාව තිබුණා. මාස තුනක් තුළ ගල් අඟුරු නැව් 12ක් ලංකාවට එනකම් මේක හිතා මතා පරක්කු කළා. ඇමතිතුමනි, ඔබතුමා මේ ගැන දන්නවා නේ.

ඒ වාගේම මේක ඇතුළේ තව umpire sample එකක් තිබෙනවා. බිමල් රත්නායක මහත්තයා, umpire sample එක තවම නොරොච්චෝලේ තිබෙනවා. පළමුවැනි නැව් හතරට අදාළව නොරොච්චෝලේ තිබෙන umpire samples හතරම මේ වෙද්දි expire වෙලා ඉවරයි. මේකේ දඩ ගහන්න, අරවා ගන්න, මේවා ගන්න ඔප්පු කරන්න තිබෙන එකම දේ තමයි, මේ umpire sample එක. හැබැයි, හිතා මතා මේ umpire samples ටික check කිරීමේ හැකියාව මග හැරලා තිබෙනවා. ඊයේ අපි COPE එකේදී ඒ ගැන ප්‍රශ්න කළාම මොකක්ද කිව්වේ? ඒකට lab එකක් සොයාගන්න මාස තුනක් ගියාලු, ඒකලු පරක්කු වුණේ. එතකොට බාල ගල් අඟුරු එනවා කියලා දැන දැන මාස තුනක් ගතවනවා, lab එකක් සොයා ගන්න. හැබැයි, කැබ් ගෙනෙන ටෙන්ඩරයට ගතවන්නේ දවස් 13යි; කැබ් 1,500ක් ගේන්න ටෙන්ඩරය ගන්න පුළුවන්, දවස් 13ට. ඊට පසුව ගල් අඟුරු ගෙනෙන ටෙන්ඩරයට ගතවන්නේ දවස් 21යි. හැබැයි, බාල ගල් අඟුරු කියලා check කරන්න ඕනෑ lab එකට යනවා, මාස 3ක්. පුදුම අපූරු ටෙන්ඩර් තමයි යන්නේ. ජයකොඩි ඇමතිතුමා ඔබතුමාට තමයි මේවා කියන්නේ, අනික් පැත්ත බලාගෙන සිටියාට. ඔබතුමා මේක ආරක්ෂා කළා. පළමු ගල් අඟුරු නැව ආපු වෙලාවේ මොකද වුණේ? මේක මේ direct feed කරන එක හොරකමක් විධියට පෙන්වන්නේ. ලංකාවට හැම දාම ගල් අඟුරු ආවායින් පස්සේ direct තමයි feed කරන්නේ. නැත්නම් double handling. මේක unload කරලා, ආයෙත් දාලා, එතකොට double handling, cost එක වැඩියි. එක්කෝ ජයකොඩි ඇමතිතුමා, ඔබතුමා දැන් කරනවා වාගේ ඔබතුමන්ලාගේ batchmate කෙනෙක් හරි දාගෙන ඒක කරන්න තිබුණා. හැබැයි, මොකක්ද කළේ? මෙතුමන්ලා ඉංජිනේරු මහත්වරුන්ට තර්ජනය කළා, direct feed කරන්න එපා, reports ටික එළියට දමන්න එපා කියලා. ඊට පසු හිටපු සභාපතිවරයා ඉල්ලා අස් වනවා, ටෙන්ඩරයට දවස් දෙකකට කලින්, මේ ටෙන්ඩරය දූෂිතයි, මේක හොරකමක් කියලා. ලේකම්තුමාට චෝදනාව දාලා, අමාත්‍යාංශයට චෝදනාව දාලා, කෙළින්ම ඔහු ඉල්ලා අස් වනවා. මොකද, මේක දූෂිතයි, මේකට සභාපතිවරයා හෝ අධ්‍යක්ෂ මණ්ඩලය වග කියන්නේ නැහැ, ඒ වෙනුවට වග කියන්න ඕනෑ ඇමතිතුමා කියලා.

ඒ වාගේම මේකේ තිබෙනවා, තව අපූරු කාරණයක්. මේකේ Agreement එක නීතිපතිතුමාට යවලා අවසර එන්න කලින් අත්සන් කරලාත් ඉවරයි. කොච්චර හදිසියක් තිබුණාද කිව්වොත්, මේකට අවසර එන්නත් කලින් අත්සන් කරලාත් ඉවරයි. බිමල් රත්නායක මහත්තයා මේ විගණන වාර්තාව කියවන්න, මේකේ ඒ දේවල් ලස්සනට තිබෙනවා. ඒ වාගේම තමයි, මේ umpire samples ටික check කරන්න පුළුවන් හැකියාව තිබෙද්දි අනිල් ජයන්ත මහත්තයා මේ පාර්ලිමේන්තුවේදීත්, එළියට ගිහිල්ලා මාධ්‍යයටත් කියනවා, මේ Agreement එක අනුව umpire samples check කරන්න බැහැ කියලා. මේ විගණන වාර්තාවේ පැහැදිලිව තිබෙනවා, umpire samples ටික check නොකිරීම නිසා මේ සම්බන්ධව දඩ අය කරගන්න තිබුණු අවස්ථාව නැති කළා කියලා. මේකේ දිගටම සිදු වෙච්ච දූෂණයට මේ ආණ්ඩුව, ඇමතිතුමා, ජනාධිපතිතුමා ඇතුළු කැබිනට් මණ්ඩලය කියන සියලුදෙනා උදවු කරලා තිබෙනවා. මොකද, මේ දින ගණන් වෙනස් කරද්දි, මේවා කල් දමද්දි, umpire samples check කරන්නේ නැතුව, labs පත් කරන්නේ නැතුව, මාස ගණන් කල් ඇදලා, බාල ගල් අඟුරු කියලා මෙච්චර reports තිබියදී මේ අය කිසිම පියවරක් ගත්තේ නැහැ.

ඊයේ දිනයේත්, මේ දවස් ටිකේමත් විදුලිය කැපුවා. ඇමතිතුමා පාර්ලිමේන්තුවට ඇවිල්ලා කියනවා, එහෙම විදුලිය කැපුවේ නැහැ කියලා. හැබැයි, ඔබතුමා යටතේ තිබෙන National System Operator (Pvt.) Limited එකේ වාර්තාව මා ළඟ තිබෙනවා. එම වාර්තාව මේ අවස්ථාවේදී මම **සභාගත*** කරනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
මට තව පොඩි වෙලාවක් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

විශේෂයෙන්ම ඒ වාර්තාවේ 9වන වගන්තියේ පැහැදිලිව තිබෙනවා, දිගටම විදුලිය කපනවා කියලා. ඒ වාගේම ගල් අඟුරුවල පාඩුව ජනතාවට දමන්නේ නැහැ කියලා ජනාධිපතිතුමා කිව්වා. NSO Report එකේ තිබෙනවා, මේ බාල ගල් අඟුරු නිසා රුපියල් බිලියන 25ක් - රුපියල් කෝටි 2,500ක් - රටේ ජනතාවට විදුලි බිලට දාලා තිබෙනවා කියලා. ඒ නිසා මේ විශ්වාස භංගයට අත ඔසවන, විරුද්ධ වන, - *[බාධා කිරීමක්]* මේ බාල ගල් අඟුරු කියලා නැහැ. *[බාධා කිරීම්]* ඔව්, කියන්න. *[බාධා කිරීමක්]* අකුරු කියවන්න පුළුවන්.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මම මේ කාරණය අහන්න කැමැතියි, ගරු මන්ත්‍රීතුමාගෙන්. මේ විවාදය වැදගත්. ඔබතුමා තොරතුරු දැනගෙන කථා කරන කෙනෙක් නේ. දැන් ඔබතුමා කිව්වා නේ මන්ත්‍රීතුමා, රුපියල් කෝටි 2,500ක් දාලා තිබෙනවා කියලා ජනතාවගේ විදුලි බිලට. අන්න ඒක කියවන්නකෝ.

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ Report එකේ තිබෙනවා, අප්‍රේල්, මැයි, ජූනි මාස සඳහා අවශ්‍ය වන gigawatt hours ප්‍රමාණය. Gigawatt hours 1,381ක් තමයි ඇස්තමේන්තු කරලා තිබෙන්නේ. ගල් අඟුරුවල ප්‍රමිතිය අඩුවීම හැරෙන්න මේක වෙනස් වෙන්න නම් එක්කෝ මැෂින් එකක් කැඩෙන්න ඕනෑ. හැබැයි, ලැබෙන්නේ gigawatt hours 1,131යි. ඒ

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

කියන්නේ gigawatt hours 250ක් අඩුයි. සාමාන්‍යයෙන් අපි පාවිච්චි කරන unitsවලින් ගත්තොත්, මිලියන 250ක්. අද පවතින ඩීසල් මිල එක්ක බැලුවොත් - ඔබතුමන්ලා විකුණන මිල නොවෙයි - unit එකක් 125යි. එතකොට රුපියල් බිලියන 25ක් - රුපියල් කෝටි 2,500ක් - පාඩුයි. මේවා හංගලා ගහන්න ඕනෑ නැහැ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
නැහැ, නැහැ. ඒක නොවෙයි. මේ වෙලාව අපෙන් ගන්නවා. ඔබතුමාටත් දෙන්නම්, තත්පර 30ක්.

ගරු මන්ත්‍රීතුමා, එච්චර හැලි ඕනෑ නැහැ. අපි ඕවාට උත්තර දෙන්නම්. ඔබතුමා quote කරන්නකෝ දැන් කිව්ව එක. ඔබතුමා ඒක කියවන්නකෝ. බාල ගල් අඟුරු නිසා ඒ බිල ජනතාවට පැටෙව්වා කියලා ඔය වාර්තාවේ තිබෙනවා කිව්වා නේ. *[බාධා කිරීමක්]* නැහැ, නැහැ. චානක මන්ත්‍රීතුමා ඒක කියන එක අපට ප්‍රශ්නයක් නැහැ. ඔබතුමා කිව්වා නේ, ඔය report එක සභාගත කරනවා, ඒකේ තිබෙනවා කියලා. අන්න ඒ ටික කියවන්නකෝ. තර්කය ඕනෑ නැහැ. තර්කය දන්නවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ඩී.වී. චානක මන්ත්‍රීතුමනි, ඔබතුමාට පොඩි කාලයක් දෙන්නම්.

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
ගරු බිමල් රත්නායක මැතිතුමනි, ඒක වචනයෙන් ලියලා නැහැ. *[බාධා කිරීම්]* හැබැයි, මේ ගල් අඟුරු බාලයි කියන එක නිපදවන units ප්‍රමාණය අඩු වීම තුළ තිබෙනවා. Units ප්‍රමාණය අඩු වීමත් IMF Report එකේ තිබෙනවා. *[බාධා කිරීම්]* IMF Report එකේත් ඒ ගැන තිබෙනවා, මේ බලන්න. *[බාධා කිරීම්]* මේ වාර්තාවේ සම්පූර්ණයෙන්ම ඒ ගැන තිබෙනවා. මේ වාර්තාව බලන්න; කියවන්න; ගණන් හදන්න; එතකොට දැනගන්න පුළුවන්. ඒක අකුරුවලින් කියන්න ඕනෑ නැහැ. *[බාධා කිරීම්]* ගණන් හදන්න; අඩු වෙලා තිබෙන units ගණන ගන්න; ඒකේ ඩීසල් අගය ගන්න. එතකොට ඔබතුමාට ගණන හදා ගන්න පුළුවන්. බොහොම ස්තුතියි. *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
සභාව නිශ්ශබ්ද වන්න.

මීළඟට, ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.10]

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ ඩී.වී. චානක මන්ත්‍රීතුමා කියපු එක වචනයෙන් මම කියවන්නම්. මේක කියන්නේ වෙන කවුරුවත් නොවෙයි, එවන් පැපජෝර්ජියෝ, මෙරට IMF ප්‍රධානියා. ඊයේ press conference එකේදී තමයි ඔහු මෙහෙම කියා තිබෙන්නේ. අවශ්‍ය නම් ඒක download කර ගන්න පුළුවන්. ඒ press release එකේ මෙසේ සඳහන් වෙනවා:

> "Responding to a query on whether recent losses from coal shipments contributed to the financial strain of the Ceylon Electricity Board, he acknowledged that they had.
>
> 'It is true that these imports had some negative impact on the profits of the Electricity Board, and were therefore one contributing factor to the increase in electricity tariffs,' he said"

සිංහලෙන් කියවන්න අවශ්‍යද? *[බාධා කිරීම්]* පොඩ්ඩක් ඉන්න, පොඩ්ඩක් ඉන්න. *[බාධා කිරීම්]* අනේ, please! බිමල් ඇමතිතුමා, පොඩ්ඩක් ඉන්න. *[බාධා කිරීම්]* අනේ, please! මගේ වෙලාව ගන්න එපා. මම ප්‍රශ්නය සිංහලෙන් අහන්නම්. බාල ගල් අඟුරු නිසා විදුලි බිල වැඩි වෙනවාද?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි 5ක කාලයක් වෙන් වෙලා තිබෙන නිසා මම ඒ වෙලාව ගන්න එක සාධාරණ නැහැ. ඔබතුමා ඒ ගැන කථා කළ නිසායි මම මේ කියන්නේ. දැන් මේ කාරණය මෙහෙම නේ යන්නේ. මම මතු කළා, චානක මන්ත්‍රීතුමා පොඩ්ඩක්,- *[බාධා කිරීමක්]* ප්‍රශ්නයක් නැහැ; ප්‍රශ්නයක් නැහැ. මම එහෙම කිව්වේ ඔබතුමා දැන් අර කාරණයට උත්තර දෙනවාය කිව්ව නිසායි. *[බාධා කිරීමක්]* මෙහෙම නේ. ඒක නොවෙයි නේ ප්‍රශ්නය. දැන් මේ බාල ගල් අඟුරු නිසා හෝ මොනවා හරි නිසා energy loss එකක් වුණා කියන එක සම්බන්ධයෙන් IMF එකට අලුතින් හොයන්න දෙයක් නැහැ නේ. *[බාධා කිරීමක්]* මෙතුමා කිව්වේ ඒක නොවෙයි නේ. මෙතුමා කිව්වේ ඒ වෙච්ච හානිය ජනතාව මත පටවනවා කියලා නේ. අන්න ඒ සම්බන්ධයෙන් ඔය IMF Director කියපු එක කියන්නකෝ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
වැදගත්ම ප්‍රශ්නය මේක තමයි. එතකොට දැන් මේ කියන්නේ මොකක්ද? බාල ගල් අඟුරු නිසා ලංකා විදුලිබල මණ්ඩලයේ පාඩුව වැඩි වුණාද කියන එක තමයි ප්‍රශ්නය. එතකොට මෙරට IMF ප්‍රධානියා කියන්නේ, ඔව්, එහෙම වෙලා තිබෙනවා, ඒ නිසා විදුලි බිල වැඩි වීමට මෙය බලපානවාය කියන එකයි. අපේ ගරු ඩී.වී. චානක හිටපු ඇමතිතුමා ඉදිරිපත් කරපු annex එකත්, මේ IMF document එකත් මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

මම ඒක කියවන්නම්. *[බාධා කිරීම්]* මේක පොඩ්ඩක් අහගන්නකෝ. අපි වාචාල විධියට කථා කරන්නේ නැහැ නේ. Please! *[Interruption.]* මට විනාඩි 5 නේ කථා කරන්න තිබෙන්නේ. *[බාධා කිරීම්]* පොඩ්ඩක් ඉන්න. එතකොට IMF Agreement එකේ පළමුවැනි ඡේදයේම තිබෙන්නේ, Staff Level Agreement එක එන්නේ එක කොන්දේසියක් මත කියන එකයි. ඒ කොන්දේසිය තමයි, cost-recovery tariffs. ඒ කියන්නේ, Ceylon Electricity Board එකේ loss එකක් වුණා නම්, ඒක recover වෙන්න ඕනෑ, reflect වෙන්න නොවෙයි. හොඳට මතක තියා ගන්න, ඉංග්‍රීසි වචන දෙකේ තේරුම. "Cost-reflective", "cost-recovery". Cost recovery කියන්නේ, loss එකක් වුණා නම් tariff එක වැඩි කරලා ඒ loss එක recover කරන්න ඕනෑ

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

කියන එකයි. ඒ කොන්දේසිය මත පමණයි ඩොලර් මිලියන 700 release කරන්නේ කියලා ඒකේ තිබෙනවා. ඊට අදාළ ලේඛනයත් මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

අපේ ගරු චානක සහෝදරයා කිව්වේ මේකයි. *[බාධා කිරීම්]* අහගෙන ඉන්න. ඔබතුමන්ලාට සහෝදරයා කියන්න පුළුවන් නම් එතුමා අපේත් මල්ලි තමයි. *[බාධා කිරීම්]* චානක මල්ලි කිව්වේ මෙච්චරයි. *[බාධා කිරීම්]* මම කියන එක අහගන්නකෝ. මේකේ තිබෙනවා, සාමාන්‍යයෙන් ගිගාවොට් පැය 1,381ක් තමයි මේ උදවිය බලාපොරොත්තු වුණේ ගල් අඟුරුවලින් ජනනය කර ගන්න කියන එක. එතුමා කිව්ව පරිදි දැන් ඒගොල්ලන් revise කරලා මේක publish කළේ පෙරේදා; 08වැනි දා. 08වැනි දා තමයි මේක publish කළේ. මමත් දැනුයි ඒක download කළේ. ඕනෑම කෙනෙකුට මේ සම්බන්ධ විස්තර computer එකෙන් ගන්න පුළුවන්. දැන් ඒගොල්ලන් බලාපොරොත්තු වන්නේ ගිගාවොට් පැය 1,131.59ක්. ඒ කියන්නේ, එතැන ගිගාවොට් පැය 250ක වෙනසක් තිබෙනවා. ගිගාවොට් පැය 250ක් කියන්නේ කොච්චරක්ද? ගිගාවොට් පැය 250ක් කියන්නේ, units මිලියන 250ක්. එතකොට ඔබතුමන්ලා ඩීසල්වලින් විදුලි ඒකකයක් ගන්නේ roughly රුපියල් 95ට. Coalවලින් විදුලි ඒකකයක් ගන්නේ රුපියල් 20ට. එතකොට ඒ දෙක අතර රුපියල් 75ක විතර වෙනසක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ඒ රුපියල් 75 වැඩි කරලා බලන්න. එතකොට රුපියල් බිලියන 19ක් එනවා. එතකොට වැඩි කිරීම හැටියට ඉල්ලන්නේ රුපියල් බිලියන 33ක්. මේකේ තිබෙනවා, රුපියල් බිලියන 33ක් කියලා. ඒ කියන්නේ, නැප්තාවලින් පාවිච්චි කරනවා නම් සියයට 25කින්, නැප්තා නැතුව ඩීසල් පාවිච්චි කරනවා නම් සියයට 30කින් විදුලි බිල වැඩි කරන්න කියනවා. දැන් ඒක download කරන්න පුළුවන්; 08වැනි දා upload කරලා තිබෙනවා. එතකොට බාල ගල් අඟුරු නිසා මේ බිලියන 33න්, බිලියන 19ක loss එකක් තිබෙනවා. ඒ කියන්නේ, වැඩි කිරීම හැටියට ඉල්ලනවා, බිලියන 33ක්. අපි හිතමු, නැප්තා තිබෙනවා කියලා. නැප්තා නැත්නම් බිලියන 41ක් වෙනවා. නැප්තා තිබෙනවා කියලා අපි හිතමුකෝ. I will give you the benefit of the doubt. එතකොට වැඩි වීම බිලියන 33යි. ගල් අඟුරු බාල නිසා loss එක බිලියන 19යි. ඒ කියන්නේ, ගල් අඟුරු නිසා සියයට 57ක වැඩි වීමක් ඉල්ලා තිබෙනවා. මේක මම නොවෙයි කියන්නේ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
අහගෙන ඉන්න. අහගන්න, මේවා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මෙහෙම කියන්නේ, ලංකා විදුලිබල මණ්ඩලයේ NSO එක. ඊට අදාළ ලේඛනය මම සභාගත කළා. පුළුවන් නම් එය හැන්සාඩ් වාර්තාවටත් ඇතුළත් කරන්න. මොකද, අපි දත්තත් එක්ක නේ කථා කරන්නේ, සහෝදරවරුනි. මම මඩ ගහන්නේ නැහැ; කිසිම මඩක් ගහන්නේ නැහැ; කාටවත් මඩ ගහන්නේ නැහැ. මම කියන්නේ එකම දෙයයි. IMF එක ඩොලර් මිලියන 700ට එකඟ වුණේ එක කොන්දේසියක් මත. ඊට අදාළ ලේඛනයත් මම සභාගත කළා. ඒ කොන්දේසිය තමයි, විදුලි බිල cost-reflective වෙන විධියට වැඩි කළ යුතුයි කියන එක. ඒක අවම වශයෙන් සියයට 25ක් හෝ සියයට 30ක් විය යුතුයි කියලා PUCSL එකට දීලා තිබෙනවා. ඒගොල්ලන් ඒ ගැන තීරණය කරයි. බාල ගල් අඟුරු නිසා ඒ වැඩි වීමෙන් සියයට 57ක්, රුපියල් බිලියන 19ක loss එකක් තිබෙනවාය කියනවා. ඊට අදාළ ලේඛනය මම සභාගත කළා. ඉතින්, ඕක තමයි ඇත්ත. ඕක නොවෙයි නම් ඇත්ත, ඔබතුමන්ලා නැඟිටලා මේ දත්ත වෙනුවට වෙනත් දත්ත ඉදිරිපත් කරන්න.

බොහොම ස්තුතියි.

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ඩී.වී. චානක මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point එක මොකක්ද?

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, සභානායකතුමා මගේ නම සඳහන් කළා. National System Operator (Private) Limited එකේ වාර්තාව මම සභාගත කළා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔය සංවාදය දැන් නතර කරමු.

ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.17]

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

අද අපි මේ පවත්වන විවාදයට මූලික වශයෙන්ම විපක්ෂයත් පාදක කර ගන්න ප්‍රධානම ලේඛනය වෙන්නේ මම හිතන විධියට විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් ගල් අඟුරු සම්බන්ධයෙන් ඉදිරිපත් කර තිබෙන වාර්තාව. මේ වාර්තාව මේ ආකාරයට පාර්ලිමේන්තුවට ඉදිරිපත් වෙලා අද අපට ඒ ගැන සාකච්ඡා කිරීමට අවස්ථාව ලැබුණේ COPE එකේ සභාපති නිශාන්ත සමරවීර මැතිතුමා මේ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වලා, මේ සම්බන්ධයෙන් වාර්තාවක් ඉල්ලූ නිසායි. ඒ නිසා රජය හැටියටත් මම හිතන විධියට අපි විශේෂයෙන් COPE එකේ සභාපතිතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ, ඒ උනන්දුව මේ කාරණය සම්බන්ධයෙන් ඉතාම නිර්පාර්ශ්වික ලෙස ගත්තාට.

***** **පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම හිතන විධියට රජයක් හැටියටත්, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් හැටියටත් අපට වැදගත්ම දෙයක් තමයි, මේ විගණන වාර්තාව හරහා ඉදිරිපත් වෙලා තිබෙන කරුණු. අපට විපක්ෂයේ අය කතන්දර ගොඩක් කියනවා. අපි ඒ හැම දෙයකටම උත්තර දෙන්න ගියොත් මම හිතන විධියට මේ විවාදයත් හැම විවාදයක් වාගේම අයාලෙ යනවා. ඒ නිසා අපි හිතනවා, විගණන වාර්තාව විසින් ඉදිරිපත් කරලා තිබෙන ප්‍රධාන කාරණා කිහිපයක් අපි මේ වෙලාවේදී ලිහා ගන්නට අවශ්‍යයි කියලා.

පළමුවැනි කාරණය මේකයි. දිගින් දිගටම වැරදි අදහසක් මතු වෙනවා, ටෙන්ඩරයේ පිරිවිතරයන් - specifications - සම්බන්ධයෙන්. අදත් මන්ත්‍රීවරුන් කිහිපදෙනෙක් ඒ සම්බන්ධයෙන් ප්‍රකාශ කළා. ඔව්, විගණන වාර්තාවේ තිබෙනවා, මේ පිරිවිතරයන් අඩු කිරීමක් සම්බන්ධයෙන්. විගණන වාර්තාවේ පිටු අංක 16හි පිරිවිතරයන් හැටියට බොහොම පැහැදිලිව ප්‍රකාශ කර තිබෙනවා, "ලියාපදිංචිය සඳහා අයදුම් කරනු ලබන සැපයුම්කරුවෙකුට අවසාන මාස 36 තුළ ගල් අඟුරු මෙට්‍රික් ටොන් පන්ලක්ෂයක් ඉක්මවා සපයා තිබීමේ පළපුරුද්ද තිබිය යුතු අතර, එයින් අවම මෙට්‍රික් ටොන් ලක්ෂයක් GCV 5,900 kilocalories per kilogram හෝ ඊට වැඩි අගයක් ගත යුතුයි" කියලා. එය අලුතෙන් එකතු කරපු කොන්දේසියක් හැටියට තිබෙනවා. ඒ කොන්දේසිය සම්බන්ධයෙන් යම් කරුණු ප්‍රමාණයක් විගණන වාර්තාවේ ඉදිරිපත් කරලා තිබෙනවා. හැබැයි, විපක්ෂය මේ අවස්ථාවේදී හිතා මතාම මඟ හරින, සඳහන් නොකරන කාරණයක් තිබෙනවා. ඒ කාරණය ඒ ඡේදයට යටින් එහෙමම තිබෙනවා. ඒ කාරණය තමයි, "2023 ජූනි 23 සංශෝධිත ඉහත කොන්දේසියට..." කියන එක. මේ කොන්දේසිය අද මේ විශ්වාස භංග යෝජනාවට පාත්‍ර වෙලා සිටින, මේ චෝදනාව ලබා තිබෙන කුමාර ජයකොඩි ඇමතිතුමාගේ ධුර කාලය තුළ වෙනස් වෙච්ච කොන්දේසියක් නොවෙයි. මේක වෙනස් වෙලා තිබෙන්නේ මම හිතන විධියට ඉස්සෙල්ලා කථා කළ ඩී.වී. චානක මන්ත්‍රීතුමා රාජ්‍ය ඇමති වෙලා හිටපු කාලයේ. 2023 ජූනි 23වැනි දා තමයි මේ කොන්දේසිය සංශෝධනය කරලා තිබෙන්නේ. ඉතින්, ඒ තරම්වත් දෙයක් පිළිගන්න අවංකකමක් තිබෙන්නට ඕනෑ. තමන්ගේ ආණ්ඩුව කාලයේ සංශෝධනය කරපු කොන්දේසියක්වත් පිළිගන්නේ නැහැ. විශ්වාස භංගයකට මාට්ටු කරලා ඒකත් පටවන්න හදනවා, කුමාර ජයකොඩි ඇමතිතුමා වෙත. අපි නැවතත් බොහොම පැහැදිලිව කියන්නේ, කුමාර ජයකොඩි ඇමතිතුමා යටතේ හෝ ජාතික ජන බලවේගය රජය යටතේ මේ tender specification එකේ කිසිදු වෙනසක් සිද්ධ කරලා නැහැ කියන එකයි. අපි තිබුණු tender specification එකම තමයි පාවිච්චි කරලා තිබෙන්නේ. ඇමතිවරයා මේ ක්‍රියාවලියට කිසිදු ආකාරයකින් එවැනි මැදිහත් වීමක් කරලා නැහැ.

වැදගත්ම කාරණය මේකයි. මෙතැනදී විශ්වාස භංගය එල්ල වෙලා තිබෙන්නේ කුමාර ජයකොඩි ඇමතිතුමාටයි. මෙතැනදී ඇමතිතුමා කරපු මැදිහත් වීම මොකක්ද? මෙතැනදී ඇමතිතුමාට යම්කිසි දූෂණ චෝදනාවක් එල්ල වෙනවාද? ඒක තමයි වැදගත් කාරණාව. ආණ්ඩු පක්ෂය විධියට අපට වැදගත්ම කාරණය ඒකයි. අපේ පක්ෂයේ සාමාජිකයෙක්; අපේ කැබිනට් මණ්ඩලයේ ඇමති කෙනෙක් මේ ක්‍රියාවලියට මැදිහත් වෙලා යම්කිසි අකටයුතු ක්‍රියාවක් කරලා තිබෙනවාද කියන එක තමයි අපට වැදගත් දේ. අද, මේ වනතුරුම විපක්ෂයෙන් එවැනි චෝදනාවක් එල්ල කළේ නැහැ. මේ පිරිවිතරය අපේ රජය කාලයේ වෙනස් කරපු එකක් නොවෙයි.

අනෙක් කාරණය තමයි, ලියාපදිංචිය සම්බන්ධයෙන් මතු වෙච්ච කාරණය. විගණන වාර්තාවේ ඒ ගැන සඳහන් වෙනවාය කියනවා. ඔව්, සඳහන් වෙනවා. මේ සමාගම ලියාපදිංචි නොවුණු ආයතනයක් ලෙස විගණන තුළ වාර්තාව හඳුනාගෙන තිබෙනවා. 2025 අගෝස්තු 18වැනි දා තමයි මිල කැඳවීම සිද්ධ කරන්නේ. ඒ මිල කැඳවීම සිද්ධ කරන අවස්ථාව වෙනකොට - අගෝස්තු 18 වෙනකොට - bidding document එක issue කරන අවස්ථාව වන විට මේ ආයතනය ලියාපදිංචි වෙලා නැහැ, එම නිසා මේක ලියාපදිංචි නොවන ආයතනයක්ය කියන චෝදනාව තමයි මෙතැනදී මතු වෙන්නේ. දැන් අපි බලන්න ඕනෑ, ලියාපදිංචි නොවීමට හේතුව මොකක්ද කියලා. Trident Chemphar Limited එක අගෝස්තු 18වෙනි දාට පෙර ලියාපදිංචි වීම සඳහා ගෙවිය යුතු ඇමෙරිකානු ඩොලර් 5,000ක ගෙවීම කිරීමට අසමත් වුණාය කියන කාරණය මත තමයි එය ලියාපදිංචි නොවුණු ආයතනයක් ලෙස නම් වෙන්නේ. අපි ඊයේ COPE එකේදී මේ පිළිබඳව සාකච්ඡා කළා. මමත් COPE එකේ සාමාජිකාවක්. අපි ඊයේ COPE එකේ මේ ගැන පැය ගණනක් සාකච්ඡා කළා. මොකද, ලියාපදිංචි නොවන ආයතනයක් කියන කාරණය බරපතළ චෝදනාවක්. ඒක අපි හැමෝටම පිළිගන්න පුළුවන්. අපේ රජය යටතේ එහෙම දෙයක් සිද්ධ වුණේ කොහොමද කියන එක ගැන අපටත් ප්‍රශ්න කරන්න අවශ්‍යතාවක් තිබෙනවා. එම නිසා තමයි COPE එක විධියට අපි මේ කාරණය ගැන සාකච්ඡා කළේ. අපි දිගටම කථා කළා, "මෙය ලියාපදිංචි නොවන ආයතනයක් කියලා කියනවා; ඇයි, මේ ලියාපදිංචි නොවන ආයතනයක් කියන්නේ?" කියන එක.

අගෝස්තු 18වැනි දා වෙනකොට මේ ආයතනය ඩොලර් 5,000ක් බැංකුගත කරලා තිබෙනවා. ඒ බැංකුගත කළාට අපේ රටට ඒ මුදල් transfer වෙලා තිබෙනවාද කියන ගැටලුව තමයි තිබෙන්නේ. අගෝස්තු 18වැනි දා ඩොලර් 5,000ක් බැංකුගත කළාට ඩොලර් 4,980ක් තමයි මෙහෙට transfer වෙන්නේ. Lanka Coal Company - LCC - එකට current account එකක් නැහැ කියලා කිව්වා. එම නිසා බැංකු commission එකක් හැටියට ඩොලර් 20ක් කැපිලා ගිහිල්ලා තිබෙනවා. අපි ඇත්තටම බැලුවොත්, මේ ආයතනය අගෝස්තු 18වන දා වෙනකොට ඩොලර් 20ක් ගෙව්වේ නැති එක තමයි ලියාපදිංචි නොවීමට තිබෙන කාරණය. ඒ මුදල අගෝස්තු 19වන දා වනකොට ලැබෙනවා. 2025 අගෝස්තු 22වන දා වෙනකොට මේ ආයතනය ලියාපදිංචි ආයතනයක් බවට පත් වෙනවා. ඒ බව විගණන වාර්තාවේ පිටු අංක 18හි සඳහන් වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඔබතුමිය මේ පිටුව බැලුවොත්, එහි බොහොම පැහැදිලිව පෙන්වා තිබෙනවා, එක් එක් සැපයුම්කරුවන් මේ මුදල් ගෙවා තිබෙන්නේ කවදාද කියලා. ඒ කියන්නේ ලියාපදිංචි වෙච්ච සැපයුම්කරුවන් ලියාපදිංචි ගාස්තුව ගෙවලා තිබෙන්නේ කවදාද කියන එක. Potencia FZ LLC, 2025 අගෝස්තු 18වන දා. A2A Trading FZE, 2025 අගෝස්තු 15වන දා. Panacape Trading DMCC, 2025 අගෝස්තු 19වන දා. Panacape Trading DMCC කියන ආයතනයත් bidding document එක issue කළාට පස්සේ, මේ කියන ආකාරයට අගෝස්තු 18වන දාට පස්සේ තමයි මේ ගෙවීම සිද්ධ කරලා තිබෙන්නේ. නමුත්, ඔවුන්ටත් bidding document issue කරලා තිබෙනවා. Trident Chemphar Limited 2025 අගෝස්තු 22වන දා. ඊළඟට, Spiriko Limited, මුදල් ගෙවා නොමැත. PERSEVERANCE DMCC, 2025 අගෝස්තු 15වන දා. එතකොට බොහොම පැහැදිලිව පෙනෙන දෙයක් තමයි, 2025 අගෝස්තු 18වන දාට පසුව මේ මුදල ගෙවීමට - ඉතා කෙටි කාලයක; දවසක, දෙකක කාරණයක් මේක - තිබෙන අවස්ථාව, කිසිම කෙනෙකු මැදිහත් වෙලා Trident Chemphar Limited එකට විශේෂයෙන් ලබා දීලා නැහැ කියන එක. ඒ අවස්ථාව ලබා දෙන්නේ උපරිම සැපයුම්කරුවන් ප්‍රමාණයක් ලියාපදිංචි කර ගැනීමට තිබෙන වුවමනාව මතයි. ඒ අවස්ථාව නිකම් ලබා දෙන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ඒක

[ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය]

High-level Procurement Committee, එහෙම නැත්නම් ඉහළ මට්ටමේ ප්‍රසම්පාදන කමිටුව විසින් සලකා බලා තමයි මේ ආකාරයට මේ අවස්ථාව ලබා දෙන්නේ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට තවත් විනාඩි දෙකක කාලයක් ලැබෙනවා.

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
බොහොම ස්තුතියි.

මේක High-level Procurement Committee එකේ අවසරය ඇතිව කළ දෙයක්. එහි සාකච්ඡා කරලා තිබෙනවා. ඒක minutesවල තිබෙනවා. ඒක, විගණන වාර්තාවේ පිටු අංක 484හි සඳහන් වෙලා තිබෙනවා. High-level Procurement Committee එකේ minutesවල තිබෙනවා, "LCC mentioned that recently approved coal suppliers are still in the process of registering by making payment of USD 5000. SHLPC informed the LCC to inform them that any coal supplier will not be eligible for bidding without being registered by paying USD 5000 before the submission of the bid" කියලා. ඒ කියන්නේ, bidding documents ටික issue කරන දවසට පෙර නොවෙයි, bid එක submit කරන දවසට පෙර US Dollars 5,000 ගෙව්වේ නැත්නම් තමයි මේ bid එකට eligible වෙන්නේ නැත්තේ කියන කාරණය තමයි SHLPC එක විසින් දැනුම් දෙන්නේ. මේක තමයි ලියාපදිංචි නොවීම සම්බන්ධයෙන් තිබෙන හේතුව. මේක ගැන තමයි මෙච්චර කථා කරන්නේ. අපි මේක තේරුම් ගන්න ඕනෑ නේ. මුල් ලේඛනය දිහා බැලුවොත්, bidding document එක දිහා බැලුවොත් මේ කියන කාරණා ඔක්කෝම හරි. නමුත් ඇත්තටම මෙතැන තිබෙන්නේ, පැය ගණනක, ඩොලර් 20ක ප්‍රශ්නයක්.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේක 2024 - 2025 අවුරුද්දේදී වුණේ කොහොමද කියා අපි බලමු. මම හිතන විධියට, මේ ටෙන්ඩර් එක පටන් ගන්නකම්, අලුත් සැපයුම්කරු එනකම් රටට coal supply කළේ Potencia LLC එක. ඒ සමාගම ලංකාවට අවුරුදු තුනක් ගල් අඟුරු සැපයුවා, සැපයුම්කරුවෙකු හැටියට ලියාපදිංචි නොවී. Potencia LLC එක ලියාපදිංචි වුණේ 2025 අගෝස්තු මාසයේ 18වැනි දා. එදා ලියාපදිංචි වෙනකම් ලංකාවේ ලියාපදිංචිගත සැපයුම්කරුවෙකු විධියට එම සමාගම coal supply කරලා නැහැ. ලියාපදිංචි නොවූ සැපයුම්කරුවෙකු විධියට තමයි අවුරුදු තුනක් coal supply කළේ. එතකොට මේ මහත්වරු කොහේද හිටියේ? එතකොට ඩී.වී. චානක මන්ත්‍රීතුමා තමයි බලශක්තිය සම්බන්ධයෙන් හිටපු රාජ්‍ය ඇමති. එතකොට, ඒ සමාගමට කොහොමද ටෙන්ඩර් එක ලැබෙන්නේ? Unregistered company එකක් කොහොමද මේක ගන්නේ? එවකට හිටපු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහත්මයා කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරපු කැබිනට් පත්‍රිකාවකින්. ප්‍රසම්පාදනය මඟින් තෝරා ගන්නා ලද Aditya Birla කියන සමාගමේ contract එක terminate කරලා තමයි මේ Potencia LLC එකට අලුතින් - කිසිදු ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් තොරව Cabinet decision එකකින් - මේ coal supply tender එක ලබා දෙන්නේ. ඒකට තමයි දේශපාලන මැදිහත්වීම කියලා කියන්නේ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ඒක තමයි වංචාව. ඒක තමයි දේශපාලන මැදිහත්වීම. විපක්ෂයේ ඔබතුමන්ලා පුළුවන් නම් පෙන්වන්න, කුමාර ජයකොඩි ඇමතිතුමා එහෙම මැදිහත්වෙලා තිබෙන්නේ කොතැනටද කියලා. අපිට වැදගත් වෙන කාරණය ඒකයි. මේ රජයට වැදගත් කාරණය ඒකයි. අපේ හෘදය සාක්ෂියට වැදගත් වෙන කාරණය ඒකයි. ඒ නිසා ඔබතුමන්ලාට ඒක පෙන්වීමේ වගකීම තිබෙනවා. මම බොහොම කරුණාවෙන් ඉල්ලනවා, ඇමතිතුමා එහෙම මැදිහත්වෙලා තිබෙන්නේ කොතැනටද කියන එක පෙන්වන්න කියලා.

අනෙක් කාරණය, accreditation සම්බන්ධ ගැටලුව. මේ ගැනත් බරපතළ ලෙස සමාජය තුළ කථා වෙනවා. "විගණන වාර්තාව, විගණන වාර්තාව" කියලා කිව්වාට මම හිතන්නේ නැහැ කවුරුවත්, පැහැදිලිව කිව්වාය කියලා. ඊයේ කෝප් කමිටුවේදී accreditation කියන කාරණය සම්බන්ධව දීර්ඝ ලෙස සාකච්ඡා කළා. Load port එකට accreditation ගන්නේ supplier. Discharge port එකට accreditation තෝරා ගන්නේ Lanka Coal Company එක. Lanka Coal Company එක tender එකක් call කරලා accreditation සඳහා ඉන්දියාවේ Cotecna කියන සමාගම තෝරාගෙන තිබෙනවා. ඒ වාගේම අපේ supplier තෝරාගෙන තිබෙනවා, Mitra SK කියන දකුණු අප්‍රිකානු සමාගම. ඒ Mitra SK කියන සමාගම accredited නැහැයි කියන කාරණය අසත්‍යයක්. Mitra SK කියන සමාගමට coalවල quality එක බැලීම සඳහා, තව කාරණා බොහොමයකට accreditation තිබෙනවා. මේ කියන ASTM accreditation එක ඒ සමාගමට තිබෙනවා. හැබැයි, ඔවුන්ට අළු විශ්ලේෂණය කිරීමට accreditation නැහැ. මේ ගැන අනුර කරුණාතිලක ඇමතිතුමා බොහොම පැහැදිලිව ප්‍රකාශ කළා. අළුවල ප්‍රතිශතය බැලීමට නොව, අළුවල සංයුතිය සම්බන්ධව විශ්ලේෂණය කිරීමට ඔවුන්ට accreditation එකක් නැහැ. ඒකට හේතුව තමයි - ඊයේ COPE එකේ හිටපු විපක්ෂයේ මන්ත්‍රීවරුත් මේක ගැන දන්නවා; ඒක තමයි එතැන සාකච්ඡා වෙච්ච කාරණය - ලෝකයේ ගොඩක් රටවල් අළුවල සංයුතිය කියන කාරණය check කරන්නේ නැහැ. මොකද, එහෙම කිරීමට අවශ්‍යතාවක් නැහැ.

ලංකාවට වුණත් මේ ගල් අඟුරු නැව් reject කරන්න බැහැ, අළු සංයුතිය මත පදනම්ව. ඒක, reject කිරීමේ condition එකක් නොවෙයි. අප මේ අපේ පරිසර යෝග්‍යතාව සඳහා කරන පරීක්ෂණයක්, ඒක. ඒ නිසා තමයි ගොඩක් accreditation තිබෙන labsවලට, එනම් accredited labsවලට ඒක කිරීමේ හැකියාවක්,- මේ කියන Mitra SK කියන South African සමාගම Gross Calorific Value - GCV - බලන්නත් accredited, sulphur බලන්නත් accredited, moisture බලන්නත් accredited, size එක බලන්නත් accredited; ඒ හැම දේටම accredited. එක කාරණයක් සම්බන්ධයෙන් ඔවුන්ට එසේ කිරීමේ හැකියාවක් නැහැ. ඒක නිසා තමයි ඔවුන් යෝජනා කරන්නේ, ඉන්දුනීසියාවේ තිබෙන ඔවුන්ගේම counterpart lab එකක් වන Mitra SK - Indonesia කියන lab එකට මේක කිරීමේ හැකියාව තිබෙනවා, ඒ නිසා ඔවුන්ට මේ කටයුත්ත කිරීමට අවස්ථාව ලබා දෙන්න කියලා. ඒක තමයි ඔවුන් ඉල්ලන්නේ. ඔවුන්ගේ accreditation එක දෙසැම්බර් 29වන දා වනකොට expire වෙලා තිබෙනවා කියන කාරණය ඇත්ත. ඒක අපි ඊයේ COPE එකේදීත් බැලුවා. ඒ කාරණය ඇත්ත. ඒක දෙසැම්බර් 29වන දා වනකොට expire වෙනවා කියන කථාව ඇත්ත වුණාට ඒකෙන් අදහස් වෙන්නේ නැහැ Mitra SK - South Africa කියන එක unaccredited lab එකක් කියලා. එහෙම කීමේ හැකියාවක් කිසිසේත්ම නැහැ.

බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්තුමා ඉතා පැහැදිලිව කමිටුවට පැහැදිලි කළා, මොකක්ද මේ accreditation කියන්නේ, accreditation නැත්තේ මොන කොටසටද, අපට ඒක වැදගත් වෙන්නේ ඇයි, අපි ඊළඟට ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්නේ කොහොමද කියන ඒවා ගැන. රජය හැටියට අපි කැමැතියි,

ටෙන්ඩර් ක්‍රියාවලිය ගැන මේ තරම් details එක්ක කථා කිරීමට අපට අවස්ථාව ලැබීම ගැන. මම අර ඉස්සෙල්ලා කිව්වා වාගේ, ගරු අසිත නිරෝෂණ මන්ත්‍රීතුමා කිව්වා වාගේ කැබිනට් එකෙන් ටෙන්ඩර් එක cancel කරලා කාට හරි ටෙන්ඩර් එක දීපු රටක්, මේක. ඒක හින්දා procurement එක - lab එක accredited ද, ඩොලර් 20 ගෙවලා තිබෙනවාද, පැය කීයක් පරක්කු වුණාද ආදිය - සම්බන්ධයෙන් මේ තරම් details එක්ක කථා කරන්න, එතැනට මේ සාකච්ඡාව ගෙනෙන්න අපි බොහොම කැමැතියි. ඔබතුමන්ලාට අපට ගෙනෙන්න තිබෙන චෝදනාව ඕකයි. ඒක නිසා අපි කැමැතියි එතැනට මේ සාකච්ඡාව ආපු එකට. අපි දිගටම ඒ standard එක maintain කරනවා. ඒ විතරක් නොවෙයි, රජය හැටියටත්, COPE එක හැටියටත් අපි මැදිහත් වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, Audit එකක් කියන්නේ, කාටවත් වගවීම පටවන්නම,- COPE එක හැටියට අපි Audit Reports ගොඩක් බලනවා. ඒ හැම Audit Report එකක් අවසානයේම ඇමතිවරයා ඉල්ලා අස්විය යුතුයි කියලා අපි තීරණය කරන්නේ නැහැ. ඒවායේ වෙන වෙන ක්‍රියාවලිවල ගැටලු තිබෙනවා. ඒ ගැටලු නිවැරැදි කර ගැනීමටයි audit එකක් කරන්නේ. කාගේ හරි නිශ්චිත වගකීමක් තිබෙනවා නම්, ඔවුන්ට වගකීම පවරන්නයි audit එකක් කරන්නේ. මෙතැන නිශ්චිත වගකීම පැහැදිලි කරනවා. ඇමතිතුමා කර තිබෙන දේශපාලන මැදිහත් වීමක් මේකේ නැහැ. මේක සම්පූර්ණයෙන්ම දෙන්නේ කැබිනට් මණ්ඩලය විසින් තීරණය කරන ලද supplier කෙනෙකුට නොවෙයි. මේක procurement committee එකකින් තමයි කරන්නේ. ඒ සම්බන්ධව ගත්තු හැම තීරණයක් සම්බන්ධයෙන්ම Minutes තිබෙනවා. මෙතැන ඇමතිතුමාගේ කිසිම දේශපාලන මැදිහත්වීමක් නැහැ, එතුමා කැමැති supplier කෙනෙකුට මේක ලබා දෙන්න කියලා.

Potencia LLC කියන සමාගම හම්බ වුණා කියලා ලොකු කථාවක් කියනවා නේ. මම දන්නේ නැහැ, මට පෙනෙන හැටියට Potencia LLC කියන සමාගම ඇමතිවරුන් හමු වීම ගැන වානක මන්ත්‍රීතුමා ගොඩක් දන්නවා. එතුමාගේ කාලයේ තමයි Potencia LLC කියන සමාගමට දීලා තිබෙන්නේ, කැබිනට් මණ්ඩල තීරණයකින්. අපි එහෙම දීලා නැහැ. මේ කියපු කට්ටියට දීලා නැහැ. ඒවා තමයි අත යට ගනුදෙනු. ඒක හින්දා අපි මේ දේවල් බොහොම වගකීමෙන් කියන්නේ. අපට හෘදය සාක්ෂියක් තිබෙනවා. අපි ඒක හින්දයි දේශපාලනය කරන්නේ. මෙතුමන්ලාට හෘදය සාක්ෂියක් තිබෙනවා නම් අඩු ගණනේ තමන්ගෙන් වෙච්ච වැරැදි කියන්න පුළුවන් වෙන්න එපායැ. ඒවා කියන්නේත් නැහැ. අපි බොහොම වගකීමෙන් ජනතාවටත්, පාර්ලිමේන්තුවටත් කියන්නේ, මේ රජයෙන් වංචා, දූෂණ සිද්ධ වෙන්නේ නැහැ කියලා අපට විශ්වාසයක් තිබෙනවා කියන එකයි. අපට විශ්වාසයක් තිබෙනවා, විපක්ෂයේ ඉන්න මේ මජර දේශපාලනඥයින්ගෙන් අපි මේ චෝදනා ලබන්න ඕනෑ නැහැ කියලා. අපේ වගවීම අපි maintain කරනවා. අපේ වගවීම maintain කරන හින්දායි COPE එකේ සභාපති මැදිහත් වෙන්නේ. *[බාධා කිරීම්]* රජය හැටියට අපි අපේ වගවීම හැම තිස්සේම ඉහළට දමා ගන්නවා. අප ඒ පොරොන්දුව, වගවීම ජනතාව මත තියමින් මම මේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට වෙලාව ලබා දුන්නාට.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.34]

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඇත්තටම, මේ කථාව මම පටන් ගන්න ඕනෑ කාන්තාව බේරා ගන්න කථාවෙන්. ඒ කියන්නේ මේ රටේත්, අපේ විපක්ෂයේත් ගොඩක් කාන්තාවන් ඉන්නවා. කාන්තාවට අපහාස කරන කථාවකින් තමයි මම මෙතැන කථාව පටන් ගන්න කැමැති. ඇත්තටම එහෙම කාන්තාව ආරක්ෂා කරනවා නම් ආණ්ඩු පක්ෂයේ එක මන්ත්‍රී කෙනෙකුටවත් අපට බණින්න බැහැ; මොනවත් අහන්න බැහැ. ඔක්කොම කාන්තාවෝ ඉන්නේ. ඒ නිසා මේ කාන්තාවන්ට මම කියන්න කැමතියි, ඔයගොල්ලන්ට හෘදය සාක්ෂියක් තිබෙනවා නම්,- පාර්ලිමේන්තුවට එන්න කලින් අපේ ජනාධිපතිතුමා ගැන මට පොඩි විශ්වාසයක් තිබුණා. එතුමා ආවොත් අපේ රට සම්පූර්ණයෙන්ම ලස්සන වෙලා, වොෂින්ටනයට අරගෙන ගිහිල්ලා හෝදලා ආපහු ගෙනැල්ලා, ඩෝබිලාට දාලා ලස්සන කරයි කියලා මම විශ්වාස කළා. එහෙම විශ්වාස කරගෙන උතුරට ගිහිල්ලා හැම මිනිස්සුන්ටම මම කිව්වා, අනේ, අනුර කුමාර දිසානායකට ඡන්දය දමන්න කියලා. එතකොට මිනිස්සු ඔක්කොම බැන්නා, මට. ඒ කාලයේ මට ඒක තේරුණේ නැහැ. හැබැයි, දැන් පට්ටම පැහැදිලියි.

සාමාන්‍යයෙන් මම මේක කියන කොට ඔයගොල්ලෝ මා එක්ක තරහ වෙනවා. හැබැයි, මම දන්න සිංහලෙන් කියන්නම්. මට සිංහල මිනිස්සුම කියලා දීපු එකක් මම කියන්නම්. සිංහල කියමනක් තියෙනවා, "සිංහලයෝ මෝඩයෝ, කැවුම් කන්න යෝධයෝ" කියලා. මම දන්නේ නැහැ. මම කියන්නේ නැහැ. දෙමළ කෙනෙක් හැටියට මම ඒක කියන්නේ නැහැ. හැබැයි, මම මෙහෙම කියන්නේ මේ නිසා. විපක්ෂය යම්කිසි - මොකක් හරි - චෝදනාවක් කරනවා නම් ජනාධිපතිවරයා මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා ඒක හෝදලා යනවා. හැමදාම කරන්නේ ඒකයි. එහෙම හෝදන්න පුළුවන් මේ ලෝකයේ - රටේත් නොවෙයි, ලෝකයේම - ජනාධිපතිවරයාට විතරයි. අපට හැම දාම කියන්නේ, "ලක්ෂ දහයද බං උඹලාට, මේ ටකරම් දෙකක් අරගෙන යන්න ලක්ෂ විස්සක් දෙන්නම්" කියලා. මම කවදාවත් දැකලා නැහැ එහෙම ටකරමකට ලක්ෂ දහයක් දීපු එකක්. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, හැබැයි මම කනගාටු වෙනවා, මේ විධියට

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

කියලා ඉතිහාසයට නම අරගෙන **තියලා** ගෙදර යනකොට කැක්කුම කොච්චර ලොකුද කියලා මට තේරෙන්නේ නැහැ. ආයේ පාරට යන්නත් බැහැ. මම හිතන විධියට, උපරිම අවුරුදු 10ක් ජනාධිපති වෙලා ඉන්න පුළුවන්. මම විශ්වාස කරන්නේ නැහැ, ඊට වැඩිය පුළුවන් කියලා. ඊට පස්සේ ජනාධිපති වෙලා ඉන්නත් බැහැ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, හිතලා බලන්න, එතකොට පාරේ යන කොට

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

කියලා කියන කොට කොච්චර කැක්කුමක් එනවාද? ඔය පැත්තේ මගේ සහෝදරයෝ ගොඩක් ඉන්නවා, යාළුවෝ ගොඩක් ඉන්නවා. මම නමත් එක්කම කියන්නම්. ඩොක්ටර් නලින්ද ජයතිස්ස ඉන්නවා, අපේ Prime Minister ඉන්නවා, සුනිල් වටගල මහත්මයා ඉන්නවා. අපි විශ්වාස කරනවා, ඒගොල්ලෝ යම්කිසි ප්‍රමාණයකට හෘදය සාක්ෂියට අනුව වැඩ කරනවා කියලා.

[ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා]

අපේ තාත්තා පොලීසියේ. මගේ පවුලේ අය මට කියලා දුන්නේ මෙහෙමයි. "අයියා වැරැද්දක් කළා නම් බේරා ගන්න යන්න එපා, කලින් ගහපන් අයියාට" කියලා. එහෙම තමයි අපිව හැදුවේ අපේ ගෙවල්වලින්. හැබැයි, මේකේ එක්කෙනෙක් වැරැද්දක් කළාම ඒක වැරදිද නැද්ද, *prima facie* ද නැද්ද කියන එක වෙනම කථාවක්. මම හොරෙක් කියලා කවුරු හරි මට අත දික්කරනවා නම්, මම කලින්ම කියනවා, "ඕක ගැන මට investigation එකක් කරන්න, මම යන්නම්" කියලා. අපි කවුරුත් ඉල්ලන්නේ නැහැ,- මම කියන්නේ නැහැ, "ඔන්න, කුමාර ජයකොඩි ඇමතිතුමා සල්ලි අරගෙන ගෙදරට ගියා" කියලා. එහෙම ගෙදරට යනවා නම්,-

මම තව දෙයක් කියන්න ඕනෑ, අපේ ලාල් කාන්ත ඇමතිතුමාට. එයා කොණ්ඩෙ තිබුණු කාලයේ කියපු කථාවක් තියෙනවා. මම මේ කියන්නේ අවුරුදු 10කට කලින් කියපු කථාවක් ගැන. දැන් කොණ්ඩය නැති කාලයේ ඇවිල්ලා අහනවා, "කෝ ඔයාට සල්ලි, wife උදේ 4.00ට නැඟිටිනවාද?" කියලා. ඒ කියන්නේ, අවුරුදු 10කට කලින් කථාවක්-

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, මාතෘකාවට අදාළව කථා කරන්න.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
කථා කරනවා. ඔබතුමිය මාතෘකාවට අදාළද, නැද්ද කියලා හොයා ගන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔය මාතෘකාවෙන් පිට නේ.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
හැබැයි මම කියන්නේ, එයා වංචා, දූෂණ කළා කියලා කවුරු හරි ගිහිල්ලා පැමිණිල්ලක් දමනවා නම්, ඒකට inquiry එකක් - විමර්ශනයක් - කරන්න ඕනෑ කියලායි. ඒ විමර්ශනය කරන්නේ නැතිව,- මේ ඇමති මම නම් මම අද මේ වෙලාව වෙනකොට resign වෙලා ඉවරයි. ඔහොම කැත මුහුණක් තියාගෙන මට පාරට යන්න බැහැ. මම මේ වෙලාවට resign වෙනවා, විමර්ශනයෙන් පස්සේ මම ආයේ සුදුසු කොල්ලෙක් වගේ, ලස්සන කොල්ලෙක් වගේ ඇවිල්ලා වාඩි වෙනවා; "ඔයගොල්ලෝ විමර්ශන කළා. මට එහෙම කිසි චෝදනාවක් නැහැ. ඔයගොල්ලෝ ඕනෑ එකක් කර ගන්න කියලා වාඩි වෙනවා.

හැබැයි, ඒක හෝදන්න යනකොට, ඒක ගැන මිනිස්සුන්ට බොරු කරන්න යන කොට? නිකම්ම ඇවිල්ලා රුපියල් 100කින්, රුපියල් 200කින් විතර පෙට්‍රල් වැඩි කරලා, ඊට පස්සේ සහනය දෙනවා කියලා රුපියල් 20ක් අඩු කරනවා. එක්කෝ මම මෝඩයා වෙන්න ඕනෑ, නැත්නම් රටේ ජනතාව මෝඩයෝ වෙන්න ඕනෑ, එහෙම නැත්නම් කියපු එක්කෙනා මෝඩයා වෙන්න ඕනෑ. ජනාධිපතිතුමා ඇවිල්ලා රුපියල් 200ක් වැඩි කරලා - දැන් රුපියල් 600ක් වෙනවා, **පෙට්‍රල් ලීටරයක්** - ඒකෙන් රුපියල් 20ක්, රුපියල් 100ක් අඩු කරන කොට ඒක සහනයක් නම්, ඒ කථාව අපේ ජනතාව විශ්වාස කරනවා නම්, "මම මෝඩයා" කියලා මම පිළිගන්නවා. මට තේරෙන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, දැන් සමහරු කියනවා, ඔයාට නයෙක් තිබෙනවා නම් නැඟිටලා පෙන්නන්න කියලා. අපට මෙහේ ඇවිල්ලා එහෙම කැත මිනිස්සුන්ට ඇවිල්ලා

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

නයා නැගිටලා. හැබැයි, මේ පාර්ලිමේන්තු ඇවිල්ලා

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

කියන්න කරුණාකරලා,-

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි 2ක කාලයක් තිබෙන්නේ.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Thank you.

ඒ මිනිස්සුන්ට කියන්න

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

මම දන්නේ නැහැ, නමට "කක්කි සුදා" කියලා එක්කෙනෙක් ඉන්නවා. "කක්කුස්" කියලා කියන්න පුළුවන් නම් අපේ මේ ඇමතිවරයාට, මම මේ "කක්කි සුදා" ගැන කථා කරන්නේ. එයා කොච්චර අපහාස කරනවාද? කොච්චර කැත විධියට කථා කරනවාද? Prime Minister එක්ක ගිහිල්ලා කයිවාරු ගහලා පිටිපස්සෙන් පිටට අත තියලා මෙහෙම අල්ලන්න පුළුවන් නම් "කක්කි සුදාට",- ඊට පස්සේ එයා කියන කථාවට - එයා කියනවා, Opera House එකේ පඩිපෙළේ තියලා මොකක් හරි කරනවාලු. එහෙනම් එයා එහෙම කියලා අත දාපු මිනිස්සුන්ට කියන්න ඒක කරන්න කියලා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, මාතෘකාවට අදාළව කථා කරන්න.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ඔව්, ඔව්, "කක්කි සුදාට" අදාළත්වයක් තිබෙනවාද නැද්ද කියලා හොයා ගන්න, මාතෘකාවට. හැබැයි, මම මේක කියන්නේ එහෙම මේ රටේ,-

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
අද විවාදයේ මාතෘකාව ඕක නොවෙයි නේ.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
අනේ මේ, කරදර කරන්න එපා. මම කියන කොට අදාළ ද නැද්ද කියලා ඔයා අහගෙන ඉන්න. අදාළ ද නැද්ද කියලා ඔයා මට කියන්න ඕනෑ නැහැ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මූලාසනයට කථා කරන්න ඉගෙන ගන්න, මන්ත්‍රීතුමා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ඔයාලාට, ඩෝබිලාට හෝදන්නේ එයා. මම නොවෙයි. ඩෝබිලාට හෝදන්නේ එයා. එයා මේ පාර්ලිමේන්තුවට අපහාස කරලා තිබෙනවා කියලා අවුරුදු එකහමාරකට කලින් මම Committee එකට දාපු නඩුවක් අද වෙනකම් අරගෙන නැහැ. හැබැයි, මම සුවස්තිකා අරුලිංගම්ට අපහාස කළා කියලා, මම කියපු නැති, හැන්සාඩ් එකේ නැති වචනයක් ඔයා හොයාගෙන ඇවිල්ලා මට දවස් අටක් දඬුවම් කළා. ලජ්ජා වෙන්න ඕනෑ.

මේක අහගෙන ඉන්න සිංහල ජනතාව විශ්වාස කරනවා නම්, අනුර ආණ්ඩුවකින් තවත් වංචා, දූෂණ අල්ලනවා කියලා, මේගොල්ලෝ එහෙම කරයි කියලා මම විශ්වාස කරන්නේ නැහැ. හැබැයි, එහෙම කරනවා නම්, මේ රටේ අර "සිංහලයෝ මෝඩයෝ කැවුම් කන්න යෝධයෝ" කියන එක ඇත්ත වෙනවා. ඒ නිසා කරුණාකරලා මම කියන්නේ අපේ සිංහල ජනතාවට නැගිටින්න කියලා. එයා වරදක් කළේ නැත්නම් විමර්ශනයෙන් පස්සේ කියන්න වරදක් කළේ නැහැ කියලා. හැබැයි, විමර්ශනයක් කරන්න කියලායි අපි ඉල්ලන්නේ. COPA Committee එක කියනවා, COPE Committee එක කියනවා. ඒ Committeesවලින් විමර්ශනයක් කරලා පෙන්වලා, ආපසු ඇවිල්ලා පුටුවේ වාඩිවෙලා ඉන්න. එහෙම නැතුව, එහෙම විමර්ශනයක් කරන්නේ නැතුව මෙයා ගෙදර යවන්න කියලා ඉල්ලුවේ නැහැ, අපි. තාවකාලිකව resign වෙන්න කියන්න; inquiry එක කරන්න කියන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, දැන් කථාව අවසන් කරන්න.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ඉවර කරනවා. තව තත්පරයක් දෙන්න.

Inquiry එක ඉවර වුණාට පස්සේ ඇවිල්ලා පුටුවේ වාඩි වෙන්න කියන්න. අපි කවුරුත් මොනවත් කියන්නේ නැහැ. හැබැයි, ඔයගොල්ලෝ අද හවස වැරදිලා හරි ඒ පුටුව වෙනුවෙන් ඡන්දය දානවා නම්, වැරදි වැඩක් ඔයගොල්ලෝ කළා කියලා මතක තියා ගන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මීළඟට, ගරු තාහීර් මරික්කාර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි තුනක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.41]

**ගරු නෙයිනා තම්බි මරික්කාර් මොහමඩ් තාහිර් මහතා**
(மாண்புமிகு நெய்னா தம்பி மரிக்கார் மொஹமட் தாஹிர்)
(The Hon. Naina Thambi Marrikkar Mohamed Thahir)
*බිස්මිල්ලාහිර් රහ්මානිර් රහීම්.*

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, නොරොච්චෝලේ ලක්විජය බලාගාරයට ගෙනාවේ ඇත්තටම බාල ගල් අඟුරු කියලා ඔප්පු වෙලා තියෙනවා. ඒක ආණ්ඩු පක්ෂයත් පිළිගන්න ඕනෑ. විපක්ෂයත් පිළිගන්න ඕනෑ. ඒක ගැන කිසිම සැකයක් නැහැ. ආණ්ඩු පක්ෂය කියනවා, ඒකේ වංචාවක් වෙලා නැහැ කියලා. විපක්ෂය මතු කරනවා වංචාවක් වෙලා තියෙනවා කියලා. ඒක ඇත්තටම වෙනම ප්‍රශ්නයක්. නමුත් මෙතැන ඉන්න 225දෙනාම බලන්න ඕනෑ පරිසරය ගැන. ඇත්තටම නොරොච්චෝලේ ලක්විජය බලාගාරය නිසා විශාල පරිසර හානියක් වෙලා තිබෙනවා. ආණ්ඩු පක්ෂයේ ගරු පරිසර ඇමතිතුමන්ලා ඉන්නවා. මේ පරිසරය පැත්ත ගත්තා නම්, උඩප්පුව ඉඳලා තලවිල කතෝලික පල්ලියට වෙනකම් ඒ ප්‍රදේශයේ ඉන්න ධීවර ජනතාවට රැකියාව කරන්න බැරි තත්ත්වයක් ඇති වෙලා තිබෙන්නේ. මොකද, සම්පූර්ණයෙන්ම අළු. මුහුදට ගිහිල්ලා බලන්න, සම්පූර්ණයෙන්ම අළු. ඒ වාගේම ගොවිතැන් කරන කට්ටියගේ එළවලු වර්ගවල සම්පූර්ණයෙන්ම කළු dust එක බැඳිලා. ඒ වාගේම පොල් වගාව සම්පූර්ණයෙන් විනාශ වෙලා යනවා. මෙතැන කථා කරනවා වංචාව ගැන. බාල ගල් අඟුරු ගෙනැල්ලා තිබෙනවා කියනවා. ඒකට වඩා ලොකු ප්‍රශ්නයක් තිබෙනවා පරිසරය පැත්තෙන්. ඒකට ආණ්ඩුවක් හැටියට මැදිහත් වෙන්න ඕනෑ. පරිසර අමාත්‍යාංශය භාර පරිසර ඇමතිතුමාත් ඉන්නවා. ඔබතුමන්ලා ගිහිල්ලා බලන්නේ බලාගාරය ඇතුළ විතරයි. අවට ගත්තොත්, කරඹේ ඉඳලා කල්පිටියට කිලෝමීටර 40ක් තිබෙනවා. ඒ කිලෝමීටර 40ම විනාශ වෙලා තිබෙන්නේ. මේ බාල ගල් අඟුරු නිසා, මේ dust එක නිසා බරපතළ රෝග, විශේෂයෙන්ම cancer, හමේ රෝග වාගේ බරපතළ රෝග ඇති වෙලා තිබෙනවා. අපේ සෞඛ්‍ය ඇමතිතුමා පොඩ්ඩක් මේ ගැන බලන්න. ඔබතුමා සෞඛ්‍ය ඇමතිතුමා හැටියට විශේෂයෙන්ම බලන්න. මේ නිසා විශාල සෞඛ්‍ය ප්‍රශ්නයක් එතැන වෙලා තිබෙනවා. ඇත්තටම අපි දන්නේ නැති රෝග පැතිරිලා තිබෙනවා. මෙතැන ගල් අඟුරු වංචාව ගැන හොයනකොට, පරිසරයට හානි වෙලා බරපතළ රෝග ඒ ප්‍රදේශවල ඇති වෙලා තිබෙනවා.

ගරු සෞඛ්‍ය ඇමතිතුමනි, විශේෂයෙන්ම වැදගත් ඇමතිවරයකු වන ඔබතුමාගෙන් මම තව ඉල්ලීමක් කරනවා. ගරු සෞඛ්‍ය ඇමතිතුමා, කල්පිටිය ප්‍රදේශයේ ලොකු ලස්සන hospital එකක් හදලා තිබෙනවා. ඒ ප්‍රදේශයේ අසූපන්දාහක්, ලක්ෂයක් විතර ජනතාව ඉන්නවා. ඔබතුමා ඇවිල්ලා හැකි ඉක්මනින් ඒ ජනතාව වෙනුවෙන් කැප වෙලා ඒක සූදානම් කරලා දෙන්න කියලා කාරුණිකව ඉල්ලා සිටිමින් මා නතර වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු අගමැතිතුමිය. ඔබතුමියට විනාඩි 15ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.45]

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මම විශ්වාස කරනවා අද මේ විවාදය තුළින් ලංකාවේ ජනතාවට වැදගත් කරුණු ගණනාවක් ඉදිරිපත් වෙනවා සහ නිරාකරණය වෙනවා කියලා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ ආණ්ඩුව පත් වෙච්ච දවසේ ඉඳන්ම විපක්ෂයේ ක්‍රියාවලිය දිහා බැලුවොත්, ඔවුන්ට තිබුණා එක් අරමුණක්. ඒ අරමුණ තමයි, ඔවුන් වාගේම අපිත් හොරු, අපේ ආණ්ඩුවත් ඒ වාගේම හොරකම් කරනවා, ඒ වාගේම දූෂිතයි කියලා කෙසේ හෝ ඔප්පු කිරීම. ඒ වුවමනාව තමයි තිබුණේ. ඒ වෙනුවෙන් මොකක්ද හම්බ වෙන්නේ, මොන තොරතුරද හම්බ වෙන්නේ, මොන කාරණයද හම්බ වෙන්නේ, ඒක හරිද වැරදිද, ඒක තාර්කිකද නැද්ද, සාධාරණද අසාධාරණද, එතැන එවැනි කරුණු තිබෙනවාද, නැද්ද කියන එක සොයන්නත් ඉස්සෙල්ලා, ඒක ඔප්පු කිරීමට හැකියාව තිබෙනවාද කියන එක බලන්නත් ඉස්සෙල්ලා ඒ හරහා කොහොම හරි මේ ආණ්ඩුවත් දූෂිතයි කියලා පෙන්වන්න පුදුම කැක්කුමක්, පුදුම වුවමනාවක් තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒකේ අරමුණ මොකක්ද? ආණ්ඩුකරණයේ දූෂිත ක්‍රියාවලි පිළිබඳව හෙළිදරව් කිරීම විපක්ෂයේ කාර්යභාරයක්. ඒක විපක්ෂය කළ යුතුයි. ඒක කළ යුත්තේ මේ රටේ ජනතාව වෙනුවෙන්, මේ රටේ දූෂණය තුරන් කිරීම සඳහා කරන කාර්යභාරය වෙනුවෙන් සහ මේ රටේ ආණ්ඩුකරණය තවත් යහපත් කිරීම වෙනුවෙන්. ඒ අරමුණින් ආණ්ඩුවේ දූෂිත ක්‍රියාදාම හෝ ක්‍රියාවලි, ආණ්ඩු පක්ෂයේ ඇමතිවරුන්ගේ අඩු පාඩු සොයා දක්වන එක විපක්ෂයේ යුතුකම. ඒක විපක්ෂයෙන් විය යුතුයි. ගරු ජනාධිපතිතුමා ඇතුළු ජාතික ජන බලවේගය, ජනතා විමුක්ති පෙරමුණේ නියෝජිතයන් ලෙස විපක්ෂයේ ඉන්නකොට දිගින් දිගටම ඔවුන් තුළින් සිද්ධ වෙච්ච දෙයක් ඒක. අපේ මේ ආණ්ඩුවට බලය ලබා ගැනීමට පාර කැපුණේ ඔවුන් විපක්ෂය තුළ සිට කළ ඒ කාර්යභාරය නිසායි. ඒ නිසා විපක්ෂය විසින් දූෂණ හෙළිදරව් කිරීම නොකළ යුතුයි කියන මතය නොවෙයි මම මේ ඉදිරිපත් කරන්න හදන්නේ.

නමුත් ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි ප්‍රශ්න කරන්න ඕනෑ, මේ රටේ ජනතාව ප්‍රශ්න කරන්න ඕනෑ, අද මේ පාර්ලිමේන්තුව තුළ ඉන්න විපක්ෂය ඒ හෙළිදරව්ව කරන්නේ දූෂිත ආණ්ඩුකරණයට තිබෙන විරෝධයටද, එහෙම නැත්නම් කෙසේ හෝ ඔවුන්ගේ දූෂණ වහ ගන්න ඔවුන් සහ අපිත් එකයි කියන ඒ කථාව ගොඩනැඟීමටද කියලා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ විවාදය තුළ මේ අවස්ථාවේදීත්, පෙර අවස්ථාවලදීත්, මේ ආණ්ඩුව තුළත් දූෂණ සිද්ධ වෙනවා, ආණ්ඩුවේ සියලුදෙනාම දූෂිතයි, ජනාධිපතිගේ ඉඳන්ම දූෂිතයි කියන ඒ කථාව ගොඩනඟන්න උත්සාහ කරන ප්‍රධානම චරිත කවුද කියලා බැලුවාමත් ඒක පිටිපස්සේ තිබෙන අරමුණ අපට ඉතාම පැහැදිලි වෙනවා. පසුගිය අවුරුදු ගණනාව තුළ මේ රට තුළ සිද්ධ වෙච්ච දූෂණවලට සෘජුව සම්බන්ධ වෙච්ච අයත්, ඒ දූෂණ රැක ගන්න මැදිහත් වෙච්ච අයත් තමයි වැඩියෙන්ම මේ වෙලාවේ කථා කරන්නේ කියන එක අපි සියලුදෙනාටම ඉතාම පැහැදිලියි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ රජය පත්වෙලා බාර ගත්තේ perfect system එකක් නොවෙයි නේ. අපි බලයට පත් වෙනකොට, අපි මේ ආණ්ඩුව බාර ගන්නකොට මේ procurement ක්‍රියාවලිය තුළත්, ප්‍රතිපත්ති සකස් කිරීමේ ක්‍රම තුළත්, රාජ්‍ය ආයතන තුළත් අඩුපාඩු, වැරදි ගොඩක් තිබුණා. අතිශයින්ම දූෂිත ක්‍රියාවලියක්, අතිශයින්ම දූෂිත යන්ත්‍රණයක් තමයි අපි බාර ගත්තේ. ආණ්ඩුව මාරු වෙච්ච පමණින්ම, පැය 24කින් ඒ සියල්ල විසඳෙන්නේ නැති බවත් අපි හොඳින් දන්නවා. ඒ නිසා අඩුපාඩු සිද්ධ වෙන්න පුළුවන්, වැරදි සිද්ධ වෙන්න පුළුවන්. ඒවා නිවැරදි කරන්න තමයි අපේ ආණ්ඩුව පත් වෙලා තිබෙන්නේ. ඒ නිසා ඒ අර්ථයෙන් ගත්තාම, ගල් අඟුරු - coal - පිළිබඳව වුණත් මේ සිද්ධ වෙන විවාදය අතිශයින්ම වැදගත්. ඒ වාගේම ඒ ක්‍රමවේදය නිවැරදි කිරීම වෙනුවෙන් ජන වරමක් ලබා ගත් ආණ්ඩුවක් හැටියටත්, ආණ්ඩුකරණය තුළින් දූෂණය පිටුවහල් කරන්න පත් වුණු සහ ජන වරමක් තිබෙන ආණ්ඩුවක් හැටියටත්, මේ COPE එකෙන් කරන විමර්ශනය සහ National Audit Office එකෙන් ඉදිරිපත් කරලා තිබෙන වාර්තාව අපට අතිශයින්ම වැදගත් වෙනවා. ඒ නිසා ඒ ක්‍රියාවලිය තුළ මේ කරන විමර්ශන හා හෙළිදරව් වෙන කරුණු අපට අතිශයින්ම වැදගත්. මොකද, ඒ ක්‍රියාවලිය තුළ තිබෙන හිස් තැන්, ඒ ක්‍රියාවලිය තුළ තිබෙන imperfections, ඒ ක්‍රියාවලිය තුළ තිබෙන loopholes යනාදී සියල්ල හඳුනා ගෙන, ඒවා නිවැරදි කිරීම අපට අතිශයින්ම වැදගත්. මේ විමර්ශනය, මේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය, මේ Lanka Coal Company (Pvt.) Limited එක පිළිබඳව කරන සංවාදය ආදී සියල්ල අපට වැදගත් නිසා තමයි, ඒ අරමුණ නිසා තමයි, අපි ඒ ක්‍රියාවලිය තුළට සක්‍රියව දායක වෙන්නේ. ඒ නිසා මේ සිද්ධිය තුළත්, මේ සිද්ධිය නිසා ඇති වුණු සංවාදයත්, මේ සිද්ධියට අදාළව සිද්ධ වෙන විමර්ශන, ඒ audits, COPE එකෙන් කරන විමර්ශන සියල්ල හරහා අපි මේ රටේ ජනතාවට පොරොන්දු වුණු පරිදි සහ අපට ලැබුණු ජන වරම අනුව අදූෂිත ආණ්ඩුකරණයක් කරා අපි යන මේ ගමන තවත් ශක්තිමත් වෙනවාය කියන එක ගැන අපට විශ්වාසයක් තිබෙනවා. ඒ නිසා මේ ක්‍රියාවලිය පිළිබඳව කරුණු විමසීම සහ සිද්ධ වෙච්ච දේ පිළිබඳව වැරැද්ද කොතැනද, වැරැද්දක් වුණා නම් මොකක්ද වැරැද්ද, ඒක සිද්ධ වුණේ කොහොමද කියලා සෙවීම පිළිබඳව විපක්ෂයට වඩා වැඩි වුවමනාවක් අපට තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, හැබැයි ඒ ක්‍රියාවලිය නිවැරදි කිරීමට හෝ මේ system එක තුළ තිබෙන දූෂණය හඳුනා ගෙන ඒක නිවැරදි කිරීමේ අරමුණින් නොවෙයි නේ, විපක්ෂය මේක ඉදිරිපත් කරන්නේ. විපක්ෂය මේක ඉදිරිපත් කරන්නේ ආණ්ඩුව දූෂිතයි, අපේ අමාත්‍යතුමා දූෂිතයි, අපේ කැබිනට් මණ්ඩලය දූෂිතයි කියන ලේබලය ගහලා ඒගොල්ලන්ගේ පව් ටික වහගන්න. තවම මේ විවාදය අවසන් නැහැ, තව වෙලාව තිබෙනවා. මම විපක්ෂයෙන් ඉල්ලා සිටින්නේ, කරුණු ඉදිරිපත් කරන්න කියලා. මේ ක්‍රියාවලිය තුළ සිද්ධ වෙච්ච මොනවා හෝ අඩුපාඩුවක් තිබෙනවා නම්, ඒ අඩුපාඩුව හෝ වැරැද්ද සිද්ධ වෙලා තිබෙන්නේ මේ කැබිනට් මණ්ඩලයේ, මේ ආණ්ඩුවේ, මේ ඇමතිවරයාගේ දූෂිත අරමුණක් නිසා කියලා තවම ඔප්පු කරලා නැහැ. තවම ඔප්පු කරලා නැහැ, තව ඉදිරියට ඔප්පු කරනවාද නැද්ද කියන එක මම දන්නේ නැහැ. ඒක ඔප්පු කරන්න කියලා මා ඉල්ලා සිටිනවා. ඒ ඔප්පු කිරීම මෙතැනදී කළ යුත්තේ සද්දෙට කෑගහලා, එහෙම නැත්නම් මෙතැන තිබෙන වරප්‍රසාදවලට මුවා වෙලා මොනවා හෝ කරුණු ටිකක් කියලා නොවෙයි. රුසියාවට ගියා, ඒ නිසා ඩීල් එකක් තිබෙනවා කියනවා." ඔප්පු කරන්න, කොහේද ඩීල් එක? එහෙම නේ කිව්වේ. "රුසියාවට ගියා, මෙන්න මිලියන ගණනක් ලැබුණා" කියනවා. ඔප්පු කරන්න, කොහේද එහෙම සිද්ධ වෙලා තිබෙන්නේ කියලා. මේ ක්‍රියාවලිය තුළ ඇමතිතුමා දූෂණයේ යෙදුණා කියනවා නම් ඒ කොතැනද, කොහොමද ඒක සිද්ධ වුණේ කියලා කියන්න. කැබිනට් මණ්ඩලය සහ ජනාධිපතිතුමා ඒක සඟවනවා කියනවා නම්, ඒ කොහොමද කියලා කරුණු ඇතිව ඔප්පු කරන්න. මම කියන්නේ, දූෂණ සිදුකිරීමේ අරමුණින්, මේ

procurement ක්‍රියාවලිය තුළ පෞද්ගලිකව ප්‍රතිලාභ ලබා ගැනීමේ අරමුණින් තීන්දු තීරණ ගත්තා කියන එක ඔප්පු කරන්න කියලායි. ඒ හරහා විතරයි, මේ No-Confidence Motion එක ඔවුන්ගේ පැත්තෙන් සාර්ථක වෙන්නේ.

මේ ක්‍රියාවලිය තුළ අඩුපාඩු තිබෙනවා. ඔව්, අඩුපාඩු තිබෙනවා කියන එක අපි පිළිගන්නවා. ඒවා නිවැරැදි කළ යුතුද, ඒක තවත් ශක්තිමත් කළ යුතුද, මේ procurement ක්‍රියාවලිය තුළ තිබෙන අඩුපාඩු අපි හදා ගත යුතුද? ඔව්. නමුත්, ඔබතුමන්ලා ඉදිරිපත් කරන්නේ ඒක නොවෙයි නේ. ඔබතුමන්ලා ඉදිරිපත් කරන්නේ, ඇමතිතුමා දූෂිත ක්‍රියාවලියක යෙදුණා, ඒ නිසා ආණ්ඩුව දූෂිතයි කියන එක නේ. තව කාලය තිබෙනවා; තව පැය දෙක තුනක් තිබෙනවා. මේ සිද්ධ වෙච්ච දේ intentionallyම දූෂිත වැඩක් සඳහා ඇමතිතුමා හෝ ආණ්ඩුව පාවිච්චි කළා කියලා මේ කාලය ඇතුළත ඔප්පු කරන්න කියලා මම ඉතාම කාරුණිකව ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා. අපි ජනතාවට දෙන පොරොන්දුව තමයි, එහෙම දෙයක් සිද්ධ වෙලා තිබෙනවා නම් ඊට විරුද්ධව action ගන්න මේ ආණ්ඩුව කිසි සේත්ම පැකිළෙන්නේ නැහැ කියන එක.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ වාගේම මේ දූෂිත system එක නිවැරදි කරමින් ඉදිරියට යන්න අපි බැඳී ඉන්නවා. ඒක තමයි අපි ජනතාවට දෙන පොරොන්දුව. ඒ වෙනුවෙන් තමයි අපි වැඩ කරන්නේ. ඒ ගැන කිසිම සැකයක් තබා ගන්න එපා කියාත් මම ජනතාවගෙන් ඉල්ලා සිටිනවා. මේ ක්‍රියාවලිය තුළ එම විමර්ශනය කරන්න මූලිකත්වය ගෙන තිබෙන්නේත් COPE එකේ අපේ සභාපතිතුමා. Audit එකේදී කරුණු විමසන්න අපේම මන්ත්‍රීවරුන් මැදිහත් වෙනවා. අපි ඒ කරුණු විමසනවා. එම විමර්ශනය හරහා එන කරුණු අනුව අපි action එකක් ගන්නවා. ඒ ගැන කිසිම සැකයක් තබා ගන්න එපා.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Madam Prime Minister, Just one clarification.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
Yes?

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Normally, should it not be an Opposition Member who should hold the position of the Chairman of the COPE? Then, it is more transparent. That is the normal system in the world. Your own Member of Parliament cannot hold that position and come to a decision. And also, it is a teamwork. ඕනෑම රටක COPE එකක සභාපති වෙන්නේ විරුද්ධ පාර්ශ්වයේ සාමාජිකයෙක්. එතකොට තමයි එහි විනිවිදභාවයක් තිබෙන්නේ. තමන්ගේම එක්කෙනෙක් ඒකට පත් කරගෙන කටයුතු කළාට හරියන්නේ නැහැ නේ.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
Hon. Member, that is a different issue. If you have any problems, if you have any issues with regard to the independence of the COPE Chairman, you can certainly raise them. I am very confident that the Hon. (Dr.) Nishantha Samaraweera, Chairman of the COPE, will do an impartial inquiry.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
He cannot.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
No, there is nothing to say he cannot. That may be your experience, that may be how your political culture operated, but it is certainly not our culture.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Could I make a small correction?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
කමක් නැහැ, කියන්න සුජීව මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Thank you very much for your graciousness. Earlier, it was the Hon. Sunil Handunnetti who held that position from the Opposition and that is why he could do a proper job. The normal system in the world is for the Opposition to hold that. So, you all cannot hold that position. හොරාගේ අම්මාගෙන් පේන අහන්න බැහැ නේ.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
That is right. But, please remember that the Hon. Sunil Handunnetti came from the same political party, the same political culture, the same discipline and training from which the Hon. (Dr.) Nishantha Samaraweera has also come. So, it does not matter whether he is from the Government or the Opposition. That is not the point. The point is the political culture that created us, brought us here and which has given us the discipline, the knowledge and the practice to do our job right. - *[Interruption.]* So, whether it is Hon. (Dr.) Nishantha Samaraweera, the Hon. Sunil Handunnetti or anyone of the other 158 Members, when it comes to corruption, do not have any doubt on that, we will investigate.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)

It would not work like that. Let the Opposition appoint the Chairman of the COPE.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, දූෂණය පිළිබඳව සෙවීමට කෙනෙක් විපක්ෂයේ සිටින මේ කණ්ඩායම තුළින් අපට හොයා ගන්න පුළුවන් වෙයි කියලා මම හිතන්නේ නැහැ. ඒක නම් හරියන්නේ නැහැ. *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු අගමැතිතුමියනි, ඔබතුමියට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

දූෂණය ගැන හරියට හොයන්න නම්, ඒ සම්බන්ධව හරියට විමර්ශනය කරන්න නම්, මේ පැත්තෙන්ම තමයි ඒ දේවල් කරන්න වෙන්නේ. *[බාධා කිරීම්]* ඒ නිසා එතැන තර්කයක් නැහැ. *[බාධා කිරීම්]* ඒ නිසා මම ආරාධනා කරනවා - *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

කරුණාකර සභාව නිහඬ වෙන්න.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඔවුන්ගේ අදහස් ප්‍රකාශ කරන්න මම ඔවුන්ට කාලය දුන්නා. ඒ නිසා දැන් මට අවස්ථාව දෙන්න, මගේ කථාව අවසන් කරන්න. මට මේ කථාව අවසන් කරලා වාඩි වෙන්න ඕනෑ, එච්චරයි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි කියන්නේ මේකයි. අපේ ආණ්ඩුව පත් වුණේ දූෂණය පිටුවහල් කරන්නයි; දූෂණය මේ ආණ්ඩුකරණයෙන් ඉවත් කරන්නයි. ඒ ගැන මේ රටේ ජනතාව කිසිම සැකයක් තබා ගන්න ඕනෑ නැහැ. විපක්ෂයට තව කාලය තිබෙනවා, අපි දූෂිතයි කියලා ඔප්පු කරන්න. ඒක තවම ඔප්පු කරලා නැහැ. ඒ නිසා මේ විවාදය තුළ මම අපේ ජනතාවට ආරාධනා කරනවා, නිකම් කථාවලට, ඒ සද්දවලට ඇහුම්කන් දෙන්නේ නැතුව කරුණුවලට ඇහුම්කන් දෙන්න කියලා. කරුණුවලට ඇහුම්කන් දීලා කවුද දූෂිත, කවුද දූෂිත නැත්තේ කියලා මේ රටේ ජනතාව තීරණයක් ගන්න. මේ රටේ තිබුණු දූෂණය පිටුවහල් කරන්න, මේක හොඳ, අදූෂිත ආණ්ඩුකරණයක් බවට පත් කරන්න හැකියාව තිබෙන්නේ කාටද කියා තීන්දු කරන්නට මේ රටේ ජනතාවට පුළුවන් වෙයි කියා මා හිතනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට කාලය ලබා දුන්නාට ඔබතුමියට බෙහෙවින් ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතරක කාලයක් තිබෙනවා.

[பி.ப. 3.00]

**ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ். அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)

*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, கிழக்கு மாகாணத்தின் அம்பாறை மாவட்டத்தின் அக்கரைப்பற்று கல்வி வலயத்தின்கீழ் பொத்துவில் பிரதேச செயலாளர் பிரிவிலுள்ள பாடசாலைகளில் ஏற்பட்டுள்ள ஆசிரிய வெற்றிடங்களை விரைவாக நிரப்புவதற்கு நடவடிக்கை எடுக்கப்பட வேண்டும். கடந்த தினங்களில் சில பாடசாலைகளில் இது தொடர்பான வெற்றிடங்களை நிரப்பும் பொருட்டு ஆர்ப்பாட்டங்கள்கூட இடம்பெற்று இருக்கின்றன. எமது பிரிவுக்கான தனியான வலயக் கல்வி அலுவலகம் ஏற்படுத்தித் தரப்பட வேண்டுமென பல ஆண்டுகளாக நாம் கோரிக்கை முன்வைத்து வருகின்றோம்.

கௌரவ கல்வி அமைச்சர் அவர்கள், எமது சூழல், தூரம், அவசியத்தன்மை, அமைவிடம் போன்ற காரணிகளையும் எமது அவசியத்தையும் விரைவாகப் பரிசீலனை செய்து, புதிய பொத்துவில் வலயக் கல்வி அலுவலகத்தை ஏற்படுத்தித் தர ஆவனபுரிய வேண்டும். அத்துடன், எமது பிரிவில் ஆரிசிரிய வாண்மை விருத்தி நிலையமொன்றை அமைப்பதற்கும் அனுமதி வழங்கி, எமது ஆசிரியர்களது திறனை விருத்திசெய்ய ஆவனபுரிய வேண்டுமெனவும் இந்தச் சபையில் கேட்டுக் கொள்கின்றேன். அண்மையில் ஆர்ப்பாட்டங்கள் பொத்துவில் அல்-ஹிதாயா வித்தியாலயத்திலும் பொத்துவில் ஹிஜ்ரா வித்தியாலயத்திலுமே இடம்பெற்றிருக்கின்றன.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, நாடளாவிய ரீதியில் எரிபொருளைப் பெற்றுக்கொள்வதற்காக QR code அறிமுகம் செய்யப்பட்டுள்ளது. நான் சார்ந்த பொத்துவில் உட்பட அறுகம்பே மற்றும் சுற்றுலாத்துறைக்குப் பெயர்போயுள்ள பிரதேசங்களில் முச்சக்கரவண்டிகளுக்கு வாராந்தம் 15 லீற்றர் பெற்றோல் மட்டுமே வழங்கப் படுகின்றது. சுற்றுலாத்துறைக்குப் பெயர்போயிருக்கின்ற இடங்களில் இது போதாமல் உள்ளது என்பதை குறிப்பிட விரும்புகின்றேன். எனவே, அரசானது சுற்றுலாத்துறைக்குப் பயன்படுத்தப்படுகின்ற முச்சக்கரவண்டிகளுக்கு QR codeமூலம் வழங்கும் பெற்றோலின் அளவை அதிகரித்து வழங்குவதற்கு நடடிவக்கை எடுக்க வேண்டும். பொத்துவில், அறுகம்பே சுற்றுலா சாரதிகள் சங்கம் சார்பாக எம்.எச். ஹமாத் அவர்களுக்கு நன்றியைத் தெரிவித்துக்கொள்ள விரும்பு கின்றேன்.

பாலமுனை வைத்தியசாலையானது, Divisional Hospital தரம் "B" என்ற நிலையில் தற்போது பல்வேறு சுகாதார சேவைகளை வழங்கி வருகின்றது. தற்காலத் தேவையின் அடிப்படையில், இதனை Divisional Hospital தரம் "A"ஆகத் தரமுயர்த்தினால், அப்பிரிவு மக்கள் மேலும் பல உன்னதமான சேவைகளைப் பெற முடியுமென நம்புகின்றோம். இதனை மேற்கொள்வதற்கு அரசாங்கம் நடவடிக்கை எடுக்க வேண்டும். இறக்காமம் வைத்தியசாலைக்கு OPD கட்டிடமொன்று மிகவும் அவசியமாக உள்ளதுடன், ward complex, children's ward complex என்பனவும் அவசியமாக இருக்கின்றன. இதனை ஏற்படுத்திக் கொடுப்பதற்கு அரசானது விரைவாக நடவடிக்கை எடுக்க வேண்டும். இவற்றைப் பெற முயற்சி செய்துகொண்டு இருக்கும் தவிசாளர் M.L. Muzny அவர்களுக்கும் உறுப்பினர் S.L.M. Raja அவர்களுக்கும் எனது மனமார்ந்த நன்றிகளைத் தெரிவித்துக் கொள்கின்றேன்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, நாவிதன்வெளி பிரதேச செயலாளர் பிரிவில் சவளக்கடை இளைஞர் படைப் பயிற்சி நிலையக் கட்டிடத்தின் நிர்மாணப் பணிகளைப் பூரணப்படுத்தி, அதனை இளைஞர்கள் பாவிப்பதற்கு நடவடிக்கை எடுக்க வேண்டுமென இந்தச் சபையில் கேட்டுக் கொள்கின்றேன். பொத்துவில் பிரதேச செயலாளர் பிரிவிலுள்ள P/25 - கனகர் கிராமத்தில் மீள்குடியேற்ற நடவடிக்கைகள் மேற்கொள்ளப்பட்டு, 176 குடும்பங்கள் இனங்காணப்பட்டுள்ளன. எனினும், 73 குடும்பங்களுக்கு மாத்திரமே காணி உறுதிப்பத்திரங்கள் வழங்கப்பட்டு இருக்கின்றன. ஏனைய 103 குடும்பங்களுக்கும் இன்றுவரை காணி உறுதிப்பத்திரங்கள் வழங்கப்படவில்லை. இந்த நடவடிக்கைகளைத் துரிதப்படுத்துவதுடன், அம் மக்களுக்கான வீதி, மின்சாரம், குடிநீர் வசதி, மலசலகூட வசதிகள் உள்ளிட்ட ஏனைய அடிப்படை வசதிகளையும் மிக அவசரமாக வழங்க அரசு நடவடிக்கை எடுக்க வேண்டுமென இந்தச் சபையில் கேட்டுக் கொள்கின்றேன்.

Pottuvil Base Hospitalக்கு dental doctor ஒருவர் மிக விரைவாக நியமிக்கப்பட வேண்டும். அங்கு பணிபுரிந்த dental doctor இடமாற்றம் செய்யப்பட்டு சுமார் 2 மாதங்களாகி இருக்கின்றன. இதனால் பொதுமக்கள் சிரமப்படுவதை அவதானிக்கக்கூடியதாக இருப்பதால், அங்கு விரைவாக dental doctor ஒருவரை நியமிப்பதற்கு அரசாங்கம் நடவடிக்கை எடுக்க வேண்டும். மேலும், Addalaichenai National College of Education, Addalaichenai Training College என்பவற்றிலுள்ள பயிற்சி ஆசிரியர்களை மிகவும் பின்தங்கிய பொத்துவில் போன்ற பிரதேசங்களுக்கும் பயிற்சிக்காக இணைக்க அரசாங்கம் நடவடிக்கை எடுக்க வேண்டும். வெற்றிடங்களை அதிகமாகக் கொண்ட இப்பிரதேசம் இதனால் ஓரளவு பிரயோசனம் அடையுமென நாங்கள் நம்புகின்றோம்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, பொத்துவில் கோட்டப் பாடசாலை ஆசிரியர்களான M.I.M. Jawath, A.L. Lafeer ஆகிய இருவரும் கடமையின் பேரில் அக்கரைப்பற்று வலயக் கல்வி அலுவலகத்துக்குச் சென்றுவரும்போது, 2010.08.18ஆம் திகதியன்று விபத்து காரணமாக மரணமடைந்தார்கள். இது தொடர்பான நஷ்டஈட்டுக் கொடுப்பனவுகள் 16 ஆண்டுகளாகியும் இன்றுவரை வழங்கப்படவில்லை. அது தொடர்பில் மேன்முறையீடுகள் பல செய்தும் இன்றுவரை எந்தவிதமான முன்னேற்றத்தையும் காணவில்லை. எனவே, மிக விரைவாக இதனை வழங்குவதற்குப் பொது நிருவாக அமைச்சு துணைபுரிய வேண்டுமென இந்தச் சந்தர்ப்பத்தில் கேட்டுக் கொள்கின்றேன்.

இறுதியாக, Pottuvilஇல் Al-Hutha எனும் கிராமத்தை உருவாக்கவும், 1990ஆம் ஆண்டு யுத்த காலத்தில் மக்களை ஒன்றுதிரட்டிப் பாதுகாக்க உதவிய, A.M.Sakkan, M.L.Kalenden, M.L.Z. Abdeen, A.M. Mahroob, U.L. Zahira Ummah, M.S. Sikender-GN, I. Uthumalevvai, M.H.M. Kiyaz, S.T. Sabura Ummah, J.U. Wahabdeen, M.M. Mubarak, M.L. Aboosaly, M. L. A. Sukoor, M.I.A. Sukoor ஆகியோருக்கு எனது பிரிவு மக்கள் சார்பாக நன்றிகளைத் தெரிவித்துக் கொள்கின்றேன்.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

**ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ். அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)
මට තව පොඩි වෙලාවක් දෙන්න.

அம்பாறை மாவட்டத்தில் Deputy Planning Directorsஆக இருந்து, எமது பொத்துவில் பிரதேசத்துக்குப் பல வழிகளிலும் உதவிய I.L. Thoufeek, H.B.M. Aanees, S. Anverdeen ஆகியோருக்கும், மூவின மக்களையும் ஒருமித்து அவதானித்து உதவிய அம்பாறை GA Chinthaka Abeywickramaக்கும், P/3 கிராமத்தின் வட்டாரப் பிரதிநிதி K. Mohideen Bawa, M.B. Hamza, M.L. Fazeel ஆகியோருக்கும் எங்களுடைய மனமார்ந்த நன்றிகளை இந்தச் சபையில் தெரிவித்து, விடைபெறு கின்றேன்.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 3ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.05]

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමියට ස්තුතිවන්ත වනවා.

මේ අවස්ථාවේ මම කියන්න කැමැතියි, වැදගත්ම කරුණු කිහිපයක් ගැන. ගල් අඟුරු පිළිබඳ ප්‍රශ්නයේදී අද මුළු රටම පිළිගන්න කාරණය තමයි, බාල ගල් අඟුරු ගෙනැල්ලා තිබෙනවා කියන එක. ඒ වාගේම අනෙක් කාරණය තමයි, ඒ ගල් අඟුරු නිසා අපට විදුලිය ලබා ගැනීමේ ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා කියන එක.

පසුගිය මාර්තු 30වැනි දා National System Operator (Pvt.) Limited එකේ CEO යවලා තිබෙන letter එකේ බොහොම පැහැදිලිව තිබෙනවා, මේ ක්‍රියාදාමය තුළ ඔවුන්ට විදුලි බලය සඳහා අනිවාර්යයෙන් ගල් අඟුරුවලට රුපියල් බිලියන 20ක් අමතරව වැය වනවා කියලා. එම ලිපියේ 22වැනි පිටුව මම **සභාගත*** කරනවා.

එහි සඳහන් පරිදි ගල් අඟුරු සඳහා වන පිරිවැය රුපියල් බිලියන 78 ඉඳලා රුපියල් බිලියන 111ක් දක්වා වැඩිවෙලා තිබෙනවා, with naphtha. එතකොට අමතරව වැය වන මේ රුපියල් බිලියන 20 යන්නේ මිනිස්සුන්ගේ පොකට් එකෙන්. ජනාධිපතිතුමා සහන පැකේජයක් ගෙනාවා. ඒ සහන පැකේජයට රුපියල් බිලියන 15ක් දානවා කියලා එතුමා කිව්වා. හැබැයි, මේ වාර්තාවේ 22වැනි පිටුව අනුව අමතරව වැය වන රුපියල් බිලියන 34න් රුපියල් බිලියන 15ක් ගියාම, රුපියල් බිලියන 20ක් යන්නේ මිනිස්සුන්ගේ පොකට් එකෙන්. නැප්තා මිල තව වැඩි වුණොත් මිනිස්සුන්ගේ විදුලි බිල ආපහු සියයට 30කින් වැඩි වනවා. මම අහන්න කැමැතියි, ඒ රුපියල් බිලියන 20ට කවුද වගකියන්නේ කියලා. මේ ආණ්ඩුව ඒකට වගකියන්න ඕනෑ; කැබිනට් මණ්ඩලය

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා]

වගකියන්න ඕනෑ. අගමැතිතුමිය කියනවා, එහෙම වගකියන්න ඕනෑ කොහොමද කියලා ඔප්පු කරලා පෙන්වන්න කියලා. ඒකට වගකියන්නේ වෙන විධියකට නොවෙයි. මෙවැනි බාල ගල් අඟුරු ගෙන්වීම සඳහා වන ක්‍රියාදාමයකට අත දීම නිසා, ඒකට අනුමැතිය දීම නිසා, ඒවා පිළිගැනීම නිසා තමුන්නාන්සේලා සියලුදෙනාම මේකට වගකියන්න ඕනෑ. ඒ වාගේම මේ කාරණයත් විශේෂයෙන්ම මම කියන්න ඕනෑ. ජනාධිපතිතුමා මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා කිව්වා, ගල් අඟුරු ගෙන්වීමේදී රුපියල් බිලියන හතහමාරක පාඩුවක් සිදු වෙලා තිබෙනවා කියලා. එතුමා ගණන් හදාගෙන තිබෙන්නේ වැරදියට. කරුණාකරලා ලංකා විදුලිබල මණ්ඩලයට අයත් මේ සමාගමේ සභාපති මහජන උපයෝගිතා කොමිසමට යවපු අලුත් ලිපියෙහි තිබෙන ඒ ලැයිස්තුව අරගෙන බලන්න.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ ක්‍රියාදාමය තුළ අපි දිගින් දිගටම බොහෝ කරුණු පෙන්වා දුන්නා. දැන් අගමැතිතුමියත් කියාගෙන ආවේ, අපි ඒගොල්ලන්ට අපේ චෝදනා දාන්න හදනවා කියලායි. එහෙම නැහැ. තමුන්නාන්සේලා මොකක්ද කළේ? මේ චෝදනා ටික අරගෙන 2020 දක්වා පසුගිය වර්ෂ ගැන හොයලා බැලුවා; අපි විතරක් නොවෙයි, අරගොල්ලොත් වැරදි කරලා තිබෙනවා කියලා ඒවා ගැන හොයා බැලුවා. එහෙම තමයි තමුන්නාන්සේලා මේක ක්‍රියාත්මක කරන්න හැදුවේ.

මේ අවස්ථාවේ මම මේ කාරණයත් කියන්න ඕනෑ. තමුන්නාන්සේලා විගණකාධිපති තනතුරට හෙංචයියෙක් පත් කරගත්තා නම් මොකද වෙන්නේ? අපට ආරංචි වෙලා තිබෙනවා, COPE එකේ සභාපතිතුමා ගිය සතියේ දවස් දෙකක් ජාතික විගණන කාර්යාලයට ගියා කියලා, බලපෑම් කළා කියලා, Zoom meeting එකක් තිබුණා කියලා. ඉතිහාසයේ කවදාවත් COPE එකේ සභාපතිවරයෙක් ජාතික විගණන කාර්යාලයට ගිහිල්ලා නැහැ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට තව තත්පරයක් දෙන්න.

අද තමුන්නාන්සේලා 159දෙනාම එකතු වෙලා මේකට විරුද්ධව ඡන්දය දෙයි. හැබැයි මේක මතක තියාගන්න. ඔය වාගේම 159දෙනෙක් එකතු වෙලා ඡන්දය දීලා කෙහෙළිය රඹුක්වැල්ලත් ගෙදර ගියා, හිටපු අනෙක් අයත් ගෙදර ගියා. ඒ නිසා ඒකට මුහුණ දෙන්න ලැහැස්ති වෙන්න කියන එකත් මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සුනිල් වටගල නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.09]

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Sunil Watagala, Attorney-at-Law - Deputy Minister of Public Security and Parliamentary Affairs)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මෙම විවාදයට අදාළ මේ විශ්වාස භංග යෝජනාව විපක්ෂයෙන් තමයි ගෙනාවේ. විපක්ෂයෙන් ගෙනාපු මේ විශ්වාස භංග යෝජනාව *sub judice* matter එකක් කියලා පැහැදිලිවම ඔවුන් දන්නවා. මේක ගරු අධිකරණයේ විෂයයට ලක් වෙච්ච කාරණාවක්. කෙසේ වෙතත්, ඊට යටත්ව අපි මෙහෙම හිතනවා. විපක්ෂයටත්, මුළු රටටත් මේ විවාදය ගන්න අවශ්‍ය නම් කිසිදු බයක්, සැකක් නැතිව අපි මේ විවාදයට ලැහැස්ති වෙලා ඉන්නවා කියන එක මේ වෙලාවේ මුලින්ම මම කියනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ වාගේම තමයි විපක්ෂය විසින් අප වෙත එල්ල කරන ලද ගොඩක් පන්දු අපි no-ball කරලායි තිබෙන්නේ. මොකද, අපට මරික්කාර් මන්ත්‍රීතුමා පන්දුවක් දිගු කළා, හෝමාගම මහජන බැංකුවේ තිබෙන නැන්දම්මාගේ ගිණුමක් ගැන හෙළිදරව් කරනවාය කියලා. අපි ඒ ගැන අදත් ඇහුවා. ඒ ගැන අහනකොට මෙතැන දොර ඇරගෙන දිව්වා. අදටත් ඒකට උත්තරයක් නැහැ.

මීට කලින් අවස්ථාවකදී බලශක්ති විෂය භාර අපේ කුමාර ජයකොඩි අමාත්‍යවරයා ගරු අධිකරණයකින් වැරැදිකරු වී ඇත කියලා ලොකු වාදයක්, සංවාදයක් පැන නැඟුවා. පුළුවන් නම් එහි නඩු අංකය ගෙනැල්ලා සභාවට ඉදිරිපත් කරන්න කියලා අපි කිව්වා. අදටත් එහෙම නඩු අංකයක් ඉදිරිපත් කරලා නැහැ. එම නිසා දෙවැනි පන්දුවත්, no-ball පන්දුවක් බවට පත් වෙලා තිබෙනවා.

ඊළඟට, මේ ගල් අඟුරු සෝෂාව මැද්දේ මට මතක් වෙනවා ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මීට මාස කිහිපයකට කලින් ලොකු සද්දයක් ආපු කන්ටේනර් 323ක් පිළිබඳ සිද්ධිය. ඒ සිද්ධියට බිමල් රත්නායක අමාත්‍යවරයා නියෝග දීලා තිබෙනවා ආදී නොයෙකුත් කථා කිය-කියා හිටියා. ඒ ප්‍රශ්නය ගැන හොයන්න ජනාධිපතිවරයාත් වෙනම කමිටුවක් පත් කළා. දැන් පාර්ලිමේන්තුව තුළ ගරු අධිකරණ අමාත්‍යවරයාගේ මූලිකත්වයෙන් කමිටුවක් පැවැත්වෙනවා. කමිටුවේ කාරණා පිළිබඳව මම සාකච්ඡා කරන්නේ නැහැ. මේ සභා ගර්භයේදීත්, එළියේදීත් කන්ටේනර් 323 පිළිබඳ කථාව ලොකු සද්දයට ඇහුවා. හැබැයි, මෙතැන කියන්නේ නැහැ, අභ්‍යන්තර කථා. එතුමන්ලාට හරස් ප්‍රශ්න අහන්න දුන්නා. නිලධාරීන් තමන්ගේ කාරණාව පැහැදිලි කළා. එහෙම පැහැදිලි කළාට පස්සේ දැන් නම් මට පෙනෙන්නේ පුස් පැටව් වාගේ ඉන්න බවයි. *[බාධා කිරීමක්]* වාර්තාව ඉදිරිපත් කරනවා විතරක් නොවෙයි, ඒ ගැන වාද විවාදත් කරනවා. ඒ ගැන භය වෙන්න එපා.

ඊට පස්සේ ගල් අඟුරු සම්බන්ධයෙන් පවතින සෝෂාව පිළිබඳව සොයා බලන්න අපි COPE එකට යොමු කළා. නිලධාරීන් කැඳෙව්වා. ඒ සම්බන්ධයෙන් ලොකු වාද විවාදයක් කළා. එහිදී අපට වැඩක් තිබෙනවාය කියලා, සෝෂාවක් නඟපු සමහර මන්ත්‍රීවරුන් කමිටුවෙන් යන්න ගියා. අර කමිටුවත් ඒ වාගේ තමයි. එතකොට වෙන්නේ ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, එන්න එන්න ඒ පන්දු අපි නිෂ්ක්‍රිය කරන එකයි. අපි යකාට භය නම් සොහොනේ ගෙවල් හදන්නේ නැහැ. ගල් අඟුරු සිද්ධියේදී වංචාවක් වෙලාය කියන කාරණාව

සම්බන්ධයෙන් අපි තමයි COPE එක මඟින් මේ විගණන වාර්තාව කැඳෙව්වේ. අපි තමයි COPE එක ඇතුළේ වාද විවාද කළේ. මෙය *sub judice* matter එකක් වෙලාත් අපි තමයි මේ විවාදය අද ගරු සභාවේ ගන්නේ; අපි තමයි විවාදයට ගන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි මේවාට භය නම් මෙහෙම වාද විවාද කරන්න එන්නේ නැහැ.

අපේ සහෝදර ඇමතිතුමෙකුට මේ චෝදනාව එල්ල වෙලා තිබෙනවා. ඒගොල්ලන් කල්පනා කරන්නේ ඒගොල්ලන්ට සාපේක්ෂව; ඒගොල්ලන්ගේ දේශපාලන ව්‍යාපාරවලට සාපේක්ෂව. අපි 159දෙනා කියන්නේ, සාමූහික තීන්දු තීරණ ගන්නා සාමූහික කණ්ඩායමක්. මේ සාමූහික කණ්ඩායම තුළ අපේ කෙනෙක් වරදක් කළොත් විපක්ෂයෙන් විශ්වාස භංග යෝජනා ගෙනෙන කල් අපි ඉන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. අපි ඉතිහාසය තුළ ගොඩාක් ජනප්‍රිය පක්ෂ සාමාජිකයෝ යම් යම් වැරැදිවලට ඉවත් කරලා තිබෙනවා. ඉතිහාසයේ ජනප්‍රිය නායකයෝ අපි ඉවත් කරලා තිබෙනවා. විපක්ෂය කියන කල් අපි හිටියේ නැහැ, ඒ අයව ඉවත් කරන්න. විපක්ෂය විශ්වාස භංග යෝජනා ගෙනෙන කල් අපි ඉඳලා නැහැ. අපේ භාවිතාව අන්න ඒක. මතක තබා ගන්න, ඒක අපේ භාවිතාව බව. අපි ඉවත් කරපු අය ඒගොල්ලන් ගත්තා. අන්න ඒක තමයි ලක්ෂණය.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම මේ කාරණා පරිශීලනය කරනකොට බැලුවා, මේ විශ්වාස භංග යෝජනාව ගෙනැල්ලා තිබෙන්නේ කවුද කියලා. මේ ගෙනැල්ලා තිබෙන විශ්වාස භංග යෝජනාවේ මන්ත්‍රීවරු 36දෙනෙකුගේ නම් තිබෙනවා. මේ මන්ත්‍රීවරු 36දෙනා අතරේ සිටින ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා, ගරු (ආචාර්ය හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා, ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා, ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා සහ ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා කියන පස්දෙනා මහ බැංකු බැඳුම්කර වංචාවේ footnotes තබපු මන්ත්‍රීවරු.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, දණ්ඩ නීති සංග්‍රහයේ 138වන වගන්තියේ තිබෙනවා, "නීති විරෝධී ජන රාශිය" කියන එක. නීති විරෝධී ජන රාශියට අඩුම තරමින් පස්දෙනෙක් හෝ ඊට වැඩි ගණනක් ඉන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ යෝජනාව ගෙනැල්ලා තිබෙන්නේ නීති විරෝධී ජන රාශියක සාමාජිකයෝ; මේ රටේ මහ බැංකුව මංකොල්ල කෑවාට පස්සේ ඒක නිවැරැදියි කියන්න footnotes තබපු කට්ටිය. අන්න එහෙම කට්ටිය තමයි විශ්වාස භංග යෝජනාවක් ගෙනැල්ලා අද කුමාර ජයකොඩිගේ කිල්ලෝටය බලන්න හදන්නේ.

මම නැවතත් මේ කාරණය කියනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. දැන් මෙතැන මොකක්ද කියන්නේ? මරික්කාර් මන්ත්‍රීතුමා මෙතැනදී අපට චෝදනාවක් එල්ල කළා, මේක සාමූහික මංකොල්ලයක් කියලා. සාමූහික මංකොල්ලයක්, ඩිජිටල් ත්‍රස්තවාදීන් විධියට තමයි වැඩ කරලා තිබෙන්නේ කියලා තව මන්ත්‍රීවරයෙක් කිව්වා. සාමූහික මංකොල්ලය සහ ඩිජිටල් ත්‍රස්තවාදීන් කියන කථා අදාළ වෙන්නේ කාටද? ඒක අදාළ වෙන්නේ ඒ කණ්ඩායමටම තමයි. මොකද, ඒගොල්ලන් ඒවාට නම් තබපු කට්ටිය. ඔවුන්ගේ නම් හැන්සාඩ්ගත වෙලා තිබෙනවා. මම "COPE" කමිටු වාර්තාව සම්බන්ධයෙන් විවාද කරපු හැන්සාඩ් වාර්තාව අරගෙන ආවා. එදා මහ බැංකුව මංකොල්ල කාලා මන්ත්‍රීවරුන් 15දෙනෙක්, "ඇත්ත තමයි. ඒක ඇතුළේ වංචාවක් සිදු වෙලා තිබෙනවා" ය කියනකොට මන්ත්‍රීවරු 9දෙනෙක් footnotes තැබුවා. ඒ footnotes තබපු කට්ටිය දැන් දූෂණ හොයන්න කියලා මේ ගරු සභාවේ Motion එකක් දාලා. අපි නොවෙයි, සංවිධානාත්මක මංකොල්ලය කළේ. සංවිධානාත්මක මංකොල්ලයට උඩ ගෙඩි දීපු කට්ටිය අද මේ ගරු සභාවට යෝජනාවක් ගෙනැල්ලා තිබෙනවා, අපේ දේවල් හොයන්න.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, බොහොම පැහැදිලියි, මේ කථා ටික. මම නැවතත් කියන්නේ මෙයයි. අපේ කණ්ඩායම ඉතාම සාමූහිකව වැඩ කරමින් ඊට අදාළ දේශපාලනයක් තමයි කරන්නේ. මේක ඇතුළේ අපි දේශපාලනිකව වංචාවකට, දූෂණයකට ඉඩ තියන්නේ නැහැ. අපේ අමාත්‍යවරයා දූෂණයක නියැළුණා කියලා කිසිදු සාධකයක් මේ සභාව තුළ අදටත් ඉදිරිපත් වුණේ නැහැ. අපි ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළ ගල් අඟුරුවලට අදාළ ක්‍රියාවලියට මැදිහත් වෙලා තිබෙනවා. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඇතුළේ තමයි යම් යම් දේවල් සිදු වෙලා තිබෙන්නේ. ඒ දේවල් තුළින්ම ඇති වෙච්ච, ගිවිසුම් තුළින්ම ඇති වෙච්ච සහන පැකේජ තිබෙනවා. අපි එක දෙයක් කියනවා. මේ කාරණාව මත පදනම්ව නැවතත් අපි මේ කාරණය කියනවා. ගුණත්වයෙන් අඩු ගල් අඟුරු කියලා ගල් අඟුරු සම්බන්ධයෙන් යම්කිසි ක්‍රියාවක් සිදු වෙලා තිබෙනවා නම්, මොනම හෝ පාඩුවක් සිදු වුණා නම්, අපි ඒ පාඩුව කවදාවත්, කිසිසේත්ම පාරිභෝගිකයාට දෙන්නේ නැහැ කියලා බොහොම පැහැදිලිව සඳහන් කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, පැහැදිලිවම අපි ඔබතුමියට කියා සිටින්නේ මෙයයි. අපි භාවිතාව තුළ ඔප්පු කරමින් තිබෙනවා, ඉතාම හොඳ කාරණා ප්‍රමාණයක්. ඒක නිසා අපේ අමාත්‍යවරයාවත්, අපිවත්, මේ ඉන්න කණ්ඩායමවත් කිසිසේත්ම දූෂණ ක්‍රියාවලියකට, එහෙම නැත්නම් වැරැදි ක්‍රියාවලියකට පණ පොවලාත් නැහැ. එහෙම කරන්නේත් නැහැ. ඒක නිසා තමයි අපි සාමූහික හැඟීමෙන් සෑම දෙයක්ම කරමින් සිටින්නේ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ මන්ත්‍රීවරයෙකු, අපේ සාමාජිකයෙකු වරදක් කළත් අපි විපක්ෂයට ඇඟිල්ල දිගු කරන්න ඉඩ තියන්නේ නැතුව ඊට කලින් අවශ්‍ය තීන්දු තීරණ ගන්නවා කියලා යළිත් මම කියනවා. ඉතිහාසයේදීත් අපි තීන්දු තීරණ අරන් මීට වඩා ජනප්‍රිය නායකයෝ අපේ පක්ෂයෙන් ඉවත් කරලා තිබෙනවා. එසේ ඉවත් කරපු කණ්ඩායම් තමයි තමුන්නාන්සේලා පසුව අරගෙන තිබෙන්නේ කියන එකත් මම මේ වෙලාවේ මතක් කරනවා. ජාතික ජන බලවේගය කියන්නේ තනි පුද්ගලයෙක් නොවෙයි, තනි මිනිහෙක් නොවෙයි, ඒක ව්‍යාපාරයක්, ඒක කණ්ඩායමක් කියන එක මම නැවත වතාවක් කියනවා. කණ්ඩායමක් ලෙස තමයි අපි ඕනෑම ප්‍රශ්නයකට මුහුණ දෙන්නේ. මේ ගල් අඟුරු ගෙන්වීම ඇතුළේ දේශපාලනිකව වංචාවක් සිද්ධ වෙලා නැහැ කියලා අපි කියනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)

යම් යම් අඩුපාඩුකම් තිබුණොත්, ඒ අඩුපාඩුකම් අපි නිවැරදි කිරීමේ කටයුත්ත අනාගතයේදී කරනවාය කියන එකත් මතක් කරමින්, ඊට අමතරව මෙය COPE එකේදීත් සාකච්ඡා කරලා, තමුන්නාන්සේලාට අවශ්‍ය නම් මේ සභාව තුළ යළිත් විවාදයක් ලබා දෙන්නම් කියන කාරණාවත් මතක් කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

මීළඟට, ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් ලැබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු සාගරිකා අතාවුද මන්ත්‍රීතුමියගේ නම යෝජනා කරන්න.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "ගරු සාගරිකා අතාවුද මහත්මිය දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සාගරිකා අතාවුද මහත්මිය මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (திருமதி) சாகரிகா அதாவுத அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. (MRS.) SAGARIKA ATHAUDA took the Chair.*

[பி.ப. 3.21]

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා)**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர் - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர்)
(The Hon. Ramalingam Chandrasekar - Minister of Fisheries, Aquatic and Ocean Resources)

நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! இன்று இந்தச் சபையில் மிகவும் முக்கியமானதொரு விவாதம் இடம்பெற்றுக்கொண்டு இருக்கின்றது. இந்த விவாதம் வேறு எதுவுமல்ல, எங்களுடைய வலுசக்தி அமைச்சருக்கு எதிராகக் கொண்டுவரப்பட்டுள்ள நம்பிக்கையில்லாப் பிரேரணை மீதான விவாதமாகும். இதனைக் கொண்டுவந்த எதிர்க்கட்சி யினர் உரையாற்றும்போது, எங்களுக்கு ஒரு விடயம் மாத்திரம் தெளிவாகத் தெரிகின்றது. நாங்களும் இந்தப் பாராளு மன்றத்தில் பல வருடங்களாக இருக்கிறோம்.

அன்று முதல் இன்றுவரையான காலப்பகுதியை எடுத்துப் பார்க்கும்போது, இவ்வாறான நிலக்கரி சம்பந்தமான பிரச்சினை இன்று நேற்று உருவானதல்ல என்பது தெரிகின்றது. இன்று மிகவும் தெளிவாக திட்டமிட்ட ஓர் ஒழுங்குமுறையின்கீழ் அரசின் செயற்பாடுகள் இடம்பெறுகின்றன என்பதில் மாற்றுக் கருத்தில்லை. இதை யார் ஏற்றுக் கொண்டாலும் ஏற்றுக் கொள்ளாவிட்டாலும், எங்களுடைய தேசிய மக்கள் சக்தி அரசாங்கத்தின்கீழ் எந்தவோர் ஊழலும் இடம்பெறுவதற்கு யாருக்கும் இடமில்லை என்பது இலங்கை வாழ் மக்கள் அனைவருக்கும் நன்றாகத் தெரியும். விசேடமாக, இங்கிருக்கின்ற அமைச்சர்கள் முன்னைய ஆட்சியாளர்களைப்போன்று தங்களுடைய மடியை நிறைத்துக்கொள்வதற்கு அமைச்சுப் பதவியைப் பெறுப்பேற் றவர்கள் அல்லர். அந்த வகையில், இன்றைக்கு நம்பிக்கை யில்லாப் பிரேரணை கொண்டுவரப்பட்டு இருக்கின்ற எங்களுடைய அமைச்சர் குமார ஜயக்கொடி அவர்கள் மோசடியில் ஈடுபடுகின்ற நபர் இல்லை என்பது நீங்கள் ஏற்றுக் கொண்டாலும் ஏற்றுக் கொள்ளாவிட்டாலும் இலங்கையில் இருக்கின்ற மக்களுக்குத் தெரியும். மேலும், எங்களுடைய அரசாங்கம் அல்லது அமைச்சுகள் தனிநபருடையது அல்ல என்பது எங்கள் எல்லோருக்கும் நன்றாகத் தெரியும்.

எங்களுடைய அமைச்சரவையின் தலைவர் வேறு யாருமல்ல, எங்களுடைய மாண்புமிகு சனாதிபதி அவர்கள்தான். எங்களுடைய சனாதிபதியை எடுத்துக் கொண்டாலும் சரி, எங்களுடைய அமைச்சர்களை எடுத்துக் கொண்டாலும் சரி, அவர்கள் இவ்வாறான பிரச்சினைகளை மிகவும் உன்னிப்பாக அவதானித்துக்கொண்டுதான் இருக்கிறார்கள். 2010ஆம் ஆண்டு ஆரம்பிக்கப்பட்ட நுரைச்சோலை லக்விஜய நிலக்கரி மின் உற்பத்தி நிலையத்துக்கு இதுவரை 450க்கும் அதிகமான கப்பல்கள்மூலம் நிலக்கரி கொண்டுவரப்பட்டு இருக்கின்றது. இதற்குச் செலவிடப்பட்டுள்ள மொத்தத் தொகை 2.25 பில்லியன் ரூபாயெனக் கூறப்படுகின்றது. இவ்வாறு பெருந்தொகை நிலக்கரி இறக்குமதி செய்யப்பட்டு இருக்கின்றது. இன்றைக்கு இதில் 26 கம்பனிகள் சம்பந்தப்பட்டிருக்கின்றன. இதுநாள் வரைக்கும் இல்லாதளவுக்கு இலங்கையில் வாழுகின்ற மக்களின் அரசாங்கமான எங்களுடைய அரசாங்கம் மிகத் தெளிவாகப் புரிந்துகொண்டு இருப்பது வேறு எதுவுமல்ல, இன்று எதிர்க்கட்சியினரால் பேசப்படுகின்ற கருத்துக்கள் எந்தவிதமான ஆதாரமும் அற்றவை என்பதைத்தான்.

இப்போது நிலக்கரி தொடர்பில் கணக்காய்வாளர் நாயகத்தின் அறிக்கையொன்று வெளியாகி இருப்பது எங்கள் எல்லோருக்கும் தெரியும். அந்த அறிக்கையை உன்னிப்பாக அவதானிக்கும்போது, ஆழமாக வாசித்து அறியும்போது ஓர் உண்மை தெரிய வருகின்றது. அது வேறு எதுவுமல்ல, இன்றைய காலகட்டத்தில் அதில் எவ்விதமான மோசடிகளும் இடம்பெறவில்லை என்பதுதான். அதுமாத்திரமல்ல, இறக்குமதி செய்யப்பட்ட நிலக்கரியின் தரம் தொடர்பில் ஆய்வறிக்கையைப் பெற்றுக்கொள்வதற்கு, உள்நாட்டிலும் வெளிநாட்டிலும் இருக்கும் ஆய்வகங்களில் ஆய்வுகள் மேற்கொள்ளப்பட்டன. அவற்றிலும் தேர்ச்சி அடைந்திருக் கின்றது. எங்களுடைய அரசாங்கம் மேலதிக ஆய்வுக்காக இவற்றின் மாதிரியை அவுஸ்திரேலிய கம்பனிக்குக்கூட அனுப்பியிருக்கிறது. நிலக்கரி இறக்குமதி விடயத்தில் எவ்வித மோசடியும் இடம் பெறக்கூடாது என்பதில் எங்களுடைய அரசாங்கம் மிகவும் தெளிவாக இருக்கின்றது; இருந்தும் இருக்கின்றது. இன்று எதிர்க்கட்சியினரால் எங்கள்மீது பல குற்றச்சாட்டுகள் சுமத்தப்படுகின்றன. குறிப்பாக, இறக்குமதி செய்யப்பட்ட நிலக்கரி தரம் குறைந்தது என்றும், அதன்மூலம் மின் உற்பத்திக்கு ஏற்படும் தாக்கம் பற்றியும், அந்தத் தாக்கத்தால் ஏற்படும் நட்டம் பற்றியும், அதன்மூலம் ஏற்படும் விலை அதிகரிப்பால் எமது நாட்டு மக்களுக்கு ஏற்படும் சுமை பற்றியும் பேசப்படுகின்றது.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இதற்கு முன்னர் 450 கப்பல்களில் நிலக்கரி கொண்டுவரப்பட்டபோது, அந்த நிலக்கரியை தின்று பார்த்தார்களா அல்லது நக்கிப் பார்த்தார்களா என்று எவராவது கேட்டார்களா? இல்லை! அந்த நிலக்கரி தொடர்பாக எந்தவிதமான ஆய்வும் செய்யாது, எந்தவிதமான அறிக்கையும் வெளியிடாது, தங்களுக்குத் தேவையான நண்பர் குழாத்துக்கு மாத்திரம் அதனை இறக்குமதி செய்வதற்கான

உரிமத்தைக் கொடுத்திருந்தார்கள். அதுதான் உண்மை! எங்களுடைய சுகாதார அமைச்சர் கௌரவ நளிந்த ஜயதிஸ்ஸ அவர்கள்கூட அடிக்கடி கூறுகின்ற விடயத்தில் உண்மை இருக்கின்றது. அதாவது, இந்த நாட்டில் நிலக்கரி இறக்குமதியில் மாபியாக்கள் இருப்பதுபோன்று, மருந்து இறக்குமதியிலும் மாபியாக்கள் இருக்கின்றன; அரிசி இறக்குமதியிலும் மாபியாக்கள் இருக்கின்றன.

இவ்வாறு எல்லாத்துறைகளிலும் இருக்கின்ற மாபியாக் களுக்குப் பின்னாலிருந்து அவற்றை ஊக்குவித்தவர்கள் வேறுயாருமல்லர், முன்னர் இருந்த அரசியல்வாதிகளும் முன்னர் இருந்த சனாதிபதிகளும் அவர்களுடைய பிள்ளைகளும்தான். இதன் அடிப்படையில் பார்க்கும்போது, இந்த வியாபாரத்துக்குப் பின்னால் இருப்பதும் அவர்களுடைய இராஜாங்கம்தான். எங்களுக்கு ஓர் உண்மை மாத்திரம் தெரிய வருகின்றது. அதாவது, அந்த இராஜாங்கம் இன்றைக்கு உடைக்கப்பட்டு இருக்கின்றது. மாபியாக்களிடம் மாத்திரம் தங்கியிருந்த, ஒருசில கம்பனிகளுக்கு மாத்திரம் மட்டுப் படுத்தப்பட்டு இருந்த அந்த இராஜாங்கம் உடைக்கப்பட்டு, இன்றைக்கு வெளிப்படைத் தன்மையுடன் செயற்பாடுகள் இடம்பெறுகின்றன. இந்த நாட்டுக்குத் தேவை வெளிப்படைத் தன்மை! எங்களுடைய அரசாங்கத்தின் நோக்கமே வெளிப்படைத் தன்மையுடன் செயற்பாடுகள் இடம்பெற வேண்டும் என்பதுதான். வெளிப்படைத் தன்மை என்பது இந்த நாட்டு மக்களுக்கு அத்தியாவசியமான ஒன்று. இந்த நாட்டு மக்களிடம் நாங்கள் கூறினோம், எமது நாட்டை இலஞ்சம், ஊழல், மோசடியிலிந்து மீட்டெடுப்போம் என்று. அதற்கு ஏற்ற வகையில், எங்களுடைய கௌரவ வலுசக்தி அமைச்சர் அவர்கள் தன்னுடைய அமைச்சின் கடமைகளை மிகச் சரிவர செய்து வருகின்றார். அவர் தனது கடமைகளைச் சரிவரச் செய்து வருகின்றபொழுதும், அவர்மீது குற்றச்சாட்டுகள் கூடுதலாக முன்வைக்கப்படுகின்றன. தமிழில் பழமொழி ஒன்றுள்ளது, "காய்க்கிற மரத்துக்குத்தான் கல்லடி படும்" என்று.

இதுவரை காலமும் நிலக்கரி கொள்வனவின்மூலம் இந்த நாட்டு மக்களுடைய சொத்தான கோடிக்கணக்கான ரூபாய் பரிமாறப்பட்டு வந்தது. இன்று அந்த நிலையில் மாற்றம் ஏற்பட்டு, அந்த மாற்றத்துக்கு ஏற்ற வகையில் சரிவர கொள்முதல் நடவடிக்கைகள் இடம்பெறும்போது, அது தொடர்பான ஆய்வுகள் சரிவர இடம்பெறும்போது, அவர்களால் அமைச்சர்மீது குற்றச்சாட்டுகள் முன்வைக்கப் படுவது தவிர்க்க முடியாது. இன்றைக்கு எதிர்க்கட்சி யினருக்குப் பேசுவதற்கு வேறு விடயங்கள் கிடையாது என்பது எங்கள் எல்லோருக்கும் மிகத் தெளிவாகத் தெரிகின்றது. இவர்கள் இன்றைக்கு நினைத்துக்கொண்டு இருக்கின்றார்கள், தேசிய மக்கள் சக்தி அரசாங்கத்தினராகிய எங்களிடமிருந்து மக்களைப் பிரித்துவிட முடியுமென்று. அவ்வாறு செய்ய முடியாது. ஏனெனில், இந்த அரசாங்கம் மக்களால் உருவாக்கப்பட்ட அரசாங்கம்! எங்களிடமிருந்து மக்களைப் பிரிப்பதற்கு என்ன சதிகளைச் செய்தாலும், இந்த நாட்டு மக்கள் உங்களை ஓரங்கட்டி விட்டார்கள் என்பது எந்தவிதமான மாற்றுக் கருத்துக்கும் இடமில்லாது ஏற்றுக் கொள்ளப்பட்ட உண்மையாகும். எனவே, நாங்கள் மிகத் தெளிவாக ஒரு விடயத்தைச் சொல்கின்றோம். தரம் குறைந்த நிலக்கரியைக் கொண்டுவந்ததாகவும், அதன்மூலம் நாட்டுக்குப் பேரிழப்பு ஏற்பட்டதாகவும், அதன்மூலம் நாட்டில் மின்தடை ஏற்படப் போவதாகவும், அதன்மூலம் இந்த நாட்டுக்குப் பேராபத்து ஏற்படப் போவதாகவும் கூறுகின்ற இவர்கள்தான், கடந்த காலங்களில் எல்லா அபிவிருத்தித் திட்டங்களிலும் கோடிக்கணக்கான ரூபாயைக் கொள்ளையடித்த பாவித் தனமான அரசியல்வாதிகள்!

குறிப்பாக, பிணைமுறி மோசடிமூலம் கோடிக்கணக்கான ரூபாயைக் கொள்ளையடித்தவர்களைப் பாதுகாப்பதற்காக அந்தக் காலத்தில் footnotes இட்டவர்கள்தான் இன்றைக்கு இந்தச் சபையில் எழுந்து சிங்கம்போல் கர்ச்சிக்கின்றார்கள். கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, உண்மையிலே அவர்கள் சிங்கங்கள் அல்ல, நரிகள்! நரிகள் ஊளையிடுவதைக் கண்டு சிங்கங்கள் அஞ்சப் போவதில்லை. இன்றைக்கு இந்தச் சபையில் சிங்கங்களாக இருப்பவர்கள் வேறு யாருமல்ல, தேசிய மக்கள் சக்தியினர்தான். அந்தச் சிங்கங்களில் ஒருவராகவே இன்றைக்கு எங்களுடைய வலுசக்தி அமைச்சர் அவர்கள் இருக்கின்றார். இன்று அவர்மீது அபாண்டமாகப் பழி சுமத்துகிறார்கள். இங்கு ஒரு விடயத்தை மீண்டும் சொல்ல வேண்டும். மனிதனுக்குத் தன்மானம் இருகின்றது; அவனுக்கென மரியாதை இருக்கின்றது; ஒரு குடும்பம் இருக்கின்றது; பிள்ளைகள் இருக்கிறார்கள்; வெளியுலகம் இருக்கின்றது என்பதை மனிதாபிமான ரீதியாகக்கூட சிந்திக்காமல், மிகவும் தான்தோன்றித் தனமானவும் மிருகத்தனமாகவும் குற்றச்சாட்டுகளை முன்வைப்பவர்களுக்கு நாங்கள் இறுதியாகக் கூறுவது வேறெதுவுமல்ல, "நரிகளின் ஊளையைக் கண்டு சிங்கங்கள் அஞ்சப் போவதில்லை" என்றுதான். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු දිලිත් ජයවීර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.36]

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, දීර්ඝ කාලයක ශ්‍රී ලාංකික ඉතිහාසය නිරීක්ෂණය කළහොත්, සිදු වුණු විශාලතම වංචාව ලෙස හඳුනාගත හැකි බවට දැනටමත් විගණකාධිපති වාර්තාවකින් තහවුරු කරන ලද ගල් අඟුරු වංචාව පිළිබඳව පැවැත්වෙන මෙම විවාදයේදී මට ලැබුණු මේ කෙටි අවස්ථාවේ දැක්විය යුතු එකම කරුණ වන්නේ මෙයයි. මෙම විශ්වාස භංග යෝජනාව ගෙන එන්නේ මෙය දිනා ගැනීමේ අරමුණින් නොවන බව ඉතාම පැහැදිලියි. මෙම විශ්වාස භංග යෝජනාව ගෙන ඒමේ අරමුණ වන්නේ මෙම රජයේ ඇඳිවත වන "දූෂණයට එරෙහි ඇඳුම" ප්‍රසිද්ධියේ උනා දමන මේ අවස්ථාවේ, ඔවුන් තමන්ගේ හදවතට විරුද්ධව කටයුතු කරන ආකාරය ජනතාවට ප්‍රදර්ශනය කිරීමටයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විගණකාධිපතිවරයා දත්ත සහිතව, කරුණු සහිතව, ඉතාම පැහැදිලිව කරුණු සනාථ කොට තිබෙනවා. මෙහිදී ගිවිසුම්ගත වූ ට්‍රයිඩන්ට් කියන සමාගමට තිබිය යුතු මූලිකම සුදුසුකම්වල සිට නැව්ගත කරන - load කරන - වරායේදී ලබාගත් සාම්පලවල නිරවද්‍යතාව තහවුරු කරන ලද පරීක්ෂණ ආයතනයේ යථාවත්භාවයක් නොමැති බව, එහෙම නැත්නම් accreditation නැති බව තහවුරු වෙලා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඔබතුමාට තවත් විනාඩි 2ක කාලයක් තිබෙන්නේ, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)

ඒ වාගේම මේ ගල් අඟුරු real-time පාවිච්චි කරන කොට ලැබුණු ප්‍රතිඵල අනුව තමන්ගේ umpire samples පාවිච්චි කරන්නේ නැතිව ඒවා expire වෙන්න ඉඩ දීලා විශාල වරදක් කරලා තිබෙනවා. මෙහිදී මහා විශාල දෙයක් කිව යුතු නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. අපේ රටේ පවත්නා නීතිය අනුව පොදු දේපළ පනතේ Section 5 යටතේ සහ දණ්ඩ නීති සංග්‍රහයේ "වංචා කිරීම" -"Cheating"- යනුවෙන් සඳහන් 398 වගන්තිය සමඟ කියවිය යුතු 403 වගන්තිය - read with Section 403 - යටතේ "දේපළ පිළිබඳ සාපරාධි සාවද්‍ය පරිහරණය" - "Criminal Misappropriation of Property" - කියන පරිච්ඡේදයේ 386 වගන්තිය යටතේ, "සොර බඩු වංක ලෙස බාර ගැනීම" - "Receiving of Stolen Property under Section 394"- යනුවෙන් සඳහන් 394 වගන්තිය යටතේ "අනුබල දීම"- "Abetment"- කියන පරිච්ඡේදයේ under Sections 113 and 101 සහ දූෂණය සඳහා කුමන්ත්‍රණය කිරීම කියන වරද යටතේ මෙයට අදාළ සියලු දෙනා මේ රටේ අධිකරණයක් ඉදිරියේදී වරදකරුවන් වන බව නිශ්චිතයි, පැහැදිලියි.

එම නිසා මෑතකදී අනුමත කළ නව ස්ථාවර නියෝග යටතේ අපි COPE එකෙන්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්තුමාගෙන් සහ අපේ රටේ නීතිපතිතුමාගෙන් ඉල්ලා සිටින්න බලාපොරොත්තු වෙනවා, මේ පිළිබඳව වහාම පියවර අරගෙන චේතනාත්මකව කරන ලද විශාලතම ජාතික ධනය මංකොල්ල කෑම සඳහා කටයුතු කරන ලද සියලුම පුද්ගලයන්ට දඬුවම් ලබා දීමට කටයුතු කරන්න කියලා.

අවසාන වශයෙන් මේ කාරණයත් කියන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)

මේ ආණ්ඩුවට මහ ජනතාව ඉදිරියේ තිබෙන වගකීම කිසිසේත්ම පැහැර හරින්නට බැහැ. ඔවුන්ට මේ බලය ලබා දුන්නේ දූෂණයට විරුද්ධව කටයුතු කරන්නයි. නමුත් ඔවුන් ලොකුම දූෂණය කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, බුදු රජාණන් වහන්සේ - භාග්‍යවතුන් වහන්සේ - ජීවතුන් අතර සිටි සමයේදී ආනන්ද තෙරුන් වහන්සේගෙන් විටෙක අසා තිබෙනවා, "ආනන්ද, සර්පයා දුටුවෙහිද?" කියලා. *[බාධා කිරීම්]* මේ කථාව දැනගන්න ඕනෑ නම්, ඒක සොයාගෙන කියවන්න. මට දැන් ඒක කියන්න වෙලාවක් නැහැ. *[බාධා කිරීම්]* මට අහන්න තිබෙන්නේ "අනුර ජනාධිපතිතුමනි, නයා දැක්කාද?" කියලායි. *[බාධා කිරීම්]* එහි නිධාන කථාව කියවලා දැන ගන්න. මම දන්නවා ඔයගොල්ලන් ඒක දන්නේ නැහැ කියලා. *[බාධා කිරීම්]* දන්නවා නම් කෑ ගහන්නේ නැහැ කියලාත් දන්නවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු අර්කම් ඉල්යාස් නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.41]

**ගරු අර්කම් ඉල්යාස් මහතා (බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அர்கம் இல்யாஸ் - வலுசக்தி பிரதி அமைச்சர்)
(The Hon. Arkam Ilyas - Deputy Minister of Power)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විශේෂයෙන්ම ගල් අඟුරුවල තත්ත්වය පිළිබඳ දිගින් දිගටම සාකච්ඡා වන විවාදයකදී කරුණු දැක්වීමට අවස්ථාව ලබා දීම වෙනුවෙන් ස්තුතියි.

පසුගිය දවසේ නිකුත් වුණු විගණකාධිපති වාර්තාව සමඟ විශාල කථාබහක් ඇවිත් තිබෙනවා වාගේම, මේ ගල් අඟුරුවල තත්ත්වය පිළිබඳව තවදුරටත් කථා වෙන්න අවස්ථාව ලැබී තිබෙනවා කියලා හිතනවා. විශේෂයෙන්ම කරුණු කිහිපයක් සම්බන්ධයෙන් මම මේ අවස්ථාවේදී කරුණු දක්වන්නට කැමැතියි. මේ අවස්ථාවේදී විශේෂයෙන්ම චෝදනා 4ක්, 5ක් ගැන වැඩිපුරම සාකච්ඡා වෙනවා. ඒවායේ ඇත්තම තත්ත්වය මොකක්ද කියලා අපේ ජනතාවට පැහැදිලි කිරීමට තමයි මම මේ අවස්ථාවේදී බලාපොරොත්තු වෙන්නේ.

පළමුවෙන්ම තිබුණා, registered නැති ආයතනයකට ටෙන්ඩර් එක ලබා දෙන්න කටයුතු කර තිබෙනවා කියලා. එතැනදී ලියා තිබෙන එක තමයි, 2025 අගෝස්තු 18වැනි දා ටෙන්ඩර් එක call කරන වෙලාවේ ඒ අදාළ සමාගම තමන්ගේ මුදල් සම්පූර්ණ වශයෙන් ගෙවලා තිබුණේ නැහැ කියන චෝදනාව. අපි කරුණු සොයා බැලුවාම, ඇත්තටම සිද්ධ වෙලා තිබෙන්නේ 2025 අගෝස්තු 18වැනි දාම ඩොලර් 5,000ම ගෙවලා තිබුණා. ඒ ඩොලර් 5,000න් ඩොලර් 20ක මුදලක් currency exchangeවලදී අඩුවෙන් ලැබිලා තිබුණා. ඒ ඩොලර් 20 අගෝස්තු 22වැනි දා ලබා දීලා තිබුණා. එදා ඒ කුවිතාන්සිය ලබා දීලා තිබුණා. ඒක තමයි එතැන සිද්ධ වුණේ.

ඊටත් වඩා හේතුවක් තමයි, ඒ අදාළ Standing High-level Procurement Committee එක ඒගොල්ලන්ගේ minutesවල, විශේෂයෙන් 5.7 නිර්දේශයේ කියලා තිබෙනවා, කවුරුහරි ටෙන්ඩර් එකට සහභාගි වෙනවා නම්, ඒ ටෙන්ඩර් එකට සහභාගි වන කෙනා ටෙන්ඩර් එකේ bid document එක භාරදෙන අවස්ථාවේදී තමන්ගේ මුදල් ටික ගෙවලා තිබෙන්න ඕනෑ කියලා. ඒ අනුව බැලුවොත්, ඇත්තටම අගෝස්තු 22 නොවෙයි, සැප්තැම්බර් 15ට කලින් ඕනෑම දවසක ඒ අදාළ මුදල ගෙවලා තිබුණොත් එයාට bid එකට සහභාගි වෙන්න පුළුවන්. ඒ සඳහා වූ සාක්ෂි තිබෙන Standing High-level Procurement Committee එකේ minutes අඩංගු document එකක් මම අද **සභාගත*** කරනවා.

Item 5.7 of the minutes of the Standing High-level Procurement Committee states, I quote:

> "LCC mentioned that recently approved coal suppliers are still in the process of registering by making payment of USD 5000. SHLPC informed the LCC to inform them that any coal supplier will not be eligible for bidding without being registered by paying USD 5000 before the submission of the bid."

ඒ කියන්නේ, bid එක submit කරන්න කලින්; bid එක call කරන්න කලින් නොවෙයි, submit කරන්න කලින්. ඒ අනුව මේගොල්ලන් සති 3කටත් වඩා වැඩි කාලයකට කලින් ඒ මුදල තැන්පත් කරලා තිබුණා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ඊට පස්සේ අපට දිගින් දිගටම එන චෝදනාවක් තමයි, load port එකේදී, ඒ වාගේම discharge port එකේදී umpire samples check කරලා තිබුණේ නැහැ කියන එක. ඒ samples පිළිබඳව දිගින් දිගටම කථා කරලා තිබුණා. ඒ පිළිබඳවත් මම කරුණු කියන්න කැමැතියි. විශේෂයෙන්ම අපි load port එකේදී 13වැනි සහ 14වැනි නැව් දෙකේම samples South Africaවල Bureau Veritas කියන accredited lab එක හරහා check කරලා තිබෙනවා. ඒ වාගේම discharge port එකේදී දැනට අපි umpire samples 9ක් ඕස්ට්‍රේලියාවේ Bureau Veritasවලට යවලා තිබෙනවා. විශේෂයෙන්ම පළමුවැනි නැව, 9වැනි නැව, 12වැනි නැව. ඒ වාගේම මුල් නැව් 6 අතර තිබුණු තවත් නැව් 3ක umpire samples අපි discharge port එකේදී check කරන්න යවලා තිබෙනවා. ඉතින්, දිගින් දිගටම umpire samples check කළේ නැහැ කියන තර්කය සම්පූර්ණයෙන්ම බොරු. අපි සම්පූර්ණයෙන්ම ඒ අදාළ umpire samples check කරන තැන්වලට යොමු කරලා තිබෙන්නේ. ඒ results එක්ක අපට ගොඩක් තීන්දු-තීරණ ගන්න පුළුවන් වෙයි.

ඒ වාගේම දිගින් දිගටම කියපු තවත් කරුණක් තමයි, South Africaවල ඒ accredited lab එකේ accreditation එක Indonesian lab එකට නැහැ කියන එක. එතැනදීත් අපි විශේෂයෙන්ම දැනගත යුතු කරුණු ටිකක් තිබෙනවා. විශේෂයෙන්ම Mitra SK - South Africa කියන ඒ accredited lab එකට අපේ රටේ දඩ මුදල් අය කරන සියලු නිර්ණායකවලට අදාළව accreditation තිබෙනවා. විශේෂයෙන්ම, GCV එක, සල්ෆර්, fixed carbon, size එක, ash percentage කියන ඒ සියලු දේවල් බලන්න අදාළ accreditation ඒගොල්ලන්ට 2025 ඉඳලා 2030 දක්වා සම්පූර්ණයෙන්ම තිබෙනවා. ඒගොල්ලන්ට නැතිවෙලා තිබුණේ ashවල සංයුතිය බලන accreditation. Ashවල සංයුතිය බලන එක සාමාන්‍යයෙන් අපේ දඩ මුදල් තීරණය කිරීමට අදාළ වන සාධකයක් නොවෙයි. ඒක බලන්න තමයි ඒගොල්ලන් ඉන්දුනීසියාවට යැව්වේ. ඒ ඉන්දුනීසියානු lab එකටත් අපි අපේ contract එක ලබාදෙන මොහොතේ accreditation තිබුණා. ඒ accreditation, 2025.12.29 දක්වා වලංගු වෙලාත් තිබුණා. 2025.12.29න් පස්සේ ඒක කල් ඉකුත් වෙලා තිබෙනවා. සාමාන්‍යයෙන් මේ field එකේ ඉන්න ඕනෑ කෙනෙක් දන්නවා මේ accreditation, recognition කල් ඉකුත් වුණාම ඒ recognition හෝ accreditation දෙන සමාගම හෝ අදාළ ආයතන ඒ රටවලින් ඇවිල්ලා check කරලා දෙන්න සාමාන්‍යයෙන් කාලයක් ගන්නවා කියලා. ඒ කාලය අවසන් වුණාට පස්සේ බොහෝ දුරට දෙන්නේ, ඒ අදාළ දවස backdate කරලා. ඒ අදාළ සමාගම අපිට ලිඛිතව දැනුම් දීලා තිබෙනවා, "අපි ඒ accreditation ගන්න process එකේ ඉන්නේ. ඉතාම ඉක්මනින් ඒක ගන්න පුළුවන්" කියලා. විශේෂයෙන්ම Mitra SK කියන South African සමාගමට, අපේ දඩ මුදල් calculate කිරීමේ සියලු නිර්ණායක බලන සමාගමට තවදුරටත් - 2025-2030 දක්වා - accreditation තිබෙනවා. ඊට අදාළ document එකත් මට මේ අවස්ථාවේ දී **සභාගත*** කරන්න පුළුවන්.

ඒ වාගේම සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ නිර්ණායක වෙනස් කරලා තිබෙනවා කියලා දිගින් දිගටම කියලා තිබුණා. අපි දිගින් දිගටම කිව්වා, 2023 අවුරුද්දේ ඉඳන් සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ නිර්ණායක කිසිම විධියකට අපි වෙනස් කරලා නැහැ, සාමාන්‍ය විධියට ඒ කාලයේ තිබ්බ එකමයි කළේ කියලා.

තවත් එකක් කියලා තිබුණා මේ අවුරුද්දේ අපේ special tender එක - ඒ කියන්නේ අපේ emergency tender එක - දිනපු සමාගම කිලෝකැලරි 5ල900ට වඩා තිබෙන supply එක අඩුම තරමින් ලක්ෂයක්වත් සපුරලා නැහැ කියලා. ඇත්තටම ඒ සමාගම register කරලා තිබෙන්නේ 2023 අවුරුද්දේ. අපේ ආණ්ඩු කාලයක නොවෙයි. මම දැන ගත්ත විධියට ඒ කාලයේ තිබුණ High-level Procurement Committee එකෙන් අවසර අරගෙන තමයි register කරලා තිබුණේ. ඒකත් අපේ ආණ්ඩු කාලයක සිද්ධ වෙච්ච දෙයක් නොවෙයි.

මම හිතනවා විශේෂයෙන්ම අපේ ටෙන්ඩර් Agreement එකේ තිබෙන සමහර කරුණු ඇත්තමට වෙනස් වෙන්න ඕනෑ කියලා. කාලයත් එක්ක මේ තිබෙන හිඩැස් ටික වහන්න ඕනෑ කියලා පිළිගෙන තිබෙනවා. අපි 2025, 2026, 2027 අවුරුදු සඳහා ඒ සම්බන්ධ ගොඩක් වෙනස්කම් කරලා තිබෙනවා. විශේෂයෙන්ම විගණකාධිපති වාර්තාවේ කියලා තිබෙනවා අවුරුදු 3ක් සඳහා එකවර register කිරීම කියන කාරණය. ඒ අනුව, 2023දී register වෙච්ච සමාගමට ඒගොල්ලන්ගේ කලින් ඒවා පිළිබඳ නිරීක්ෂණ බලන්නේ නැතිව, එවැනි review එකක් කරන්නේ නැතිව 2026 ටෙන්ඩර් එකට සහභාගි වෙන්න පුළුවන්. සමහර වෙලාවට ඒගොල්ලන් බුන්වත් වෙලා තිබෙන්න පුළුවන්, අසාධු ලේඛනගත වෙලා තිබෙන්න පුළුවන්. එවැනි සමාගමකට දෙන්න අවස්ථාව තිබුණා. අපි ඒ නිරීක්ෂණය අනිවාර්යයෙන්ම පිළිගන්නවා. ඒ නිසා අපි 2026-2027 අවුරුද්දට අදාළ ටෙන්ඩර් එකේදී ගොඩක් දේවල් වෙනස් කළා. විශේෂයෙන් මේ වාගේ හිඩැස් තිබෙන තැන් පුළුවන් තරම් ප්‍රමාණයක් අපි වහලා තිබෙනවා. තවත් ඒවා ඉදිරියට ආවොත් ඒ හැම එකක්ම අපි වහනවා. විපක්ෂයේ අයට කලින් අමතක වෙලා හෝ ඕනෑ කමින්ම නවත්වලා හෝ තිබුණු ඒවා අපි සම්පූර්ණයෙන්ම විසඳා තිබෙනවා. ඒ කියන්නේ one millionවලට වඩා supply එක වැඩි වෙලා තිබෙන්න ඕනෑ, GC Value එක 5900ට වැඩි. ඒගොල්ලන්ගේ සම්පූර්ණ බිස්නස් එකේදී අවුරුදු තුන ඇතුළතදී two millionවලට වඩා වැඩියෙන් supply කරලා තිබෙන්න ඕනෑ.

හැම දාම මේගොල්ලෝ කථා වුණා, load port එක, load port එක කියලා. Load port එකත් supplier තමයි තෝරලා දෙන්නේ. ඒගොල්ලන් යෝජනා කරන එකක් තෝරා ගන්නා ක්‍රමයක් තමයි තිබුණේ. 2026-2027 ටෙන්ඩර් එකේදී අපි load port එක define කරලා දෙනවා. Load port එක වාගේම discharge port එක යන දෙකේම labs තෝරා ගන්නේ අපි බවට පත් කරලා තිබෙනවා.

ඒ වාගේම working capital එක කලින් තිබුණේ US Dollars 15 million. අපි ඒක US Dollars 30 million කරලා තිබෙනවා. Turnover එක කලින් තිබුණේ US Dollars 150 million. ඒක US Dollars 300 million කරලා තිබෙනවා.

ඒ වාගේමයි supplier. හැම දාම තිබුණේ එක ටෙන්ඩර් එකකින් ඒක supplier කෙනෙක් මත රඳා පවතින ටෙන්ඩර් එකක්. අපි මේ සැරේ ඒක වෙනස් කළා. ඒක reverse bidding තත්ත්වයක් කියලා කියන්න පුළුවන්. පළමුවෙනියාට දෙන්නේ සියයට 50යි. ඊට පස්සේ දෙවැනියාට, තුන්වැනියාට ආරාධනා කරනවා, පළමුවෙනියාගේ මිල match කරන්න කියලා. එහෙම match කරන්න පුළුවන් වුණොත් අපි suppliersලා දෙතුන්දෙනෙක්ගෙන් ලබා ගන්න බලාපොරොත්තු වෙනවා. එතකොට එක supplier කෙනෙක් මත රැඳී පවතින එකත් නතර වෙනවා. ඒ වාගේ වෙනස්කම් කිහිපයක් අපි කරලා තිබෙනවා.

විගණකාධිපති වාර්තාවේ කියලා තිබුණා, නීතිපතිගේ එකඟතාව ලබා ගැනීමට පෙර Agreement එක sign කළා කියලා. මම ඒ පිළිබඳවත් නිලධාරින්ගෙන් විමසුවා මොකක්ද වෙලා තිබෙන්නේ කියලා. ඒගොල්ලෝ කිව්වා, "නොවැම්බර් 19වෙනි දා විගණකාධිපතිගේ එකඟතාව ලබා ගැනීම මත" කියලා තමයි Agreement එක sign කරලා තිබුණේ කියලා. ඒ document එක මම මේ වෙලාවේ සභාගත කරන්න පුළුවන්. ඊට පස්සේ

---

** **පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු අර්කම් ඉල්යාස් මහතා]

විගණකාධිපතිගේ එකඟතාව එවලා තිබුණා. ඊටත් පස්සේ විගණකාධිපතිගේ සියලු නිර්දේශ incorporate කරලා තමයි නොවැම්බර් 24වෙනි දා ඒ Agreement එක sign කරලා තිබෙන්නේ. ඒ පිළිබඳවත් documents තිබෙනවා. ඒ documents සභාගත කරන්න පුළුවන්.

ඒ වාගේම දිගින් දිගටම කියනවා මේ නිසා ලොකු පාඩුවක් වෙලා තිබෙනවා කියලා. මම හිතන්නේ එක එක තැන්වල එක එක විධියට කථා කරනවා. එක තැනක කියා තිබෙනවා මිලියන 8,000ක විතර පාඩුවක් වෙලා තිබෙනවා කියලා. ඇත්තටම අපට ඒක පිළිගන්න බැහැ. සාමාන්‍ය වශයෙන් අපට අහිමි වන සම්පූර්ණ විදුලි ශක්ති ප්‍රමාණය ඩීසල්වලින් නිෂ්පාදනය කරන විධියට ගණනය කරලා තමයි මිලියන 8,000ක් විධියට ගණන් හදලා තිබෙන්නේ. අපි ඒක හරියට පැහැදිලි කර ගත්තොත්, සාමාන්‍යයෙන් අපි විදුලිය ජනනය කරන ප්‍රභවයන් කිහිපයක් තිබෙනවා. ජල විදුලිය, සූර්ය විදුලිය, සුළං විදුලිය, ගල් අඟුරුවලින්, ඩීසල්වලින්, ඒ වාගේම නැප්තාවලින් සහ විවිධ ඉන්ධන මඟින්. එහෙම බැලුවොත්, අපට ජල විදුලිය නිෂ්පාදනය කිරීමේදී යුනිට් එකකට රුපියල් 3කට අඩු ප්‍රමාණයක් තමයි වැය වෙන්නේ. සුළඟින් විදුලි නිෂ්පාදනය කරනකොට ඒකකයකට රුපියල් 12කට අඩු ප්‍රමාණයක් වැය වෙනවා. සූර්ය විදුලිය නිෂ්පාදනය කරන්න රුපියල් 15ත්, 37ත් අතර ගණනක් වැය වෙනවා. විශේෂයෙන් රුපියල් 37ක් වැය වෙන්නේ, විපක්ෂයේ උදවිය අවුරුදු 20කට agreement ගහලා තිබෙන නිසායි. ඒ වාගේම රුපියල් 15යි, 37යි අතර ප්‍රමාණයක් තමයි සූර්ය ශක්තියෙන් විදුලිය හදන්න අපට වැය වෙන්නේ. ඒ වාගේම ගල් අඟුරුවලින් විදුලිය හදන්න රුපියල් 20කට ආසන්න ප්‍රමාණයක් වැය වෙනවා. ඩීසල්වලින් හදන්න රුපියල් 60ත්, 75ත් අතර මුදලක් වැය වෙනවා.

රුපියල් මිලියන 8,000ක් කියන මේ ගණන හදලා තිබෙන්නේ, සම්පූර්ණ විදුලිය ප්‍රමාණය ඩීසල්වලින් නිෂ්පාදනය කරනවාය කියන පදනම මතයි. ඇත්තටම බැලුවොත්, අපි ඩීසල් වැඩිපුර භාවිතයට ගන්නේ night peak එකේදී. ඒ කියන්නේ, සවස 6.00න් පස්සේ. සවස 6.00ත්, රාත්‍රි 10.00ත් අතර ඩීසල්වලට ගියත්, ඊට පස්සේ අපි යන්නේ අනෙක් ප්‍රභවයන්ට. ඒ කියන්නේ ඒකට වඩා තුන්ගුණයක්, හතරගුණයක්, පස්ගුණයක් වියදම අඩු ප්‍රභවයන්ගෙන් තමයි විදුලිය අරන් තිබෙන්නේ. ඇත්තටම එක් එක් දවස්වල ගල් අඟුරු පාවිච්චිය අඩු වීම නිසා වැඩි වුණු පිරිවැය ගණන් හදලා අන්තිම මොහොතේ තමයි අපට සත්‍ය පාඩුව කියන්න පුළුවන් වෙන්නේ. ඇත්තටම, රුපියල් මිලියන 8,000ක් කියන එක - *[බාධා කිරීමක්]*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ආණ්ඩු පක්ෂය පැත්තෙන් මෙතුමාට අමතර විනාඩි 5ක කාලයක් ලබා දෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට විනාඩි 5ක අමතර කාලයක් ලැබෙනවා.

**ගරු අර්කම් ඉල්යාස් මහතා**
(மாண்புமிகு அர்கம் இல்யாஸ்)
(The Hon. Arkam Ilyas)
විගණකාධිපති වාර්තාවේ කියලා තිබෙනවා, ආසන්න වශයෙන් කෝටි 223ක පාඩුවක් ඇතිවෙලා තිබෙනවා කියලා. *[බාධා කිරීමක්]* ඇත්තටම අපි අද වෙනකොට නැව් 13කට අදාළව ඇමෙරිකානු ඩොලර් මිලියන 17ක් - කෝටි 510ක් - අදාළ සමාගමට නොගෙවා රඳවා තබාගෙන තිබෙනවා. ඒ කියන්නේ ගෙවලා නැහැ. පාඩුව කෝටි 223යි කියලා කිව්වේ. නමුත්, අපි කෝටි 510ක් රඳවා තබාගෙන තිබෙනවා. ඒ වාගේම, ඒ ගොල්ලන්ගේ bid bond එක වශයෙන් තවත් ඩොලර් මිලියන 15ක්, ආසන්න වශයෙන් කෝටි 450ක් අපේ ළඟ තිබෙනවා. ඒ කියන්නේ, කෝටි 960ක් පමණ. අදාළ සමාගමෙන් කෝටි 1,000කට ආසන්න ප්‍රමාණයක් දැනටත් අපි ළඟ රඳවා තබාගෙන තිබෙනවා. දැනට පාඩුව කෝටි 223යි නම්, ඒ වගේ හතරගුණයක මුදලක් අපි දැනටත් රඳවා තබාගෙන තිබෙනවා.

ඒ වාගේම අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමාටත් කියන්න ඕනෑ, ඔබතුමන්ලාගේ කාලයේ සිදු වූ ඇමෙරිකානු ඩොලර් මිලියන 1.5ක් වන පාඩුව තවම අයවෙලා නැහැ කියන එක. නඩුව ක්‍රියාත්මක වෙනවා. ඒ මුදලත් අපට අරගෙන දුන්නා නම්, විදුලි බිලෙන් තව පොඩි ගණනක් අඩු කර ගන්නත් පුළුවන් වෙයි කියලා මම හිතනවා.

මෙතුමන්ලා ඉදිරිපත් කළ තවත් ප්‍රශ්නයක් තමයි, සැලසුම් කළ කාල පරිච්ඡේදය ඇතුළත ගල් අඟුරු ලබා ගැනීමට නොහැකි වීම. ඒ කියන්නේ නැව් ප්‍රමාද වී පැමිණීම. ඒ පිළිබඳව දිගින් දිගටම සාකච්ඡා වුණා.

විශේෂයෙන්ම අපි කියන්න ඕනෑ ඊට කලින් supplier දිගින් දිගටම, - මම හිතන්නේ අපේ Cabinet එකෙන් approval එක දීලා ටෙන්ඩර් එකෙන් ආපු කෙනාව විසි කරලා Cabinet එකෙන් දීපු supplier අපට ගොඩාක් පරක්කු වෙලා තමයි නැව් ටික අරගෙන ආවේ. ගොඩාක් පරක්කු වෙලා තමයි නැව් ටික අරගෙන ආවේ. දෙසැම්බර් 8 වෙනකන් ඒගොල්ලන්ගේ නැව් ටික පරක්කු කළා. අපේ ආණ්ඩු කාලයේ දී ප්‍රථම වතාවට අවුරුදු 15ක ඉතිහාසයේ පරක්කු වෙච්ච නැව්වලටත් ආසන්න වශයෙන් ඩොලර් ලක්ෂ 5ක දඩ මුදල් ගහලා තිබෙනවා කියල අපි හිතනවා. විශේෂයෙන්ම පසුගිය අවුරුදුවල පරක්කු වෙච්ච හැම නැවක් පිළිබඳව වාර්තාවක් අරගෙන ඒ හැම නැවක් හරහාම අදාළ දඩ මුදල් තීරණය කරලා අය කර ගන්න බලාපොරොත්තු වෙනවා. මොකද, අපි එක තැනකවත් ඒ සමාගම් වෙනුවෙන් පෙනී සිටින්නේ නැහැ. ඒ සමාගම් මොනවා හෝ වැරැද්දක් කරලා තිබුණා නම් ඒ සමාගම්වලින් අදාළ දඩ මුදල් අය කර ගන්නවා.

විශේෂයෙන්ම විගණකාධිපති වාර්තාව අපේ agreement එකේ මොනවා හරි අඩුපාඩු තිබුණා නම් ඒ පිළිබඳව අපිව දැනුවත් කරලා තිබෙනවා. ඒ දැනුවත් කිරීම හරහා ඉස්සහරට තිබෙන සියලු tenders අපි හදලා තිබෙනවා. ඒ වාගේම විගණකාධිපති වාර්තාවේ සමහර කරුණු පිළිබඳව අපේ විශ්ලේෂණ, අපේ නිරීක්ෂණ, අපේ comments මෙතැන ප්‍රකාශ කළා. විශේෂයෙන්ම අපේ procurement process එකේදී ඒ වාගේම අපේ දඩ මුදල් අය කර ගැනීමේ දී ඒ කිසිම තැනකදී අපි කිසිම වැරැද්දක් කරලා නැහැ කියන එක තමයි කියන්න තිබෙන්නේ.

අවසාන වශයෙන් කියන්න ඕනෑ, ඉදිරි විදුලි බිල වැඩිවීමක දී කිසිම මුදලක් - රුපියලක, සතයක මුදලක් - අය කිරීමෙන් මේ ගල් අඟුරු නිසා ඇතිවන පාඩුව රජය ජනතාව මත පවරන්නේ නැහැ කියන එක. ඒක ගණන් හදලාම පෙන්නුවා. ආසන්න වශයෙන් අපි රුපියල් කෝටි 960කට ආසන්න ප්‍රමාණයක් දැනටත් නවත්වා ගෙන ඉන්නවා. ඉස්සරහට එන නැව්වල මොනවා හරි ප්‍රශ්නයක් වුණොත් එතැනිනුත් යම් මුදල් ප්‍රමාණයක් අය කර ගන්න පුළුවන් වෙයි කියලා අපි හිතනවා. ඒ නිසා රුපියලක්වත් ජනතාවගෙන් අය කර ගන්න අපි කටයුතු කරන්නේ නැහැ කියන එක තමයි මට කියන්න තිබෙන්නේ. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 3ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.56]

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට කථා කරන්න විනාඩි තුනක් දුන්නාට ස්තුතියි.

ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරියක් කිව්වා tender document එක issue කළා, ඩොලර් 20ක අඩුවක් තිබුණු එක ප්‍රශ්නයක් නැහැ කියලා. ප්‍රසම්පාදනය ගැන කථා කළා. මම එතුමියගේ කථාව අහගෙන හිටියා. අපි දන්නා කාරණාවක් තමයි ප්‍රසම්පාදන නීතිය අනුව ප්‍රසම්පාදන, එහෙම නැත්නම් tender document එක සඳහන් කරලා තිබෙනවා නම් ලියාපදිංචි සමාගමක් කියන එක, එතැනින් එහාට ඔබතුමියත් දැන් ටෙන්ඩර් එක ගන්න ආවානම් අපි කියන්නේ ටෙන්ඩර් පත දෙන්න කලින් ඔබගේ ලියාපදිංචිය ඉදිරිපත් කරන්න කියන එකයි. ලියාපදිංචිය ඉදිරිපත් කරන්න කියලා කිව්වාම කියන්න බැහැ, "ඩොලර් 20ක් තව ගෙවන්න තිබෙනවා, ඒක පස්සේ ගෙවනකල් මේක දෙන්න" කියලා. හැබැයි, දෙන්න කියන්න පුළුවන් කාට හෝ. ඒ, ජයකොඩි ඇමතිද දන්නේ නැහැ. එහෙම දුන්නාද දන්නේ නැහැ. අන්න ඒකයි අපි කියන්නේ. විගණනයේ කියන්නෙත් ඒකයි. දෙයියනේ! මේ විගණන දෙපාර්තමේන්තුවේ විගණකාධිපතිනිය මේ ලියාපදිංචිය නැහැයි කියන කාරණය කියන්නේ ඒකයි. ඩොලර් 20 ගෙවලා ආවාට පස්සේ මේක දෙන්න කියලා කවුද කිවුවේ?

ඇයි එහෙම කියන්නේ? මේ සමාගමට දුන්නා කියන කාරණය "ලක්විජය බලාගාරය සඳහා ලංකා ගල් අඟුරු සමාගම විසින් ගල් අඟුරු මිලදී ගැනීමේ ක්‍රියාවලිය සහ 2025/2026 වාරය සඳහා ගල් අඟුරු ප්‍රසම්පාදනය පිළිබඳ විශේෂ විගණන වාර්තාව" 102 පිටුවේ, 6. නිරීක්ෂණ යටතේ, 6.1.3වන ඡේදයේ අන්තිම කොටසේ සඳහන්ව තිබෙන්නේ මෙසේයි:

> "තවද, ගල් අඟුරු සැපයීම සඳහා හැකියාව ඇති ලියාපදිංචි වීමට ඉල්ලීම් කළ නොහැකි වූ අනෙකුත් සැපයුම්කරුවන් හට මෙම අවස්ථාව ලබා නොදීම තුළ ප්‍රසම්පාදන මූලධර්මයක් වූ සාධාරණත්වය නැමැති මූලධර්ම කඩ වී ඇති බවත් විගණනයට නිරීක්ෂණය විය."

මට මේක සම්පූර්ණයෙන්ම කියවන්න බැහැ. මොකද, මට ලැබිලා තිබෙන්නේ විනාඩි 3ක කාලයක් පමණක් නිසා.

ඔබතුමන්ලා හොරාටම දීලා. ඒක තමයි කියන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අනෙක් කාරණය මෙයයි. ඔබතුමන්ලාට, අපට තර්ක කරන්න පුළුවන්. ඔබතුමන්ලාගේ ආණ්ඩුව වුණත්, අපේ ආණ්ඩුවක් වුණත් ඒ හැම ආණ්ඩුවක්ම රජයේ බදු මුදල්වලින් කරන වංචා-දූෂණ සියල්ලක්ම හොයන්නේ විගණන කාර්යාලයෙන්. ඔබ කියනවා මේක හොරකමක් කියලා කියනවා නම්, අපට කරුණු ඉදිරිපත් කරන්න ලූ. අපිට බැරි වුණා කියමු කෝ. ජාතික විගණන කාර්යාලයේ මේ පොත ඊයේ COPE එකේදී අමාත්‍යාංශයේ ලේකම් නම් පිළිගත්තා. මේක පිළිගත්ත නිසා - දැන් සිද්ධ වෙලා තිබෙන්නේ වෙන මොකක්වත් නොවෙයි. ජනාධිපතිතුමා ගල් අඟුරු කැවා. ඇමතිතුමා ඒක පැහැරුවා. දැන් ඔබතුමන්ලා මේක හූර හූරා සුද්ද කරන්න හදනවා. ඒක තමයි දැන් ආණ්ඩු පක්ෂයට සිද්ධ වෙලා තිබෙන්නේ. ඒ නිසා ඔබතුමන්ලා තේරුම් ගන්න මේ රටේ කවුරු ආණ්ඩු කළත් - දැන් ඔබතුමන්ලා කියනවා, "අපි මේ විගණන වාර්තාව ලබා ගත්තා, දැන් අපිට හොඳයි" කියලා. දැන් ඔබතුමන්ලාට මේක පිළිගන්න වෙනවා. ඒ නිසා ලජ්ජා නැතිව මේක පිළිගන්නවා නම් මේ ඇමතිවරයාට ඉල්ලා අස් වෙන්න කියන්න. එහෙම වුණොත්, ජාතික ජන බලවේගයේ කියා ගන්නා කට්ටියට, තමන්ට ඡන්දය දුන් අය වෙනුවෙන් ඒ ගෞරවය, අභිමානය ලබා ගන්න පුළුවන්. ඒ නිසා ඔබ හොරු අල්ලන කඳවුර නොවෙයි, ඔබ හොරා කන කඳවුර බවට අද පත්වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ කාරණයත් කියලා මගේ කථාව අවසන් කරනවා. ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමනි, රට බේරා ගත්තා නේ, රට බේරා ගත්තා නේ කිය කියා හිටියා, ඉතිහාසයේ අවුරුදු 10ක්, 15ක් තිස්සේ. දැන්, අනේ! රට කැවා නේ, රට කැවා නේ කියලා අවුරුදු 20කින් ගහලා එළවයි. මේක කියන්නේ මේ රටේ පුරවැසියන්ට. "අපි හොරකම් කරන්නේ නැහැ; අපි හොරකම් කරන්නේ නැහැ" කියලා කිව්වාම හොරකම් කරන එකක් නැහැ කියලා දැන් රටේ පුරවැසියෝ හිතේ තියාගෙන ඉන්නවා නම්, තව අවුරුදු දෙකක් තුනක් යනකොට තේරේවි, හොරා කාලා, රට නන්නත්තාර කරලා, රටේ ජනතාව අසරණ කළේ වෙන කවුරුවත් නොවෙයි, ජාතික ජන බලවේගයේ ඔබතුමිය ඇතුළු බුද්ධිමතුන් කියන එක. ඒ කාරණය මතක් කරමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් තිබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු සාගරිකා අතාවුද මහත්මිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සංජීව රණසිංහ මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு (திருமதி) சாகரிகா அதாவுத அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. (MRS.) SAGARIKA ATHAUDA left the Chair, and THE HON. SANJEEWA RANASINGHA took the Chair.*

[අ.භා. 4.00]

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ විනාඩි 4 හරියටම මේ වෙලාවේ ඉඳන් බලාගන්න.

මුලින්ම මම මේ කාරණය කියන්න ඕනෑ. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා ඇතුළු අය

[ගරු චාමර සම්පත් දසනායක මහතා]

කියනවා, මේ ෆුට්නෝට්කාරයෝ කියලා. මේ ෆුට්නෝට්කාරයෝ හින්දා තමයි, මිනිස්සු මෙතැනට 30ක්, 40ක් විතරක් එව්වේ. ඔයගොල්ලන්ගේ වැදගත් මහත්වරු නෝනලා 159කට මේ ආණ්ඩුව බාර දුන්නේ අර අය ඒ දේවල් කරපු නිසා තමයි. ඔයගොල්ලන්ට ඒ දේවල් කරන්න එපා කියලා තමයි 159ක් මෙතැන වාඩි කෙරෙව්වේ. වැදගත් විධියට මහත්වරු, නෝනලා 159ක් මෙතැන වාඩි කෙරෙව්වේ ඒ නිසායි. ඒ නිසා ඒවා ගැන ආයෙත් කියන එක වැඩක් නැහැ. 2015දී කරපුවා කියන්න එපා. 2024 ඉඳන් කරපුවා කියන්න පටන් ගන්න.

Lanka Coal Company එකේ සභාපතිවරයා දෙසැම්බර් මාසයේ අයින් වුණා. අයින් වෙච්ච වෙලාවේදී ඒ සභාපති භාර දුන් ලියුමේ තිබෙනවා, මේකේ වැරදිකාරයෝ කවුද කියලා. හේමපාල තමයි ලේකම්. මේකට වගකියන්න ඕනෑ හේමපාලයි, ඇමතිතුමායි කියන එක ඒ සභාපතිගේ ලියුමේ කියා තිබෙනවා. දැන් ඔයගොල්ලන් ලැහැස්ති වෙන්නේ මොකකටද? ඔයගොල්ලන් GMව arrest කරන්න යනවා. එම නිලධාරියාගේ නම මොකක්ද? GMගේ නම නාමල් හේවගේ. ඔබතුමන්ලා නාමල් හේවගේ arrest කරන්න හදනවා. එහෙම GM වන නාමල් හේවගේ අත්අඩංගුවට ගන්නවා නම් ඇමතිතුමාත් එක්කම අත්අඩංගුවට ගන්න කියන්න. එහෙම නම් ඇමතිතුමායි, නාමල් හේවගේයි දෙදෙනාම අත්අඩංගුවට ගන්න කියන්න. ඔබතුමන්ලා මීට පෙර ඉලුක්පිටිය ඇතුළට දාලා, ඉලුක්පිටියට අසාධාරණයක් කළා වාගේ මේ රාජ්‍ය නිලධාරින්ටත් එහෙම කරන්න යන්න එපා. මොකද, ඒ මිනිස්සු පව්. මේක GMගේ ඇඟේ තියන්න තමයි මේ ලැහැස්ති වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඇතුළු මේ මන්ත්‍රීවරුන් එක දෙයක් මතක තියාගන්න. ඔයගොල්ලන්ගේ ආණ්ඩුවට තවම වෙන්නේ අවුරුද්දයි මාස 4යි. ඒ අවුරුද්දයි මාස 4ට සිද්ධ වෙච්ච තුන්වැනි සිද්ධිය මේක. පළමුවැනි එක මොකක්ද? පළමුවැනි එක තමයි, අර අහිංසක හිටපු කථානායකට විරුද්ධව ගේන්න හදපු විශ්වාස භංගය. එතුමා හොර සහතිකයක් දීලා තිබෙන නිසා ඒ තනතුරින් අයින් වුණා. ඊට පස්සේ ඒ විශ්වාස භංගය ඉදිරිපත් වුණේ නැහැ. දෙවැනි එක මොකක්ද? දෙවැනි විශ්වාස භංගය, අර "බංකු-බංකු" ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමාට ගෙනාවා. ඒ වෙලාවේදී ඔබතුමන්ලා මොකක්දෝ ගහලා ඒ නියෝජ්‍ය ඇමතිවරයා වෙනුවෙන් එවැනි විශ්වාස භංග යෝජනාවක් ගේන්න බැහැ කිව්වා. ඒ නියෝජ්‍ය ඇමතිවරයාට එරෙහිව විශ්වාස භංගයක් ගේන්න බැහැ කිව්වේ මොකද? ඒ දෙවැනි එක ගේන්න බැහැ කියපු හේතුව මෙයයි.

සහරාන් හෂීම් ඇතුළු 10දෙනෙක් බෝම්බ පුපුරවන්න කලින් කළු ඇඳගෙන නැඟෙනහිර පළාතේදී දිවුරුම් දුන්නා, මතකද? මේ රටේ මිනිස්සු ඒක දන්නවා. නැඟෙනහිර පළාතේදී දිවුරුම් දුන්නා, "අපි යනවා, මරාගෙන මැරෙන්න" කියලා. කළු පාට ඇඳුම් ඇඳගෙන නැඟෙනහිර පළාතේදී තමයි ඒ දිවුරුම දුන්නේ. ඒ දිවුරුම් දීපු වෙලාවේ නැඟෙනහිර පළාතේ ආඥාපති කවුද? එදා නැඟෙනහිර ආඥාපති තමයි දැන් ඉන්න ආරක්ෂක නියෝජ්‍ය ඇමති. ඒ නියෝජ්‍ය ඇමතිවරයාට විරුද්ධවත් විශ්වාස භංගයක් ගේන්න හැදුවා. මේක අහගන්න. 1990දී රණසිංහ ප්‍රේමදාස මහත්තයා දෙවැනි යුද්ධය පටන් ගන්නකොට නැඟෙනහිර ආඥාපති හැටියට යැව්වේ ජෙනරාල් කොබ්බෑකඩුව. ජෙනරාල් කොබ්බෑකඩුව ගිහිල්ලා මාසයෙන් නැඟෙනහිර පළාත සාමාන්‍ය තත්ත්වයට ගත්තා. ජෙනරාල් කොබ්බෑකඩුව එදා නැඟෙනහිරට යනකොට මේ නියෝජ්‍ය ඇමතිවරයා second lieutenant කෙනෙක්. ඊට පස්සේ ජෙනරාල් කොබ්බෑකඩුවගේ තනතුරට ආපු මනුස්සයෙක්, මේ පුද්ගලයා. ඔහුට විරුද්ධව විශ්වාස භංගයක් ගෙනාවාම ඔබතුමන්ලා මොනවා හරි මොත්තයක් ගහලා ඒකත් හකුළා ගත්තා. මේ, තුන්වැනි විශ්වාස භංගය, මහත්වරුනේ. මේ ඔයගොල්ලන්ට ආපු තුන්වැනි විශ්වාස භංගය. ඔයගොල්ලන් මොනවාද කළේ?

හොරකම් කරන්න කියන්න, ඔයගොල්ලන් හදලා. ලක් විජය බලාගාරය හැදුවේ ඔයගොල්ලන්ද? ලක් විජය බලාගාරය හදනකොට ඔයගොල්ලන් කොච්චර උද්ඝෝෂණ කළා ද? උමා ඔය හදනකොට කිව්වා, උමා ඔයේ බැම්මේ හිලක් තිබෙනවා කියලා. දැන් ඒකෙන් මෙගාවොට් 120ක විදුලි බලයක් නිෂ්පාදනය කරනවා. ඔයගොල්ලන් විදුලිය කපාගන්න, ඔයගොල්ලන්ගේ ගෙවල්වල. අපේ ගෙවල්වල විදුලිය කපන්න එපා. අපේ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය නව ලක්ෂපාන ජල විදුලි බලාගාරය හැදුවා. එක්සත් ජාතික පක්ෂයෙන්, UNP ආණ්ඩුවෙන් කොත්මලේ, වික්ටෝරියා හැදුවා. මහින්ද රාජපක්ෂ මහත්තයා ලක් විජය බලාගාරය හැදුවා. ඔයගොල්ලන්ට අයිතියක් නැහැ, මේ රටේ විදුලිය කපන්න කියන්න. ඔයගොල්ලන්ගේ විදුලිය කපාගන්න.

අනික් එක, මේ ඇමතිවරයා හරියට මේ දේවල් ඔහු හැදුවා වාගේ තමයි වැඩ කරන්නේ. මේවා අනුන්ගේ ආණ්ඩුවලින් හදපු දේවල්. මේවා මිනිස්සු දුක් විඳලා හදපුවා. මේ රටේ මිනිස්සු පෝලිම් ගහලා, උද්ඝෝෂණ කරවලා ඒවා හදන්න ඉඩ දීපු නැති උදවිය තමයි අද මේ ඉන්නේ. ඔයගොල්ලන් මේ රටේ එක බලාගාරයක් හදන්න දුන්නේ නැහැ. ඒ බලාගාර හදනකොට ඔයගොල්ලන් හැම වෙලාවේම කළේ උද්ඝෝෂණ කරලා, උපවාස කරලා ඒවා නවත්වන්න කටයුතු කරපු එක. ඒ බලාගාර හදපු නිසා තමයි අදටත් විදුලිය මෙහෙමවත් තිබෙන්නේ. අවුරුදු 76ක්, 76ක් කියලා නිතරම කියනවා. අවුරුදු 76ක් මේ රට පාලනය කරපු නායකයෝ හදපු විදුලි බලාගාරවලින් උපදවන විදුලියෙන් තමයි අද ඔයගොල්ලනුත් බල්බ් එකක් පත්තු කරගෙන ඉන්නේ. ඔයගොල්ලන් මේ ගල් අඟුරුවලින් හොරකම් කළේත් අපි හදපු විදුලි බලාගාරයෙන් කියන එකත් මම මේ වෙලාවේදී කියන්න ඕනෑ.

මට කාලය ලබා දුන්නාට ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.05]

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මගේ කථාව ඉක්මනින්ම පටන් ගන්නම්. මම පටන් ගන්න ඕනෑ, මේ තර්කයේ තිබෙන දුර්වලම ස්ථානයෙන්. ඒ කියන්නේ, තාක්ෂණික වරදක් හැරෙන්නට වරදක් සිදු නොවුණු ලියාපදිංචි කිරීම පිළිබඳ කාරණාවෙන්.

මම දන්න විධියට මෙතැන ගොඩක් උගත් නීතිඥ මහත්වරු ඉන්නවා. දැන් කියන්න හැදුවේ, ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් තාක්ෂණික වරදක් සිදු වුණත්, එතැන දූෂණයක් සිදු නොවුණු බවයි. මේ හා සමාන නඩුවක් තිබුණා, මම ඔයගොල්ලන්ට පොඩ්ඩක් මතක් කරලා දෙන්නම් එය පිළිබඳව. ඒ තමයි, Sunway

International (Pvt.) Limited & Another vs Airport and Aviation Services & Others නඩුව. ඒකේත් තිබුණේ, ලියාපදිංචි සමාගමකට විතරයි යම් කිසි ටෙන්ඩර් එකකට ඇතුළත් වෙන්න පුළුවන් කියලා. හැබැයි, අදාළ සමාගම ඒ අවස්ථාවේදී ලියාපදිංචි වෙලා තිබුණේ නැහැ. මෙතැන තිබෙන්නේ දූෂණ ප්‍රශ්නයක් නොවෙයි, සම්පූර්ණ තාක්ෂණික ප්‍රශ්නයක්. එතකොට Supreme Court එකේදි argue කළා, ඒ සමාගමේ තමයි වැඩිම හොඳම bid එක තිබෙන්නේ, ඒ නිසා ඒ සමාගමට දීපු එක වරදක් නැහැ කියලා. හැබැයි, ශ්‍රේෂ්ඨාධිකරණය මෙසේ තීරණය කළා, I quote:

> "The court takes serious note of the fact that, in innumerable cases this court had held, that the award of a tender must be based on compliance with the terms and conditions of the tender documents on the date and at the time specified for the closing of the tender and further the State and its agencies are bound by and must rigorously and scrupulously observe the procedures laid down, in awarding tenders."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ කියන්නේ ඔය ඩොලර් 20 කථාව අදාළ නැහැ. මම කියන්නම්, ඔබතුමන්ලාගේ social media කරන කෙනාගේ පැහැදිලි කිරීමක්.

අපි හිතමු, driving licence එක බලන්න මාව පොලීසියෙන් නැවැත්තුවා කියලා. මම කියනවා, රාළහාමි, පොඩ්ඩක් ඉන්න, මගේ ළඟ driving licence එක තිබෙනවා, ගේන්නම් කියලා. ඊට පස්සේ මට කියනවා, හරි, හෙට ගෙනැල්ලා පෙන්වන්නකෝ කියලා. මම අනිද්දා ගිහිල්ලා - මාව නවත්වපු දිනයේ නොවෙයි, ඊළඟ දිනයේ නිකුත් කරපු එකක් ගෙනිහිල්ලා - කියනවා, "රාළහාමි, පොඩි ප්‍රශ්නයක් වුණා, මට මේක ලැබෙන්න තිබුණේ ගිය සතියේ, රුපියල් 1,000ක් දෙන්න ඕනෑ කියලා මම මේ පුද්ගලයාට රුපියල් 1,000ක් දුන්නා, ඔහු 250ක් අතරමඟදී වියදම් කරලා, ඊට පස්සේ ඔහුට එන්න වුණා, ඊට පස්සේ මම 250ක් දුන්නා, මේක පොඩි ප්‍රශ්නයක්" කියලා. එතකොට ඒ රාළහාමි කියනවා, "ඒවා අදාළ නැහැ, වාහනයේ ගිය දවසේ ඔබේ අතේ රියදුරු බලපතක් - driving licence එකක් - නැහැ. එච්චරයි, that is all. ඔබ වරදක් කරලා ඉවරයි" කියලා. ඒකෙන් කියන්නේ දූෂණය ගැන නොවෙයි. එතකොට බැලූ බැල්මටම ලියාපදිංචිය පිළිබඳව විගණකාධිපතිතුමියගේ වාර්තාවෙන් එලෙසම ඔප්පු වෙනවා. *Res ipsa loquitur;* on the face of it, upon reading, it is proved.

ඊට පස්සේ අගමැතිතුමිය කියනවා, දූෂණය කියන්නේ, තමාට යම් කිසි ප්‍රතිලාභයක් ලබා ගැනීම සඳහා කිරීම කියලා. අනේ, very sorry. ඒක එහෙම නොවෙයි. මම මේ කියන්නේ, ඔබතුමන්ලා පුන පුනා කියන CIABOC Act එක. "Any act where a public servant or a person connected to public administration unlawfully or improperly uses their position for personal gain or advantage to another." දැන් මෙතැන පිළිගත් කාරණයක් තිබෙනවා නේ. පාඩුවක් සිද්ධ වෙලා තිබෙනවා. පාඩුවක් සිද්ධ වුණා නම් කාට හරි ලාභයක් සිද්ධ වෙන්න එපා යැ. තවත් කෙනෙකුට ලාභයක් සිදු වීමට ඉඩ හැරීමත් දූෂණයක්. ඉතින් ඒකවත් දැනගෙන හිටියේ නැහැ. අපට ඉස්කෝලයේදී උගන්වනවා නේ, කැකිල්ලේ රජතුමාගේ නඩු තීන්දු ගැන. ඒක තිබෙන්නේ "කුමාරොදයේ" ද කොහෙද.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
මට තව පොඩි වෙලාවක් දෙන්න.

කැකිල්ලේ රජතුමාගේ නඩු තීන්දුව තිබෙනවා නේ. *[බාධා කිරීමක්]* Sir, I have been given a few extra minutes by the Hon. Kabir Hashim. Thank you.

කැකිල්ලේ රජතුමාගේ නඩු තීන්දු තිබෙනවා නේ. ඒ වාගේ තමයි COPE එකේ ඊයේ රෑ වුණු සිද්ධිය. මොකක්ද දන්නවාද කළේ? ඔබතුමන්ලා දැන් ඇවිල්ලා කියන්නේ මොකක්ද? "මම මේ බිත්තිය හදාගෙන යනකොට පොඩ්ඩක් ඇද වුණා" කියනවා. ඇයි, බිත්තිය ඇද වුණේ කියලා ඇහුවාම කියනවා, "මම නොවෙයි ඇද කළේ. අර මනුස්සයාට මේ line එක ගහන්න කිව්වා. Line එක ගහනකොට කෙල්ලෙක් ගියා. ඒ කෙල්ල දිහා බලාගෙන ඉන්නකොට line එක ඇද වුණා" කියලා. ඊට පස්සේ රජතුමා කියනවා, "එහෙමද? එහෙම නම් අර මනුස්සයාව ගේන්න" කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, දැන් කථාව අවසන් කරන්න.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
ඒ මනුස්සයා ආවාම කියනවා, "මගේ නොවෙයි වරද. කෙල්ල ගිය එක තමයි වරද" කියලා. එතකොට කෙල්ලට අඬගහලා අහනවා, මොකටද මෙතැනින් ගියේ කියලා. "අනේ, මගේ වරදක් නොවෙයි. තාත්තා කිව්වා, ගෙදර සීනි නැහැ කියලා. මම සීනි ගන්න ගියා" කියලා කෙල්ල කියනවා. ඊට පස්සේ තාත්තාට අඬගහලා කැකිල්ලේ රජතුමා කියනවා, "එහෙම නම් නුඹගේ තමයි වැරැද්ද. නුඹගේ වැරැද්ද නිසා තමයි මේ බිත්තිය ඇද වුණේ" කියලා. මිනිහාගෙන් තමයි දඬය අය කළේ. අන්න ඒ වාගේ වැඩක් නේ ඔයගොල්ලන් කරන්න හදන්නේ.

ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නජිත් ඉන්දික මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.10]

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගල් අඟුරු ගනුදෙනුව සම්බන්ධයෙන්; ගල් අඟුරු ටෙන්ඩරය සම්බන්ධයෙන් වංචාවක් සිදු වෙලා තිබෙනවා කියලා විපක්ෂය විසින් ඇමතිවරයාට විරුද්ධව ඉදිරිපත් කර තිබෙන විශ්වාස භංග යෝජනාව ගැන අද දවස පුරාම සාකච්ඡාව සිද්ධ වනවා. පසුගිය මාසයක්, දෙකක් තිස්සේ විපක්ෂය විසින් මේක වංචාවක්, දූෂණයක් කියලා පෙන්වන්න ඉදිරිපත් කරපු තර්ක විතර්ක නැත්නම් ඒ ඉලක්කම් වැරැදියි, ඒක එහෙම නොවෙන්නේ කොහොමද කියන එක ගැන ඉතාම පැහැදිලිව අද උදේ සිට සාකච්ඡාවක් පැවැත්වුණා. පසුගිය මාස දෙක, තුන ගත්තාම බොහොම පැහැදිලිව එකම මාතෘකාව බවට ගල් අඟුරු පත් කරගෙන මේ සම්බන්ධව විශාල සාකච්ඡාවක් මාධ්‍ය හරහා ගෙන යන්නත්, මාතෘකාව මොකක් වුණත් තමන්ට අවස්ථාව ලැබෙන සෑම තැනකදීම "ගල් අඟුරු, ගල් අඟුරු" කියන තත්ත්වයට විපක්ෂයේ බොහෝ මන්ත්‍රීවරු වැඩ කළ බවත් අපි දැක්කා. මම හිතන්නේ ඒගොල්ලන්ගේ

[ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා]

උපක්‍රමයක් වුණා, ඒ මාතෘකාවම අරගෙන, ඒ ගැනම කියලා, ඒකටම තද කරලා ආණ්ඩුව අමාරුවේ වට්ටන්න මොකක් හරි කරන්න පුළුවන් ඇති කියන එක.

සති කිහිපයකට කලින් මේ සම්බන්ධව විවාදයකුත් තිබුණා. ඒ විවාදයෙන් පසුව අද දවසේ මේ මාතෘකාව මේ සභාවට ගෙනැල්ලා, මේ ආකාරයෙන් ඒ ගැන සංවාද කරලා, මේ මට්ටමට මේ ගැන කථා කරන්න පුළුවන් වුණු එක හොඳයි. ඒ වාගේම උදෑසන කිව්වා වාගේ විගණකාධිපති වාර්තා ඇතුළු ඒ සියල්ල තුළ මේ සම්බන්ධව තිබෙන කාරණා නිරවුල් කර ගැනීමකුත් අපට කර ගන්න පුළුවන්.

මූලිකව විපක්ෂයෙන් කරන චෝදනා සහ කියන කථා ගත්තොත්, එහි ප්‍රධානම දෙයක් හැටියට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය කාලයක් තිස්සේම මේගොල්ලන් දිගටම අදහසක් ඉදිරිපත් කළා, මේ ආණ්ඩුවෙන් නැත්නම් මේ ඇමතිවරයා දැනුවත්ව සැලසුම් කරලා බාල ගල් අඟුරු ගෙනාවාය කියලා. බාල ගල් අඟුරු ගෙනාවා කියලා තමයි මේගොල්ලන් ඔප්පු කරන්න උත්සාහ කරමින්, දිගටම තර්ක කරමින් ඉන්නේ.

ඇත්තටම මොකක්ද මේ සිදු වෙලා තිබෙන්නේ? දැන් ජනාධිපතිතුමාත් පාර්ලිමේන්තුවට ඇවිල්ලා කථා කළා. අපි හැම දෙනාම වාගේ ඒ ගැන කථා කළා. කලින් කිව්වේ බොරු. ඒකේ අඩුපාඩුවක් සිදු වුණා නැත්නම් අගය අඩුයි කියන එක අපි හැමෝම හැම සාකච්ඡාවකදීම ඒ විධියටම පිළිගත්තා. මොකද, අපට සමාගමක් රකින්න හෝ සමාගමක නිෂ්පාදන රකින්න වුවමනාවක් නැහැ නේ. සිදු වුණු ක්‍රියාවලිය ගැන කිව්වා; වෙච්ච දේ කිව්වා. හැබැයි, දැන් වුවමනාවෙන් හෝ එහෙම නැත්නම් වංචාවක් විධියට, දූෂිත විධියට බාල ගල් අඟුරු ගෙනාවා කියලා ඇමතිවරයාට හෝ ආණ්ඩුවට චෝදනා කිරීම වෙන කථාවක්.

දැන් මේ ගල් අඟුරු ගෙනෙන්නේ කොහොමද? මේ ගැන කලින් කියැවුණා. නමුත්, මම නැවත වතාවක් ඒ ගැන මතක් කරන්න කැමැතියි. ලංකාවට ගල් අඟුරු ගෙන්වන මේ tender procedure එක අනුව 2009දී බලාගාරය හදලා පළමු ටෙන්ඩරය දැම්මාට පස්සේ 2010දී තමයි ලංකාවට පළමු ගල් අඟුරු නැව ආවේ. මම හිතන්නේ මේ වෙනකොට නැව් 450කට වඩා ලංකාවට ඇවිල්ලා තිබෙනවා. ඒ නැව් 450 ගෙන්වූයේ කොහොමද? ඒ නැව් ගෙන්වන එක විධියක් තිබුණා. ගැනුම්කරුවෙක්, විකුණුම්කරුවෙකුගෙන් ගනිද්දී කොහේ හරි රටක වරායකින් ඒවා පටවනවා නේ. මේවා ගන්නේ දකුණු අප්‍රිකාවෙන්. වරායෙන් පටවද්දී ඒ විකුණුම්කරුවා විසින් ගිවිසුමට අනුව නිර්දේශ කරන විද්‍යාගාරයකින් වාර්තාවක් - Load Port Report එක - එවනවා. එතකොට ඒ වාර්තාව අනුව තමයි ගෙවීම් කරන්නේ. ඒ වාර්තාවේ නියමිත ප්‍රමිතිය තිබෙනවා කියන එක සඳහන් වෙලා තිබුණොත් තමයි ගල් අඟුරු නැවට සල්ලි ගෙවන්නේ. එතකොට කවුරුවත් බාල ගල් අඟුරු ගෙන්වන්නේ නැහැ. ඒක තමයි තිබෙන ගිවිසුම. ඒ ගිවිසුම අනුව වාර්තාවේ සඳහන් වන නිවැරදි අගය තිබෙනවා නම් තමයි මුදල් ගෙවන්නේ. ඊට කලින් සම්පූර්ණ මුදල ගෙව්වා. ඊට පස්සේ ඒ වාර්තා මත පදනම් වෙලා සියයට 80ක් ගෙවනවා. ඉතුරු සියයට 20 ලංකාවට ආවට පස්සේ සිදු කරන ලද විද්‍යාගාර පරීක්ෂණවලින් ලැබෙන වාර්තා මත පදනම් වෙලා ගෙවනවා. එහෙම තමයි තිබුණේ. මේක තමයි ගල් අඟුරු ගෙන්වන ක්‍රමය. එහෙම නැතුව මේ ආණ්ඩුව ඇවිල්ලා ගල් අඟුරු ගෙන්වන ක්‍රමයේ මොකක්වත් වෙනසක් කරලා නැහැ. ගල් අඟුරු ගෙන්වූවාට පසුවත් නිසි ප්‍රමිතිය තිබෙනවාද කියලා බලන්න දෙවැනි වතාවටත් විද්‍යාගාරයකින් පරීක්ෂාවකුත් කරනවා. ඒ වාර්තා දෙකම අනුව තමයි මුදල් ගෙවීම සම්පූර්ණ කරන්නේ. මේ ක්‍රමය තමයි මේ ගල් අඟුරු ටෙන්ඩරය තුළත් අනුගමනය කර තිබෙන්නේ.

මීට කලින් 2014 අවුරුද්දේ ආපු නැව් 7ක ගල් අඟුරු නියමිත ප්‍රමිතියේ නැහැ කියලා වාර්තා ලැබී තිබුණා. "M.V. Alam Mutiara", "Kitakami" යනාදී වශයෙන් නැව් 7ක් තිබුණා. ඒ නැව් 7න්, 4කට නැවත වාර්තා ලැබී තිබුණා, ඉතුරු කරපු sample එක අනුව පරීක්ෂා කරලා, ඒකෙනුත් 4ක ප්‍රමිතිය අඩුයි කියලා නැවත වාර්තා ලැබී තිබුණා. ඉතිහාසයේම ඒ ක්‍රමවේදය තමයි ඇවිල්ලා තිබුණේ. මේ වතාවේත් ඒ ක්‍රමවේදයට අනුව කටයුතු කරලා තිබෙනවා.

මෙතැන තිබෙන ප්‍රශ්නය මේකයි. ඇමතිවරයා මැදිහත් වෙලා බාල ගල් අඟුරු ගෙනාවා කියලා අතේ පත්තු වන බොරුවක් කියනවා නේ. හැබැයි, මෙතැනදී කියන්න ඕනෑ, ඒ ක්‍රියාවලිය ඒ විධියටම කරගෙන ගිහිල්ලා තිබෙනවාය කියන එක. ඒ වාගේම වැදගත් දෙය මෙයයි. ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවට ඇවිල්ලා කිව්වා වාගේම වල්මත් වෙලා, කාටල හදලා, මේක බිස්නස් එකක් කරගෙන, ගනුදෙනුවක් කරගෙන තිබුණු විශාල ටෙන්ඩර් සහ ව්‍යාපෘති නැවත system එකක් බවට පත් කිරීම තමයි අපට තිබුණු අභියෝගය. ඒකට හොඳම උදාහරණයක් තමයි, මේ ගල් අඟුරු ටෙන්ඩරයේ කථාව. පසුගිය දවස් ටිකේ පාර්ලිමේන්තුව තුළ මේ ගැන අනන්වත් කථා වුණා. මේ ආණ්ඩුව ගත්තාට පස්සේ අපට තිබුණු අභියෝගය තමයි, ටෙන්ඩරයක් දමලා ගල් අඟුරු ගෙන්වන එක. අද මහත්වරු මෙතැනට ඇවිල්ලා ඒ ගැන කථා කළා. ඒ කියන්නේ, ටෙන්ඩරය දැම්මට පසුවත් ඒකට පිටින් ගිහිල්ලා කැබිනට් අනුමැතියක් අරගෙන තමයි පසුගිය අවුරුදු තුනේම ගල් අඟුරු ගෙන්වූයේ.

ඊට පස්සේ මේ ඇමතිවරයා විසින් - අවුරුදු තුනකට පස්සේ - මේ අමාත්‍යාංශය මෙහෙයවද්දී තමයි නිසි ටෙන්ඩර් පටිපාටියකට අනුව ටෙන්ඩර් කැඳවලා ගල් අඟුරු ගෙන්වන්න පටන් ගත්තේ. ඒ කියන්නේ, එහි යම් පියවරක් ඉස්සරහට තබා තිබෙනවා. හැබැයි, ඒ ආකාරයට ටෙන්ඩරය දමලා ගල් අඟුරු ගෙන්වද්දී සමාගම විසින් සපයන ගල් අඟුරුවල, පරීක්ෂණාගාරවල සහ වාර්තා සම්බන්ධයෙන් ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා. පසුගිය දවස්වල ප්‍රශ්නයක් ඇවිල්ලා තිබෙනවා. ඒ ප්‍රශ්නයට ටෙන්ඩරයේ පටිපාටිය අනුව, ඒ ක්‍රමවේදය අනුව අපි වැඩ කරනවා. ඒක නේ කරන්න වෙන්නේ. විද්‍යාගාර වාර්තා මත පදනම් වෙලා තමයි වැඩ කරන්නේ. ටෙන්ඩර් පටිපාටිය අනුව පදනම් වෙලා තමයි වැඩ කරන්නේ. ඒ ටෙන්ඩර් පටිපාටිය අපි හදපු එකක් නොවෙයි. 2023න් පස්සේ මේ ටෙන්ඩර් පටිපාටිය වෙනස් කරලා නැහැ. ඒ අනුව තමයි ටෙන්ඩරය කැඳවන්නේ. සමාගම් 10ක් ඉල්ලනවා. සුදුසුකම් සපුරපු, දෙන්න තිබෙන සමාගමට දෙනවා. එහෙම දෙන්නේ නැතුව කලින් කළා වාගේ ටෙන්ඩරය දාලා, ටෙන්ඩරය වෙන කාට හරි ගියාට පස්සේ, ඇමතිට හිතවත්, ආණ්ඩුවට හිතවත් කාට හරි දෙන්න නැවත කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරලා, ටෙන්ඩරය දීලා නොවෙයි, මේ. මේක හරි පැහැදිලියි. මේකේ නිසි ක්‍රියාවලිය අනුගමනය කර තිබෙනවා. අවුරුදු තුනකට පස්සේ නිසි ක්‍රියාවලියට ගෙනැල්ලා තිබෙනවා. පසුගිය අවුරුදු ගණනාව ගත්තාම පළමුවෙනි වතාවට නැව්වලින් ප්‍රමාද ගාස්තු අරගෙන තිබෙනවා; නැව්වලින් ප්‍රමාද ගාස්තු ගන්න තීරණය කරලා තිබෙනවා. පසුගිය කාලයේ එහෙමවත් කරලා තිබුණේ නැහැ. නැව්වලින් ප්‍රමාද ගාස්තු අරගෙන තිබුණේ නැහැ. ඒ වාගේම සමහර ඒවායේ පාඩුව, දඩය අය කරගෙන තිබුණේ නැහැ. 2015-19 කාලයේදීත් බිලියන 1.5ක් මට මතක විධියට අය කරගෙන නැහැ. සූත්‍ර අනුව දශමයකින් බෙදන්න ඕනෑ එක එකෙන් බෙදන්න තමයි හදලා තිබුණේ; අඩු කරලා.

ඒ වාගේ දූෂිත සහ ඕනෑ ඕනෑ විධියට වංගු ගහපු ක්‍රියාවලියක් විධිමත් ආකාරයකට ටෙන්ඩර් කරන්න අපි පටන් ගෙන තිබෙනවා. ඒ ටෙන්ඩරය නිසි ක්‍රියාවලියකට අනුව ටෙන්ඩර් කරලා තිබෙනවා. සමාගම් 10ක් ඉල්ලා තිබෙනවා. ඒවා අපේ

සමාගම් නොවෙයි. ටෙන්ඩර් පටිපාටියට අනුව ලබා දුන් සමාගම සපයන ගල් අඟුරු නැව් කිහිපයක යම් ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. ඒකට අනුව දඩ මුදල් සහ අනෙකුත් අය කර ගැනීම් කරනවා කියන එක ජනාධිපතිතුමා සහ අපේ ආණ්ඩුව තීරණය කර තිබෙනවා. ඒ තීරණය අනුව ඉතාම පැහැදිලිව නැවත නැවතත් ඒක ගණනය කරනවාය කියන එකයි අපි කියන්නේ. ඒ අනුව සිදු වන පාඩුව ඒ සමාගමෙන් අය කර ගන්න පුළුවන් විධියට කටයුතු කරනවා. ඕක නේ කරන්න වෙන්නේ.

එහෙම නැතුව මේගොල්ලන් කියන්නේ මේක නවත්වලා ආපසු තමන්ගේ හිතවත් කෙනෙකුට දීලා නිකම් ගෙන්වන්න කියලාද? නිසි ක්‍රියාදාමයක්, නිසි පටිපාටියක් එහෙම නැත්නම් system එකක් හදන එක තමයි අපට තිබුණු අභියෝගය. ඒකට තමයි අපට ජන වරම දුන්නේ. අඩු වැඩි වශයෙන් අයාලේ ගියපු, හැම ක්ෂේත්‍රයකම එක එක දේවල් කරපු, එක එක ඇමතිට ඕනෑ විධියට එක එක දේවල් කරපු, තමන්ගේ සමාගම් හදාගෙන බෙහෙත් ගෙන්වපු, තමන්ගේ සමාගම් හදාගෙන ගල් අඟුරු ගෙන්වපු රටක් පිළිවෙළක් කරන්න තමයි අපට භාර දුන්නේ. ඒ නිසා මේ රට පිළිවෙළක් කරන්න අපි පටන් ගෙන තිබෙනවා.

හැබැයි, පිළිවෙළක් කරද්දිත් ප්‍රශ්න එනවා. ඒක ඇත්ත. අපිළිවෙළටම පුරුදු වෙච්ච, ගසා කෑමටම පුරුදු වෙච්ච, සියලුදෙනා එකතු වෙලා බිලියන ගණන් ගනුදෙනුවලින් පොඩ්ඩ පොඩ්ඩ කන්න පුරුදු වෙච්ච, ඒවාට මෙතැන ඉන්න අයත් සම්බන්ධ වෙච්ච, ආයතනවල අයත් සම්බන්ධ වෙච්ච, සමාගමුත් සම්බන්ධ වෙච්ච සංස්කෘතියක් තමයි තිබුණේ. බිස්නස් කිව්වාම, ටෙන්ඩර් කිව්වාම එහෙම සංස්කෘතියක් තමයි තිබුණේ. එහෙම සංස්කෘතියක් තිබුණු රටක ඒවා ආපසු පිළිවෙළක් කරන්න ගියාට පස්සේ, කාටල කඩන්න ගියාට පස්සේ ප්‍රශ්නයක් වෙනවා; ප්‍රශ්න හදනවා. ප්‍රශ්න වෙනවා විතරක් නොවෙයි, ප්‍රශ්න හදනවා. මොකද, ඒවායෙන් වාසි ගත්ත විශාල පිරිසක් ඉන්නවා. ඒවායෙන් හම්බ කරපු විශාල පිරිස් ඉන්නවා. එතකොට තමයි හැම තිස්සේම භාණ්ඩ හිඟයන් හදන්නේ, ප්‍රශ්න එන්නේ. අපි ඒවා අත්දකිමින් ඉන්නවා. හැබැයි, ජනාධිපතිතුමා කිව්වා වාගේ මේක කළ යුතු දෙයක්. අපි ඒ කටයුත්ත කරනවා.

ඇමතිතුමා සම්බන්ධයෙන් ගත්තොත්, මේ ඇමතිතුමා යටතේ තමයි අවුරුදු 3කට පස්සේ ටෙන්ඩර් නැතුව කරපු ක්‍රියාවලියක් නිසි ක්‍රියාවලියකට ගෙනෙන්නේ. ඒ නිසා ඒක අපි පැහැදිලි කර ගත යුතුයි. 2010 අවුරුද්දේ ඉඳන් මේ කටයුතුවලට ඇමතිවරයා මැදිහත් වුණා කියලා නේ කියන්නේ. 2010 අවුරුද්දේ ඉඳන් ඇමතිතුමා මැදිහත් වෙලා තමයි මේ කටයුත්ත කළේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. දැන් තමයි ඇමතිතුමා මැදිහත් වෙලා නැතුව ටෙන්ඩරයක් දෙන්නේ. ඒ ගත වෙච්ච කාලයෙන් භාගයකට වඩා කැබිනට් මණ්ඩලයෙන් තමයි දුන්නේ. ඇමතිතුමා මැදිහත් වෙලා කරපු ටෙන්ඩර්, ඇමතිතුමා මැදිහත් වෙලා කරපු ගනුදෙනු දැන් එහෙම නොකරපු එක තමයි මේ ඇමතිතුමා කරලා තිබෙන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමා දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩියක් දෙන්න.

අවසාන වශයෙන් මම කියන්නේ මේකයි. අපි system එකක් හදනකොට, system එකක් නැතිකමින් වාසි ගත්ත මිනිස්සු - ඒ අය මන්ත්‍රීවරු වෙන්න පුළුවන්, ඇමතිවරු වෙන්න පුළුවන්, සමාගම්වල අය වෙන්න පුළුවන්, ආයතනවල අය වෙන්න පුළුවන් - කලබල වෙනවා; ප්‍රශ්න හදනවා; system එක හැදෙන එක නවත්වලා පරණ විධියටම යන්න, පරණ විධියටම කාලා බීලා ඉන්න පුළුවන් ක්‍රමවලට යන්න ඔවුන් උත්සාහ කරනවා. අපි ඒක දකිනවා. මේ ආණ්ඩුව පත් වෙලා මේ වනවිට අවුරුදු එකහමාරයි. අපි ඒ තිබුණු ටෙන්ඩර් ක්‍රියාවලි බිඳිමින්, නිසි ක්‍රියාවලියට අනුව ටෙන්ඩර් කරමින් කටයුතු කරනවා. මොන බාධක ආවත් අපි ඒ කටයුත්ත කරනවාය කියන එක මම අවසාන වශයෙන් කියන්න ඕනෑ.

සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා ඇහුවා, COPE එකේ සභාපති ආණ්ඩුවෙන් පත් කර තිබෙන්නේ ඇයි කියලා. ඒකටත් මම උත්තරයක් දෙන්නම්, පොඩි වේලාවක් අරගෙන. COPE එකේ සභාපති කියන්නේ, වංචා, දූෂණ සහ මේ ක්‍රියාවලි ගැන හොයන පාර්ලිමේන්තුවේ සිටින වැදගත් චරිතයක්; වැදගත් කාර්ය භාරයක් පැවරී තිබෙන චරිතයක්. අපි හිතනවා, දූෂිතයෙක් නොවෙන කෙනෙක් එතැනට පත් කරන්න ඕනෑ කියලා. දූෂිත ඉතිහාසයක් තිබෙන මිනිස්සු අරගෙන COPE එකේ සභාපති කරන්න බැහැ. COPE එකේ වාර්තාවලට තමන්ගේ ආණ්ඩුව වෙනුවෙන් footnotes දාපු අය එහි සභාපති කරන්න බැහැ. ඒ නිසා අපිට හොයා ගන්න පුළුවන් වුණු කෙනා තමයි අපි COPE එකේ සභාපති වශයෙන් පත් කර තිබෙන්නේ. අපට ඔයගොල්ලන් කවුරුවත් ඒ තනතුරට පත් කරන්න විධියක් තිබුණේ නැහැ.

මට අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[பி.ப. 4.21]

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, வலுசக்தி அமைச்சர்மீது நம்பிக்கையில்லாப் பிரேரணை கொண்டுவரப்பட்டு, பாராளுமன்றத்திலே அது பற்றி விவாதிக்கப்பட்டுக் கொண்டிருக்கின்றது. குறிப்பாக, ஆளும் தரப்பிலே இருக்கின்ற உறுப்பினர்களுடைய பேச்சுக்களிலே இருந்து ஒரு விடயம் தெளிவாகின்றது. நிலக்கரி இறக்குமதியின்போது ஊழல் நடந்திருப்பதை அவர்கள் ஏற்றுக்கொள்கிறார்கள் என்பதைத் தெளிவாக உணரக்கூடியதாக இருக்கின்றது. ஏனென்றால், இதற்கு முன்னர் நடந்த விவாதங்களிலே ஆளும்தரப்பு உறுப்பினர்களுடைய பேச்சுக்களிலே ஒரு வித்தியாசத்தை அவதானிக்கக்கூடியதாக இருந்தது. ஆனால், இன்று அப்படியல்ல. இந்த ஊழலை எப்படி மறைப்பது என்றொரு செயற்பாட்டை அவர்கள் முன்னெடுத்துச் செல்வதை உண்மையிலே அவதானிக்கக்கூடியதாக இருக்கின்றது. அந்த அடிப்படையிலே, "நாங்கள் ஊழலை ஒழிப்போம்; ஊழலற்ற ஒரு நாட்டை உருவாக்குவோம்! சென்ற காலங்களிலே நிகழ்ந்த ஊழல் சம்பவங்களைக் கண்டறிந்து, ஊழல்வாதிகளுக்குத் தண்டனை வழங்குவோம்" என்று கூறி ஆட்சிக்கு வந்த இந்த அரசாங்கத்திலே இப்படியொரு நிலை ஏற்படுகின்றபொழுது, அதைத் தாங்கிக்கொள்ள முடியாத ஒரு நிலைப்பாடு இன்று இந்த அரசாங்கத்துக்கு ஏற்பட்டிருக்கின்றது.

[ගරු ඉම්රාන් මහරූෆ් මහතා]

நாங்கள் விளங்கிக்கொள்ளவேண்டிய ஒரு விடயம் என்னவென்றால், இன்று ஆளும் தரப்பிலே இருக்கின்ற பாராளுமன்ற உறுப்பினர்கள் அல்லது அமைச்சர்கள், இந்த நிலக்கரி இறக்குமதி தொடர்பான விடயத்திலே அமைச்சர்மேல் சுமத்தப்பட்டிருக்கின்ற குற்றச்சாட்டுகளுக்கு பதிலளிப்பார்கள் அல்லது அது சம்பந்தமாக அவர்கள் மக்களுக்குத் தெளிவுபடுத்துவார்கள் என்று நாங்கள் எதிர்பார்த்தோம். ஆனால், எதிர்க்கட்சித் தலைவர் அல்லது எதிர்க்கட்சி உறுப்பினர்களைத் தாக்கிப் பேசி அல்லது அவர்களைக் குற்றஞ்சாட்டிவிட்டுத் தாங்கள் தப்பித்துக் கொள்ளுகின்ற ஒரு நிலையை இன்று அவர்கள் உருவாக்கி இருக்கின்றார்கள்.

கௌரவ ஆளுங்கட்சி உறுப்பினர்களே, கௌரவ அமைச்சர்களே, உங்களுடைய எதிரிகள் அல்லது உங்களுடைய அரசாங்கத்தின்மீது பகையை ஏற்படுத்துகின்றவர்கள், எதிர்க்கட்சித் தலைவரோ அல்லது எதிர்க்கட்சி உறுப்பினர்களோ அல்லர். சென்ற காலங்களிலே உங்கள் தேர்தல் மேடைகளிலே நீங்கள் பேசிய voice-cut அல்லது கதைகள்தான் இன்று உங்களுக்கு எதிராக அமைந்திருக்கின்றன. அதன் அடிப்படையில், குறித்த அமைச்சர் மீதான குற்றச்சாட்டுக்களுக்கு இன்று நீங்கள் என்ன பதில் சொல்லப் போகின்றீர்கள் என்பதை மக்கள் துல்லியமாகப் பார்த்துக்கொண்டு இருக்கின்றார்கள். இன்று நீங்கள் சில ஊடகவியலாளர்களையும் சில YouTubersஐயும் கைக்குள் போட்டுக்கொண்டு, உங்களுடைய அமைச்சின் மூலமாக அவர்களில் சிலருக்கு நிதி உதவிகளை வழங்கிக்கொண்டு, அவர்கள் மூலமாக நீங்கள் பயனடைந்துகொண்டு இருக்கின்றீர்கள்.

இன்று இந்த ஊழல் உறுதிப்படுத்தப்பட்டு இருக்கின்றது என்பதை, எரிபொருட்களின் விலை அதிகரிப்பில் இருந்து நாங்கள் விளங்கிக்கொள்கின்றோம். இந்த நாட்டில் மாத்திரமல்ல, உலகத்தில் ஏதும் மாற்றம் ஏற்பட்டு பொருட்களின் விலை அதிகரித்தால், அரசாங்கம் எதற்கு? சனாதிபதி எதற்கு? என்று இந்த நாட்டின் மாண்புமிகு சனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்கள், கடந்த காலத்தில் எதிர்க்கட்சியில் இருந்த சந்தர்ப்பத்தில் கேட்டார். இன்று அவர் சனாதிபதியாக இருக்கின்றார். வரலாற்றிலே, காணமுடியாத அளவுக்கு 159 பாராளுமன்ற உறுப்பினர்களைக் கொண்டிருக்கும் நிலையில், "நிலக்கரியைச் சாப்பிட்டுப் பார்த்தா வாங்குவது?" என்று இன்று கேட்கின்றார்கள். வெட்கம்! நீங்கள் எதிர்க்கட்சியில் இருந்தபொழுது, சொன்ன விடயங்களைச் சிந்தித்துப் பாருங்கள்! அவைதான் இன்று உங்களுக்கு எதிராக மாறியிருக்கின்றன. அதனை விடுத்துவிட்டு, இன்று கௌரவ சஜித் பிரேமதாஸ அவர்களையும், எதிர்க்கட்சியில் இருக்கின்ற உறுப்பினர்களையும் குற்றம்கூறி, நீங்கள் தப்பித்துக்கொள்ள முடியாது என்பதை விளங்கிக்கொள்ள வேண்டும்.

இன்னுமொரு விடயத்தையும் குறிப்பிட வேண்டும். கௌரவ சஜித் பிரேமதாஸ அவர்கள் கடந்த சனாதிபதித் தேர்தலில் 32 சதவீதத்துக்கும் அதிகமான வாக்குக்களைப் பெற்றார். நான் நினைக்கின்றேன், தேர்தல் வரலாற்றில் 51 சதவீதத்தைப் பொற்றுக்கொள்ளாத ஒரு சனாதிபதிதான் மாண்புமிகு அநுர குமார திஸாநாயக்க அவர்கள் என்பதை நீங்கள் மறந்து விட்டீர்கள். அதனை நீங்கள் மீண்டும் மீண்டும் நினைவுபடுத்திக் கொள்ளுங்கள்! கடந்தகால அரசியலை விமர்சித்தாவது இந்தக் குற்றச்சாட்டுக்களில் இருந்து தப்பித்துக்கொள்ள வேண்டும் என்பதற்காக ஏதேதோ கருத்துக்களைச் சொல்வதில் இருந்து நீங்கள் விலகிக்கொள்ள வேண்டும். ஏனென்றால், மக்கள் வித்தியாசமான ஓர் அரசியல் பயணத்தை உங்களிடம் எதிர்பார்க்கின்றார்கள். அதனை மக்களுக்கு நீங்கள் வழங்க வேண்டும். எதிர்க்கட்சியினுடைய காலத்திலே tenders call பண்ணப்படவில்லையென்றும் அந்த அமைச்சர் குற்றஞ்செய்யவில்லையா? இந்த அமைச்சர் குற்றஞ்செய்யவில்லையா? என்றும் நீங்கள் சொல்லிக்கொண்டு இருக்கின்றீர்கள். அந்த நேரத்தில் tender பிரச்சினை இருந்தது, அந்த அமைச்சர்கள் குற்றம்செய்தார்கள் என்பதற்காகத்தான் இன்று 159 பாராளுமன்ற உறுப்பினர்களோடு இந்த அரசாங்கத்தை மக்கள் ஏற்படுத்தி இருக்கின்றார்கள். ஆகையால், இந்த அரசாங்கத்தில் அவ்வாறான ஒரு நிலை ஏற்படுமாக இருந்தால், மக்கள் எந்த நிலைக்குச் செல்வார்கள் என்பதை நீங்கள் சிந்திக்க வேண்டும். எதிர்க்கட்சித் தலைவரைப் பற்றி நீங்கள் கவலைப்படவேண்டிய அவசியம் கிடையாது.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
මම අවසන් කරන්නම්.

யார் எதிர்க்கட்சி, யார் அரசாங்கம் என்பதை எதிர்வரும் காலங்களில் மக்கள் தீர்மானிப்பார்கள். அதற்கு நாங்கள் மக்களுக்குச் சந்தர்ப்பத்தை வழங்குவோம். இப்பொழுது எதிர்க்கட்சியிலே எங்களுடைய கட்சிதான் அதிகூடிய ஆசனங்களைப் பெற்றிருக்கின்ற கட்சி. அந்த அடிப்படையில், எங்களுடைய கட்சித் தலைவர் எதிர்க்கட்சித் தலைவராக இருக்கின்றார். நாளை உங்களுடைய கட்சித் தலைவர் எதிர்க்கட்சியில் இருக்கும்பொழுது, கூடுதலான ஆசனங்களைப் பெற்றுக்கொள்ளும் ஒரு கட்சியிலிருந்து அப்பொழுது புதிதாக ஓர் எதிர்க்கட்சித் தலைவர் உருவாகுவார். ஆகையால், எதிர்க்கட்சி யார், ஆளும் கட்சி யார் என்பதை எதிர்வரும் தேர்தலில் நாங்கள் பார்த்துக்கொள்வோம். இப்பொழுது நடந்திருக்கின்ற ஊழலை உங்களால் மறைக்க முடியாது. அதனை நீங்கள் ஏற்றுக்கொண்டு, அதற்கான தீர்வுகளை வழங்கி மீதமிருக்கின்ற காலங்களில் மக்களுக்கான சேவைகளை ஆற்றுவதற்கான சிறந்த வழிகளை ஏற்படுத்தி, மக்களுக்கான சேவையை வழங்க வேண்டுமெனக் கூறி, விடைபெறுகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.27]

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම සන්තෝෂ වනවා, ගරු අග්‍රාමාත්‍යතුමියත් මේ වෙලාවේ සභාවේ සිටීම සම්බන්ධයෙන්. *[බාධා කිරීමක්]* නැහැ, නැහැ. ඔබතුමිය තුළ යම් සාධාරණත්වයක්

තිබෙනවා කියලා මම විශ්වාස කරන නිසා ඔබතුමිය සභාවේ ඉන්න මොහොතේ කථා කරන්න කැමැතියි. ඔබතුමිය හිටියේ ඒ වාගේ පිරිසක් එක්ක, people with zero tolerance for corruption. හැබැයි, මේ දේශපාලනය මිනිස්සු වෙනස් කරනවා. ඒක ඔබතුමියටත් වෙන්න පුළුවන්, මටත් වෙන්න පුළුවන්. හැබැයි, අපි බලා ගන්න ඕනෑ එහෙම නොවෙන්න. මොකද, අපි දේශපාලනයට ආවාට පස්සේ දේශපාලනයට බර වෙනවා. ඒ නිසා සමහර විට අපි සමහර දේවල් පෙනෙන්නේ නැහැ වාගේ ඉන්නවා.

ඔබතුමිය කිව්වා, මේක ගැන පැහැදිලිව කථා කරන්න කියලා. මම කථා කරන්නම්. ගරු අගමැතිතුමියනි, නොරොච්චෝලේ බලාගාරයේ මෙගාවොට් 900ක් නිෂ්පාදනය කරන්න ඕනෑ, නමුත් මේ දවස්වල මෙගාවොට් 750යි නිෂ්පාදනය වෙන්නේ. ආපු දවසේ COPE එකේ සභාපතිතුමාට මම දෝෂාරෝපණයක් කළා, එතුමා ස්වාධීන නැහැ කියලා. එතුමා Auditor-General's Department එකට දෙපාරක් ගිහිල්ලා මුණ ගැහිලා තිබෙනවා. එතුමා බලපෑම් කර තිබෙනවා. සාමාන්‍යයෙන් එතුමා කථා කරන්නේ මහජන මුදල් ගැන. නමුත්, ඊයේ එහෙම කථා කළේ නැහැ. Lanka Coal Company එකේ සභාපතිතුමා ආවේ නැහැ. එතකොට මම ඇහුවා, ඇයි ආවේ නැත්තේ කියලා. එතුමා ඒක සමනය කරන්න හදනවා, "නැහැ අපි දැනුම් දුන්නේ නැහැ" කියලා. වෙන දවසක නම් එතුමා, "මේ සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කරන්න ඕනෑ, ගෙන්වන්න ඕනෑ" කියලා දැඩිව කටයුතු කරනවා. නමුත්, එතුමා එහෙම කටයුතු කළේ නැහැ. "නැහැ, අපි දන්වලා නැහැ" කිව්වා. Lanka Coal Company එකේ සභාපති එන්නේ නැත්නම් කාගෙන්ද අපි ප්‍රශ්න අහන්නේ?

ගරු අග්‍රාමාත්‍යතුමියනි, අමාත්‍යාංශයේ ලේකම්තුමා - මහාචාර්ය හේමපාල මහතා - පිළිගත්තා දූෂණයක් වෙලා තිබෙනවා කියලා. ඔබතුමිය දාලා බලන්න, ඒ වීඩියෝ එක. එතුමා කිව්වා, දූෂණයක් වෙලා තිබෙනවා කියලා අපි පිළිගන්නවා කියලා. එතකොට, Lanka Coal Company එකේ සභාපතිතුමා කියනවා, "පළමුවෙනි නැවෙන්ම බාල ගල් අඟුරු කියලා දැන ගත්තා, ඒක ගැන නීතිපතිතුමාව දැනුවත් කළා, මේක කොහොමද cancel කරන්නේ කියලා නීතිය අනුව බලන්න කියලා නීතිපතිතුමා කිව්වා" කියලා. එතකොට අපි කිව්වා, accreditation නැති සමාගම් දෙකකින් තමයි මේ සහතික අරන් තිබෙන්නේ කියලා. Real-time dataවලින් පෙනෙනවා. ගරු අග්‍රාමාත්‍යතුමියනි, ඔබතුමිය සාධාරණ හින්දා මේ කියන්නේ. මේ වෙලාවේ නලින්ද ඇමතිතුමාත් සභාවේ හිටියා නම් හොඳයි. අනෙක් කට්ටිය දේශපාලන වශයෙන් කෑ ගහනවා. ඒකෙන් අපට වැඩක් නැහැ. ජේවීපී එකේ මානසිකත්වය අපට හරවන්න බැහැ. ඒගොල්ලන්ගේ ප්‍රතිපත්තිය විශ්වාස කරන්නේ නැත්නම් අනෙක් අය ඔක්කොම විනාශ වෙන්න ඕනෑය කියන මතයේ ඉන්නේ. ඒක නොවෙයි අපි කියන්නේ.

මෙතැන විශාල වංචාවක් වෙලා තිබෙනවා. නැව ආපු වෙලාවෙම ඒක දන්නවා. මේකේ ලියාපදිංචිය ඔක්කොම වැරදියි. ඊළඟට මේකේ ක්‍රමවේදය, technical පැත්ත ගැන කථා කළා. මේ නිෂ්පාදනය සම්බන්ධ real-time data හොර කරන්න බැහැ. මෙගාවොට් 900ක් නිෂ්පාදනය වෙන්න ඕනෑ. නමුත්, මෙගාවොට් 750යි නිෂ්පාදනය වෙන්නේ. මේ coal මිලදී ගැනීමේදී කිලෝ කැලරි 6,000න් උඩ ගන්නේ, premium එක. ඒක ගණන්. කිලෝ කැලරි හාරදහස් ගණන්වල ගල් අඟුරු නැවක් ඩොලර් මිලියන 2කට විතර ගන්න පුළුවන්. නියමිත ප්‍රමිතියෙන් යුත් ගල් අඟුරු නැවකට ඩොලර් මිලියන 6ක් ගෙවන්න ඕනෑ. ඉතාම අඩු මිලකට, සියයට 30කට වාගේ ගන්න පුළුවන් මේ බාල ගල් අඟුරු. මේකයි වංචාව. එතකොට රටේ ජනතාවට විශාල අර්බුදයකට මුහුණ දෙන්න වෙනවා. සමස්ත විදුලි උත්පාදනයෙන් සියයට 30ක්, 40ක් වාගේ ප්‍රමාණයක් නිෂ්පාදනය වනවා, නොරොච්චෝලේ බලාගාරයෙන්. මේ ප්‍රශ්නය හින්දා දැන් නිෂ්පාදනය වෙන්නේ, සියයට 15ක් වාගේ ප්‍රමාණයක්. මේ නිසා විශාල ප්‍රමාණයකින් - සියයට 50කින් වාගේ - විදුලි බිල වැඩි කරනවා, ලංකාවේ. ඒ ඔක්කොම බර යන්නේ ජනතාව මතට. මේ, ජනතාවගේ මුදල්.

ගරු අගමැතිතුමියනි, අනෙක් කාරණය මේකයි. කමිටුවේ සභාපතිතුමා ආණ්ඩු පක්ෂයෙන් දැම්මාම අපි කිව්වා, පක්ෂග්‍රාහියි කියලා. මුල ඉඳන්ම මේක ශුද්ධ කරන්න හැදුවේ. මන්ත්‍රීවරු එහෙම කළාට කමක් නැහැ. මන්ත්‍රීවරු දේශපාලනය කරන්නේ මෙතැනට ඇවිල්ලා. අපි ඒක දන්නවා. දේශපාලනඥයන්ගෙන් බලාපොරොත්තු වෙන්න බැහැ, ස්වාධීන චරිතයක්. ඒකයි අපි අධිකරණයට දමන්නේ දේශපාලනය නොකරපු අය. ඒ හින්දායි ඔබතුමියට මේ ගැන කිව්වේ. ඔබතුමිය සාධාරණත්වය ගැන හිතනවා නම් මේ විනාශය නවත්වා ගන්න. මේකේ ඉදිරිය බලන්න. තව නැව් 8ක් එන්නේ නැහැ. එතකොට, නොරොච්චෝලෙන් සියයට 40ක විදුලි ධාරිතාවක් නිෂ්පාදනය කළා නම් දැන් පුළුවන් වෙන්නේ සියයට 20ක් විතර. මේක විශාල ripple effect එකක්. ඒකෙන් රුපියල් බිලියන 60ක්, බිලියන 100 දක්වා පාඩුවක් වෙන්න පුළුවන්. කර්මාන්ත වැහෙන්න පුළුවන්, විදුලිය කප්පාදු කරන්න පුළුවන්, ඉදිරියේදී. විශාල විනාශයක් කරා මේක යන්න පුළුවන්. ඒ නිසා මේක පරීක්ෂා කරන්න. මේක මම අමුතුවෙන් ඔබතුමියට ඔප්පු කරන්න ඕනෑ නැහැ. ඔබතුමියට මම කියන්නේ. අඩුම ගාණේ ඔබතුමියට ගිහිල්ලා අනෙක් අයට කියන්න පුළුවන්, මෙතැන වංචාවක් වෙලා තිබෙනවා, මොනවා හරි කරන්න කියලා. පෞද්ගලිකව හරි ඔබතුමිය එහෙම කියයි කියලා අපට විශ්වාසයක් තිබෙනවා. මම දන්නවා, දේශපාලන වශයෙන් ඔබතුමිය අමාරුවෙන් ඉන්නේ කියලා. ඔබතුමිය ඒ කාලයේ කථා කරපු දේවල් පොඩ්ඩක් හරි තමන්ගේ හෘදය සාක්ෂියේ තිබෙනවා නම්, ඔබතුමියට මතක් වෙයි. මේ වාගේ කාරණයකදි ඡන්දය පාවිච්චි කරන විධිය ඔබතුමිය ඒ කාලයේ කිව්වා. මම දන්නවා, ඔබතුමිය අද එතුමාට පක්ෂව, මේක හෝදන්න ඡන්දය දෙයි කියලා. ජනාධිපතිතුමාට, ඇමතිතුමාට "හොරා" කියලා මම කියන්නේ නැහැ. එහෙම කියලා වැඩක් නැහැ. මේක විශාල දූෂණයක්. මේ දූෂණය රටේ සියලුදෙනාම පිළිගෙන තිබෙනවා. IMF එක, අමාත්‍යාංශයේ ලේකම්තුමා, Lanka Coal Company එකේ සියලුදෙනාමත් පිළිඅරගෙන තිබෙනවා. සභාපති එන්නේ නැහැ. සභාපති අයින් වුණා. මේක ලංකාවේ විශාලම හොරකමක් බවට පත් වෙනවා. ඒ හින්දා මේ සම්බන්ධයෙන් ඔබතුමියලා පරීක්ෂා කරලා ජනතාව බේරා ගන්න.

ජනතාව කන්න නැතිව ඉන්නේ. World Bank report එක බලන්න. දුර්භික්ෂයක් ලංකාවට එනවා, ඉදිරි මාස දෙක තුනේ. ඔබතුමියට වග කියන්න වෙනවා. අග්‍රාමාත්‍යතුමිය කියලා ඔබතුමියට ඇඟ බේරා ගන්න බැහැ. මම ඉතාම ආදරයෙන් ඉල්ලා සිටිනවා, මේ සම්බන්ධයෙන් පරීක්ෂා කරන්න කියලා. දේශපාලනය අමතක කරන්න. ස්වාධීන පුද්ගලයෙක් COPE එකට පත් කරන්න. COPE එකේ තනිකර පක්ෂග්‍රාහීව වැඩ කරන්නේ. මේක ශුද්ධ කරන්න කඩේ යන්න හදනවා. එතුමා එතුමාගේ අදහස් දරලා ඇවිල්ලා COPE එකේ ඉඳ ගන්නේ. එහෙම කරන්න බැහැ. You know a conflict of interest. It cannot happen; it is not natural. So, please take this into consideration.

Thank you.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු කුමාර ජයකොඩි ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.32]

**ගරු කුමාර ජයකොඩි මහතා (බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு குமார ஜயகொடி - வலுசக்தி அமைச்சர்)
(The Hon. Kumara Jayakody - Minister of Energy)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගොඩක් අය දූෂණය ගැන කථා කරනකොට අපිට පොඩි හිනාවකුත් යනවා. අපි නම් එදා ඉඳලාම මේකට විරුද්ධව තමයි කටයුතු කළේ.

අපි ආණ්ඩුව ගත්තාට පසුවත් එහෙමයි; ආණ්ඩුවට එන්න ඉස්සෙල්ලාත් එහෙමයි. මොකද, අප ජාතික ජන බලවේගය හැදුවේම රටේ පැවැති හොරකම, දූෂණය, අනවශ්‍ය දේශපාලන බලපෑම්, ඇඟිලි ගැසීම්, මැදිහත්වීම් වාගේම මහජන දේපළ අවභාවිතය වැනි ජනතා විරෝධී දේවල් මුලිනුපුටා දමා එවැනි දේවල් කරන දේශපාලකයන්, රජයේ නිලධාරින් සහ වෙනත් ඕනෑම පුද්ගලයෙකුට එරෙහිව නීතිය දැඩිව එක ලෙස ක්‍රියාත්මක කිරීමේ අරමුණින් වන බවත්, ඉන් රටේ ඉතිරි වන මහජන ධනය රටේ සංවර්ධනයට මෙන්ම ජනතාවගේ සුබ සිද්ධිය වෙනුවෙන් ඵලදායී ලෙස වැය කිරීම සහ රට වැටී තිබූ ආර්ථික අගාධයෙන් ගොඩ ගෙන "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" රටටත්, ජනතාවටත් උදා කරලීම සඳහාම වන බවත් මම වගකීමෙන් කියන්න කැමැතියි. ඔව්, මා වාගේම අපේ මේ ආණ්ඩුවේ සිටින මන්ත්‍රීවරුන්, මන්ත්‍රීවරියන් කිසිවෙකුත් මේ ජාතික ජන බලවේගය තුළ ක්‍රියාත්මක වූයේ කිසිදු මන්ත්‍රී තනතුරක්, ඇමති තනතුරක්, වෙනත් තනතුරක් හෝ ප්‍රතිලාභයක් බලාපොරොත්තුවෙන් නොවන බව මම බොහොම ආඩම්බරයෙන් මේ සභාවට කියන්න කැමැතියි. අපගේ පක්ෂය විසින් අපට පවරනු ලබන වගකීම් ඉටු කිරීම තමයි අප සැමගේම ඒකායන අරමුණ. ඒ කුමක් සඳහාද? ඒ, අප මුලින් සඳහන් කළ, පැවැති තත්ත්වයන් අහෝසි කිරීමට මෙන්ම අලුත් රටක් නිර්මාණය කිරීම සඳහායි. ඉතින් හොරකමට, දූෂණයට එරෙහිව අප හැමෝම එකා වාගේ කැප වෙලා මේ ආණ්ඩුව ගොඩනැගුවේ තවත් හොරා කන්නද? දූෂණය කරන්නද? පුළුවන් නම් කෙළින් උත්තර දෙන්න. නැහැ, කොහෙත්ම නැහැ, අපි නම්. මොකද, මේවායේ සමහරු දන්නේ නැති දේවල් තියෙන්න පුළුවන්. සමහරු දැනගෙනත් කුහකකමට, දේශපාලන කුහකකමට චෝදනා කරනවා වෙන්නත් පුළුවන්.

අපේ මේ සහෝදර, සහෝදරියන් සැමටම හොඳ හෘදය සාක්ෂියක් තිබෙනවා; අදූෂිත මෙන්ම දූෂණයට එරෙහිව කටයුතු කිරීමේ හොඳ පන්නරයක් තිබෙනවා. ඒකට අභියෝග කරන්න මගේ ඉදිරියෙන් ඉන්න විපක්ෂයේ කාටද පුළුවන් කියලා මම මගේ පැත්තෙන් අභියෝග කරනවා; භාවිතයෙන් අභියෝග කරනවා. මහජන මුදල් කොල්ල කාලා රටේ ආර්ථිකය අගාධයට දාපු කට්ටිය තමයි බහුතරයක් ඔය පැත්තේ ඉන්නේ. කණ්ණාඩිය ඉස්සරහට ගිහිල්ලා දූෂකයෝ කවුද කියලා අහන්න ඕනෑ අය තමයි අපට එහෙම කියන්න පටන් අරගෙන තිබෙන්නේ. අපගේ දේශපාලන ව්‍යාපාරය කිසිසේත්ම දූෂණයට, හොරකමට කිසිදු ඉඩක් නොමැති තැනක්. මම දූෂණය කළත්, මගෙන් වැරැදීමකින් හෝ කිසියම් දූෂණයකට සම්බන්ධතාවක් ඇති වුණත්, අපේ බොහෝ කථිකයන් කිව්වා වාගේ ඊට එරෙහිව කාටත් පෙර කටයුතු කරන්නේ අපේ පක්ෂයම තමයි. ඒකට ඕනෑ තරම් උදාහරණ සමාජයේ දීලා තිබෙනවා. විපක්ෂයේ සිටිද්දීත් එහෙම කටයුතු කරලා තිබෙනවා. අපට ආණ්ඩුව කියලා දෙවැනි නැහැ. ඇත්තටම අපි හැමෝම ඒක හොඳින් දන්නවා. එහෙම දේශපාලන ව්‍යාපාරයක්, මේ ජාතික ජන බලවේගය කියන්නේ.

අධිකරණයේ පවතින කාරණා ගැන කියන්න, සදාචාරාත්මක සහ නීතිගරුක පුරවැසියෙකු ලෙස මෙන්ම ජාතික ජන බලවේගයේ සාමාජිකයෙකු ලෙස ඊට බලපෑම් වන ලෙස වැඩි යමක් මෙතැන කථා කරන්න මම බලාපොරොත්තු වන්නේ නැහැ. නමුත් මම සුළුවෙන් හෝ යමක් කියන්න ඕනෑ. 2005-2015 කාලය තුළ මා සේවය කළ ලංකා පොහොර සමාගම තුළ නිලධාරියෙකු ලෙස මා විසින් වංචාවට, දූෂණයට එරෙහිව සිදු කරන ලද ක්‍රියාකාරකම් හරහා රජය, එම සමාගම වෙනුවෙන් කාර්ය සාධන ඇපකර හරහා සහ දඩ හරහා රුපියල් කෝටි ගණන් මුදල් අය කර ගැනීම් කළා. විශේෂයෙන් එවකට තනි නිලධාරින් විධියට හිටියත් - විපක්ෂයේ අප හිටියත් - අරලියගහ මන්දිරයේ සිට - ඒ හරහා - මෙහෙය වූ බොහෝ දූෂිත පොහොර ගනුදෙනු ව්‍යර්ථ කිරීමට සෘජුවම මැදිහත් වෙලා මා කටයුතු කළ බව මම ආඩම්බරයෙන් කියනවා. මෙතැන ඉන්න අය නොදැන සිටියාට, මා ගැන දන්නා බොහෝ දෙනෙක් ඒ ගැන හොඳටම දන්නවා; ඒවා රහස් නොවෙයි. එහිදී මම පොහොට්ටුවෙන් පත් කරපු ඇතැම් සභාපතිවරුන්ව ගෙදර යැව්වා. මොකද, ඔය අවුරුදු 5, 10 කාලය තුළ ඉන්නේ පොහොට්ටුවෙන් පත් කළ අය නේ. මාස තුනට වැඩි කාලයක් රිමාන්ඩ් සිරගත කරපු සභාපතිවරුත් ඉන්නවා. ඒවාට අපේ ජනාධිපති සහෝදරයා ඇත්තටම සාක්ෂි දරයි. මොකද, අපි එතුමාත් එක්ක එම දූෂණයට විරුද්ධව ගොඩක් වැඩ කරපු මිනිස්සු. අප මෙතැනට ඇවිල්ලා තිබෙන්නේ නිකම් මේ හොරා කන්න නොවෙයි; හොරාට එරෙහිව වැඩ කරන්නයි. එතකොට ඒවාට විරුද්ධව නොයෙක් චෝදනා ඒ පාර්ශ්වවලින් අපට එන එක වළක්වන්න බැහැ. අපි ඒවා බලාපොරොත්තු වුණා. මොකද, ඒ කාලයේ අරලියගහ මන්දිරයේ සෘජු බලපෑමට අමතරව, ඒ ප්‍රදේශයේ හිටපු ඇමතිවරුන් හරහාත් - මර්වින් සිල්වා හිටපු ඇමතිවරයා හරහාත් - බලපෑම් ආවා. ඒ දවස්වල හිටපු මන්ත්‍රී ප්‍රසන්න රණවීර මාව යට කරලා මරනවා කියලායි ප්‍රසිද්ධියේ කියා තිබුණේ. අපි ඒවාට විරුද්ධව තමයි වැඩ කළේ. එහෙම කරලා තමයි අපි මේ ඇවිල්ලා ඉන්නේ. ඒ නිසා විපක්ෂය ඇවිල්ලා මේ පුහු සද්ද දැම්මාට අපි ඇත්තටම බය නැහැ. අපි අදත් එහෙමයි; හෙටත් එහෙමයි. අපි හොරකමට විරුද්ධයි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)

ඔබතුමා ගහගන්න වගේ නේ කථා කරන්නේ. බයයි එතකොට. යන්නද අපි නැඟිටලා?

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

කැමැත්තක්.

දූෂණයට විරුද්ධව එච්චර දේවල් කරලායි අපි ඇවිල්ලා ඉන්නේ. මේ නඩුව ඉවර වුණාම නම් ගම් වශයෙන් මම කියන්නම්, මම දූෂණයට විරුද්ධව කරපු දේවල් ගැන; අපි මේ ආණ්ඩුව ගන්න ඉස්සෙල්ලා කොයි පුද්ගලයාද හිරේ ඇරියේ, ඒ කොයි කාලයේද, ඒ අයගෙන් කීයක් අය කර ගත්තාද කියලා කියන්නම්. ඔය සෙනරත්ලාගේ පවුලෙනුත් අපි මුදල් අය කර ගත්තා bonds හරහා, දූෂිත රාජපක්ෂලාගේ. ඒ හැම එකක්ම කරන්න මම තමයි මැදිහත් වුණේ. ඉතින්, ඒවායේ return එක එනවා තමයි. හැබැයි, ඒවාට අපි බය නැහැ. මැරෙන්න හරි බලාගෙන තමයි ඒ කාලයේ අපි ඒවා කළේ. දූෂණ කළා, හොරා කෑවා කියලා කියන්න. හැබැයි, අපි කොහෙන් හරි එක රුපියලක් හොරකම් කරලා තිබෙනවා නම් ඔප්පු කරන්න. එහෙම කළොත් මේ තනතුරු නොවෙයි ඕනෑම දෙයක් ඔයගොල්ලන්ට දෙනවා. හරිද? ඔබතුමන්ලා පව්, ඇත්තටම. මොකද, අප එතැනට වට්ටන්න බැහැ. අපේ දේශපාලන ව්‍යාපාරය එහෙම සැලෙන එකක් නොවෙයි. එහෙම වට්ටන්න බැහැ ඔයගොල්ලෝ කෑ ගහලා සද්දය දැම්මාට. ඔබතුමන්ලා පව්. ඕවාට භය වෙන්නේ නැහැ, දේශපාලන ව්‍යාපාරයක් විධියට අපි එකමුතුව සටන් කරනවා, රට නියම තැනට ගෙනියනවා. අප භය කරන්න බැහැ

ඕවාට. අපි කැපවීම් කරන්නේ රට වෙනුවෙන් සහ ජනතාවගේ සුබසිද්ධිය වෙනුවෙන් පමණයි. ඒ සඳහා අපි කවදත්, - ඊයේ පෙරේදා, විපක්ෂයේ ඉද්දී පවා, සියයට 3 ඉද්දී පවා - භය නැතිව සටන් කළ අය. අපි ජීවිත පරිත්‍යාගයෙන් එදාත් මේවාට පෙනී සිටියා. හෙටත් එහෙමයි. ඒ නිසා අපි මේ කිසිම දෙයකින් සැලෙන්නේ නැහැ. පුළුවන් නම් ඔප්පු කරන්න, අපි මහජනතාවගේ රුපියලක හරි මුදලක් හොරකම් කරලා තිබෙනවා කියලා.

ඊට අමතරව කියන්න ඕනෑ, මේ කාරණා ටිකත්. ගල් අඟුරු සම්බන්ධ spot tenders වාගේ ගොඩක් දේවල් - හොරා කන ක්‍රම - නැවැත්වූයේ මම තමයි; ඒවාට මැදිහත් වුණේ මම. ඒ හැරෙන්න, වෙනම පිරිවිතරවලටවත්, වෙන ක්‍රමවලටවත් මැදිහත් වුණේ නැහැ. අපි, පරණ විධියට ආව ගොඩක් ටෙන්ඩර් වෙනස් කරලා තිබෙනවා. ජාත්‍යන්තර වෙළෙඳාමේ තිබෙන ඒ තත්ත්ව ගැන රවි කරුණානායක මන්ත්‍රීතුමා එහෙම දන්නවා ඇති. ජාත්‍යන්තර contract එකක් ගැහුවාම කොහොමද ඒවා අය කර ගන්නේ? අපි මේ සභාවේ කෑ ගැහුවා කියලා ඒ සල්ලි අය කර ගන්න බැහැ, supplier කෙනෙක් default කරන්න බැහැ. ඒවාට ක්‍රම තිබෙනවා. අපි කිසිම විධියකට ඒවා හංගන්නෙත් නැහැ, යට ගහන්නෙත් නැහැ. අපට ඔය කිසිම supplier කෙනෙක් සමඟ කිසිම සම්බන්ධයක් නැහැ. ඔය කාටවත් මම telephone call එකක්වත් අරගෙන නැහැ. ඒ හින්දා අපි භය නැහැ.

මම එදා ඉඳලා ලංකාවට වැඩිම පොහොර ප්‍රසම්පාදනයක් කළ නිලධාරියෙක්. පොහොර සම්බන්ධයෙන් මට රුපියලකටවත් චෝදනාවක් නැහැ, ඩොලර් මිලියන ගණන්වලින් ගනුදෙනු කළේ. අපි එහෙම මිනිස්සු. පුළුවන් නම් මේවා ඔප්පු කරන්න. දෙකයි පණහේ ගනුදෙනුවලින් සල්ලි ගත්තා, කෝටි 5ක්ද කීයක්ද ගත්තා කියනවා. පුළුවන් නම් ඒවා එළියේ කියන්න, ගරු මන්ත්‍රීතුමන්ලා. ඒගොල්ලන් තමයි පොටෙන්ෂියා සමාගම එක්ක එකතු වෙලා ගේම් ගැහුවේ. පොටෙන්ෂියා ටෙන්ඩරය නැවැත්වූවේ මම. මටත් ආවා Cabinet Paper එක ඒගොල්ලන් qualify කරන්න කියලා. මම අත්සන් කළේ නැහැ. මම තමයි ඒක නැවැත්වූවේ. ඒ අවුල තමයි මේ දිගටම යන්නේ. දෙවැනියාට දෙන්න, දෙවැනියාට දෙන්න කියන්නේ ඒක තමයි. අපි කවදාවත් ඒ දේවල් කරන්නේ නැහැ. *[බාධා කිරීමක්]* ප්‍රකාශ කළේ ඒක තමයි. දෙවැනියා පොටෙන්ෂියා පීඑල්සී. රාජපක්ෂ රෙජීමයේ. *[බාධා කිරීමක්]* ඔව්, *[බාධා කිරීම්]* ඒවා කිව්වා, එතුමා පැනලා ගිහිල්ලා නේ. මම කියනවා ඕනෑ වෙලාවක. සජබයේ සමහර මන්ත්‍රීවරු දන්නේ නැහැ. පොහොට්ටුවේ බෙර පදයට නටනවා. සමහරුන්ට තේරෙන්නේ නැහැ. ඒ, ඒගොල්ලන්ගේ බිස්නස්. පොටෙන්ෂියා පීඑල්සී කියන්නේ හොරට බෙහෙත් ගෙනැල්ලා අහු වුණු කට්ටිය, ළමයි මැරුණා. ලංකාවේ නියෝජිතයෝ දෙන්නෙක් ඉන්නේ Dubai company එකක් හදාගෙන; යෝෂිතගේ යාළුවෝ; එක පන්තියේ. ඒගොල්ලන් එක්ක තමයි මෙච්චර කල් කැබිනට් එකෙන් දූෂිත විධියට approval දීලා ගල් අඟුරු ගෙනාවේ, කිසිම bond එකක් නැතිව. ඒවා වෙනස් කළාම දෙදරනවා තමයි. ඒකට තමයි මේ රැල්ල යන්නේ. හැමෝම හිතන්නේ මේ ඇත්ත කියලා. ඒකට විරුද්ධව තමයි මේ රැල්ල යන්නේ. ඒ නැව්වල කිසිම දෙයක් check කරලා නැහැ. ගිය අවුරුද්දේ නැව් 7ක් ආවා. ලක්විජය බලාගාරයේ lab එකේ report අරගෙන බැලුවාම ඒ නැව් 7ම GCV - Gross Calorific Value - එක 5,900ට අඩුයි. කෝ, කිසිම action එකක් නැහැ. ඊළඟට, නැව් delay වුණා. නැව් 11ක් ආවා 2024 අවුරුද්දේ පරක්කු වෙලා; delay charges නැහැ. *[බාධා කිරීමක්]* ඒ ඔක්කෝම හොරට කරපු දේවල්. ඒ කවුරුවත් නැහැ අද මෙතැන. ඒවා ගැන අහන්නේ නැහැ. මම හිතන විධියට, මීට අදාළ කාරණා ගොඩක් අපේ සහෝදර මන්ත්‍රීවරු ඉදිරිපත් කළා. මට කියන්න තිබෙන්නේ මෙහෙම චෝදනා කරලා ජාතික මේ ජන බලවේගයේ මන්ත්‍රීවරු හරි, ඇමතිවරු හරි කොටු කරගෙන, කොටු කරගෙන අපේ ආණ්ඩුව දුර්වල කරන්න හිතනවා නම් ඒක වෙන්නේ නැහැ කියලා. බොහොම දුකයි. ඔබතුමන්ලා පව්. මොකද, එහෙම ව්‍යාපාරයක් නොවෙයි අපි හදලා තිබෙන්නේ. එකාට එකා ගියත් මේක හදලා මිසක් අපි අතාරින්නේත් නැහැ.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.43]

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇමතිතුමා අද මෙතැනදී ඉල්ලා අස්වීම ගැන කථා කරයි කියලා තමයි අපි නම් ඇත්තටම බලාපොරොත්තුවෙන් හිටියේ. නමුත්, ඒ කථාව නොවෙයි ආවේ, නේද? මොකද, සාමාන්‍යයෙන්,- *[බාධා කිරීම්]* ඕකට ඇවිස්සෙන්න ඕනෑ නැහැ. *[බාධා කිරීම්]* ඔච්චර ඇඹරෙන්න ඕනෑ නැහැ. රුපියල් බිලියන 22ක අලාභයක් කරලා තිබෙනවා. ලජ්ජා භය තිබෙනවා නම්, අපි බලාපොරොත්තු වුණේ ඔබතුමා ඉල්ලා අස් වෙයි කියලා. නමුත්, දැන් අපට පෙනෙනවා, ඔබතුමාගේ ලජ්ජා නහරය පැලවත්තේදී කපා දාලා තිබෙනවා කියලා. ඒක කපලා නිසා, ඔබතුමාට දැන් ඉන්න පුළුවන්.

මම විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ, ඔය වාගේ චෝදනා එල්ල වුණාම, ඔබතුමන්ලා හොරුයි කියලා කියපු ආණ්ඩුවල හිටපු ඇමතිවරු අයින් වුණු බව. රවි කරුණානායක මන්ත්‍රීතුමා ඇමතිවරයෙක්ව සිටියදී චෝදනාවක් ආවා; අයින් වුණා. තිලක් මාරපන ඇමතිතුමාට චෝදනාවක් ආවා; අයින් වුණා. ඔබතුමන්ලා ඊට වඩා හොඳ දේශපාලන සංස්කෘතියක් මේ රටට ගේන්න ආපු අය නේ. ඒ දේශපාලන සංස්කෘතිය ගේන්න ආපු උදවිය මොන චෝදනා ආවත් ඉල්ලා අස් වෙන්නේ නැහැ, ඒ පරණ සංස්කෘතියේම තමයි ඉන්නේ. නමුත්, තමුන්නාන්සේලා එක එක්කෙනා නැඟිටලා එතුමාව සුද්ද කරනවා. එක පැත්තකින් කියනවා, බාල ගල් අඟුරු ගෙනාවා කියලා. ඒ කියන ගමන් ඇමතිතුමාව ආරක්ෂා කරනවා. ජනාධිපතිතුමාත් ඇවිල්ලා කිව්වා, බාල ගල් අඟුරු ගෙනාවා කියලා. පාඩු වුණා කියලාත් පිළිගන්නවා. ඒ පාඩුව මකා ගන්න තුන්පැත්තකින් අය කර ගන්න ඕනෑ කියලාත් ජනාධිපතිතුමා කිව්වා. ඒ කියන ගමන් ඇමතිවරයා අයින් කරන්න කියන්නේ නැහැ. නමුත්, කලින් ආණ්ඩුවල ඇමතිවරුන්ට දූෂණ චෝදනා ආපු ගමන් අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා විපක්ෂයේ ඉඳගෙන හැමදාම ආණ්ඩු පක්ෂයට අත දික් කර කර කිව්වා, "අයින් වෙන්න, අයින් වෙන්න. ලජ්ජා නැද්ද, ලජ්ජා නැද්ද?" කියලා. දැන් එතුමාගේ ආණ්ඩුවේම ලජ්ජාව නැති, ලජ්ජා නහරය කපාපු ඇමතිවරයෙක් තියාගෙන ඉන්නවා. ඇමතිතුමනි, ඔබතුමාට තිබෙන මේ චෝදනාව ඕනෑ නම් අතාරින්නකෝ. ඔබතුමාට මහාධිකරණයේ නඩුවක් තිබෙනවා නේ. පොහොර සංස්ථාවේ සිද්ධියකට චෝදනාවක් තිබෙනවා නේ. අඩුම ගණනේ ඒක නිසාවත් මේ ඇමතිකමින් අයින් වෙන්න එපායැ, දූෂණ චෝදනාවක් කලින් තිබෙන නිසා. දැන් ඒකවත් කරන්නේ නැහැ නේ. එහෙම චෝදනාවක් නැතුව නොවෙයි නේ. පොහොර සංස්ථාවේ සිද්ධ වෙච්ච දෙයට චෝදනාවක් තිබෙනවා. ඒකට මහාධිකරණයේ නඩුවකුත් දාලා තිබෙනවා. අඩුම ගණනේ ඒ නඩුව තිබෙන නිසා, ඒක ඉවර වනතුරුවත් ඇමතිකමින් අයින් වෙන්නකෝ. නමුත්, අයින් වෙන්නේ නැහැ.

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදා ජනාධිපතිතුමා ඇවිල්ලා කිව්වා, තුන්පැත්තකින් වැරැදි සිද්ධ වෙලා තිබෙනවා කියලා. තුන්පැත්තකින් අය කර ගන්න ඕනෑ කිව්වා. එතුමා කියනවා, මහා භාණ්ඩාගාරයෙන් ගෙවනවාලු. අනෙක් එක හැටියට එතුමා කියනවා, මහජනතාවට යම් මුදලක් ගෙවන්න වෙනවාලු. ඊළඟට එතුමා කියනවා, නඩු දාලා ගන්නවාලු. මහා භාණ්ඩාගාරයෙන් ගෙවන්නේ කාගේ මුදල් ද? මේ පාඩුව මකා ගන්න මහා භාණ්ඩාගාරයෙන් ගෙවන්නේත් අපේ මුදල්. ඊළඟට, මහජනතාවගෙන් අය කර ගන්නවා කියන්නේ විදුලි බිල වැඩි කරන්න ඕනෑය කියන එක. ඊළඟට නඩු මහට යනකොට ඒ නඩුවලට කථා කරන නීතිඥවරුන්ට සල්ලි ගෙවන්නත් ඕනෑ මහා භාණ්ඩාගාරයෙන්. එතකොට බැලුවාම ජනාධිපතිතුමා කිව්වේ හරිම ෂෝක්, නිර්මාණශීලී කථාවක් කියලා කාට හරි හිතෙන්න පුළුවන්. මේක මාර කථාවක් කියලා කියන්න පුළුවන්. නමුත්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක පැත්තකින් අපේ බදු මුදල්, මහා භාණ්ඩාගාරයේ සල්ලිත් පාවිච්චි කරනවා මේක පියවා ගන්න. අනෙක් පැත්තෙන්, නඩු කියන්නත් පාවිච්චි කරනවා. එතකොට අපි ජනාධිපතිතුමාගේ කථාව හරියට අරගෙන බැලුවොත්, බර්ටි සහ ඇනස්ලිගේ කථාවක් තිබුණේ "ඌ මට ගහනවා, මට ඌ ගහනවා" කියලා, අන්න ඒක තමයි වෙන්නේ. "ඌ මට ගහනවා, මට ඌ ගහනවා" ජනාධිපතිතුමාගේ කථාව බැලුවොත්, අන්තිමට හැම එකෙන්ම අපේ ජනතාවගේ බදු මුදල් තමයි ගෙවන්න සිද්ධ වෙලා තිබෙන්නේ. එතකොට ඒක අපට දරන්න සිද්ධ වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කාරණයේදී අපි එක දෙයක් කියන්න ඕනෑ. මේ විශේෂ විගණන වාර්තාව අනුව තමයි අපි සියලුදෙනා මේ කරුණු කියන්නේ. විගණකාධිපති මෙවැනි වාර්තාවක් නිකුත් කළාම, මේ ආණ්ඩුවේ ඉන්න අය එදා විපක්ෂයේ ඉන්න කොට ඒක පිළිගත්තා. නමුත්, අද මේක පිළිගන්න සූදානම් නැහැ. මම බරපතළ ලෙස එක දෙයක් කියන්න කැමැතියි. ජනාධිපතිතුමා මේ විගණකාධිපතිතුමිය පත් කරන්න මාස නවයක කාලයක් ගත්තා. පත් කළේ නැහැ. අපි එදා පැහැදිලිව දෙයක් කිව්වා. මොකක්ද අපි එදා කිව්වේ? මේ අවුරුද්දේ ඉඳන් පසුගිය අවුරුද්දේ ආණ්ඩුවේ අමාත්‍යාංශවල විගණන කටයුතු කරන්න පටන් ගන්නවා. ඒ නිසා තමන්ට අවශ්‍ය විගණකාධිපතිවරයෙක් පත් කර ගන්න තමයි මේ පත්වීම ප්‍රමාද කරන්නේ කියලා අපි කිව්වා. ඒක හරියට හරි. දැන් මේකෙන් ඒ කාරණය ඔප්පු වෙලා තිබෙනවා. ඇයි මම එහෙම කියන්නේ? මේ වාර්තාව හදනකොට COPE එකේ සභාපතිතුමා විගණකාධිපති දෙපාර්තමේන්තුවට ගිහිල්ලා මේ වාර්තාව හදන අයත් එක්ක දවස් පහක-හයක සාකච්ඡාවක් කර තිබෙනවා; බලපෑම් කර තිබෙනවා. COPE එකේ සභාපතිතුමා කොහොමද, විගණකාධිපති දෙපාර්තමේන්තුවට යන්නේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ගරු කථානායකතුමාගෙන් ඉල්ලා සිටිනවා මේ පිළිබඳව පරීක්ෂණයක් කරන්න කියලා. විගණකාධිපතිතුමියගෙන් එම කාරණය අහන්න ඕනෑ. විගණකාධිපති දෙපාර්තමේන්තුවේ CCTV recordings තිබෙනවා. ඒවාත් ගෙනෙන්න ඕනෑ. මොකද, COPE එකේ සභාපතිතුමා නීති විරෝධී වැඩක් කළා. එතුමා විගණකාධිපති දෙපාර්තමේන්තුවට ගිහිල්ලා මේ වාර්තාව හදපු නිලධාරින්ට බලපෑම් කළා. නමුත් එම නිලධාරින් ඒ බලපෑම් භාර ගත්තේ නැහැ. එම බලපෑම් භාර ගන්නේ නැතුව, ඒ බලපෑමට යටත් නොවී මෙවැනි වාර්තාවක් එළි දැක්වීම ගැන විගණකාධිපති දෙපාර්තමේන්තුවට අපේ ස්තුතිය පිරිනමන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.49]

**ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ පාර්ලිමේන්තුවේ සාකච්ඡා වන්නේ විපක්ෂය විසින් ඉදිරිපත් කළ තුන්වන විශ්වාස භංග යෝජනාව පිළිබඳවයි. පළමු එක - *[බාධා කිරීමක්]* මම කියන්න හැදුවේ මේකයි. අගමැතිතුමියට එරෙහිව ගෙනෙනවා කියපු එක ගැනත් අපි තවම හොයනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
කෝ, ඒක?

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ඒකත් ඔය ගමන්ම ඉදිරිපත් කළා නම් ලෙහෙසියි. මොකද, ජයකොඩි ඇමතිතුමාට විරුද්ධව මේ ගෙනාපු විශ්වාස භංග යෝජනාවේ දීත් ඒකම තමයි විපක්ෂයට සිද්ධ වෙන්නේ. මේ තුළ අලුතින් සිද්ධ වෙන්න දෙයක් නැහැ.

මේ විවාදය ඇතුළේ විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුන් උත්සාහ කළා, මේ විශ්වාස භංග යෝජනාව කුමාර ජයකොඩි ඇමතිතුමාට ගොනු කරන්න. අපි පැහැදිලිව කියනවා, රජයක් හැටියට අපි සාමූහිකව වගකීම දරන බව. ජනාධිපතිවරයා ඇතුළු කැබිනට් මණ්ඩලය සාමූහිකව වගකීම දරමින් තමයි මේ වැඩ කටයුතු කරන්නේ. මේ ගල් අඟුරු පිළිබඳ කථාව පසුගිය මාස කිහිපයේම මේ පාර්ලිමේන්තුව තුළත්, රටේත් සාකච්ඡාවට ගැනුණා. මේ අතර මේ ටෙන්ඩරය දෙවැනියට තිබෙන සමාගමට දෙන්න කියන කථාවකුත් එනවා නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒක පිටුපස තිබෙන්නේ මොකක්ද? පොටෙන්ෂියා තමයි දෙවැනියා. අවසානයට qualify වුණු සමාගම් දෙකෙන් එකක් තමයි ඒක. ඒගොල්ලන් තමයි දිගටම ගල් අඟුරු දුන්නේ. හැබැයි, ටෙන්ඩර් නැතුව තමයි එය සිදුවී තිබෙන්නේ. ටෙන්ඩර් එකෙන් තෝරා ගත් කාටවත් කවදාවත් දීලා නැහැ, බලනකොට. පොටෙන්ෂියා එකේ සල්ලි සමහර විට තවම වැඩ කරනවා ඇති. පාර්ලිමේන්තුව ඇතුළේ ඒවාට කෑ ගැහුවා කියලා පොටෙන්ෂියා එකට මේක දෙන්න වෙන්නේ නැහැ. ඒකත් කියන්න එපායැ.

මේ ගල් අඟුරු සැපයුම් ක්‍රියාවලිය තුළින් කුමාර ජයකොඩි ඇමතිතුමාට එරෙහිව විශ්වාස භංගයක් ගෙනෙන්නේ කොහොමද? ඒ කියන්නේ, එතුමා මේ රටේ ජනතාවට අලාභයක් කරන්න, වංචාවක් කරන්න කටයුතු කළාද? දැන් මේ සංවාදයට යොමු වුණා, වංචාවක් සිද්ධ වෙලා තිබෙනවා, දූෂණයක් සිද්ධ වෙලා තිබෙනවා කියා ලේකම්වරයා කිව්වාය කියන කාරණය. එහෙම ප්‍රකාශයක් කර තිබෙනවා නම් විපක්ෂයේ මන්ත්‍රීවරුන්ටත් වගකීමක් තිබෙනවා, ලේකම්වරයාගේ ප්‍රකාශය පිළිබඳව පරීක්ෂණයක් පවත්වන්න කියලා කියන්න. ඒක හරි. ඒ වාගේම ලේකම්වරයාටත් වගකීමක් තිබෙනවා. ඔහුට එහෙම ආවාට ගියාට ප්‍රකාශ කරන්න බැහැ. එවැනි දූෂණයක්, වංචාවක් සිද්ධ වෙලා තිබෙනවා නම් ඔහු තොරතුරු සහිතව ඒ ගැන ප්‍රකාශ කරන්න ඕනෑ; ඒ සම්බන්ධව නීතිය ක්‍රියාත්මක කරන්න ඕනෑ; පරීක්ෂණ පවත්වන්න ඕනෑ. ඒ සිද්ධ වෙච්ච ක්‍රියාවලිය පරීක්ෂාවට ලක් කරන්න ඕනෑ. එහෙම නැතුව නිකම්ම ඒ විධියට කියන එක ගැළපෙන්නේ නැහැ. ඒ නිසා ලේකම්වරයා එහෙම දෙයක්

කොහේ හරි තැනක කියා තිබෙනවා නම්, ඒ මන්ත්‍රීවරුන්ට පුළුවන් ඒ පිළිබඳව පරීක්ෂණයක් පවත්වන්න කියන කාරණය ලිඛිතව දැනුම් දෙන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගල් අඟුරු වංචාව පිළිබඳව වන මෙම සාකච්ඡාවේදී මතු කරන්න උත්සාහ කරන්නේ මොකක්ද? දැනුත් එක මන්ත්‍රීවරයෙක් කිව්වා බිලියන 22ක් පාඩුයි කියලා. මේ ආකාරයට ගණන් හැදුවේ කොහොමද කියලා හොයා ගන්න තමයි අපි දැන් බලන්නේ. ඒකට වෙනම පාඩමක් කරන්න වෙනවා. බිලියන 22ක් පාඩුයි කියනවා. මේ ගල් අඟුරු සැපයුම් ක්‍රියාවලිය ඇතුළේ පාඩුවක් සිද්ධ වෙලා තිබෙනවාද කියන කාරණය ගත්තාම, 'ඔව්' පාඩුවක් සිද්ධ වෙලා තිබෙනවා. ඒ සිද්ධ වෙච්ච පාඩුව අවම කර ගැනීම සඳහා මේ ටෙන්ඩර් ක්‍රියාවලිය ඇතුළේම අනුගමනය කරපු ප්‍රසම්පාදන කොන්දේසි තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සැපයුම්කරුවාගේ වගකීම වන්නේ එම ප්‍රසම්පාදන කොන්දේසි අනුව ටෙන්ඩර් පටිපාටිය ඇතුළේ ප්‍රමිතියෙන් යුතු ගල් අඟුරු සැපයීමයි. ඒ නිසා අදාළ ප්‍රසම්පාදන කමිටුව, ඒ තාක්ෂණික ඇගයීම් කමිටුව - TEC එක - ආදී සියල්ල විසින් එම ප්‍රසම්පාදන කටයුතු සම්පූර්ණ කර, ඒ අනුව අදාළ සැපයුම්කරුවා තෝරා ගන්නවා. එම සැපයුම්කරුවා තමන්ගේ සැපයුම වෙනුවෙන් එකඟතාවකට එනවා. ඒක තමයි විධිය. එසේ එකඟතාවකට ආවාට පසුව එම එකඟතාවත් එක්ක තමයි අපි වැඩ කරන්න ඕනෑ.

ගල් අඟුරු සැපයුමේ ඉතිහාසය සොයා බැලුවාම අපට පෙනී යනවා, ඉතිහාසය තුළත් මේ වාගේම නැව් පිටින් ප්‍රතික්ෂේප වෙලා තිබෙන බව. 2014-2017 කාලයේ ගල් අඟුරු නැව් 7ක් ප්‍රතික්ෂේප වෙනවා. ඒ කොහොමද? සැපයුම්කරුවාගේ වරායෙන් සාම්පල් පරීක්ෂාව කරනවා. ඒකත් ප්‍රතික්ෂේපයි. ඒකත් ප්‍රතික්ෂේපයි කියලා කියන්නේ මේ නිසායි. මීට කලින් ගල් අඟුරුවල තිබිය යුතු දළ කැලරි ප්‍රමාණය විධියට තිබුණේ කිලෝග්‍රෑමයකට කිලෝ කැලරි 5,800ත්, 6,300ත් අතර ප්‍රමාණයක්. අපේ බලාගාරය සකස් වෙලා බලාගාරය ප්‍රමිතීන්වලට එනකොට කැලරි ප්‍රමාණයෙත් යම් වෙනස්කම් ඇති වෙනවා. ඒක අදාළ තාක්ෂණික කරුණක්. ඉංජිනේරුවන්ට ඒ අදාළ තාක්ෂණික කරුණුත් එක්ක ගනුදෙනු කරන්න පුළුවන්. හැබැයි ප්‍රතික්ෂේප වෙච්ච ඒ නැව් 7 ගොඩබාන වරායෙනුත්, එහෙම නැත්නම් අපෙනුත් ප්‍රතික්ෂේප වෙලා තිබෙනවා. එතකොට ඒ සාම්පල් පටවන වරායෙනුත් ප්‍රතික්ෂේපයි. මෙහේ භාරගන්න වරායෙනුත් ඒ සාම්පල් ප්‍රතික්ෂේපයි. ඊට පස්සේ යනවා third umpire ළඟට. එතකොට තුන්වැනි පරීක්ෂණ වාර්තාව ගත්තාම, මේ ගල් අඟුරු නැව් 7ම ප්‍රතික්ෂේප නැහැ. ගල් අඟුරු නැව් 3ක්, 4ක් ප්‍රතික්ෂේපයි. ඒ ගොල්ලෝ කියනවා 3ක් හොඳයි කියලා. හැබැයි මේ පරීක්ෂාවන් සිද්ධ කරන්නේ මාස කිහිපයකට පස්සේ. ගල් අඟුරු සම්පාදනයේදී මේ ක්‍රියාවලිය මේ විධියට තිබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තව කරුණක් කියන්න තිබෙනවා. සමහර ඒවායේ අලාභය ගණන් හදලා, එහෙම නැත්නම් ප්‍රසම්පාදනයේදී ඒ අයත් එක්ක; සැපයුම්කරුවාත් එක්ක හරියට එකඟ වෙලා සැපයුමේදී වෙච්ච ප්‍රමාදය ද නැත්නම් ප්‍රමිතියෙන් තොර ගල් අඟුරු සැපයීම සම්බන්ධයෙන් අය කර ගැනීම් හරියට කළාද කියලා ඇහුවොත් එහෙම, ඒත් නැහැ. ඒවාත් හරියට කරලා නැහැ. මොකද, Potencia එකත් එක්ක නේ, මේ සැපයුම දිගට ඇවිල්ලා තිබෙන්නේ. ඒ කාලයේ සමහර ඒවා තිබුණේ මෙහෙමයි. Term tender එක එනවා. Term tender එක supply කරනවාත් එක්කම spot tenders දෙක තුනක් ඇතුළට එනවා; emergency purchasing එනවා. මොකටද? ඒක තමයි ගහන්න ලේසි තැන. හදිසි මිලදී ගැනීම් - emergency purchasing - එනවා. Spot tenders දාලා හදිසි මිලදී ගැනීම් එනවා. වැඩිපුර කරන්නේ ඒවා. මේවා කරන අතරේ සමහර ප්‍රශ්න ඇවිල්ලා තිබෙනවා. ඉතිහාස කථාව ඇතුළේම ගල් අඟුරු සම්පාදනයේදී මෙවැනි සිදුවීම් වාර්තා වෙනවා, මෙවැනි තත්ත්වයන් තිබෙනවා.

එතකොට ඒ වාගේ ඒවාට මැදිහත් වෙච්ච අය, ඒ ක්‍රියාවලියට සම්බන්ධ වෙච්ච අය, ඒ ක්‍රියාවලිය ඇතුළේ ප්‍රතිලාභ ගත්ත සමහර අය, වරප්‍රසාද ලබපු අය ඉන්නවා. හැබැයි ජාතික ජන බලවේගයේ ආණ්ඩුවක් ලෙස අපි මේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්පූර්ණ කරලා සැපයුම්කරුවා තෝරනකොට ප්‍රශ්නය වැඩිවෙන්නේ continuous supply එක දීපු Potencia සමාගම වෙනුවට වෙන කෙනෙක් තේරෙන නිසා. ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුව ඔහු තමයි තේරෙන්නේ. ඔහුත් එක්ක අපි එකඟතාවකට එනවා. එකඟතාවකට ඇවිල්ලා අදාළ ගිවිසුම අනුව ඔහු ගල් අඟුරු සපයනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සැපයීම සඳහා ඔහු මෙහේට ගල් අඟුරු ගෙනාවට පස්සේ, ඒ ගෙනෙන ගල් අඟුරුවල වටිනාකමෙන් සියයට 80යි ඔහු ගෙවන්න ඕනෑ. ඒ වටිනාකමෙන් සියයට 20ක් රඳවාගන්නවා. ඒ රඳවා ගැනීම්වල අගය ගත්තොත්, මේ වෙනකොට ඩොලර් මිලියන 15කට ආසන්නයි.

ඒ නිසා මේ ගල් අඟුරු සම්පාදන ක්‍රියාවලිය තුළ ඒ ප්‍රමිතියට අදාළව එහෙම නැත්නම් අපේ specsවලට අදාළව, අපේ නිර්ණායකවලට අදාළව, අපේ බලාගාරයේදී ගල් අඟුරු ටොන් එකක් පුච්චනකොට විදුලිය නිෂ්පාදනය වෙන්න ඕනෑ මෙච්චරයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔහු ඒ ප්‍රමිතියට අදාළ ගල් අඟුරු ලබා නොදුන්නොත් අපිට නිෂ්පාදනයේදී සිද්ධ වෙන අඩුව අවම කර ගැනීම සඳහා තමයි අර Performance Bond එක වාගේම ඔහුට ගෙවීමේදී අපි bond එකේ අඩුව තියාගෙන තිබෙන්නේ. ඒ අනුව මේ වෙනකොට රුපියල් කෝටි 850කට ආසන්න මුදලක් අය කරගන්න අපි කටයුතු කර තිබෙනවා. ඒ අය කරගන්න කටයුතු කරන්නේ වෙන මොකුත් නිසා නොවෙයි. ඔහු ඒ අදාළ specsවලට අනුව, අදාළ ප්‍රමිතියට අනුව ගල් අඟුරු සැපයීමේදී සිදු වෙලා තිබෙන අසමත්කම නිසා ශ්‍රී ලංකා රජයට අලාභයක් දරන්න සිද්ධ වෙනවා නම්, එහෙම නැත්නම් විදුලිය නිෂ්පාදනයේදී අඩුවක් සිද්ධ වෙනවා නම්, අපි ඒ විදුලිය වෙන තැනකින්; කොහෙන් හරි නිෂ්පාදනය කරගන්න ඕනෑ.

උදාහරණයක් වශයෙන් ගත්තොත්, අපි solar power තිබෙනවාද කියලා බලන්න ඕනෑ, hydropower තිබෙනවාද කියලා බලන්න ඕනෑ, ඩීසල් තිබෙනවාද කියලා බලන්න ඕනෑ. මේ ඕනෑම එකකින් අපි අඩු විදුලිය නිෂ්පාදනය කරගන්න ඕනෑ. මොකද, අපේ පරිභෝජනයට ඒ විදුලිය ප්‍රමාණය අවශ්‍ය වෙනවා. අන්න ඒකට දරන පිරිවැය අවම කරගන්න, පිරිවැය cover කරගන්න තමයි අපි ඒ මුදල අයකර ගන්නේ. විදුලිය නිපදවීම තවදුරටත් අඩු වෙනවා නම් ඒ අදාළ සමාගමට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කරලා නීත්‍යානුකූල ක්‍රියාමාර්ග අරගෙන ඒ ප්‍රමාණය අයකර ගන්න අපි තීරණයක් ගෙන තිබෙනවා.

දැන් අපිට තිබෙන ප්‍රශ්නය මෙයයි. මෙන්න මේ කටයුත්ත තමයි අපි දැන් කරමින් යන්නේ. ඒ කටයුත්ත කරගෙන යනකොට ඉතිහාසය ඇතුළේ සිද්ධ වෙච්ච සමහර සිදුවීම් ගැන හොඳටම දන්න අයත් මේ ගැන බොරු කියනවා. මොකද, කුමාර ජයකොඩි ඇමතිතුමා ඒ කාරණයට තනිවම මැදිහත් වෙලා, එතුමා කැමැති කෙනෙක් තෝරලා, එදා Potencia කියන සමාගමට ටෙන්ඩරය දුන්නා වාගේ අරයාට මේ ටෙන්ඩරය දෙන්න කියලා කැබිනට් මණ්ඩලයට යෝජනාව ගෙනැල්ලා, කැබිනට් මණ්ඩලය එකඟ වෙලා, ඒ අනුව එම ආයතනවලට මේ ටෙන්ඩරය දීලා නම් එතැන ප්‍රශ්නයක් තිබෙනවා. හැබැයි, මේ එහෙම දෙයක් නොවෙයි. නිශ්චිත ප්‍රසම්පාදන ක්‍රියාවලිය යටතේ තමයි අපි එම කටයුත්ත කරලා තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම නිසා මේ තත්ත්වය යටතේ තමයි අපි මේ අලාභය පිළිබඳ කාරණයත් ගන්නේ.

එහි අලාභය ගණනය කළ ආකාරය මොකක්ද? ඒකෙන් රුපියල් බිලියන 22ක් විතර අලාභ වෙලා තිබෙන බව කියනවා.

[ගරු වසන්ත සමරසිංහ මහතා]

දැන් අපි රුපියල් කෝටි 850කට ආසන්න මුදලක් ආවරණය කරගෙන තිබෙනවා. අපි හිතනවා, එය ප්‍රමාණවත් කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි, එය ප්‍රමාණවත් නොවෙයි නම් විදුලිය නිෂ්පාදනය වීමේ අඩුව තවදුරටත් සම්පූර්ණ කරන්න අපට ඩීසල් හෝ වෙනත් ප්‍රභවයක් පාවිච්චි කරන්න වනවා නම් ඒ වෙනුවෙන් දරන්න වන වියදම කොච්චරක්ද කියලා බලලා ඒ බර ජනතාවට දෙනවා වෙනුවට ඒ පාඩුව සමාගමෙන් අය කර ගන්න තමයි අපි නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගන්නේ. ඒක තමයි අපේ සැලැස්ම. ඒ අලාභය පැති දෙකකින් ගණනය කරන්න අපි සොයා බලා තිබෙනවා.

විශේෂයෙන් ප්‍රමිතියට අදාළව විදුලිය නිපදවීමක් සිදු වන්නේ නම් ප්‍රශ්නයක් නැහැ. හැබැයි, ප්‍රමිතියට අදාළව නිපදවීමක් සිදු නොවන්නේ නම් එතැන අධි පරිභෝජනයක් සිදු වනවා. අපි හිතමු කෝ, ගල් අඟුරු මෙට්‍රික් ටොන් එකකින් හදන්නේ විදුලිය ඒකක 10යි කියලා. හැබැයි, දැන් ගල් අඟුරු මෙට්‍රික් ටොන් එකකින් අපට විදුලිය ඒකක 10ක් නිපදවන්න බැහැ. දැන් අපට විදුලිය ඒකක 10ක් නිපදවන්න ගල් අඟුරු කිලෝ ග්‍රෑම් 1,200ක් වැය වනවා. ඒ කියන්නේ, මෙට්‍රික් ටොන් එකක් වෙනුවට තව දශම දෙකක් වැඩි වෙනවා. එතකොට නිෂ්පාදනය පවත්වාගෙන යෑම වෙනුවෙන් වැඩිපුර ගල් අඟුරු යොදවන්න වෙනවා. එම නිසා අධි පරිභෝජනයක් සිදු වනවා. එක බලාගාරයකින් මෙගාවොට් 270ක් අපට අවශ්‍යයි නම්, ඒ බලාගාරයට අවශ්‍ය කරන ගල් අඟුරු ප්‍රමාණය මෙට්‍රික් ටොන් 100,000යි නම් තව මෙට්‍රික් ටොන් ප්‍රමාණයක් වැඩියෙන් යොදවන්න වනවා. අන්න එතකොට අධි පරිභෝජනයක් සිදු වනවා. ඒ අධි පරිභෝජනය හරහා අපට අලාභයක් සිදු වනවා, ඒක cover කර ගන්න අපි දැන් මුදලක් අය කරගෙන තිබෙනවා; අපි bond එක නවත්වාගෙන තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දෙවැනි කාරණය මෙයයි. දැන් අපට අමතර නිෂ්පාදනයක් කරන්න වනවා. අමතර නිෂ්පාදනයක් කරන්න වනවාය කියන්නේ, අපට මෙගාවොට් 270ක් ජනනය කර ගැනීම සඳහා ගල් අඟුරු මෙට්‍රික් ටොන් 100,000ක් වෙනුවට දැන් මෙට්‍රික් ටොන් 120,000ක් පාවිච්චි කරන්න වනවා. හැබැයි, මෙට්‍රික් ටොන් 120,000ක් පාවිච්චි කළාට අවශ්‍ය නිෂ්පාදනය ඒත් එන්නේ නැත්නම් මොකද කරන්නේ? අපි හිතමු, මෙගාවොට් 270 වෙනුවට ලැබෙන්නේ මෙගාවොට් 260යි කියලා. එතකොට තව මෙගාවොට් 10ක හිඟයක් තිබෙනවා. ඒ මෙගාවොට් 10ක හිඟය සම්පූර්ණ කරන්න අපේ ජාතික ජනන සැලසුම ඇතුළේ තිබෙන ජනන ප්‍රභව මොනවාද කියලා හඳුනාගන්න වනවා. ඒ ජනන ප්‍රභව හඳුනාගෙන අපි පාවිච්චි කරන්න ඕනෑ ප්‍රභවය මොකක්ද කියලා තීරණය කරන්න ඕනෑ.

අපට hydropower නැහැ. මොකද, මහ කන්නය ඉවර වෙලා දැන් එන්නේ යල කන්නය. එම නිසා අපේ ජලාශවල තිබෙන වතුර ටික තියාගන්න ඕනෑ, ඉදිරි කන්නවල වැඩ කරගන්න. අපට LNG නැහැ. මොකද, අපි තවම ඒ බලාගාර පටන් අරගෙන නැහැ. ඒ වාගේම අපට solar වාගේ ප්‍රභවයකින් දවල්ට විදුලිය නිෂ්පාදනය කර ගන්න පුළුවන් වුණාට රෑට එම නිෂ්පාදනය රඳවා ගන්න ප්‍රමාණවත් batteries නැහැ. එම නිසා අපි දැන් ඒකටත් අවශ්‍ය පියවර අරගෙන තිබෙනවා. අපි batteries ගෙනැල්ලා දවල් කරන නිෂ්පාදනය ගබඩා කරලා තියාගෙන grid එකට එකතු කර ගන්න පුළුවන් විධියේ යෝජනාවක් දීලා තිබෙනවා. එහෙම නැත්නම් අපට ඩීසල් පාවිච්චි කරන්න වනවා. ඩීසල් පාවිච්චි කරන්න ගියාම අපි දන්නවා, ලෝක ගෝලීය තත්ත්වයත් අපට යම් බලපෑමක් ඇති කරලා තිබෙන බව. ඒක හැම දාම එන ගැටලුවක් නොවෙයි. ලෝක ගෝලීය තත්ත්වය, මේ දේශපාලන තත්ත්වය අපට යම් බලපෑමක් ඇති කරලා තිබෙනවා. ඒ සඳහා ඩීසල් පාවිච්චි කරන්න වනකොට සමහර විට අපට refined DIESEL විතරක්ම පාවිච්චි කරන්න වනවා. එතකොටත් cost එක ටිකක් වැඩි වනවා.

එම නිසා අපි ඒ සියල්ල සලකා, අර අමතරව නිෂ්පාදනය කරන්න යන ප්‍රමාණය සඳහා පාවිච්චි කරන ප්‍රභවය මොකක්ද කියලා තීරණය කරනවා. එය ඩීසල් ද, LNG ද, solar batteriesවලින් ද කියලා, ගන්න ප්‍රමාණය සහ ඒ ප්‍රභවයට අපට දරන්න වන පිරිවැය කීයද කියලා බලනවා. අන්න ඒ අමතර පිරිවැය තමයි අපට ගණනය කරලා නැවත අධිකරණ ක්‍රියාමාර්ග අරගෙන ඒ සැපයුම්කරුවාගෙන් අය කර ගන්න තිබෙන්නේ. අපි දන්නේ නැහැ, හැබැයි විපක්ෂය නම් දැන් ඔක්කෝම ගණනය කරලාත් ඉවරයි. රුපියල් බිලියන 22ක අලාභයකුත් තිබෙනවා ලු. ගණනය කරපු ක්‍රමය මොකක්ද කියලා හරියට කිව්වොත් මෙය පහසු වනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි අපි ඉතාම පැහැදිලිව කියනවා, මේ මූලික ක්‍රියාවලිය ඇතුළේ විදුලිය විසන්ධි වීමක් කිසිසේත්ම සිදු නොවන්න තමයි රජයක් හැටියට අපි කටයුතු කරන්නේ කියන එක. ඒ වාගේම ජනතාවට පීඩාවක් ඇති නොවන්න අඛණ්ඩ විදුලි සැපයුමක් ලබා දෙන්නත් අපි කටයුතු කරනවා.

ඒ අඛණ්ඩ විදුලි සැපයුම ලබා දීමට අමතර විදුලිය නිෂ්පාදනයක් කරන්න ඕනෑ නම් ඒකට අවශ්‍ය ඉන්ධන ප්‍රභවය පාවිච්චි කරලා, නැත්නම් විදුලි ජනන ප්‍රභවය පාවිච්චි කරලා ජනතාවට විදුලිය ලබා දෙන්න කටයුතු කරනවා. ඒ කටයුත්ත කරගෙන යනකොට තමයි අද පාර්ලිමේන්තුවට විශ්වාස භංගයක් ගෙනැල්ලා අපේ විපක්ෂයේ මන්ත්‍රීවරුන් මෙලෙස අවධානය දිනාගන්න උත්සාහ කරන්නේ. මේ අවස්ථාවේ අපි මේ දේත් කියන්න ඕනෑ. විපක්ෂය ඇතුළේ ගෙනාපු යෝජනාව පිළිබඳව ඔවුනුත් දන්නවා, සමහර විට මේක දාන්න ඕනෑ නිසා දාන බව. එහෙම නැත්නම් සුපුරුදු විශ්වාස භංග යෝජනාවලට වෙච්ච ක්‍රියාවලියම මේකටත් සිදු වනවා. මේ විශ්වාස භංගයට අපේ ආණ්ඩු පක්ෂයේ, මන්ත්‍රීවරුන්, ඇමතිවරුන් ඉදිරිපත් කරපු කරුණු මත අපි ඉතා පැහැදිලිව ඔප්පු කළා, මේකේ වංචාවක් වෙලා නැහැ කියලා.

හැබැයි, ප්‍රමිතියෙන් තොර සමහර ගල් අඟුරු සැපයුම්, සැපයුම්කරුවන් විසින් සිද්ධ කරලා තිබෙනවා. ඒ සැපයුම්කරුවාගේ Performance Bond එක අනුව, අය කර ගැනීම්වලට අදාල bond එක අනුව, ඒ අය කර ගැනීම් කරලා තිබෙනවා. ඒ අනුව විදුලි නිෂ්පාදනය අඛණ්ඩව පවත්වාගෙන යාමට අවශ්‍ය ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. ඒ නිසා ජනන ප්‍රභවවලට අමතර පිරිවැයක් දරන්න වනවා නම් ඒ අමතර පිරිවැයෙහි බර ජනතාවට නොදී රජයක් විධියට අපි දරනවා. ඒ විතරක් නොවෙයි. ඒක අය කර ගැනීම සඳහා අදාළ සමාගමට එරෙහිව අපි නීතිමය ක්‍රියාමාර්ග ගන්නත් කටයුතු කරනවාය කියන කාරණය අපි මේ වන විටත් පැහැදිලිව කියලා තිබෙනවා.

එම නිසා විපක්ෂයට අපි කියන්න ඕනෑ, මෙවැනි විශ්වාස භංගවලින් තවදුරටත් විපක්ෂයටම විශ්වාසය අහිමි වෙලා යන බව. ජාතික ජන බලවේගයේ ආණ්ඩුව ලෙස ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවට පැමිණ මේ ගැන කරුණු කිව්වා. පාර්ලිමේන්තුව ඇතුළේ අවස්ථා ගණනාවක දී ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නවලට විපක්ෂ නායකතුමාට උත්තර දුන්නා. ඒ වාගේම ඇමතිවරයා මේ හරහා ප්‍රශ්න ගණනාවකට උත්තර දීලා කරුණු කිව්වා. ඒ කරුණු කියද්දිත් උත්සාහ කරන්න හදනවා, තවදුරටත් අසත්‍ය තහවුරු කිරීමට විශ්වාස භංග පාවිච්චි කරන්න හදන විපක්ෂයට මේ විශ්වාස භංගයත් විශ්වාස භංගයක්ම බවට පත් වෙලා අද අතිවිශිෂ්ට ලෙස මෙම විශ්වාස භංගය අපි පරාජය කරනවාය කියන කාරණය කියමින් මම කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 3ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.05]

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම කුමාර ජයකොඩි මහත්තයාගේ කථාවෙන් පස්සේ මම කථා කරන්න හිටපු එක වෙනස් කරන්න හිතුණා.

මොකද, එතුමා බොහොම පාරිශුද්ධභාවයක් ඇති ඇමතිවරයෙක් විධියට කථා කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ කථා කරන්නේ ඊයේ-පෙරේදා වෙච්ච හොරකමක් ගැන නොවෙයි. මීට අවුරුදු 30කට කලින් කථාවක් ගැන තමයි කුමාර ජයකොඩි මහත්තයා ගැන මම මේ කථා කරන්නේ. ඔබතුමන්ලා දැන් පැලවත්තේ හිටියාට, කලින් අත්තිඩියේ ඉන්නකොට කුමාර ජයකොඩි මහත්තයයි, අපියි පැලවත්තේ හිටියා. එතුමාට company එක මතක ඇති. ඔබතුමාට මතක ඇති, ඔබතුමා PAT Report එකක් - Provisional Acceptance Test Report එකක් - බොරුවට අත්සන් කරලා, හොරට අත්සන් කරලා ඔබතුමාට ටෙලිකොම් එකට ඇතුළු වන entry permit එකත් අවලංගු කළ බව. ඔබතුමා පුළුවන් නම් ඒක නැහැයි කියන්න. LG Cables ඔබතුමාව අයින් කළා. මීට අවුරුදු 30කට කලින් කරපු හොරකමක් ගැන තමයි මම මේ කියන්නේ. මම මේක කියන්න නොවෙයි හිටියේ. මොකද, එදා අපි එකට හිටපු අය. එතුමාගේ කථාවේදී පෙන් වූ පාරිශුද්ධභාවය නිසා මට හිතුණා, මේ අවංකව කථා කරන්නේ කුමාර ජයකොඩි මහත්තයාද කියලා. ඒ වාගේම මට ප්‍රශ්නයක් තිබෙනවා, ඔබතුමාට "ඉංජිනේරු කුමාර ජයකොඩි" කිව්වාට, මම දන්නා කාලයේ නම් ඔබතුමා ඉංජිනේරු නොවෙයි. ඔබතුමා එතකොට repeat කර කර තමයි හිටියේ. මම දන්නේ නැහැ, ඔබතුමා 2013-14 කාලය වනකොට ඒක කර ගත්තාද කියා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

දෙන්නා එකට ද repeat කළේ?

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

දෙන්නා එකට නොවෙයි. දෙන්නා එකට හිටියා නම් මම එතැන දිගටම ඉන්නවා නේ. මම හිටියානේ, එතුමා එතැනින් අයින් කරනකොටත්. ඔබතුමන්ලා පැලවත්තේ නැති කාලයේ සිදු වූ මේ අනික් මන්ත්‍රීවරු 223 දෙනාම දන්නේ නැති කතන්දරයක් තමයි මම මේ කිව්වේ. මොකද, එතුමා ඒ දවස්වලත් හොරකම් කළා. ඒකයි එතුමාට ටෙලිකොම් සමාගමට යන්න බැරිව ගියේ. ඇමතිතුමනි, ඔබතුමාට පුළුවන් නම් නැගිටලා කියන්න, ඔබතුමාට ටෙලිකොම් එකට යන්න බැරිව ගියේ වෙනත් කාරණයක් නිසා කියලා. ඔබතුමාගේ සේවය ටෙලිකොම් සමාගමෙන් තහනම් කළා. ටෙලිකොම් සමාගමට ඇතුළු වෙන්නවත් ඔබතුමාට ඉඩ දුන්නේ නැහැ, ඔබතුමාගේ entry permit එකත් අවලංගු කළා. ඉතින් එහෙම කරපු කෙනෙකුට මේ වාගේ chance එකක් දුන්නාම උඩ පැනලා නොගහ ඉදියිද? හොරට අත්සන ගහලා test reports හදපු කෙනා උප කොන්ත්‍රාත්කරුවන් එක්ක එකතු වෙලා ඒවායෙන් වාසි ගන්න කටයුතු කළා. එතුමා හදපු ව්‍යාජ උප කොන්ත්‍රාත්කරුවන් ආයතනයේ subcontracts කළා. එහෙම කරපු කෙනා මේ වාගේ ගේමක් ගහයි කියන එක ගැන කවර කථා ද? ඔබතුමන්ලා මේ වෙලාවේ කරන්නේ සුද්ධ කිරීමක්. මේ වෙලාවේ සුද්ධ කරලා හරියන්නේ නැහැ. මට මේ සමහර කථාවලින් තේරුණේ ඉස්සර මහා පරිමාණ හොරකම් කළා, දැන් පොඩි පොඩි හොරකම් වුණාට කමක් නැහැ කියන එකයි. එහෙම කථාවක් නේ ගියේ. ඒක තමයි සමස්ත කථාව ඇතුළේ දැක්කේ. එහෙම වෙන්න බැහැ.

මේක ලංකාවේ වූ අති දැවැන්ත හොරකමක්. මටත් ලොකු වේදනාවක් තිබෙනවා. මොකද, මමත් නොරොච්චෝලේ බලාගාරය හදන්න මුල් වූ, දායක වූ කොන්ත්‍රාත්කරුවෙක්. ඒක නිසා,- *[බාධා කිරීම්]* ඒකද කැඩෙන්නේ? *[බාධා කිරීම්]* ඒකද කැඩෙන්නේ? එහෙම නම්, මහ මොළකාරයා නලින් බණ්ඩාරද? එහෙමද? හැබැයි, නොරොච්චෝලේ බලාගාරය 2009, 2010, 2011 ආදී වශයෙන් අවුරුදු ගණනාවක් ක්‍රියාත්මක වුණත් ඔබතුමන්ලා ගල් අඟුරු ගෙනාවාට පස්සේ තමයි කැඩෙන්න ගත්තේ. එතකොට නලින් බණ්ඩාරද වැරැදිකාරයා, එහෙම නැත්නම් බාල අඟුරු ගෙනාපු අයද වැරැදිකාරයා?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතිහාසයේ ගෙනාපු බාලම ගල් අඟුරු තමයි මේ ආණ්ඩුව ගෙන්වපු ගල් අඟුරු. ඒවා කාලා බලන්න දෙයක් නැහැ. ජනාධිපතිවරයා "කාලා බලන්නද?" කියලා අහන කථාව පට්ටපල් අමු ජෝක් එකක්. කාලා බලන්න දෙයක් නැහැ. Test කරන්න තිබෙන එකම තැන තමයි, third umpireට දාලා test කරන එක. ක්‍රිකට් මැච් එකක out එකක් ගැන සැකයක් තිබුණොත් අපට third umpire ඉල්ලන්න පුළුවන්. ඒ වාගේ ඔබතුමන්ලාට umpire test එක කරන්න තිබුණා. Third umpireට දැම්මාම සාමාන්‍යයෙන් වරදින්නේ නැහැ. මේක Third umpireට දාලා test කර ගන්න තිබුණු අවස්ථාව. මම ක්‍රිකට්වලින්ම තමයි ඒ කාරණය කියලා දුන්නේ. නමුත්, ඒ අවස්ථාව ලබා ගත්තේ නැහැ. බොහොම පැහැදිලිව පෙනෙනවා, මේක සාමූහික හොරකමක් කියලා. මේක තනි හොරකමක් නොවෙයි. මේක සාමූහික හොරකමක්. ඒක තමයි 159දෙනාම එකතු වෙලා ඒ වංචාව කරපු අයව රකින්නේ. හැබැයි, 159දෙනාට අමතරව මේකට පැලවත්තෙන් සහයෝගයක් තිබෙනවා කියායි මට පෙනෙන්නේ. පැලවත්තෙනුත් මේකට සහයෝගය තිබෙනවා. නැත්නම් මේක ගැටුමක් බවට පරිවර්තනය වෙනවා.

හැම දෙනාම හොරු නොවෙයි කියන එකත් මම කියන්න ඕනෑ. දැන් මේගොල්ලන් හොරකම් කරන්නේ පැලවත්තට දෙන්න කියලා. ඒක තමයි අලුත්ම theory එක. ඒක සමහරු use කරනවා. කුමාර ජයකොඩි මහත්තයාත් ඒක use කළා වාගේ තමයි අපට පෙනෙන්නේ. ඒක නිසා බොහොම පැහැදිලිව අපට පෙනෙනවා, මෙතැන සාමූහික හොරකමක් වෙලා කියලා. ඉස්සර හොරකමක් වුණාම අර හොරා, මේ හොරා කියලා නාමිකව කියනවා. දැන් මේ සිද්ධියේදී එහෙම නොවෙයි. මෙතැන තිබෙන්නේ සාමූහික හොරකමක්. මේ සිද්ධියේදී සමූහයම එකතු වෙලා එය ආරක්ෂා කරනවා. ඒක හොඳ වැඩක් විධියට ඔබතුමන්ලාට කියන්න පුළුවන්. හැබැයි, ඒක රටට හොඳ වැඩක් නොවෙයි. ඔබතුමන්ලාගේ හෘදය සාක්ෂියට අනුවත් එය හොඳ වැඩක් නොවෙයි. හෘදය සාක්ෂිය අනුව තමන්ට යම් දිනයක ඒ පිළිබඳව පසුතැවෙන්න සිදු වෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි පැහැදිලිව කියනවා, එක්කෙනෙක් හරි අද ඡන්දය නොදී - මෙතැන ඡන්දය දෙන්න ඉන්න ඕනෑ නැහැ - මඟ හැරලා හිටියොත්, හෘදය සාක්ෂියට එකඟව මම කටයුතු කළා කියලා තමන්ගේ ජීවිතයේ අවසාන මොහොතේදී හෝ කියන්න පුළුවන් වෙයි කියන එක.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු බිමල් රත්නායක ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 30ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.10]

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ் சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දිනයේදී බලශක්ති අමාත්‍ය කුමාර ජයකොඩි මැතිතුමාට විරුද්ධව විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා විසින් විශ්වාස භංග යෝජනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. මේ විශ්වාස භංග යෝජනාවට විපක්ෂයේ සෑම පක්ෂයකම මන්ත්‍රීවරුන් අත්සන් කරලා නැහැ කියන එක අපි මුලින්ම කියන්න ඕනෑ. මේ විශ්වාස භංග යෝජනාවට අත්සන් කරලා තිබෙන්නේ සමගි ජන බලවේගයේ මන්ත්‍රීවරුනුත්, රාජපක්ෂ පාර්ශ්වයේ මන්ත්‍රීවරුනුත්, ඊට අමතරව ස්වාධීන කණ්ඩායමේ මන්ත්‍රීවරයාත් විතරයි. තවත් පක්ෂ ගණනාවක මන්ත්‍රීතුමන්ලා ඉන්නවා. නමුත්, ඒගොල්ලන් මේ විශ්වාස භංග යෝජනාවට අත්සන් කරලා නැහැ කියන එකත් අපි කියන්න ඕනෑ, මේ කාරණය සැලකිල්ලට ගැනීමේදී. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමන්ලා ඉදිරිපත් කරන විශ්වාස භංග යෝජනාව ගැනත් කථා කරන්න ඕනෑ නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! මේ අවස්ථාවේදී ගරු කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු සංජීව රණසිංහ මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SANJEEWA RANASINGHA left the Chair, and THE HON. SPEAKER took the Chair.*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

විශ්වාස භංග යෝජනාව යටතේ එතුමන්ලා කියන චෝදනා තුනක් තිබෙනවා, ගරු කථානායකතුමනි.

පළමුවන චෝදනාව තමයි, "නොරොච්චෝලේ, ලක්විජය ගල් අඟුරු බලාගාරය සඳහා ප්‍රමාණවත් හා ගුණාත්මක ගල් අඟුරු ප්‍රසම්පාදනය සහතික කිරීම සඳහා බලශක්ති අමාත්‍යවරයා තම මූලික රාජකාරිය ඉටු කිරීමට අපොහොසත් වී ඇති බව සනාථ වන හෙයින්ද..." කියන එක. දෙවන චෝදනාව තමයි, "ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, 2024 නොවැම්බර් 25 දිනැති අංක 2412/08 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් බලශක්ති අමාත්‍යවරයාට පවරා ඇති ආයතනික කළමනාකරණ මට්ටමින් සිදු වන පාඩු සහ විදුලි ජනන හා බෙදා හැරීමේ පද්ධතියට සිදු වන තාක්ෂණික හානි අවම කිරීමට අවශ්‍ය පියවර ගැනීම සහ විදුලි ජනනය සඳහා දරනු ලබන පිරිවැය අඩු කිරීම සහ ජනනයේදී ඇති වන අවිනිශ්චිතතා ඉවත් කිරීම යන විෂයයන් හා කාර්යයන් ඉටු කිරීම පැහැර හැරීම සිදු කර ඇති හෙයින්ද..." කියන එක.

තුන්වන චෝදනාව තමයි, "වර්තමාන බලශක්ති අමාත්‍යවරයා, ලංකා පොහොර සමාගමේ ප්‍රසම්පාදන කළමනාකරු ලෙස සේවය කරමින් සිටියදී දූෂණ ක්‍රියාවක් සිදු කිරීම සම්බන්ධයෙන් ඔහුට එරෙහිව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් (26 වැනි අධිකාරිය වූ) අල්ලස් පනතේ 70 වගන්තිය ප්‍රකාරව "දූෂණය වරද" පිළිබඳ චෝදනා කර කොළඹ මහාධිකරණය හමුවේ විධිමත් අධිචෝදනා ගොනු කර ඇති හෙයින්ද..." කියන එක. ඒ විධියට එතුමන්ලා නිශ්චිත චෝදනා තුනක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ චෝදනා තුන සනාථ කරන්න තමයි එතුමන්ලා, එතුමන්ලාගේ පැත්තෙන් කරුණු ඉදිරිපත් කරන්නේත්, ඒවා එහෙම නොවෙයි කියන්න අපේ පැත්තෙන් අපි කරුණු ඉදිරිපත් කරන්නේත්.

ගරු කථානායකතුමනි, දැන් ගොඩක් මැති ඇමතිවරු කථා කරපු නිසා මෙම චෝදනා සම්බන්ධ ක්‍රියාවලිය පිළිබඳව මට මුලින්ම කියන්න තිබෙන්නේ මෙයයි. මේ සිදුවීමට අදාළව ගත්තොත්, ගල් අඟුරු ක්‍රියාවලිය අපට කොටස් තුනකට කඩන්න පුළුවන්. එකක් තමයි, ගල් අඟුරු මිලදී ගන්න ක්‍රියාවලියක් හදලා තිබීම. ගල් අඟුරු මිලදී ගැනීමේ ක්‍රියාවලිය දැනට හදලා තිබෙන්නේ කවුද? මේ වෙලාවේදී විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කරපු ප්‍රධාන මන්ත්‍රීතුමා සභාවේ හිටියා නම් හොඳයි. එතුමා නැත්නම් වෙනත් මන්ත්‍රීවරයෙක් හෝ කමක් නැහැ කියන්න, මෙතෙක් ගල් අඟුරු මිලදී ගන්නා ක්‍රියාවලිය හදලා තිබෙන්නේ කවුද කියන එක. ඒ ගැන කවුරුන් හෝ දන්නා කෙනෙක් ඉන්නවා නම් කියන්න. ඩී.වී. චානක මන්ත්‍රීතුමා මේ ගැන ටිකක් දන්නවා.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)

එතුමා දැන් සභාවේ නැහැ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

එතුමා සභාවේ නැද්ද? *[බාධා කිරීමක්]* ඔබතුමා වැඩක් නැහැ, සුජීව සේනසිංහ මන්ත්‍රීතුමනි. මොකද, ඔබතුමා "footnote" එකේ කෙනෙක් නේ. ඒ වාගේම ඔබතුමා බලශක්ති අමාත්‍යාංශය භාරව හිටියේත් නැහැ නේ. ඩී.වී. චානක මන්ත්‍රීතුමා නම් විදුලිබල හා බලශක්ති රාජ්‍ය ඇමති වශයෙන් කටයුතු කළා නේ.

ගරු කථානායකතුමනි, ගල් අඟුරු මිලදී ගැනීම සඳහා දැනට ලංකාව ක්‍රියාත්මක කරන ක්‍රියාවලිය හදලා තිබෙන්නේ 2023 අවුරුද්දේ. ඒ ක්‍රියාවලිය තමයි වර්තමාන ආණ්ඩුවත්, වර්තමාන අමාත්‍යාංශයත් පවත්වාගෙන යන්නේ. ඒක, පළමුවැනි එක. එහෙම නම් අපි බලන්න ඕනෑ තිබෙන්නේ මොකක්ද? ගල් අඟුරු මිලදී ගැනීමේ procedure එක මේ ආණ්ඩුවෙන් හෝ බලශක්ති ඇමතිතුමා හදපු එකක් නොවෙයි. ඒක කලින් ඉඳලා තිබුණු එකක්. ඒ ක්‍රමය අපිත් කරගෙන යනවා. ගොඩක් ආයතනවල එහෙම තමයි වෙන්නේ. ටෙන්ඩර් ක්‍රම ගත්තත්, ඒවා අපි හදපු ඒවා නොවෙයි. අවුරුදු 4ක්, 5ක්, 10ක් තිස්සේ තිබෙන දේවල් තමයි අපිත් කරගෙන යන්නේ. එහෙම නම් පළමු කාරණය විධියට අපට පිළිගන්න වෙනවා, මෙතෙක් තිබුණු ක්‍රියාවලිය තමයි අපිත් කරගෙන යන්නේ කියන එක.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
පරණ ක්‍රමය වැරදියි නම්, ඒකම ක්‍රියාත්මක කළේ ඇයි?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඔබතුමා කියන එක හරි, මන්ත්‍රීතුමනි. ඒක නිවැරදි කිරීමට ඕනෑ නම් නිවැරදි කරන්න අවශ්‍යයි. මම මේ කියන්නේ, මෙතෙක් තිබුණු ක්‍රියාවලිය තමයි මේ ආණ්ඩුවත් කරගෙන ගියේ කියන එකයි. ඒ නිසා අංක එක හැටියට තිබුණු ටෙන්ඩර් පරීක්ෂණ ක්‍රියාවලියම තමයි මේ ආණ්ඩුවත් කරගෙන යන්නේ. *[බාධා කිරීමක්]* නැහැ, අලුත් එකක් නොවෙයි.

දෙවැනි කාරණය මේකයි. මේ ගැන දන්නා අය දෙදෙනෙක් හිටියා. ඒ නිසා ඒගොල්ලන්ගෙන් තමයි මම මේ ගැන ඇහුවේ. නමුත්, එතුමන්ලා දැන් මේ සභාවේ නැති නිසා කරන්න දෙයක් නැහැ. මේ ක්‍රියාවලිය තිබුණු එකම නම්, ඒක සාපේක්ෂව සාධාරණ හා නිවැරදි එකක් නම්, ඒ කියන්නේ තිබුණු ක්‍රියාවලියේ අවුලක් නැත්නම්, ඒ වාගේම ගල් අඟුරු මිලදී ගන්න අලුත් ක්‍රියාවලියක් හදලාත් නැත්නම් මෙතැනදී වැරැද්දක් වෙන්න පුළුවන් අවස්ථාව තමයි ගරු කථානායකතුමනි, තිබුණු ක්‍රියාවලියට ඇමතිවරයා මැදිහත් වුණාද කියන කාරණය. ඔබතුමන්ලා කියන විධියට තිබුණු ක්‍රියාවලිය දූෂණ කටයුතුවලට යොදා ගැනීම සඳහා, ඒ කියන්නේ මුදල් හොරකම් කිරීම සඳහා එතුමා මේ ක්‍රියාවලිය කොතැනින් හෝ තැනකින් වෙනස් කරලා තිබෙනවාද? උදාහරණයක් විධියට මේ ක්‍රියාවලියේ ප්‍රධාන තැන් ටික ගත්තොත්, ගල් අඟුරු මිලදී ගන්න ටෙන්ඩර් ක්‍රියාවලියකට යනවා. ඒ ටෙන්ඩරය Tender Evaluation Committeesවලින්, ඊට පස්සේ High-level Procurement Committeesවලින් අනුමත වෙනවා. ඒ හැම එකකම ඉන්නේ රජයේ නිලධාරින්. BEC කියනවා, HLPC කියනවා; ඒ වාගේ එක එක නම් කියනවා. ඒ කියන්නේ, High-level Procurement Committees තිබෙනවා; Bid Evaluation Committees තිබෙනවා. ඒ ඔක්කෝගෙන්ම අනුමත වෙලා තමයි මේ ටෙන්ඩරය කැබිනට් මණ්ඩලයෙන් award කරන්නේ. මේක තමයි තිබුණු ක්‍රියාවලිය. ඊට පස්සේ සිදු වන දේ ගැනත් මම කියන්නම්.

ගරු කථානායකතුමනි, සමාගමක් තෝරා ගත්තාට පස්සේ එම සමාගම අදාළ රටෙන් ගල් අඟුරු පටවන වරායක් තිබෙනවා. ඒ වරායෙන් test එකක් කර ගන්නවා. ඊට පස්සේ ඒක pass නම් ගෙනෙන්න කියනවා. තෙල් ගෙනෙන්නේත් එහෙමයි. ගොඩක් භාණ්ඩ ගෙනෙන්නේ එහෙමයි. ගරු කථානායකතුමනි, ඔබතුමා දන්නවා, ලෝකයේ බොහෝ රටවල් ආනයන හා අපනයන මත කටයුතු කරනකොට හොඳම දේවල් පොරොන්දු වුණාට, සමහර විට ඒ හොඳම දේවල් එන්නේ නැති බව. හොඳම දේවල් එන්නේ නැති නිසා insurance තිබෙනවා; ඒ වාගේම reinsurance තිබෙනවා. කොච්චර insure කරලා ගෙනාවත් සමහර විට මහදී කන්ටේනර්වල seal කැඩුණොත් භාණ්ඩවලටත් විශාල වශයෙන් damage වෙනවා. එම නිසා මේ හැම එකකටම ඉතාම rigorous, ඉතාම විධිමත් පාලන ක්‍රමයක් හදලා තිබෙනවා, අවශ්‍ය වුණොත් shippingවලදී දඩ ගෙවන්න. ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා ඒ ගැන දන්නවා. මමත් Transport, Highways, Ports and Civil Aviation Ministry එකේ හිටපු නිසා ඒ ගැන දන්නවා. එක තැනක ඉඳලා මෙහේට ගල් අඟුරු නොවෙයි වෙන මොනවා ගෙනාවත් ඒ අවස්ථාවලදී ඉතාම බරපතළ විධියේ කථාවක් තිබෙනවා. මෙහාට ආවාට පස්සේ ආයෙත් ඒ සාම්පල් check කරනවා. ඊට පසුව ඒ සාම්පල් එක lab එකකින් check කරගන්නවා. ඕක තමයි තිබෙන ක්‍රියාවලිය. ඒවා ෆේල් වුණොත් කටයුතු කරන්න ඕනෑ විධියත් ලෝකයේ සම්මත කරලා තිබෙනවා. ලෝකයේ පළමුවැනි වරට ගල් අඟුරු ගෙනාවේ ජයකොඩි ඇමතිතුමා නොවෙයි නේ. ආනයනය කරන ගල් අඟුරු ෆේල් වුණාම, තෙල් ෆේල් වුණාම, කිරි පිටි ෆේල් වුණාම කරන්න ඕනෑ දේවල් අන්තර්ජාතිකවත්, ලංකාවේත් ඉතාම විධිමත්ව සම්මත කරලා තිබෙනවා. එතකොට මම දැන් අහන්නේ, මෙන්න මේ සම්මත කරලා තිබෙන ක්‍රියාවලිය මේ මාස 18 තුළදී බලශක්ති ඇමතිතුමා විසින් කොතැනදී ද වෙනස් කරලා තිබෙන්නේ කියලායි.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
ඒ ක්‍රියාවලියේ අඩුපාඩුවක් තිබෙනවා. ප්‍රශ්න තිබෙනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මම අහන්නේ, හදලා තිබුණු ප්‍රධාන ක්‍රියාවලියේ මේ check කරන තැන්, මේ barriers, මේ අනුමත කරගන්න තැන් සම්බන්ධව. එහෙම නේ, මන්ත්‍රීතුමනි බලන්නේ. මම ඒවා ගැන කියන්නම්. මම කියන්නේ මේකයි. මේ ක්‍රියාවලිය ගත්තාම, මේ ක්‍රියාවලියේ පියවර 100ක් යන්න තිබුණා නම්, ඒ පියවර 100 එහෙමම තිබෙනවා.

මම කියන්නම් ගරු කථානායකතුමනි, මේ procurement එක ගැන. මුලින්ම කරන්න තිබෙන්නේ මොකක්ද? මුලින්ම Lanka Coal Company (Pvt.) Limited එක විසින් ප්‍රධාන මිලදී ගැනීමේ සැලැස්මක් - Master Procurement Plan එකක් - හදනවා. ලංකාවේ බලශක්ති අවශ්‍යතාවට අනුව නොරොච්චෝලේට මාස හයටයි ගේන්න පුළුවන්. එකත් සැලකිල්ලට අරගෙන ප්‍රධාන Procurement Plan එකක් හදනවා. *[බාධා කිරීමක්]* සුජීව මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නේ නැහැ. *[බාධා කිරීමක්]* Please! ඔබතුමා දන්නේ නැහැ. දන්න කෙනෙක් නැඟිට්ටොත් මම අවස්ථාව දෙනවා. ඔබතුමා දන්නේ නැහැ. ඔබතුමා ඕනෑ දෙයක් ගැන කථා කරන කෙනෙක් නේ. වැඩක් නැහැ. *[බාධා කිරීමක්]* මට අවස්ථාව දෙන්න. Please! ඔබතුමා දන්නේ නැහැ. ඔබතුමා දන්න දේවල් තිබෙනවා. මේක දන්නේ නැහැ. *[බාධා කිරීමක්]* ඔබතුමාගෙන් ඇහුවේ නැහැ. *[බාධා කිරීමක්]* එතුමා දන්න ඒවා තිබෙනවා, දයාසිරි මන්ත්‍රීතුමනි. ඔබතුමාත් ඒවා දන්නවා. නමුත් මේක එතුමා දන්නේ නැහැ. *[බාධා කිරීමක්]* එතුමා හිටියේ "footnote" COPE එකේ නේ. *[බාධා කිරීමක්]* හරි. වෙලාව යනවා. අද සිකුරාදා නේ. *[බාධා කිරීමක්]* මම නම කියලා කිව්වා, දන්නවා කියලා හිතපු මන්ත්‍රීතුමාගේ. එතුමා වෙලාවට සභාව ඇතුළේ නැහැ. *[බාධා කිරීම්]* මට ඉඩ දෙන්න. *[බාධා කිරීම්]* හරි, හරි. පළමුවෙන්ම ඒ Master Plan එක හදන්නේ Lanka Coal Company (Pvt.) Limited එකෙන්. ජයකොඩි ඇමතිතුමාවත්, අමාත්‍යාංශයවත් නොවෙයි. ඒක වෙනස් කරලා නැහැ.

දෙවැනි එක තමයි ගරු කථානායකතුමනි,- *[බාධා කිරීමක්]* මන්ත්‍රීතුමනි, අපි වාදයක් කළා නේ. පිළිවෙළට යමු. සැහැල්ලුවෙන් යමු. අවුලක් නැහැ. *[බාධා කිරීමක්]* බය වෙන්න එපා. තිගැස්සෙන්න එපා. වතුර බොන්නේ ඇයි ඔච්චර? *[බාධා කිරීම්]* ඔබතුමා සෝදා ගන්නද? ගරු කථානායකතුමනි, මෙතුමා සෝදන්න මහවැලි ගඟත් මදි.*[බාධා කිරීම්]* සුජීව මන්ත්‍රීතුමා, ඔබතුමාව සෝදන්න මහවැලි ගඟේ වතුරත් මදි. *[බාධා කිරීම්]* අපි දෙන්නා ඒවා කරගන්නම්. ඔබතුමාට පොඩි එහෙම එකක් තිබෙනවා. හරි, හරි. අපි කථාවට යමු. නැත්නම් අපරාදේ වෙලාව නාස්ති වෙනවා. දැන් හරි.

දෙවැනි procedure එක මේකයි, ගරු කථානායකතුමනි. ඒ Master Plan එක හැදුවාට පස්සේ Bid Evaluation Committee

[ගරු බිමල් රත්නායක මහතා]

එකෙන් සහ Special High-level Procurement Committeesවලින් ඒ අදාළ කටයුතු කරනවා. ඒවා පත් කරන්නේ කැබිනට් එකෙන්. රජයේ නිලධාරීන් ඉන්නේ. මට මතක හැටියට මේකේ හිටියේ පරිසර අමාත්‍යාංශයේ ලේකම්. එතුමන්ලා තමයි ඊට පස්සේ මේ bid එකේ evaluation එක කරන්නේ. ඒකට මේ ඇමතිවරු කවුරුවත් සම්බන්ධ වෙන්නේ නැහැ. මේ procurement එක එහෙම කරගත්තාට පස්සේ මේක ගේන්න කාලසටහනක් හදනවා. ඒක හදන්නේ Lanka Coal Company (Pvt.) Limited එකෙන්. හැබැයි, ඒක අනුමත කරද්දී අමාත්‍යාංශයේ ලේකම් මැදිහත් වෙනවා. ඕනෑ නම් ඒකට ඇමතිටත් මැදිහත් වෙන්න පුළුවන්. නමුත් මේකේ නිශ්චිත කෙනා අමාත්‍යාංශයේ ලේකම්. ඊට පසුව ගරු කථානායකතුමනි, bidding period එකේ දින - දින 30කදී දෙන්නද, දින 50කදී දෙන්නද, දින 100කදී දෙන්නද, දින 15කදී දෙන්නද - පිළිබඳ තීන්දු කරන්නේ අර Special High-level Procurement Committee එකෙන්.

සමහර අයට මෙහෙම ප්‍රශ්නයක් තිබුණා. රේගුව තිබෙන්නේ වරාය ඇතුළේ නිසා රේගුව වරායට අයිතියි වාගේ හිතපු කට්ටියට මේවා පැටලෙන්න පුළුවන්. නමුත් Special High-level Procurement Committees කියන ඒවා ගත්තාට පස්සේ ඒවා ගැන හුඟක් අය දන්නේ නැහැ. ඒක ගැන තේරුම් ගන්න. ඊට පසුව මේකේ legal clearance ගන්න ඕනෑ, ගරු කථානායකතුමනි. මොකද, මේක අතිවිශාල මුදලක - මිලියන ගණන්, බිලියන ගණන් - procurement එකක් නිසා නීතිපති clearance එක ගන්න ඕනෑ. ඊට පසුව තෝරාගත් සමාගමට ටෙන්ඩරය ලබා දෙන්න ඕනෑ. ටෙන්ඩරය ලබා දෙන්නේ කැබිනට් මණ්ඩලයෙන්. කැබිනට් මණ්ඩලය මේ ඔක්කොම ටික බලලා තමයි ටෙන්ඩරය ලබා දෙන්නේ. ටෙන්ඩරය අදාළ සමාගමට දුන්නාට පස්සේ තමයි සමාගම ගේන්නේ. මම මේ ප්‍රධාන තැන් ටික කිව්වේ.

ඊට අමතරව මම කිව්වා, ඒ දුන්නාට පස්සේ සමාගම ඒ ගල් අඟුරු පටවන වරායේ සිට කොළඹ වරාය දක්වා ගෙනෙන ක්‍රියාවලිය. මෙන්න මේ ක්‍රියාවලියේ එක් තැනක් හරි වෙනස් කරලා තිබෙනවාද? මම ඒකයි ඔබතුමන්ලාගෙන් ඇහුවේ. *[බාධා කිරීම්]* වෙනස් කරලා නැහැ. නැහැ, මම අභියෝග කරනවා. ඔබතුමන්ලාගේ කථාවලදී කිව්වා නම් හොඳයි. මම ඔක්කොම කථා ඇහුවේ නැහැ. මම ප්‍රධාන කථා ඇහුවා. ඒ කථා එකකවත් මේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් ඔබතුමන්ලාගේ චෝදනාවක් නැහැ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු ඇමතිතුමනි, අප්‍රේල් මාසයේ දමන්න තිබුණු ටෙන්ඩරය ඇයි අගෝස්තු වෙනකල් කල් දැම්මේ? තිබෙන ඒවා ගෙනෙනවාය කියලා කියන්න එපා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු මන්ත්‍රීතුමා, ඕවාට ඇති වෙන්න උත්තර දීලා තිබෙනවා. ඕවාට උත්තර දුන්නා; හොඳටම technically උත්තර දුන්නා, ලේඛන එක්ක. ලේඛන සභාගත කර තිබෙනවා, ඔබතුමාට දෙන්නම් ඒවා. මේ ක්‍රියාවලිය සම්බන්ධව ඔබතුමන්ලාගේ ලොකු චෝදනාවක් නැහැ. මොකද, ඇත්ත, සැලසුම් සහගත දූෂණයක් කරනවා නම්, මොකක්ද ඉස්සර වෙලාම කරන්න ඕනෑ, ගරු කථානායකතුමනි? ඉස්සර වෙලාම කරන්න ඕනෑ දේ තමයි මේ ක්‍රියාවලිය වෙනස් කරන එක. *[බාධා කිරීම්]* හරිද? එහෙම කරනවා නම් ඉස්සරවෙලාම ක්‍රියාවලිය බොඳ කරන්න ඕනෑ, ක්‍රියාවලියේ තිබෙන කඩුලු අඩු කරන්න ඕනෑ, checkpoints අඩු කරන්න ඕනෑ. එහෙම කිසිම තර්කයක් ඔබතුමන්ලා ඉදිරිපත් කළේ නැහැ. දැන් නොවෙයි, පසුව ඔබතුමන්ලාට නඩු යන්න පුළුවන් නේ. මෙතැන වැඩක් නැහැ නේ. අද කොහොමත් මේ යෝජනාව පරදිනවා නේ. අපට මේ දිනුම පැරදුම පිළිබඳ ප්‍රශ්නයක් නොවෙයි තිබෙන්නේ. මමත් පිළිගන්නවා. ඔබතුමන්ලා මේ විශ්වාස භංගය ගෙනෙනකොට ඔබතුමන්ලා දන්නවා, ඒක පරදිනවා කියලා. මම කියන්නේ මේක පැරදුණාට අධෛර්යයට පත්වෙන්න එපා කියලා. *[බාධා කිරීම්]*

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඇත්ත කියන්න. ඔබතුමා අයින් වෙන්න කිව්වා නේද? *[බාධා කිරීම්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මම ඇත්ත කියන්නද? හරි, මම ඇත්ත කියන්නම්. *[බාධා කිරීම්]* ඉතින්, අහගන්න පොඩ්ඩක්. *[බාධා කිරීම්]* ඉතින්, අහගන්නකෝ. *[බාධා කිරීම්]* අහගන්න, අහගන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සභාව නිශ්ශබ්ද වෙන්න. *[බාධා කිරීම්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
එතුමා හොරෙක් නොවෙයි. *[බාධා කිරීම්]* හරි, හරි. වාඩිවෙන්න, වාඩිවෙන්න. දැන් මම කියන්න හැදුවේ, ඊයේ ඇත්තටම අපේ කථික කණ්ඩායම රැස්වුණා. *[බාධා කිරීම්]*

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ඔබතුමා ඇමතිතුමාට අස්වෙන්න කිව්වා නේද?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඔබතුමා දැක්කා නම්, එතැන තිබුණු unity එක, ඔබතුමන්ලා බය වෙනවා. බය වෙනවා ඔයගොල්ලන්. ඔයගොල්ලන් දුවනවා. *[බාධා කිරීම්]* හරි, හරි. දැන් මගේ වෙලාවත් යනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please! අද දිනට නියමිත කටයුතු නිම කිරීම සඳහා අවශ්‍ය වන කාලය ලබා දීමට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
එකඟයි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

No, no. ඒ කොහොමද? *[බාධා කිරීම්]* ඔයගොල්ලන් කැමැති අපේ හොරකම් ගැන වැඩිපුර කථා කරන්න නේ. මොකද, වෙලාව අඩු කරන්නේ? අපි රාත්‍රී 8.00 වෙනකල් යමු. සවස 5.30න් පසු කොහොමත් නිලධාරි මහත්වරුන්ට ලැබෙන්න ඕනෑ දීමනාවත් ලැබෙනවා නේ. *[බාධා කිරීම්]* ගරු කථානායකතුමනි, කරුණාකර මට කථා කරන්න ඉඩ දෙන්න කියන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මේක ලොකු washing machine එකක්. ඒකයි වෙලාව ඉල්ලන්නේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ඔව්, industrial washing machine එකක්. මම නිශ්චිතව කියන්නේ මේකයි,- *[බාධා කිරීම්]* ගරු මන්ත්‍රීතුමනි, බාධා නොකර ඉන්න. *[බාධා කිරීම්]* මම ඔබතුමා දෙස බලාගෙන කථා කරන්නම්. *[බාධා කිරීම්]* මම කියන්නේ මේකයි. මේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් කිසිම වරදක් ඔබතුමන්ලාට කියන්න බැරි වුණා. ඒ විතරක් නොවෙයි. මම ඔබතුමන්ලාට කියනවා නඩු දමන්න කියලා. අද පරදින බව දැනගෙන නේ මේ විශ්වාස භංග යෝජනාව ගෙනාවේ. නමුත්, උසාවියට යන්න. ඔබතුමන්ලා අධිකරණය විශ්වාස කරනවා නේ. *[බාධා කිරීම්]* අධිකරණයට යනවා නේ. යන්න. මම කියන්න කැමැතියි, මේ ක්‍රියාවලියේ කිසිම වෙනස්කමක් කරලා නැහැ. තිබිච්ච ක්‍රියාවලිය තමයි කරගෙන ගිහින් තිබෙන්නේ කියන එක. *[බාධා කිරීම්]* අහගන්න.

ඒ වාගේම තමයි, ඊයේ රූස්වීම ගැන, අපි කථා කරපු දේවල් ගැන මම පසුව වෙනම කියන්නම්. මේකෙදි ක්‍රියාවලියේ වැරැද්දක් නැහැ. ක්‍රියාවලිය ඒ විධියටම කරලා තිබෙනවා, තිබිච්ච විධියටම. ඒ අභියෝගය විවෘතයි ඔබතුමන්ලාට. ක්‍රියාවලිය වෙනස් කර තිබෙනවා නම් ඔප්පු කරන්න, ලේඛනවලින්. නිකම් කටේ සද්දයෙන් නොවෙයි. ගරු කථානායකතුමනි, එහෙම නම් මේ ක්‍රියාවලිය ඇතුළේ ඊට පස්සේ පෙන්වන්න තිබෙන්නේ මොකක්ද? ඒ ක්‍රියාවලිය නම් අනුගමනය කළේ, ඒ ක්‍රියාවලියම යද්දී ඇමති මැදිහත් වෙලා ඒක අවුල් කළා කියලා එහෙනම් පෙන්වන්න ඕනෑ. ගරු මන්ත්‍රීතුමනි, අන්න එහෙම එකක් පෙන්වන්න බලන්න. ඒ කියන්නේ, සාමාන්‍යයෙන් ක්‍රියාවලිය අවුල් කරන්න පුළුවන් ප්‍රධාන ක්‍රම කිහිපයක් තිබෙනවා. එකක් තමයි, ඔය හදිසි මිලදී ගැනීම් වාගේ දේවල්. නැත්නම්, මීට කලින් පිළිඅරගෙන තිබිච්ච පර්යේෂණාගාර වෙනුවට හදිසියේ වෙන එකක් භාවිත කරන එක. ඒවා තමයි සුලභ ක්‍රම. ඒ කියන්නේ, umpireව අල්ලා ගන්න එක. Umpireව අල්ලාගෙන, umpireව සල්ලිවලට ගන්න එක තමයි කරන්නේ. ඒ වාගේ වැඩ, ඒ ජාතියේ වැඩ ගොඩක් අය දන්නවාත් එක්ක. ඒ නිසා අපි අභියෝග කරලා ඔබතුමන්ලාට කියනවා, එහෙම නම් මේ තිබිච්ච ක්‍රියාවලිය අවුල් කරන්න ඇමතිවරයා මොනවාද කරලා තිබෙන්නේ කියා පෙන්වන්න කියලා.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

එතකොට, ටෙන්ඩර් කාලසීමාව දවස් 21කට අඩු කළේ?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු මන්ත්‍රීතුමනි, අඩු කළා හෝ වැඩි කළා, ඒවා කරන්න ඇමතිතුමාට කිසිම බලයක් නැහැ. ඔබතුමා හිටපු ජ්‍යෙෂ්ඨ ඇමති කෙනෙකුගෙන් අහන්න. ඒවා තනිකරම High-level Procurement Committee එක තීන්දු කරන්නේ. *[බාධා කිරීම්]* ඒ වාගේම, ජාතික ප්‍රසම්පාදන කමිටුවක් තිබෙනවා; Commission එකක් තිබෙනවා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

නැහැ, කැබිනට් මණ්ඩලයෙන් කළේ. *[බාධා කිරීම්]* ඒ procurement එක කැබිනට් එකට නේ දැම්මේ.*[බාධා කිරීම්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

නැහැ, නැහැ. හිතෙන හිතෙන දේවල් කියන්න එපා. Please! *[බාධා කිරීම්]* ගරු කථානායකතුමනි, මම ඒකයි කිව්වේ කිසිම ආකාරයකින් ඒ ක්‍රියාවලිය- *[බාධා කිරීම්]* නැහැ, ඔහොම නිකම් මට කෑ ගහලා වැඩක් නැහැ නේ. උසාවියට ඉදිරිපත් කරන්නකෝ. කුමාර ජයකොඩි ඇමතිවරයා මේ තිබිච්ච ක්‍රියාවලියට මෙන්න මේ ආකාරයට මැදිහත් වෙලා disturb කළා කියලා උසාවියට ඉදිරිපත් කරන්න. එක්කෝ lab එක වෙනස් කළා; නැත්නම් වෙනත් දේවල් කළා කියලා ඉදිරිපත් කරන්න. මොකද, procurement එකක කාලය තීන්දු කිරීම ගත්තොත්, National Procurement Commission එකෙන් එක එක දේවල්වලට එක එක කාලසීමා දීලා තිබෙනවා. මම දන්නේ පාරවල් සම්බන්ධ ඒවා ගැන. දින 42 තිබෙනවා; දින 21 තිබෙනවා. ඒ විධියට තිබෙනවා. සමහර විට මාස 3ත් දීලා ඇති. දෙවැනි අභියෝගය ඒක. පළමුවැනි එක, ක්‍රියාවලිය වෙනස් කරලා නැහැ. දෙවැනි එක, තිබිච්ච ක්‍රියාවලිය දූෂිත අරමුණකට හෝ වෙනත් අරමුණකට හෝ කිසිම ආකාරයකින් ඇමතිවරයා මැදිහත් වෙලා වෙනස් කරලා නැහැ. ඒක තමයි අපේ තර්කය. එහෙම කර තිබෙනවා නම් ඔබතුමන්ලා ලේඛනවලින් ඔප්පු කරන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

එහෙම නම් ඇමතිවරයාට ඉල්ලා අස් වෙන්න කිව්වේ ඇයි? *[බාධා කිරීම්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ඇත්තටම ඔබතුමන්ලා පොඩි හෝ වෙලාවක් ඔහොම හරි සතුටින් ඉන්න එක ගැන මට සතුටුයි.

ගරු කථානායකතුමනි, විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා මෙතැන ඉදිරිපත් කරන තර්කවල නිශ්චිත වශයෙන් එතුමාට කියන්න කිසිම චෝදනාවක් නැහැ. තර්කානුකූලව සහ කරුණුමය වශයෙන් කිසිම චෝදනාවක් නැහැ. මම ඒකයි කියන්නේ. හැබැයි, අපි කවුරුත් පිළිගන්නා දෙයක් තිබෙනවා. ඒ මොකක්ද? ගෙනාපු ගල් අඟුරුවලින් උත්පාදනය වන බලශක්ති ප්‍රමාණයේ අඩුවක් වෙලා තිබෙනවා. *[බාධා කිරීම්]* ඕක ගැන මම අවශ්‍ය වුණොත් කියන්නම්. අවශ්‍ය වුණොත් කියන්නම්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)

නැහැ, නැහැ. බලාගාරයත් වැරදියි; lab එකත් වැරදියි, නිලධාරීන්-*[බාධා කිරීම්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඉතින් බලාගාරය වැරදියි කියන්නේ හරි නේ, නලින් බණ්ඩාර මන්ත්‍රීතුමා නේ හදලා තිබෙන්නේ. බලාගාරය වැරදියි ඉතින්. නලින් බණ්ඩාර මන්ත්‍රීතුමා නේ හදලා තිබෙන්නේ. *[බාධා කිරීම්]* නලින් බණ්ඩාර මන්ත්‍රීතුමා, ඔයා මේ පොඩි ළමයින්ට කියා දෙන්න.

ගරු කථානායකතුමනි, ඒ නිසා අපි පිළිගන්නවා, - පිළිගන්න වෙනවා. ඒක අමුතු දෙයක් නොවෙයි - procedures මොන තරම් හරියාකාරව අනුගමනය කරලා ගෙනාවත්, මේ ඇමතිවරයා කිසිම ආකාරයකින් මේවාට මැදිහත් වුණේ නැති වුණත්, මෙතැන ගෙනැල්ලා තිබෙන ගල් අඟුරුවලින් උත්පාදනය වන බලශක්ති ප්‍රමාණය අඩුයි කියන එක. ඒක fact එකක්; කරුණක්. ඒක හරි. ඒ කියන්නේ, එහෙම අඩුවක් වෙලා තිබෙනවා. දැන් ඒ නිසා ඔබතුමන්ලා මොකක්ද කර තිබෙන්නේ? වැරැද්දක් වෙලා තිබෙනවා නේ; අඩුවක් වෙලා තිබෙනවා නේ. අඩුවක් වුණාට පස්සේ මොකක්ද බලන්නේ? සාමාන්‍යයෙන් accident එකක් වුණාම, නැත්නම් රෝහලක හදිසි මරණයක් වුණාම, නැත්නම් දරුවෙක් පාසලට දා ගන්න බැරි වුණාම - මේ වාගේ වැරදි වෙනවා - මොකක්ද බලන්නේ?

මා හැමදාම උදේට accidents දිහා බලන්නේ, 'මෙය වළක්වා ගැනීමේ වගකීමේ කොටසක් මගේත් තිබෙනවා නේද' කියලා හිත හිතා. මෙතැනදීත් වැරැද්දක් වෙලා තිබෙනවා. ඔබතුමන්ලාගේ චෝදනා අතර දෙවැනියට වාගේ තිබෙනවා, "...තාක්ෂණික හානි අවම කිරීමට අවශ්‍ය පියවර, විදුලි ජනනය සඳහා දරනු ලබන පිරිවැය අඩු කිරීම සහ ජනනයේදී ඇති වන අවිනිශ්චිතතා ඉවත් කිරීම..." යනාදි වශයෙන්. ඒ වාගේ දෙයක් සම්බන්ධව ඇමතිවරයාට යම්කිසි වගකීමක් තිබෙනවා. ඇමතිවරුන් වශයෙන් අපි අංග සම්පූර්ණව - perfectly - සමාජයක් දුවවන කට්ටියක් නොවෙයි නේ, ගරු කථානායකතුමනි. නමුත් තිබෙන යථාර්ථය ඇතුළේ, සාපේක්ෂව අපේ රටේ තිබෙන හැකියාව, පුරුදු, ශක්තීන් මත තමයි අපට අපේ වැරැදි, අඩුපාඩුකම් දිහා බලන්න වෙන්නේ. අපට දිව්‍ය ලෝකයකට සාපේක්ෂව බලන්න බැහැ. ඒ නිසා අප හැම ඇමතිවරයෙකුටම හැම දෙයකටම අදාළව යම්කිසි moral responsibility එකක් තිබෙනවා. මම ඒකයි කිව්වේ, හැප්පෙන හැම වාහනයක්ම, පරක්කු වෙන හැම කෝච්චියක්ම සම්බන්ධයෙන් moral responsibility එකක් මට තිබෙනවා; වරදකාරි හැඟීමක් මට තිබෙනවා කියලා. රෝහලක ලෙඩුන්ට strike එකක් නිසා මොනවා හරි වුණොත්, නලින්ද ජයතිස්ස සෞඛ්‍ය ඇමතිතුමාට යම්කිසි moral responsibility එකක් තිබෙනවා. ඒක දන්නා මිනිස්සු, අපි. ඒ හෘදය සාක්ෂි ප්‍රශ්නය, ඒ හෘදය සාක්ෂි වේදනාව ජයකොඩි ඇමතිතුමාටත් තිබෙනවා.

**ගරු වරුණ ලියනගේ මහතා**
(மாண்புமிகு வருண லியனகே)
(The Hon. Waruna Liyanage)
කෙහෙළියටත් තිබෙනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඔව්, කෙහෙළියටත් තිබෙන්න පුළුවන්. අන්න හරි. අන්න හොඳ උදාහරණයක්. කෙහෙළියටත් ඒක තිබෙන්න පුළුවන්. හැබැයි කෙහෙළියගේ ක්‍රියාවලිය තමයි බලන්න තිබෙන්නේ. හරියට logic එකෙන් ගෙනාවා. මම කැමැතියි ඔබතුමාගේ ඒ කාරණාවට. ඔබතුමා වැදගත් මන්ත්‍රීතුමෙක්. අපි ඔබතුමාට ගරු කරනවා; truly ගරු කරනවා. මම හරි කැමැතියි, ඒ උදාරණය ගත්තාට. දැන් ගල උඩ සටන වාගේ ගත හැකියි. කෙහෙළිය හිටපු ඇමතිතුමාගේ ප්‍රශ්නයයි, ජයකොඩි ඇමතිතුමාගේ ප්‍රශ්නයයි අපි ගනිමු. කෙහෙළිය හිටපු ඇමතිතුමා මොකක්ද කළේ? කෙහෙළිය හිටපු ඇමතිතුමා ක්‍රියාවලිය විනාශ කළා, හොරකම වෙනුවෙන්. එයාගේ අරමුණක් තිබුණා, හොරකම් කරන්න. එයා ඒ වෙනුවෙන් ක්‍රියාවලිය විනාශ කළා. ජයකොඩි ඇමතිතුමාට හොරකම් කරන්න වුවමනාවක් තිබුණේත් නැහැ; අරමුණක් තිබුණේත් නැහැ. ඒ නිසා එතුමා ක්‍රියාවලිය වෙනස් කළේ නැහැ. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඇයි, අයින් වෙන්න කිව්වේ?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
අයින් වෙන්න කිව්වාද, නැද්ද කියන එක මම අන්තිමට කියන්නම් කෝ. ඡන්දෙන් පෙනෙනවා නේ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඔබතුමායි, වසන්ත ඇමතිතුමායි දෙන්නාම කිව්වා, අයින් වෙන්න කියලා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
වසන්ත ඊයේ හිටියේත් නැහැ, අනේ. වසන්ත ඊයේ අලුත් සහල් මංගල්‍යයට ගිහිල්ලා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
වසන්ති නොවෙයි, වසන්ත.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
වසන්ති කියන්නේ කවුද? ඔබතුමාට නම් පැටලෙනවා. ගෙදර යන්න බැරි වෙයි ඔබතුමාට. *[බාධා කිරීම්]* හර්ෂ මන්ත්‍රීතුමා, මෙතුමාට නම් පැටලෙනවා. *[බාධා කිරීම්]* අර මොකක්ද, "උපුලී" කියලා සින්දුවකුත් තිබෙනවා නේද? *[බාධා කිරීම්]* ඔබතුමා virus guard එකක් දමා ගන්න. *[බාධා කිරීම්]* මම නම් නැහැ. ඔබතුමා ඉතින් විශාල පවුලක අයිතිකාරයෙක්.

ගරු කථානායකතුමනි, මම ස්තුතිවන්ත වෙනවා, අපේ ලියනගේ මන්ත්‍රීතුමාට. *[බාධා කිරීම්]* හරියටම හරි. කෙහෙළිය හිටපු ඇමතිතුමාගේ ප්‍රශ්නයේදියි, ජයකොඩි ඇමතිතුමාගේ ප්‍රශ්නයේදියි අපට හොඳින්ම පෙනෙනවා, කෙහෙළිය හිටපු ඇමතිතුමා එතුමාගේ දූෂිත අරමුණු වෙනුවෙන් ක්‍රියාවලියම වෙනස් කළා කියලා. ජයකොඩි ඇමතිතුමාට දූෂිත අරමුණක් තිබුණේ නැහැ කියන එක ඔප්පු වෙනවා. එතුමා ක්‍රියාවලියට අත තිබ්බේ නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
සභානායකතුමා, පෙර වැරැදි?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
හරි, එතැනටත් එනවා. *[බාධා කිරීමක්]* එතැනටත් එනවා. *[බාධා කිරීමක්]* හරි, හරි. දැන් වෙලාවත් ඉක්මවාගෙන යනවා. මම ඒකයි කිව්වේ, අපට සදාචාරාත්මක වගකීමක් තිබෙනවා කියලා, ගරු කථානායකතුමනි. ඒ වගකීම එතුමාටත් තිබෙනවා. නමුත් එතුමා මේ නිශ්චිත ක්‍රියාවලිය- *[බාධා කිරීමක්]* හැප්පෙන හැම බස් එකක් සම්බන්ධයෙන්ම ප්‍රවාහන ඇමතිවරයාට ඉල්ලා අස් වෙන්න පුළුවන්; මටත් ඉල්ලා අස් වෙන්න පුළුවන්. හැබැයි 225දෙනාම ප්‍රවාහන ඇමතිකමට පත් වුණත් දවස් 225න් ඒ ඔක්කෝටම ඉල්ලා අස් වෙන්න වෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
අධිචෝදනාවක් තිබුණු-

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මම ඒ ප්‍රශ්නයට එනවා. ඒ නිසා moral responsibility එකක් මිසක් ජයකොඩි ඇමතිතුමාට ඔබතුමන්ලා කියන නිශ්චිත චෝදනා එකක්වත් නැහැ. *[බාධා කිරීමක්]*

ඊට පස්සේ ගන්න තිබෙන කාරණය මේකයි, ගරු කථානායකතුමනි. දැන් ජයකොඩි ඇමතිතුමා මැදිහත් නොවුණු නිසාද මේ නොසැලකිල්ල හරි වුණේ? දැන් මේ ක්‍රියාවලියේ මොනවා හරි අවුලක් තිබෙනවා නේ. එතුමා දැන් මාස 16ක් තිස්සේ මේක කරනවා නේ. එතකොට, මේ labs ගැන හෙව්වේ නැද්ද? මේ ක්‍රියාවලිය තව මීට වඩා rigorously, in-depth බලලා, ඇතුළට බැහැලා කළේ නැද්ද? මැදිහත් වුණේ නැද්ද? නැත්නම් නොසැලකිලිමත් වුණාද? ක්‍රියාවලියට බාධා-

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
දැන් කියන්න එපා, ඔබතුමන්ලා බැස්සා කියලා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
හදිසි තීරණයක් නිසා මේ අවුල වුණාද? අපට හොඳට තේරෙනවා, එහෙම ප්‍රශ්නයක් නැහැ කියලා. ඇමතිතුමා වෙන මොකුත් කරන්නේ නැහැ, එතුමා විදුලිබල ක්ෂේත්‍රයේ, බලශක්ති අමාත්‍යාංශයේ වැඩ එක්ක තමයි ඉන්නේ. එතුමා කැබිනට් මණ්ඩලයටත් පත්‍රිකා ගොඩක් ගෙන එනවා. එහෙම තමයි එතුමා වැඩ කරගෙන ඉන්නේ. ඒ නිසා එතුමා තුළ නොසැලකිල්ලක්වත් නැහැ. නමුත් අපි දන්නවා, සුනාමි ආපු වෙලාවේ ලංකාවට එන්නේ නැතුව මාස දෙකතුන හිටපු ඇමතිවරුන් ගැන. එහෙම ඇමතිවරුත් හිටියා. ඒ අය අමාත්‍යාංශය ගැන සොයා බැලුවේ නැහැ. අපි දන්නවා, ඉස්සර සමහර ඇමතිවරුන්ගෙන් Cabinet Papersවලට අත්සන් කරවා ගන්න Cabinet Papers ගෙනියන්න සිදු වුණා වාහනවලින් රට වටේ; clubsවලට ගෙන යන්න ඕනෑ. ඒ ගැන දන්නවා, සමහර මන්ත්‍රීවරු, නුවර මන්ත්‍රීවරු. සමහර clubsවලදීයි අත්සන් කරගෙන ආවේ, Cabinet Papers. දැන් එහෙම නොවෙයි. බිලියන ගණන් ඉලක්කම්, තේරෙන්නේ නැති තැන් අරගෙන ඇවිල්ලා අපේ කාලයෙනුත් සෑහෙන ප්‍රමාණයක් අරගෙන, ජනාධිපතිතුමාත් සම්බන්ධ කරගෙන මහා වාද විවාද කර කර තමයි හැමදාම කැබිනට් මණ්ඩලයේ ඒ කටයුතු කෙරෙන්නේ. ගරු කථානායකතුමනි, නිශ්චිත කරුණු වශයෙන් ගත්තොත්, මම ඒකයි කිව්වේ ඇමතිතුමා මේ ක්‍රියාවලිය වෙනස් කරලාත් නැහැ, තිබෙන ක්‍රියාවලිය අවුල් කරන්න මැදිහත් වෙලාත් නැහැ, ඒ වාගේම මේ ගත්තු කිසිම තීරණයකට එතුමා තනියම දායක වෙලාත් නැහැ කියන එක. එතුමාගේ දායකත්වය මේකයි. කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරලා මේක අපි ඒ කොම්පැනියට දීලා තිබෙනවා.

මොකක්ද, මෙතැන වෙලා තිබෙන්නේ? මෙතැන තිබෙන දේ මේකයි. වැරැද්දක් වෙලා තිබෙනවා. ඒ වැරැද්ද තුළ අපි බලන්න ඕනෑ මොකක්ද, ගරු කථානායකතුමනි? අපි බලන්න ඕනෑ, වැරැද්ද වුණේ ක්‍රියාවලියේ වැරැද්දකින්ද, පුද්ගලයාගේ වැරැද්දකින්ද, නැතිනම් මේ දෙකම නොවෙයිද කියන එක. අපි පිළිගන්නවා, මේ ක්‍රියාවලිය ඔබතුමන්ලාගේ ආණ්ඩු කාලයේ ඉඳලා තිබුණු ක්‍රියාවලියක් බව. පුද්ගලයා වැරැද්දක් කරලාත් නැහැ. ඒත් වැරැදි වෙන්න පුළුවන්. මොකද, පෙනෙනවා නේ, ගෙනාපු ගල් අඟුරුවල බලශක්ති ප්‍රභවය මදි කියලා. එහෙම වෙන්න පුළුවන්. ඔබතුමන්ලාත් දන්නවා,- *[බාධා කිරීමක්]* එහෙම වෙන්න පුළුවන්. *[බාධා කිරීමක්]* ඕක පැත්තකින් තියන්න. අපි කිරි පිටි ගෙනෙනවා. කවුරුවත් දන්නේ නැතිව මඟදී box එකට පොඩ්ඩක් හානි වුණාම ඒකෙන් ඇතුළට හුළං ගිහිල්ලා කිරි පිටි සවුත්තු වෙනවා.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
පළමුවැනි එකෙන්ම නවත්වනවා. ආයෙත් ගෙන්වන්නේ නැහැ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඒක තමයි. ගරු කථානායකතුමනි, ඕනෑම ආනයන අපනයන ක්‍රියාවලියකදී හිතාමතා නොකළත්, දූෂණය මත නොවුණත්, අඩුපාඩුකම් සිද්ධ වෙනවා. ලෝකයේ ඕනෑම භාණ්ඩයක් ආනයනය කරද්දී අන්න ඒ අඩුපාඩුකම් වුණාට පස්සේ මොකක්ද කරන්නේ කියන එක සම්බන්ධයෙන් ක්‍රමවේද හදලා තිබෙනවා.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
අපි මුල ඉඳන්ම ඒක කිව්වා. නමුත් ඔබතුමන්ලා ඒක පිළිගත්තේ නැහැ නේ. එය අඩුපාඩුවක් හැටියට ජනාධිපතිතුමා පිළිගත්තේත් නැහැ; ඔබතුමා පිළිගත්තේත් නැහැ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
නැහැ, සුජීව සේනසිංහ මන්ත්‍රීතුමනි, බලශක්ති ප්‍රභවය මදි කියන එක අපි ඔක්කෝම පිළිගත්තා නේ. ඒක පිළිගන්නේ නැතිව ඉන්නේ කොහොමද? ඒ වචනය මොකක්ද කියන එක නොවෙයි බලන්න ඕනෑ. අපි නිශ්චිත වශයෙන්,- *[බාධා කිරීමක්]* ඒක කරුණක් නේ. ඒක විද්‍යාත්මක කරුණක් නේ. *[බාධා කිරීමක්]* මම කියාගෙන ආවේ මේකයි. වැරැද්දක් වෙලා තිබෙනවා. වැරැද්ද වෙන්න හේතුව දැන් හොයන්න ඕනෑ. ඔබතුමන්ලා දේශපාලනඥයන් නිසා ඔබතුමන්ලා හිතනවා, සාමාන්‍යයෙන් ඇමතිවරු හොරකම් කරනවා, ඒ නිසා මෙතුමාත් හොරකම් කරපු හින්දා මේ වැරැද්ද වුණා කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Minister, you have only two more minutes.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, එතුමන්ලා විනාඩි 10ක් විතර ගත්තා. එම නිසා ඔබතුමා මට තව පොඩි වෙලාවක් දෙන්න.

මම කියාගෙන ආපු දේ මේකයි. වැරැද්දක් වූ පමණින් ඒක හැම වෙලාවේම ක්‍රියාවලියේ වැරැද්දක් වෙන්නේත් නැහැ, පුද්ගලයාගේ වැරැද්දක් වෙන්නේත් නැහැ. වෙනත් බාහිර හේතු මතත් වැරැද්දක් වෙන්න පුළුවන්. ආනයන අපනයන ක්‍රියාවලියට සම්බන්ධ ඕනෑම කෙනෙකුගෙන් ඒ ගැන අහලා බලන්න. එම නිසා තමයි insurance companies තිබෙන්නේ, එම නිසා තමයි arbitration ගොඩක් හදලා තිබෙන්නේ. Shipping සම්බන්ධව "අ" යන්න "ආ" යන්න දන්නා අය දන්නවා, ඒ නිසා තමයි ඒවා හදලා තිබෙන්නේ කියලා. මෙතැනදී වැරැද්දක් වෙලා තිබෙනවා. දේශපාලනඥයන් වශයෙන් ඔබතුමන්ලාට මේ වෙලාවේ කථා කරන්න හරියට දෙයකුත් නැති නිසා ඔබතුමන්ලා මේ වාගේ මතයක් හදනවා. අද විපක්ෂ නායකතුමා කථා කළේත් නැහැ. එතුමා එන්නේත් නැද්ද මන්දා. එතුමා අද AIවලින්වත් නැද්ද, මෙතැන? ගරු කථානායකතුමනි, සමහර විද්‍යාඥයෝ හිතන්න පුළුවන්, මේවා labsවල ප්‍රශ්න කියලා. ඇත්තටම මේකේ ගන්න තිබෙන පැත්ත වෙන්න පුළුවන්, accredited labsවලින් මේවා pass කළේ ඇයි කියන එක. ඕනෑ නම් කෙනෙකුට ඒක ඒ පැත්තෙන් බලන්නත් පුළුවන්.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Not accredited; they are not accredited.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මම කියන්නේ, accredited ආයතනවලින් නේ දුන්නේ. ඒගොල්ලන්ට යම්කිසි ප්‍රමාණයක් නැති එක වෙනම දෙයක්. *[බාධා කිරීමක්]* නැහැ, මා කියන්නේ ඒවා අපි accredit කරපු ඒවා නොවෙයි කියන එක. *[බාධා කිරීම්]* නැහැ, නැහැ, මම කියන්න හදන්නේ ඒක නොවෙයි. *[බාධා කිරීම්]* ගරු කථානායකතුමනි, මට කියන්න ඕනෑ දේ මේකයි. ඒතැන වැරැද්දක් වෙලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලා හදනවා, වැරැද්ද වූ පළියට ඒක දැන් ජයකොඩි ඇමතිතුමාගේ ඇඟේ ගහන්න. *[බාධා කිරීම්]* ඒක තමයි ඔබතුමන්ලා කරන්න හදන්නේ. ගරු මන්ත්‍රීතුමනි, ඕනෑ නම් ඔබතුමාට පුළුවන්, බස් එක හැප්පුනේ මගේ වැරැද්දෙන් කියලා කියන්න. *[බාධා කිරීම්]* එම නිසා තමයි මම ඔබතුමන්ලාට කිව්වේ, එතුමාගේ මැදිහත් වීමෙන් මේ වැරැද්ද වුණා කියලා කියන්න කිසිම තර්කයක් නැහැ කියලා. එකම දේ මේකයි. වැරැද්දක් වෙලා තිබෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඒකටත් අපව අල්ලනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඒක අමාත්‍යාංශය භාර ඇමතිතුමා කරපු දෙයකුත් නොවෙයි. හැබැයි, ඔබතුමන්ලා හිතනවා, ඒක දේශපාලන වශයෙන් ඇමතිට ආරූඪ කරන්න. එම නිසා මම ඔබතුමන්ලාට කියන්න කැමැතියි,- *[බාධා කිරීමක්]* අපි දැන් අවසාන භාගයට එමු, ගරු කථානායකතුමනි.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
දැන් two minutes ඉවරයි.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
අවසන් වනකල් යනවා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
පෙට්‍රල් ප්‍රශ්නයක් නේ,- *[බාධා කිරීමක්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ඊළඟට බලන්න තිබෙන්නේ මේ ක්‍රියාවලිය තුළ ජයකොඩි ඇමතිවරයා යම්කිසි දූෂිත වුවමනාවක් මත එතුමාගේ හිතේ සැලසුමක් ඇතිව ක්‍රියාවලිය සිදු කළාද කියන එකයි. නලින්ලා ආශ්‍රය කරන්න හොඳයි. නමුත්, බලාගෙනයි. අර පන්තියේ විභාගවලදී පොඩි පොඩි උදව් කර ගන්නේ. ඔබතුමා ඒවාත් කියයිද දන්නේ නැහැ, ඉස්සරහට. මම කියන්න හදන්නේ මේකයි, ගරු කථානායකතුමනි. අපට මේ මුළු ක්‍රියාවලිය දිහා බැලුවාම පෙනෙනවාද, ජයකොඩි ඇමතිවරයා යම්කිසි දූෂිත වුවමනාවකින් කරපු මොනවා හරි සැලසුමක් තිබෙනවා කියලා? ගරු කථානායකතුමනි, පාස්කු ප්‍රහාරය ගැන සාකච්ඡා කරද්දී අපට පෙනුණා, ඒ ප්‍රහාරකයන්, ඒකට සම්බන්ධ mastermind ඒ අරමුණ වෙනුවෙන් දූෂිත විධියට සෑහෙන වැඩ ප්‍රමාණයක් කරලා තිබෙන බව. යම්කිසි අපරාධයක් කරන්න ඕනෑ වුණාම, යම්කිසි හොරකමක් කරන්න ඕනෑ වුණාම ඊට සම්බන්ධව කරන මොනවා හෝ දෙයක් අහු වෙනවා. මෙතැනට අදාළව ගත්තොත්, ඔබතුමන්ලා third umpire කෙනෙක් ගැන කිව්වා. මේකේ third umpire කෙනෙක් විතරක් නොවෙයි, fourth umpire කෙනෙකුත් ඉන්නවා.

මේක නේ තර්කය. දැන් සැපයුම්කරුවාගේ lab එකෙන් කියනවා - මොකක් හරි ඒ කොම්පැනියකින් කියනවා - මේ ගල් අඟුරු quality කියලා. අපි තමයි ඒවා මිලදී ගන්නේ. අපි කියනවා, ඒවා අපේ lab එකෙන් ෆේල් වුණා කියලා. ඊට පස්සේ සැපයුම්කරු කියනවා, ඔයගොල්ලන්ගේ lab එක අපට පිළිගන්න බැහැ, ඒ නිසා අපි දෙගොල්ලෝම පිළිගන්න lab එකකට යමු කියලා. *[බාධා කිරීමක්]* ගරු කථානායකතුමනි, මෙතුමාත් හිටියා සජිත් ප්‍රේමදාස මහත්මයාට AI කියන්න. ඒ ඇයි? *[බාධා කිරීමක්]* ගරු කථානායකතුමනි, අපට කියන්න තිබෙන්නේ මේකයි. මොකක්ද අපි කළේ? මගේ තර්කයට බාධා කරන්න එපා. එතැන වුණේ, ඒ පරීක්ෂණාගාරය ප්‍රතික්ෂේප වුණාට පස්සේ, ඒගොල්ලෝ කියපු, - *[බාධා කිරීම්]* එහෙම කරන්න පුළුවන්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
එහෙම කරන්න බැහැ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
එහෙම කරන්න පුළුවන්.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, අපි විවාදය අවසන් වනතුරු වෙලාව ලබා ගනිමු.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විවාදය අවසන් කිරීම සඳහා කාලය ලබා දෙනවා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, ඔබතුමා මූලාසනයේ ඉඳගෙන විනාඩි 2යි තව තිබෙන්නේ කියලා කිව්වාට පස්සේ, නැවත කාලය දීර්ඝ කරන්නේ කොහොමද කියලා මම දන්නේ නැහැ. මොකද, ඔබතුමා කිව්වා, "You have two more minutes" කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතුමා තව වෙලාව ඉල්ලුවා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඒක වැරදියි නේ, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
වෙලාව ඉල්ලුවා. ඒකට මම අවසර දීලා තිබෙන්නේ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඒක වැරදියි. ඔබතුමා කිව්වා, "Two minutes තිබෙන්නේ. කරුණාකරලා නවත්වන්න" කියලා. ඔබතුමා තමයි ඒක තීරණය කරන්නේ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, මේක වැදගත් විවාදයක්. ඒ නිසා මේ කථාව අවසන් වනතුරු අපි යමු. ඔබතුමා ඒකට සභාවේ එකඟතාව විමසන්න. සභාව එකඟ නම් අපට පුළුවන්, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විවාදය අවසන් වනතෙක් සභාව පවත්වාගෙන යෑමට එකඟද? *[බාධා කිරීම්]*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
අපි එකඟයි. *[බාධා කිරීම්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඔයගොල්ලෝ සද්දේ වහගෙන ඉන්න. මම විනාඩි 5න් ඉවර කරන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විවාදය අවසන් වනතුරු කාලය ලබා ගැනීමට සභාව එකඟද?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
එකඟයි.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
නැහැ, අපි එකඟ නැහැ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මේක ජාතික වශයෙන් වැදගත් කාරණයක්. ඒ නිසා ඔබතුමන්ලා කරුණාකරලා බාධා කරන්න එපා, මට ඉවර කරන්න බැරි වෙනවා.

අපි හිතමු, යම්කිසි ආකාරයකට සැකයක් හිතෙන දෙයක් එතුමා කරලා තිබෙනවා කියලා. හැබැයි, එහෙම නොවන බව ඔප්පු වෙන තැනක් තිබෙනවා. මේ lab එකෙන් ෆේල් වුණාට පස්සේ දෙගොල්ලෝම එකතුවෙලා තමයි ඉන්දුනීසියාවේ lab එකක් යෝජනා කරලා තිබුණේ. ඒ lab එකට අමතරව, - ඔය වාර්තාවේත් තිබෙනවා - අපි ඕස්ට්‍රේලියාවේ තිබෙන lab එකකටත් යැව්වා. මම ඒකයි කිව්වේ, fourth umpire කෙනෙකුත් ඉන්නවා කියලා. අපට ඕනෑකම තිබුණා, මේ ප්‍රශ්නය මතු වුණාට පස්සේ, - *[බාධා කිරීමක්]*

ඒ සමාගම තමයි කියන්නේ ඉන්දුනීසියාවේ තිබෙන ඒගොල්ලන්ගේ සමාගමකට දෙන්න කියලා. ඒක හරි. හරි කියන්නේ ඇයි? ඒගොල්ලෝ තමයි විකුණන්නේ. අපි තමයි කියන්නේ මේවා හොඳ නැහැ කියලා. එතකොට අපට අනිවාර්යයෙන්ම යන්න වෙනවා, දෙගොල්ලන්ම එකඟවෙන තැනකට. ඒක තමයි එතැන තිබෙන logic එක. අපට කියන්න බැහැ, අපි කියන එක පිළිගන්න කියලා. ඒ නිසා දෙගොල්ලන්ම පිළිගන්න lab එකක් යෝජනා කළා. හැබැයි, අපි මොකක්ද කළේ? ඊට අමතරව ඕස්ට්‍රේලියාවේ තිබෙන පිළිගත් lab එකකටත් අපි මේවා යැව්වා. ජයකොඩි ඇමතිතුමාට යම්කිසි දූෂණයක යෙදෙන්න ඕනෑකම තිබුණා නම්, අපි අමතර වශයෙන් අදූෂිතභාවය ඔප්පු කරන ක්‍රියාවලියකට යන්නේ නැහැ. සාමාන්‍යයෙන් අපරාධයක් කරනකොට අපරාධකරුගේ චෛතසිකය හොයාගන්න පුළුවන්. මොකද, ඒ පුද්ගලයා එක එක දේවල් කරනවා; එක එක තැන්වල දේවල් හංගනවා; එක එක ගේම් ගහනවා; එක එක calls දෙනවා. ඒවා අනුව තමයි crimes හොයන්නේ. මෙතැන ඒ කාරණය තිබෙනවා.

[ගරු බිමල් රත්නායක මහතා]

දෙවැනි එක මොකක්ද? දැන් සමාගමක් ගැන කියනවා නේ. ඒ සමාගම හම්බවෙන්න ගියාලු නේ. අපි කියන මේ සමාගම ඇතුළුව සමාගම් ඔක්කෝම ගල් අඟුරු සම්පාදනය කිරීම සඳහා ලියාපදිංචි වීමට පෙබරවාරි මාසයේදී ඉල්ලීම් කරලා තිබුණා. තමන්ගේ හිතවත් සමාගමක් නම් මොකක්ද කරන්න ඕනෑ? ඉක්මනින්ම ලියාපදිංචි කරන්න ඕනෑ. ඇයි දැන් කිව්වා නේ, රුසියාවෙත් ගියා කියලා හම්බ වෙන්න. එහෙම නම් ජයකොඩි ඇමතිතුමාට කරන්න තිබුණේ මොකක්ද? ඒ සමාගම කලින්ම ලියාපදිංචි කරන්නයි තිබුණේ. නමුත් එහෙම වුණේ නැහැ. ටෙන්ඩරයට සම්බන්ධ වෙච්ච ඔය හැම සමාගමක්ම ලියාපදිංචි වුණේ අගෝස්තු මාසයේ 18, 19 දවස්වල. මම ඒකයි කිව්වේ.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
නැහැ, නැහැ. ඊට කලින්.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
නැහැ, ඔබතුමා බලන්න.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
බැලුවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඔබතුමා හරියට බලලා නැහැ. හරියට බලන්න. *[බාධා කිරීම්]* එහෙම ප්‍රශ්නයක් නැහැ. මම මේ කරුණු දෙක ගත්තේ, ගරු කථානායකතුමනි, මේ කාරණය පැහැදිලි කරන්නයි. යම්කිසි දූෂිත අරමුණක් තිබුණා නම්, ඒ දූෂිත අරමුණට අනුව යම්කිසි කටයුත්තක් කරලා තිබෙන්න ඕනෑ. එතුමා කර තිබෙන්නේ දූෂිතභාවයට විරුද්ධව කටයුතු කිරීම. දූෂිත මොනවා හරි දෙයක් තිබෙනවා නම් ඒක වළක්වන්න තමයි කටයුතු කරලා තිබෙන්නේ.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අර්ච්චුනා මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Hon. Speaker, මට ගෙදර යන්න ඕනෑ. කරුණාකර කථාව නවත්වන්න කියන්නකෝ. ස්ථාවර නියෝග 92 (2), -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක point of Order එකක් නොවෙයි, ගරු මන්ත්‍රීතුමා. *[බාධා කිරීම්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
කොහොමත් ඊළඟ සැරේ ගෙදර යවයි. *[බාධා කිරීම්]* බාධා කළොත් නම් අපි යෝජනාවක් ගේනවා සභාවෙන් එළියට දමන්න කියලා. *[බාධා කිරීම්]* ඒ නිසා බාධා කරන්න නම් ඉඩ දෙන්න එපා. ඕනෑ point of Order එකක් ගේන්න. බාධා කළොත් නම් එළියට දමනවා. ගරු කථානායකතුමනි, මම කථාව අවසාන කරගෙන යන්නේ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඔබතුමා කොහොමද එහෙම එළියට දමන්නේ?*[බාධා කිරීම්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
හරි, හරි. මේ ජයකොඩි ඇමතිතුමාගේ, -

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා. *[බාධා කිරීම්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මේ විවාදය කරන්න ඔබතුමන්ලාට ඕනෑ නැහැ නේ. ගරු කථානායකතුමනි, මෙතුමන්ලාට ඕනෑකම තිබෙන්නේ, වෙන වෙන points of Order ඇදගෙන දාලන්න. කාටත් තේරෙනවා අපි මෙතැන වැඩ කරගෙන යන විධිය.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ වෙලාව වෙන් කරන්නේ 60:40 වශයෙන්. එතකොට අපි දැන් එහෙම එකඟතාවකට ඇවිල්ලා, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කාලය දීර්ඝ කිරීමට සභාවේ අවසරය ලබා දීලා තිබෙනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
දැන් අනුමත කරගෙන තිබෙන්නේ වැඩිපුරත් එක්ක. බාධා නොකර ඉන්න. කථාව අවසන් කරන්න දෙන්නේ නැහැ නේ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මේ පළමු වතාව නොවෙයි. හැමදාම 5.30න් පස්සෙ තමයි කථා කරන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බාධා නොකර ඉන්න. එතකොට වැඩේ ඉවර කරයි.*[බාධා කිරීම්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
අපි කියන්නේ මේකයි. විශ්වාස භංග යෝජනාවක් ගෙනැල්ලා ඒක තර්ක නැතුව පරදින්න යනකොට, දැන් අපේ කථාවට බාධා කරනවා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
පැය භාගයකට වැඩියෙන් යනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
පැය භාගයකට වැඩියෙන් යන්නේ ඔයගොල්ලන්ගේ බාධා කිරීම් නිසා. *[බාධා කිරීම්]*

මම අවසාන වශයෙන් කියන්න කැමතියි, මේ කාරණයත්. ගරු කථානායකතුමනි, මෙතැන තිබෙන ප්‍රශ්නය මොකක්ද? මෙතැන තිබෙන ප්‍රශ්නය තමයි *[බාධා කිරීම්]* විවාදයක් වැදගත් විධියට ඉවර කරන්න දෙන්න. *[බාධා කිරීම්]* විවාදය අවසන් කරන්න දෙන්න, හරියට.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සභාවේ කාලය දීර්ඝ කර තිබෙන නිසා ගරු මන්ත්‍රීතුමන්ලා කරුණාකර වාඩි වෙන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, කැබිනට් ඇමතිවරයෙකුට විරුද්ධව එන විශ්වාස භංග යෝජනාවක් කියන්නේ මුළු ආණ්ඩුවටම එන විශ්වාස භංග යෝජනාවක්. *[බාධා කිරීම්]* ඔබතුමන්ලා හැම කෙනාමත් වැඩිපුර වෙලාව අරගෙන තිබෙනවා. *[බාධා කිරීම්]* බලන්න. ඔව්, ඒ නිසා තමයි මේක දික් වුණේ. මට විනාඩි 30ක් කොහොමත් තිබුණේ නැහැ. *[බාධා කිරීම්]* විනාඩි 30ක් තිබුණේ නැහැ, 5.30 වෙනකොට.*[බාධා කිරීම්]* ඔක්කොගෙම, ඔක්කොගෙම.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, පුරුද්දක් විධියට සභානායකතුමා හැමදාම මේ පාර්ලිමේන්තුවේ කථා කරන්න පටන් ගන්නේ 5.30 පැන්නාට පසුව. දෙනවා නම් අපි ඔක්කොටම දෙන්න, ගරු කථානායකතුමනි, එක සමාන වෙලාවක්. එතුමාට වෙනම පැය භාගයක් දෙන්න බැහැ. කොහොමද එහෙම කරන්නේ?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා, කථාව අවසන් කරන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
දැන් කථාවට ඇහුම්කන් දෙන්න ඕනෑ නැද්ද? *[බාධා කිරීම්]* ගරු කථානායකතුමනි, මේගොල්ලන් විවාදයක් ගෙනැල්ලා, විශ්වාස භංග යෝජනාවක් ගෙනැල්ලා දැන් අපි කථා කරනවාට විරුද්ධව කථා කරනවා. මොකක්ද ඔබතුමන්ලා කරන්නේ? *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සියලුදෙනාම වාඩිවෙන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මේ විශ්වාස භංගයේදී සහමුලින්ම අපි මොකක්ද රකින්නේ, ගරු කථානායකතුමනි. මේ විශ්වාස භංගයේදී මොකක්ද අපි රකින්නේ? අපි රකින්නේ මෙන්න මේ ප්‍රතිපත්තිය, ගරු කථානායකතුමනි. ජාතික ජන බලවේගයේ ආණ්ඩුවක් විධියටත්, ඒ වාගේම ජනතා විමුක්ති පෙරමුණ විධියටත්, පුද්ගලයන් විධියටත් අපි අවුරුදු ගණනක් තිස්සේ, දශක ගණනාවක් තිස්සේ රැකගෙන ආපු ප්‍රතිපත්තියක් තිබෙනවා. අපි ඒ ප්‍රතිපත්තිය පුද්ගලයෙකු වෙනුවෙන්වත්, කණ්ඩායමක් වෙනුවෙන්වත් කවදාවත් පාවා දෙන පක්ෂයක් නොවෙයි. කවදාවත් එහෙම පාවා දීලාත් නැහැ. ඒ නිසා තමයි අපට කවදාවත් විපක්ෂයකින් හරි, මාධ්‍යවලින් හරි කියන්න කලින් අපේ පක්ෂය තුළ විවිධ අඩුපාඩුකම් තිබුණු, ප්‍රසිද්ධයි කියලා හිතාගෙන හිටපු සමහර පුද්ගලයන් කනෙන් අල්ලලා එළියට දමලා තිබෙන්නේ. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඒ, ආණ්ඩුවට එන්න කලින්.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ආණ්ඩුවට එන්න කලිනුත් එහෙමයි. ආණ්ඩුවට ආවාට පස්සෙත් එහෙමයි.

[ගරු බිමල් රත්නායක මහතා]

අපේ පක්ෂයේ තිබෙන ජන වරමේ ලොකු කොටසක් තමයි අදූෂිතභාවය. අපි රකින්නේ ඒ ප්‍රතිපත්තිය; අපි රකින්නේ ඒ ප්‍රතිපත්තිය. ඒකෙදී අපට ජයකොඩි ඇමතිතුමා ද, වෙන ඇමති කෙනෙකු ද කියලා ප්‍රශ්නයක් නැහැ. අඩුපාඩුවක් තිබෙනවා නම් මේගොල්ලන් විශ්වාස භංග යෝජනාවක් ගෙනෙනකල් ඉන්නේ නැහැ, අපි අයින් කරනවා. අපි දැනුත් සමහර මට්ටමෙන් අපේ ප්‍රාදේශීය සභාවල එක්කෙනෙකු දෙදෙනෙකු අයින් කර තිබෙනවා. මම ඔබතුමාට මේ කාරණයත් කියන්න කැමැතියි. සම්පූර්ණයෙන්ම එතුමාගේ ක්‍රියාවලියත්, මුළු ටෙන්ඩර් ක්‍රියාවලියත් කරුණු වශයෙන් බලලා ඒ ක්‍රියාවලියේ කිසිදු අඩුවක්, දූෂණයක් දකින්නේ නැති නිසා තමයි අපි අද විශ්වාස භංග යෝජනාවට විරුද්ධව ඡන්දය පාවිච්චි කරන්නේ. නමුත් අපි පිළිගන්නවා, මේ කාරණය හරහා ජනතාව තුළ යම් කිසි සංවාදයක් මතුවෙලා තිබෙන බව. ඇත්තටම මෙහෙම ගැටලුවක් ඇති වෙලා තිබෙනවාද කියලා, - *[බාධා කිරීම්]* ජයකොඩි ඇමතිතුමා මීට කලින් නිලධාරියෙකු වශයෙන් කටයුතු කරද්දී සිදු වූ වැරැද්දක්, අඩුපාඩුවක් පිළිබඳව දැනට උසාවියේ නඩුවක් තිබෙනවා. එය එතුමා ලංකා පොහොර සමාගමේ ප්‍රසම්පාදන කළමනාකරු ලෙස සිටියදී සිදු වෙච්ච දෙයක්. *[බාධා කිරීම්]* එතුමා ඇමතිවරයා වශයෙන් සිටියදී සිදු වූ දෙයක් නොවෙයි. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඇති, ඇති.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඔච්චර desperate වෙන්න එපා. හොඳද?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඔබතුමා තමයි desperate.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඔයගොල්ලන් හිතනවා, අපේ ආණ්ඩුවට හොරකමක් දාලා ලකුණු ගන්න. *[බාධා කිරීම්]* කොහොමද කරන්නේ? ඔතැන ඉන්න තුන්දෙනාම ෆුට්නෝට්. - *[බාධා කිරීම්]* අඩු ගානේ එක වැදගත් මිනිහෙක් දාලා මේ යෝජනාව ගෙනෙන්න පුළුවන්කම තිබුණා. මම ඒ පැත්තට යන්නේ නැහැ. නමුත් මම කියන්න කැමැතියි, මේ විශ්වාස භංග යෝජනාවෙන් ඔබතුමන්ලා පරදිනවා කියන එක. අපි ඔබතුමන්ලාට කියනවා, ඔබතුමන්ලා නඩු දමන්න.

ගරු කථානායකතුමනි, ජනාධිපතිතුමා එක්ක අපි කථා කළා. *[බාධා කිරීම්]* මේක අහගන්න, අහගන්න. වාඩි වෙලා අහගන්න. *[බාධා කිරීම්]* ඒ නිසා අපි කියන්න කැමැතියි, අද මේ විශ්වාස භංග යෝජනාවෙන් පස්සේ ගරු ජනාධිපතිතුමා විසින් විශේෂ කොමිෂන් සභාවක් පත් කරන බව. අපි ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවක් පත් කරනවා. අපි ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවක් පත් කරනවා. ඒ විශේෂ ජනාධිපති කොමිෂන් සභාවේ විශේෂත්වය තමයි, - *[බාධා කිරීම්]* ඔයගොල්ලන් කැමැති වෙන්න එපැයි. විශේෂ ජනාධිපති කොමිෂන් සභාවක් පත් කරනවා. ගරු කථානායකතුමනි, ඒකට පත් වෙන්නේ දැනට ඉන්න ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරු. විශ්‍රාම ගිය අය නොවෙයි. අපි ඔබතුමාට මෙහෙම කියනවා. මම හිතන විධියට, 2009 ඉඳලා නැව් 450ක විතර ගල් අඟුරු ගෙනැවිත් තිබෙනවා. නැව් 465ක් ගෙනැවිත් තිබෙනවා. ඒ නැව් 465න් 452ක් ගෙනැවිත් තිබෙන්නේ ඔයගොල්ලන්. අපේ කාලයේ ගෙනැවිත් තිබෙන්නේ 13යි. අපි මේ ඔක්කොම බලමු. ඔක්කොම බලලා, වැරදිකරු වුණොත් ඔයගොල්ලන් හිරේ යන්න ලෑස්තිද? *[බාධා කිරීම්]* වැරදිකරු වුණොත් ඔයගොල්ලන් හිරේ යන්න ලෑස්තිද? විශේෂ ජනාධිපති කොමිෂන් සභාවක් පත් කරනවා. *[බාධා කිරීම්]* ඒ පත් වෙන ජනාධිපති කොමිෂන් සභාව දැනට සිටින ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරුන්ගෙන් සමන්විත කොමිෂන් සභාවක්. 2009 ඉඳන් සම්පූර්ණ ගල් අඟුරු ක්‍රියාවලිය පරීක්ෂා කරනවා. පරීක්ෂා කරලා, ජයකොඩි ඇමතිතුමා වැරදිකරු වුණොත් එතුමා හිරේ යයි. එහෙම නොවී ඔබතුමන්ලා වැරදිකරුවන් වුණොත් ඔබතුමන්ලා හිරේ යයි.

ඒ නිසා අන්න ඒ සඳහා අපි කටයුතු කරමු. *[බාධා කිරීම්]* ගරු කථානායකතුමනි, ආණ්ඩුවක් වශයෙන් අපි ජනතාවට කියන දේ තමයි, ජන වරමට අනුව ඔබ අප කෙරෙහි තබා තිබෙන විශ්වාසය එක වචනයකින්, එක දශමයකින් පලුදු කරන්නේ නැති බව. *[බාධා කිරීම්]* අපි ජන වරම රකිනවා. *[බාධා කිරීම්]* ඒ ජන වරම රැකීමේ උත්සාහයක් තමයි අපට තිබෙන්නේ. අපේ ඇමතිවරයෙකුට විරුද්ධව අසත්‍ය චෝදනා ඉදිරිපත් වුණාම අපි ඒකට විරුද්ධව කටයුතු කරනවා. හැබැයි, තවදුරටත් ඒ පිළිබඳව පවතින සැකය දුරු කරන්න ඕනෑ නිසා තමයි අපි විශේෂ ජනාධිපති කොමිෂන් සභාවක් ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරයෙකු මඟින් පත් කරන්නේ. අන්න ඒ කොමිෂන් සභාවට ඔබතුමන්ලා ගිහිල්ලා තොරතුරු ලබා දෙයි කියා අපි බලාපොරොත්තු වනවා.

බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
න්‍යාය පත්‍රයේ විෂය අංක 83, බලශක්ති අමාත්‍ය ගරු කුමාර ජයකොඩි මහතාට එරෙහිව ගෙන එන ලද විශ්වාස භංග යෝජනාවට සභාව එකඟද?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
I call for a Division, Sir.

***බෙදුම් සීනුව නාද වී අවසන් වුණාට පසු -***
*பிரிவுமணி ஒலித்து ஓய்ந்த பின் -*
*At the conclusion of the Division Bell -*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් ඡන්දය ප්‍රකාශ කිරීමේ අවස්ථාව.

න්‍යාය පත්‍රයේ විෂය අංක 83, බලශක්ති අමාත්‍ය ගරු කුමාර ජයකොඩි මහතාට එරෙහි විශ්වාස භංග යෝජනාව සම්මත කිරීමට පක්ෂ මන්ත්‍රීවරුන් කොළ පැහැති බොත්තමත්, විරුද්ධ මන්ත්‍රීවරුන් රතු පැහැති බොත්තමත්, ඡන්දය දීමෙන් වැළකී සිටින මන්ත්‍රීවරුන් කහ පැහැති බොත්තමත් භාවිත කර ඡන්දය ප්‍රකාශ කළ හැකියි.

ගරු මන්ත්‍රීවරුනි, දැන් ඡන්දය දීම ආරම්භ කරන්න.

***මේ අවස්ථාවේදී ඡන්දය දීම ආරම්භ කෙරිණි.***
*(இச்சந்தர்ப்பத்தில் வாக்கெடுப்பு ஆரம்பமானது.)*
*(At this stage, the Voting commenced.)*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීවරුනි, ඔබගේ ඡන්දය ඩිජිටල් පුවරුවේ නිවැරදිව සටහන් වී ඇත්දැයි බලන්න.

මගේ දකුණු අත පැත්තේ ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ ගරු මන්ත්‍රීවරු ඉන්නවා නම් කරුණාකර නැඟී සිට දන්වන්න.

මගේ වම් අත පැත්තේ ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ ගරු මන්ත්‍රීවරු ඉන්නවා නම් කරුණාකර නැඟී සිට දන්වන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමාගේ ආසනයේ අංකය කියන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ආසන අංක 21, පක්ෂයි.

**ගරු නෙයිනා තම්බි මරික්කාර් මොහමඩ් තාහිර් මහතා**
(மாண்புமிகு நெய்னா தம்பி மரிக்கார் மொஹமட் தாஹிர்)
(The Hon. Naina Thambi Marrikkar Mohamed Thahir)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමාගේ ආසනයේ අංකය කියන්න.

**ගරු නෙයිනා තම්බි මරික්කාර් මොහමඩ් තාහිර් මහතා**
(மாண்புமிகு நெய்னா தம்பி மரிக்கார் மொஹமட் தாஹிர்)
(The Hon. Naina Thambi Marrikkar Mohamed Thahir)
ආසන අංක 64.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා ඡන්දය ප්‍රකාශ කරන්නේ පක්ෂවද, විපක්ෂවද?

**ගරු නෙයිනා තම්බි මරික්කාර් මොහමඩ් තාහිර් මහතා**
(மாண்புமிகு நெய்னா தம்பி மரிக்கார் மொஹமட் தாஹிர்)
(The Hon. Naina Thambi Marrikkar Mohamed Thahir)
පක්ෂයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ වෙනත් ගරු මන්ත්‍රීවරු ඉන්නවා නම් කරුණාකර නැඟී සිට දන්වන්න.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු වසන්ත සමරසිංහ අමාත්‍යතුමා, ඔබතුමාගේ ආසනයේ අංකය කියන්න.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු කථානායකතුමනි, ආසන අංක 10.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමනි, ඔබතුමා ඡන්දය ප්‍රකාශ කරන්නේ පක්ෂවද, විපක්ෂවද?

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
විපක්ෂයි, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ වෙනත් ගරු මන්ත්‍රීවරු ඉන්නවාද?

කිසිවෙකු නොමැති බවයි පෙනෙන්නේ.

ඡන්දය ප්‍රකාශ කිරීමේ කාලය දැන් අවසානයි.

***ඡන්දය ප්‍රකාශ කිරීමෙන් පසුව -***
*வாக்கெடுப்பின் பின் -*
*On conclusion of the Voting -*

***මේ අවස්ථාවේදී පහත සඳහන් නම් සභා ගර්භයේ ඇති ඩිජිටල් පුවරුවේ ප්‍රදර්ශනය කෙරිණි.***
*(இவ்வேளையில், கீழ்வரும் பெயர்கள் சபாமண்டபத்திலுள்ள டிஜிற்றல் திரையில் காண்பிக்கப்பட்டது.)*
*(At this stage, the following names appeared on the digital screen in the Chamber.)*

***විද්‍යුත් ඡන්ද විමසීම අනුව පහත දැක්වෙන පරිදි - පක්ෂව 47; විරුද්ධව 152; වැළකී සිටි 0 යනුවෙන් බෙදුණේය.***
*இலத்திரனியல் வாக்கெடுப்பு முறைக்கிணங்க பாராளுமன்றம் பிரிந்தது: சார்பாக 47; எதிராக 152 விலகியிருந்தோர் 0.*
*According to Electronic Voting, Parliament divided: Ayes 47; Noes 152; Abstain 0.*

| | |
|---|---|
| G 001. K.V. Samantha Viddyarathna | No |
| G 003. K.D. Lal Kantha | No |
| G 004. Vijitha Herath | No |
| G 005. Nalinda Jayathissa | No |
| G 006. Bimal Rathnayake | No |
| G 007. Harini Amarasuriya | No |
| G 009. Ramalingam Chandrasekar | No |
| G 011. A.H.M.H. Abayarathna | No |
| G 012. Chrishantha Abeysena | No |
| G 013. Anil Jayantha | No |
| G 014. Harshana Nanayakkara | No |
| G 015. Dammika Patabendi | No |
| G 016. Saroja Savithri Paulraj | No |
| G 017. Ananda Wijepala | No |
| G 018. Hiniduma Sunil Senevi | No |
| G 019. Sunil Kumara Gamage | No |
| G 020. Kumara Jayakody | No |
| G 021. Rizvie Salih | No |
| G 022. Anura Karunathilaka | No |
| G 023. Upali Pannilage | No |
| G 024. Susil Ranasinghe | No |
| G 025. Nihal Galappaththi | No |
| G 026. Nihal Abeysinghe | No |
| G 027. Namal Karunaratne | No |
| G 028. Wasantha Piyathissa | No |
| G 029. Gamagedara Dissanayake | No |
| G 030. R.M. Jayawardhana | No |
| G 031. Sunil Watagala | No |
| G 032. Rathna Gamage | No |
| G 033. Mahinda Jayasinghe | No |
| G 034. Chathuranga Abeysinghe | No |
| G 035. Eranga Gunasekara | No |
| G 036. Upali Samarasingha | No |
| G 037. T.B. Sarath | No |
| G 038. Nalin Hewage | No |
| G 039. Prasanna Gunasena | No |
| G 040. Anton Jayakody | No |
| G 041. Hemali Weerasekara | No |
| G 042. Sundaralingam Pradeep | No |
| G 043. Ruwan Ranasinghe | No |
| G 044. Muneer Mulaffer | No |
| G 045. Hansaka Wijemuni | No |
| G 046. Eranga Weeraratne | No |
| G 047. Namal Sudarshana | No |
| G 048. P. Ruwan Senarath | No |
| G 049. Madhura Senevirathna | No |
| G 050. Arun Hemachandra | No |
| G 051. Janitha Ruwan Kodithuwakku | No |
| G 052. Aruna Jayasekera | No |
| G 053. Sugath Thilakaratne | No |
| G 054. Kaushalya Ariyarathne | No |
| G 055. Arkam Ilyas | No |
| G 056. Aravinda Senarath | No |
| G 057. Dinindu Saman | No |
| G 058. Nishantha Jayaweera | No |
| G 059. Asoka Ranwala | No |
| G 060. Lakshman Nipuna Arachchi | No |
| G 061. Gayan Janaka | No |
| G 062. Najith Indika | No |
| G 063. Lakmali Hemachandra | No |
| G 064. Samanmali Gunasingha | No |
| G 065. R.M. Gamini Rathnayake | No |
| G 066. Manjula Suraweera Arachchi | No |
| G 067. K. Ilankumaran | No |
| G 068. Shantha Pathma Kumara Subasingha | No |
| G 069. Ajith Agalakada | No |
| G 070. Sagarika Athauda | No |
| G 071. Roshan Akmeemana | No |
| G 072. U. P. Abeywickrama | No |
| G 073. L.M. Abeywickrama | No |
| G 074. M.K.M. Aslam | No |
| G 075. Asitha Niroshana Egoda Vithana | No |
| G 076. Oshani Umanga | No |
| G 077. Krishnan Kalaichelvi | No |
| G 078. Upul Kithsiri | No |
| G 079. Wasantha Pushpa Kumara | No |
| G 080. Chaminda Lalith Kumara | No |
| G 081. Sarath Kumara | No |
| G 082. Nilanthi Kottahachchi | No |
| G 083. M.A.C.S. Chathuri Gangani | No |
| G 084. Darmapriya Wijesinghe | No |
| G 085. Thilanka U. Gamage | No |
| G 086. Nilusha Lakmali Gamage | No |
| G 087. Ajantha Gammeddage | No |
| G 088. Ajith Gihan | No |
| G 089. Jagath Gunawardana | No |
| G 090. Aboobucker Athambawa | No |
| G 091. Ruwanthilaka Jayakody | No |
| G 092. Thushari Jayasingha | No |
| G 093. T.K. Jayasundara | No |
| G 094. Mayilvaganam Jegatheeswaran | No |
| G 095. Rajeevan Jeyachandramoorthy | No |
| G 096. Sellaththamby Thilaganathan | No |
| G 097. Sugath Wasantha de Silva | No |
| G 098. Anushka Thilakarathne | No |
| G 099. Chandana Thennakoon | No |
| G 100. Thanura Dissanayake | No |
| G 101. Dharmapriya Dissanayake | No |
| G 102. Sujeewa Dissanayake | No |
| G 104. Susantha Kumara Nawarathna | No |
| G 105. Sena Nanayakkara | No |
| G 106. Aruna Panagoda | No |
| G 107. Nimal Palihena | No |
| G 108. Nishantha Perera | No |

| | |
|---|---|
| G 109. Stepni Fernando | No |
| G 111. Lal Premanath | No |
| G 112. Nanda Bandara | No |
| G 113. Padmasiri Bandara | No |
| G 114. Ravindra Bandara | No |
| G 115. Sudath Balagalla | No |
| G 116. Sri Bavanandarajah | No |
| O 002. Kabir Hashim | Yes |
| O 004. Rishad Bathinudeen | Yes |
| O 005. Rauff Hakeem | Yes |
| O 006. R.M.Ranjith Madduma Bandara | Yes |
| O 008. Sajith Premadasa | Yes |
| O 009. Ravi Karunanayake | Yes |
| O 016. Ramanathan Archchuna | Yes |
| O 017. M.A.M. Thahir | Yes |
| O 018. Dilith Jayaweera | Yes |
| O 019. Sivagnanam Shritharan | Yes |
| O 020. Shanakiyan Rajaputhran Rasamanickam | Yes |
| O 022. Harsha de Silva | Yes |
| O 023. Ajith P. Perera | Yes |
| O 024. Sujeewa Senasinghe | Yes |
| O 026. Dilip Wedaarachchi | Yes |
| O 027. J. C. Alawathuwala | Yes |
| O 028. Nalin Bandara Jayamaha | Yes |
| O 029. Hector Appuhamy | Yes |
| O 030. Hesha Withanage | Yes |
| O 031. Kavinda Heshan Jayawardhana | Yes |
| O 032. Sujith Sanjaya Perera | Yes |
| O 033. S.M. Marikkar | Yes |
| O 034. Imran Maharoof | Yes |
| O 035. Harshana Rajakaruna | Yes |
| O 036. Rohini Kumari Wijerathna | Yes |
| O 039. Kaveenthiran Kodeeswaran | Yes |
| O 040. Gnanamuththu Srineshan | Yes |
| O 041. Chaminda Wijesiri | Yes |
| O 042. Mujibur Rahman | Yes |
| O 043. Waruna Liyanage | Yes |
| O 045. Rohana Bandara | Yes |
| O 046. W.H.M. Dharmasena | Yes |
| O 048. B. Ariyawansha | Yes |
| O 049. Chamindranee Kiriella | Yes |
| O 050. Chathura Galappaththi | Yes |
| O 051. Chithral Fernando | Yes |
| O 052. Amila Prasad | Yes |
| O 053. Anuradha Jayaratne | Yes |
| O 054. Chamara Sampath Dasanayake | Yes |
| O 055. D.V. Chanaka | Yes |
| O 056. Chanaka Madugoda | Yes |
| O 060. Thurairasa Ravikaran | Yes |
| O 061. Suranga Rathnayaka | Yes |
| O 062. Jagath Vithana | Yes |
| O 063. Nizam Kariapper | Yes |
| O 065. E. M. Basnayaka | No |
| O 066. Wijesiri Basnayake | No |
| O 067. S. Sandaruwan Madarasinghe | No |
| O 068. Prageeth Madhuranga | No |
| O 069. Jagath Manuwarna | No |
| O 070. Ruwan Mapalagama | No |
| O 071. Nandana Millagala | No |
| O 072. Riyas Farook | No |
| O 079. Elayathamby Srinath | Yes |
| O 080. Pathmanathan Sathiyalingam | Yes |
| O 081. Danushka Ranganath | No |
| O 082. Sanjeewa Ranasingha | No |
| O 083. Sunil Rathnasiri | No |
| O 084. Manjula Sugath Rathnayaka | No |
| O 085. A.M.M.M. Rathwaththe | No |
| O 086. Manoj Rajapaksha | No |
| O 087. Sunil Rajapaksha | No |
| O 088. Hasara Liyanage | No |
| O 089. Deepthi Wasalage | No |
| O 090. Kanchana Welipitiya | No |
| O 091. R. G. Wijerathna | No |
| O 092. Nishantha Samaraweera | No |
| O 094. Ruwan Wijeweera | No |
| O 095. Lasith Bhashana Gamage | No |
| O 097. Athula Welandagoda | No |
| O 098. Fasmin Sharif | No |
| O 099. Thilina Samarakoon | No |
| O 100. Ambika Samivel | No |
| O 101. Dewananda Suraweera | No |
| O 102. Chandana Sooriyaarachchi | No |
| O 103. G.D. Sooriyabandara | No |
| O 104. Kitnan Selvaraj | No |
| O 105. Janaka Senarathna | No |
| O 106. Chandima Hettiaratchi | No |
| O 107. Champika Hettiarachchi | No |
| O 108. Dinesh Hemantha | No |
| O 109. Geetha Herath | No |
| O 110. Bhagya Sri Herath | No |
| O 111. Muhammad Faizal | No |
| O 112. Ashoka Gunasena | No |
| O 113. Nandana Pathmakumara | No |
| O 114. Sunil Biyanwila | No |
| O 115. Samantha Ranasingha | No |

Electronic Voting Results:

**Participants:**

Present 199

**Votes:**

Yes 47

No 152

Abstain 0

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

විද්‍යුත් ඡන්ද විමසීම අනුව පක්ෂව ඡන්ද 47යි; විරුද්ධව ඡන්ද 152යි; ඡන්දය දීමෙන් වැළකී සිටි සංඛ්‍යාව 0යි.

නැඟී සිට පක්ෂව ඡන්දය දුන් සංඛ්‍යාව 02යි. ඒ අනුව පක්ෂව ලබා දුන් මුළු ඡන්ද සංඛ්‍යාව 49යි.

නැඟී සිට විරුද්ධව ඡන්දය දුන් සංඛ්‍යාව 01යි. ඒ අනුව විරුද්ධව ලබා දුන් මුළු ඡන්ද සංඛ්‍යාව 153යි.

[ගරු කථානායකතුමා]

ඒ අනුව, අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 83, බලශක්ති අමාත්‍ය ගරු කුමාර ජයකොඩි මහතාට එරෙහි විශ්වාස භංග යෝජනාව වැඩි ඡන්ද 104කින් පරාජයට පත් වී ඇත.

මීළඟ රැස්වීම් දිනය සිංහල හා දෙමළ අලුත් අවුරුද්දට පසුව එළඹෙන දිනයක් වන බැවින්, ගරු ජනාධිපතිතුමා මෙන්ම මෙම උත්තරීතර පාර්ලිමේන්තුව නියෝජනය කරනු ලබන ගරු අග්‍රාමාත්‍යතුමිය ඇතුළු මහජන නියෝජිතයින් සියලුදෙනාටත්, පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමිය ඇතුළු ලේකම් මණ්ඩලයටත්, පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩලයටත්, අනුබද්ධ කාර්ය මණ්ඩලයටත්, ආරක්ෂක අංශවල සියලු නිලධාරින්ට මෙන්ම සමස්ත රටවාසී ජනතාවටත් ලබන්නා වූ සිංහල හා දෙමළ අලුත් අවුරුද්ද වාසනාවන්ත සුබ අලුත් අවුරුද්දක් වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ඔබතුමා ප්‍රකාශ කළ පරිදිම එළඹෙන සිංහල හා දෙමළ අලුත් අවුරුද්ද අපේ කාර්ය මණ්ඩලය ඇතුළු සියලුදෙනාටම - අපේ ගරු විපක්ෂ නායකතුමාටත් එක්කම - සුබ අලුත් අවුරුද්දක් වේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා.

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

***එකල්හි වේලාව අ.භා. 5.30 පසු කර තිබුණෙන් ගරු කථානායකතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 6.12ට, අද දින සභා සම්මතිය අනුව, 2026 මැයි 05වන අඟහරුවාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அப்பொழுது நேரம் பி.ப. 5.30 மணிக்குப் பிந்திவிட்டமையால் மாண்புமிகு சபாநாயகர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*இதன்படி, பி.ப. 6.12க்கு, பாராளுமன்றம் அதனது இன்றைய தீர்மானத்திற்கிணங்க, 2026 மே 05, செவ்வாய்க்கிழமை மு.ப. 9.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.*

*It being past 5.30 p.m., THE HON. SPEAKER adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly at 6.12 p.m. until 9.30 a.m. on Tuesday, 05th May, 2026, pursuant to the Resolution of Parliament of this Day.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.